# දෙවැනි කොටස

## දෙවැනි කොටස
## ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු


| | | පිටුව |
|---|---|---|
| 1. | ගිණුම්කරණ සහ මූල්‍ය | 1 |
| 2. | බැංකු අධීක්ෂණ | 67 |
| 3. | බැංකු විදු පියෙස | 71 |
| 4. | සන්නිවේදන | 72 |
| 5. | ව්‍යවහාර මුදල් | 74 |
| 6. | දේශීය මෙහෙයුම් කටයුතු | 77 |
| 7 | ආර්ථික පර්යේෂණ | 80 |
| 8. | සේවක අර්ථසාධක අරමුදල | 86 |
| 9. | විනිමය පාලනය | 90 |
| 10. | පහසුකම් කළමනාකරණ | 96 |
| 11. | මූල්‍ය කටයුතු | 97 |
| 12. | මූල්‍ය බුද්ධි ඒකකය | 99 |
| 13. | මානව සම්පත් | 100 |
| 14. | තොරතුරු තාක්ෂණ | 104 |
| 15. | අභ්‍යන්තර විගණන | 106 |
| 16. | ජාත්‍යන්තර මෙහෙයුම් | 107 |
| 17. | නීති සහ අනුකූලතා කටයුතු | 110 |
| 18. | සාර්ව විචක්ෂණතා අධ්‍යයන | 111 |
| 19. | ගෙවීම් සහ පියවීම් | 111 |
| 20. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | 114 |
| 21. | රාජ්‍ය ණය | 115 |
| 22. | ප්‍රාදේශීය සංවර්ධන | 118 |
| 23. | ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ | 127 |
| 24. | අවදානම් කළමනාකරණ | 128 |
| 25. | ලේකම් දෙපාර්තමේන්තුව | 133 |
| 26. | ආරක්ෂක සේවා | 133 |
| 27. | කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ | 134 |
| 28. | සංඛ්‍යාන | 134 |
| 29. | ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ | 139 |
| 30. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | 140 |
| 31. | පුහුණු හා සංවර්ධන | 144 |

# I. ගිණුම්කරණ සහ මූල්‍ය

## මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී වාර්තාව

### 1. හැඳින්වීම

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව යනු මුදල් මණ්ඩලයේ අනු කමිටුවකි. මෙම කමිටුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති, අනුකූලතා, දුෂ්කෘත නිවේදන සහ වංචා, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලයෙන් පැවරූ වෙනත් කරුණු පිළිබඳව මුදල් මණ්ඩලයට උපදේශන ලබා දීම සිදු කරයි. කමිටුවෙහි නිර්දේශ සහ ක්‍රියාකාරීත්වය කාර්තුමය වශයෙන් සහ අවශ්‍ය පරිදි මුදල් මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

### 2. මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සංයුතිය

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සභාපති ලෙස මුදල් මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයෙකු කටයුතු කරන අතර එහි සෙසු සාමාජිකයන් ලෙස බාහිර විගණන වෘත්තීයවේදීන් දෙදෙනෙකු කටයුතු කරයි. මුදල් මණ්ඩලයේ ලේකම්, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවෙහිද ලේකම් ධූරය උසුලනු ලබන අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම කමිටුවෙහි සහකාර ලේකම් ලෙස කටයුතු කරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ලේකම් කටයුතු සඳහා පහසුකම් සපයයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණන කටයුතු මෙහෙයවන විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී නිරීක්ෂකයෙකු ලෙස කමිටු රැස්වීම්වලට සහභාගි වේ. මූල්‍ය දෙපාර්තමේන්තුව භාර සහකාර අධිපති සහ මහ බැංකුවේ අනුකූලතා නිලධාරී නිරීක්ෂකයන් ලෙසද, අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂකගේ කාර්යයන්ට පහසුකම් සැපයීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන්ද කමිටු රැස්වීම් වලට සහභාගී වෙති. කමිටුවේ සභාපති විසින් තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් අවශ්‍යතා පරිදි රැස්වීම් වලට කැඳවීම් කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සාකච්ඡා කිරීමේදී විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණනය සඳහා පත් කළ විගණන ආයතනයේ හවුල්කරුද කමිටු රැස්වීම් වලට සහභාගි වේ.

2017.12.31 දිනට කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i) ඒ.එන්. ෆොන්සේකා මහතා - සභාපති
ii) එච්.එම්.ඒ. ජයසිංහ මහතා - සාමාජික (2017.08.15 දින සිට බලපවත්වන පරිදි)

මුදල් මණ්ඩලය මගින් එම්.ආර්. මිහුලාර් මහතාගේ සහ ඒ.එම්.ජේ. පැට්‍රික් මහත්මියගේ ධූර කාලයන් 2016.12.31 දින සිට එච්.එම්.ඒ. ජයසිංහ මහතාගේ පත්වීම දක්වා දිගු කරන ලදී. ඒ.එම්.ජේ. පැට්‍රික් මහත්මියගෙන් හිස්වන ධූරය සඳහා නව සාමාජිකයෙකු පත්කිරීම මුදල් මණ්ඩලය මගින් අනුමත කර ඇත.

කමිටුව අවම වශයෙන් වර්ෂයකට හය (06) වතාවක් රැස්විය යුතුය. ඊට අමතරව සභාපතිගේ තීරණය මත හෝ මුදල් මණ්ඩලයේ අවශ්‍යතාවයන්ට අනුව රැස්විය හැක. කමිටුවේ ලේකම් විසින් කමිටු රැස්වීම් කැඳවනු ලබයි. රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය වනුයේ සභාපති ඇතුළුව සාමාජිකයන් දෙදෙනෙකි.

### 3. 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කළ කාර්යයන්

කමිටුව 2017 වර්ෂය තුළදී රැස්වීම් හයක් (06) පැවැත්වූ අතර පහත සඳහන් කාර්යයන්ට අදාළ නිර්දේශයන්ද කරන ලදී.

(අ) මූල්‍ය වාර්තාකරණය හා බාහිර විගණනය

කමිටුව විසින්,

i) 2016.09.30 න් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය මත නිකුත් කරන ලද අතුරු නිරීක්ෂණ පත්‍රිකාව සමාලෝචනය කර මුදල් මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ii) 2015 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සමාලෝචනය කරන ලදී.

iii) 2016 වර්ෂය සඳහා බාහිර විගණකගේ කළමනාකාරිත්ව ලිපිය සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

iv) ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (ජා.මූ.වා.ප්‍ර. 9) - මූල්‍ය උපකරණ වෙත යොමු වීම පිළිබඳව සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

**(ආ) අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ පද්ධති**

කමිටුව විසින්,

i) ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු පද්ධතිවල සුරක්ෂිතභාවය පිළිබඳ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සමාලෝචනය කිරීම සහ එම නිරීක්ෂණ මත පදනම් වූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පුද්ගලයන් යොමු කිරීම.

ii) ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ පද්ධතීන්හි ප්‍රමාණවත් බව හා සඵලදායී බව සමාලෝචනය කර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා අදාළ උපදෙස් දෙන ලදී.

**(ඇ) අභ්‍යන්තර විගණනය**

කමිටුව විසින්,

i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් පිළියෙළ කරන ලද 2018 - 2020 සඳහා වූ උපායමාර්ගික විගණන සැලසුම සහ 2018 වර්ෂය සඳහා වූ විගණන සැලසුම සමාලෝචනය කර මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

ii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත වාර්තා කළ නිරීක්ෂණයන් මත වූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

iii) විගණන සංගහණයෙහි අවදානම් ඇගයීම සඳහා යෝජනා කරන ලද ක්‍රමවේදය සමාලෝචනය කරන ලදී.

iv) විගණන පහසුකම් සැපයීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සැකසූ උපදෙස් මාලාවෙහි කරන ලද සංශෝධනයන් සහ එම දෙපාර්තමේන්තුවෙහි ඇති සම්පත් පිළිබඳව සමාලෝචනය කරන ලදී.

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2017 දෙසැම්බර් 31 දිනට කළමනාකාරිත්ව ප්‍රකාශය**

**ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මුදල් නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහ බැංකුව සතු බැවින් බැංකුව විසින් ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික සහ මිල ස්ථායිතා හා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මුදල් නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා කේපීඑම්ජී වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } බීඒජී/එච්/සීබීඑස්එල්/1/17/1 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 අප්‍රේල් 03 දින

ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මුදල් නීති පනතේ 42(2) වගන්තිය (422 අධිකාරිය) ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

**මතය**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා මුදල් නීති පනතේ 42(2) වගන්තිය (422 අධිකාරිය) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාමේදී, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලවීම පරීක්ෂා කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ සියලු ප්‍රමාණාත්මක කරුණුවලින් සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRS) අනුකූලව සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**මතය සඳහා පදනම**

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISA) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආචාර ධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළවන ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට අනුකූලව බැංකුව කෙරෙහි මම ස්වාධීන වන අතර, එම අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි මාගේ වෙනත් ආචාරධර්ම වගකීම් මා විසින් සම්පූර්ණ කර ඇත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**මුදල් මණ්ඩලයේ වගකීම**

මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මෙන් යුතුව පවත්වා ගැනීම සඳහා අඛණ්ඩ පැවැත්මට අදාළවන කරුණු අදාළ වන පරිදි හෙළිදරව් කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගනිමින් පවත්වා ගැනීම සඳහා බැංකුවේ හැකියාව ඇගයීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වගකිව යුතු වේ.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පාලනයට යටත් අයගේ වගකීම වේ.

**මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරන තහවුරුවක් යන්න,ඉහල මට්ටමේ,තහවුරුවක් වන නමුත් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISA) අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීමේදී සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගැනීම සඳහා තහවුරුවක් නොවේ. සාවද්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් පැන නැගිය හැකි අතර එය තනිකර හෝ සමස්තයක් ලෙස ගත්කල ප්‍රමාණාත්මක ලෙස සැලකේ නම්, භාවිතා කරන්නන්ට මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්ව ආර්ථික තීරණ ගැනීම සඳහා බලපානු ලබන බවට සාධාරණව අපේක්ෂා කළ හැකිය.

ජාත්‍යන්තර විගණන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව විගණනයේ කොටසක් ලෙස සමස්ත විගණනය තුළ මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණභාවය පවත්වා ගෙන යන ලදී. එසේම මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පරිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ප්‍රමාණාත්මක සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම. වංචාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් සොයා නොගැනීම වැරදි

එළිදරව් නොකිරීමට වඩා වැඩි අවදානමකට හේතු වන අතර දුස්සන්ධානය, කූට රචනය, අභිප්‍රායික අත්හැරීම්, වරදවා දැක්වීම් හෝ අභ්‍යන්තර පාලනය අක්‍රීය කරන වංචා, මෙයට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළවන අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකෙරේ.
- යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාළත්වය හා ගිණුම්කරණ ඇස්තමේන්තු සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද අදාළ හෙළිදරව් කිරීම පිළිබඳ සාධාරණත්වය ඇගයීම.
- අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ මුදල් මණ්ඩලයේ යොදාගැනීම පිළිබඳ අදාළත්වය නිගමනය කිරීම සහ ලබාගත් විගණන සාක්ෂි පදනම් කරගෙන, අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වා ගෙන යාමට බැංකුවේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයකට හේතුවන සිද්ධිවලට හෝ කරුණුවලට අදාළවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා විසින් නිගමනය කෙරේ නම් හෝ මාගේ මතය විකරණය කිරීම සඳහා එම හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ මාගේ විගණන වාර්තාවට අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද අනාගත සිද්ධි හෝ තත්ත්වයන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම නතර කිරීමට හේතු විය හැක.
- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉටු කරගැනීමට පාදක වූ ගනුදෙනු හා සිද්ධි මූල්‍ය ප්‍රකාශනවලින් නියෝජනය වේද යන්න ඇගයීම.

මාගේ විගණනයේදී හඳුනාගත් අනෙකුත් කරුණු අතර සැලසුම් කරන ලද විෂය පථය, විගණනයේ කාලය සහ අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් සැලකිය යුතු සොයාගැනීම් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වෙත මා විසින් සන්නිවේදනය කරනු ලැබේ.

**පාර්ලිමේන්තුවට වාර්තා කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව පාර්ලිමේන්තුවට යථා කාලයේදී ඉදිරිපත් කරනු ඇත.

අත්සන්කළේ :

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

අ/ක. එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2017 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

| | සටහන | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානයන් | 5 | **459,827,641** | 423,783,737 |
| ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 6 | **45,264,376** | 43,278,755 |
| විකුණුම් සඳහා වූ ආයෝජන | 6 | **566,228,935** | 348,544,650 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 7 | **4,940,455** | 198,880 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම් | 8 | **126,838,152** | 117,008,340 |
| අනිකුත් ලැබිය යුතු දෑ | | **3,670,494** | 6,175,049 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **1,206,770,053** | 938,989,411 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 9 | **32,080,086** | 351,426,470 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 10 | **199,800,871** | 83,306,771 |
| බැංකු සඳහා දෙන ලද ණය | 11 | **223,702** | 484,043 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 12 | **41,095** | 41,095 |
| අනිකුත් වත්කම් | 13 | **12,882,470** | 12,492,990 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **245,028,224** | 447,751,369 |
| **මුළු මූල්‍ය වත්කම්** | | **1,451,798,277** | 1,386,740,780 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| රන් | 14 | **126,583,727** | 111,009,339 |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| තොගය | 15 | **6,875,533** | 6,114,861 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | | **1,534,848** | 7,056,407 |
| දේපල පිරියත සහ උපකරණ | 16 | **17,960,517** | 18,132,390 |
| අස්පෘශ්‍ය වත්කම් | 17 | **80,623** | 156,320 |
| **මුළු මූල්‍ය නොවන වත්කම්** | | **153,035,248** | 142,469,317 |
| **මුළු වත්කම්** | | **1,604,833,525** | 1,529,210,097 |
| **බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 18 | **8,683,033** | 45,566,681 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 7 | **4,648,449** | 14,573,675 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 19 | **90,868,160** | 79,863,615 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) | 20 | **318,665,332** | 269,540,596 |
| අනිකුත් | 21 | **64,095,889** | 96,250,032 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | | **486,960,863** | 505,794,599 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 22 | **341,712,198** | 303,251,290 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 23 | **324,517** | 450,884 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 24 | **40,655,278** | 70,054,436 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 25 | **4,547** | 51,744 |
| සංසරණයෙහි පවතින මුදල් | 26 | **598,053,901** | 552,777,865 |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 27 | **8,887,156** | 8,563,548 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | | **989,637,597** | 935,149,767 |
| **මුළු මූල්‍ය බැරකම්** | | **1,476,598,460** | 1,440,944,366 |
| **අනිකුත් බැරකම්** | | | |
| විලම්භිත ප්‍රදාන | 28 | **45** | 80 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 29 | **671,061** | 2,429,153 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 30 | **211,720** | 193,297 |
| **මුළු අනිකුත් බැරකම්** | | **882,826** | 2,622,530 |
| **මුළු බැරකම්** | | **1,477,481,286** | 1,443,566,896 |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල | | **50,000,000** | 50,000,000 |
| සංචිත | 31 | **77,352,239** | 35,643,201 |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | **127,352,239** | 85,643,201 |
| **මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | **1,604,833,525** | 1,529,210,097 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2018 මාර්තු 20 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි - අධිපති

යූ.එල්.මුතුගල - වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරී

පිටු අංක 11 සිට 66 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### ආදයම් ප්‍රකාශනය

| | සටහන | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම:** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 33 | **22,914,716** | 14,869,835 |
| උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය | 34 | **24,000,475** | 9,739,043 |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය | | **2,772,209** | 1,755,321 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම** | | **49,687,400** | 26,364,199 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොළී වියදම | 35 | **(2,963,231)** | (3,953,835) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම** | | **(2,963,231)** | (3,953,835) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන පාඩුව | | **(3,808,147)** | (6,775,246) |
| **විදේශීය මූල්‍ය ආයෝජන ආදායම** | | **42,916,022** | 15,635,118 |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 33 | **18,768,928** | 21,020,691 |
| පොළී වියදම | 35 | **(2,676,116)** | (2,197,815) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත මුළු ආදායම** | | **16,092,812** | 18,822,876 |
| අනිකුත් ආදායම් | 36 | **1,602,664** | 1,508,261 |
| මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම | | **60,611,498** | 35,966,255 |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| සේවක මණ්ඩල වියදම් : | 37 | | |
| - වැටුප් සහ වේතන | | **(4,112,349)** | (4,258,884) |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | **(610,489)** | (629,786) |
| - පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය සඳහා වූ දායකත්වය | | **(744,356)** | (1,479,963) |
| | | **(5,467,194)** | (6,368,633) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | **(518,716)** | (520,961) |
| තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) | | **(2,850,823)** | (3,076,747) |
| පරිපාලන සහ අනිකුත් වියදම් | 38 | **(1,305,649)** | (1,465,584) |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන අලාභ | | **-** | (378,907) |
| වත්කම් මත හානිකරණ ගාස්තු | | **(274,773)** | (141,556) |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **(10,417,155)** | (11,952,388) |
| **බදු වලට පෙර ලාභය** | | **50,194,343** | 24,013,867 |
| රඳවා ගැනීම් මත බද්ද | 39 | **(1,837,976)** | (1,834,348) |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | | **48,356,367** | 22,179,519 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 11 සිට 66 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය. | **48,356,367** | 22,179,519 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | |
| **පසු කාලපරිච්ඡේදයේ ලාභ/(අලාභ) වලට නැවත වර්ගීකරණය විය යුතු විස්තීරණ ආදායම** | | |
| විකුණුම් සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම ලාභය/(අලාභය) | **(6,843,970)** | 2,022,241 |
| **පසු කාලපරිච්ඡේදයේ ලාභ/(අලාභ) වලට නැවත වර්ගීකරණය නොවිය යුතු විස්තීරණ ආදායම** | | |
| දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන ලාභ | **-** | 3,036,305 |
| විස්තීරණ ආදායමට ගලපන ලද පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වියදම | **1,741,622** | 9,485,849 |
| **මුළු විස්තීරණ ආදායම.** | **43,254,019** | 36,723,914 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 11 සිට 66 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශනය**

| | ආයක ප්‍රාග්ධනය රු. 000 | ප්‍රත්‍යාගණන සංචිතය රු. 000 | අනිකුත් සංචිත (සටහන 31) රු. 000 | රඳවාගත් ලාභ රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|---|
| **2016 ජනවාරි 1 දිනට** | 50,000,000 | 5,986,602 | 39,714,048 | (41,605,668) | 54,094,982 |
| ශුද්ධ ලාභය | - | - | - | 22,179,519 | 22,179,519 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | - | - | 220,272 | (220,272) | - |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | - | 9,485,849 | 9,485,849 |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය මාරු කිරීම (IRR) | - | - | (6,775,246) | 6,775,246 | - |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | - | - | - | (175,470) | (175,470) |
| විකුණුම් සඳහා වූ සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය | - | - | 2,022,241 | - | 2,022,241 |
| 2016 වර්ෂයට අදාළ අන්තර් ලාභයන් රජයට පැවරීම | - | - | - | (5,000,000) | (5,000,000) |
| දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන ලාභ | - | 3,036,305 | - | - | 3,036,305 |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | - | (225) | (225) |
| වෙළඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ලාභවලට අරමුදල් මාරු කිරීම | - | - | (4,650,806) | 4,650,806 | - |
| **2016 දෙසැම්බර් 31 දිනට** | 50,000,000 | 9,022,907 | 30,530,509 | (3,910,215) | 85,643,201 |
| 2017 ජනවාරි 01 වන දින | **50,000,000** | **9,022,907** | **30,530,509** | **(3,910,215)** | **85,643,201** |
| ශුද්ධ ලාභය | **-** | **-** | **-** | **48,356,367** | **48,356,367** |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | **-** | **-** | **273,918** | **(273,918)** | **-** |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | **-** | **-** | **-** | **1,741,622** | **1,741,622** |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය මාරු කිරීම (IRR) | **-** | **-** | **(3,808,147)** | **3,808,147** | **-** |
| ශ්‍රී.ලං.ම.බැ. නිශ්චිත සංචිතවලට මාරු කිරීම | **-** | **-** | **-** | **(166,388)** | **(166,388)** |
| විකුණුම් සඳහා වූ සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ අලාභය | **-** | **-** | **(6,843,970)** | **-** | **(6,843,970)** |
| රඳවාගත් ලාභයෙන් වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම | **-** | **-** | **14,028,792** | **(14,028,792)** | **-** |
| පොදු සංචිතයට මාරු කිරීම | **-** | **-** | **7,462,613** | **(7,462,613)** | **-** |
| 2016 වර්ෂයට අදාළ ලාභයන් රජයට පැවරීම - මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම | **-** | **-** | **-** | **(1,378,272)** | **(1,378,272)** |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | **-** | **-** | **-** | **(321)** | **(321)** |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම | **-** | **-** | **689,025** | **(689,025)** | **-** |
| **2017 දෙසැම්බර් 31 දිනට** | **50,000,000** | **9,022,907** | **42,332,740** | **25,996,592** | **127,352,239** |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 11 සිට 66 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්:** | | | |
| ලැබුණු පොලිය - විදේශීය මුදල් | | **24,380,250** | 11,097,325 |
| ලැබුණු පොලිය - දේශීය මුදල් - අනිකුත් | | **843,143** | 690,326 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **2,772,208** | 1,755,321 |
| උපලබ්ධි වූ විනිමය පාඩුව | | **(14,514,115)** | (19,001,328) |
| ලැබුණු අනිකුත් ආදායම් | | **1,607,790** | 1,500,669 |
| | | **15,089,276** | (3,957,687) |
| **විය පැහැදම්:** | | | |
| ගෙවන ලද පොලිය - විදේශීය මුදල් | | **2,740,357** | 3,922,805 |
| ගෙවන ලද පොලිය - දේශීය මුදල් | | **2,679,274** | 2,196,385 |
| සේවකයින්ට ගෙවීම් | | **5,245,612** | 5,464,654 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **4,823,628** | 5,557,729 |
| ගෙවන ලද බදු | | **902,864** | 2,595,700 |
| | | **16,391,735** | 19,737,273 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 40 | **(1,302,459)** | (23,694,960) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම) / අඩුවීම | | **(1,524,155)** | (2,100,302) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම් | | **487,927** | 890,497 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීම් | | **3,088** | 709 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(29,394,318)** | (35,429,276) |
| | | **(30,427,458)** | (36,638,372) |
| **විය පැහැදම් :** | | | |
| විදේශ මුදල් සුරකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **211,673,611** | (7,066,141) |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **355,012** | 30,222,682 |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **60,818,636** | 89,038,712 |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(155)** | (791) |
| දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩු කිරීමෙන් පසු) | | **265,725** | 488,036 |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම් | | **7,432** | 1,124 |
| කල්බදු වත්කම් මිලදී ගැනීම් | | **-** | 5,135 |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් | | **369,684** | 488,183 |
| | | **273,489,945** | 113,176,940 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද/ (සඳහා භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(303,917,403)** | (149,815,312) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **628,828,164** | 595,035,881 |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **(583,552,128)** | (533,957,965) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **45,276,036** | 61,077,916 |
| **විය පැහැදම් :** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 41 | **(220,649,290)** | 160,378,295 |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 42 | **(38,460,908)** | (121,524,559) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | | **(259,110,198)** | 38,853,736 |
| **සංසරණ මුදල් ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **304,386,234** | 22,224,180 |
| **විය පැහැදම් :** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **(28,666,576)** | (13,612,965) |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **321** | 225 |
| විශ්‍රාම අරමුදල සඳහා ගෙවීම | | **261,625** | - |
| රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම | | **-** | 5,000,000 |
| | | **(28,404,630)** | (8,612,740) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **332,790,864** | 30,836,920 |
| **මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | **27,571,002** | (142,673,352) |
| මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන්ගේ බලපෑම | | **8,472,902** | 8,982,404 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන් | | **423,783,737** | 557,474,685 |
| **දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන්** | 43 | **459,827,641** | 423,783,737 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 11 සිට 66 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන**

## 1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මුදල් මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2018 මාර්තු 20 වැනි දින අනුමත කරන ලදී.

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

පහත සඳහන් නිශ්චිත ගණකාධිකරණ ප්‍රතිපත්තිවලින් හඳුන්වා දී ඇති පරිදි සාධාරණ වටිනාකමට අගය කරන ලද රන් සහ ඇතැම් මූල්‍ය වත්කම් හැර, ඓතිහාසික පිරිවැය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරන ලදී.

#### 2.1.1 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේ දී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙලට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 4 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

#### 2.1.2 අනුකූලතා ප්‍රකාශනය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මූ.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ. එකී මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කර නීතිමය අවශ්‍යතා මත ගැසට් පත්‍රයේ පල කර ඇත. කෙසේ වුවද, යම් යම් වර්ගීකරණ වෙනස්කම් හේතුකොටගෙන ගැසට් පත්‍රයේ පලකර ඇති මූල්‍ය ප්‍රකාශන වල ඇති අගයන් මෙහි ප්‍රකාශයට පත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සමගින් වෙනස් විය හැක.

#### 2.1.3 වාර්තා කිරීමේ මුදල් ඒකකය

වෙනත් අන්දමකට දක්වා නොමැති නම්, සියළුම සංඛ්‍යා ආසන්නතම ශ්‍රී ලංකා රුපියල් දහස් වලින් දැක්වේ.

### 2.2 වැදගත් ගිණුම් නිශ්චයන් සහ ඇස්තමේන්තු

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ නිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන් හා ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පන යාවත්කාලීන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක බලපෑමක් සහිත අයිතමයන් සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා වූ විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් මගින් පැහැදිලි කෙරේ.

#### 2.2.1 ණය සහ ලැබීම් හානිකරණය

කේවල ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ අලාභයක් ආදායම් ප්‍රකාශයට වාර්තා කළ යුතු ද යන්න තක්සේරු කිරීම සඳහා බැංකුව විසින් ඒ ඒ වාර්තාකරණ දිනයන්හිදී සමාලෝචනය කරනු ලැබේ. බැංකුව විසින් ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන වත්කම් සඳහා වන හානිකරණ ක්‍රමවේදය මගින් පහත ප්‍රතිපාදනයන් ජනනය වේ.

- කේවල ප්‍රමාණාත්මක නිරාවරණයන් සඳහා විශේෂ හානිකරණ අලාභයන්.
- කේවල වශයෙන් නොවැදගත් නිරාවරණයන් සඳහා සාමූහික හානිකරණය.

හානිකරණ අලාභ තක්සේරුවේ දී විශේෂයෙන් අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි ප්‍රමාණය සහ කාලය සහ ඇපවල වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී සියලුම වර්ගීකරණයන් සඳහා කළමනාකරණ නිශ්චයන් ඇතුලත් වේ. මෙම ඇස්තමේන්තු සඳහා විවිධ සාධක බලපාන අතර ඒවායේ වෙනස්වීම මගින් වෙනස් ප්‍රතිපාදනයන් උත්පාදනය වේ.

#### 2.2.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. ආයුගණන ඇගයීමේදී භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 29 හි දැක්වේ.

**2.2.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය**

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාගන්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී විනිශ්චයන් මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. නිගමනවලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (longer-dated derivatives) වෙනස්වීම වැනි ආකෘතිවලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත.

**2.3 විදේශීය මුදල් පරිවර්තනය**

බැංකුවේ ගනුදෙනු සඳහා භාවිතා වන සහ ඒවා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වේ. විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වාර්තා කරන දිනට වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| මුදල් වර්ගය | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | **119.3796** | 108.2380 |
| කැනේඩියානු ඩොලර් 1 | **121.8598** | 111.0617 |
| යුරෝ 1 | **183.1353** | 158.4959 |
| ජපන් යෙන් 1 | **1.3580** | 1.2818 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | **217.1608** | 201.3811 |
| ස්ටර්ලින් පවුම් 1 | **206.5221** | 184.5087 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | **152.8548** | 149.8000 |
| චීන යුවාන් 1 (අක්වෙරළ) | **23.4847** | 21.4901 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

**2.4 සාධාරණ අගය මිනුම් කිරීම**

බැංකුව විසින් විදේශීය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ රන් ආදී වූ මූල්‍ය නොවන උපකරණයන් එකී වාර්තාකරණ දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 47 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වගකීම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් වාසිසහගත වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරනු ලබන්නේ වෙළෙඳපොළ ගණුදෙනුකරුවන් ඔවුන් උපරිම ආර්ථික වාසියක් ලබාගැනීම උදෙසා හැසිරෙනු ඇතැයි යන උපකල්පනය මත වත්කමක් හෝ වගකීමක් මිලකිරීමේදී යොදාගන්නා උපකල්පනයන් යොදා ගැනීමෙනි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම්ගත කිරීමේ දී වෙළෙඳපොළ ගණුදෙනුකරුවන්ගේ වත්කමක් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීම මගින් හෝ උපරිම හා විශිෂ්ට වාසි ලැබෙන ලෙස භාවිතාවේ යොදා ගන්නා වෙනත් වෙළෙඳපොළ ගණුදෙනුකරුවකුට විකිණීම මගින් හෝ, ආර්ථික වාසි ජනනය කිරීමේ හැකියාව සලකා බලනු ලබයි.

බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ අපරීක්ෂාකාරී යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධූරාවලිය තුළ පහත දැක්වෙන පරිදි වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

පළමුවන මට්ටම - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන්

දෙවන මට්ටම - ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්

තෙවන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්.

මූල්‍ය වාර්තාවන්හි පුනරාවර්තන පදනම මත හඳුනාගන්නා ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන්, මෙම ධූරාවලියෙහි මට්ටම් අතර හුවමාරු වීම් සිදුවී ඇත්දැයි බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම්කරණය උදෙසා සමස්තයක් වශයෙන් වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව මෙම වර්ගීකරණය නැවත තක්සේරු කිරීම තුළින් වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය අවසානයේ තීරණය කරනු ලබයි.

### 2.5 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

### අ. මූල්‍ය වත්කම්

බැංකුව විසින් මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලැබේ.

- ණය සහ ලැබීම්.
- කල් පිරෙන තෙක් තබාගෙන ඇති මූල්‍ය වත්කම්.
- විකිණීම සඳහා තබාගෙන ඇති මූල්‍ය වත්කම්.
- ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට සහ ඒ තුල ඇතුලත්
  - ගණුදෙනු කිරීම සඳහා හෝ
  - ලාභ හෝ පාඩු මත සාධාරණ මිලට නම් කරන ලද මූල්‍ය වත්කම්.

### ආ. මූල්‍ය වගකීම්

සියලුම මූල්‍ය වගකීම් ඒවා ජනනය වන දිනයේදී ම බැංකුව විසින් මූලිකව හඳුනාගන්නා අතර ඒවා ක්‍රමක්ෂය පිරිවැයට හෝ ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට අගය කරනු ලැබේ.

සියළු මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මෙම මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මිනුම් පදනම්, පහත විස්තර කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් හා වගකීම් වෙළෙඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලි සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

### 2.5.1 ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති සුරැකුම්පත්

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, "ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති වත්කම්" යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මූලික හඳුනාගැනීමේදී ආරෝපණය කළ ගනුදෙනු පිරිවැය ලාභය හෝ පාඩුව තුළ දරන ලද ලෙස හඳුනාගනු ලැබේ. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/අවාසිය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය "මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ.

### 2.5.2 විකිණීම සඳහා ඇති ආයෝජන

අලෙවිය සඳහා ඇති ආයෝජන වනුයේ අලෙවිය සඳහා ඇති ලෙස නම් ව්‍යුත්පන්න නොවන ආයෝජන සහ අනෙකුත් මූල්‍ය වත්කම් කණ්ඩයකට වර්ග නොකරන ලද අයෝජනයි.

විකිණීම සඳහා වන විදේශීය ආයෝජන පසුව වෙළෙඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ විකිණීමට ඇති සුරැකුම්පත්වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත්වල වෙළෙඳපොළ අගය වෙනස්වීමෙන් උද්ගතවන වාසිය හෝ අවාසිය, එම ආයෝජන විකුණා, ප්‍රතිග්‍රහණය කර හෝ වෙනත් අයුරකින් බැහැර කරන තෙක් හෝ එම ආයෝජනය හානිකරණය වූ බවට නිරීක්ෂණය කරන තෙක් හෝ හිමිකරු ප්‍රාග්ධනයේ වෙනම සංරචකයන් (මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වෙනත් සංචිත ලෙස දක්වා ඇති) ලෙස හඳුන්වනු ලබන අතර, එවැනි අවස්ථාවක් උද්ගතවීමේ දී හිමිකරු ප්‍රාග්ධනය ලෙස මුලින් වාර්තා කළ වාසිය හෝ අවාසිය ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ. සඵල පොලී ක්‍රමය භාවිත කර පොලී ආදායම ලාභය හෝ පාඩුව තුළ හඳුනාගනු ලැබේ.

### 2.5.2.1 විකිණීම සඳහා ඇති ලෙස වර්ග කර ඇති මූල්‍ය සහ අනෙකුත් ආයතනයන්හි ස්කන්ධ ආයෝජන

සාධාරණ අගය විශ්වාසනීය ලෙස අගය කල නොහැකි ලැයිස්තුගත නොවූ ස්කන්ධ සුරැකුම්පත් පිරිවැයට පවත්වාගෙන යනු ලැබේ. අනෙකුත් සියළුම විකිණීමට ඇති ආයෝජන මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සාධාරණ අගයට අගය කරනු ලැබේ.

### 2.5.3 ණය සහ ලැබීම්

ණය සහ ලැබීම් යනු ස්ථාවර හෝ නිශ්චිත ගෙවීම් සහිත සක්‍රීය වෙළඳපළක් තුළ මිල ගණන් නියම නොකරන ලද සහ බැංකුව ආසන්න කාලපරිච්ඡේදයකදී හෝ ක්ෂණික ව විකිණීම අරමුණු කර නොගත් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ.

ණය සහ ලැබීම් ආරම්භයේදී සාධාරණ අගයකට වර්ධක සෘජු ගණුදෙනු පිරිවැය එකතු කර අගය කරනු ලබන අතර පසුකාලීනව සරල පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

**2.5.4 කල් පිරෙන තෙක් රඳවාගෙන ඇති ආයෝජන**

කල් පිරෙන තෙක් රඳවා ගෙන ඇති ආයෝජන යනු ලාභ අලාභ මත සාධාරණ අගයට හෝ විකිණීම සඳහා ඇති ලෙස වර්ග නොකරන ලද, කල් පිරෙන තෙක් තබා ගැනීමට ධනාත්මක අපේක්ෂාවක් සහ හැකියාවක් ඇති ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරීමක් ඇති ව්‍යුත්පන්න නොවන වත්කම් ය. කල් පිරෙන තෙක් රඳවා ගෙන ඇති ආයෝජන සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යනු ලැබේ.

**2.5.5 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

මුදල් හුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් සහ පොලී අනුපාත හුවමාරු වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකු විසින් භාවිතා කරනු ලබන අතර ඒවා භාවිතා කරනුයේ අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර එහි සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයෙහි ඇතිවන චලනයන් "උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව)" යටතේ වාර්තා කරනු ලැබේ.

ගනුදෙණුවක මිල ඒ හා සමාන ගණුදෙණු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්ථමාන වෙළෙඳපළක සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ මිල නිරීක්ෂණය කල හැකි වර්ථමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් ලෙස යොදාගත් ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් ලබාගත් මිලෙන් වෙනස් වේ නම්, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දිනට වෙනස) "උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)" ලෙස හඳුනාගනු ලබයි. ගණුදෙණුවක සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පැනවිම තිරණය කළ අවස්ථාවක එම ගණුදෙණුවේ මිල හා අදාල ඇගයීම් රාමුවේ මිල අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණ මූල්‍ය ප්‍රකාශන තුළින් ඉවත් කල විට පමණක් අදායම් ප්‍රකාශය තුළ ගලපනු ලබයි.

**2.5.6 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)**

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මු.අ. සමඟ සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මු.අ. සමඟ වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මු.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මු.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මු.අ. හා අදාල වන සියලුම වත්කම් සහ වගකීම් සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලැබේ. ජා.මු.අ. විසින් වාර්තාකරණ දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මු.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. ජා.මු.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**2.5.7 මුදල් සහ මුදල් සමානයන්**

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ පරිණත කාලය මාස තුනකට අඩු, සාධාරණ අගය වෙනස්වීමේ සැලකිය යුතු අවදානමක් නොමැති සහ බැංකුව මගින් එහි කෙටිකාලීන බැඳීම් කළමණාකරණය සඳහා යොදා ගන්නා ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු මූල්‍ය වත්කම් මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

මුදල් සහ මුදල් සමානයන් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් කරනු ලැබේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල ආයක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, බැහැර කිරීම් හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 41 සහ සටහන් 42 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මත හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මත නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සමග වන ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

**2.5.8 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

ප්‍රතිමිලදී ගැනීම සඳහා ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක්

ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු නිසා උපචිත ආදායමක් හෝ උපචිත වියදමක් උද්ගත වූයේ නම්, එය ද ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු වටිනාකම සමග වාර්තා කරනු ලැබේ.

### 2.5.9 නිත්‍ය තැන්පතු සහ ණයදීමේ පහසුකම්

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය මිලදී ගැනුම් පහසුකම) සුරැකුම් රහිත තැන්පතු පහසුකමක් බවට පරිවර්තනය කරන ලදී. එබැවින් සහභාගී වන ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනිකව ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකම, පෙර නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම හා සර්ව සම වේ.

### 2.5.10 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි.

නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරන අතර මුහුණත අගය සහ නිකුතු මිල අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස වාර්තා කරනු ලබයි.

### 2.5.11 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත වේ. එම කළඹ ක්‍රමක්ෂය පිරිවැයට සටහන් කරනු ලැබේ.

### 2.5.12 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද කාලීන අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ. මෙම අත්තිකාරම් පසුව ක්‍රමක්ෂය පිරිවැයට දක්වා ඇත.

### 2.5.13 අනිකුත් ආයතනවලට දෙන ලද ණය

අනිකුත් ආයතනවලට දෙන ලද ණය මුදලින් අයකරගත නොහැකි ප්‍රමාණයන් සඳහා වූ මුදල් අඩුකර, ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන දක්වා ඇත. අයකරගත යුතු සියළු මුදල් බැංකුවට අයකරගත නොහැකි බවට නිශ්චිත සාක්ෂි තිබේ නම්, ඒ සඳහා (ණය අඩාලවීම) අඩමාන ණය ප්‍රතිපාදනයන් සලසනු ලැබේ. එම ප්‍රතිපාදනයේ ප්‍රමාණය ධාරණ මුදල් සහ ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල අතර වෙනස වේ. බොල් ණය හඳුනාගත් අවස්ථාවේ දී කපාහරිනු ලැබේ.

### 2.5.14 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගිවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භාව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වර්තාකරණු ලබයි.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශවයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරෙනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභයන්ද මාරු වූයේ නම් පමණි.

### 2.5.15 සේවක ණය

සහනදායි පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. 2008 වසරේ සිට නිකුත් කල මෙම ණය, ජා.ගි.ප්‍ර. 39 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

**වට්ටම් අනුපාතය** - මෙම අනුපාතය ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් ඉලක්ක කරගත් දිගුකාලීන උද්ධමනය පදනම් කොට ශ්‍රී ලංකා මහ බැංකු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මඟින් සම්පාදනය කරන ලදී. විගණන කමිටුව මඟින් එකඟ වී ඇති පරිදි වාණිජ්‍ය පොළී නිර්දේශිත අනුපාතය (CIRR) සඳහා සියයට 1 ක අවදානම් අධිකයක් ද එකතු කරමින් වට්ටම් අනුපාතය භාවිත කොට ඇති අතර එය ණයවල කාලපරිච්ඡේදය සමඟ වෙනස් වේ.

මෙම ණය සහනදායි පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය, වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම්, බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක්, අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගය කිරීම ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන්:**

- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ පියවීමක් සිදුවී නොමැත.

**2.5.16 මූල්‍ය වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇත්දැයි බැංකුව විසින් වාර්තාකරණ දිනයන්හි දී තක්සේරු කරනු ලැබේ.

ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ ණයක් හෝ ලැබිය යුතු මුදලක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එම අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වත්කමේ මුල් සඵල පොළී අනුපාතයත්, වට්ටම් කළ අගයත් අතර වෙනස මගිනි. වත්කමක ධාරණ අගය ඍජුව හෝ දීමනා ගිණුමක් මගින් හෝ අඩුකරනු ලැබේ. පාඩු වූ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

බැංකුව ප්‍රථමයෙන් තනිව වැදගත් සහ තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් තනිව හෝ සාමූහිකව හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි විමර්ෂණය කරනු ලබයි. එසේ වැදගත් හෝ නොවැදගත් තනිව විමර්ෂණය කළ මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යැයි තීරණය කළහොත් එම මූල්‍ය වත්කම සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර, එම වත්කම් හානිකරණය සඳහා සාමූහිකව විමර්ශණය කරනු ලැබේ. තනිව හානිකරණ පාඩු සඳහා තක්සේරු වටිනාකමට අදාළව හානිකරණ පාඩු පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේ නම් ඒවා සාමූහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

පසුකාලයේ දී හානිකරණ අලාභයේ අගය අඩුවන්නේ නම් සහ හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදු වූ සිදුවීමකට විෂයානුබද්ධව අදාල කර ගතහැකි නම් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ආපසු ගලපයි. පසුකාලයක දී ආපසු ගලපන ලද ඕනෑම හානිකරණ අලාභයක් ආපසු ගලපන ලද දිනට වත්කමේ ධාරණ අගය එහි ක්‍රමක්‍ෂය පිරිවැය නොඉක්මවන ප්‍රමාණයක් දක්වා ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

විකිණීමට ඇති වත්කමක් හානිකරණය වී ඇත්නම් එහි පිරිවැය (මූලික ගෙවීම සහ ක්‍රමක්ෂය අතර ශුද්ධ අගය) හා එහි වර්තමාන සාධාරණ අගය, මීට පෙර ලාභය හෝ අලාභය යටතේ හඳුනාගත් හානිකරණ අලාභයක් වේ නම් එය අඩුකර හිමිකරු ප්‍රාග්ධනයෙන් ආදායම් ප්‍රකාශනයට මාරුකරනු ලැබේ. විකිණීමට ඇති ලියවිලි ලෙස වර්ගකර ඇති හිමිකම් ප්‍රාග්ධන ලියවිලි නැවත ගැලපීම් ලාභය සඳහා හඳුනාගන්නේ නැත. ණය ලියවිලිවල හානිකරණ අලාභ, ලියවිල්ලෙහි සාධාරණ අගයෙහි වැඩිවීම, හානිකරණ පාඩුව හඳුනා ගැනීමට පසුව වූ සිද්ධියකට අදාල වන බවට නිශ්චිත සාක්ෂි තිබේ නම් පමණක්, එය ලාභ හෝ පාඩු හරහා නැවත ගැලපිය හැකිය.

**2.5.17 විදේශීය මුදල් කාලීන බැරකම්**

විදේශීය මුදල් කාලීන බැරකම්, බැරකම්වල ක්‍රමක්ෂය පිරිවැයට පසුව වාර්තා කරනු ලැබේ. මෙම බැරකම්වල අගය වෙනස්වීම කාලීන බැරකම්වල වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි දක්වනු ලැබේ. විදේශීය මුදල් කාලීන බැරකම්වල වෙනස්වීම් වලින් උද්ගතවන වාසි සහ අවාසි වහාම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. බැරකමේ අයිතිය තවදුරටත් පවතී නම් වාසිය හෝ අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(පාඩුව) ලෙස වාර්තා කරනු ලැබේ. වාසිය හෝ අවාසිය උපලබ්ධි වූ (බැරකම ආපසු ගෙවීම් මගින්) අවස්ථාවන්හිදී එය මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ වාසිය/(පාඩුව) ලෙස වාර්තා කරනු ලැබේ.

**2.5.18 වෙනත් මූල්‍ය වත්කම් සහ බැරකම්**

මුදල්, තැන්පතු සහ කෙටිකාලීන අත්තිකාරම් වශයෙන් වූ දේශීය සහ විදේශීය මුදල් වෙළෙඳ දිනයේ දී හඳුනාගන්නා අතර ඒවා ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

**2.6 අනිකුත් වත්කම් සහ බැරකම්**

**2.6.1 රන්**

මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවට තම ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස, රන් දැරිය හැක. මුදල් නීති පනතේ 67(2) වගන්තිය ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ ඍජුව හෝ වක්‍රව පරිවර්තනය කළ හැකි විනිමයක් ලෙස පවත්වාගත යුතුයි. එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස 2017 දෙසැම්බර් 31 දිනට බෙදා වෙන්කළ හැකි රන් රුපියල් බිලියන 126.58 ක් සහ බෙදා වෙන් කළ නොහැකි රන් රුපියල් බිලියන 15.28 ක් දරා සිටී. මෙම රන් තොගය ජාත්‍යන්තර සංචිතයේ කොටසක් වන බැවින් සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී වෙළෙඳ භාණ්ඩයක් ලෙස හුවමාරු නොවන බැවින් රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය හෝ අලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

**2.6.2 තොග**

**2.6.2.1 මුදල් තොග**

බැංකුවේ තොගය තුල, සංසරණය සඳහා නිකුත් කර නොමැති නව ව්‍යවහාර මුදල් අන්තර්ගත වේ. නව මුදල් නෝට්ටු සහ කාසිවලට අදාල නිෂ්පාදන සහ නිර්මාණ පිරිවැය, මුල්වරට පිරිවැයට හඳුනාගනු ලැබේ. සංසරණය සඳහා නිකුත් කරනු ලබන නව මුදල් නෝට්ටු සහ කාසිවල අදාල පිරිවැය බර තබන ලද සාමාන්‍ය පදනමක් මත තීරණය කරන අතර, නිකුත් කරන අවස්ථාවේදී එය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ. සෙමෙන් චලනය වන තොගය සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

**2.6.2.2 අනෙකුත් තොග**

අනෙකුත් තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ.

**2.6.3 දේපළ, පිරියත සහ උපකරණ**

ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන දිනට එහි සාධාරණ අගය වන ප්‍රත්‍යාගණන අගයට අගය කර ඉන් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර දක්වනු ලැබේ.

සිත්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සිත්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ හෝ වසර 50 යන දෙකෙන් අවමය |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| 2014 වර්ෂයේ සිට මිලදී ගත් මෝටර් රථ | වර්ෂ 10 ක් තුළ |
| පරිගණක දෘඩාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක දේපල, පිරියත හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර 5කට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් තුළදී ප්‍රත්‍යක්ෂ වූ විටය.

ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, මූල්‍ය තත්ව ප්‍රකාශයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මිට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම්, ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් බැහැර කිරීමේදී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

ප්‍රාග්ධන නොනිම් වැඩ එහි පිරිවැයට දක්වා ඇත. මෙම වියදම් ප්‍රාග්ධන ස්වභාවයේ වන අතර ගොඩනැගිලි ඉදිකිරීමේ දී ප්‍රධාන පිරියත සහ යන්ත්‍ර සහ පද්ධති සංවර්ධනයේදී සෘජුව දරා ඇති අතර ප්‍රාග්ධනීකරණය කිරීමට සූදානමින් පවතින වියදම් වේ.

**2.6.4 අස්පෘශ්‍ය වත්කම්**

පරිගණක දෘඩාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග, අස්පෘශ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හාණිකරණ අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

මෘදුකාංග වත්කම් සඳහා පසුකාලීනව ඇතිවන වියදම් ප්‍රාග්ධනීකරණය කරන්නේ එමගින් ඊට අදාල නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන්නේ නම් පමණි. අනෙකුත් සියලු වියදම් දරන ලද අවස්ථාවේදී ම වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ අපේක්ෂිත පරිභෝජන රටාව මැනවින් පිළිබිඹු වන බැවින් අදාල වත්කම පාවිච්චිය සඳහා සූදානම් දිනයේ සිට වසර 4ක එළඹයි ජීව කාලයක් තුළ සෘජු පදනමක් යටතේ ක්‍රමයෙන් ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**2.6.5 අනෙකුත් වත්කම්**

අනෙකුත් වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

**2.6.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සලකුණු දක්වන්නේ නම් හෝ පවත්නා සිද්ධීන් හෝ වෙනත් තත්ත්වයක් හේතුවෙන් ධාරණ අගය හානි වියහැකි බව පෙන්නුම් කරන්නේ නම් බැංකුව විසින් ඒවා එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඉගියක් පවතී නම්, බැංකුව විසින් වත්කමෙන් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය අයකරගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සලකා, අයකර ගත හැකි වටිනාකමට ගිණුම් තබනු ලැබේ. හාණිකරණ අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**2.6.7 ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

**2.6.8 සංසරණයේ පවතින මුදල්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

**2.6.9 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනාක්‍රම**

බැංකුව විසින් මෙහෙයවනු ලබන විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම 29 වැනි සටහනෙහි හෙළිදරව් කර ඇත.

**2.6.10 නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රමයන් යනු නිශ්චිත දායක යෝජනා ක්‍රමයක් නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි.

බැංකුව විසින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ.

එක් එක් නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා බැංකුවේ බැඳීම් වෙන වෙනම ගණනය කරන අතර එහිදී සේවා නියුක්තිකයින්ගේ වර්තමාන හා පෙර කාලසීමාවන් හි සපයන ලද සේවාවන්ට ඉපැයූ ප්‍රතිලාභවල අනාගත ප්‍රතිලාභ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී ප්‍රතිලාභ වට්ටම් කර එහි වර්තමාන අගය තීරණය කරයි. මෙහිදී හඳුනානොගත් අතීත සේවා පිරිවැය සහ යෝජනා ක්‍රමයේ වත්කම්වල සාධාරණ අගය අඩුකරනු ලැබේ. වට්ටම් අනුපාතය වනුයේ ඉදිරියට ඇති සේවා කාලයේ සාමාන්‍යයට ආසන්න කල්පිරීම් දිනයන් සහිත රජයේ බැඳුම්කර තක්සේරු දිනට ඉපැයීම් අනුපාතයයි. සටහන් අංක 29 හි හෙළිදරව් කල සියළුම ප්‍රධාන ආයුගණන උපකල්පන, සම්පූර්ණ ආයුගණන තක්සේරුවක් කල අවස්ථාවකදී පමණක් සංශෝධනය කරනු ලැබේ.

**2.6.11 නිශ්චිත දායක යෝජනා ක්‍රම**

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිශ්චිත දායක යෝජනා ක්‍රමයේ දායකත්ව වගකීම් ඒවා පැන නගින අවස්ථාවන්හිදී ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

**2.6.12 ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශනයට මුදාහරිනු ලැබේ.

**2.6.13 අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්**

ආර්ථික ප්‍රතිලාභ මාරුවීම නිශ්චිත නොවන හෝ විශ්වසනීය ලෙස අගය කළ නොහැකි සිදුවීමක් හෝ වර්තමාන බැඳීමක් මගින් පමණක් පැවැත්ම තහවුරු කෙරෙන පැන නැගිය හැකි බැඳීමක් අසම්භාව්‍ය වගකීමක් ලෙස හැඳින්වේ. ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර අදාල ශීර්ෂ යටතේ අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් අයිතම ලෙස හෙළිදරව්කර ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

**2.7 ආදායම් ප්‍රකාශනය**

**ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් හා වියදම් හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීම් හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලිය යුතුය.

**2.7.1 පොලී ආදායම් සහ වියදම්**

පොලිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව, සඵල ඵලදායිත්ව ක්‍රමයට, උපචිත පදනම මත පොළී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන, සුරැකුම්පත් මත උපයන කූපන්, භාණ්ඩාගාර බිල්පත්, අනිකුත් වට්ටම් උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල පොළී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොළී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොළී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**2.7.2 ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**2.7.3 විවිධ**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේදී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම්, බැහැර කිරීමේදී දරණ ලද වියදම් අඩුකොට ආදායම් ප්‍රකාශනයෙහි ගිණුම්ගත කර ඇත. ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**2.7.4 සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම්, අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

**2.7.5 ක්‍රියාත්මක කල්බදු**

ක්‍රියාත්මක කල්බදු මත වන සියලු කල්බදු කුලිය සරල මාර්ග ක්‍රමය අනුව කල්බදු කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**2.7.6 බදුකරණය**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. තවද 2013 අංක 06 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත යටතේ සහ 2013 අංක 17 දරණ එකතුකළ අගය මත බදු (සංශෝධිත) පනත යටතේ ආර්ථික සේවා ගාස්තු සහ මූල්‍ය සේවා සැපයීම මත වන එකතුකළ අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

## 3. ප්‍රකාශිත නමුත් මේ වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන්

ප්‍රකාශිත නමුත් බැංකු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කරන දිනය වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් පහත පරිදි වේ. මෙම ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් අනාගත දිනක දී අදාළ වන බවට බැංකුව බලාපොරොත්තු වේ. මෙම ප්‍රමිතීන් බල සහිත වූ විට ඒවා අදාළ කරගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

**3.1 ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09: මූල්‍ය උපකරණ**

2014 ජූලි මස නිකුත් කරන ලද ජා.මූ.වා. ප්‍ර 09, 2018 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේදයන් සඳහා බලපැවැත්වෙන අතර ඊට පෙර වුවද අනුගත වීමට අවසර ලබාදී ඇත. මෙමගින් ජා.ගි.ප්‍ර.අ. 39 මූල්‍ය උපකරණ: හඳුනාගැනීම සහ අගය කිරීම ප්‍රමිතය ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.

ජා.මූ.වා.ප්‍ර. 09 අනුගත වීම නිසා 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශයන්ට විය හැකි බලපෑම බැංකුව විසින් බාහිර උපදේශකයකුගේ සහය ඇති ව මූලික ව තක්සේරු කර ඇත.

එම තක්සේරු ව අනුව (2016 දෙසැම්බර් 31 වන දින ශේෂයන් මත පදනම් ව) මුළු ඇස්තමේන්තු ගැලපුම් පහත පරිදි වේ.

- හානිකරණ අවශ්‍යතා වෙනුවෙන් දළ වශයෙන් 1.5% - 3% අතර ශුද්ධ ලාභයේ අඩුවීමක්.
- හානිකරණ අවශ්‍යතාවලට හැර වර්ගීකරණ හා අගය කිරීමේ අවශ්‍යතා මත පදනම් ව 5% - 8% අතර ශුද්ධ වත්කම්වල වැඩිවීමක්.

අනුගත වීමට අදාල සියලු කාර්යයන් අවසන් කර නොමැති බැවින් ඉහත තක්සේරුව මූලික තක්සේරුවක් පමණි. 2018 ජනවාරි 01 දින සිට ජා.මූ.වා.ප්‍ර 09ට අනුගත වීම තුලින් ඇතිවන සත්‍ය බලපෑම පහත සඳහන් දෑ නිසා වෙනස් විය හැකි ය.

- ගිණුම්කරණ ක්‍රියාවලිය සහ අභ්‍යන්තර පාලනයන්ට ජා.මූ.වා.ප්‍ර 09 නිසා විය හැකි සංශෝධනයන් සම්පූර්ණයෙන් අවසන් කර නොතිබීම.
- නව ප්‍රමිතිය අනුව පළමුවරට සකස් කරන්නා වූ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අවසන් කරන තෙක් ගිණුම්කරණ ප්‍රතිපත්ති, උපකල්පන, විනිශ්චයන් හා තක්සේරු ක්‍රමවල විය හැකි වෙනස්කම්.

**මූල්‍ය වත්කම් වර්ගීකරණය**

නව ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය වත්කම් වර්ගීකරණය හා අගය කිරීම සඳහා නව ප්‍රවේශයක් හඳුන්වා දෙනු ලැබේ. ඒ අනුව මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය සහ මුදල් ප්‍රවාහයන්හි ස්වරූපය අනුව ඇගයුම් කළ යුතුය.

මූල්‍ය වත්කම් වර්ගීකරණ ප්‍රධාන ක්‍රම තුනක් ජා.මූ.වා.ප්‍ර. 9 හි ඇතුලත් වේ. එනම්, ක්‍රමක්ෂය පිරිවැයට, අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට සහ ලාභ හෝ පාඩුව මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ගීකරණය කළ යුතු බවට ප්‍රමිතයෙන් නිර්දේශ කරනු ලැබේ. මෙමගින් ජා.ගි.ප්‍ර. 39 හි අඩංගු වූ ''වෙළඳාම සඳහා තබාගෙන ඇති'', ''කල්පිරෙන තෙක් තබාගෙන ඇති'', ''ණය සහ ලැබීම්'' සහ ''විකිණීම සඳහා ඇති වත්කම්'' යන වර්ගීකරණ කාණ්ඩයන් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.

**ක්‍රමක්ෂය පිරිවැය**

පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන සහ ලාභ හෝ පාඩු මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටත් වර්ගීකරණය නොකළ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

- එම මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස්කිරීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යාම.
- මූල්‍ය වත්කම් ගිවිසුම්ගත කොන්දේසි ප්‍රකාරව නිශ්චිත දිනයන්හිදී මූලික ගෙවීම සහ මූලික ගෙවීමට අදාල පොලිය පමණක් සම්පූර්ණයෙන් මුදල් ප්‍රවාහයන් ලෙස ජනනය වීම.

**අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය**

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසිවලට අනුකූල නම් සහ ලාභ හෝ පාඩු මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ග කළ නොහැකි නම් එම මූල්‍ය වත්කම් අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට අගය කළ හැක.

- යම් කිසි මූල්‍ය වත්කමක් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීමේ හා මූල්‍ය වත්කම් විකිණීම යන පරමාර්ථ ද්විත්වයෙන් ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කම ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව නිශ්චිත දිනයන්හිදී මූලික ගෙවීම සහ මූලික ගෙවීමට අදාල පොලිය පමණක් සම්පූර්ණයෙන් මුදල් ප්‍රවාහයන් ලෙස ජනනය වීම.

විකිණීම සඳහා නොවන ලෙස මූලික ව හඳුනාගත් හිමිකරු ප්‍රාග්ධන ආයෝජන, අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය යටතේ නැවත වෙනස් කළ නොහැකි පරිදි වාර්තා කිරීමට බැංකුවට තෝරාගත හැකිය. මෙම තෝරාගැනීම ආයෝජනයෙන් ආයෝජනයට සිදු කරනු ලැබේ.

ක්‍රමක්ෂය පිරිවැයට සහ අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට අගය නොකරන සියලුම මූල්‍ය වත්කම් ලාභ හෝ පාඩු මත සාධාරණ අගය යටතේ අගය කරනු ලැබේ.

ජා.මු.වා.ප්‍ර. 9 විෂය පථය යටතේ මූල්‍ය වත්කමක් හා සබැඳි ගිවිසුම් හි අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වෙන වෙන ම නොදක්වයි. ඒ වෙනුවට, දෙමුහුන් මූල්‍ය උපකරණ සමස්ථයක් ලෙස වර්ගීකරණය සඳහා තක්සේරු කෙරේ.

**බලපෑම තක්සේරුව - වර්ගීකරණය**

2018 ජනවාරි 01 දිනට පවතින මූල්‍ය වත්කම් මෙම ප්‍රමිතිය අනුව වර්ගීකරණය හා ඇගයීම මගින් සිදුවන බලපෑම පහත පරිදි වේ.

- ජා.ගි.ප්‍ර. අංක 39 යටතේ ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට අගය කරන ලද හා ගනුදෙනු කිරීම සඳහා පවතින ලෙස වර්ගීකරණය කළ අවදානම් කළමනාකරණය සඳහා පවත්වාගෙන ගිය අලෙවිය සඳහා වූ වත්කම් හා ව්‍යුත්පන්න වත්කම් ජා.මු.වා.ප්‍ර. අංක 09 යටතේ ද ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට ම අගය කරනු ඇත.
- ජා.ගි.ප්‍ර. 39 යටතේ අනිකුත් ලැබිය යුතු දෑ ලෙස වර්ග කරන ලද සහ ක්‍රමක්ෂය පිරිවැයට අගය කරන ලද බැංකු සහ ගනුදෙනුකරුවන් වෙත ලබාදුන් ණය සහ අත්තිකාරම් ජා.මු.වා.ප්‍ර. 09 යටතේ ද සාමාන්‍යයෙන් ක්‍රමක්ෂය පිරිවැයට ම අගය කරනු ලැබේ.
- ජා.ගි.ප්‍ර. 39 යටතේ ක්‍රමක්ෂය පිරිවැයට අගය කරන ලද කල් පිරෙන තෙක් රඳවාගෙන ඇති ආයෝජන සුරැකුම්පත් ජා.මු.වා.ප්‍ර. 09 යටතේ ද ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.
- ජා.ගි.ප්‍ර. 39 යටතේ විකුණුම් සඳහා වූ ආයෝජන ලෙස වර්ග කළ ණය ආයෝජන සුරැකුම්පත්, ජා.මු.වා.ප්‍ර. 09 යටතේ දී ඒ ඒ අවස්ථාවේදී බලපවත්නා තත්ත්වයන්ට අනුව ක්‍රමක්ෂය පිරිවැය, අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට හෝ ලාභ හෝ පාඩුව මත සාධාරණ අගයට අගය කරනු ලැබේ.
- ජා.ගි.ප්‍ර. 39 යටතේ අලෙවිය සඳහා වන ලෙස වර්ග කළ බොහෝමයක් හිමිකම් ස්කන්ධ ආයෝජන සුරැකුම්පත්, ජා.මු.වා.ප්‍ර. 09 යටතේ ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට අගය කරනු ලැබේ. කෙසේ නමුත් දීර්ඝ කාලීන උපායමාර්ගික අරමුණ සඳහා තබාගන්නා සමහර ස්කන්ධ ආයෝජන සුරැකුම්පත් අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට 2018 ජනවාරි 01 දිනට වර්ග කරනු ඇත.

**හානිකරණය - මූල්‍ය වත්කම්, ණය සඳහා වූ බැඳීම් සහ මූල්‍ය ඇප කොන්ත්‍රාත්**

ජා.මු.වා.ප්‍ර. 09 මගින් ''දරන ලද අලාභ'' ක්‍රමය ඉදිරි දැක්මක් මත පදනම් වන ''අපේක්ෂිත ණය අලාභ'' ක්‍රමවේදය මගින් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ. මෙම නිසා ආර්ථික විචල්‍යන්ගේ වෙනස්වීම් අපේක්ෂිත ණය අලාභ මත බලපාන ආකාරය පිළිබඳව සැලකිය යුතු විනිශ්චයක් සිදු කළ යුතු අතර මෙය බර තැබූ සම්භාවිතා පදනම් මත තීරණය කරනු ලැබේ.

ලාභ හෝ පාඩුව මත සාධාරණ අගයට අගය නොකළ පහත මූල්‍ය උපකරණ සඳහා නව හානිකරණ ක්‍රමය අදාල වේ.

- මූල්‍ය වත්කම් වන ණය උපකරණ
- නිකුත් කළ ණය සඳහා වූ බැඳීම් හා මූල්‍ය ඇප කොන්ත්‍රාත්තු (මීට පෙර ජා.ගි.ප්‍ර. 37 ''වෙන්කිරීම්, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්'' මත හානිකරණය කරන ලදී.)

ජා.මු.වා.ප්‍ර. 09 යටතේ හිමිකරු ස්කන්ධ ආයෝජන සඳහා හානිකරණ අලාභ හඳුනාගනු නොලැබේ.

ජා.මු.වා.ප්‍ර. 9 යටතේ මාස 12 ක අපේක්ෂිත ණය අලාභ හෝ ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් හඳුනාගැනීම කළ යුතුය. ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභ යනු මූල්‍ය උපකරණයක ජීව කාලය තුළ සියලුම විය හැකි ණය පැහැරහැරීම්වලින් ජනනය වන අපේක්ෂිත ණය අලාභය වන අතර මාස 12 ක අපේක්ෂිත ණය අලාභ යනු වාර්තාකරණ දිනයේ සිට මාස 12 ක් ඇතුලත ණය පැහැරහැරීම්වලින් ජනනය විය හැකි අපේක්ෂිත ණය අලාභවල එකතුව වේ.

**ණය පැහැර හැරීමේ නිර්වචනය**

ජා.මු.වා.ප්‍ර. 09 හි ''හානිකරණය වූ ණය'' නිර්වචනය සැලකිල්ලට ගනිමින් ශ්‍රී.ලං.ම.බැ. විසින් ණය පැහැරහැරීමේ නිර්වචනය තක්සේරු කර ඇත. එනම්;

- ණය නිකුත් කරන්නා හෝ ගැනුම්කරුවා මුහුණ දෙන ප්‍රමාණාත්මක මූල්‍ය දුෂ්කරතාවය;
- ණය පැහැරහැරීමක් හෝ අතීත ණය නොගෙවීමේ අවස්ථාවක් වැනි ගිවිසුම උල්ලංඝනය කිරීමක්;
- ණය ලබාගන්නාගේ මූල්‍ය දුෂ්කරතා සම්බන්ධ ආර්ථික හෝ ගිවිසුම්මය හේතූන් මත ණය ලබාදෙන්නා විසින් සාමාන්‍ය තත්ත්වයන් යටතේ ලබානොදෙන සහනයක් ලබාදී තිබීම;
- ණය ගැනුම්කරු බුන්වත් වීම හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානය වීමට ඇති වැඩි සම්භාවිතාවය;
- මූල්‍ය දුෂ්කරතාවයක් හේතුවෙන් මූල්‍ය වත්කම් සඳහා සක්‍රීය වෙළඳපොළ අහිමිවීම; හෝ,
- මූල්‍ය වත්කමක් දරන ලද ණය අලාභ පිළිඹිබු වන සේ මිලදී ගැනීම හෝ උත්පාදනය වීම.

ශ්‍රී.ලං.ම.බැ. භාවිතා කරන ණය පැහැර හැරීමේ නිර්වචනය ස්වාධීන ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන වන මූඩීස්, ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් සහ බ්ලුම්බර්ග් භාවිත කරන නිර්වචන සමග බොහෝ සෙයින් සමාන වේ.

**ණය අවදානමෙහි සැලකිය යුතු වර්ධනය**

නව ප්‍රමිතය යටතේ මූල්‍ය උපකරණයක ණය අවදානම ආරම්භක හඳුනාගැනීමේ සිට සැලකිය යුතු ඉහළ යෑමක් සිදුවී ඇත්ද යන්න නිර්ණය කිරීමේදී බැංකුව විසින් බාහිර ණය ශ්‍රේණිගත කිරීම ආයෝජන ශ්‍රේණියට වඩා පහළ යාම හෝ ණය පැහැරහැරීමේ සම්භාවිතාව දෙගුණ වීමට හේතුවන ලෙස ණය ශ්‍රේණිගත කිරීම පහල යෑම සලකා බලනු ඇත.

අපේක්ෂිත ණය අලාභය අගය කිරීමේදී ප්‍රධාන යෙදවුම් වශයෙන් පහත විචල්‍යයන්ගේ කාලීන ව්‍යුහයන් අනුව බොහෝ දුරට තීරණය වේ.

- ණය පැහැර හැරීමේ සම්භාවිතාව
- ණය පැහැර හැරීම මත අලාභ
- ණය පැහැර හැරීමකදී ණය නිරාවරණය

අභ්‍යන්තරව සැකසූ සංඛ්‍යාන ක්‍රම සහ අනෙකුත් ඓතිහාසික දත්ත යොදාගෙන මෙම පරාමිතීන් සකසනු ලැබේ. එම පරාමිතීන් තුළින් අනාගත තොරතුරු පිළිඹිබු වන ලෙස පහත විස්තර කර ඇති පරිදි ගැලපුම් කරනු ලැබේ.

**ණය පැහැර හැරීමේ සම්භාවිතාව**

වෙළඳපල තොරතුරු සහ සංඛ්‍යාන ක්‍රම භාවිත කර විවිධ කාණ්ඩයන්හි ප්‍රතිපාර්ශ්වයන්ට හා නිරාවරණයන්ට අදාල ව ගණනය කරනු බලන ඇස්තමේන්තුවකි.

**ණය පැහැර හැරීම මත අලාභ**

ණය ගෙවීම පැහැරහැරීමක දී වන අලාභයේ ප්‍රමාණයයි. ණය පැහැරහැරීම මත අලාභ ගණනය කරන ක්‍රමයන් මගින් ව්‍යුහය, ඇප සුරැකුම, හිමිකමෙහි ජ්‍යෙෂ්ඨත්වය, ප්‍රති පාර්ශ්වයන්ගේ කර්මාන්ත සහ යම් මූල්‍ය වත්කමක ඇප සුරැකුමකට අදාල ව නැවත අයකර ගැනීමට දරන පිරිවැය යනාදිය සලකා බලනු ඇත.

**ණය පැහැර හැරීමකදී ණය නිරාවරණය**

ණය පැහැරහැරීමකදී වන ණය නිරාවරණය මෙයින් දැක්වේ. වර්තමානයේ දැනට ප්‍රතිපාර්ශවයට ඇති නිරාවරණය, ක්‍රමක්ෂය සහ පෙරගෙවුම් ඇතුල්ව ගිවිසුමට අනුව දැනට ඇති අගයට විය හැකි වෙනස්කම් අයුරින් ණය පැහැරහැරීමකදී ණය නිරාවරණය ගණනය කරනු ලැබේ. මූල්‍ය වත්කමක ණය පැහැරහැරීමකදී, ණය නිරාවරණය වනුයේ එම වත්කමෙහි ගෙවීම පැහැර හරින විටදී ඇති දළ ධාරණ අගයයි.

**ඉදිරි දැක්මක් සහිත තොරතුරු**

ජා.මු.වා.ප්‍ර. 09 යටතේ බැංකුව විසින් මූල්‍ය උපකරණයක් ප්‍රථම වරට හඳුනාගැනීමේ සිට සැලකිය යුතු ලෙස වර්ධනය වී ද සහ එහි අපේක්ෂිත ණය අලාභ අගය කිරීම සඳහා ඉදිරි දැක්මක් සහිත තොරතුරු උපයෝගී කර ගනු ලැබේ. බැංකුව විසින් අදාල ආර්ථික විචල්‍යන්ගේ අනාගත ගමන් මග තීරණය කිරීම සඳහා ''පදනම් සිද්ධියක්'' යොදා ගන්නා අතර අනෙකුත් පුරෝකථන සිද්ධීන් සඳහා නියෝජනාත්මක පරාසයක් විවිධ සත්‍ය හා පුරෝකථනය කරන ලද බාහිර තොරතුරු යොදා ගනු ලැබේ.

**මූල්‍ය වගකීම් වර්ගීකරණය කිරීම**

මූල්‍ය වගකීම් වර්ගීකරණය සඳහා ජා.මු.වා.ප්‍ර. 09 මගින් ජා.ගි.ප්‍ර 39 හි පවතින අවශ්‍යතාවලින් සැලකිය යුතු වෙනස්වීමක් දක්නට නොමැත. නමුත් ජා.ගි.ප්‍ර. 39 යටතේ ලාභ හෝ පාඩු මත සාධාරණ මිලට හඳුනාගෙන ඇති මූල්‍ය වගකීම්වල සියලු සාධාරණ අගයන්ගේ වෙනස්වීම් ලාභාලාභ සඳහා හඳුනාගන්නා ලදී. නමුත් නව ප්‍රමිතය මගින් සාධාරණ අගයන් වෙනස්වීම් පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

- මූල්‍ය වගකීමක ණය අවදානමේ වෙනස්වීමට අදාල සාධාරණ අගයේ වෙනස්වීම අනෙකුත් විස්තීරණ ආදායම් යටතේ ඉදිරිපත් කරනු ලැබේ.
- සෙසු සාධාරණ අගයේ වෙනස්වීම් ලාභලාභ යටතේ ඉදිරිපත් කෙරේ.

**බැංකුව ජා.මු.වා.ප්‍ර. 09 සඳහා අනුගත වීමේ ක්‍රියාපටිපාටිය**

නව ජා.මු.වා.ප්‍ර. 09 භාවිත කිරීම නිසා ඇතිවන ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල වෙනස්වීම අතීතයට බලපාන පරිදි ගලපනු ලැබේ.

**3.2 ජා.මු.වා.ප්‍ර. 16 - කල්බදු**

2016 ජනවාරි මස දී, IASB විසින් කල්බදු ගිණුම් තැබීම සඳහා නව ප්‍රමිතියක් ලෙස ජා.මු.වා.ප්‍ර. 16 නිකුත් කරන ලදි. නව ප්‍රමිතිය මගින් කල්බදු හිමියා වෙනුවෙන් ගිණුම් තැබීමෙහි සැලකිය යුතු වෙනසක් සිදුකර නොමැත. කෙසේවෙතත්, කල්බදු ගැනුම්කරුවන් හට තම බොහොමයක් කල්බදු අනුරූප පාවිච්චි කිරීමේ අයිතියද සමග මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන්හි කල්බදු වගකීම් ලෙස හඳුනාගැනීම අවශ්‍ය වේ. කල්බදු ගැනුම්කරුවන් සියලුම හඳුනාගත් කල්බදු සඳහා එක් ආදර්ශකයක් යොදා ගත යුතු නමුත් කෙටිකාලීන කල්බදු සහ අඩු අගයන්ගෙන් යුත් වත්කම්වල කල්බදු හඳුනා නොගැනීමට විකල්පයක් පවතිනු ඇත. සාමාන්‍යයෙන් හඳුනාගත් කල්බදු සඳහා වන ලාභ සහ අලාභ ගිණුම්කරණ රටාව, වර්තමාන මූල්‍ය කල්බදු ගිණුම්ගත කරන ආකාරයට සමාන වන අතර එහි දී පොළී වියදම සහ ක්ෂය වියදම යන කොටස් දෙක ද ආදායම් ප්‍රකාශය තුළ වෙනම හඳුනා ගනු ලැබේ.

ජා.මු.වා.ප්‍ර. 16, 2019 ජනවාරි 01 වන දිනට හෝ ඊට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන්වලට බලාත්මක වේ. නව ආදායම් ප්‍රමිතිය වන ජා.මු.වා.ප්‍ර. 15 ද මෙම කල්බදු ප්‍රමිතිය සමගම එකම දින ප්‍රායෝගිකව භාවිත කිරීම ආරම්භ කිරීමට යටත්ව ජා.මු.වා.ප්‍ර. 16 කලින් ක්‍රියාත්මක කිරීමට අවසර ඇත. කල්බදු ගැනුම්කරුවන් විසින් ජා.මු.වා.ප්‍ර. 16 මුළුමනින් ම හෝ වෙනස් කරන ලද අතීතානුයෝගී ගැලපුමක් වශයෙන් යොදා ගත යුතුය. බැංකුව ජා.මු.වා.ප්‍ර. 16 කලින් යොදාගැනීමක් අපේක්ෂා නොකරන අතර වර්තමානයේ එහි බලපෑම අගයමින් සිටී.

**3.3 ජා.මු.වා.ප්‍ර. 15 - ගණුදෙණුකරුවන් සමග වූ කොන්ත්‍රාත්තු මත ආදායම**

IASB විසින් 2014 මැයි මස ගණුදෙණුකරුවන් සමග වූ කොන්ත්‍රාත්තු මත ආදායම මැයෙන් වන ජා.මු.වා.ප්‍ර. 15, 2018 ජනවාරි 01 දින සිට ආරම්භ වන මූල්‍ය වර්ෂයන්ට බලාත්මක වන අයුරින් හා කලින් ක්‍රියාත්මක කිරීමට අවසර ලබා දෙමින් නිකුත් කරන ලදි. ජා.මු.වා.ප්‍ර. 15 ආදායම් හඳුනාගැනීම සඳහා ප්‍රතිපත්ති නිර්වචනය කරන අතර ගනුදෙනුකරුවන් සමග වන සියලු ගිවිසුම් සඳහා අදාළ වනු ඇත. කෙසේවෙතත්, මූල්‍ය උපකරණ හා කල්බදු සම්බන්ධයෙන් වන පොළී සහ

ගාස්තු ආදායම ජා.මු.වා.ප්‍ර. 15 හි විෂයපථයෙන් පරිබාහිරව පවතිනු ඇති අතර වෙනත් සුදුසු ප්‍රමිතීන් මගින් නියාමනය වනු ඇත (උදා:- ජා.මු.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ සහ ජා.මු.වා.ප්‍ර. 16 කල්බදු). ජා.මු.වා.ප්‍ර. 15ට අනුව ආදායම හඳුනා ගත හැකි වන්නේ පැවරුම්කරු භාණ්ඩ හා සේවාවල අයිතිය අපේක්ෂා කරන තෙක් වේ. මෙම ප්‍රමිතිය මගින් ආදායමේ ස්වභාවය, ප්‍රමාණය, කාල නිශ්චය, ආදායමෙහි අනියතතාවය සහ ගණුදෙනුකරුවන් සමග වන මුදල් ප්‍රවාහ යනාදී විස්තීරණ හෙළිදරව් කිරීම් රැසක් විශේෂණය කරනු ලබයි.

බැංකුව ජා.මු.වා.ප්‍ර. 15 කලින් යොදාගැනීමක් අපේක්ෂා නොකරන අතර වර්තමානයේ එහි බලපෑම අගයමින් සිටී.

## 4. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවරෙන අතර, බැංකුවේ කළමනාකාරිත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- මූල්‍ය පද්ධතියෙහි නිදහස් තරගකාරිත්වය සහ ස්ථායීතාවය සැලසීම.
- සුදුසුකම්ලත් මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබාදීම සහ අධීක්ෂණය.
- අන්තර් බැංකු බේරුම් කිරීමේ පද්ධතිය සංවිධානය හා කළමනාකරණය සහ ගෙවීම් පද්ධතියෙහි නිසි ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජය සහ රජය වෙනුවෙන් ක්‍රියාකරන නියෝජිත ආයතන සමග නිශ්චිත විධිවිධාන යටතේ සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියාකිරීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සපුරාගැනීම සඳහා පවත්වා ගෙනයන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාළව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

### 4.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් පවතී.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් ස්වෛරී සුරැකුම්පත් ප්‍රතිවර්තිත මිලදී ගැනීමේ ගනුදෙනු යටතේ දරනු ලබන සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන වෙත වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

### 4.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික විටට වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) විවෘත වෙළෙඳපොළ කටයුතු සඳහා ආධාරකයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

### 4.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

භාරකාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන මුදල්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් හි අන්තර්ගත කොටසක් නොවන බැවින් ඒවා මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොමැත.

## 5. මුදල් සහ මුදලට සමානයන්

| | 2017<br>රු. 000 | 2016<br>රු. 000 |
|---|---|---|
| බැංකු සමග ඇති ශේෂයන් | **16,518,603** | 68,594,961 |
| බැංකු සමග ඇති කාලීන තැන්පතු | **269,193,626** | 281,094,724 |
| එක්දින ස්ථාපනය කිරීම් | **173,979,333** | 74,031,160 |
| මුදල් සහ මුදලට සමාන දෑ සඳහා ලැබිය යුතු පොලී | **136,079** | 62,892 |
| එකතුව | **459,827,641** | 423,783,737 |

### 6. විදේශීය සුරැකුම්පත්වල අයෝජනයන්

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| **ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත්** | | |
| - විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් | **29,988,753** | 29,882,588 |
| - රන් (බෙදා වෙන් කළ නොහැකි) | **15,275,623** | 13,396,167 |
| | **45,264,376** | 43,278,755 |
| **විකිණීම සඳහා ඇති ආයෝජන** | | |
| - විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් | **566,228,935** | 341,225,162 |
| - ඒකක ආයෝජන | **-** | 7,319,488 |
| | **566,228,935** | 348,544,650 |
| **විදේශ සුරැකුම්පත්වල එකතුව** | **611,493,311** | 391,823,405 |

ලාභ හෝ පාඩුව තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද විදේශීය සුරැකුම්පත් ආයෝජන තුළ ශ්‍රී ලංකා මහ බැංකුව 2016 වසර තුළදී ලෝක බැංකුව මගින් පාලනය කරනු ලබන සංචිත කළමනාකරණය සහ උපදේශන වැඩසටහන (RAMP)හි කරන ලද ආයෝජන ඇතුළත් වේ. එම RAMP ආයෝජනයේ 2017 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. මිලියන 29,988.75 ක් වේ.

### 7. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

**7.1** පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමෙහි නිර්දේශ අනුපාතයෙහි හෝ දර්ශකයෙහි අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟවේ.

| | 2017 | | | 2016 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 |
| මුදල් හුවමාරු (Currency SWAPS) | **4,939,919** | **3,403,866** | **228,553,847** | 198,880 | 8,659,453 | 374,297,030 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forward Forex) | **536** | **-** | **132,773** | - | 2,410 | 2,771,960 |
| අන්තර්ගත ව්‍යුත්පන්න විනිමය විකල්පයන් (Currency Option) | **-** | **1,244,581** | **13,374,795** | - | 5,911,812 | 85,524,565 |
| එකතුව | **4,940,455** | **4,648,449** | **242,061,415** | 198,880 | 14,573,675 | 462,593,555 |

**7.2** ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වනුයේ මුදල් හුවමාරු, මුදල් විකල්ප, ඉදිරි විදේශ විනිමය ගිවිසුම්, සහ පොළී අනුපාත හුවමාරුවලිනි. මෙවැනි උපකරණ යොදා ගනුයේ බැංකුවේ ව්‍යවස්ථාපිත අරමුණක් වන ජාත්‍යන්තර අරමුදල් පවත්වා ගැනීමේ දී පැන නගින්නා වූ වෙළඳපොළ සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීම සඳහාය. මීට අමතරව මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ විදේශ මහ බැංකු සමග හුවමාරු ගිවිසුම්වලට එළඹීම මගින් ශ්‍රී ලංකා රුපියල අන්තර්ජාතිකව ස්ථාවරව පවත්වා ගැනීමත්, දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමත්, විදේශ මුදල් රටතුලට ගෙන ඒමට එම බැංකු දිරිමත් කිරීමත් අපේක්ෂා කෙරේ.

**7.3** ව්‍යුත්පන්නයන් යනු පොළී අනුපාත, මූල්‍ය උපකරණවල වටිනාකම, භාණ්ඩ මිල ගණන්, විදේශ විනිමය අනුපාත, ණය අවදානම් සහ දර්ශක වෙනස්වීම්වලට අනුව අගය තීරණය වන මූල්‍ය ගිවිසුම්ය.

**7.4** කෙටිකාලීන ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා වූ උපායමාර්ගයක් ලෙස එළඹුණු මුදල් හුවමාරු (Currency SWAP) බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ කළඹයෙහි වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. මුදල් හුවමාරුවකදී බැංකුව, නියමිත දින දෙකකදී එක් මුදල් වර්ගයකින් නිශ්චිත ප්‍රමාණයක් තවත් මුදල් වර්ගයක් සමග එකග වූ අනුපාතයන් යටතේ හුවමාරු කර ගනී.

**7.5** ඉදිරි විදේශ විනිමය ගිවිසුම් මගින් බැංකුව, එකග වූ අනුපාතයකට, එකග වූ ඉදිරි දිනයකදී නිශ්චිත විදේශ මුදල් ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටී.

**7.6** සමස්ථ අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ බැංකුව වෙත ලැබීම තහවුරු කිරීමට, බැංකුව විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වෙත නිරාවරණය වීම සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි.

### 8. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| විශේෂ ගැනුම් හිමිකම් දැරීම | **677,131** | 303,070 |
| ජා.මූ.අ. පංගුව | **125,996,456** | 116,559,364 |
| ජා.මූ.අ. තැන්පතු | **164,565** | 145,906 |
| මුළු ජා.මූ.අ. වත්කම් | **126,838,152** | 117,008,340 |

**8.1 විශේෂ ගැනුම් හිමිකම් දැරීම**

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සාමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා අනෙකුත් සංචිත මුදල් හුවමාරු කරගත හැකිවීමය. එකී සාමාජිකයන් එම මුදල් වි.ගැ.හි.

දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාලව විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම නිසා සංචිත වත්කමක් ලෙස වි.ගැ.හි. විශේෂ වේ. අබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ වාර්තාකරණ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

### 8.2 ජා.මූ.අ. පංගුව

ජා.මූ.අ. හි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබා ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රග්ධන දායකත්වයයි. එක් එක් රටවල පංගුව, පුළුල් වශයෙන්, එම රටෙහි සාපේක්ෂ ආර්ථික වටිනාකම පදනම් කර ගනිමින් තීරණය කරනු ලබයි. ජා.මූ.අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල්ව පිළිගත් විදේශ මුදලකින් හෝ විශේෂ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශීය මුදලින්ද ගෙවිය යුතුය. ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස නියෝජනය වේ.

ජා.මූ අරමුදලේ පොදු පංගු සමාලෝචන ගිවිසුම යටතේ, 2016 ජනවාරි මස දී 189ක් වූ ජා.මූ.අ සාමාජිකයන්ගේ පංගුව වැඩි කිරීමට තීරණය කරන ලදී.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ජා.මූ.අ. පංගුව වි.ගැ.හි. මිලියන 413.40 ක් වූ පෙර පංගු ප්‍රමාණයේ සිට 2016 පෙබරවාරි 17 වන දිනට වි.ගැ.හි. මිලියන 578.80 දක්වා වර්ධනය විය.

ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 20 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මඟින් ජා.මූ.අ. සමඟ රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

**i.)** **දායකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතුය.

**ii.)** **ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්දයක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. 100,000 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් ද බැගින් හිමි වේ. 2008 ප්‍රතිසංස්කරණ මඟින් මූලික ඡන්ද සංඛ්‍යාව මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 5.50 ක් ලෙස ස්ථාවර කරන ලදී.

**iii.)** **මූල්‍යකරණයට පිවිසීම** - ජා.මූ.අ. මගින් සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම් ප්‍රමාණය (එහි පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව මත තීරණය වේ. සම්පස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට වාර්ෂිකව පංගුවෙන් සියයට 145 ක් ද සමුච්චිත වශයෙන් සියයට 435 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

**iv.)** **වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ.

### 8.3 ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF - HIPC) භාර තැන්පතුව

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788,783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි.

## 9. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

මුදල් ප්‍රතිපත්ති යටතේ විවට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යාම සඳහා මුදල් නීති පනතේ 90(2) වගන්තිය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාගත් සහ පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සුරැකුම්පත් කළඹ මේ යටතට ගැනේ.

| | 2017<br>රු. 000 | 2016<br>රු. 000 |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | **9,704,962** | 320,605,082 |
| ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | **22,359,000** | 30,807,000 |
| ප්‍රති විකුණුම් ගිවිසුම් මත ලැබිය යුතු පොළී | **16,124** | 14,388 |
| | **32,080,086** | 351,426,470 |

## 10. රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

රජයේ ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අවසර ලබාදී ඇති වියදම් මූල්‍යනය සඳහා වූ නියමයන්හි සඳහන් කර ඇති තත්ත්වයන්ට යටත්ව මුදල් නීති පනතේ 89 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජයට ලබාදෙන අත්තිකාරම් මෙමගින් නියෝජනය කරයි.

## 11. බැංකුවලට දෙන ලද ණය

මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව ඵලදායීතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ.

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| මධ්‍යම සහ දීඝකාලීන ණය යෝජනා ක්‍රමය | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **29,146** | 31,340 |
| පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **28,254** | 112,652 |
| සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **49,539** | 101,176 |
| - අනෙකුත් | **14,211** | 30,768 |
| නැගෙනහිර ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **41,382** | 115,977 |
| - අනෙකුත් | **35,492** | 53,296 |
| උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **24,330** | 30,310 |
| පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය (අදියර II) | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **1,348** | 34,632 |
| - අනෙකුත් | **-** | 1,194 |
| අඩුකළා: | | |
| හානිකරණය (සටහන 11.1) | **-** | (27,302) |
| ශුද්ධ ලැබිය යුතු මුදල | **223,702** | 484,043 |

### 11.1 අඩමාන ණය සඳහා වෙන් කිරීමේ චලනය

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | **27,302** | 27,302 |
| වර්ෂය තුළ හානිකරණ කපා හැරීම | **(27,302)** | - |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **-** | 27,302 |

## 12. මූල්‍ය සහ අනිකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

මුදල් නීති පනතේ 105 (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. මෙය යටතේ මුදල් මණ්ඩලයේ අභිමතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ගැනීමට බැංකුව වෙත බලතල පවරා තිබේ.

(i) ආයෝජන තත්ත්වය

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | දරණ ප්‍රතිශතය 2017 | 2016 |
|---|---|---|---|
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **19.66** | 19.66 |
| සීමාසහිත ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | ණය ශ්‍රේණිගත කිරීම | **10.00** | 10.00 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **7.50** | 7.50 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | **19.30** | 19.30 |

(ii) අදාළ ආයතනවල වූ ආයෝජනයන්ගේ ධාරණ වටිනාකම

| ආයතනය | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | **5,845** | 5,845 |
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | **29,500** | 29,500 |
| සීමාසහිත ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | **3,500** | 3,500 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | **2,250** | 2,250 |
| මුළු ආයෝජනය | **41,095** | 41,095 |

## 13. අනිකුත් වත්කම්

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| මූල්‍ය වත්කම් | | |
| අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **6,443,984** | 5,208.837 |
| අභ්‍යන්තර අරමුදල් මත ලැබිය යුතු පොළී | **286,564** | 170,394 |
| වත්කම් මත හානිකරණ ගාස්තු | **(151,674)** | (139,131) |
| ශුද්ධ අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **6,578,874** | 5,240,100 |
| ක්‍රමක්ෂය පිරිවැයට කාර්ය මණ්ඩල ණය | **5,036,028** | 4,588,285 |
| භාණ්ඩාගාර සහ අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ | **54,490** | 1,401,497 |
| ක්‍රමක්ෂය පිරිවැයට ණයකර ආයෝජන (සටහන 13.1) | **-** | 11,964 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | **143,276** | 235,918 |
| | **11,812,668** | 11,477,769 |
| මූල්‍ය නොවන වත්කම් | | |
| කාර්ය මණ්ඩල ණය මත වූ විලම්භිත වත්කම් | **1,069,802** | 1,015,226 |
| | **12,882,470** | 12,492,990 |

**13.1** ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ රු. මිලියන 11.96 ක් වූ ක්‍රමක්ෂය පිරිවැයට ණයකර ආයෝජන යටතේ 2017 දෙසැම්බර් 3 කල්පිරුණි.

## 14. රන්

මුදල් නීති පනතේ 67(1) සහ 67(2) වගන්ති ප්‍රකාරව බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස බැංකුව සතුව ඇති රන්වල වටිනාකම මෙයින් අදහස් වේ. තවද මුදල් නීති පනතේ වගන්ති 67(2) ප්‍රකාරව, අවම වශයෙන් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ සෘජුව හෝ වක්‍රව පරිවර්ථනය කළ හැකි විනිමයක් ලෙසින් පවත්වාගැනීමට මුදල් මණ්ඩලයට සිදු වේ.

## 15. තොග

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| සංසරණය සඳහා ඇති නෝට්ටු | **4,442,014** | 3,402,661 |
| සංසරණය සඳහා ඇති කාසි | **1,850,723** | 1,779,021 |
| මාර්ගස්ථ කාසි | **-** | 116,197 |
| මාර්ගස්ථ නෝට්ටු | **568,716** | 803,227 |
| | **6,861,453** | 6,101,106 |
| අඩුකළා : සෙමින් චලනය වන අයිතමයන් සඳහා වෙන්කිරීම් | **(45,000)** | (45,000) |
| | **6,816,453** | 6,056,106 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | **58,881** | 58,557 |
| වෛද්‍ය මධ්‍යස්ථාන තොගය | **199** | 198 |
| පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට මුළු තොගය | **6,875,533** | 6,114,861 |

## 16. දේපළ පිරියත සහ උපකරණ

| පිරිවැය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | අනිකුත් ග්‍රන්ථ හා පරිශීලන ද්‍රව්‍ය | අනිකුත් නොනිමි ඉදිකිරීම් | එකතුව 2017 | එකතුව 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | 16,724,361 | 1,495,922 | 1,281,814 | 489,475 | 843,039 | 54,008 | 31,395 | **20,920,014** | 18,603,049 |
| ප්‍රත්‍යාගණන ලාභය | - | - | - | - | - | - | - | **-** | 1,848,249 |
| එකතු කිරීම් | - | 1,637 | 27,794 | 125,100 | 20,034 | 1,428 | 91,136 | **267,129** | 493,172 |
| බැහැර කිරීම් | - | (3,530) | (6,396) | (12) | (19,708) | - | - | **(29,646)** | (19,321) |
| මාරු කිරීම් | 18,839 | 73,641 | 1,845 | - | - | - | (94,325) | **-** | (5,135) |
| දෙසැම්බර් 31 දිනට අගය | 16,743,200 | 1,567,670 | 1,305,057 | 614,563 | 843,365 | 55,436 | 28,206 | **21,157,497** | 20,920,014 |

| ක්ෂය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | අනිකුත් කියවීම් උපකරණ | අනිකුත් නොනිමි ඉදිකිරීම් | එකතුව 2017 | එකතුව 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | 52,341 | 784,842 | 787,049 | 376,456 | 751,788 | 35,148 | - | **2,787,624** | 3,180,734 |
| වර්ෂය සඳහා ක්ෂය | 199,193 | 76,782 | 81,065 | 33,997 | 42,496 | 1,025 | - | **434,558** | 434,688 |
| ප්‍රත්‍යාගණන ගැලපුම් | - | - | - | - | - | - | - | **-** | (809,150) |
| බැහැර කිරීම් | - | (677) | (5,019) | (12) | (19,494) | - | - | **(25,202)** | (18,648) |
| දෙසැම්බර් 31 දිනට අගය | 251,534 | 860,947 | 863,095 | 410,441 | 774,790 | 36,173 | - | **3,196,980** | 2,787,624 |
| ශුද්ධ පොත් අගය | 16,491,666 | 706,723 | 441,962 | 204,122 | 68,575 | 19,263 | 28,206 | **17,960,517** | 18,132,390 |

ඉඩම් සහ ගොඩනැගිලිවල ධාරණ වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2016 දෙසැම්බර් 31 දිනට එෆ්.එම්. වැලුවර්ස් විසින් සිදු කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දිනට එය වාර්තාගත කර තිබුණි.

බැංකුවේ දේපලක් වන නිව්යෝර්ක් සහ බ්‍රසිල් දේපල සාධාරණ අගයට වාර්තා කර නොමැති අතර අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව 2016 නොවැම්බර් මස දී එම දේපල පිරිවැයට විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් යටතට මාරු කිරීමට තීරණය කර ඇත. තවද මෙම දේපළ, විකිණීම සඳහා රඳවාගෙන ඇති වත්කම් යටතේ වර්ගීකරණය නොකර දේපළ, පිරියත සහ උපකරණ යටතේ හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය වර්ෂය තුළදී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු. මිලියන 265.73 (2016 - රු.මිලියන 488.04) මුළු වටිනාකමින් යුත් දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගන්නා ලදී.

2017 දෙසැම්බර් 31 දිනට මුළුමනින්ම ක්ෂය කරන ලද නමුත් භාවිතයේ ඇති වත්කම්වල වටිනාකම රු. මිලියන 1,598.17 ක් වේ (2016 රු. මිලියන 1,404.91).

### බැංකුවේ සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හා කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලිවල තක්සේරු තොරතුරු

| දේපළ | වරලත් තක්සේරුකරුවන්ගේ නම | තක්සේරු ප්‍රවේශය | පර්චස් එකක ඇස්තමේන්තුගත මිල (රු.) | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල (රු.) | ඇස්තමේන්තුගත මාසික (රු.) | පිටතට යන වියදම් | වසර මිලදී ගැනීම් |
|---|---|---|---|---|---|---|---|
| **ඉඩම් හා ගොඩනැගිලි** | | | | | | | |
| ප්‍රධාන කාර්යාලය - කොළඹ 01 | ඒ.ඒ.එම්. ෆාතිහු | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 12,500,000 | 9,000 - 15,000 | - | - | - |
| වයිට්(අ)වේස් ගොඩනැගිල්ල -කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 13,500,000 | - | 6,000,000 | 40% | 16.66 |
| ලොයිඩ්ස් ගොඩනැගිල්ල -කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 13,500,000 | - | 6,750,000 | 40% | 16.66 |
| සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 14,000,000 | - | 7,500,000 | 35% | 16.66 |
| බැංකු විදු පියස - රාජගිරිය | - එම - | වෙළෙඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 2,500,000 - 3,500,000 | 2,500 - 9,500 | - | - | - |
| අධිපති නිල නිවස - කොළඹ 07 | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 7,500,000 | 3,500 - 8,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතර | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 1,500,000 - 3,000,000 | 4,000 - 7,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 100,000 - 500,000 | 2,500 - 7,500 | - | - | - |
| නිවාඩු නිකේතනය - නුවරඑළිය | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 1,000,000 | 2,000 - 7,000 | - | - | - |
| නිවාඩු නිකේතනය - කතරගම | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 200,000 | 4,500 - 10,000 | - | - | - |
| **කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලි** | | | | | | | |
| ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 3,500 - 7,500 | - | - | - |
| නිවාඩු නිකේතනය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 5,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - කිලිනොච්චි | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 1,500 - 7,000 | - | - | - |
| නිවාඩු නිකේතනය - සෝමාවතිය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 10,000 | - | - | - |

#### ඉඩම් සහ ගොඩනැගිලිවල සංයුතිය

| | ධාරණ අගය 2017 රු. 000 | ධාරණ අගය 2016 රු. 000 |
|---|---|---|
| සින්නක්කර ඉඩම් | **8,976,339** | 8,976,339 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | **7,250,954** | 7,424,981 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | **264,373** | 270,700 |
| | **16,491,666** | 16,672,020 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වූයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රු.මි. 8607.88 ක් වේ (2016 - රු.මි. 8,762.63).

## 17. අස්පෘශ්‍ය වත්කම්

| පරිගණක මෘදුකාංග : | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| **පිරිවැය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **949,772** | 948,648 |
| එකතු කිරීම් | **7,432** | 1,124 |
| දෙසැම්බර් 31 දිනට අගය | **957,204** | 949,772 |
| **ක්‍රමක්ෂය සහ හානිකරණය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **793,452** | 708,038 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **83,129** | 85,414 |
| දෙසැම්බර් 31 දිනට අගය | **876,581** | 793,452 |
| **ශුද්ධ පොත් අගය:** | | |
| දෙසැම්බර් 31 දිනට අගය | **80,623** | 156,320 |

මෙම මූල්‍ය වර්ෂය තුල දී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු.මි. 7.43 (2016 - රු.මි. 1.12) මුළු වටිනාකමකින් යුතු අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගන්නා ලදී.

2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්‍රම ක්ෂය කරන ලද එහෙත් තව දුරටත් ප්‍රයෝජනයට ගන්නා අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රමාණය රු. මි. 636.58 (2016 රු. මි. 613.34)ක් වේ.

## 18. බැංකු සහ මූල්‍ය ආයතන

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **8,237,633** | 45,267,025 |
| අනිකුත් විදේශීය මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **445,400** | 299,656 |
| | **8,683,033** | 45,566,681 |

## 19. ආසියානු නිශ්කාෂණ සංගමය

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ මූලිකත්වය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව, බංගලාදේශය, ඉරානය, නේපාලය, පකිස්ථානය, ඉන්දියාව, භූතානය, මියන්මාරය සහ මාලදිවයින එහි සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. ශුද්ධ ණයගැතියන් විසින් 0.63% ක සිට 1.28% ක් දක්වා වූ පොළියක්

ඇ.එ.ජ. ඩොලර් සඳහා (2016 දී එය 0.34% ක් සහ 0.51% ක් විය) ශුද්ධ ණය හිමියන් වෙත දෛනික පරිශේෂ ශේෂයන් මත 2017 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ගෙවන ලදී.

වාර්තා කරන දිනයන්හිදී ආසියානු නිශ්කාෂණ සංගමය වෙත ගෙවිය යුතු ප්‍රමාණය ශේෂයන්හි දක්වා ඇත.

## 20.ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)

| | 2017<br>රු. 000 | 2016<br>රු. 000 |
|---|---|---|
| පොළිය දරන ණය - ප්‍රවර්තන නොවන | **116,996,460** | 48,288,764 |
| පොළිය දරන ණය - ප්‍රවර්තන | - | 34,687,890 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | **86,086,013** | 79,638,200 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | **57,137,759** | 52,858,160 |
| පංගු බැරකම් | **58,445,100** | 54,067,582 |
| | **201,668,872** | 221,251,832 |
| ජා.මූ.අ. සම්බන්ධ මුළු බැරකම් | **318,665,332** | 269,540,596 |

**20.1** පොලී දරණ ණය, විස්තීර්ණ ණය පහසුකම් (EFF) හා ජා.මූ. අරමුදලෙන් ලබාගන්නා සම්පස්ථ ණය පහසුකම් වලින් සමන්විත වේ.

**20.2** විස්තීර්ණ ණය පහසුකම යනු රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යායාය පත්‍රයට සහය දීමට හා ශේෂය පියවීම සඳහා සහය දීමට ජා.මූ.අ. විසින් දෙන ලද තුන් අවුරුදු පහසුකමකි. ජා.මූ.අ. 2016 ජුනි හිදි විස්තීර්ණ ණය පහසුකම් වි.ගැ.හි බිලියන 1.10ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.බිලියන 1.50 ක්) ලබා දීමට අනුමැතිය දී තිබේ. මෙම මුදල ජා.මූ. අරමුදලේ රටවල්වල වර්තමාන පංගුවෙන් සියයට 185 කට සමාන වේ. 2016 ජුනි මස විස්තීර්ණ ණය පහසුකම යටතේ පළමුවැනි වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.මිලියන 168.10) ලබා දෙන ලදී. විස්තීර්ණ ණය පහසුකම යටතේ දෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 (ආසන්න වශයෙන් ඇ.ඩො.මි. 162.56), තෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.මි. 167.2) සහ හතරවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.මි. 251.4) පිළිවෙලින් 2016 නොවැම්බර්, 2017 ජුලි සහ දෙසැම්බර් යන මාස වලදී ලබාදී ඇත. හතරවන වාරිකය නිදහස් කිරීමත් සමඟ විස්තීරණ ණය පහසුකම යටතේ ඇ.ඩො. මිලියන 759.9ක් ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත. ඉතිරි මුදල වසර 2ක් ඇතුළත වාරික තුනකින් බෙදා හැරීමට අපේක්ෂා කරන අතර එහි අවසන් වාරිකය 2019 අප්‍රේල් මස දී සිදු කිරීමට නියමිතය. විස්තීරණ ණය පහසුකම සඳහා අදාල වන පොලී අනුපාතය භාර මූලික අනුපාතය වේ. මෙය වි.ගැ.හි. පොලී අනුපාතය (වර්තමානයේ දී වාර්ෂිකව 0.05%) සහ පදනම් අංක 100හි එකතුවට සමාන වේ.

**20.3** සම්පස්ථ ණය පහසුකම (SBA) යනු ණය ගනු ලබන රටවල්වල සාර්ව ආර්ථික කළමණාකරණ කටයුතු සඳහා වූ නිශ්චිත කොන්දේසිවලට යටත් ව ගෙවුම් ශේෂ කටයුතු මූල්‍යකරණය සඳහා ලබා දෙනු ලබන තවත් පහසුකමකි. ජා.මූ.අ. විසින් 2009 ජූලි මස වි.ගැ.හි. බිලියන 1.65ක් (ඇ.එ.ජ. ඩොලර් බිලියන 2.60) සම්පස්ථ ණය පහසුකමක් ගෙවුම් ශේෂ කටයුතුවලට සහය දීම සඳහා අනුමත කරන ලදී. 2012 ජූලි මස අවසාන වාරිකය හිමිවීමත් සමග සම්පස්ථ ණය පහසුකම 2012 වසර තුළදී සාර්ථකව අවසන් වන ලදී. මෙම ණය මුදල ආපසු ගෙවීම සඳහා වර්ෂ 5ක කාලසීමාවක් හිමිවන අතර එය 2012 ඔක්තෝබර් මසින් ආරම්භ වුනි. මෙම ණය පහසුකම සඳහා අයකරන පොළී අනුපාතය, සේවා ගාස්තු හා ස්ථාවර ආන්තිකය යන කොටස් දෙකකින් සමන්විත වේ. සේවා ගාස්තුව, විශේෂ ගැනුම් හිමිකම් පොළී අනුපාතයට යටත්ව සතිපතා ගණනය කරනු ලැබේ. නොගෙවූ ණය මුදල ජා.මූ. අරමුදලේ පංගුවෙන් 300% වන තෙක් ස්ථාවර ආන්තිකය වාර්ෂිකව 1% වේ. නොගෙවූ ණය මුදල ජා.මූ. අරමුදලේ පංගුවෙන් 300% ක් ඉක්මවන අවස්ථාවකදී එම ඉක්මවූ ප්‍රමාණය මත වර්ෂයකට 2% ක් වූ අමතර ගාස්තුවක් ගෙවිය යුතුවේ. 2012 ඔක්තෝබර් 25 වන දින වි.ගැ.හි. මිලියන 25.80 ක මුදලක් ප්‍රථම ආපසු ගෙවීම ලෙස පියවන ලදී. 2013-2016 වර්ෂ වලදී වි.ගැ.හි. මිලියන 1,455.52 ක් ආපසු ගෙවන ලද අතර 2016 දෙසැම්බර් 31 දිනට නොගෙවූ ශේෂය වි.ගැ.හි. මිලියන 172.25ක් වේ. මෙම මුදල 2017 ජනවාරි - ජූලි කාලය තුළදී ආපසු ගෙවන ලදී. 2017 දෙසැම්බර් 31 දිනට විස්තීර්ණ ණය පහසුකම් ශේෂයක් නොපවතී.

පොළී දරණ ණය සඳහා මාස 12 කට පෙර සහ පසු බේරුම් කිරීමට අපේක්ෂිත මුදල් පහත සඳහන් පරිදි වේ.

| | සඵල පොළී අනුපාතිකය % | පරිණත වර්ෂය | 2017<br>රු. 000 | 2016<br>රු. 000 |
|---|---|---|---|---|
| ප්‍රවර්තන සම්පස්ථ ණය පහසුකම (SBA) | **0.244** | **2017** | **-** | 34,687,890 |
| | | | **-** | 34,687,890 |
| ප්‍රවර්තන නොවන විස්තීර්ණ ණය පහසුකම (EFF) | **0.74** | **2027** | **116,996,460** | 48,288,764 |
| | | | **116,996,460** | 48,288,764 |
| පොළී දරණ මුළු ණය මුදල | | | **116,996,460** | 82,976,654 |

**20.4** විශේෂ ගැණුම් හිමිකම (වි.ගැ.හි.) යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපූරණයන් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි), සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන් ආදී වූ නිල සංචිත වත්කම්වලට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රීලංකාරජයවෙනුවෙන්අත්සන්කරනලදගිවිසුමේසඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන අතර ඒ සඳහා පොළී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන

නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 8 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. දැරීම් වැඩි වේ. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කරන හෝ ඇවර කරන අවස්ථාවක දී සාමාජිකයන් විසින් ශුද්ධ සමුච්චිත වෙන්කිරීම්වලට සමාන මුදලක් සහ වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගී වීම හේතුවෙන් ගෙවිය යුතු අනෙකුත් යම් මුදලක් වෙතොත් එය ද ජා.මූ.අ. වෙත ගෙවීමට බැඳී සිටී.

**20.5 ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් :** මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

**20.6 පංගු බැරකම:** අංක 8.2 දරණ සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

## 21. අනෙකුත්

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| DST එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය II (සටහන 21.1) | **0** | 364,794 |
| එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය (සටහන 21.2) | **2,056,009** | 5,857,173 |
| DST එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III (සටහන 21.3) | **7,588,467** | 13,245,476 |
| DST - එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II (සටහන 21.4) | **8,094,403** | 12,754,696 |
| DST විශේෂ ඩොලර් ගිණුම - කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SME) සහ ගෝලීය හරිත ශක්ති ණය (සටහන 21.5) | **109,808** | 2,195,121 |
| DST විශේෂ ඩොලර් ගිණුම - අඹතලේ ජල සම්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘතිය (සටහන 21.6) | **189,196** | 291,768 |
| DST පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ NORAD WASO ASIA ව්‍යාපෘතිය සඳහා වන ගිණුම (සටහන 21.7) | **10,664** | 6,409 |
| සා(ර්)ක් විනිමය හුවමාරුව (SAARC SWAP facility) යටතේ ඉන්දියානු මහ බැංකුවට (Reserve Bank of India) ගෙවිය යුතු මුදල (සටහන 21.8) | **-** | 59,920,000 |
| DST ඩොලර් ගිණුම හම්බන්තොට වරාය ව්‍යාපෘතිය (සටහන 21.9) | **44,648,475** | |
| අනෙකුත් විදේශීය බැරකම් | **1,398,867** | 1,614,595 |
| | **64,095,889** | 96,250,032 |

### 21.1 එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය II

ඇ.එ.ජ. ඩොලර් මිලියන 500 ණය පහසුකමක් ලබා ගැනීම සඳහා 2011 මාර්තු 31 දින ශ්‍රී ලංකා රජය හා චීන සංවර්ධන බැංකුව (CDB) අතර පහසුකම් එකඟතාවක් සඳහා අත්සන් තබන ලදී. මෙම පහසුකම් එකඟතාවේ අරමුදල් ප්‍රමුඛතා මාර්ගයන් සංවර්ධනය හා පුනරුත්ථාපනය සඳහා යොදා ගැනේ. පහසුකම් එකඟතාවය අනුව, බැංකුව එස්කෝරු නියෝජිතයා ලෙස පත් කරන ලදී. ඒ අනුව ණය තැන්පත් කිරීම හා එලෙස ලැබෙන මුදල් මාර්ග ව්‍යාපෘති සඳහා බෙදා හැරීමේ හුදු අරමුණ ඇතුව එස්කෝරු ගිණුමක් බැංකුවේ විවෘත කරන අතර සහ එකී ගිවිසුම ප්‍රකාරව ණයහිමියා (චීන සංවර්ධන බැංකුව) හා ණය ගැනුම්කරු (ශ්‍රී ලංකා රජය) යන දෙපාර්ශවයම එම එස්කෝරු ගිණුම හවුලේ බල පවත්වනු ලබයි.

මෙම ව්‍යාපෘතිය යටතේ වන අවසාන වාරිකය 2017 ජූලි 25 දින බෙදා හරින ලද අතර, 2017 දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් 0.09ක් පමණි.

### 21.2 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය

ඇ.එ.ජ.ඩො. මිලියන 214.20 සඳහා වූ මෙම ණය ගිවිසුම චීන සංවර්ධන බැංකුව (ණය හිමියා) සහ ශ්‍රී ලංකා රජය (ණය ගැනුම්කරු) අතර 2012 ජූනි 28 දින අත්සන් කර ඇත. මෙම ණය ගිවිසුමේ අරමුණ වන්නේ මොරගහකන්ද ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා පහසුකම් සැපයීමයි. ජල සම්පාදන හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ගිවිසුමෙහි බැංකුකරු වශයෙන් ණය ලැබීමට හා බෙදා හැරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි බැංකුව විසින් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී.

2017 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 25.65 ක් බෙදා හරින ලද අතර 2017 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ශේෂය ඇ.එ.ජ.ඩොලර් මිලියන 13.45 කි.

### 21.3 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III

ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් සඳහා වු මෙම පහසුකම් ගිවිසුම චීන සංවර්ධන බැංකුව (ණය හිමියා) සහ ශ්‍රී ලංකා රජය (ණය ගැණුම්කරු) අතර 2014 මාර්තු 11 වන දින අත්සන් කර ඇත. ප්‍රමුඛතා මාර්ග III වන ව්‍යාපෘතියේ I වන අදියර තවදුරටත් දියුණු කිරීම සහ යළි නගා සිටුවීම සඳහා වන වියදම් මුල්‍යනය කිරීම මෙම ණය මුදලේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පත් කරගන්නා ලදී. ඒ අනුව, හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුනු මුදල් මාර්ග ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පමණක් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2017 වර්ෂය තුළදී ඇ.එ.ජ ඩොලර් මිලියන 38.78 ක් බෙදාහරින ලදී. 2017 දෙසැම්බර් 31 වන විට ඉතිරි වී ඇති ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 49.64කි.

**21.4 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II**

එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන II වන අදියර සඳහා වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක් 2014 නොවැම්බර් 24 වන දින හිමි විය. 2017 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 32.19 ක් බෙදාහරින ලද අතර 2017 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 52.96 කි

**21.5 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගෝලීය හරිත ශක්ති ණය**

මෙය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ යුරෝපීය ආයෝජන බැංකුව අතර 2013 නොවැම්බර් 13 වන දින ඇති වූ මූල්‍ය ගිවිසුමකි. මෙම පහසුකම් එකඟතාවය අනුව, ශ්‍රී ලංකා රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව තෝරා ගැණිනි. ඒ අනුව, හුදෙක් ලැබෙන ණය මුදල් තැන්පත් කිරීමට සහ එම මුදල් ව්‍යාපෘති සඳහා බෙදා හැරීමේ පරමාර්ථය ඇතිව පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී.

ඉහත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගෝලීය හරිත ශක්ති ණයෙහි දෙවන වාරිකය 2015 ජූලි 09 වන දින යූරෝ වලින් ලැබුණි. ඒ අනුව හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුණු මුදල් ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි.

2017 වසර තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 13.94 ක් බෙදා හරින ලද අතර 2017 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.71 කි.

**21.6 DST විශේෂ ඩොලර් ගිණුම - අඹතලේ ජල සම්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘතිය**

මෙම ණය පහසුකම් ගිවිසුම Agence Francaise de Development (ණය හිමියා) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ණය ගැණුම්කරු) අතර 2014 සැප්තැම්බර් 29 වන දින අත්සන් කර ඇත. මෙම ගිවිසුමෙහි බැංකුකරු වශයෙන් ණය ලැබීමට හා බෙදා හැරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි බැංකුව විසින් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී. 2015 සැප්තැම්බර් 14 වන දින ඉහත ගිණුමට ඇ.එ.ජ. ඩොලර් මිලියන 5 ක් ලැබුණි. 2017 වසර තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.71 ක් බෙදා හරින ලද අතර 2017 දෙසැම්බර් 31 වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.24 කි.

**21.7 පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ NORAD WASO ASIA ව්‍යාපෘතිය සඳහා වන ඩොලර් ගිණුම**

හැකියාවන් ප්‍රවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් NORAD වෙතින් ලැබෙන අරමුදල් ලබා ගැනීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ NORAD WASO ASIA ව්‍යාපෘතිය සඳහා වන ගිණුම විශ්ව විද්‍යාලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබයි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හරහා මුදල් නැවත ලබා ගැනීමේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇ.එ.ජ. ඩොලර් හෝ රුපියල් වශයෙන්, ගිණුමෙන් අරමුදල් ලබා ගැනීමට පේරාදෙණිය විශ්ව විද්‍යාලය අපේක්ෂා කරයි. ඉහත සඳහන් ගිණුමට 2017 වසර තුළ, එකතුව ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.07ක් වන ලැබීම් 2ක් ලැබී ඇති අතර ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.04 DST ගිණුමට මාරු කරන ලදී. 2017 දෙසැම්බර් 31 වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.07 කි.

**21.8 සාර්ක් විනිමය හුවමාරුව යටතේ ඉන්දියානු මහ බැංකුවට ගෙවිය යුතු මුදල**

2016 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය, ඇ.එ.ජ. ඩොලර් මිලියන 400 ක ගැනීම නිරූපණය කරන අතර මෙම වාරිකය 2017 මාර්තු 16 දින පියවන ලදී.

**21.9 හම්බන්තොට වරාය ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ China Merchant Port Holdings Co Ltd අතර හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු පැවරීම වෙනුවෙන් ලද මුදල් බැර කර ආරම්භ කල මෙම විශේෂ ඩොලර් ගිණුම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබයි. 2017 දෙසැම්බර් 22 දින මූලිකව ලත් මුදල වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 292.1ක මුදල 2017 වර්ෂ අවසානය වන විටද ශේෂය ලෙස පවතී.

## 22. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පතු

මුදල් නීති පනතේ 93 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සපුරාලීම පිණිස බලපත්‍රලාභී වාණිජ බැංකු පවත්වාගෙන යන තැන්පතු සහ මුදල් නීති පනතේ විධිවිධාන යටතේ තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගීවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළෙඳුන් සහ සේවක අර්ථසාධක අරමුදල් යන ආයතනවල තැන්පතු මේ යටතේ වේ. මෙම ක්‍රමය යටතේ, පියවුම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා සහභාගී පාර්ශවයන්ට අදාල ගෙවීම් අවශ්‍යතාවයන් දිනක් තුලදී සපුරාලීමට රජය විසින් සම්පූර්ණයෙන්ම සුරැකුම් සහිත, පොලී රහිත එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේ හැකියාව ඇත. ගිණුම්කරණ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් මත මෙම තැන්පතු, සම්බන්ධිත පාර්ශ්ව සහ අනෙකුත් ලෙස වර්ග කළද, එය බැංකුව හා සඳහන් කළ ආයතන අතර වූ විශේෂ ව්‍යාපාර සම්බන්ධතා නිසා හටගන්නක් නොවේ.

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| බැංකුව විසින් තැන්පත් කිරීම: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **215,901,806** | 183,836,224 |
| - අනිකුත් | **125,805,585** | 110,060,140 |
| | **341,707,391** | 293,896,364 |
| මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **94** | 477 |
| - අනිකුත් | **4,713** | 9,354,449 |
| | **4,807** | 9,354,926 |
| බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු | **341,712,198** | 303,251,290 |

**23. රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු**

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| රජයේ තැන්පතු | **167,492** | 167,615 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | **157,025** | 283,269 |
| | **324,517** | 450,884 |

රජයේ සහ/හෝ රජයේ නියෝජිතයන්ගේ හෝ ආයතනවල නිල තැන්පතුධාරී වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතේ අංක 106 (1) දරන වගන්තියට යටත්ව මෙම තැන්පතු පවත්වාගෙන යනු ලබයි.

**24. ප්‍රති මිලදී ගැනීමේ එකගතාවය මත අලෙවි කළ සුරැකුම්පත්**

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| රජයේ සුරැකුම්පත් | **6,503,884** | 21,383,724 |
| නිත්‍ය තැන්පතු පහසුකම (සටහන 2.5.9) | **34,151,394** | 48,670,712 |
| | **40,655,278** | 70,054,436 |

මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීමේ අංගයක් ලෙස මුදල් නීති පනතේ වගන්ති 90 හා 91 යටතේ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය නියාමනයට විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ එකගතාවන් නිර්මාණය කරනු ලබයි. මෙම ප්‍රතිමිලදී ගැනීමේ එකගතාවයන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙළෙඳපළ ද්‍රවශීලිතා ප්‍රතිපත්තිය මත රඳා පවතිමින් එක් දිනක් සඳහා වන පදනම් මත හෝ කාලීන පදනම මත රජයේ සුරැකුම්පත් පමණක් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

**25. සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන්**

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ජංගම ගිණුම් පහසුකම් සපයනු ලැබේ. වෙනමම පරිපාලනය කරනු ලබන බැංකුවේ සේවක ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ ජංගම ගිණුම්වල සහ අන්තර් ඒකක ගිණුම්වල ශේෂයන් මෙසේය.

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| ශ්‍රී.ලං.ම.බැ. අර්ථසාධක අරමුදල, ශ්‍රී.ලං.ම.බැ. විශ්‍රාම යෝජනා ක්‍රමය සහ වැන්දඹු/වැන්දඹු, පුරුෂ හා අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රමයෙන් හි ශේෂය | **4,547** | 51,744 |
| | **4,547** | 51,744 |

**26. සංසරණයේ ඇති මුදල්**

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. වාර්තාකරණ දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| වර්ගය | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| කාසි | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,707** | 5,703 |
| සත 5 | **23,258** | 23,247 |
| සත 10 | **39,229** | 39,208 |
| සත 25 | **121,039** | 120,586 |
| සත 50 | **185,590** | 185,611 |
| රුපියල් 1 | **898,148** | 851,968 |
| රුපියල් 2 | **1,357,849** | 1,272,301 |
| රුපියල් 5 | **4,102,486** | 3,725,947 |
| රුපියල් 10 | **5,402,312** | 4,505,834 |
| සමරු කාසි | **587,075** | 584,177 |
| | **12,726,324** | 11,318,213 |
| නෝට්ටු | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,696** | 26,696 |
| රුපියල් 5 | **37,193** | 37,194 |
| රුපියල් 10 | **1,340,240** | 1,382,089 |
| රුපියල් 20 | **5,758,265** | 5,331,571 |
| රුපියල් 50 | **5,561,352** | 5,141,033 |
| රුපියල් 100 | **21,599,562** | 20,590,404 |
| රුපියල් 200 | **130,040** | 130,526 |
| රුපියල් 500 | **38,153,548** | 33,475,699 |
| රුපියල් 1,000 | **141,832,264** | 141,169,379 |
| රුපියල් 2,000 | **10,526,029** | 20,436,195 |
| රුපියල් 5,000 | **360,357,407** | 313,733,885 |
| | **585,327,577** | 541,459,652 |
| සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය | **598,053,901** | 552,777,865 |

**27. අනෙකුත් ගෙවිය යුතු දෑ**

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| ගෙවිය යුතු පොළී - දේශීය | **1,676** | - |
| වෙන්කිරීම් සහ අයකිරීම් | **396,531** | 563,783 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කළ තැන්පතු | **2,306,897** | 2,440,187 |
| අත්හරින ලද දේපළ ලැබීම් සඳහා වූ වගකීම් (සටහන 27.1) | **5,083,171** | 4,094,268 |
| අනෙකුත් ගෙවිය යුතු මුදල් | **1,098,881** | 1,465,310 |
| | **8,887,156** | 8,563,548 |

**27.1** අත්හරින ලද දේපලවලට අදාළව ගෙවිය යුතු මුදලින් නියෝජනය වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල අත්හරින ලද දේපළ හඳුනාගැනීම, වාර්තා කිරීම, මාරු කිරීම හා පවත්වාගෙන යැමට අදාළ 2009 අංක 05 දරණ බැංකු පනතේ විධානයට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් රැස් කරගත් අරමුදල වේ. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැන්පතු මුදල හා එයට අදාල පොළීය ගෙවීමට වගකීමෙන් බැඳේ. එම නිසා මුළු තැන්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතය අනුව ගණනය කරන ලද පොළීය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

## 28. විලම්භිත ප්‍රදානයන්

| | 2017 | 2016 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| ජනවාරි 01 වන දිනට | 80 | 106 |
| වර්ෂය තුල ක්‍රමක්ෂය | (35) | (26) |
| දෙසැම්බර් 31 දිනට | 45 | 80 |

විලම්භිත ප්‍රදානයන් අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙතට සරිලන පරිදි කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ගෙවීමක් නොමැතිව බැංකුවට හිමි වූ වත්කම් මෙහි ඇතුලත් වේ. වත්කමෙහි සාධාරණ අගය විලම්භිත ප්‍රදානයන් ගිණුමට බැර කරන ලද අතර අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙත හා සංගත වන පරිදි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා අනෙකුත් ආදායම් වෙත ලියා හරින ලදී.

## 29. විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

සියළුම සුදුසුකම්ලත් සේවකයින් ආවරණයවන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හයක් බැංකුව විසින් මෙහෙයවනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පැරණි) යටතේ, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවට බැඳුනු සේවකයින්, වර්ෂ 10 ක සේවා කාලයක් නිම කිරීමෙන් අනතුරුව එයට සුදුසුකම් ලබති. 1998 ජනවාරි 01 දිනට පසු බැංකු සේවයට එක්වී වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කල සේවකයන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය දායක මුදල් නොගෙවන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, එහි ප්‍රතිලාභ පිරිවැය සම්පූර්ණයෙන්ම බැංකුව විසින් දරනු ලැබේ. පිරිමි සේවකයන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, කාන්තා සේවිකාවන් සඳහා වු වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුනු සේවකයින්ට විවෘතය. මෙම සැලසුම්වලට 1994.08.01 දිනට පෙර බඳවා ගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5% ක ප්‍රමාණයකින් දායක වන අතර, 1994.08.01 දින හෝ ඊට පසු බඳවාගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 10% කින් දායක වෙයි.

අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක වැටුප් විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ද බැංකුව විසින් සලසනු ලැබේ. මෙම බැරකම පියවීම සඳහා ආයුගණන අගය කිරීමට අනුකූලව ගණනය කළ බැරකමට සමාන ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙනයනු ලැබේ.

පශ්චාත් වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමලත් බැංකු සේවකයන් හට තමා හා තම කාලත්‍රයන් සහ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් විසින් දරන ලද ඇතැම් වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරගත හැක.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රමවල වර්ෂය තුළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් හා ප්‍රවර්ථන සේවා පිරිවැය නැවත තක්සේරු කිරීම සඳහා ස්වාධීන උපදේශකයකු හා ආයුගණකයෙකු වන කේ. ඒ. පණ්ඩිත් (මුම්බායි) මහතාගේ සේවය ලබාගෙන ඇත.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු හා අනත්දරු විශ්‍රම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි අරමුදල් වෙන්ව කළමනාකරණය කරන අතර, වෙන් වූ පොත් පවත්වාගෙන යනු ලබයි. කෙසේ හෝ පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම බැංකුවේ ගිණුම් පොත්වලින් වෙන්ව පවත්වාගෙන යනු නොලැබේ. තවදුරටත්, ආයෝජන හා ආයෝජන ආදායම්, බැංකු පොත්වල මෙම අරමුදල්වලට පරිබාහිරව වාර්තා කරනු ලැබේ. තවද, ආයෝජන ආදායම් නැවත මෙම අරමුදල්වලට මාරු කරන අතර බෙදාහැරීමකින් තොරව නැවත ආයෝජනය කරනු ලැබේ.

මුළු සැලසුම් වත්කම් හි සාධාරණ අගය රු.මි. 40,816.60 (2016 - රු.මි. 36,145.06) වන අතර එය ප්‍රතිලාභ බැරකමෙහි වර්තමාන අගය වන රු.මි. 38,392.29 (2016 - රු.මි. 36,065.09) ඉක්මවා රු.මි. 2,424.31 (2016 - රු.මි. 79.97) ක අතිරික්තයක් අවසානයේ දී වාර්තා වේ.

2017 දෙසැම්බර් 31 දිනට

| ප්‍රතිලාභ බැරකම/ (වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2017 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම | 29,232,145 | 718,032 | 5,218,411 | 912,262 | 153,167 | 2,158,269 | 38,392,286 |
| සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ වටිනාකම | (28,339,460) | (3,251,092) | (5,643,016) | (2,191,535) | (175,385) | (1,216,111) | (40,816,599) |
| **ප්‍රවර්තන නොවන ප්‍රතිලාභ බැරකම්/(වත්කම්)** | 892,685 | (2,533,060) | (424,605) | (1,279,273) | (22,218) | 942,158 | (2,424,313) |

මූල්‍ය තත්ව ප්‍රකාශයේ විශ්‍රාම සේවක හා අනෙකුත් සේවක පශ්චාත් ප්‍රතිලාභ සැලසුම් යටතේ දක්වා ඇති බැරකම් ශේෂය ස්වාධීන ආයුගණනය කරන්නා විසින් දෙනු ලැබූ ශුද්ධ බැරකම් ශේෂයෙන් වෙනස් වීමට පහත හේතු බලපා ඇත.

(අ) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම යටතේ ආයුගණනය කරන්නා විසින් දෙන ලද ශුද්ධ වත්කම් ප්‍රමාණය ගිණුම්ගත කොට නැත්තේ, එකී අරමුදල් වල ඉතිරි වන්නා වූ යම් ශේෂයක් වෙතොත් එය බැංකුවට ලබා ගැනීමට ඇති සම්භාවිතාව ඉතා අඩු බැවිනි.

(ආ) පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ගිණුම් ගත කොට ඇත්තේ, ආයුගණනය කරන්නාට අනුව ඇති ශුද්ධ බැරකම් ප්‍රමාණය නොව දළ බැරකම් ප්‍රමාණය වන අතර එයට හේතු වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එකී යෝජනා ක්‍රමවලට අදාල වත්කම් අභ්‍යන්තරව කළමණාකරණය වන ස්වාධීන අරමුදලක් යටතේ පවත්වා නොගැනීමයි.

සේවක විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, පාරිතොෂික විශ්‍රාම වැටුප් හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යන අරමුදල් හි රු.මි. 485.79 ක අගයකින් යුතු සුරුකුම් රහිත ආයෝජන ඇතුලත් වන අතර ඒ වෙනුවෙන් 100% වෙන් කිරීම් කර ඇති හෙයින් සැලසුම් වත්කම් තුළ ඇතුලත් කර නොමැත. එවැනි ආයෝජනයන්හි අගයන් නොමැතිව පවා, ආයුගණන ඇගයීමට අනුව සේවක විශ්‍රාම වැටුප් බැරකමෙහි ශුද්ධ වත්කම් තත්ත්වයක් බැංකුව සතු වේ.

| ප්‍රතිලාභ බැරකම/(වත්කම) වෙනස් වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2017 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2017 ජනවාරි 01 දිනට | 2,076,018 | (1,834,772) | (187,705) | (1,002,453) | (20,646) | 889,590 | (79,968) |
| ප්‍රතිලාභ වියදම් | 480,203 | (208,897) | (24,402) | (130,319) | 12,698 | 144,685 | 273,968 |
| අනෙකුත් විස්තීරණ ආදායම් හි හඳුනාගත් අගය | (1,017,607) | (308,404) | (180,379) | (136,612) | (14,270) | (84,350) | (1,741,622) |
| දායක ගෙවීම් | (645,929) | (180,987) | (32,119) | (9,889) | - | (7,767) | (876,691) |
| **2017 දෙසැම්බර් 31 දිනට - ප්‍රවර්තන නොවන** | 892,685 | (2,533,060) | (424,605) | (1,279,273) | (22,218) | 942,158 | (2,424,313) |

| ප්‍රතිලාභ වියදම් | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2017 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | 269,882 | (238,520) | (24,402) | (130,319) | (2,684) | 115,647 | (10,396) |
| වර්තමාන සේවා පිරිවැය | 210,321 | 29,623 | - | - | 15,382 | 29,038 | 284,364 |
| **ප්‍රතිලාභ වියදම්** | 480,203 | (208,897) | (24,402) | (130,319) | 12,698 | 144,685 | 273,968 |
| **සැලසුම් වත්කම්/ආයෝජනවල සත්‍ය ප්‍රතිලාභය** | 4,375,497 | 627,231 | 849,631 | 375,242 | 37,653 | 253,174 | 6,518,428 |
| **සැලසුම් වත්කම්/ආයෝජනවල සත්‍ය ප්‍රතිලාභය සාමාන්‍ය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස** | 16.28% | 22.02% | 15.75% | 18.67% | 22.97% | 21.25% | 16.94% |
| **ගෙවූ ප්‍රතිලාභය ඉක්මවා ඉපැයූ අතිරික්ත පොලිය** | 2,285,220 | 625,357 | 466,108 | 353,400 | 22,966 | 41,801 | 3,794,852 |

| සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2017 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වර්ෂ ආරම්භයේ දී සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ අගය | 25,408,311 | 2,444,748 | 5,144,789 | 1,828,245 | 152,419 | 1,166,543 | 36,145,055 |
| සැලසුම් වත්කම්/ආයෝජනවල සත්‍ය ප්‍රතිලාභය | 4,375,497 | 627,231 | 849,631 | 375,242 | 37,653 | 253,174 | 6,518,428 |
| දායක ලැබීම් | 645,929 | 180,987 | 32,119 | 9,889 | - | 7,767 | 876,691 |
| ප්‍රතිලාභ ගෙවීම් | (2,090,277) | (1,874) | (383,523) | (21,842) | (14,687) | (211,373) | (2,723,576) |
| **වර්ෂ අවසානයේ දී සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ අගය** | 28,339,460 | 3,251,092 | 5,643,016 | 2,191,534 | 175,385 | 1,216,111 | 40,816,598 |

2016 දෙසැම්බර් 31 දිනට

| ප්‍රතිලාභ බැරකම/(වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2016 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම | 27,484,329 | 609,976 | 4,957,084 | 825,792 | 131,774 | 2,056,133 | 36,065,088 |
| සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ වටිනාකම | (25,408,311) | (2,444,748) | (5,144,789) | (1,828,245) | (152,419) | (1,166,543) | (36,145,055) |
| **ප්‍රවර්තන නොවන ප්‍රතිලාභ බැරකම්/(වත්කම්)** | 2,076,018 | (1,834,772) | (187,705) | (1,002,453) | (20,645) | 889,590 | (79,967) |

| ප්‍රතිලාභ බැරකම්වල/(වත්කම) වෙනස් වීම. | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2016 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2016 ජනවාරි 01 දිනට | 9,055,520 | (1,245,041) | 819,399 | (612,924) | (33,574) | 786,620 | 8,770,000 |
| ප්‍රතිලාභ වියදම් | 1,232,222 | (72,429) | 81,940 | (61,292) | 24,042 | 112,275 | 1,316,758 |
| අනෙකුත් විස්තීරණ ආදායම්තුල හඳුනාගත් වටිනාකම | (7,765,143) | (345,098) | (1,055,189) | (316,344) | (11,113) | 7,038 | (9,485,849) |
| දායක ගෙවීම් | (446,581) | (172,204) | (33,855) | (11,893) | - | (16,343) | (680,876) |
| **2016 දෙසැම්බර් 31 දිනට - ප්‍රවර්තන නොවන** | 2,076,018 | (1,834,772) | (187,705) | (1,002,453) | (20,645) | 889,590 | (79,967) |

| **ප්‍රතිලාභ වියදම්** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2016 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | 905,552 | (124,504) | 81,940 | (61,292) | (3,358) | 78,662 | 877,000 |
| අතීත සේවා පිරිවැය | 326,670 | 52,075 | - | - | 27,400 | 33,613 | 439,758 |
| **ප්‍රතිලාභ වියදම්** | 1,232,222 | (72,429) | 81,940 | (61,292) | 24,042 | 112,275 | 1,316,758 |
| **සැලසුම් වත්කම්/ආයෝජනවල සත්‍ය ප්‍රතිලාභය** | 877,139 | 12,576 | 268,269 | 89,924 | (6,438) | (37,029) | 1,204,441 |
| **සැලසුම් වත්කම්/ආයෝජනවල සත්‍ය ප්‍රතිලාභය සාමාන්‍ය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස** | 3.40% | 0.53% | 5.17% | 5.03% | -3.89% | -2.91% | 3.30% |
| **ගෙවූ ප්‍රතිලාභය ඉක්මවා ඉපැයූ අතිරික්ත පොළිය** | (1,158,329) | 12,576 | (114,825) | 69,041 | (25,769) | (231,229) | (1,448,535) |

| සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2016 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වර්ෂ ආරම්භයේ දී සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ අගය | 26,120,059 | 2,259,968 | 5,225,759 | 1,747,311 | 178,188 | 1,381,429 | 36,912,714 |
| සැලසුම් වත්කම්/ආයෝජනවල සත්‍ය ප්‍රතිලාභය | 877,139 | 12,576 | 268,269 | 89,924 | (6,438) | (37,029) | 1,204,441 |
| දායක ලැබීම් | 446,581 | 172,204 | 33,855 | 11,893 | - | 16,343 | 680,876 |
| ප්‍රතිලාභ ගෙවීම් | (2,035,468) | - | (383,094) | (20,883) | (19,331) | (194,200) | (2,652,976) |
| **වර්ෂ අවසානයේ සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ අගය** | 25,408,311 | 2,444,748 | 5,144,789 | 1,828,245 | 152,419 | 1,166,543 | 36,145,055 |

සියලුම සේවක ප්‍රතිලාභ බැඳීම් නිශ්චය කිරීමේ දී යොදාගන්නා ලද ප්‍රධාන උපකල්පනයන් පහත දැක්වේ.

| | 2017 | 2016 |
|---|---|---|
| වට්ටම් අනුපාතිකය | 13.00% | 13.00% |
| වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය | 13.00% | 13.00% |
| අනාගත වැටුප් වැඩිවීම් | 8.50% | 8.50% |
| අනාගත වැටුප් වැඩිවීම් අනුපාතය - (විශ්‍රාම) (නව) | 6.50% | 6.50% |
| අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම අනුපාතය (විශ්‍රාම) (නව) | 7.50% | 7.50% |
| සේවය හැරයාමේ අනුපාතය | 2.00% | 2.00% |
| වෛද්‍ය පිරිවැයෙහි උද්ධමන අනුපාතය | 3.00% | 3.00% |
| ඉතිරි සාමාන්‍ය සේවා කාලය | | |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් | අවුරුදු 27 | අවුරුදු 27 |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් - නව | අවුරුදු 41 | අවුරුදු 41 |
| වැන්දඹු හා අනත්දරු | අවුරුදු 27 | අවුරුදු 27 |
| වැන්දඹු පුරුෂ හා අනත්දරු | අවුරුදු 27 | අවුරුදු 27 |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් | අවුරුදු 20 | අවුරුදු 20 |
| වෛද්‍ය ප්‍රතිලාභ | අවුරුදු 32 | අවුරුදු 32 |
| විශ්‍රාමික වයස | අවුරුදු 60 | අවුරුදු 60 |

| 0.5% දී සංවේදීතා විශ්ලේෂණය (2017-12-31) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පුරෝකථනය කරන ලද ප්‍රතිලාභ සඳහා වන බැඳීම් මත ඇති වත්මන් උපකල්පනයන්** | **29,232,145** | **718,032** | **5,218,411** | **912,262** | **153,167** | **2,158,269** |
| "+" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම | (1,191,585) | (74,437) | (235,086) | (51,577) | (5,314) | (69,405) |
| "-" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම | 1,284,348 | 84,978 | 256,050 | 56,341 | 5,668 | 74,344 |
| "+" සේවය හැර යාමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | 30,610 | 13,365 |
| "-" සේවය හැර යාමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | (33,377) | (14,060) |
| "+" වැටුප් වැඩි වීමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | 163,917 | 64,085 | 12,735 | 5,293 | 5,883 | - |
| "-" වැටුප් වැඩි වීමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | (159,677) | (58,265) | (12,410) | (5,165) | (5,551) | - |
| "+" වෛද්‍ය පිරිවැයෙහි උද්ධමනය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | 75,512 |
| "-" වෛද්‍ය පිරිවැයෙහි උද්ධමනය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | (70,491) |
| "+" විශ්‍රාම වැටුප් ඉහළ යාමේ ප්‍රතිශතය වෙනස්වීමේ බලපෑම | 1,173,562 | - | 254,555 | 53,360 | - | - |
| "-" විශ්‍රාම වැටුප් ඉහළ යාමේ ප්‍රතිශතය වෙනස්වීමේ බලපෑම | (1,101,245) | - | (236,091) | (49,459) | - | - |

**30. විවිධ බැරකම් හා උපචිතයන්**

විවිධ බැරකම් හා උපචිතයන්හි ශේෂයන් තුළ ගෙවීමට ඇති ගිණුම්, කොන්ත්‍රාත් මත රඳවා ගැනීම්, නැවත ලබා දිය යුතු ටෙන්ඩර් තැන්පතු සහ රජයට ගෙවිය යුතු දඩ මුදල් අන්තර්ගතය.

**31. හිමිකරු ප්‍රාග්ධනය**

**හිමිකරු ප්‍රාග්ධන විෂයයන්ගේ ස්වභාවය**

**31.1** ප්‍රාග්ධන අරමුදල්

ආයක ප්‍රාග්ධනය : මුදල් නීති පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ගිණුමෙන් පෙන්නුම් කරයි. 2014 අංක 15 දරණ මුදල් නීති පනතෙහි (සංශෝධිත) 6 වන වගන්තියට අනුව බැංකුවේ ආයක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 ක් දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව බැංකුව විසින් මුදල් ඇමතිගේ එකඟතාවය ඇතිව 2014 සැප්තැම්බර් මස බැංකුවේ සංචිත ප්‍රාග්ධනිත කරමින් ආයක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 තෙක් වැඩි කරන ලදී.

**31.2** **ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය** - ජා.ගි.ප්‍ර. අංක 16 ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තයන් තුළින් මෙම සංචිතය ගොඩනැගී ඇත.

**31.3** **අනෙකුත් සංචිත පහත සඳහන් දේ වලින් සමන්විත වේ;**

i. **ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය (IRR)** : ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය වූ කලී මුදල් නීති පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සංචිතයකි. මෙම වගන්තිය ප්‍රකාර, රන් සහ විදේශ මුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු බැංකුවේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු අතර, ඒ වෙනුවට එම ලාභ හෝ පාඩු ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කළ යුතුය.

ii. **වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය (MRR)** : ජාත්‍යන්තර වෙළඳපල තුල සිදුවන අහිතකර චලන ප්‍රතිවිපාකයන් හි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය වත්කම් වල වෙළඳපල මිල ගණන් හි සිදුවන අහිතකර වෙනස් වීම්වලට මුහුණ දීමේ පරමාර්ථයෙන් ජාත්‍යන්තර වත්කම් වෙළඳපල මිල මත ඇගැයීමේ ලාභ මාරු කිරීම සඳහා 2003 ජනවාරි 30 දින ලබා දුන් මුදල් මණ්ඩල තීරණයට අනුව වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය පිහිටුවන ලදී. මුදල් මණ්ඩලය විසින් මෙම සංචිතය ශ්‍රී.ලං.ම.බැ. දළ විදේශ සංචිත වලින් සියයට දහයක ප්‍රමාණයක් දක්වා ගොඩනැගීමට තීරණය කරන ලදී.

තවද, 2016 පෙබරවාරි 29 වන දින MB/DG(W)/7/1/2016 දරන මුදල් මණ්ඩලයේ යෝජිත සංශෝධිත බැංකුවේ ලාභ බෙදා දීමේ ප්‍රතිපත්තියට අනුව, මුදල් මණ්ඩලයට අවශ්‍යයැයි සලකන ඕනෑම අවස්ථාවකදී උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නා වූ පාඩු වැඩිවීම නිසා රඳවාගත් ලාභයන් ඍණ වන අවස්ථාවකදී වෙළෙඳපොල ප්‍රත්‍යාගණන සංචිතයේ සිට රඳවාගත් ලාභයන් වෙත හුවමාරු කිරීමක් සිදු කල හැක.

ඒ අනුව, ප්‍රධාන වශයෙන්ම පසුගිය වසරවලදී උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන සැළකිය යුතු අලාභයන් එකතු වීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ දැනට පවතින ඍණ රඳවාගත් ලාභයන් වැඩි දියුණු කරවීම සඳහා වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයේ සිට රඳවාගත් ලාභයන් වෙත රුපියල් බිලියන 4.65 ක් මාරු කර ඇත.

පසුකාලීන වෙළඳපල ප්‍රත්‍යාගණන ලාභ සැලකිල්ලට ගෙන 2017 පෙබරවාරි 20 දිනැති BP MB/F/7/21/2017 දරන මුදල් මණ්ඩල තීරණය පරිදි රු. බිලියන 14.03 ක් රඳවාගත් ලාභයෙන් වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරන ලදී.

iii. **අනෙකුත් සංචිත** : පොදු සංචිතය, ගොඩනැගිලි සංචිතය හා ණය ඇපකර සංචිතයන් අනෙකුත් සංචිතයන් තුල ඇතුලත් වේ. මුදල් මණ්ඩලය විසින් රඳවාගත් ලාභයන්ගෙන් වෙන්කල ප්‍රමාණයන්ගෙන් පොදු සංචිතය සමන්විත වේ.

iv. **විකිණීම සඳහා තිබෙන සුරකුම්පත්වල ශුද්ධ සාධාරණ ලාභය/(අලාභය)** : විකිණීමට තිබෙන ලෙස නම් කර ඇති සුරකුම්පත් සහ ඒකක ආයෝජනයන් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ සහ පාඩු මෙම සංචිතයට මාරු කරන ලදී.

v. **තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදල** : තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා සහභාගිවන්නන්ගේ අයකිරීම්වලින් මෙම අරමුදල ගොඩනගා ඇත.

vi. **විශ්‍රාම ප්‍රතිලාභ සංචිතය** : මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 3 ක් මාරු කිරීමෙන් ආරම්භ කරන ලද අතර, බාහිර අවදානම් තත්ත්වයන් යටතේ බැංකුවේ ආදායම් ඉපැයීමේ ධාරිතාවයේ වන උච්ඡාවචනයන් හමුවේ විශ්‍රාම අරමුදලේ වන හිඟතාවයන් සඳහා යොදාගැනීමට අපේක්ෂා කෙරේ. 2011 ලාභවලින් තවත් රුපියල් බිලියන 1 ක් මෙම සංචිතයට මාරු කරන ලදී. MB/HR/11/12/2015 දරණ මුදල් මණ්ඩල පත්‍රිකාව අනුව නව විශ්‍රාම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජූනි මාසය තුළදී විශ්‍රාම ප්‍රතිලාභ සංචිතයෙන් රුපියල් බිලියන 2ක් නව විශ්‍රාම ගිණුමට මාරු කරන ලදී.

vii. **තාක්ෂණික අභිවර්ධන සංචිතය** : මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් ගොඩනගා ඇති අතර මහ බැංකුවේ දැනට භාවිතා කරන පොදු ලෙජර පද්ධතිය, තත්කාලීන ගෙවුම් පියවුම් පද්ධතිය, භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය හා නිර්ලේඛනගත සුරකුම්පත් පියවීම් ක්‍රමය යන පද්ධතීන්වල සිදු කළ යුතු නවීකරණ කටයුතු හෝ වැඩි දියුණු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා මෙය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

viii. **පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රම අරමුදල** : 2010 වර්ෂය තුළ බැංකුවේ ලාභවලින් රුපියල් බිලියන 2.90 ක අරමුදලක් ගොඩනගා, එමගින් කලාපවල මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන අරමුණු සඳහා, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. එම ණය ප්‍රදානයන් ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා සිදුවිය.

**ix. විශේෂිත ණය ඇප ක්‍රම අරමුදල :** මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදලින් රුපියල් බිලියන 2 ක් මාරු කිරීමෙන් 2014 දී මෙම අරමුදල පිහිටුවන ලද අතර ඉන් රුපියල් බිලියන 1 ක් බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන සෞභාග්‍යා ණය ක්‍රමය, පිබිදෙන උතුර අදියර II, නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු ප්‍රතිස්ථාපනය කිරීම II සහ උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීම යන ණය ක්‍රමයන් ප්‍රති ව්‍යුහගත කිරීම සඳහා වෙන්කර ඇත. අනෙක් රුපියල් බිලියන 1 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට ණය දීම සඳහා වානිජ බැංකු මගින් විශේෂිත ණය ඇප ක්‍රමයක් ක්‍රියාවට නැංවීමට වෙන් කර ඇත.

අනෙකුත් සංචිතවල වෙනස් වීම පහත පරිදි වේ.

| | මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිතය | වෙළෙඳපල ප්‍රත්‍යාගණන සංචිතය | අනෙකුත් සංචිත | විශේෂිත ණය ඇප ක්‍රම සංචිතය | තත් කාලීන දළ පියවුම් නිධන් අරමුදල | ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය | විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ ලාභය/අලාභය | විශ්‍රාම අරමුදල් සංචිතය | තාක්ෂණික අභිවර්ධන සංචිතය | පළාත් සංවර්ධන ණය යෝජනාක්‍රම අරමුදල | පශ්චාත් සේවක ප්‍රතිලාභ සැළසුම් මූල්‍යනය සඳහා වූ සංචිතය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | - | රු. 000 |
| 2017 ජනවාරි 01 දිනට | 2,925,000 | - | 2,489,920 | 2,000,000 | 1,552,900 | 12,381,876 | 3,280,813 | 2,000,000 | 1,000,000 | 2,900,000 | - | 30,530,509 |
| තත්කාලීන දළ පියවුම සංචිතයට මාරු කිරීම | - | - | - | - | 273,918 | - | - | - | - | - | - | 273,918 |
| පොදු සංචිතයට ලාභ මාරු කිරීම | - | - | 7,462,613 | - | - | - | - | - | - | - | - | 7,462,613 |
| සුසහන ණය ක්‍රමයේ ඉතිරි අරමුදල් පොදු සංචිතයට මාරු කිරීම | (1,000,000) | - | 1,000,000 | - | - | - | - | - | - | - | - | - |
| විදේශ විනිමය ප්‍රත්‍යගණන ශුද්ධ අලාභ මාරු කිරීම | - | - | - | - | - | (3,808,147) | - | - | - | - | - | (3,808,147) |
| විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ ලාභය | - | - | - | - | - | - | (6,843,970) | - | - | - | - | (6,843,970) |
| වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම. | - | 14,028,792 | - | - | - | - | - | - | - | - | - | 14,028,792 |
| පශ්චාත සේවක ප්‍රතිලාභ සැළසුම් මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම. | - | - | - | - | - | - | - | - | - | - | 689,025 | 689,025 |
| 2017 දෙසැම්බර් 31 දිනට | 1,925,000 | 14,028,792 | 10,952,533 | 2,000,000 | 1,826,818 | 8,573,729 | (3,563,157) | 2,000,000 | 1,000,000 | 2,900,000 | 689,025 | 42,332,740 |

## 32. ලාභ බෙදාහැරීම

මුදල් නීති පනතට අනුව සහ 2015 වසරේ සිට බලපැවැත්වෙන මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව, බෙදිය හැකි ලාභය ගණනය කිරීමේදී ජා.මු.වා.ප්‍ර. ප්‍රකාර වසර සඳහා වන ශුද්ධ ලාභය / අලාභය සඳහා පහත දැක්වෙන ගැලපීම් කරනු ලැබේ.

(අ) මුදල් නීතිපනතේ වගන්ති අංක 41 ට අනුකූලව විදේශ විනිමය ප්‍රත්‍යාගණනයෙන් වන ලාභ/(අලාභ) ඉවත්කරනු ලැබේ.

(ආ) විදේශ වත්කම්වල උපලබ්ධි නොවූ ප්‍රත්‍යාග ණනයන්ගෙන් ඇතිවන්නාවූ පාඩු ගලපනු ලබන අතර (ඉවත්කිරීමක් නොකෙරේ) උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නාවූ වාසි ඉවත් කෙරේ (ලාභ බෙදා හැරීමේ ප්‍රතිපත්තීන්ට අනුකූලව).

(ඇ) මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි මුදල් නීති පනතේ වගන්ති අංක 38 අනුව සංචිතයන්ට සිදු කරනු ලබන වෙනත් ඕනෑම මාරු කිරීමක් සහ මුදල් නීතිපනතේ වගන්ති අංක 39 අනුව කළ යුතු ගැලපුම් කරනු ලැබේ.

තවද ගිණුම්කරණ ප්‍රමිති සහ කළමණාකාරීත්වයේ තීරණ අනුව කළ යුතු ගැලපුම් ද බෙදිය හැකි ලාභය ගණනය කිරීමේ දී ගලපනු ලැබේ.

ඉහත සඳහන් ගැලපුම් වලට අනුව ගණනය කරන ලද 2017 දෙසැම්බර් 31 දිනට බෙදිය හැකි ලාභය පහත පරිදි වේ.

| අයිතමය | **2017**<br>රු. 000 |
|---|---|
| ජා.මු.වා.ප්‍ර. ප්‍රකාර ලාභය | **48,356,367** |
| අඩුකළා : | |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම. (මුදල් නීති පනත ප්‍රකාරව) | **(3,808,147)** |
| විදේශ වත්කම්වල උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇති වන්නා වූ ලාභ වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම | **24,337,841** |
| අනෙකුත් ගිණුම්කරණ ගැලපුම් | **440,627** |
| **මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභය බෙදා හැරීමේ ප්‍රතිපත්තීන් සහ අනෙකුත් ගැලපුම්වලට අනුකූලව බෙදා හරින ලද ලාභය/(අලාභය) - උපලබ්ධි වූ ලාභය/ (අලාභය)** | **27,386,046** |
| සංචිත සඳහා මාරු කිරීම් (මුදල් නීති පනතේ වගන්ති අංක 38 ප්‍රකාර) | **-** |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ සැළසුම් මූල්‍යනය සඳහා වූ සංචිතයට මාරු කිරීම | **5,372,178** |
| තාක්ෂණික අභිවර්ධන සංචිතයට මාරු කිරීම් | **2,000,000** |
| පොදු සංචිත වෙත මාරු කිරීම. | **5,013,868** |
| මහ බැංකුව වෙත ඇති රජයේ බැදීම් යළි පියවා ගැනීම්. (මුදල් නීති පනතේ වගන්ති අංක 39 ප්‍රකාර) | **772,903** |
| රජයේ ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම් (මුදල් නීති පනත් වගන්ති 39 ප්‍රකාර) | **14,227,097** |

### 33. මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම** | | |
| මුදල් හා කෙටිකාලීන තැන්පතු | **2,760,599** | 1,479,882 |
| මූල්‍ය වත්කම් | **6,170,100** | 4,628,934 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **13,984,017** | 8,761,019 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම** | **22,914,716** | 14,869,835 |
| **දේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම** | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **17,923,374** | 20,333,567 |
| අනිකුත් ණය සහ අත්තිකාරම් | **845,554** | 687,124 |
| **දේශීය මූල්‍ය වත්කම් වලින් ඉපැයූ මුළු පොළී ආදායම** | **18,768,928** | 21,020,691 |
| **මුළු මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම** | **41,683,644** | 35,890,526 |

### 34. උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් ලද ලාභ/(අලාභ)

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| විදේශ සුරැකුම්පත් | **(61,814)** | 3,166 |
| රන් | **13,949,169** | 8,306,063 |
| විදේශ විනිමය සහ මුදල් හුවමාරු | **9,702,099** | 5,719,563 |
| පොළී අනුපාතික හුවමාරු | **-** | (1,637) |
| අන්තර්ගත ව්‍යුත්පන්න විනිමය විකල්පයන් | **411,021** | (4,288,112) |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් ලද සම්පූර්ණ ලාභය | **24,000,475** | 9,739,043 |

### 35. මූල්‍ය බැරකම් මත පොළී වියදම

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම** | | |
| ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල | **467,828** | 174,504 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වගකීම් | **1,900,742** | 1,180,604 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **210,877** | 396 |
| අනෙකුත් ගෙවිය යුතු මුදල් - විදේශීය | **383,784** | 2,598,331 |
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම** | **2,963,231** | 3,953,835 |
| **දේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම** ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම මත අලෙවිකරණ ලද සුරැකුම්පත් | **1,023,720** | 345,835 |
| නිත්‍ය තැන්පතු පහසුකම | **1,195,866** | 1,519,585 |
| ණයට ගත් බැඳුම්කර | **1,716** | - |
| අත්හල දේපල | **454,814** | 332,395 |
| **දේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම** | **2,676,116** | 2,197,815 |
| **මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොළී වියදම** | **5,639,347** | 6,151,650 |

බැංකුව විසින් මුදල් වෙළෙඳපොල තුළ ඇති වූ ඌණ ද්‍රවශීලීතාවය මග හැරවීමට රුපියල් මුදා හැරීම තුළින් රු.මි. 12,977.01 ක ශුද්ධ නිවාරණ ලාභයක් 2017 වර්ෂය තුළදී උපයාගෙන ඇත (2016 රු.මි. 9,366.62 කි). පහත පරිදි මෙම නිවාරණ ලාභය ප්‍රති මිලදීගැනුම් ගිවිසුම් යටතේ සුරැකුම්පත් විකිණීම මත වූ පොළී වියදම, බැඳුම්කර ණයට ගැනීම මත වූ පොළී වියදම, නිත්‍ය තැන්පතු පහසුකම් මත පොළී වියදම සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ලද පොළී ආදායමෙහි අඩංගු නැවත විකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්වලින් ලද පොළී ආදායම සහ විදේශ මූල්‍ය වත්කම් මත වූ පොළී ආදායමෙහි අඩංගු ඇ.එ.ජ. ඩොලර්/රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ලාභයන්ගේ ශුද්ධ අගය වේ.

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් මත විකුණූ සුරැකුම්පත් වෙනුවෙන් දරණ ලද පොළී වියදම් | **1,023,720** | 345,835 |
| බැඳුම්කර ණයට ගැනීම වෙනුවෙන් ගෙවූ පොළී වියදම | **1,716** | - |
| නිත්‍ය තැන්පතු පහසුකම මත පොළී වියදම | **1,195,866** | 1,519,585 |
| **අඩු කළා :** | | |
| ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් වෙනුවෙන් ලද පොළී අදායම | **1,214,298** | 2,471,022 |
| ඇ.එ.ජ.ඩොලර්/රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල ලාභය | **13,984,017** | 8,761,019 |
| | **12,977,013** | 9,366,621 |

### 36. අනෙකුත් ආදායම්

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| ලාභාංශ ආදායම | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **104,601** | 37,259 |
| - අනිකුත් | **2,540** | 1,818 |
| දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමෙන් ලද ලාභය/(අලාභ) | **(732)** | 424 |
| විලම්භිත ප්‍රදානය ක්‍රමක්ෂය වීම | **34** | 34 |
| මූල්‍ය ආයතනයන්ට අදාල බලපත්‍ර ගාස්තු | **555,975** | 519,900 |
| කුලී ආදායම් | **485,515** | 455,514 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි සහභාගීකරුවන්ගෙන් අයකරන ලද ගාස්තු | **119,606** | 112,863 |
| විවිධ ආදායම් | **335,125** | 380,449 |
| මුළු අනිකුත් ආදායම් | **1,602,664** | 1,508,261 |

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකු ණයකර මත වූ ක්‍රමක්ෂය ලාභය වන රු.මි. 1.59 (2016 රු.මි. 1.40) සහ වි.ගැ.හි. 788,783 ක වටිනාකමින් යුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි පවත්වාගෙන යන PRGF තැන්පතු මත වසරක ඉතිරි කාලය සඳහා වූ ක්‍රමක්ෂය ලාභය වන රු.මි. 6.80 ක් (2016 රු.මි. 6.17) (සටහන 8) විවිධ ආදායම් හි අන්තර්ගතව ඇත.

## 37. සේවක මණ්ඩල වියදම්

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| වේතන සහ වැටුප් | **4,112,349** | 4,258,884 |
| නිශ්චිත දායක සැලසුම් පිරිවැය | **610,489** | 629,786 |
| පශ්චාත් සේවක නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | **744,356** | 1,479,963 |
| **මුළු සේවක මණ්ඩල වියදම්** | **5,467,194** | 6,368,633 |

## 38. පරිපාලන හා අනිකුත් වියදම්

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| අලුත්වැඩියා සහ නඩත්තු | **796,595** | 773,239 |
| රොයිටර්, බ්ලූම්බර්ග්, SWIFT ආදිය වෙනුවෙන් මෙහෙයුම් වියදම් | **122,260** | 134,648 |
| ගමනාගමන වියදම් | **114,217** | 116,658 |
| බදුකුලී වියදම් | **3,325** | 4,994 |
| මුද්‍රණ වියදම් | **27,728** | 27,468 |
| විගණන ගාස්තු | **10,412** | 7,846 |
| මුදල් මණ්ඩලයේ සාමාජිකයිනට පාරිශ්‍රමිකය | **4,463** | 3,605 |
| ශ්‍රී ලංකා මහ බැංකු අර්ථසාධක අරමුදල් පොළී සහනාධාර වියදම් | **-** | 47,877 |
| ප්‍රචාරණ වියදම් | **36,045** | 80,519 |
| උපදේශාත්මක, සන්නිවේදන සහ වෘත්තිමය ගාස්තු | **87,020** | 68,058 |
| විවිධ වියදම් | **103,584** | 200,672 |
| **මුළු පරිපාලන හා අනිකුත් වියදම්** | **1,305,649** | 1,465,584 |

## 39. රඳවාගැනීම් මත බද්ද

දේශීය ආදායම් (සංශෝධන) 2006 අංක 10 දරණ 7b (xvi) පනත අනුව ශ්‍රී ලංකා මහ බැංකුවට ආදයම් බදු ගෙවීම සඳහා වගකීමක් නොමැති අතර බැංකුව විසින් ගෙවනු ලබන රඳවාගැනීමේ බද්ද අවසාන බද්දක් ලෙස සැලකේ.

2007 අංක 10 ආදායම් බදු (සංශෝධිත) පනතට අනුව ලාභාංශ සහ පොළී ආදායම් ගෙවීමේ හෝ බැර කිරීමේ අවස්ථාවේ දී සියයට 10 ක රඳවා ගැනීමේ බද්දකට යටත් වේ. රජයේ සුරැකුම්පත් සඳහා වූ පොළී ආදායම මත වූ රඳවා ගැනීමේ බද්ද, කල්පිරීමට ඇති දින ගණනට ගැලපූ ආසන්නතම ප්‍රාථමික වෙන්දේසියේ සාමාන්‍ය බර තබන ලද ඵලදා අනුපාතය මත පදනම් වේ.

2017 වර්ෂය තුළ දී රු.මි. 20,094.54 (2016 රු.මි. 15,623.62) ක පොළී ආදායම හා ලාභාංශ ආදායම වන රු.මි. 107.14 (2016 රු. මි. 39.08) ක ආදායම මත රඳවා ගැනීමේ බදු ලෙස රු. මි. 1,837.96 (2016 රු. මි. 1,834.35) ක වියදමක් දරා ඇත.

## 40. මෙහෙයුම් ලාභය මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමග සැසඳීම

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වාර්තා කෙරුණු ශුද්ධ ලාභය | **48,356,368** | 22,179,519 |
| මුදල් නොවන අයිතමයන් එකතුකළා / (අඩුකළා) | | |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය | **518,716** | 520,961 |
| දේශීය මුදල් ආයෝජන කළඹ මගින් ලද පොලිය | **(17,911,410)** | (20,333,567) |
| බොල්ණය ආපසු ලැබීම් | **(27,302)** | - |
| උපලබ්ධි නොවූ දළ විදේශ විනිමය (ලාභය) / පාඩුව | **(9,595,724)** | (12,107,722) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභය | **-** | (1,400) |
| වෙන් කිරීම් හා උපචිතයන් | **725,778** | 2,713,774 |
| විලම්භිත ප්‍රදාන | **(34)** | (27) |
| ප්‍රත්‍යාගණන අලාභ | **-** | 378,907 |
| PRGF තැන්පතු ක්‍රමක්ෂය | **(6,804)** | (6,165) |
| ස්ථාවර ආදායම් සුරැකුම්පත් ක්‍රමක්ෂය වියදම් | **883,659** | 807,349 |
| **එකතුකළා / (අඩුකළා) අනෙකුත් කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම්** | | |
| තොගවල (වැඩිවීම)/අඩුවීම | **(760,672)** | (2,694,897) |
| ලැබිය යුතු පොළිය (වැඩිවීම)/අඩුවීම | **579,464** | (4,576,657) |
| විවිධ බැරකම්වල වැඩිවීම/(අඩුවීම) | **906,181** | (723,637) |
| ගෙවිය යුතු පොළිය වැඩිවීම/ (අඩුවීම) | **219,716** | 32,460 |
| අනෙකුත් ලැබීම් (වැඩිවීම)/ අඩුවීම | **(79,675)** | (26,455) |
| **එකතුකළා/(අඩුකළා) ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| ශුද්ධ උපලබ්ධි නොවූ වෙළෙඳපොළ අගය වෙනස්වීම | **(25,110,720)** | (9,857,403) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | **(1,302,459)** | (23,694,960) |

## 41. රජයේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු/ (ආපසු ගැනීම්)

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම | **(315,960,919)** | 246,320,577 |
| ලැබුණු පොලිය - දේශීය මුදල් - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **(21,308,838)** | (18,094,641) |
| ශ්‍රී ලංකා රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් වැඩිවීම/(අඩුවීම) | **116,494,100** | (67,824,900) |
| රජය සහ රජයේ ආයතන සමග ශේෂ (වැඩිවීම)/අඩුවීම | **126,367** | (22,741) |
| | **(220,649,290)** | 160,378,295 |

## 42. බැංකු සහ මූල්‍ය ආයතනයන්ගේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්)

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| බැංකු හා මූල්‍ය ආයතනයන්ගේ තැන්පතු (වැඩිවීම)/අඩුවීම | **(38,460,908)** | (121,524,559) |
| | **(38,460,908)** | (121,524,559) |

## 43. අවසාන මුදල් සහ මුදල් සමානයන්

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| විදේශීය මූල්‍ය වත්කම් | | |
| විදේශීය බැංකු සමඟ මුදල් ශේෂ | **459,827,641** | 423,783,737 |
| | **459,827,641** | 423,783,737 |

## 44. අරමුදල්කරණයේ සංකේන්ද්‍රණය වීම

වර්ෂ අවසානයට බැංකුවේ අරමුදල්කරණයේ සැලකිය යුතු සංකේන්ද්‍රණය වීම පහත සඳහන් පරිදි ය.

| 2017 දෙසැම්බර් 31 දිනට | එකතුව රු. 000 | ශ්‍රී ලංකා රජය රු. 000 | ශ්‍රී ලංකා මහජනයා රු. 000 | ශ්‍රී ලංකා වාණිජ බැංකු රු. 000 | අධි ජාතික මූල්‍ය ආයතන රු. 000 | අනිකුත් රු. 000 |
|---|---|---|---|---|---|---|
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල් | 8,683,033 | - | - | - | 329,937 | 8,353,096 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 4,648,449 | - | - | 4,648,449 | - | - |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 90,868,160 | - | - | - | 90,868,160 | - |
| ජා.මූ.අ. | 318,665,332 | - | - | - | 318,665,332 | - |
| අනිකුත් | 64,095,889 | 17,848,687 | - | 1,193,019 | 200,757 | 44,853,426 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | 486,960,863 | 17,848,687 | - | 5,841,468 | 410,064,186 | 53,206,522 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 341,712,198 | - | - | 341,707,391 | - | 4,807 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 324,517 | 324,515 | 2 | - | - | - |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අළෙවි කළ සුරැකුම්පත් | 40,655,278 | - | - | 40,655,278 | - | - |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 4,547 | - | - | - | - | 4,547 |
| සංසරණයේ ඇති මුදල් | 598,053,901 | - | 598,053,901 | - | - | - |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 8,887,156 | 45,734 | - | 2,306,897 | - | 6,534,525 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | 989,637,597 | 370,249 | 598,053,903 | 384,669,566 | - | 6,543,879 |
| **මුළු මූල්‍ය බැරකම්** | 1,476,598,460 | 18,218,935 | 598,053,903 | 390,511,035 | 410,064,186 | 59,750,401 |
| **අනිකුත් බැරකම්** | | | | | | |
| විලම්භිත ප්‍රදානයන් | 45 | - | - | - | - | 45 |
| විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 671,061 | - | - | - | - | 671,061 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 211,720 | 82,328 | - | - | - | 129,392 |
| **මුළු අනිකුත් බැරකම්** | 882,826 | 82,328 | - | - | - | 800,498 |
| **මුළු බැරකම්** | 1,477,481,286 | 18,301,263 | 598,053,903 | 390,511,035 | 410,064,186 | 60,550,899 |

2016 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක සංඛ්‍යා පහත සඳහන් පරිදි වේ.

| 2016 දෙසැම්බර් 31 දිනට | එකතුව | ශ්‍රී ලංකා රජය | ශ්‍රී ලංකා මහජනයා | ශ්‍රී ලංකා වාණිජ බැංකු | අධි ජාතික මූල්‍ය ආයතන | අනිකුත් |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල් | 45,566,681 | - | - | - | 180,696 | 45,385,985 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 14,573,675 | - | - | 14,573,664 | 11 | - |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 79,863,615 | - | - | - | 79,863,615 | - |
| ජා.මූ.අ. | 269,540,596 | - | - | - | 269,540,596 | - |
| අනිකුත් | 96,250,032 | 34,417,259 | - | 1,169,177 | 440,328 | 60,223,268 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | 505,794,599 | 34,417,259 | - | 15,742,841 | 350,025,246 | 105,609,253 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 303,251,290 | - | - | 293,896,364 | - | 9,354,926 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 450,884 | 450,837 | 47 | - | - | - |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 70,054,436 | - | - | 67,552,907 | - | 2,501,529 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 51,744 | - | - | - | - | 51,744 |
| සංසරණයේ ඇති මුදල් | 552,777,865 | - | 552,777,865 | - | - | - |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 8,563,548 | 46,218 | - | 182,000 | - | 8,335,330 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | 935,149,767 | 497,055 | 552,777,912 | 361,631,271 | - | 20,243,529 |
| **මුළු මූල්‍ය බැරකම්** | 1,440,944,366 | 34,914,314 | 552,777,912 | 377,374,112 | 350,025,246 | 125,852,782 |
| **අනිකුත් බැරකම්** | | | | | | |
| විලම්භිත ප්‍රදානයන් | 80 | - | - | - | - | 80 |
| විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 2,429,153 | - | - | - | - | 2,429,153 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 193,297 | 62,449 | - | - | - | 130,848 |
| **මුළු අනිකුත් බැරකම්** | 2,622,530 | 62,449 | - | - | - | 2,560,081 |
| **මුළු බැරකම්** | 1,443,566,896 | 34,976,763 | 552,777,912 | 377,374,112 | 350,025,246 | 128,412,863 |

## 45. අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව එහි ව්‍යවස්ථාපිත අරමුණු දෙකක් වන මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය වෙනුවෙන් කටයුතු කරනු ලබයි. එමෙන්ම, ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර එහි අරමුණු සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පුළුල් වූ ව්‍යවස්ථාපිත බලතල පැවරී ඇත. මූල්‍ය මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලන මණ්ඩලය වශයෙන් බැංකුවේ කළමණාකරණය, මෙහෙයුම් හා පරිපාලනය සම්බන්ධ සියළු ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට වගකියනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් හා ප්‍රතිපත්ති, ලාභ ඉපැයීම කෙරෙහි අරමුණු ගත නොවේ. කෙසේ වෙතත්, බැංකුව තම කාර්යයන් පවත්වාගෙන යාමේදී විවිධ වූ අවදානම් තත්ත්වයන්ට නිරාවරණය වේ.

එබැවින් බැංකුවේ කළමනකාරිත්වය, ඇඩි හා ඵලදායි අවදානම් කළමනාකරණ හා පාලන ක්‍රමයන් තහවුරු කිරීමට කටයුතු කරනු ලබයි.

මේ සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය, අවදානම් පාලනය හා ඵලදායී කළමනාකරණය තහවුරු කිරීම සඳහා කමිටු කිහිපයකට සහ අංශ/දෙපාර්තමේන්තුවලට මෙම කටයුතු පවරා තිබේ.

එබැවින් අවදානම් කළමණාකරණය බැංකුවේ තීරණ ගැනීමට අදාල සියළු මට්ටම්වල වගකීමක් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව තුල අවදානම් කළමනාකරණ කාර්යය " තුන් පෙළ ආරක්ෂිත උපක්‍රම" ආකෘතිය යටතේ සිදුවේ.

ඒ අනුව "පළමු පෙළ ආරක්ෂිත උපක්‍රම" යන්ගේ වගකීම අදාල දෙපාර්තමේන්තු හා බැඳේ. "පළමු පෙළ ආරක්ෂිත උපක්‍රම" යටතට ගැනෙන අවදානම් තත්ත්වයන් මෙහෙයුම් ස්වභාවයක් ඇති තත්ත්වයන් වන බැවින් අදාල අවදානම් තත්ත්වයන් ඒවා හටගත් දෙපාර්තමේන්තු විසින්ම හසුරුවනු ලබයි.

ආරක්ෂිත උපක්‍රමයන්ගේ පළමු පෙළ, යෝග්‍ය අභ්‍යන්තර අවදානම් කළමණාකරණ පද්ධති සහ පාලන මාර්ගයන් නියමිත පරිදි ඇති බවට තහවුරු කරයි. ආරක්ෂිත උපක්‍රමයන්ගේ දෙවන පෙළ වශයෙන් අවදානම් කළමණාකරණ දෙපාර්තමේන්තුව මූල්‍ය අවදානම් තත්ත්වයන් ඇගයීම, පාලනය හා අධීක්ෂණය කිරීමටත් ස්වාධීනව අධිපතිතුමාට වාර්තා කිරීමටත් වගකීම දරයි. ආරක්ෂිත උපක්‍රමයන්ගේ තුන්වන පෙළ ලෙස, අවදානම් රක්ෂණය කිරීමේ කාර්යයෙහි වගකීම අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

අවදානම් හි ප්‍රධාන මානයන් දෙක වනුයේ, මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් ය. මූල්‍ය අවදානම තුල වෙළෙඳපොල අවදානම, (පොළී අනුපාත අවදානම හා විදේශ විනිමය අනුපාත අවදානම) ණය අවදානම හා ද්‍රවශීලතා අවදානම අන්තර්ගත වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත කළඹ හා බැඳුනු අවදානම් තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන අතර ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විදේශ සංචිත කළඹ කළමනාකරණය කරනු ලබයි. මෙම සංචිත කළඹ කළමනාකරණය කිරීමේ දී, ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අවදානම් ආවරණය සඳහා වූ ප්‍රතිපත්ති ඇතුලත් විස්තීර්ණ මඟපෙන්වීම් අනුගමනය කරනු ලබන අතර, ජාත්‍යන්තර සංචිත ආශ්‍රිත මූල්‍ය අවදානම් තක්සේරු කිරීම් ස්වාධීනව අධිපති තුමා සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

පොළී අනුපාත අවදානම හෙවත් පොළී අනුපාත චලනයන්ට බැංකුවේ විදේශ වත්කම් කළඹෙහි ආවරණයවීම්, ආයෝජන කළඹෙහි කාල පරාසය ගැලපීම මඟින් සහ දින 10ක කාලපරාසයකට සහ සියයට අනූනවයක විශ්වාසතා මට්ටමකට ඇති අවදානමෙහි වටිනාකම තක්සේරු කිරීම මගින් අධීක්ෂණය කෙරේ. විදේශ විනිමය අවදානම හෙවත් විදේශ විනිමය අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් සිදුවන ප්‍රාග්ධන පාඩු ප්‍රධාන වශයෙන් ආයෝජන විනිමයන් විවිධාංගිකරණය තුළින් පාලනය කරනු ලැබේ. ද්‍රවශීලතා අවදානම අවම කිරීම උදසො වත්කම් බෙදා වෙන්කිරීමේ ක්‍රියාවලියෙහි වත්කම් කාණ්ඩ සීමා කිරීමත්, සුරැකුම්පත් නිකුත් කරන්නන්ගෙන් මිලදී ගත හැකි මුළු අගයට උපරිම සීමාවන් පැනවීමත් සිදුකරනු ලබයි. විදේශ සංචිත කළමනාකරණයේ දී, විදේශ විනිමය අනුපාතය පාලනය කිරීමේ හැකියාවන් පවත්වාගැනීම සඳහා, ද්‍රවශීලතා අවදානම අවම කිරීම කෙරෙහි මූලික අවධානය යොමු කෙරේ. ණය අවදානම, පොළී අනුපාතය, විදේශ විනිමය හා ද්‍රවශීලතා අවදානම පාලනය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති පිළිවෙලින් 45.1, 45.2, 45.3, 45.4 සහ 45.5 යන සටහන් වලින් විස්තර කෙරේ.

ආයෝජනවල හා ප්‍රතිපාර්ශවයන්ගේ ණය වර්ගීකරණයන් පදනම් කරගත් විදේශ වත්කම් කළඹ සම්බන්ධ ණය අවදානම පාලනය කිරීම සඳහා ප්‍රතිපාර්ශවයන් සම්බන්ධ ණය අවදානම් කළමනාකරණ පද්ධතිය යොදා ගනු ලබයි. මීට අමතරව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මුදල් වෙළෙඳපොල ප්‍රතිපාර්ශවිය ණය පැහැරහැරීම් හුවමාරු/කොටස් මිල නිරන්තර අධීක්ෂණයට ලක් කරනු ලබයි.

අභ්‍යන්තර ආයෝජන අරමුදල්වලට අදාල මූල්‍ය අවදානම් තක්සේරු කිරීම, අධික්ෂණය කිරීම සහ වාර්තා කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ ඉදිරි කාර්යාලය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර ආයෝජන අරමුදල පාලනය කෙරෙන අතර, අවදානම් කළමනාකරන දෙපාර්තමේන්තුව මඟින් එයට අදාල අවදානම් අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. එමෙන්ම අඛණ්ඩව සකසන ලද තත්ත්ව වාර්තා අධිපතිවරයා වෙත ස්වාධීනව වාර්තා කිරීමත්, ප්‍රාග්ධන සංරක්ෂණය සහ ප්‍රමාණවත් ද්‍රවශීලීතාවයක් නිරතුරුව පවත්වා ගැනීම වෙනුවෙන් ආයෝජන ක්‍රියාවලිය සහ ආයෝජන ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමට ඉවහල් වන අවදානම් සබැඳි යෙදවුම් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව වෙත ලබාදීමත්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ.

මූල්‍ය නොවන අවදානම තුල, නීතිමය අවදානම, අනුකූලතා අවදානම, මානව සම්පත් අවදානම, වංචා අවදානම, උපාය මාර්ගික හා ප්‍රතිපත්ති අවදානම සහ අනෙකුත් මෙහෙයුම් අවදානම් ඇතුළත් වේ.

මූල්‍ය නොවන අවදානම් අධීක්ෂණය කිරීම, කාර්යය පිළවෙත්, නීති හා මාර්ග නිර්දේශයන් හා අනුකූල වීමේ අවදානම මෙන්ම බැංකුවට යෝග්‍ය අවදානම් පාලනය කිරීම ද තහවුරු කරයි. ඉහත දැක්වූ පරිදි, තෝරාගත් දෙපාර්තමේන්තු 17 ඔවුන්ගේ මූල්‍ය නොවන අවදානම් පැතිකඩ වරින් වර අවදානම් කළමණාකරණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරන අතර, එසේ වාර්තා කළ තොරතුරු අවදානම් කළමණාකරන දෙපාර්තමේන්තුව මඟින් විශ්ලේෂණය කර ඉහළ කළමණාකාරීත්වයට ඉදිරිපත් කරනු ලැබේ.

අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව විගණනය කෙරේ. මෙම දෙපාර්තමේන්තුව එම ක්‍රියාමාර්ගවල ප්‍රමාණාත්මතාවය හා එම ක්‍රියා මාර්ග කෙරෙහි බැංකුවේ අනුකූලතාවය පරීක්ෂා කරනු ලබයි. සෑම දෙපැර්තමේන්තුවක්ම කලින් කලට අභ්‍යන්තර විගණන විමර්ෂණයකට ලක් වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව පරිපාලනමය වශයෙන්, මුදල් මණ්ඩලයෙහි සභාපතීත්වය දරන අධිපතිවරයා වෙත වාර්තා කරන අතර, ක්‍රියාකාරී ලෙස විගණන කමිටුව වෙත වාර්තා කරනු ලැබේ.

මුදල් මණ්ඩලයෙහි තෝරගත් සාමාජිකයෙකු විසින් උපදේශාත්මක විගණන කමිටුවෙහි මුලසුන දරන අතර, එම කමිටුව විසින් වාර්ෂික හා අනෙකුත් මූල්‍ය වාර්තාවල විනිවිදභාවය පිළිබඳවද, මූල්‍යමය කාර්යසාධනය පිළිබඳව වූ කාර්තුමය කළමනාකාරීත්ව ප්‍රකාශන හා අනෙකුත් නිල දැනුම් දීම් පිළිබඳවද, සැලකිය යුතු මූල්‍ය වාර්තාකරණ ගැටලු හා විනිශ්චයන් සමාලෝචනය පිළිබඳවද, අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකාරීත්ව පද්ධති පිළිබඳවද, බැංකුවේ අනුකූලතා කාර්යයයෙහි ප්‍රමාණාත්මක හා සඵලදායී බව පිළිබඳවද, අභ්‍යන්තර විගණන කාර්යයන් හා එයට සම්බන්ධිත කාර්යයන් හා එයට සම්බන්ධිත කාර්යයන්වල සඵලදායීතාවය සහ බාහිර විගණන කටයුතු පිළිබඳවද, මුදල් මණ්ඩලය දැනුවත් කරනු ලබයි. උපදේශාත්මක විගණන කමිටුවෙහි නිර්දේශයන් සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි ප්‍රගතිය කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩල වෙත වාර්තා කරනු ලබයි.

මුදල් නීතී පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාරව, බැංකුව විගණකාධිපතිවරයා විසින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකිරීමේ ප්‍රමිතීන්ට අනුකූලව ජාත්‍යන්තර විගණන ප්‍රමිතීන් යටතේ විගණන කටයුතු කරගෙන යාම සඳහා වරළත් ගණකාධිකාරී සමාගමක් වන කේ.පී.එම්.ජී. හි සහාය ද ලබාගෙන ඇත.

**45.1 ණය අවදානම**

**(අ) භූගෝලීය ප්‍රදේශ අනුව ණය සංකේන්ද්‍රණය**

බැංකුවේ වර්ෂය අවසානයේ දී සැලකිය යුතු ණය සංකේන්ද්‍රණයන් භූගෝලීය ප්‍රදේශ අනුව (ආයතනයේ අයිතිකාරත්ව රටවල් පදනම් කරගෙන) පහත දැක්වේ.

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| ශ්‍රී ලංකාව | **249,968,143** | 450,197,249 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | **643,710,289** | 238,171,318 |
| ජපානය | **18,253,104** | 42,458,692 |
| බ්‍රිතාන්‍යය | **28,946,605** | 53,470,593 |
| යුරෝපය | **94,190,661** | 130,405,122 |
| අධි ජාතික මූල්‍ය ආයතන | **273,831,693** | 373,327,138 |
| වෙනත් | **142,897,782** | 98,710,669 |
| මුළු මූල්‍ය වත්කම් | **1,451,798,277** | 1,386,740,780 |

**(ආ) ආයතනය අනුව ණය සංකේන්ද්‍රණය වීම**

බැංකුවේ වර්ෂය අවසානයට වන සැලකිය යුතු ණය සංකේන්ද්‍රණය වීම ආයතන වර්ගයන් අනුව පහත දැක්වේ.

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| රජයන් | **958,345,205** | 844,074,103 |
| අධි ජාතික මූල්‍ය ආයතන | **273,831,693** | 373,327,138 |
| විදේශීය බැංකු සහ මූල්‍ය ආයතන | **201,640,454** | 159,700,398 |
| ශ්‍රී ලංකා බැංකු හා මූල්‍ය ආයතන | **10,308,545** | 3,885,700 |
| අනිකුත් | **7,672,380** | 5,753,441 |
| **මුළු මූල්‍ය වත්කම්** | **1,451,798,277** | 1,386,740,780 |

**(ඇ) ණය ශ්‍රේණිගත කිරීම මගින් ණය අවදානම මැනීම**

ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් සහ ෆිච් රේටින්ග්ස් සමාගමට අනුව ණය ශ්‍රේණිගත කිරීම සිදුකළ බැංකුවේ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් නිකුතුකරුවන් පහත වගුවෙන් දැක්වේ. ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් සහ ෆිච් රේටින් සමාගමේ ශ්‍රේණිගත කිරීම් අනුව AAA සංකේතය ඉතා ඉහළම ශ්‍රේණිගත කිරීම හා අවම අපේක්ෂිත ණය අවදානම පෙන්නුම් කරන අතර, යම්කිසි ආයතනයකට පොළීය සහ මුල් මුදල් ගෙවීමට හැකි ශක්තිමත් තත්වයක් තිබෙන බව දක්වයි. AA සංකේතයෙන් ඉතා ඉහළ ශ්‍රේණිගත කිරීමක් හා ඉතා අඩු අපේක්ෂිත ණය අවදානමක් දැක්වෙන අතර, ශක්තිමත් තත්වයක් දක්වයි. A සංකේතයෙන් ඉහළ මධ්‍යම ශ්‍රේණියන් දක්වන අතර ශක්තිමත් තත්ත්වයක් හා ණය අවදානමේ පහළ තත්වයක් දක්වයි. BBB සංකේතයෙන් පහළ ම ආයෝජන ශ්‍රේණිගත කිරීමක් හා පහළ මට්ටමේ ණය අවදානමක් බවතින බව දක්වන අතර, ප්‍රමාණවත් ආරක්ෂක පරාමිති පෙන්නුම් කරයි. AAA සංකේතයට පහළ ශ්‍රේණි ප්‍රධාන ප්‍රභේදයන් අතර පවත්නා තත්ත්වය දැක්වීම පිණිස + හෝ - ලකුණු මඟින් කාණ්ඩකරණය කළ හැකිය. ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් හා ෆිච් රේටින්ග් සමාගම් විසින් ණය ශ්‍රේණිගත නොකළ බව NR සංකේතයෙන් දැක්වේ.

| **ණය ශ්‍රේණිගත කිරීම මගින් ණය අවදානම මැනීම** | ණය ශ්‍රේණිය | 2017 රු. 000 | % | 2016 රු. 000 | % |
|---|---|---|---|---|---|
| **මුදල් හා මුදල් සමානයන්** | | | | | |
| ෆෙඩරල් රිසව් බැන්ක් - ඇ.එ.ජ./ රිසව් බැන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා /බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/බැන්ක් ඔෆ් ජැපෑන්/ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරීග්ස් රික්ස් බැන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ් | | **310,350,210** | **21.38%** | 310,794,899 | 22.41% |
| | AAA | **50,158,566** | **3.45%** | 53,182,289 | 3.84% |
| | AA | **772,746** | **0.05%** | 7,536 | 0.00% |
| | AA- | **81,500,623** | **5.61%** | 50,185,913 | 3.62% |
| | A+ | **3,032,823** | **0.21%** | 8,002,830 | 0.58% |
| | A | **13,741,004** | **0.95%** | 946,070 | 0.07% |
| | A- | **84,841** | **0.01%** | 138,110 | 0.01% |
| | BBB+ | **-** | **0.00%** | 37 | 0.00% |
| | BBB- | **1,505** | **0.00%** | 29,187 | 0.00% |
| | NR | **185,323** | **0.01%** | 496,866 | 0.04% |
| | | **459,827,641** | **31.67%** | 423,783,737 | 30.56% |
| **විකිණීම සඳහා ඇති සුරැකුම්පත්** | | | | | |
| ෆෙඩරල් රිසව් බැන්ක් - ඇ. එ. ජ./රිසව් බැන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා/ බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/ බැන්ක් ඔෆ් ජැපෑන්/ ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරීග්ස් රික්ස් බැන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ් | | **-** | **0.00%** | 8,820,628 | 0.64% |
| | AAA | **62,060,643** | **4.27%** | 99,753,201 | 7.19% |
| | AA+ | **464,672,544** | **32.01%** | 183,643,987 | 13.24% |
| | AA | **1,862,308** | **0.13%** | 1,621,201 | 0.12% |
| | AA- | **13,360,972** | **0.92%** | 18,981,776 | 1.37% |
| | A+ | **21,867,283** | **1.51%** | 22,734,638 | 1.64% |
| | A | **298,956** | **0.02%** | 3,119,014 | 0.22% |

| | | | | | |
|---|---|---|---|---|---|
| | A- | **-** | **0.00%** | (120,419) | -0.01% |
| | NR | **2,106,229** | **0.15%** | 9,990,623 | 0.72 |
| | | **566,228,935** | **39.00%** | 348,544,650 | 25.13% |
| ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | | | | | |
| | AAA | **23,517,574** | **1.62%** | 23,455,657 | 1.69% |
| | AA+ | **1,393,767** | **0.10%** | 1,620,526 | 0.12% |
| | AA | **3,593,798** | **0.25%** | 2,902,494 | 0.21% |
| | AA- | **1,174,551** | **0.08%** | 1,586,037 | 0.11% |
| | A+ | **309,062** | **0.02%** | (224,716) | -0.02% |
| | A | **15,275,623** | **1.05%** | 13,396,168 | 0.97 |
| | BBB+ | **-** | **0.00%** | 542,589 | 0.04% |
| | | **45,264,376** | **3.12%** | 43,278,755 | 3.12% |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ<br>දේශීය ශ්‍රේණිගත කිරීම | AAA | **979,560** | **0.07%** | - | 0.00% |
| | AA+ | **-** | **0.00%** | 2,377 | 0.00% |
| | AA | **2,749,069** | **0.19%** | 156,660 | 0.01% |
| | AA- | **481,327** | **0.03%** | 39,843 | 0.00% |
| | A+ | **66,030** | **0.00%** | - | 0.00% |
| | A | **64,099** | **0.00%** | - | 0.00% |
| | A- | **387,706** | **0.03%** | - | 0.00% |
| | B | **24,265** | **0.00%** | - | 0.00% |
| | NR | **188,399** | **0.01%** | - | 0.00% |
| | | **4,940,455** | **0.33%** | 198,880 | 0.01% |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | AAA | **126,838,152** | **8.74%** | 117,008,339 | 8.44% |
| | | **126,838,152** | **8.74%** | 117,008,339 | 8.44% |
| අනෙකුත් ලැබිය යුතු දෑ | | | | | |
| | AAA | **4,794** | **0.00%** | 532 | 0.00% |
| | AA+ | **3,072,381** | **0.21%** | - | 0.00% |
| | AA- | **-** | **0.00%** | 2,299,102 | 0.17% |
| | A+ | **-** | **0.00%** | 224,742 | 0.02% |
| | A | **-** | **0.00%** | 127 | 0.00% |
| | A- | **-** | **0.00%** | 120,772 | 0.01% |
| | BBB+ | **-** | **0.00%** | 237,320 | 0.02% |
| දේශීය ශ්‍රේණිගත කිරීම | AAA | **-** | **0.00%** | 2,247,000 | 0.16% |
| | NR | **593,319** | **0.04%** | 1,045,455 | 0.08% |
| | | **3,670,494** | **0.25%** | 6,175,049 | 0.45% |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **1,206,770,053** | **83.12%** | 938,989,411 | 67.71% |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | B+ | **32,080,086** | **2.21%** | 351,426,470 | 25.34% |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | B+ | **199,800,871** | **13.76%** | 83,306,771 | 6.01% |
| බැංකුවලට දෙන ලද ණය | AA+ | **96,025** | **0.01%** | 244,284 | 0.02% |
| | AA | **2,056** | **0.00%** | 4,040 | 0.00% |
| | AA- | **2,493** | **0.00%** | 7,902 | 0.00% |
| | A+ | **8,218** | **0.00%** | 17,775 | 0.00% |
| | A- | **14,624** | **0.00%** | 25,195 | 0.00% |
| | BBB | **1,449** | **0.00%** | 3,626 | 0.00% |
| | BB+ | **39,692** | **0.00%** | 62,341 | 0.00% |
| | B+ | **-** | **0.00%** | 515 | 0.00% |
| | B | **2,140** | **0.00%** | 3,500 | 0.00% |
| | NR | **57,006** | **0.00%** | 114,865 | 0.01% |
| මූල්‍ය හා අනෙකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | NR | **41,095** | **0.00%** | 41,095 | 0.00% |
| අනෙකුත් වත්කම් | AAA | **135,457** | **0.01%** | 811 | 0.00% |
| | AA+ | **919,142** | **0.06%** | 548,609 | 0.04% |
| | AA | **-** | **0.00%** | 167,860 | 0.01% |
| | A | **6,746** | **0.00%** | 6,639 | 0.00% |
| | B+ | **5,443,809** | **0.37%** | 5,824,867 | 0.42% |
| | B | **-** | **0.00%** | 10,317 | 0.00% |
| | NR | **6,377,316** | **0.44%** | 5,933,887 | 0.43% |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **245,028,224** | **16.88%** | 447,751,369 | 32.29% |
| **මුළු මූල්‍ය වත්කම්** | | **1, 451,798,277** | **100.00%** | 1,386,740,780 | 100.00% |

| (ඇ) ප්‍රධාන ණය ශ්‍රේණිවල සාරාංශය | ණය ශ්‍රේණිය | 2017 රු. 000 | % | 2016 රු. 000 | % |
|---|---|---|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| ෆෙඩරල් රිසව් බැන්ක් - ඇ.එ.ජ./රිසව් බැන්ක් ඔෆ් ඔස්ට්‍රේලියා/ බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/බැන්ක් ඔෆ් ජැපෑන්/ ඩොයිෂ් බුන්ඩෙස් බෑන්ක්/බැන්ක් ඔෆ් ඉංග්ලන්ඩ්/ සෙවරීග්ස් රික්ස් බැන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ් | | **310,350,210** | **21.38%** | 319,615,527 | 23.05% |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | | **126,838,152** | **8.74%** | 117,008,871 | 8.44% |
| | AAA | **135,741,577** | **935%** | 176,391,148 | 12.72% |
| | AA+/- | **571,403,690** | **39.36%** | 262,848,573 | 18.95% |
| | A+/- | **54,609,592** | **3.76%** | 48,337,336 | 3.49% |
| | BBB+/- | **1,505** | **0.00%** | 809,132 | 0.06% |
| | NR | **2,291,553** | **0.16%** | 10,487,489 | 0.76% |
| | AAA | **979,560** | **0.07%** | 2,247,000 | 0.16% |
| දේශීය ශ්‍රේණිගත කිරීම | AA+ | **-** | **0.00%** | 2,377 | 0.00% |
| | AA | **2,749,069** | **0.19%** | 156,660 | 0.01% |
| | AA- | **481,327** | **0.03%** | 39,843 | 0.00% |
| | A+/- | **517,835** | **0.04%** | - | 0.00% |
| | B+ | **24,265** | **0.00%** | - | 0.00% |
| | NR | **781,718** | **0.05%** | 1,045,455 | 0.08% |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | 1,206,770,053 | 83.12% | 938,989,411 | 67.71% |
| **දේශීය මූල්‍ය වත්කම්** | AAA | **135,457** | **0.01%** | 811 | 0.00% |
| | AA+ | **1,015,167** | **0.07%** | 792,893 | 0.06% |
| | AA | **2,056** | **0.00%** | 171,900 | 0.01% |
| | AA- | **2,493** | **0.00%** | 7,902 | 0.00% |
| | A+ | **8,218** | **0.00%** | 17,775 | 0.00% |
| | A | **6,746** | **0.00%** | 6,639 | 0.00% |
| | A- | **14,624** | **0.00%** | 25,195 | 0.00% |
| | BBB | **1,449** | **0.00%** | 3,626 | 0.00% |
| | BB+ | **39,692** | **0.00%** | 62,341 | 0.00% |
| | B+ | **237,324,767** | **16.35%** | 440,558,623 | 31.77% |
| | B | **2,140** | **0.00%** | 13,817 | 0.00% |
| | NR | **6,475,417** | **0.45%** | 6,089,847 | 0.44% |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **245,028,224** | **16.88%** | 447,751,369 | 32.29% |
| **මුළු මූල්‍ය වත්කම්** | | **1,451,798,277** | **100.00%** | 1,386,740,780 | 100.00% |

## 45.2 පොළී අනුපාතික අවදානම

(අ) විදේශීය මුදල් පොළී අනුපාත සංවේදීතාවය

**පොළී අනුපාත අවදානම යනු පොළී අනුපාතයේ වෙනස්වීම නිසා ඇතිවන පාඩු විඳීමේ අවදානමයි.**

ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹෙහි පොළී අනුපාත සංවේදීතාවය, සංචිත කළමනාකරණ සහ උපදේශක වැඩසටහනෙහි ආයෝජන (RAMP) හැර, පොළී අනුපාතය පදනම් අංක 10 කින් වැඩිවීම මගින් අදාළ ආයෝජන කළඹෙහි වියහැකි හානිය වන අතර මෙය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවදානම් තක්සේරු කිරීම සඳහා යොදා ගන්නා තවත් ක්‍රමයක් වේ.

බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් ආයෝජන කළඹෙහි අවදානම් නිවාරණ සංවේදීතාවය පහත දැක්වේ.

| බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ | විය හැකි පාඩුව (ඇ.එ.ජ. ඩොලර් මිලියන) | |
|---|---|---|
| | **2017** | **2016** |
| වෙළෙඳ හා විකිණීම සඳහා ඇති ආයෝජන | **7.55** | 5.16 |
| RAMP | **0.03** | 0.03 |

අවදානම් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් විදේශ වත්කම් ආයෝජන කළඹෙහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කිරීම සඳහා පහත දැක්වෙන උපාය මාර්ග යන් අනුගමනය කරනු ලැබේ.

**(i)** පොළී අනුපාත වෙනස්වීම මත විදේශ වත්කම් ආයෝජන කළඹට ඇතිවන බලපෑම පොළී අනුපාත සංවේදීතාවය

මගින් මනිනු ලබන අතරම පොළී අනුපාතය මෙන්ම ආයෝජනයේ කාල සීමාව සැලකිල්ලට ගනු ලබන විකරිත සඵල කාලච්ඡේදය පොළී අනුපාත අවදානම මැනීම සඳහා බැංකුව විසින් යොදා ගනු ලැබේ. විකරිත සඵල කාලච්ඡේදය මගින් දෙනලද පොළී අනුපාත (ඵලදාව) වෙනස්වීම් මත සුරැකුම්පත්වල මිල වෙනස්වීම් මනිනු ලැබේ. ඉහළ විකරිත සඵල කාලච්ඡේදයක් මගින් ඉහළ අවදානමක් පෙන්නුම් කෙරේ. එමනිසා මූල්‍ය වෙළෙඳපොලවල් තුළ ඇති වන සංවර්ධනයන්, ආයෝජන කළඹේ ඇති සංලක්ෂණයන් හා බැඳුම්කර ආයෝජන කළඹේ ඇති අවදානම් අභිරුචිය යන කරුණු සලකා බැලීමෙන් අනතුරුව මහ බැංකුව විසින් උචිත විකරිත සඵල කාලච්ඡේදයන් කලින් කලට සකස් කරනු ලැබේ. විදේශ වත්කම් ආයෝජන කළඹේ විකරිත සඵල කාලච්ඡේදය පහත ආකාර වේ.

**විකරිත සඵල කාලච්ඡේදය**

| ආයෝජන ඛණ්ඩය | විකරිත සඵල කාලච්ඡේදය | |
|---|---|---|
| | **2017** | **2016** |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ (ස්ථාවර ආදායම් සුරැකුම්පත්) | **2.02** | 2.26 |
| **RAMP** | **1.39** | 1.42 |

**(ii)** විකරිත සඵල කාලච්ඡේදය මඟින් විශාල වශයෙන් වන මිල වෙනස්වීම් ගණනය නොවන නිසා, විදේශ සංචිත ආයෝජන කළඹේ පොළී අනුපාත අවදානම මැනීම සඳහා භාවිතා කරන තවත් මිනුමක් ලෙස උත්තලතාවය (convexity) දැක්විය හැකිය. උත්තලතාවය මඟින් බැඳුම්කර මිල ඵලදා වක්‍රයේ වෙනස්වීම කාල පරිච්ඡේදයට අනුව සරල රේඛාවක් මඟින් මනිනු ලබයි. මෙමගින් ස්ථාවර සුරැකුම්පත් මිල, පොළී අනුපාතයට දක්වන සංවේදීතාවය තවදුරටත් නියමිත අගයට ආසන්න කිරීමට ඉඩකඩ ලබාදේ. කාලච්ඡේදයේ වෙනස සඳහා ඵලදා අනුපාතයේ වෙනස උත්තලතාවයයි. එය විකරිත සඵල කාලච්ඡේදයේ පුරෝකතනය කළ දෝෂය මනිනු ලබයි. වෙනත් වචනයෙන් කිවහොත් මෙය ඵලදා අනුපාතය සම්බන්ධයෙන් සුරැකුම්පත්වල මිලයන්හි දෙවන ව්‍යුත්පන්නයයි.

**බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹේ උත්තලතාවය**

| බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ | විය හැකි පාඩුව (ඇ.ඩොලර් මිලියන) | |
|---|---|---|
| | **2017** | **2016** |
| වෙළෙඳ හා විකිණීම සඳහා ඇති ආයෝජන | **0.07** | 0.99 |
| **RAMP** | **0.04** | 0.04 |

**(iii) අවදානම් වටිනාකම (Value at Risk)**

සාමාන්‍ය වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ මූල්‍ය වෙළෙඳපොළ චලනයන් මගින් ආයෝජන කළඹක අයහපත් දිසාවට අවදානම තනි අගයකට සාරාංශ කිරීමක් අවදානම් වටිනාකම මගින් සිදුකරයි. එම නිසා අවදානම් වටිනාකම ඉලක්ක කාල සීමාව පුරාවට වන උපරිම අලාභය වන අතර එහි දී සත්‍ය අලාභය ඉහළ වීමේ සම්භාවිතාව පහළ හා කලින් සඳහන් මට්ටමේ විය හැක. අවදානම් වටිනාකම මගින්, අවදානම සහ තත්ත්වය හරහා සමාහාරය කළ හැකි මුදලින් ප්‍රකාශ කරනු ලබන සංඛ්‍යාවක් ලබා දේ.

99% විශ්‍රමභ ප්‍රාන්තරයක් යටතේ දින 10 ක කාල සීමාවක් සඳහා අවදානම් වටිනාකම් අගය ගණනය සඳහා බැංකුව ඓතිහාසික අනුරූපන (simulation) ක්‍රමය යොදාගනී. අවදානම් වටිනාකම් තක්සේරු කිරීම සඳහා වූ ඓතිහාසික ක්‍රමය විටෙක ඓතිහාසික අනුරූපන ක්‍රමය ලෙස දක්වයි. උදාහරණයක් වශයෙන් ඓතිහාසික ක්‍රමය භාවිතා කරමින් 5% දෛනික අවදානම් වටිනාකම ගණනය කිරීමේදී පසුගිය දෛනික ප්‍රතිලාභය සමුච්චිත කොට ප්‍රතිලාභයන් ඉහලම අගයේ සිට පහලම අගය දක්වා ශ්‍රේණි ගතකොට 5% අවම ප්‍රතිලාභය හඳුනා ගනී. මෙම 5% අවම ප්‍රතිලාභයන් අතුරින් ඉහලම අගය එක්දින 5% වටිනාකම් අවදානම ලෙස හඳුනාගනී.

| බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ | අවදානම් වටිනාකම (ඇ.එ. ජ.ඩොලර්.මිලියන) | |
|---|---|---|
| | **2017** | **2016** |
| වෙළෙඳ හා විකිණීම සඳහා ඇති ආයෝජන | **22.98** | 36.02 |
| **RAMP** | **0.64** | 0.65 |

**(iv) වෙළෙඳ හා විවෘත තත්ත්වයන් (Open Positions) හි සීමා**

ගණුදෙනු අධිකාරිය වශයෙන් බැංකුව විසින් අන්තර් දින කටයුතු සඳහා නිශ්චිත ගණුදෙනුකරු සීමා (Specific Dealer Limit) ද එක්දින තත්ත්ව සීමා (Overnight Position Limit) තනිපුද්ගල ගණුදෙනුකරුවන් සඳහා ද පනවනු ලබයි.

විදේශීය සංචිත කළමනාකරණ කමිටුවට අඛණ්ඩ ව වාර්තා කිරීම පිණිස පොළී අනුපාතික අවධානම, සංචිත කළමනාකරණය හා උපදේශක වැඩසටහනෙහි ආයෝජනවලට අදාළ ව මනිනු ලැබේ.

**(ආ) දේශීය මුදල් පොළී අනුපාත සංවේදීතාවය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති දේශීය භාණ්ඩාගාර බිල්පත් කළඹ, ශ්‍රී ලංකා රජයට ලබාදුන් ණය ප්‍රමාණය නියෝජනය කරන නිසා එය ක්‍රමක්ෂය අගයට වාර්තා කරනු ලබයි. බැංකුව පොළී ආදායම ඉපැයීම අරමුණු කර නොගෙන භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සිදු කරන හෙයින් භාණ්ඩාගාර බිල්පත් කළඹ, ආයෝජන කළඹක් ලෙස

නොසැලකේ. බැංකුවේ මූලික අරමුණුවලින් එකක් වන, ආර්ථික හා මිල ස්ථායිතාවය රැකීම සම්බන්ධ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය වෙළෙඳපොළට ද්‍රවශීලතාවය විදීමට හෝ දේශීය වෙළෙඳපොළින් ද්‍රවශීලතාවය උකහා ගැනීමට බැංකුව භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හෝ විකිණීම සිදු කරනු ලබයි. එහෙයින් බැංකු ආයෝජන කළඹෙහි භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රමාණය, එහි මූල්‍ය ප්‍රතිපත්තිය විසින් තීරණය කරනු ලැබේ. ඊට අමතරව, රුපියල් වෙළෙඳපොළේ මූලික පොළී අනුපාත එනම්, ප්‍රතිමිලදී ගැනීමේ අනුපාතය හා ප්‍රතිවිකුණුම් අනුපාත, මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබයි. වැඩිදුරටත්, රුපියල් ද්‍රවශීලතාවය විදීම් හෝ වෙළෙඳපොළින් රුපියල් ද්‍රවශීලතාවය උකහා ගැනීම් සඳහා වූ බැංකුවේ ක්‍රියාමාර්ග පොදු රුපියල් වෙළෙඳපොළේ පොළී අනුපාතයන් කෙරෙහි බලපානු ලබයි. ඒ අනුව භාණ්ඩාගාර බිල්පත් කළඹ මගින් උද්ගත වන පොළී ආදායමේ වෙනස්වීම් කෙරෙහි ආයෝජන තීරණවලට වඩා බැංකුවෙහි භාණ්ඩාගාර බිල්පත් කළඹෙහි ප්‍රමාණය මෙන් ම මූලික වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග බලපානු ලබයි. එම නිසා බැංකුව දේශීය මූල්‍ය වත්කම්වල පොළියේ වන සංවේදීතාවය ගැන නොසලකනු ලැබේ.

**(ඇ) වත්කම් සහ වගකීම් කල් පිරීම හෝ ප්‍රතිමිල කිරීම පහත සඳහන් කාලච්ඡේදවලදී සිදුවේ.**

| විදේශ මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරයः | හරිත සාමාන්‍ය පොළී අනුපාතය | 2017 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 1.5150 | **459,827,641** | 459,827,641 | - | - | - | - |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් හා අලෙවි කල හැකි සුරැකුම්පත් | 1.9158 | **596,217,687** | 87,922,743 | 76,479,327 | 118,516,346 | 313,299,271 | - |
| ජා. මූ. අ. සම්බන්ධ වත්කම් | 0.5392 | **11,094,542** | 11,094,542 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | | **1,067,139,870** | 558,844,926 | 76,479,327 | 118,516,346 | 313,299,271 | - |
| **පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | | **115,743,610** | - | 164,564 | - | - | 115,579,046 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | **4,940,455** | 4,536,892 | 403,563 | - | - | - |
| අනෙකුත් ලැබිය යුතු දෑ | | **3,670,494** | 3,670,494 | - | - | - | - |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | | **15,275,623** | 15,275,623 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්** | | **139,630,182** | 23,483,009 | 568,127 | - | - | 115,579,046 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **1,206,770,052** | 582,327,935 | 77,047,454 | 118,516,346 | 313,299,271 | 115,579,046 |
| **පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| ජා.මූ.අ. | 1.5480 | **116,996,460** | - | - | - | 49,873,486 | 67,122,974 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 1.2800 | **90,868,160** | 90,868,160 | - | - | - | - |
| ඉන්දියානු මහ බැංකුව සමග විනිමය හුවමාරු | 0.0000 | **-** | - | - | - | - | - |
| **මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්** | | **207,864,620** | 90,868,160 | - | - | 49,873,486 | 67,122,974 |
| **පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | | **8,683,033** | 8,683,033 | - | - | - | - |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | **4,648,449** | 1,048,241 | 2,355,626 | 448,134 | 796,448 | - |
| ජා.මූ.අ. | | **201,668,872** | - | - | - | - | 201,668,872 |
| විදේශීය මුදලින් ඇති වාණිජ බැංකුවල ප්‍රාග්ධනය | | **1,193,019** | - | - | - | - | 1,193,019 |
| අනෙකුත් විදේශ වගකීම | | **62,902,870** | 62,902,870 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්** | | **279,096,243** | 72,634,144 | 2,355,626 | 448,134 | 796,448 | 202,861,891 |
| **මුළු විදේශීය මූල්‍ය වගකීම්** | | **486,960,863** | 163,502,304 | 2,355,626 | 448,134 | 50,669,934 | 269,984,865 |
| **විදේශීය මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය** | | **859,275,250** | 467,976,766 | 76,479,327 | 118,516,346 | 263,425,785 | (67,122,974) |

| | හරිත සාමාන්‍ය පොළී අනුපාතය | 2017 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| **පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්** | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 8.9863 | **9,704,962** | 9,704,962 | - | - | - | - |
| භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ප්‍රතිමිළදී ගැනීම | 8.7500 | **22,375,124** | 22,375,124 | - | - | - | - |
| බැංකුවලට දෙන ලද ණය | 8.0891 | **223,702** | 110,409 | 44,126 | 54,599 | 10,049 | 4,519 |
| අනිකුත් වත්කම් - සේවක ණය | 3.9834 | **6,105,830** | 231,580 | 238,514 | 486,331 | 1,543,517 | 3,605,888 |
| - අනෙකුත් | 10.2520 | **6,579,629** | 593,501 | 622,037 | 1,142,843 | 1,870,103 | 2,351,145 |
| **මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්** | | **44,989,247** | 33,015,576 | 904,676 | 1,683,773 | 3,423,669 | 5,961,551 |
| **පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | | **199,800,871** | 199,800,871 | - | - | - | - |
| අනෙකුත් වත්කම් - අනෙකුත් | | **197,011** | 197,011 | - | - | - | - |
| හිමිකරු ප්‍රාග්ධන ආයෝජන - විකිණීමට ඇති | | **41,095** | - | - | - | - | 41,095 |
| **මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්** | | **200,038,977** | 199,997,882 | - | - | - | 41,095 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **245,028,224** | 233,013,459 | 904,676 | 1,683,773 | 3,423,669 | 6,002,646 |
| **පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත් | 7.2500 | **6,503,884** | 6,503,884 | - | - | - | - |
| නිත්‍ය තැන්පතු පහසුකම | 7.2500 | **34,151,394** | 34,151,394 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්** | | **40,655,278** | 40,655,278 | - | - | - | - |
| **පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | | **341,712,198** | 341,712,198 | - | - | - | - |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | | **324,516** | 324,516 | - | - | - | - |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | | **4,547** | 4,547 | - | - | - | - |
| සංසරණයේ පවතින මුදල් | | **598,053,901** | 598,053,901 | - | - | - | - |
| අනිකුත් ගෙවිය යුතු දෑ | | **8,887,156** | 8,887,156 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්** | | **948,982,318** | 948,982,318 | - | - | - | - |
| **මුළු දේශීය මූල්‍ය වගකීම්** | | **989,637,596** | 989,637,596 | - | - | - | - |
| **දේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය** | | **4,333,968** | (7,639,702) | 904,676 | 1,683,773 | 3,423,669 | 5,961,551 |

2016 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක සංඛ්‍යා පහත පරිදි වේ.

| **විදේශ මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය:** | හරිත සාමාන්‍ය පොළී අනුපාතය | 2016 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| **පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| මුදල් හා මුදල් සමානයන් | 0.6352 | 423,783,737 | 423,783,737 | - | - | - | - |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් හා අලෙවිකල හැකි ආයෝජන | 1.1792 | 378,427,237 | 82,598,844 | 37,282,832 | 100,641,826 | 117,752,141 | 40,151,594 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 0.0228 | 9,940,219 | 9,940,219 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | | 812,151,193 | 516,322,800 | 37,282,832 | 100,641,826 | 117,752,141 | 40,151,594 |
| **පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | | 107,068,121 | - | - | - | 145,906 | 106,922,215 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | 198,880 | 198,880 | - | - | - | - |
| ලැබිය යුතු දෑ | | 6,175,049 | 6,175,049 | - | - | - | - |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | | 13,396,168 | 13,396,168 | - | - | - | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මුළු පොලී සංවේදි නොවන විදේශීය මූල්‍ය වත්කම් | | 126,838,218 | 19,770,097 | - | - | 145,906 | 106,922,215 |
| මුළු විදේශීය මූල්‍ය වත්කම් | | 938,989,411 | 536,092,897 | 37,282,832 | 100,641,826 | 117,898,047 | 147,073,809 |
| **පොලී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| ජා.මූ.අ. | 0.2440 | 82,976,654 | 27,750,312 | 6,937,578 | - | 18,108,285 | 30,180,479 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 0.5100 | 79,863,615 | 79,863,615 | - | - | - | - |
| ඉන්දියානු මහ බැංකුව සමඟ විනිමය හුවමාරුව | 2.9973 | 59,920,000 | 59,920,000 | - | - | - | - |
| මුළු පොලී සංවේදී විදේශීය මූල්‍ය වගකීම් | | 222,760,269 | 167,533,927 | 6,937,578 | - | 18,108,285 | 30,180,479 |
| **පොලී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | | 45,566,681 | 45,566,681 | - | - | - | - |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | 14,573,675 | 5,088,148 | 3,564,938 | 3,931,574 | 1,989,015 | - |
| ජා.මූ.අ. | | 186,563,942 | - | - | - | - | 186,563,942 |
| විදේශීය මුදලින් ඇති වාණිජ බැංකුවල ප්‍රාග්ධනය | | 1,169,177 | - | - | - | - | 1,169,177 |
| අනෙකුත් විදේශීය වගකීම් | | 35,160,855 | 35,160,855 | - | - | - | - |
| මුළු පොලී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම් | | 283,034,330 | 85,815,684 | 3,564,938 | 3,931,574 | 1,989,015 | 187,733,119 |
| මුළු විදේශීය මූල්‍ය වගකීම් | | 505,794,599 | 253,349,611 | 10,502,516 | 3,931,574 | 20,097,300 | 217,913,598 |
| විදේශීය මුදල් පොලී අනුපාත සංවේදීතා අන්තරය | | 589,390,924 | 348,788,873 | 30,345,254 | 100,641,826 | 99,643,856 | 9,971,115 |

| දේශීය මුදල් පොලී අනුපාත සංවේදීතා අන්තරය: | භාරිත සාමාන්‍ය පොලී අනුපාතය | 2016 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පොලී සංවේදී දේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 9.1639 | 320,605,082 | 233,255,698 | 87,349,384 | - | - | - |
| භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ප්‍රතිමිළදී ගැනීම | 8.5000 | 30,820,231 | 30,820,231 | - | - | - | - |
| බැංකුවලට දෙන ලද ණය | 8.4016 | 484,043 | 182,396 | 107,091 | 125,390 | 61,511 | 7,655 |
| අනිකුත් වත්කම් - සේවක ණය | 3.5355 | 5,603,510 | 92,230 | 92,417 | 192,376 | 621,059 | 4,605,428 |
| - අනෙකුත් | 10.0079 | 5,252,364 | 661,399 | 183,437 | 843,138 | 2,134,946 | 1,429,444 |
| මුළු පොලී සංවේදී දේශීය මූල්‍ය වත්කම් | | 362,765,230 | 265,011,953 | 87,732,329 | 1,160,904 | 2,817,516 | 6,042,528 |
| **පොලී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | | 83,306,771 | 83,306,771 | - | - | - | - |
| අනෙකුත් වත්කම් - අනෙකුත් | | 1,638,273 | 1,638,273 | - | - | - | - |
| හිමිකරු ප්‍රාග්ධන අයෝජන - විකිණීමට ඇති | | 41,095 | - | - | - | - | 41,095 |
| මුළු පොලී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම් | | 84,986,139 | 84,945,044 | - | - | - | 41,095 |
| මුළු දේශීය මූල්‍ය වත්කම් | | 447,751,369 | 349,956,998 | 87,732,329 | 1,160,904 | 2,817,516 | 6,083,622 |
| **පොලී සංවේදී දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| ප්‍රතිමිළදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත් | 7.4282 | 21,383,724 | 21,383,724 | - | - | - | - |
| නිත්‍ය තැන්පතු පහසුකම් | 7.0000 | 48,670,712 | 48,670,712 | - | - | - | - |
| මුළු පොලී සංවේදී දේශීය මූල්‍ය වගකීම් | | 70,054,436 | 70,054,436 | - | - | - | - |
| **පොලී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | | 303,251,290 | 303,251,290 | - | - | - | - |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | | 450,884 | 450,884 | - | - | - | - |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | | 51,744 | 51,744 | - | - | - | - |
| සංසරණයෙහි පවතින මුදල් | | 552,777,865 | 552,777,865 | - | - | - | - |
| අනිකුත් ගෙවිය යුතු දෑ | | 8,563,548 | 8,563,548 | - | - | - | - |
| මුළු පොලී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම් | | 865,095,331 | 865,095,331 | - | - | - | - |
| මුළු දේශීය මූල්‍ය වගකීම් | | 935,149,767 | 935,149,767 | - | - | - | - |
| දේශීය මුදල් පොලී අනුපාත සංවේදීතා අන්තරය | | 292,710,794 | 194,957,517 | 87,732,329 | 1,160,904 | 2,817,516 | 6,042,528 |

### 45.3 විදේශීය මුදල් අවදානම

බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යය යටතේ දරන්නා වූ විදේශීය වත්කම් තුළින් බැංකුවෙහි විදේශ මුදල් කටයුතු නිරූපණය වේ. විදේශ විනිමය වෙළෙඳපොළේ වෙනස්වීම හේතුවෙන් බැංකුව, විනිමය අවදානමට විවෘත වේ. මුදල් මණ්ඩලය සහ විදේශ සංචිත කළමනාකරණ කමිටුව විසින් බැංකුවේ ජාත්‍යන්තර සංචිතයෙහි විවිධ මුදල වර්ගවලින් දැරිය යුතු ප්‍රතිශත ප්‍රමාණයක් නියම කර තිබේ. මුදල් වෙන්කිරීම පිළිබඳව තීරණය කිරීමේ දී රාජ්‍ය ණය ආපසු ගෙවීමේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනු ලැබේ. එබැවින් බැංකුව විසින් ප්‍රධාන මුදල් වර්ග බොහොමයක්, එනම් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ස්ටර්ලිං පවුම්, ජපන් යෙන්, යූරෝ, ඕස්ට්‍රේලියන් ඩොලර් හා නවසීලන්ත ඩොලර් මගින් දරනු ලබයි. විදේශීය මුදල් තත්ත්වය මත පනවා ඇති සීමාවන්ට අනුකූලවීම සුපරීක්ෂණයට භාජනය වේ.

**විදේශ මුදල් සඳහා ශුද්ධ නිරාවරණය**

2017 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ නිරාවරණය පහත පරිදි වේ.

| | මුදල් වර්ගය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | යූරෝ | ජපන් යෙන් | ස්ටර්ලිං පවුම් | විගැහි | ඕස්ට්‍රේලියානු ඩොලර් | කැනේඩියානු ඩොලර් | නවසීලන්ත ඩොලර් | අනිකුත් මුදල් | සියළුම මුදල් වර්ගවල එකතුව |
| 2017 දෙසැම්බර් 31 දිනට | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 133,266,127 | (50,974,866) | (58,292,654) | 92,771,973 | - | 124,864,455 | 390,378 | (6,412,537) | 224,214,765 | 459,827,641 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් හා අලෙවිය සඳහා ඇති ආයෝජන | 532,783,747 | 3,676,937 | 6,297,818 | 5,302,523 | - | 34,445,694 | - | 11,011,941 | 17,974,651 | 611,493,311 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 536 | - | - | - | | - | - | - | 4,939,919 | 4,940,455 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | - | - | - | - | 126,838,152 | - | - | - | - | 126,838,152 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 3,665,700 | - | - | - | 4,794 | - | - | - | - | 3,670,494 |
| මුළු විදේශීය මූල්‍ය වත්කම් | 669,716,110 | (47,297,929) | (51,994,836) | 98,074,496 | 126,842,946 | 159,310,149 | 390,378 | 4,599,404 | 247,129,335 | 1,206,770,053 |
| සමානුපාතය | 55.50% | (3.92%) | (4.31%) | 8.13% | 10.51% | 13.20% | 0.03% | 0.38% | 20.48% | 100% |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 8,681,097 | 12 | - | - | - | - | - | - | 1,924 | 8,683,033 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | - | - | - | - | - | - | - | 4,648,449 | 4,648,449 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 90,868,160 | - | - | - | - | - | - | - | - | 90,868,160 |
| ජා.මූ.අ. | - | - | - | - | 318,665,332 | - | - | - | - | 318,665,332 |
| අනෙකුත් | 19,241,566 | - | - | - | - | - | - | - | 44,854,323 | 64,095,889 |
| මුළු විදේශීය මූල්‍ය බැරකම් | 118,790,823 | 12 | - | - | 318,665,332 | - | - | - | 49,504,696 | 486,960,863 |
| සමානුපාතය | 24.39% | 0.00% | 0.00% | 0.00% | 65.44% | 0.00% | 0.00% | 0.00% | 10.17% | 100% |
| ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය | 550,925,287 | (47,297,941) | (51,994,836) | 98,074,496 | (191,822,386) | 159,310,149 | 390,378 | 4,599,404 | 197,624,639 | 719,809,190 |

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ.

| 2017 දෙසැම්බර් 31 දිනට | ශ්‍රී ලංකා රුපියල් | එක්සත් ජනපද ඩොලර් | යූරෝ | ස්ටර්ලිං පවුම් | ජපන් යෙන් | ඕස්ට්‍රේලියානු ඩොලර් | ස්විඩන ක්‍රෝනය |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| මිලදී ගැනුම් | 260,379,629 | (18,113,664) | 131,788 | (62,622) | (4,876) | (6,352,618) | - |
| විකුණුම් | (24,459,676) | (231,780,079) | 5,375,438 | 19,321,868 | 4,876 | 30,444 | - |
| ඉදිරියෙහි වූ හුවමාරු ප්‍රතිගිණුම -ආසන්නම ගනුදෙනුව | (1,667) | - | - | - | - | - | - |
| ඉදිරි ප්‍රති ගිණුම | (4,468,841) | - | - | - | - | - | - |

2016 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ අවදානම් නිරාවරණය පහත සඳහන් විය.

| | මුදල් වර්ගය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2016 දෙසැම්බර් 31 දිනට | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | යුරෝ | ජපන් යෙන් | ස්ටර්ලිං පවුම් | විගැහි | ඕස්ට්‍රේලියානු ඩොලර් | කැනේඩියානු ඩොලර් | නවසීලන්ත ඩොලර් | අනිකුත් මුදල් | සියළුම මුදල් වර්ගවල එකතුව |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 60,672,511 | (52,620,544) | (44,196,304) | 92,331,449 | - | 134,790,117 | (9,651,058) | (5,876,338) | 248,333,904 | 423,783,737 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් හා අලෙවිය සඳහා ඇති ආයෝජන | 243,152,847 | 44,267,349 | 21,813,382 | 11,527,275 | - | 21,471,379 | 9,797,465 | 9,687,691 | 30,106,017 | 391,823,404 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | - | - | - | - | - | - | - | 198,880 | 198,880 |
| ජා.මු.අ. සම්බන්ධ වත්කම් | - | - | - | - | 117,008,340 | - | - | - | - | 117,008,340 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 6,053,745 | 120,772 | - | - | 532 | - | - | - | - | 6,175,049 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | 309,879,103 | (8,232,423) | (22,382,922) | 103,858,723 | 117,008,872 | 156,261,496 | 146,407 | 3,811,353 | 278,638,802 | 938,989,411 |
| සමානුපාතය | 33.00% | (0.88%) | (2.38%) | 11.06% | 12.46% | 16.64% | 0.02% | 0.41% | 29.67% | 100% |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 45,566,531 | 10 | - | 139 | - | - | 1 | - | - | 45,566,681 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 11 | - | - | - | - | - | - | - | 14,573,664 | 14,573,675 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 79,863,615 | - | - | - | - | - | - | - | - | 79,863,615 |
| ජා.මු.අ. | - | - | - | - | 269,540,596 | - | - | - | - | 269,540,596 |
| අනෙකුත් | 95,804,614 | - | - | - | - | - | - | - | 445,418 | 96,250,032 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | 221 ,234,771 | 10 | - | 139 | 269,540,596 | - | 1 | - | 15,019,082 | 505,794,599 |
| සමානුපාතය | 43.74% | 0.00% | 0.00% | 0.00% | 53.29% | 0.00% | 0.00% | 0.00% | 4.27% | 100% |
| **ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය** | 88,644,332 | (8,232,433) | (22,382,922) | 103,858,584 | (152,531,724) | 156,261,496 | 146,406 | 3,811,353 | 263,619,720 | 433,194,812 |

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ.

| 2016 දෙසැම්බර් 31 දිනට | ශ්‍රී ලංකා රුපියල් | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | යුරෝ | ස්ටර්ලිං පවුම් | ජපන් යෙන් | ඕස්ට්‍රේලියානු ඩොලර් | ස්විඩන ක්‍රෝනය |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| මිලදී ගැනුම් | 399,872,823 | (15,716,215) | (985) | (62,622) | (4,876) | (6,352,618) | - |
| විකුණුම් | (26,858,576) | (377,765,524) | 5,375,438 | 19,321,868 | 4,876 | 30,444 | (960) |
| ඉදිරියෙහි වූ හුවමාරු ප්‍රතිගිණුම - ආසන්නම ගනුදෙනුව | (1,667) | - | - | - | - | - | - |
| ඉදිරි ප්‍රති ගිණුම | 2,158,595 | - | - | - | - | - | - |

## 45.4 මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම්

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම්හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල්පිරීම් පහත පරිදි වේ.

| | මාස 6ට අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2017 දෙසැම්බර් 31 දිනට | | | | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 459,827,641 | - | - | - | - | 459,827,641 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 21,369,496 | 4,465,690 | 13,178,459 | 8,851,636 | - | 47,865,281 |
| අලෙවිය සඳහා ඇති ආයෝජන | 46,372,253 | 94,705,246 | 126,493,457 | 322,848,221 | - | 590,419,177 |
| ජා.මු.අ. සම්බන්ධ වත්කම් | 11,094,542 | - | - | 164,565 | 115,579,046 | 126,838,153 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 3,670,494 | - | - | - | - | 3,670,494 |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම්** | 542,334,426 | 99,170,936 | 139,671,916 | 331,864,422 | 115,579,046 | 1,228,620,746 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **දේශීය මුදල් මූල්‍ය වත්කම්** | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 32,288,005 | - | - | - | - | 32,288,005 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 199,800,871 | - | - | - | - | 199,800,871 |
| බැංකු සඳහා දෙන ලද ණය | 114,827 | 46,409 | 56,593 | 11,274 | 4,697 | 233,800 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | - | - | 41,095 | 41,095 |
| අනෙකුත් වත්කම් | 14,901,062 | 1,189,827 | 2,713,417 | 4,296,510 | 8,129,740 | 31,230,555 |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්** | 247,104,765 | 1,236,235 | 2,770,010 | 4,307,784 | 8,175,531 | 263,594,325 |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්** | 789,439,191 | 100,407,171 | 142,441,927 | 336,172,205 | 123,754,577 | 1,492,215,071 |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 9,607,147 | 1,348,974 | 2,678,505 | 7,689,134 | 10,313,402 | 31,637,162 |
| ආසියානු නිශ්කාශන සංගමය | 90,868,160 | - | - | - | - | 90,868,160 |
| ජා.මූ.අ. | - | - | - | 30,374,077 | 288,291,256 | 318,665,333 |
| අනෙකුත් | 62,902,870 | - | - | - | 1,193,019 | 64,095,889 |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්** | 163,378,177 | 1,348,974 | 2,678,505 | 38,063,211 | 299,797,677 | 505,266,544 |
| **දේශීය මුදල් මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 341,712,198 | - | - | - | - | 341,712,198 |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | 324,517 | - | - | - | - | 324,517 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 40,663 | - | - | - | - | 40,663 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 4,547 | - | - | - | - | 4,547 |
| සංසරණයේ පවත්නා මුදල් | 598,053,901 | - | - | - | - | 598,053,901 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 9,189,166 | - | - | - | - | 9,189,166 |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්** | 949,324,992 | - | - | - | - | 949,324,992 |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්** | 1,112,703,169 | 1,348,974 | 2,678,505 | 38,063,211 | 299,797,677 | 1,454,591,536 |
| **ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම්/(වගකීම්)** | (323,263,978) | 99,058,197 | 139,763,422 | 298,108,994 | (176,043,100) | 37,623,535 |

| | මාස 6ට අඩු | මාස 6 සිට 12 දක්වා |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| **2017 දෙසැම්බර් 31 දිනට** | | |
| ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් | 178,883,331 | 57,169,395 |
| ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් | 171,988,417 | 56,697,667 |

### විදේශීය මුදල් පරිවර්තනය

විදේශීය මූල්‍ය වත්කම් හා වගකීම්වලට සම්බන්ධ සියලුම අනාගත මූල්‍ය ප්‍රවාහ වාර්තාගත කරන මුදල් ඒකකයට පරිවර්තනය කර ඇත්තේ වාර්තාකරණ දිනයට අදාළ විනිමය අනුපාතිකයටයි.

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම් පහත පරිදි වේ.

| | මාස 6ට අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **2016 දෙසැම්බර් 31 දිනට විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 423,783,737 | - | - | - | - | 423,783,737 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 18,588,564 | 5,033,982 | 12,151,636 | 8,087,248 | - | 43,861,430 |
| අලෙවිය සඳහා ඇති ආයෝජන | 54,001,291 | 39,271,443 | 104,459,788 | 120,422,348 | 38,708,398 | 356,863,268 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 9,940,219 | - | - | 145,906 | 106,922,214 | 117,008,339 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 6,175,049 | - | - | - | - | 6,175,049 |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම්** | 512,488,860 | 44,305,425 | 116,611,424 | 128,655,502 | 145,630,612 | 947,691,823 |
| **දේශීය මුදල් මූල්‍ය වත්කම්** | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 267,791,962 | 94,425,980 | - | - | - | 362,217,942 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 83,306,771 | - | - | - | - | 83,306,771 |
| බැංකු සඳහා දෙන ලද ණය | 194,137 | 114,307 | 132,090 | 64,456 | 8,108 | 513,098 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | - | - | 41,095 | 41,095 |
| අනෙකුත් වත්කම් | 16,371,699 | 645,307 | 1,684,900 | 4,588,533 | 6,697,731 | 24,592,998 |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්** | 367,664,569 | 95,185,594 | 1,816,990 | 4,652,989 | 6,746,934 | 470,671,904 |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්** | 880,153,429 | 139,491,019 | 118,428,414 | 133,308,491 | 152,377,546 | 1,418,363,727 |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| බැංකු සහ මූල්‍ය ආයතන | 44,456,357 | 418,671 | 793,905 | 2,337,833 | 3,461,514 | 51,468,280 |
| ආසියානු නිශ්කාශන සංගමය | 79,863,615 | - | - | - | - | 79,863,615 |
| ජා.මූ.අ. | 27,750,312 | 6,937,578 | - | 10,060,159 | 224,792,547 | 269,540,596 |
| අනෙකුත් | 95,125,637 | - | - | - | 1,124,395 | 96,250,032 |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්** | 247,195,921 | 7,356,249 | 793,905 | 12,397,992 | 229,378,456 | 497,122,523 |
| **දේශීය මුදල් මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 303,251,290 | - | - | - | - | 303,251,290 |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | 450,884 | - | - | - | - | 450,884 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 70,081,240 | - | - | - | - | 70,081,240 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 51,744 | - | - | - | - | 51,744 |
| සංසරණයෙහි පවත්නා මුදල් | 552,777,865 | - | - | - | - | 552,777,865 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 8,563,548 | - | - | - | - | 8,563,548 |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්** | 935,176,571 | - | - | - | - | 935,176,571 |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්** | 1,182,372,492 | 7,356,249 | 793,905 | 12,397,992 | 229,378,456 | 1,432,299,094 |
| **ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම් / (වගකීම්)** | (302,219,063) | 132,134,770 | 117,634,509 | 120,910,499 | (77,000,910) | (13,935,367) |

| | මාස 6ට අඩු | මාස 6 සිට 12 දක්වා |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| **2016 දෙසැම්බර් 31 දිනට** | | |
| ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් | 279,092,132 | 93,922,515 |
| ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් | 279,934,575 | 92,340,465 |

### 45.5 ද්‍රවශීලතා අවදානම

මූල්‍ය ලියවිලි ආශ්‍රිත බැඳීම් සපුරාලීමට අවශ්‍යවන අරමුදල් කෙටි දැනුම්දීමක දී සපයා ගැනීමේ දී ඒකකයක් විසින් මුහුණපානු ලබන දුෂ්කරතා ද්‍රවශීලතා අවදානම වේ. ඒකකයකට තම මූල්‍ය වත්කම් ඉක්මණින්, සාධාරණ අගයට වඩා ඉතා අඩු මිලකට විකිණීමට සිදුවීම ද ද්‍රවශීලතා අවදානමකි.

(අ) බැංකුවේ විදේශීය මුදල් වත්කම් සංයුතිය නිශ්චය කිරීමේදී ද ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ ද්‍රවශීලතාවය සම්බන්ධයෙනි. අවශ්‍ය අවස්ථාවන්හි දී මැදිහත්වීමේ කාර්යයන් ද රාජ්‍ය ණය සහ ජා.මූ.අ. ණය ආපසු ගෙවීම වැනි වූ බැඳීම් බේරුම් කිරීම සඳහා ද විදේශීය සංචිත ඇවර කිරීමේ විභව අවශ්‍යතාවය මෙයින් ගම්‍ය වේ. අරමුදල්වලට ඉක්මණින් ප්‍රවේශවීම තහවුරු කර ගැනීම සඳහා බැංකුව පහත සඳහන් මිනුම් යොදා ගනී.

- රඳවාගෙන ඇති සුරැකුම්පත්වල ද්‍රවශීලතා ලක්ෂණයන් පදනම් කළ ද්‍රවශීලතා වත්කම් අනුපාත.
- එක් එක් මුදල් වර්ගයෙන් සහ එක් එක් ප්‍රතිපාර්ශ්වය සමග රඳවා ගත හැකි සංචිතවල උපරිම සංකලනය වන සීමාවන්.

(ආ) විශේෂයෙන් ම විවට වෙළෙඳ කටයුතු වැනි දේශීය මූල්‍ය ඒකකයන් භාවිතා කරමින් කරන කටයුතුවල දී වන ද්‍රවශීලතා අවදානම අඩු කිරීම සඳහා ඉතා ද්‍රවශීලී වෙළෙඳපොළ උපකරණ වන භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සුරැකුමක් ලෙස භාවිතා කර ඇත. ඒ මගින් බැංකු පද්ධතියේ දෛනික ද්‍රවශීලතා තත්ත්වය කළමණාකරණය කිරීම සඳහා, අරමුදල් යෙදවීම හා පාලනය කිරීමට භාණ්ඩාගාර බිල්පත් හා මහබැංකු සුරැකුම්පත් ප්‍රතිමිලදී ගැනීම්/විකිණීම් හා අමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මත ශ්‍රී ලංකා රුපියල් හුවමාරුකරණය යොදාගෙන ඇත.

## 46. වත්කම් හා බැරකම්හි පරිණත විශ්ලේෂණය

| 2017 දෙසැම්බර් 31 දිනට | මාස 12ට අඩු | මාස 12ට වැඩි | එකතුව |
|---|---|---|---|
| **වත්කම්** | රු.000 | රු.000 | රු.000 |
| මුදල් හා මුදල් සමානයන් | **459,827,641** | **-** | **459,827,641** |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **23,416,953** | **21,847,423** | **45,264,376** |
| අලෙවිය සඳහා ඇති ආයෝජන | **134,413,318** | **431,815,617** | **566,228,935** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **4,940,455** | **-** | **4,940,455** |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | **11,094,542** | **115,743,610** | **126,838,152** |
| අනෙකුත් ලැබිය යුතු දෑ - විදේශීය | **3,670,494** | **-** | **3,670,494** |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **32,080,086** | **-** | **32,080,086** |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | **199,800,871** | **-** | **199,800,871** |
| බැංකුවලට දෙනු ලැබූ ණය | **154,536** | **69,166** | **223,702** |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | **-** | **41,095** | **41,095** |
| අනෙකුත් වත්කම් | **2,180,722** | **10,701,748** | **12,882,470** |
| රන් | **-** | **126,583,727** | **126,583,727** |
| තොගය | **-** | **6,875,533** | **6,875,533** |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | **1,369,157** | **165,691** | **1,534,848** |

| | | | |
|---|---|---|---|
| දේපළ පිරියත සහ උපකරණ | - | 17,960,517 | 17,960,517 |
| අස්පෘශ්‍ය වත්කම් | - | 80,623 | 80,623 |
| **මුළු වත්කම්** | **872,948,775** | **731,884,750** | **1,604,833,525** |
| **බැරකම්** | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 8,683,033 | - | 8,683,033 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 4,648,449 | - | 4,648,449 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 90,868,160 | - | 90,868,160 |
| ජා.මූ.අ. | - | 318,665,332 | 318,665,332 |
| අනිකුත් | 62,902,870 | 1,193,019 | 64,095,889 |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 341,712,198 | - | 341,712,198 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 324,517 | - | 324,517 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කල සුරැකුම්පත් | 40,655,278 | - | 40,655,278 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 4,547 | - | 4,547 |
| සංසරණයෙහි පවත්නා මුදල් | 598,053,901 | - | 598,053,901 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 8,887,156 | - | 8,887,156 |
| විලම්භිත ප්‍රදාන | 34 | 11 | 45 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | - | 671,061 | 671,061 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 160,398 | 51,322 | 211,720 |
| **මුළු බැරකම්** | **1,156,900,541** | **320,580,745** | **1,477,481,286** |
| **ශුද්ධ වත්කම්/(බැරකම්) අගය** | **(283,951,766)** | **411,304,005** | **127,352,239** |

| 2016 දෙසැම්බර් 31 දිනට | මාස 12ට අඩු | මාස 12ට වැඩි | එකතුව |
|---|---|---|---|
| **වත්කම්** | රු.000 | රු.000 | රු.000 |
| මුදල් හා මුදල් සමානයන් | 423,783,737 | - | 423,783,737 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 9,948,121 | 33,330,634 | 43,278,755 |
| අලෙවිය සඳහා ඇති ආයෝජන | 88,536,415 | 260,008,235 | 348,544,650 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 198,880 | - | 198,880 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 9,940,219 | 107,068,121 | 117,008,340 |
| අනෙකුත් ලැබිය යුතු දෑ - විදේශීය | 6,175,049 | - | 6,175,049 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 351,426,470 | - | 351,426,470 |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | 83,306,771 | - | 83,306,771 |
| බැංකුවලට දෙනු ලැබූ ණය | 289,487 | 194,556 | 484,043 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | 41,095 | 41,095 |
| අනෙකුත් වත්කම් | 2,952,281 | 9,540,709 | 12,492,990 |
| රන් | - | 111,009,339 | 111,009,339 |
| තොගය | - | 6,114,861 | 6,114,861 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | 6,659,993 | 396,414 | 7,056,407 |
| දේපළ පිරියත සහ උපකරණ | - | 18,132,390 | 18,132,390 |
| අස්පෘශ්‍ය වත්කම් | - | 156,320 | 156,320 |
| **මුළු වත්කම්** | 983,217,423 | 545,992,674 | 1,529,210,097 |
| **බැරකම්** | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 45,566,681 | - | 45,566,681 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 14,573,675 | - | 14,573,675 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 79,863,615 | - | 79,863,615 |
| ජා.මූ.අ. | 34,687,890 | 234,852,706 | 269,540,596 |
| අනිකුත් | 95,125,637 | 1,124,395 | 96,250,032 |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 303,251,290 | - | 303,251,290 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 450,884 | - | 450,884 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කල සුරැකුම්පත් | 70,054,436 | - | 70,054,436 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 51,744 | - | 51,744 |
| සංසරණයෙහි පවත්නා මුදල් | 552,777,865 | - | 552,777,865 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 8,563,548 | - | 8,563,548 |
| විලම්භිත ප්‍රදාන | 34 | 46 | 80 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | - | 2,429,153 | 2,429,153 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 182,544 | 10,753 | 193,297 |
| **මුළු බැරකම්** | 1,205,149,843 | 238,417,053 | 1,443,566,896 |
| **ශුද්ධ වත්කම්/(බැරකම්) අගය** | (221,932,420) | 307,575,621 | 85,643,201 |

## 47. සාධාරණ වටිනාකම් පිළිබඳ හෙළිදරව් කිරීම්

### අ) වත්කම් හා වගකීම්වල සාධාරණ වටිනාකම

වත්කම් හා වගකීම්වල සාධාරණ අගය වන්නේ යම් වත්කමක් හුවමාරුවට හෝ වගකීමක් පියවීමේදී දැනුම හා කැමැත්ත ඇති වෙළඳපොළ සහභාගීවන්නන් අතර අතේ දුරින් සිදුවන ගනුදෙන්වක වටිනාකම වේ. මූල්‍ය ලියවිල්ලක් විකුණන්නාට එරෙහිව මිල චලනයක් සිදු නොවන පරිදි සැලකිය යුතු ගනුදෙනුවක්, ග්‍රහණය කරගත හැකි ලෙස සංවිධාන වූ සහ ද්‍රවශීලතාවය ඇති වෙළෙඳපොළක මූල්‍ය ලියවිල්ලක් විකිණීම කළ විට එහි ප්‍රකාශිත මිල සාධාරණ අගය වේ.

ඇගයුම් ක්‍රමයන්ට වන වත්කම් හා වගකීම්වල සාධාරණ අගය නිශ්චය කිරීමට සහ අනාවරණය කිරීමට බැංකුව විසින් පහත ධූරාවලිය උපයෝගී කරගනු ලැබේ.

**පළමුවන මට්ටම** : අනන්‍ය වත්කම හෝ වගකීම සඳහා ක්‍රියාකාරී වෙළඳපල තුළ හිමි ප්‍රකාශිත (නොසැකසූ) මිල ගණන්;

**දෙවන මට්ටම** : වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි සියළුම යෙදවුම් සඳහා සෘජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතා කරන අනෙකුත් ක්‍රම;

**තෙවන මට්ටම** : නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවූ වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි යෙදවුම්, භාවිතා කරනු ලබන ක්‍රම;

පහත දැක්වෙන වගුව මගින් සාධාරණ අගය ධූරාවලිය අනුව වාර්තා කරන ලද වත්කම් හා වගකීම්වල විශ්ලේෂණයක් පෙන්නුම් කරයි.

| 2017 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම රු. 000 | දෙවන මට්ටම රු. 000 | තෙවන මට්ටම රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 45,264,376 | - | - | 45,264,376 |
| විකුණුම් සඳහා වන ආයෝජන | 566,228,935 | - | - | 566,228,935 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 4,940,455 | - | 4,940,455 |
| | 611,493,311 | 4,940,455 | - | 616,433,766 |
| **මූල්‍ය නොවන විදේශ විනිමය වත්කම්** | | | | |
| රන් | 126,583,727 | - | - | 126,583,727 |
| | 126,583,727 | - | - | 126,583,727 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 9,754,483 | - | - | 9,754,483 |
| | 9,754,483 | - | - | 9,754,483 |
| **අනෙකුත් මූල්‍ය නොවන වත්කම්** | | | | |
| ඉඩම් | - | - | 8,976,339 | 8,976,339 |
| ගොඩනැගිලි | - | - | 7,515,327 | 7,515,327 |
| | - | - | 16,491,666 | 16,491,666 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය - විනිමය විකල්ප | - | - | 1,244,581 | 1,244,581 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 3,403,868 | - | 3,403,868 |
| | - | 3,403,868 | 1,244,581 | 4,648,449 |

| 2016 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම රු. 000 | දෙවන මට්ටම රු. 000 | තෙවන මට්ටම රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 43,278,755 | - | - | 43,278,755 |
| විකුණුම් සඳහා වන ආයෝජන | 348,544,650 | - | - | 348,544,650 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 198,880 | - | 198,880 |
| | 391,823,405 | 198,880 | - | 392,022,285 |
| **මූල්‍ය නොවන විදේශ විනිමය වත්කම්** | | | | |
| රන් | 111,009,339 | - | - | 111,009,339 |
| | 111,009,339 | - | - | 111,009,339 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 321,779,576 | - | - | 321,779,576 |
| | 321,779,576 | - | - | 321,779,576 |
| **අනෙකුත් මූල්‍ය නොවන වත්කම්** | | | | |
| ඉඩම් | - | - | 8,976,339 | 8,976,339 |
| ගොඩනැගිලි | - | - | 7,695,682 | 7,695,682 |
| | - | - | 16,672,021 | 16,672,021 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය - විනිමය විකල්ප | - | - | 5,911,812 | 5,911,812 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 8,661,863 | - | 8,661,863 |
| | - | 8,661,863 | 5,911,812 | 14,573,675 |

**ඉඩම් හා ගොඩනැගිලි**

**අගය කිරීමේ ක්‍රමය**

ඍජු සන්සන්දනාත්මක ක්‍රමය සමඟ වෙළඳපොල ප්‍රවේශය භාවිතා කරමින් ඉඩම් අගය කරනු ලබන අතර එහිදී වත්කම නුදුරේදී සිදුකරන ලද සමාන වත්කමක විකුණුම් අගය සමඟ සංසන්දනය කොට එකී අගයට එකතු කළ හෝ නාමිකව එකතු කළ වැඩිදියුණු අගයක් ගැලපුම් කිරීමකින් තොරව Points of Difference සඳහා පමණක් ගැලපුම් කිරීමෙන් සාධාරණ අගය ගණනය කරනු ලබයි.

පොදු මහජනතාවට සේවා සපයන රාජ්‍ය අංශ ඒකකයන් විසින් පාලනය කරනු ලබන වත්කම්, විවෘත ද්‍රවශීල වෙළඳපොලෙහි හුවමාරු නොවන බැවින් සෙන්ට්‍රල් පොයින්ට්, වයිට් අවේස්, ලොයිඩ්ස් ගොඩනැගිලි හැර අනෙකුත් සියළුම ගොඩනැගිලි ක්ෂය කරන ලද ප්‍රවර්තන ප්‍රතිස්ථාපන පිරිවැය (DRC) ක්‍රමයට තක්සේරු කර ඇත.

අනෙකුත් ගොඩනැගිලි අගය කිරීම සඳහා, තනි වර්තමාන අගයකට හැර වූ (වට්ටම් කල) ඇස්තමේන්තුගත අනාගත ආදායම, ලාභය හෝ මුදල් ප්‍රවාහයන් මත පදනම්ව දේපල අගය කරනු ලබන ආදායම් ප්‍රවේශය යොදා ගන්නා ලදී.

පහත සඳහන් ඇ හේතුවෙන් වෙළඳපොල ප්‍රවේශය යටතේ ඇස්තමේන්තු කරන ලද සාධාරණ අගය වැඩිවීම/(අඩුවීම) සිදුවිය හැක.

- පර්වසයක ඒකක මිල වැඩිවීම/(අඩුවීම)
- වර්ග අඩියක ඒකක මිල වැඩිවීම/(අඩුවීම)
- ගොඩනැගිලි සඳහා වන ක්ෂය අනුපාතය අඩුවීම/(වැඩිවීම)

පහත සඳහන් ඇ හේතුවෙන් ආදායම් ප්‍රවේශය යටතේ ඇස්තමේන්තු කරන ලද සාධාරණ අගය වැඩිවීම/(අඩුවීම) සිදුවිය හැක.

- දළ වාර්ෂික කුලිය වැඩිවීම/(අඩුවීම)
- වසර මිලදී ගැනීම (years purchase) වැඩිවීම/(අඩුවීම)

**ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ අගය කිරීමේ ආකෘති සඳහා ඉදිරි මිල ගණන් (වෙළෙඳපොලහි ඇති ඉදිරි ලක්ෂ්‍ය බහිර් නිවේෂණය (extrapolation) කිරීමෙන් ගණනය කරයි.) සහ අගය කරන දිනට අදාල එක් එක් මුදල් වර්ගයන්හි ශුන්‍ය පොළී ඵලදා වක්‍ර මත පදනම් ව ගණනය කල වට්ටම් සාධක යොදා ගැනේ. අගය කරන ලද උපකරණයේ ආන්තිකයක් අඩංගු වේ නම්, ආන්තික අනුපාතයන් හි බලපෑම ඉදිරිපත් කිරීමටත් ඉදිරි මිල ගණන්වලට හා/හෝ පොළී අනුපාතයන්වලට ගැලපීම සිදුකරනු ලබයි.

**අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ - මූල්‍ය විකල්පයන්**

අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල අගය බ්ලැක්ෂෝල්ස් ආදර්ශකය භාවිතා කරමින් ගනණය කර ඇත.

**තෙවන මට්ටම**

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | 5,911,813 | 10,290,162 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වගකීම් | (4,667,231) | (4,378,349) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,244,582 | 5,911,813 |
| ඉපයීම්වල ඇතුළත් උපලබ්ධි නොවූ ඉපැයීම්වල එකතුව | 4,667,231 | 4,378,349 |

**භාවිතා කරන ලද නිරීක්ෂණය කල නොහැකි සුවිශේෂී යෙදවුම්**

| | |
|---|---|
| වට්ටම් සාධකය | 10% |
| උච්චාවචනය | 4% |

| සංවේදීතා විශ්ලේෂකය | වට්ටම් සාධකය | | උච්චාවචනය | |
|---|---|---|---|---|
| | 9% | 11% | 3% | 5% |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| අන්තර්ගත ව්‍යුත්පන්න උපකරණ - මූල්‍ය විකල්පයන් | 1,271,115 | 1,218,952 | 1,244,547 | 1,245,000 |

| **අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මත විලම්භිත වත්කම්** | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | 4,625,665 | 13,292,126 |
| වසර තුලදී ක්‍රමක්ෂය කරන ලද අධිමිල | (4,256,210) | (8,666,461) |
| දෙසැම්බර් 31 ට ශේෂය | 369,455 | 4,625,665 |

**ආ) ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම්**

ගිවිසුම්වල කෙටිකාලීන ස්වභාවය නිසා, ආසන්න සාධාරණ අගයක් ලබා ගැනීමට ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල වාර්තා කළ අගය සලකා බලනු ලැබේ. 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රු.මි. 6,503.88 ක් (2016 - රු.මි. 21,383.72) සහ නිත්‍ය තැන්පතු පහසුකම් රු.මි. 34,151.39 (2016 - රු.මි. 48,670.71). 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රු.මි. 22,375.12 (2016 - රු.මි. 30,821.39) කි.

**ඇ) සංසරණයේ ඇති මුදල්**

සංසරණයේ ඇති මුදල්වල සාධාරණ අගය, මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකර ඇති පරිදි ඒවායේ මුහුණත වටිනාකමය.

**ඈ) තැන්පතු වටිනාකම**

ඉල්ලූ විටෙක දී ගෙවිය යුතු බැවින් තැන්පතුවල ධාරණ අගය ආසන්න සාධාරණ අගය ලෙස සලකනු ලැබේ.

**ඉ) සාධාරණ වටිනාකම තීරණය කිරීම හා සාධාරණ වටිනාකම් ධූරාවලිය**

පහත දැක්වෙන්නේ ධාරණ අගයන් සහ සාධාරණ අගයන් ආසන්න වශයෙන් සමාන නොවන බැංකුවේ වත්කම් හා වගකීම් හි පන්ති ලෙස ධාරණ අගයන් හා සාධාරණ අගයන් අතර සංසන්දනාත්මක තොරතුරු වේ.

| | ධාරණ වටිනාකම් | | සාධාරණ වටිනාකම් | |
|---|---|---|---|---|
| | 2017 රු. 000 | 2016 රු. 000 | 2017 රු. 000 | 2016 රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | |
| විදේශීය විනිමය විකුණුම් /විකිණීම සඳහා ඇති සුරැකුම්පත් | 611,493,311 | 391,823,405 | 611,493,311 | 391,823,405 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 4,940,455 | 198,880 | 4,940,455 | 198,880 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 32,080,086 | 351,426,470 | 32,129,607 | 352,586,576 |
| බැංකුවලට දෙනු ලැබූ ණය | 223,702 | 484,043 | 214,077 | 460,376 |
| අනිකුත් වත්කම් | 12,882,470 | 12,492,990 | 9,702,999 | 9,743,612 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | | |
| රන්වලින් කරන ලද ආයෝජන | 126,583,727 | 111,009,339 | 126,583,727 | 111,009,339 |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 4,648,449 | 14,573,675 | 4,648,449 | 14,573,675 |

## 48. සන්සන්දනාත්මක තොරතුරු

| පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට: | 2016 රු. 000 |
|---|---|
| **දේශීය මූල්‍ය වත්කම්** | |
| අනෙකුත් වත්කම් | 12,322,596 |
| **මූල්‍ය නොවන වත්කම්** | |
| අනෙකුත් ලැබිය යුතු හා කලින් ගෙවීම් | 7,226,801 |

| වත්මන් ඉදිරිපත් කිරීම | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| **දේශීය මූල්‍ය වත්කම්** | | |
| අනෙකුත් වත්කම් | **12,882,470** | 12,492,990 |
| **මූල්‍ය නොවන වත්කම්** | | |
| අනෙකුත් ලැබිය යුතු හා කලින් ගෙවීම් | **1,534,848** | 7,056,407 |

වඩාත් නිවැරදි ඉදිරිපත් කිරීමක් වෙනුවෙන් 2016 දී අනෙකුත් ලැබිය යුතු හා කලින් ගෙවූ යටතේ වර්ගීකරණය කළ රු. මිලියන 170.39 ක් වූ අභ්‍යන්තර අරමුදල් ආයෝජනයන්හි ලැබිය යුතු පොළිය අදාල ආයෝජන වර්ගීකරණය යටතේ වෙන වෙනම දක්වා ඇත.

## 49. සම්බන්ධිත පාර්ශවයන්

### 49.1 රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමග ගනුදෙනු

බැංකුව විසින් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගණුදෙනුවලට පිවිසෙනු ලැබේ. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ම.බැ. පරම අයිතිකරු වශයෙන්) විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය මඟින් පාලනය කෙරෙන ආයතන ද සම්බන්ධිත පාර්ශවයන්ට ඇතුළත් වේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත 24 (සංශෝධිත) සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ හෙළිදරව් කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව තනිව ගත් කළ සැළකිය යුතු මට්ටමේ වන හා අනෙකුත් ගණුදෙනුවලදී එකී ගණුදෙනු තනි වශයෙන් නොව සාමූහිකව සැළකිය යුතු මට්ටමේ වන රජය සහ රජය මඟින් පාලනය කෙරෙන ආයතන සමග එළැඹී ගණුදෙනු සහ විධිවිධානයන් පහත සඳහන් පරිදි වේ.

| ගනුදෙනු වල ස්වභාවය | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| **ගනුදෙනු:** | | |
| එක්වර මිලදී ගත් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **-** | 8,065,953 |
| එක්වර විකිණූ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **74,237,317** | 37,375,643 |
| ප්‍රතිවිකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් හෝ විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **4,311,989,631** | 6,215,152,910 |
| ප්‍රතිවිකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් හෝ විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සඳහා පොලී ආදායම් හෝ වියදම් | **1,210,183** | 1,885,223 |
| රජය වෙනුවෙන් ලද අරමුදල් (සටහන 21.1 - 21.9) | **44,676,985** | 6,079,600 |
| රජය වෙනුවෙන් දරන ලද විය පැහැදම් (සටහන 21.1 - 21.9) | **17,346,423** | 31,001,635 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිරිවැය (සටහන 49.1.3) | **1,906,625** | 3,162,625 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ හා මුද්‍රණය කිරීමේ පිරිවැය (සටහන 49.1.4) | **2,744,815** | 3,063,380 |
| වර්ෂය තුළදී අතිරික්ත රජයට ගෙවීම (සටහන 32) | **-** | 5,000,000 |
| වර්ෂය තුළදී දළ විදේශ විනිමය ගනුදෙනු (සටහන 49.1.6) | | |
| - විකුණුම් | **5,337,500** | 55,884,998 |
| - මිලට ගැනීම් | **85,719,851** | 68,112,483 |
| - ඇ.එ.ජ.ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **751,569,889** | 737,197,729 |
| වර්ෂය තුළදී අත්හල දේපල වෙනුවෙන් ලද අරමුදල් | **123,394** | 275,236 |
| උපදේශනාත්මක, සන්නිවේදන හා වෘත්තීමය ගෙවීම් (සටහන 49.1.7) | **-** | 28,038 |
| කුලී ආදායම් | **412,206** | 387,569 |
| අනෙකුත් ගනුදෙනු (සටහන 49.1.11) | **996,174** | 966,694 |
| **ශේෂයන් :** | | |
| ශ්‍රී ලං.ම.බැ. විසින් අයිතිකාරීත්වය දරන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (සටහන 49.1.8) | **9,704,962** | 320,605,082 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් (සටහන 10) | **199,800,871** | 83,306,771 |
| සුසහන අදියර I සහ II, පළාත් සංවර්ධන ණය ක්‍රමය, සෞභාග්‍යා ණය ක්‍රමය, පිබිදෙන උතුර ණය ක්‍රමය (අදියර II), නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු ප්‍රතිශ්ඨාපනය කිරීම (අදියර II) සහ උතුරු නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ දෙන ලද ණය | **28,254** | 112,652 |
| නිශ්චිත අරමුණු සඳහා මිලදීගත් රජයේ සුරැකුම්පත් | **6,443,984** | 5,208,837 |
| බැංකු හා මූල්‍ය ආයතනවල තත්කාලීන දළ පියවුම් පද්ධතියේ (RTGS) ශේෂයන් (සටහන 22) | **215,901,806** | 183,836,224 |
| ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන නොස්ට්‍රෝ ගිණුමේ ශේෂය | **185,324** | 168,790 |
| භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ | **54,490** | 1,401,497 |
| භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙත කළ යුතු ගෙවීම් (සටහන 21) | **62,576,551** | 32,513,907 |
| දෙසැම්බර් 31 දිනට රජයේ හා රජයේ ආයතන සමග ජංගම ගිණුම් ශේෂයන් | **84,833** | 198,936 |
| අත්හල දේපල වල ශේෂයන් | **2,257,579** | 1,952,446 |
| අනෙකුත් ශේෂයන් (සටහන 49.1.11) | **599,623** | 700,951 |

**49.1.1** මුදල් නීති පනතේ 28-33 වගන්ති අනුව පැවරෙන ලද බලය ප්‍රකාර බැංකුවේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී බැංකුවල කටයුතු නියාමනය හා සුපරීක්ෂණය කරනු ලබයි. 2017 දෙසැම්බර් 31 දිනට රජය මගින් අරමුදල් සැපයූ හෝ රජයේ සුවිශේෂ බලපෑමක් ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු 03 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 04 ක් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණයට භාජනය කර ඇත.

බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි බැංකු නොවන, මූල්‍ය සමාගම්වල නියාමනය සහ සුපරීක්ෂණය කරගෙන යනු ලබයි. ඒ අනුව, රජය විසින් පාලනය කරනු ලබන හෝ අරමුදල් සපයා ඇති බැංකුවලට සම්බන්ධිත ආයතන සහ බැංකු නොවන මූල්‍ය සමාගම් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතට පැවරේ.

**49.1.2** මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය, මුදල් මණ්ඩලය හා බැංකුව සතු වේ. ඒ අනුව, රජයේ නියෝජිතයා ලෙස, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අයවැය අවශ්‍යතා සහ දේශීය හා විදේශීය ණය සේවා සපුරා ගැනීම සඳහා දේශීය වෙළෙඳපොළට සුරැකුම්පත් නිකුත් කිරීම කරනු ලැබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණය හා ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම කරනු ලබයි. රජයේ අවශ්‍යතා හා එහි පියවීම් බැරකම් සපුරාලීම සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ණය පරිපාලනය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

**49.1.3** මුදල් නීති පනතේ 49 වගන්තිය ප්‍රකාර, මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ කාර්යය ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්) සමාගම විසින් කරගෙන යනු ලැබේ. මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජයයි.

**49.1.4** බැංකුව සාමාන්‍යයෙන් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ සුවිශේෂ බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමඟ ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

**49.1.5** සටහන් අංක 51 හි පැහැදිලි කර ඇති පරිදි බැංකුව භාරකරු සහ අනෙකුත් විශ්වාසතා තත්ත්වයන්හි කටයුතු කිරීම මගින් රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සාමාන්‍යයෙන් සිදුකරනු ලැබේ.

**49.1.6** මුදල් නීති පනතට යටත්ව බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය, විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සංවර්ධනය හා වාණිජ බැංකුවල එක් දින විවෘත විදේශ විනිමය තත්ත්වය සුපරීක්ෂණය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය සුපරීක්ෂණයේ දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය ඇඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි මෙම අංශ දෙකෙහි ම නියැලෙන්නේය. විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් ප්‍රමාණයන් එම සුපරීක්ෂණයේ ප්‍රතිඵල නියෝජනය කෙරේ.

**49.1.7** එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විමර්ශනය වෙනුවෙන් ගෙවූ උපදේශණාත්මක හා වෘත්තීමය ගාස්තු මෙමගින් නිරූපණය කරයි. මෙම ගෙවීම් පරිපාලන හා අනිකුත් වියදම් යටතේ වාර්තා කර ඇත.

**49.1.8** දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, 1949 අංක 58 දරණ මුදල් නීති සංශෝධිත පනතේ 90-92 වගන්ති ප්‍රකාර, බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාර්යයන් ලෙස විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතුවල නියැලීම, මුදල් නීති පනතේ 93-98 වගන්ති ප්‍රකාර, නෛතික සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයේ කොටස් හිමිකම් ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2017 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් 23 හා 24 හි දක්වා ඇත. රජයේ සුරැකුම්පත් මත උපයාගත් පොළිය 33 සටහනෙහි දැක්වේ.

**49.1.9** රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුන අතර ඒ සඳහා ගාස්තුවක් අය නොකෙරුණි.

**49.1.10** බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව, කෘෂිකර්මාන්තය සඳහා අවම අත්තිකාරම් සීමාව වූ 10% පවත්වාගෙන යනු නොලබන බැංකු විසින්, එම හිඟ මුදල ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක ප්‍රතිමූල්‍ය අරමුදලට ආයක කළ යුතුය. මේ යටතේ 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මහජන බැංකුව රු.මි. 2.46 (2016 - රු.මි. 25.57), ලංකා බැංකුව රු.මි. 1.88 (2016 - රු.මි. 7.71), ප්‍රාදේශීය සංවර්ධන බැංකුව රු.මි. 0.63 (2016 රු.මි. 23.42) හා ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව රු.මි. 1.86 (2016 රු.මි. 7.78) හරහා රු.මි. 6.83 ණය ප්‍රතිමූල්‍යනය කර ඇත. එමගින් රු.මි. 99.19 ක පොළියක් උපයා ඇත.

**49.1.11** තනි වශයෙන් ගත්කල සුවිශේෂී නොවන, රජය, රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය වන ආයතන සමඟ බැංකුව විසින් සිදුකල ගනුදෙනුවල ශේෂයන්, අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් හි ඇතුලත් වේ.

### 49.2 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමඟ ගණුදෙනු

අධිපති ඇතුළු මුදල් මණ්ඩලයේ සාමාජිකයන් (මුදල් නීති පනතට අනුව මෙම සාමාජිකයින් හට වෙනත් කිසිදු බැංකු ආයතනයක අධ්‍යක්ෂකධූරයක්, නිලධාරී තනතුරක්, සේවකයෙක් හෝ කොටස් හිමියෙක් විය නොහැක.), නියෝජ්‍ය

අධිපතිවරුන්, සහකාර අධිපතිවරුන් හා කළමනාකරණ විගණන අංශයේ අධ්‍යක්ෂක ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ඇතුළත් වේ. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය බැංකුව සමග සිදුකරන ලද ගනුදෙනු පහත පරිදි වේ.

**49.3 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය වෙත කළ ගෙවීම්**

| | 2017 | 2016 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | 123,072 | 123,948 |

මෙයට අමතරව ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම්වලට යටත්ව මූල්‍ය නොවන ප්‍රතිලාභ ද සපයනු ලැබේ.

**49.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමග වූ වෙනත් ගණුදෙනු**

| | 2017 | 2016 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් හට දුන් ණය | 73,141 | 57,793 |

මෙම ණය සඳහා අදාළ වන පොළී අනුපාතයන් සියයට 2 සිට සියයට 7 දක්වා පරාසයන්හි වන අතර, මාසිකව ගෙවනු ලබන එම සියළු ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇත.

**49.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමග ගණුදෙනු**

| | 2017 | 2016 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| ගෙවන ලද සහ ගෙවිය යුතු දායකය | 69,573 | 69,511 |

සටහන් අංක 29 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම් සඳහා විවිධ මුදල් ප්‍රමාණවලින් දායක වූ අතර රු.මි. 542.58 ක් (2016 - රු.මි. 559.67) සේවක අර්ථසාධක අරමුදලට ගෙවන ලදී.

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැළසුම් සඳහා බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂයන් 25 සටහනෙහි දක්වා ඇත.

## 50. අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්

**50.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්**

රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිත ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශ්වයන්ට ඇප සපයනු ලැබේ. 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ එවැනි ඇප කිසිවක් නොවීය.

**50.2 ණය ඇප**

බැංකුවෙහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්යයන් වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන මුදල් සහභාගී මූල්‍ය ආයතන මගින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ව්‍යවසායකයින් සඳහා ණය ඇපවීම් නිකුත්කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය පැහැරහැරීම් මගහැරවීම සඳහා හා එම ණය නිසිපරිදි යෙදවෙන බවට සාක්ෂාත් කර ගැනීම සඳහා ණය ඇපකරු අරමුදල් පරිපාලනය සහ පශ්චාත් ණය සුපරීක්ෂණයයි. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයෙන් සහභාගි මූල්‍ය ආයතනවලට සිදුවිය හැකි පාඩු ආවරණය සැපයීම සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම ප්‍රා.සං.දෙ. විසින් සමාලෝචිත වර්ෂය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙය ණය පැහැර හැරීමේ ප්‍රමාණය මත වන ආවරණයක් නොවන අතර සහභාගී වන මූල්‍ය ආයතන මගින් ණය ලබාදුන් පාර්ශවයන්ගෙන් ණය ආපසු අයකර ගැනිමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු, ඉතිරිවන පාඩු සඳහා වන ආවරණයකි. ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සිදුවිය හැකි පාඩු පිළිබඳව සහභාගි මූල්‍ය ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් පමණක් සලකා බැලීම මෙහි අර්ථය වේ. මෙම වැඩපිළිවෙල මගින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් පහත දැක්වේ.

දේශීය වාණිජ බැංකු - ණය ඇප සඳහා :

| | ණය ඇප සැපයූ මුදල් වර්ගය | නොපියවා පැවැති ඇප ප්‍රමාණය 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|---|
| සම්බන්ධිත පාර්ශ්වයන් | රුපියල් | 1,798 | 54,799 |
| අනිකුත් | රුපියල් | - | 5,311 |
| මුළු ණය ඇප ප්‍රමාණය | | 1,798 | 60,110 |

**50.3 විශ්වස්ත ක්‍රියාකාරකම්**

මුදල් නීති පනත අනුව බැංකුව විසින් විශ්වස්ත ක්‍රියාකාරකම් කරගෙන යනු ලබයි. ඒ අනුව ක්‍රියාකිරීමේ දී විවිධ පාර්ශ්වයන් සඳහා වත්කම් දැරීම හෝ ස්ථාපනය කිරීම ද කරනු ලැබේ. කෙසේ වුවද එසේ කිරීමෙන් කිසියම් බැරකමක් ඇතිවේ යැයි බැංකුව අපේක්ෂා කරනු නොලැබේ.

**50.4 නෛතික හිමිකම්**

අදාළ ආයතනයෙහි ඇල්මැති පාර්ශ්වයන් විසින් රු.මි. 35 ක් සඳහා හිමිකම්පාමින් ගොනු කර ඇති නඩුවක බැංකුව විත්තිකරු වේ. මෙම පැමිණිල්ලට එරෙහිව බැංකුව අභියෝග කරන බැවින් මූල්‍ය ප්‍රකාශනවල මේ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

බැංකුව, හානි රු.මි. 16.57 කට හිමිකම් පාමින් ගොනුකර ඇති නඩු 2 කට පැමිණිලිකරු වන අතර ඒ වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොමැත.

තවද, බැංකුවට එරෙහිව නීති කෘත්‍යන් ගණනාවක් 2017 දෙසැම්බර් 31 දිනට පරිශේෂව තිබුණි. මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යනු බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

**50.5 බැඳීම්**

(අ) 2017 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.මි. 277.26 (2016 රු.මි. 148.30) ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරි හුවමාරු ගණුදෙනු මෙසේය.

| | 2017 රු. 000 | 2016 රු. 000 |
|---|---|---|
| ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු | | |
| ඉදිරි විනිමය විකුණුම් | | |
| - ඇ.එ.ජ. ඩොලර් | 1,850,735 | 2,501,145 |
| - යූරෝ | 2 | - |
| - ස්වීඩන ක්‍රෝනය | - | 58 |
| ඉදිරි විනිමය මිලදී ගැනීම් | | |
| - ඇ.එ.ජ. ඩොලර් | 5,000 | 15,998 |
| - යූරෝ | 400 | - |

**50.6 වත්කම් ඔඩපන කිරීම**

සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලිය පහසුකරලීම සඳහා බැංකුව ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35 (2016 ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35) - ධාරණ අගය - ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35.74 (2016 - ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 36.02) යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට ඇ.එ.ජ ඩොලර් මිලියන 30 (2016 - ඇ.එ.ජ. ඩොලර් මිලියන 30) ණය පහසුකම් ලබාගෙන ඇත. ඔඩපන කරන ලද සුරැකුම්පත් යූරෝ ක්ලියර් හි වෙනම ගිණුමක රඳවා ඇත.

එම සුරැකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශනය තුළ 'විකිණීම සඳහා ඇති සුරැකුම්පත්' ලෙස ඉදිරිපත් කර තිබේ. "Collateral Agreement Governing Secured Borrowings by participants in the Euroclear System" හා "General Conditions Governing Extensions of credit to participants in the Euroclear System" යන මාර්ග නිර්දේශයන් මත පදනම් වී එකී ගණුදෙනු බැංකුව විසින් හසුරවනු ලැබේ.

2017 දෙසැම්බර් 31 වැනි දිනට, විවිට වෙළඳපොළ කටයුත්තක් වන ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුම් (ප්‍රතිමිලදී ගැණුම් ගනුදෙනු) ඔස්සේ මුදල් වෙළඳපොලෙහි ද්‍රවශීලීතාවය නියාමනය කිරීම මගින් කෙටි කාලීන පොළී අනුපාතයන් ස්ථාවරව පවත්වා ගැනීමට රු.මි. 6,500 - ධාරණ අගය රු.මි. 6,469 (2016 දෙසැම්බර් 31 දිනට රු.මි. 21,375 - ධාරණ අගය රු.මි. 21,350) වත්කම් බැංකුව විසින් විවිධ ප්‍රාථමික වෙළඳුන් වෙත ඔඩපන කර ඇත.

මේ සඳහා යොදාගත් සුරැකුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ''ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් '' යටතෙහි පෙන්වා ඇති අතර බැංකුව මෙම ගනුදෙනු 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාරව සිදුකර ඇත.

## 51. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස හා අනෙකුත් විශ්වාසනා තත්ත්වයන්හි ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

**51.1** විවිධ විදේශීය ණය සහ විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වන ප්‍රදානයන්හි ණය මුදාහැරීම සහ ආපසු ගෙවීම් බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සිදු කිරීම කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

**51.2** බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) භාරකාරත්වය උසුලයි. ඒ අනුව, පනතේ විධි විධාන ප්‍රකාර ආයක මුදල් ලබා ගැනීම, අධිභාර ලබාගැනීම, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

**51.3** ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලපත්‍රලාභී බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිති සඳහා විවෘතව ඇති ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයක් වන "තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" බැංකුව විසින් පරිපාලනය කර ඇත. 2010 ඔක්තෝබර් 01 දා සිට එම යෝජනා ක්‍රමයෙහි ඇති අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දා තම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" වෙත පවරා ඇත.

**51.4** 2010 සැප්තැම්බර් 28 දාතම වූ 1673/11 අංක දරණ ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" නමින් අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමයක් ජාතික අවශ්‍යතාවයක් ලෙස තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ඒ අනුව, මෙහි සමස්ථ සාමාජිකයන් ගණන 76 කි. ගැසට් පත්‍රයේ 5.2 වගන්තියට අනුව විශේෂිත අතහැරීම් හා සියලුම ණය උපකරණ හැර සාමාජික ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් සහ 01.01.2012 දිනට පෙර මුදල් මණ්ඩලයේ මගපෙන්වීම අනුව 2010 සහ 2011 වර්ෂවල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත සැලසුම්වලට අනුව ස්කන්ධය බවට පරිවර්තනය වූ පෙර තැන්පත්කරුවන් වූ දැනට කොටස් හිමියන්ගේ කොටස් රක්ෂණය කෙරේ.

රු.මි. 350.20 ක් වූ ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රු.මි. 1,168.31 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන

ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල පිහිටුවා ඇත. 2017 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ප්‍රමාණය රු. බිලියන 45.3 ක් (තාවකාලික) වන අතර, දැනට මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය එක් මූල්‍ය ආයතනයක් සඳහා රු.මි. 0.60 ක් හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි.

වන්දි ගෙවීම බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර තැන්පත් අරමුදල විසින් එසේ ගෙවිය යුතු මුළු වන්දි මුදල් ප්‍රමාණය තැන්පත් අරමුදලේ අවසරලත් ණය සහ එකතු වී ඇති වාරික මුදල් ද ඇතුළුව තැන්පතු රක්ෂණ අරමුදලෙහි රැස් වී ඇති, පවත්නා මුදල් ප්‍රමාණයට සීමා විය යුතුය. නැතහොත් අවසරලත් ණය ගැනීම් හා ලැබුණු දායක මුදල්වලින් තැන්පතු රක්ෂණ අරමුදල ඉහළ දැමිය හැකිය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා බැංකුව වගකියනු නොලැබේ.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමණාකරණ කටයුතු නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ පිහිටා ඇති තැන්පත් රක්‍ෂණ ඒකකය මඟින් මූල්‍ය මණ්ඩලය මඟින් අනුමත වූ රෙගුලාසි හා ප්‍රතිපත්තීන් වලට අනුව නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂකවරයාගේ අධීක්‍ෂණය හා උපදෙස් අනුව සිදු කෙරෙන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශවලින් වෙන් වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

මෙම යෝජනා ක්‍රමය සහ අරමුදල 2013 නොවැම්බර් 22 වන දින සිට පිළිවෙලින් “ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය” සහ “ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදල” ලෙස නම් කරන ලදී.

**51.5** ලියාපදිංචි මූල්‍ය සමාගම් විධිමත් කිරීම හා සුපරීක්ෂණ කටයුතු, මුදල් මණ්ඩලය විසින් පවරා ඇති බලතල ප්‍රකාරව, බැංකුව විසින් සිදුකරයි. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

**51.6** බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනය අනුව, කෘෂිකාර්මික කටයුතු සඳහා මුළු අත්තිකාරම්වලින් 10% ක අවමය පවත්වාගෙන නොමැති බැංකු එම හිඟ මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (ප්‍රා.සං.දෙ.) විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිමූල්‍ය අරමුදලට දායක කළ යුතු වේ. ප්‍රා.සං.දෙ. එසේ එකතු කළ මුදල් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, ලංකා බැංකුව සහ මහජන බැංකුව තුළින් කෘෂිකාර්මික කටයුතු සඳහා “විස්කම්” ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ.

2017 දෙසැම්බර් 1 දිනට එසේ රැස් කළ මුල් මුදල නැවත බැංකුවලට ගෙවා ඇත (2016 දෙසැම්බර් 31 දිනට අදාල බැංකුවලින් හිඟ මුදල රු.මි. 554.26). 2017 දෙසැම්බර් 31 දිනට රු.මි. 6.83 (2016 - රු.මි. 64.48) මුදලක් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ නොපියවා ඇති අතර රු.මි. 1.83 ක පොළී ආදායමක් උපයන ලදී. තවද රු.මි. 84.72 (2016 - රු.මි. 5.69) ක් එම ආයෝජනවල ආදායම ලෙස උපයා ඇත.

**51.7** බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, විදේශීය දායකයන්ගේ හා ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රජයේ විශේෂිත නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි. තව ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයන ව්‍යාපෘතිද ක්‍රියාවට නැංවීම ඉටු කරයි.

## නිමකර අවසන් ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ |
|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 24.50 | කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘති කලාපවල ස්වභාවික පරිසරය සංවර්ධනය | 2,550.90 | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය | 1,453.11 | |
| වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 40.00 | ශ්‍රී ලංකාවේ භෝග කර්මාන්තයේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරඟකාරී වාසිය පවත්වා ගැනීම | 5,200.00 | |
| සුසහන මූල්‍ය හා කල්බදු සමාගම | රුපියල් | 352.69 | සුනාමියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම | 351.06 | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන | රුපියල් | 2,656.00 | සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම සඳහා ණය පහසුකම් ලබා දීම | 2,663.40 | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන - චක්‍රිය අරමුදල | රුපියල් | 150.00 | සුනාමිය මගින් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් ලබා දීම | 122.72 | |
| හැකියා සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 94.31 | ගුණාත්වයෙන් අනූන ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවශ්‍ය හැකියා පුහුණු වැඩසටහන් වල අදාලත්වය සහ ගුණාත්වය වැඩිදියුණු කිරීම හා හැකියා නොගැලපීම් ආමන්ත්‍රණය කිරීම | 94.59 | |
| නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 4.00 | නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ පාරිසරික සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක පහසුකම් වර්ධනය කිරීම | 369.15 | |
| අඩු ආදායම් නිවාස සේවණ ණය ඇපකර ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 25.00 | රටේ අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස ගොඩනැගීම අළුත්වැඩියාව සහ ඔවුන්ගේ වාසස්ථාන ව්‍යාප්ත කිරීමට ආධාර කිරීම. | 1,362.00 | නියමිත දිනට සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | වි.ගැ.හි | 15.10 | අඩු ආදායම් කුටුම්භ වල නිවාස සංවර්ධනයට ආධාර කිරීමක් වශයෙන් ප්‍රාග්ධනය සපයා දීම | 1,915.76 | |
| වයඹ පලාත් ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 1.80 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල මිනිසුන්ගේ ආර්ථික, සමාජීය හා පෝෂණ ශුභ සාධනය වැඩි දියුණු කිරීම. | 102.76 | |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.00 | කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් වර්ධනය හා ස්ථිර කිරීම | 249.06 | |
| රට මැද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදනය නගා සිටුවීමට ණය පහසුකම් සැලසීම | 642.00 | |
| කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය. | වි. ගැ. හි. | 17.05 | සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර පළාත් හා මායිම් දිස්ත්‍රික්ක පහ තුළ පවතින මිනිස් ජීවිත හා දේපල නැවත නගා සිටුවීම | 843.00 | |
| කුඩා තේ වතු හිමියන් සංවර්ධන ව්‍යාපෘති | ඇ.එ.ජ. ඩොලර් | 12.60 | කුඩා තේ වතු හිමියන් සංවර්ධනය කිරීම හා තේ වතු පහසුකම් පුනරුත්ථාපනය කිරීම | 645.93 | |
| දිළිඳු බව පිටුදැකීමේ ක්‍ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,368.00 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායී ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම | 1,402.45 | |
| ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 17.40 | අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත් පිරිවැය ඵලදායී සහ ශක්තිමත් ක්ෂුද්‍ර ණය බෙදාහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම | 345.69 | |
| කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 148.00 | |
| දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 27.90 | දකුණු පළාත් මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම | 564.00 | |
| EIB ගිවිසුම් B | යූරෝ | 10.00 | සුනාමි මගින් සෘජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත නගා සිටුවීම | 1,553.27 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| සුසහන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 3,000.00 | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 2,750.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවට මාරු කළ යුතුය. |
| සුසහන අදියර II | රුපියල් | 500.00 | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 105.54 | |
| පිබිදෙන උතුර | රුපියල් | 2.000.00 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2.000.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කළ යුතුය. |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුල වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් ප්‍රදානය කිරීම | 1,000.00 | |
| පිබිදෙන උතුර අදියර II | රුපියල් | 2,154.25 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2,361.00 | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති - චක්‍රීය අරමුදල | රුපියල් | 1,200.00 | රට තුළ බහුවාර්ෂික භෝග අංශයට ණය පහසුකම් සපයා දීම | 1,199.82 | |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ - චක්‍රීය අරමුදල | රුපියල් | 77.00 | ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම් වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා එම දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය | 77.00 | |
| සබරගමු පළාත් ග්‍රාමීය සාමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 100.00 | සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 100.00 | |
| ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | යූරෝ | 9.00 | පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ ඉදිකිරීමේ හා මහජන කටයුතුවලට සක්‍රීයව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාරවල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම. | 1,399.73 | |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය (අදියර II) | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 70.00 | |
| පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.09 | සුනාමියේ බලපෑමට ලක් වූ ජනතාවගේ වත්කම් නැවත ගොඩනංවා ගැනීම, ඔවුන්ගේ දෛනික ආර්ථික කටයුතු සඳහා පදනම දැමීම හා ආදායම උත්පාදන මාර්ග විවිධාංගීකරණය කිරීම සඳහා සහාය දීම. | 190.77 | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II (ප්‍රබෝධිනී) | ජපන් යෙන් | 2,381.00 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රුපියල් 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්ත්වය වර්ධනය කිරීම. | 3,213.20 | |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 250.00 | රටතුළ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් සමත් පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම. | 232.39 | |
| විස්කම් (කෘෂිකාර්මික අංශය සංවර්ධනය සඳහා වූ විශේෂ ණය යෝජනා ක්‍රමය) | රුපියල් | 1,325.60 | ආයෝජන සඳහා ණය ලබා ගැනීමේ හැකියාව තහවුරු කර ගැනීම, විවිධාංගීකරණය සහ වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම | 881.00 | සහභාගීත්ව බැංකු විසින් අනිවාර්ය අවශ්‍යතා සම්පූර්ණ කළ පසු අරමුදල් නැවත ලබාදීම සිදුකරයි. |
| පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 2,900.00 | රට තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ මධ්‍ය හා දිගුකාලීන ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැලසීම | 2,900.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව වෙත මාරු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| වියලි කලාපීය ජීවනෝපාය හා හවුල්වීමේ ණය සහන වැඩසටහන | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල දිස්ත්‍රික්කවල ආදායම ජනනය වන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම | 252.95 | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර II | රුපියල් | 1,078.27 | නැගෙනහිර පළාත තුළ කෘෂිකාර්මික හා පශු සම්පත් ක්‍ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 1,000.00 | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර III | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුළ කෘෂිකාර්මික පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 1,428.47 | |
| උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන | රුපියල් | 600.00 | ගැටුම් පැවති කාල සීමා තුළ නැගෙනහිර හා උතුරු පළාත්වල හානියට පත් වූ නිවාස ප්‍රතිසංස්කරණය සඳහා ණය පහසුකම් සැපයීම | 600.00 | |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | ඇ.එ.ජ. ඩොලර් | 32.90 | වෙළෙඳපොළ වටිනාකම්දාම තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාදකයින් හා ඉඩම් අහිමි වූවන්, විශේෂයෙන් යෞවනයන්ට අරමුදල් සපයාදීම හා ආදායම් ඉහළ නැංවීම | 113.13 | |
| කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.60 | නුවර එළිය, මහනුවර, කෑගැල්ල, මොණරාගල දිස්ත්‍රිකවල අඩු ආදයම් ලාභීන්ගේ ජීවන තත්වය උසස් කිරීම. | 487.66 | |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ක්‍ෂුද්‍ර මූල්‍ය වැඩසටහන (NADeP) | රුපියල් | 1,049.84 | තෝරාගත් ව්‍යාපෘති ප්‍රදේශවල දිළිඳු ජනතාවගේ ආදායම් සහ සමාජ තත්ත්වය වර්ධනය කිරීම. | 1,049.84 | |
| NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන ප්‍රාග්ධන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 135.69 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් වැඩි කිරීම. | 135.69 | |
| NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන සෘතුමය කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 302.04 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් වැඩි කිරීම. | 302.04 | |
| පශ්චාත් ආපදා ආර්ථික ක්‍රියාකාරකම් නගා සිටුවීමේ ණය යෝජනා ක්‍රමය (PEARL) | රුපියල් | 134.58 | මෑත කාලීන ගංවතුර/නියං හේතුවෙන් ආපදාවට පත් ණය ගැතියන් (පුද්ගල හෝ පුද්ගල කණ්ඩායම්) පශ්චාත් ආපදා තත්වයෙන් මුදවා ගැනීම සඳහා අරමුදල් අවශ්‍යතා සැපයීම තුලින් ඔවුන්ගේ ව්‍යාපාරික හෝ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් යථාතත්වයට පත් කිරීම. | 134.58 | |
| ''තරුණ දිරිය'' NADeP තරුණයින් බලගැන්වීමේ හා ණ කියා යෝජනා ක්‍රමය | රුපියල් | 288.48 | කුඩා ව්‍යාපාර සහ අනෙකුත් ආකාරයේ ව්‍යවසායකත්ව ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැපයීම තුළින් ග්‍රාමීයමට්ටමේ දිලිඳු යෞවනයන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම සඳහා උපකාරී වීම. | 288.48 | |
| වියලි කලාපීය ජීවනෝපාය සහායවීමේ හා හවුල්වීමේ ණය වැඩසටහන - චක්‍රීය අරමුදල | රුපියල් | 252.90 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම. | 252.89 | |
| සුළු ගොවියන් හා ඉඩම් අහිමි වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 345.69 | සුළු පරිමාණ ගොවීන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන වේගය වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ වගා නොවන ග්‍රාමීය ව්‍යවසායන් ස්ථාපනය කිරීම. | 1,564.75 | |

## ඉදිරියට යන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 1,100.00 | තේ අංශය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයාදීම | 964.87 | | වගකීම් හා සහතිකවීම් නැත | මූල්‍ය ප්‍රකාශන බාහිර විගණකයින් විගණනය කළ යුතුය. | අදාල සියලුම පාර්ශ්වයන්ගේ එකඟතාවය නොමැතිව ගිවිසුම්වල අයිතිවාසිකම් හා බැඳීම්, පැවරීම් හෝ සංශෝධනය හෝ අහෝසි කිරීම හෝ අතහැර දැමීම සිදුකරනු නොලැබේ. |
| ස්වශක්ති ණය යෝජනා ක්‍රමය | රුපියල් | 4,000.00 | නව හා වත්මන් ව්‍යවසායකයින් මූල්‍ය සහනාධාර සැපයම මගින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම | 2,146.78 | | | | |
| ''අත්වැල'' ස්වාභාවික ව්‍යසන මගින් හානිවූ ආර්ථික කටයුතු නැවත නඟා පිහිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (READ) | රුපියල් | 2,000.00 | රජය මගින් දැනුම් දී ඇති පරිදි ස්වභාවික ව්‍යසනයන්ගෙන් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා මූල්‍ය සහනාධාර සැපයීම. | 100.00 | | | | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 1,031.00 | විධිමත් මූල්‍ය පහසුකම්වලට ප්‍රවේශය අපහසු ග්‍රාමීය දිළිඳු පවුල් සඳහා ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම්වලට ණය සැපයීම පිණිස ඵලදායී ණය ප්‍රදාන යාන්ත්‍රණයක් ස්තාපිත කිරීම. | 4,301.45 | | | | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 2,764.84 | ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීම මඟින් දිළිඳු පවුල්වල ආදායම් තත්වය වැඩිදියුණු කිරීම. | 6,680.66 | | | | |
| සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය | රුපියල් | 22,875.47 | ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා ආපදා මගින් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ණය පහසුකම් සැපයීම | 22,875.47 | සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් නැවත අය කර ගන්නා මුදල් අදාල දිනයන්හි දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුයි. | | | |
| ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක ණය අදියර II (SEPI II) | රුපියල් | 225.00 | National Vocational Qualification (NVQ) හි සහතිකපත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලාවන් සම්පූර්ණ කරන ලද පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම | 224.66 | | | | |

## 2. බැංකු අධීක්ෂණ

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල අඛණ්ඩ අධීක්ෂණ සහ කාලීන පරීක්ෂා කටයුතු සිදු කිරීම සඳහා විශේෂ බලතල සහ කාර්යයන් සහිතව මුදල් නීති පනතේ 28 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබීය. මුදල් මණ්ඩලය මගින් අනුමත කරන ලද විචක්ෂණශීලී විධාන, මාර්ගෝපදේශ සහ අනුමැතීන් සකස් කිරීම සහ නිකුත් කිරීම, අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සිදු කිරීම, කාලීන පරීක්ෂා සිදු කිරීම, බැංකු අංශයේ ශක්‍යතා වර්ධනය සහ දැනුවත් කිරීමේ කටයුතුවල නිරත වීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් වේ. තව ද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ පරිපාලන කටයුතු සිදු කිරීම ද කරන ලදී. 2017 වසර අවසන් වන විට මුදල් නීති පනත සහ බැංකු පනත යටතේ නියාමනයට සහ අධීක්ෂණයට යටත් බලපත්‍රලාභී වාණිජ බැංකු 25 ක්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 7 ක් සහ විදේශ බැංකු වල නියෝජිත කාර්යාල 2ක් ක්‍රියාත්මක වුණි. මෙම බැංකුවල නාම ලේඛනයක් II-1 ඇමුණුමෙහි ඇතුළත් වේ. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2017 වසර තුළ දී සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් සහ වැඩකටයුතුවල සාරාංශයක් පහත දක්වා ඇත.

### 2.1 විචක්ෂණශීලී නියාමනයන් නිකුත් කිරීම

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විචක්ෂණශීලී විධානයන් මෙම වාර්තාවේ III කොටසෙහි දක්වා ඇත. ඒ අතුරින් ප්‍රධාන විචක්ෂණශීලී විධානයන් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

**(අ) මෝටර් රථ සඳහා ලබා දෙනු ලබන ණය පහසුකම් සඳහා වන වටිනාකම මත ණය අනුපාත සීමා**

මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතයට ගැනීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ලබා දෙනු ලබන ණය පහසුකම් හේතුවෙන් බැංකු ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන අතිරික්ත ණය සීමා කිරීමේ සාර්ව ආර්ථික ක්‍රියාමාර්ග යක් ලෙස එකී ණය පහසුකම්වල වටිනාකම් මත උපරිම වටිනාකම මත ණය අනුපාත සීමාවන් අනුගමනය කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී. තවද, මෝටර් රථ සඳහා ලබා දෙන ණය පහසුකම් මත පනවා ඇති, වටිනාකම මත ණය අනුපාත සඳහා අදාළ වන තක්සේරුකරණ පදනම සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති වාහන පන්ති වර්ගීකරණ, අදාළ අර්ථකථනයන් ආදිය සඳහන් ඉහත විධානයේ සංශෝධනයන් පසුව නිකුත් කරන ලදී.

**(ආ) 2017 අයවැය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම**

2017 අයවැය මගින් අනුමත කරන ලද ජාතික ප්‍රතිපත්තිය පරිදි කෘෂිකර්මාන්ත, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, අපනයන, සංචාරක, තරුණ සහ කාන්තා යනාදී හඳුනාගත් අංශ වෙත සපයන ණය පහසුකම් ඉහළ නැංවීමටත්, බැංකු සේවා වැඩිදියුණු කරන ලෙසත් බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී.

**(ඇ) බලපත්‍රලාභී බැංකු සඳහා නිකුත් කරන ලද උකස් ගැනීම් පිළිබඳ කොන්දේසි සඳහා වන සංශෝධන**

රත්‍රන් නීති විරෝධී අන්දමින් රටින් පිට කිරීම වැළැක්වීම සඳහා උකස් කළ රන් ආභරණ වෙන්දේසිවල දී තොග වශයෙන් මිලදී ගැනීම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට බලපත්‍රලාභී බැංකු වෙත නියම කරන ලදී.

**(ඈ) ණය උපකරණ මත වන පොලී අනුපාත**

2017 ජූලි 01 වන දින සිට බැංකු විසින් ලබා දෙන ණය පහසුකම් සඳහා අදාළ වන පොලී අනුපාත ඒ ඒ බැංකුවල ප්‍රතිපත්තීන් මත තීරණය කිරීමට බලපත්‍රලාභී බැංකු සඳහා අවසර ලබා දුන් අතර බැංකු විසින් එසේ අය කරනු ලබන පොලී අනුපාත, ඒවා ගණනය කිරීමේ පදනම සහ දඬ පොලී (අදාළ වන විට) පිළිබඳ මහජනතාව නිසි පරිදි දැනුවත් කිරීමට ද නියම කරන ලදී.

**(ඉ) ගංවතුරෙන් විපතට පත් ණය ගනුදෙනුකරුවන් සඳහා ලබා දෙන සහන**

මෑතක දී පැවති ගංවතුර, අයහපත් කාලගුණික තත්ත්ව සහ ඊට සම්බන්ධ සිද්ධි නිසා හානියට පත් ව්‍යාපාර සහ ඒවායේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු යළි නගාසිටුවීමේ ජාතික ප්‍රතිපත්තිය යටතේ එකී හානියට පත් වූ ණය ගනුදෙනුකරුවන් වෙත අවස්ථානුකූලව සලකා බලා සහන ලබා දෙන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී.

**(ඊ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන වාර්ෂික බලපත්‍ර ගාස්තු**

2018 වසර සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තු ඒ ඒ බැංකුවල 2017 වසර අවසානයේ පවතින මුළු වත්කම් ප්‍රමාණය මත තීරණය කරන ලදී.

**(උ) අවම ප්‍රාග්ධන මට්ටම් ඉහළ නැංවීම**

ශක්තිමත් සහ ගතික බැංකු අංශයක් පවත්වා ගැනීමේ අරමුණින් සහ බාසල් III රාමුව මෙරට දී ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා බලපත්‍රලාභී බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන් ඉහළ නංවන ලෙස දැනුම් දෙමින් විධානයක් නිකුත් කරන ලදී. ඒ අනුව 2020 දෙසැම්බර් 31 වන විට දැනට සංස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා රුපියල් බිලියන 20 ක් ද, රුපියල් බිලියන 100 ට අඩු වත්කම් සහිත විදේශීය බැංකු සඳහා රුපියල් බිලියන 5 ක් සහ රුපියල් බිලියන 100 ඉක්මවූ වත්කම් සහිත විදේශීය බැංකු සඳහා රුපියල් බිලියන 10 ක ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගත යුතු වේ. බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා අදාළ වන අවම ප්‍රාග්ධන මට්ටම රුපියල් බිලියන 7.5 කි. තවද, නව බැංකුවක් ආරම්භ කිරීමේදී මෙරට සංස්ථාපිත බලපත්‍රලාභී වානිජ බැංකුවක් සඳහා රුපියල් බිලියන 20ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සඳහා රුපියල් බිලියන 7.5ක අවම ප්‍රාග්ධන මට්ටමක් සහ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත බැංකුවක් මෙරට ස්ථාපනය කිරීමේ දී රුපියල් බිලියන 10ක අවම ප්‍රාග්ධනයක් එම බැංකු ස්ථාපනය කරන අවස්ථාවේ දී රැගෙන ආ යුතු වේ.

(ඥ) **බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් කරනු ලබන මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු**

2018 ජනවාරි 01 වන දින සිට බලපත්‍රලාභී බැංකුවලට සිය ව්‍යුත්පන්න ගනුදෙනුවල අවදානම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීමට නියම කරන ලදී.

(එ) **විදේශ ව්‍යවහාර මුදල් ණය**

2018 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී බැංකුවල විදේශීය ව්‍යවහාර මුදල් ණය ගැනීම්වල අවදානම් කළමනාකරණය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණෙන් එම බැංකු සඳහා නව විදේශීය ව්‍යවහාර මුදල් ණය ගැනීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව බැංකුවල විදේශීය ව්‍යවහාර මුදල් ණය ගැනීමේ සීමාව ගණනය වනුයේ බැංකුවල බාහිර ශ්‍රේණිගත කිරීම සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය මත පදනම්ව ගණනය කරනු ලබන ලකුණු මට්ටමක් අනුව වත්කම් වලින් ප්‍රතිශතයක් ලෙස ය.

## 2.2 මුදල් මණ්ඩලය විසින් ලබා දුන් අනුමැතීන්

(අ) **ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක**

2017 වසර තුළ දී බැංකු ශාඛා සහ අනෙකුත් සේවා ඒකක පිළිබඳ අනුමැතීන් 704 ක් සැකසීමට කටයුතු කළ අතර එයින් අනුමැතීන් 42 ක් විචක්ෂණ කරුණු මත පදනම්ව කල් දැමීම/ප්‍රතික්ෂේප කළ අතර 662 ක් සඳහා අනුමැතීන් ලබා දෙන ලදී (සංඛ්‍යා සටහන II-1).

**II-1 සංඛ්‍යා සටහන**

**ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක සඳහා ලබා දෙන ලද අනුමැතීන්**

| අනුමැතියේ ස්වභාවය | අනුමැතීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | සකසන ලද | ලබා දෙන ලද |
| **විවෘත කිරීමේ සහ ස්ථාපනය කිරීම්** | | |
| ශාඛාවන් | 105 | 75 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | 142 | 136 |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක | 143 | 143 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 31 | 30 |
| ජංගම බැංකු ඒකක සහ ජංගම රථ | 113 | 113 |
| ජංගම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ මුදල් තැන්පතු යන්ත්‍ර | 04 | 04 |
| **ප්‍රතිස්ථාපන කිරීම්** | | |
| ශාඛාවන් | 95 | 93 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | 07 | 06 |
| ශාඛා සහ වෙනත් සේවා ඒකක වසා දැමීම හෝ ලබා දී ඇති අනුමැතීන් අවලංගු කිරීම් | 64 | 62 |
| මුළු එකතුව | 704 | 662 |

මේ අනුව 2017 වසර අවසානය වන විට මෙරට තුළ බැංකු ශාඛා 3,560 ක්, ශිෂ්‍ය ඉතුරුම් ඒකක 3,059 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 4,416 ක් ක්‍රියාත්මකව පැවතුණි. මෙයට අමතරව එක් බලපත්‍රලාභී බැංකුවකට මාලදිවයිනෙහි පරිපාලිත සමාග මක් ආරම්භ කිරීමට අනුමැතිය ද, චීන බැංකුවට මෙරට ශාඛාවක් ආරම්භ කොට බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස කටයුතු කිරීමට තාවකාලික අනුමැතිය ද, දෝහා බැන්ක් QPSC හට මෙරට නියෝජිත කාර්යාලයක් විවෘත කිරීමට අනුමැතිය ලබාදෙන ලදී. විදේශීය බැංකු හි නියෝජිත ශාඛාවන් සීමිත විෂය පථයක කාර්යයන් සිදුකිරීම සඳහා පිහිටුවනු ලබන අතර ඒවා මගින් බැංකු කටයුතු සිදු කරනු නොලබයි. මේවායේ වැඩ කටයුතු මූලිකව ම යොමු වී ඇති ක්ෂේත්‍රයන් වනුයේ ශ්‍රී ලංකාව සහ අදාළ බැංකුවේ මව් රට අතර සහයෝගීතාව වර්ධනය කරලීම, ශ්‍රී ලංකාව සහ එම බැංකු ව්‍යාප්ත වී ඇති අනෙකුත් රටවල් අතර කෙරෙන වෙළඳ සහ ආයෝජන කටයුතු සඳහා පහසුකම් සැලසීම, සහ ශ්‍රී ලංකාවේ ගෝලීය ආර්ථික සබඳතා ශක්තිමත් කර ගැනීමට ආධාර කිරීම වේ.

(ආ) **වෙනත් නියාමන අනුමැතීන්**

2017 වසරේ දී වෙනත් නියාමන අනුමැතීන් 437 ක් ලබා දී තිබූ අතර ඒවා, බලපත්‍රලාභී බැංකු විසින් විදේශ ව්‍යවහාර මුදල් ණය ලබා ගැනීමේ දී පනවා ඇති සීමා, දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය සඳහා ණයකර ඇතුළත් කර ගැනීම, බැංකුවක කොටස් හිමිකාරිත්වය පිළිබඳ ප්‍රමාණික අයිතියක් ලබා ගැනීම, උපරිම ණය ලබා දීමේ සීමා ඉක්මවීම, බැංකු සඳහා අලුතින් පත්වන හෝ ධූර කාලය අලුත් කරන අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකාරිත්වයේ නියුතු නිලධාරීන්ගේ යෝග්‍යතා තක්සේරු කිරීම, වෙළඳපොළ වටිනාකමට වඩා අඩුවෙන් සිදු කරන වත්කම් විකිණීම්, අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම, බාහිරකරණය සඳහා වන විධිවිධාන සහ අතහැර දමා ඇති දේපළ ප්‍රතිපූර්ණය වැනි විෂය පථයන්ට අයත් විය.

## 2.3 නිරන්තර සුපරීක්ෂණය සිදු කිරීම

(අ) නිරන්තර සුපරීක්ෂණය යනු සමස්ත බැංකු පද්ධතියෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ දිගුකාලීන ස්ථායීතාවය නිර්ණය කිරීමෙහිලා කල් ඇතිව අනතුරු ඇඟීමේ ක්‍රමවේදයක් ලෙස සේවය සපයන්නා වූ එක් එක් බැංකුවල මෙහෙයුම් කටයුතු නිරීක්ෂණය කිරීමේ ක්‍රියාවලියකි. මෙමගින් අවශ්‍ය විටෙක නිවැරදිකරණ ක්‍රියාමාර්ග ගැනීම හා එමගින් තැන්පත්කරුවන්ගේ මුදල්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සිදු කෙරේ.

(ආ) වෙබ් අඩවි පාදකව ක්‍රියාත්මක වන FinNet පද්ධතිය හරහා බැංකු විසින් ආවර්තිතීකව යොමු කරවනු ලබන මූල්‍ය සහ කාර්යසාධන වාර්තා පදනම් කර ගනිමින් අඛණ්ඩ අධීක්ෂණ ක්‍රියාවලිය සිදු කරනු ලබන අතර වසරක දී දළ වශයෙන් මූල්‍ය විචක්ෂණශීලී දත්ත ඇතුළත් මාසික/කාර්තුමය/වාර්ෂික වාර්තා 69 ක් FinNet පද්ධතිය හරහා බැංකු විසින් ආදානය කරනු ලබයි. මෙයට අමතරව තවත් වාර්තා 18 ක් FinNet පද්ධතියෙන් පරිබාහිරව සපයනු ලැබේ. 2017 වසරේ දී ද වඩාත් ගුණාත්මකභාවයෙන් යුතු වාර්තා ජනනය කරවීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගනිමින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු දත්ත ගබඩාව වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග ඉදිරියට

ගෙන යන ලදී. මේ යටතේ, දැනට පවතින වාර්තා 30 ක් සංශෝධනය සඳහා කටයුතු සම්පාදනය කළ අතර බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නව බැංකු පනත් විධානයන් හා අනුගතව නව වාර්තා 17 ක් හඳුන්වා දුන් අතර තවත් වාර්තා 2 ක් සංශෝධනය කරන ලදී. එමෙන්ම බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණවල දී හඳුනාගත් අඩුලුහුඩුකම් නියමිත කාලසීමාවන් තුළ දී නිවැරදි කිරීමෙහිලා ගනු ලබන ක්‍රියාමාර්ගයන්හි අත්කර ගෙන ඇති ප්‍රගතිය කාර්තුමය වශයෙන් අධීක්ෂණය කරන ලදී.

(ඇ) බැංකු අඛණ්ඩව සුපරීක්ෂණය සහ අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියෙහි ලා බැංකු විසින් ඉදිකිරීම් ක්ෂේත්‍රයට ලබා දී ඇති ණය, බැංකු අංශයේ ණය වර්ධනය සහ සංකේන්ද්‍රණය, තැන්පතු මත ණය අනුපාතය, උතුරු හා උතුරු-නැගෙනහිර පළාත්හි ණයබරිතභාවය, ගංවතුරෙන් හානියට පත් ගනුදෙනුකරුවන් සඳහා ලබා දී ඇති ණය සහ බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය පිළිබඳ කාර්තුමය වාර්තා වැනි කාරණා සම්බන්ධයෙන් විශේෂ වාර්තාවක් බැංකු වෙතින් ලබාගත් අතර මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ පරිබාහිර රජයේ ආයතනයන්හි වාර්තාවන් සඳහා අවශ්‍ය බැංකු ක්ෂේත්‍රයේ සමුච්චිත දත්ත (Aggregate Data) ලබා දීම ද සිදු කරන ලදී.

(ඈ) 2015 වසරේ සිට 2017 වසර දක්වා බැංකු අංශයේ කාර්යසාධන සාරාංශය පහත සංඛ්‍යා සටහන II-2 හි දක්වා ඇත. මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය හා පද්ධතික ස්ථායීතාව සම්බන්ධ සවිස්තරයන් මත ඇගයුමක් 8 වන පරිච්ඡේදයෙහි දක්වා ඇත.

**II-2 සංඛ්‍යා සටහන**

**බැංකු අංශයෙහි ප්‍රවණතා**

| අයිතම | 2015 | 2016 | 2017 | වෙනස % | |
|---|---|---|---|---|---|
| | (අ) | (අ) | (ආ) | 2015/16 | 2016/17 |
| මුළු වත්කම් | 8,077 | 9,047 | 10,293 | 12.0 | 13.8 |
| මුළු ණය හා අත්තිකාරම් | 4,715 | 5,541 | 6,431 | 17.5 | 16.1 |
| මුළු ආයෝජන | 2,348 | 2,271 | 2,554 | (3.3) | 12.5 |
| මුළු තැන්පතු | 5,403 | 6,296 | 7,399 | 16.5 | 17.5 |
| මුළු ණය ගැනීම් | 1,758 | 1,696 | 1,607 | (3.3) | (5.3) |
| ප්‍රාග්ධන අරමුදල් | 601 | 790 | 871 | 19.5 | 10.2 |
| ශුද්ධ ලාභය (බදු පසු) | 97 | 116 | 139 | 19.9 | 19.2 |
| බැංකු ශාඛා සහ අනෙක් සේවා ඒකක | | | | | |
| බැංකු ශාඛා සංඛ්‍යාව | 3,452 | 3,524 | 3,560 | - | - |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | 3,535 | 3,851 | 4,416 | - | - |
| විචක්ෂණ අනුපාත (ප්‍රතිශතයක් ලෙස) | | | | | |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය | 15.4 | 15.6 | 15.2 | - | - |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය | 33.9 | 29.9 | 31.3 | - | - |
| අක්‍රීය ණය අනුපාතය (දළ) | 3.2 | 2.6 | 2.5 | - | - |
| හිමිකම් මත ප්‍රතිලාභ | 16.2 | 17.3 | 17.6 | - | - |
| වත්කම් මත ප්‍රතිලාභ | 1.9 | 1.9 | 2.0 | - | - |

(අ) සංශෝධිත (ආ) තාවකාලික

## 2.4 කාලීන පරීක්ෂණ සිදු කිරීම

(අ) පසුගිය වසරේ සිට ඉදිරියට ගෙන ආ පරීක්ෂණ 12 ක් ද ඇතුළුව 2017 වසරේ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ 38 ක් සිදු කරන ලදී. 2017 වසර තුළ දී අදාළ බැංකුවල කළමනාකාරිත්වය සමඟ විධිමත් සාකච්ඡාවලින් අනතුරුව සහ මුදල් මණ්ඩලය වෙත අදාළ වාර්තා යොමු කිරීමෙන් පසුව බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ 33 ක් අවසන් කෙරුණු අතර පරීක්ෂණ 5 ක කටයුතු අවසන් වෙමින් පැවතුණි. මෙම පරීක්ෂණවලදී හඳුනාගත් ප්‍රධාන කරුණු ලෙස, අඩු ප්‍රාග්ධනායනය, අඩු කාර්යක්ෂමතාව, ආයතනික යහපාලනය මෙන්ම කළමනාකරණය පිළිබඳ දුර්වලතාවයන්, තාක්ෂණික අවදානම් කළමනාකරණයේ ඇති අඩුලුහුඩුකම්, අක්‍රීය ණය අඩුවෙන් තක්සේරු කිරීම, බොල් හා අඩමාන ණය ඌණ වෙන්කිරීම් මෙන්ම භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳ කාරණා ද ඇතුළත් විය. මෙයට අමතරව විචක්ෂණ ස්වභාවයේ විශේෂ කරුණු සඳහා සීමිත විෂය පථයකින් යුත් පරීක්ෂණ කිහිපයක් ලියකියවිලි සත්‍යාපනය, රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන, ආයතනික යහපාලනය, ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි, මුදල් පිරිසැකසුම සහ ආචාර සම්පන්න නොවන ව්‍යාපාර භාවිතයන් යන අංශ සඳහා සිදු කරන ලදී.

(ආ) තවද, 2017 වසරේ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බැංකුවල කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය සම්බන්ධ ප්‍රමාණික සහ ගුණාත්මක සංරචකයන්ගේ එකතුවක් යොදා ගනිමින් බැංකු සඳහා ශ්‍රේණිගත කිරීමේ අභ්‍යන්තර ක්‍රමවේදයක් සකස් කරන ලදී. මේ සඳහා බැංකු තිරසාර හා ශ්‍රේණිගත කිරීමේ දර්ශක (Bank Sustainability Rating Indicator - BSRI) ආකෘතිය යොදා ගැනීමටත් එමගින් අවදානම මත පදනම් වූ අධීක්ෂණය පවත්වාගෙන යාමටත් පහසුකම් සැලසේ. මේ අනුව, අවදානම මත පදනම් වූ ප්‍රවේශයකින් යුතුව එතැන් පරීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ එක් අදියරයක් වශයෙන්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ බැංකුවලට අදාළ අවදානම සැලකිල්ලට ගනිමින් පරීක්ෂණ පැවැත්වීමේ වාර ගණන සහ එම පරීක්ෂණවල විෂයපථය නිර්ණය කරමින් බැංකු වර්ගීකරණ රාමුවක් සකස් කිරීමට කටයුතු කෙරිණි.

## 2.5 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම

(අ) 2017 දෙසැම්බර් මස 31 දිනට සමස්ථ අරමුදලෙහි වටිනාකම ආසන්න වශයෙන් රුපියල් බිලියන 44 (විගණනය නොකළ) පමණ වූ අතර සාමාජික ආයතන 76 කින් සමන්විත විය. අරමුදල විසින් සිදු කරන ලද රජයේ සුරැකුම්පත්වල ආයෝජනයන් හා ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සාමාජික ආයතනයන් වෙත 2014 වසරේ දී සැපයූ ද්‍රවශීලතා ආධාරක පහසුකමෙහි පොත් තබන ලද අගය 2017 දෙසැම්බර් 31 දිනට පිළිවෙළින් රුපියල් බිලියන 39.6 ක් සහ රුපියල් බිලියන 6.1 ක් වේ.

(ආ) ආසන්නතම පූර්ව මූල්‍ය වර්ෂය අවසානයේ දී සියයට 14 ක් හෝ ඊට වැඩි ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයක් පවත්වාගෙන යනු ලැබූ බලපත්‍රලාභී බැංකු විසින් සුදුසුකම් ලැබූ තැන්පතු ප්‍රමාණය මත වසරකට සියයට 0.1 ක් සහ අනෙකුත් සියලුම බැංකු විසින් වසරකට සියයට 0.125 ක් අරමුදල සඳහා වාරික ලෙස ගෙවිය යුතු විය. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා අදාළ වාරික මුදල සියයට 0.15 ක් විය. මෙම වසර තුළ දී රුපියල් බිලියන 8.1 ක මුදලක් සාමාජික ආයතනවලින් වාරික සහ දඩ මුදල් වශයෙන් රැස් කර ගන්නා ලදී.

(ඇ) 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තැන්පතු රක්ෂණ ආවරණය එක් ආයතනයක එක් තැන්පතුකරුවෙකු සඳහා රුපියල් 300,000 සිට 600,000 දක්වා ඉහළ නංවන ලදී.

**II- 3 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි ප්‍රධාන මූල්‍ය තොරතුරු**

| අයිතමය | රුපියල් මිලියන | |
|---|---|---|
| | 2016.12.31 දිනට | 2017.12.31 දිනට * |
| අරමුදලේ ප්‍රමාණය | 34,257 | 44,141 |
| මුළු ආදායම | 9,593 | 12,115 |
| මුළු වියදම | 753 | 2,230** |
| වර්ෂය සඳහා ලාභය (බදු පෙර) | 8,839 | 9,884 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 25,700 | 39,646 |
| ණය සහ ලැබිය යුතු දෑ | 6,179 | 6,129 |
| වෙළෙඳාම පිණිස පවතින වත්කම් සඳහා ඇති සංචිත | (665) | 2,392 |

* තාවකාලික
** බදු ඇතුළත්ව

(ඈ) 2018 ජනවාරි 01 දින සිට මෙම යෝජනා ක්‍රමය නිරාකරණ හා බලගැන්වීමේ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වනු ඇත.

## 2.6 බැංකු අංශයේ දැනුවත් භාවය සහ ශක්‍යතා වැඩි දියුණු කිරීම

### (අ) ශක්‍යතා වැඩි දියුණු කිරීම

බැංකු අංශයේ ශක්‍යතාව වැඩි දියුණු කිරීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලබා දෙනු ලබන නිරන්තර දායකත්වය ඉදිරියට රැගෙන යමින් මෙම වසරේ දී ද, ආයතනික යහපාලනය, අවදානම් කළමනාකරණය, බැංකුකරණය, බැංකු හා මූල්‍යකරණය සම්බන්ධ නීති හා රෙගුලාසිවල ප්‍රවනතාවය වැනි විෂය කරුණු යටතේ බැංකු විදු පියෙසේ සහ ඉන් පරිබාහිරව වෙනත් ආයතනයන්ගේ පැවති විවිධ පුහුණු සැසි හා සමුළු සඳහා දෙපාර්තමේන්තුව විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

2017 බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සිය නිලධාරීන්ගේ ශක්‍යතාවය වර්ධනය කිරීමට කැප වී ක්‍රියා කළ අතර මේ සඳහා අවදානම් කළමනාකරණය, බාසල් III සම්මුතීන්, ආතති පරීක්ෂාව, මූල්‍ය තාක්ෂණ, සයිබර් ආරක්ෂණ, මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ ඒකාබද්ධ අධීක්ෂණය වැනි විෂයන් ඔස්සේ පැවති දේශීය හා විදේශීය පුහුණු වැඩමුළු සඳහා නිලධාරීන් සහභාගි කරවීමට කටයුතු කරන ලදී.

### (ආ) බැංකුවල කළමනාකාරිත්වයන් සමඟ පැවති රැස්වීම්

ශ්‍රී ලංකා ආර්ථිකයේ මෙන්ම බැංකු අංශයේ වර්ධනයන් සහ නියාමන හා අධීක්ෂණ රාමුවේ නව ප්‍රවණතාවන් පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමේ හමුවක් ලෙස ක්‍රියාත්මක වූ බැංකු ප්‍රධාන විධායක නිලධාරීන් හා මහ බැංකු අධිපතිතුමා අතර පැවැත්වෙන මාසික රැස්වීම් සඳහා වන ලේකම් කටයුතු, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී.

බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය සහ දේශීය සහ විදේශීය වශයෙන් නියාමන රෙගුලාසි හමුවේ සහ ආර්ථිකයේ සිදුවන වෙනස්වීම් දැනුම් දෙමින්, බැංකුවල සභාපතිවරුන්ට ඔවුන්ගේ බැංකුවල තීන්දු තීරණ ගැනීමේ කටයුතු ශක්තිමත් කිරීමේ අරමුණින් බැංකු සභාපතිවරුන් සහ මහ බැංකු අධිපතිතුමා අතර හමුවීම් දෙකක් පසුගිය වසරේ දී පැවැත්වීය.

බලපත්‍රලාභී බැංකුවල සැලකිය යුතු කරුණු පවතින අවස්ථාවන්හි ඒ සඳහා කඩිනම් අවශ්‍ය නිවැරදිකරණ ක්‍රියාමාර්ග ගැනීම සහ නිසි සුපරීක්ෂනයක් සෑම අවස්ථාවකදීම පවත්වාගෙන යාමේ අරමුණින් ඒ ඒ බැංකුවලට අදාළව විශේෂ රැස්වීම් අදාළ බැංකුවල ඉහළ කළමනාකාරිත්වය සමඟ නිරන්තරව පවත්වන ලදී. එසේම බැංකුවල සහ බැංකු ක්ෂේත්‍රයේ තිරසාරභාවය සුරැකීම සඳහා බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සමඟ ද රැස්වීම් පවත්වන ලදී.

තවද, බැංකු සඳහා නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් හඳුන්වා දීමේ දී ඇතිවන ගැටලු නිරාකරණය කර ගැනීම සහ අවශ්‍ය තොරතුරු ආදිය පැහැදිලි කර ගැනීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් බැංකු සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය අතර රැස්වීම් මාලාවක් පැවැත්වීය.

2017 වසරේ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය, ශක්තිමත්භාවය සහ සුරක්ෂිතභාවය තිර කිරීම සඳහා මූල්‍ය අංශයේ ප්‍රධාන නියාමන ආයතනවල ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් මූල්‍ය ක්ෂේත්‍ර අධීක්ෂණ කමිටු රැස්වීමක් පැවැත්වීය.

මීට අමතරව බැංකුවල තිරසාරභාවය මැනීමේ සාමූහික ප්‍රවේශයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මෙම වසරේ දී, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බලපත්‍රලාභී බැංකුවල විගණකාධිකාරීවරුන් සහ විගණක මණ්ඩල කමිටු සභාපතිවරුන් සමඟ රැස්වීම් පවත්වන ලදී.

තවද මෙම වසරේ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බාසල් III ප්‍රාග්ධන රෙගුලාසි පිළිබඳව මාධ්‍යවේදීන්, අවදානම් කළමනාකරුවන්, වෘත්තිකයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ අන්තර් ක්‍රියාකාරී සැසි පැවැත්වූ අතර මූල්‍ය නොවන අවදානම් බාහිරකරණය පිළිබඳ අධීක්ෂණ වැඩසටහනකට ද සම්බන්ධ විය.

(ඇ) මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

2017 වසර තුළ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්, මහජනතාවගේ තැන්පතු භාර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබා දී ඇති මූල්‍ය ආයතන පිළිබඳව මෙන්ම නීති විරෝධී යෝජනා ක්‍රමවලට සම්බන්ධ වීමේ අවදානම පිළිබඳව ද වැඩමුළු 15 ක් පවත්වන ලදී. මෙයට අමතරව දැන්වීම් හා අත්පත්‍රිකා බෙදා හැරීම තුළින් ද මහජනතාව තවදුරටත් දැනුවත් කිරීමට කටයුතු යොදන ලදී.

**ඇමුණුම II-1**

**බලපත්‍රලාභී බැංකුවල නාමලේඛනය**

| | |
|---|---|
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | |
| 1. | අමානා බැන්ක් පී.එල්.සී. |
| 2. | ඇක්සිස් බැන්ක් ලිමිටඩ් |
| 3. | ලංකා බැංකුව |
| 4. | කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් |
| 5. | සිටි බැන්ක් එන්.ඒ. |
| 6. | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. |
| 7. | ඩොයිෂ් බැන්ක් ඒ.ජී. |
| 8. | ඩී.එෆ්.සී.සී. බැන්ක් පී.එල්.සී. |
| 9. | හබීබ් බැන්ක් ලිමිටඩ් |
| 10. | හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. |
| 11. | අයි.සී.අයි.සී.අයි. බැන්ක් ලිමිටඩ් |
| 12. | ඉන්දියන් බැන්ක් |
| 13. | ඉන්දියන් ඕවර්සීස් බැන්ක් |
| 14. | එම්සීබී බැන්ක් ලිමිටඩ් |
| 15. | නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. |
| 16. | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. |
| 17. | පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. |
| 18. | මහජන බැංකුව |
| 19. | පබ්ලික් බැන්ක් බර්හාඩ් |
| 20. | සම්පත් බැන්ක් පී.එල්.සී. |
| 21. | සෙලාන් බැන්ක් පී.එල්.සී. |
| 22. | ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැන්ක් |
| 23. | ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා |
| 24. | ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් |
| 25. | යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී. |
| **බලපත්‍රලාභී විශේෂිත බැංකු** | |
| 26. | ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව |
| 27. | ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් |
| 28. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| 29. | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| 30. | සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. |
| 31. | ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ් |
| 32. | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව |
| **විදේශ බැංකුවල නියෝජිත කාර්යාල** | |
| 01. | ජේ.පී. මෝගන් චේස් බැන්ක් එන්.ඒ. |
| 02. | ද බැන්ක් ඔෆ් ටෝකියෝ - මිට්සුබිසි යූ.එෆ්.ජේ. ලිමිටඩ් |

# 3. බැංකු විද්‍යා පියෙස

ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු කේන්ද්‍රය ලෙස මහ බැංකුව ඇතුළු මූල්‍ය අංශයේ මානව සම්පත් දියුණු කිරීම සඳහා වූ දායකත්වය නොකඩවා සිදු කිරීම සඳහා පුළුල් පරාසයක් ආවරණය වන පරිදි පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු රාශියක් බැංකු විද්‍යා පියෙස විසින් මෙම වසර තුළදී සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික උපායමාර්ගික අරමුණට අනුගත වෙමින් හා මූල්‍ය අංශයේ ඉල්ලුම සපුරාලීම සඳහා හැකියා ගොඩනැංවීම හා සහය දීම පිණිස පුළුල් පරාසයක පුහුණු පාඨමාලා රාශියක් පැවැත්වීමට 2017 වසර තුළ බැංකු විද්‍යා පියෙස කටයුතු කර ඇත. වාණිජ බැංකු මෙහෙයුම් කටයුතු, මෙහෙයුම් කළමනාකරණය, ණය කළමනාකරණය, නීති හා රෙගුලාසි, සංවර්ධන බැංකුකරණය, පර්යේෂණ හා දත්ත විශ්ලේෂණය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය හා මානව සම්පත් කළමනාකරණය යන විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් මෙම පාඨමාලා පවත්වන ලදී.

ඒ අනුව, 2017 වසරේ ප්‍රකාශයට පත් කළ පුහුණු කාලසටහනට අනුව පාඨමාලා 54 ක්, විශේෂ අවශ්‍යතා මත සැලසුම් කළ පාඨමාලා 41 ක්, සහතික පත්‍ර පාඨමාලා 3 ක්, අධ්‍යාපනික සම්මන්ත්‍රණ 4 ක්, මූල්‍ය සාක්ෂරතා සහ ආර්ථික කටයුතු පිළිබඳ දැනුම වර්ධනය සඳහා මහජනයාට විවෘත වූ ප්‍රසිද්ධ දේශන 9 ක් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා අග්නිදිග ආසියානු මහ බැංකු සංගමය හා එක්ව ජාත්‍යන්තර පාඨමාලා 4 ක් සාර්ථකව පැවැත්වීමට බැංකු විද්‍යා පියෙස සමත් වී තිබේ.

මහ බැංකුකරණයේ ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩල හැකියාවන් ඉහළ නැංවීමේ අරමුණින් ඉන්දීය මහ බැංකුවේ හා ජර්මනියේ මහ බැංකුව වන ඩොයිෂ් බුන්ඩේස් බැංකුවේ ජාත්‍යන්තර විශේෂඥ සහාය ඇතිව විශේෂයෙන් සැලසුම් කරන ලද විශේෂ පාඨමාලා 5 ක් ද සංවිධානය කරන ලදී. පිරිවැයට සරිලන ඵලදායීතාවකින් යුතු මෙම පාඨමාලා කාර්ය මණ්ඩලයේ ඉහළ ඇගයීමට ලක්ව ඇත. 2016 වසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුවට බඳවාගත් කළමනාකරණ අභ්‍යාසලාභීන් හා බැංකු සහායකයින් වෙනුවෙන්, මානව සම්පත් සහ පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවල ඉල්ලීම පරිදි, විශේෂයෙන් සැලසුම් කරන ලද පාඨමාලා 3 ක් පැවැත්වීමට ද බැංකු විද්‍යා පියෙස 2017 වසර තුළදී කටයුතු කර ඇත.

ප්‍රාදේශීය මට්ටමේ ජනතාවගේ ආර්ථික දැනුම හා මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා එක්ව ප්‍රාදේශීය මට්ටමේ සම්මන්ත්‍රණ 11 ක් හා විශේෂ පාඨමාලා 12 ක් පැවැත්වීමට බැංකු විද්‍යා පියෙස කටයුතු කර තිබේ. තවද, 'තක්ෂිලාව' හා 'අරිවූට්රු' නමින් ජනප්‍රිය රූපවාහිනී වැඩසටහන් මාලා 2 ක් 2017 වසර තුළ විකාශනය කිරීම සඳහා කටයුතු සම්පාදනය කරන ලද්දේ උසස් පෙළ සිසුන් ඉලක්ක කර ගනිමිනි. 2017 වසර තුළ පවත්වන ලද පුහුණු පාඨමාලා 146 ක් සඳහා 6,250 ක පිරිසක් සහභාගි වූ අතර නේපාලය, බංගලාදේශය, භූතානය, මාලදිවයින, ඉන්දුනීසියාව, මැලේසියාව, පැපුවා නිව්ගිනියාව,

දකුණු කොරියාව, කාම්බෝජියාව, මියන්මාරය, බෘනෙයි, සීෂෙල්ස් සහ තායිලන්තය යන රටවලින් සහභාගි වූ 126 ක විදේශ නියෝජිතයන් ද ඒ අතර වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ මූල්‍ය අංශයේ වර්තමාන සහ අනාගත පුහුණු හා මානව සම්පත් සංවර්ධන අවශ්‍යතා නිසි ලෙස තක්සේරු කරමින් බැංකු විදු පියෙසේ 2018 වසර සඳහා වූ පුහුණු පාඨමාලා දින දර්ශනය (Programme Calendar) සකස් කොට ඇත. පුහුණු පාඨමාලාවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා එම පුහුණු පාඨමාලාවල විෂය පරාසය ඇතුළු පුහුණුව හා සම්බන්ධ අනෙකුත් සේවා පිළිබඳ පශ්චාත් ඇගයුම් ක්‍රියාවලියක් නොකඩවා පවත්වා ගෙන යනු ලබන අතර, බැංකු විදු පියෙස මගින් පවත්වනු ලබන සියලුම පාඨමාලා සෑම අතකින්ම ඉහළ ප්‍රමිතියක පවත්වාගෙන යාමට ප්‍රයත්න දරනු ලැබේ.

## 4. සන්නිවේදන

සන්නිවේදන දෙපාර්තමේන්තුව සිය කාර්යභාරය වඩාත් ශක්තිමත් කිරීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙවර වන ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගැනීම සාක්ෂාත් කර ගැනීම උදෙසා 2017 වසර තුළ දී මනා දායකත්වයක් සැපයීය. බාහිර සහ අභ්‍යන්තර සන්නිවේදන ප්‍රවේශයන් හරහා මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, විද්‍යුත් මාධ්‍ය දැනුම මිනුම තරග පැවැත්වීම, පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානයේ සේවා ආදිය තුළින් ඇල්මැති පාර්ශ්වයන් වෙත තොරතුරු බෙදා හැරීම ඒ සඳහා දායක කර ගන්නා ලදී.

### 4.1 බාහිර සන්නිවේදන කටයුතු

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික වෙබ් අඩවිය නවීකරණය සන්නිවේදන දෙපාර්තමේන්තුව පසුගිය වසරේ සිදු කළ ප්‍රධාන කර්තව්‍යයක් විය. 2016 වසරේ ඒ සඳහා ස්ථාපිත කරන ලද කාර්යසාධක බලකායේ ද සහයෝගය ඇතිව පවත්නා නවීනතම අංගෝපාංග ඇතුළත් වන සේ එම වෙබ් අඩවිය නිර්මාණය කිරීම දෙපාර්තමේන්තුවට අභියෝගයක් වූ අතර, සිංහල, ඉංග්‍රීසි, සහ දෙමළ භාෂාත්‍රයෙන් ම විස්තර සහිත නව වෙබ් අඩවිය 2018 වසරේ දී භාවිතය සඳහා නිදහස් කිරීමට නියමිතය.

සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් 2017 වසර තුළ දී පුවත්පත් නිවේදන 1,115ක් නිකුත් කෙරුණු අතර, මූල්‍ය ප්‍රතිපත්ති විවරණ, විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය සහ උද්ධමනය ආදී අංශ ආවරණය වන පරිදි නිකුත් කෙරුණු ප්‍රධාන නිවේදන 183ක් ඒ අතර විය. ඊට අමතරව ගැසට් නිවේදන 5ක්, මාධ්‍ය වෙත නිකුත් කෙරුණු දැන්වීම් 135ක් (මුදල් ගෙවා පළ කරන ලද දැන්වීම් ද ඇතුළුව) ද පළ කෙරිණි. තවදුරටත් මහ බැංකුවේ ඇල්මැති පාර්ශ්වයන් සමඟ සන්නිවේදනය විධිමත් කිරීමේ අරමුණින් සන්නිවේදන දෙපාර්තමේන්තුව ට්විටර්, ෆේස්බුක් සහ යූටියුබ් යන සිය ආයතනික සමාජ මාධ්‍ය ගිණුම් නිරන්තර නිරීක්ෂණයට ලක් කරමින් ඒවායේ පරිපාලන කටයුතු සිදු කළේය. 2016 සහ 2017 වසර තුළ මහ බැංකුවේ සමාජ මාධ්‍ය ගිණුම්වල ක්‍රියාකාරිත්වය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් II-4 සංඛ්‍යා සටහනේ දැක්වේ.

**II-4 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ මාධ්‍ය සන්නිවේදනය පිළිබඳ විස්තර**

| මාධ්‍ය වර්ග | 2016 | 2017 |
|---|---|---|
| යූටියුබ් (වීඩියෝ උඩුගතකිරීම්) | 54 | 63 |
| යූටියුබ් නැරඹීම් (සමස්තයක් ලෙස) | 131,000 | 177,454 |
| ෆේස්බුක් කැමැත්ත පළ කිරීම් (likes) (සමස්තයක් ලෙස) | 11,630 | 18,146 |
| ට්විටර් සාමාජිකයන් (සමස්තයක් ලෙස) | 8,791 | 17,990 |

මීට අමතරව මහ බැංකුවේ කටයුතු හා සම්බන්ධ විවිධ වැදගත් ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව වූ මාධ්‍ය හමු 15 ක් 2017 වසර තුළ දී පැවැත්විණි. මහ බැංකුවේ විවිධ වැඩසටහන්වලට පහසුකම් සැපයීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව තවදුරටත් සිය දායකත්වය සැපයූ අතර මහ බැංකුවේ 67 වන සංවත්සරය වෙනුවෙන් පකිස්තාන මහ බැංකුවේ හිටපු අධිපතිවරයෙකු වූ අෂ්රෆ් මෙමූඩ් වත්‍රා මහතා "සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ව්‍යුහාත්මක පුනරුදය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පකිස්තානයේ මෑතකාලීන අත්දැකීම්" යන මැයෙන් පැවැත්වූ දේශනය, බැංකු විදු පියෙස සංවිධානය කළ 2016 වාර්ෂික වාර්තාව පිළිබඳ විවරණය ඇතුළු තවත් මහජන දේශන 5 ක් ද ඒවා අතර විය. ඒවාට අමතරව මහ බැංකු බෝම්බ ප්‍රහාරයට ලක් වූවන් පිළිබඳ 21 වන අනුස්මරණ උත්සවය, "පෙර දැක්ම" එළිදැක්වීම, 34 වන සාර්ක්ෆිනෑන්ස් කණ්ඩායම් රැස්වීම හා සාර්ක් රටවල මහ බැංකු අධිපතිවරුන්ගේ සාකච්ඡා සමුළුව, ආසියානු නිෂ්කාශන සංගමයේ තාක්ෂණික කමිටු රැස්වීම සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා-ශාන්තිකර කණ්ඩායමේ වාර්ෂික සැසිවාරය සහ තාක්ෂණික සහයෝගිතා රැස්වීම ඇතුළු වැඩසටහන් ගණනාවකටම පහසුකම් සැපයීම ද කෙරිණි.

2017 සැප්තැම්බර් 15 සිට 24 දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වුණු කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට ද සන්නිවේදන දෙපාර්තමේන්තුව සහභාගි විය. විවිධ මහ බැංකු ප්‍රකාශන අලෙවිය තුළින් ප්‍රාදේශීය සංවර්ධනය ඇතුළු විවිධ ක්ෂේත්‍ර අරභයා මහ බැංකුව විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, වැඩසටහන් ආදිය පිළිබඳව මහජනතාවගේ දැනුම්වත්භාවය වැඩි කිරීම මෙහි අරමුණ විය.

''ජනපතිට කියන්න - මහජන දුක්ගැනවිලි විසඳීමේ වැඩසටහන'' සමග සක්‍රිය ව සම්බන්ධ වූ සන්නිවේදන දෙපාර්තමේන්තුව 2017 වසර තුළ දී අදාළ දෙපාර්තමේන්තු ද සම්බන්ධ කරගෙන තමන් වෙත යොමු කළ දුක්ගැනවිලි 86කට ප්‍රතිචාර දක්වා ඇත.

''2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත'' යටතේ පුරවැසියන්ගෙන් ලැබෙන ඉල්ලීම් සම්බන්ධීකරණය කිරීමේ වගකීම 2017 මාර්තු මාසයේ දී

සන්නිවේදන දෙපාර්තමේන්තුව වෙත පැවරුණු අතර, 2017 වසර තුළ දී අදාළ දෙපාර්තමේන්තුවල ද සහයෝගය ඇතිව තොරතුරු ඉල්ලීම් 71කට සහ අභියාචනා 12කට ප්‍රතිචාර දක්වා ඇත.

## 4.2 අභ්‍යන්තර සන්නිවේදනය

ආර්ථික, මූල්‍ය අංශ සහ මහ බැංකුවට අදාළ වෙනත් ක්ෂේත්‍ර පිළිබඳ එදිනෙදා තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත සන්නිවේදනය කිරීම උදෙසා සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් භාෂාත්‍රයෙන්ම පළ වූ ජාතික මට්ටමේ පුවත්පත් 15ක පළ වූ වාර්තා, විශේෂාංග සහ මහජන මත පළ කිරීම් 8,466ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී.

නිල අභ්‍යන්තර ප්‍රවෘත්ති ප්‍රකාශනය වන "කවුළුව" සඟරාවේ කලාප දෙකක් වර්ෂය තුළ දී නිකුත් කරන ලදී.

## 4.3 මහජනතාව දැනුම්වත් කිරීම

රටේ පාසල් දරුවන් අතර ආර්ථික සාක්ෂරතාව වැඩිදියුණු කිරීම ඉලක්ක කරගෙන සිංහල සහ දෙමළ භාෂාවලින් පැවැත්වූ "Econ-Icon-Season III" අන්තර් පාඨශාලීය දැනුම මිනුම තරගය පසුගිය වසරේ දී සාර්ථක ලෙස නිමාවට පත් කළ අතර, එහි අවසන් මහා තරගය 2017 පෙබරවාරි මාසයේ දී පැවැත්විණ.

සන්නිවේදන දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් "ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු සහ කාර්යභාරය", "ශ්‍රී ලංකාවේ ආර්ථිකය" ආදී විවිධ මාතෘකා රැසක් ආවරණය වන පරිදි දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් ඉදිරිපත් කෙරුණු අතර ඒ පිළිබඳ විස්තර II-5 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. මීට අමතරව සන්නිවේදන දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් ප්‍රධාන කාර්යාලයෙන් බැහැරගතව වැඩසටහන් 17ක් පැවැත්වුණු අතර, ඒ සඳහා විවිධ ඇල්මැති පාර්ශ්වයන්ගෙන් පුද්ගලයන් 2,500ක් පමණ සහභාගි වූ බව වාර්තා වී ඇත.

**II-5 සංඛ්‍යා සටහන**

**2017 වසර තුළ පැවැත්වූ මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර**

| ආයතනය | වැඩසටහන් ගණන | සහභාගි වූ ගණන |
|---|---|---|
| පාසල් | 100 | 6,776 |
| විශ්වවිද්‍යාල | 6 | 289 |
| ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා සහ ආරක්ෂක විශ්වවිද්‍යාලය | 4 | 106 |
| විදේශීය දූත මණ්ඩල (ජාතික ආරක්ෂක විද්‍යාල) | 5 | 118 |
| ප්‍රාදේශීය කාර්යාල හරහා ගුරුවරුන්, පාසල් සිසුන් සහ රාජ්‍ය නිලධාරීන් සඳහා කෙරුණු වැඩසටහන් | 5 | ලැබී නොමැත |
| සන්නිවේදන දෙපාර්තමේන්තුව සංවිධානය කළ බැහැරගත වැඩසටහන් | 17 | 2,500 |

බැංකු විදූ පියෙස සංවිධානය කළ "අරිවුට්රු" (දැනුම් උල්පත) නම් දෙමළ රූපවාහිනී අධ්‍යාපනික වැඩසටහනට සම්පත්දායකත්වය සන්නිවේදන දෙපාර්තමේන්තුවෙන් සැපයුණු අතර, ප්‍රාදේශීය කාර්යාල දෙකක් විසින් සංවිධානය කෙරුණු දැනුම්වත් කිරීමේ වැඩසටහන් 5ක් සඳහා සම්පත් දායකයන් සහ ප්‍රකාශන සැපයීම තුළින් සන්නිවේදන දෙපාර්තමේන්තුව සිය දායකත්වය සපයන ලදී.

ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාස කෞතුකාගාරයේ පිහිටි මහ බැංකු ප්‍රකාශන අලෙවි කවුළුවෙන්, රාජගිරියේ පිහිටි ප්‍රකාශන අලෙවි මධ්‍යස්ථානයෙන්, ප්‍රාදේශීය කාර්යාලවලින් සහ කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ අලෙවි කුටියෙන් පසුගිය වසර තුළ රුපියල් මිලියන 5.6ක් වටිනා මහ බැංකු ප්‍රකාශන අලෙවි විය. එසේම සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පාසල්, මහජන පුස්තකාල සහ වෙනත් රාජ්‍ය ආයතන වෙත මහ බැංකු ප්‍රකාශන 16,698ක් බෙදා හරින ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් සහ ඉන් සැපයෙන සේවා සම්බන්ධයෙන් මධ්‍යම පළාතේ පාසල් සිසුන් ඇතුළු මහජනතාව දැනුම්වත් කිරීමේ අරමුණින් සන්නිවේදන දෙපාර්තමේන්තුව ප්‍රථම වරට සංවිධානය කළ "මහ බැංකුව ඔබ හමුවට - විවෘත දිනය" වැඩසටහන 2017 මැයි 5 සහ 6 යන දෙදින තුළ මාතලේ ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ දී සාර්ථකව පැවැත්විණ. මීට අමතරව මහජනතාවට මූල්‍ය හා බැංකු සේවා සම්බන්ධයෙන් තම දුක්ගැනවිලි සහ පැමිණිලි ඉදිරිපත් කිරීමේ ඉඩප්‍රස්ථා ද සලසා තිබිණි.

## 4.4 දෙමළ පරිවර්තන සේවා

ප්‍රධාන මහ බැංකු ප්‍රකාශන ඇතුළු සියලු ම සන්නිවේදන අවශ්‍යතාවන්හි පරිවර්තන කටයුතු සිදු කිරීම තුළින් ජාතික භාෂා ප්‍රතිපත්තියට අනුකූල ලෙස සියලු ම සන්නිවේදන කටයුතු භාෂා ත්‍රිත්වයෙන් ම ඉදිරිපත් කිරීමේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාර්ථක කර ගැනීම සඳහා අමිල සේවාවක් දෙමළ භාෂා පරිවර්තන අංශය විසින් අඛණ්ඩව ලබා දෙන ලදී.

## 4.5 ඡායාරූප සහ වීඩියෝ ආවරණය

මහ බැංකුවේ විවිධ අවස්ථා සඳහා දෘශ්‍ය සන්නිවේදන ආවරණය සැපයීම තුළින් සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මාධ්‍ය අංශය සිය සේවා තවදුරටත් ලබා දෙන ලදී. 2017 වසර තුළ දී අවස්ථා 730ක් ආවරණය කළ අතර 2016 වසරේ දී එම සංඛ්‍යාව 379ක් විය. ඡායාරූප හා වීඩියෝ සංස්කරණය, ඡායාරූප මුද්‍රණය, ඡායාරූප ඇල්බම් සකස් කිරීම, සංයුක්ත තැටි සකස් කිරීම, ඡායාරූප සහ වීඩියෝ මහ බැංකු වෙබ් අඩවියට හා අභ්‍යන්තර ජාල බිහිදොර වන "මංසල" වෙත උඩුගත කිරීම ඉහළ වෘත්තීය මට්ටමකින් සිදු කෙරිණි.

## 4.6 මුද්‍රණාලය

මහ බැංකුවේ මුද්‍රණ අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය පරිගණක වර්ණයෝජන කටයුතු, රූ රටා සැලසුම්කරණය සහ මුද්‍රණ කටයුතු ඉහළ ප්‍රමිතියකින් යුතුව සැපයීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව සමත් විය. මේ යටතේ මුද්‍රණ ඇණවුම්

219ක් 2017 වසර තුළ දී නිම කර ඇත. "සටහන" කලාප 4ක් "නිව්ස් සර්වේ" කලාප 2ක්, "කුරිප්පේඩු" සහ "වයිප්පහම්" කලාප 3ක්, "කවුළුව" සහ "සැදෑව" යන වාර ප්‍රකාශන ද "ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය පිළිබඳ සමීක්ෂණයක්", "ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා සඳහා මඟපෙන්වීමක්" (භාෂා තුනෙන්ම), "මහ බැංකුවේ අරමුණු සහ කාර්යභාරය" (සිංහල), "මුදල් ගනුදෙනු බැංකු සහ ආර්ථිකය", "උද්ධමනයේ කතාව" යන ප්‍රකාශන ද පෝස්ටර්, අත්පත්‍රිකා, සහතිකපත්, ලිපි ශීර්ෂ, නම්පත් සහ සුබපැතුම්පත් ද ඒවා අතර විය.

### 4.7 පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා මහ බැංකුවේ දැනුම් බිහිදොර පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානයයි. මහ බැංකු කාර්ය මණ්ඩලයටත්, විශ්වවිද්‍යාල සිසුන් සහ පර්යේෂකයන් ඇතුළු අවසරලත් බාහිර පාර්ශ්වයන්ටත් සිය දැනුම වර්ධනය කර ගැනීම සඳහා ඇති ප්‍රධාන සම්පත් මධ්‍යස්ථානය ද වන මෙය පොත් 30,600කින්, වාර්තා 19,500කින්, සංයුක්ත තැටි 1,935කින් සහ ජර්නල 48,000කින් සමන්විත වේ. මේවා අතරින් 2017 වසර තුළ දී පොත් 667ක්, වාර්තා 153ක් සහ සංයුක්ත තැටි 77ක් පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානයට අලුතින් එකතු කර ගන්නා ලදී. ආර්ථික විද්‍යාව, කළමනාකරණය සහ මූල්‍යය යන විෂයයන් ගැන පාථුල දැනුමක් ලබා ගැනීමට පහසු "සයන්ස් ඩිරෙක්ට්" සහ "ඉකෝන්ලිට්" යන මංගත දත්ත පදනම්වල සාමාජිකත්වය ද මුදල් ගෙවා ලබා ගෙන ඇත. ඊට අමතරව, මහ බැංකු කටයුතු සම්බන්ධ තොරතුරු ලබා ගත හැකි www.centralbanking.com,www.risk.net සහ www.ft.com යන මංගත මූලයන්ගේ ද සාමාජිකත්වය ලබා ගෙන ඇති පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය, මහ බැංකු පරිශ්‍රය තුළ දී ඒවාට ප්‍රවේශ වීමේ පහසුකම් ද සලසා ඇත.

"ඕපන්ඇතැන්ස්" ප්‍රවේශ කළමනාකරණ සේවාව සඳහා ලියාපදිංචි වීම 2017 වසරේ පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය ඉටු කරගත් ප්‍රධාන කර්තව්‍යයකි. එහි සුවිශේෂත්වය වනුයේ පූර්ව ලියාපදිංචිය ලබා ගත් මහ බැංකු නිලධාරීන්ට ඕනෑම තැනක සිට එයට ප්‍රවේශ වීමේ හැකියාවයි. එසේම එකවර මංගත ජර්නල 12කට ප්‍රවේශ විය හැකි පහසුකම් සහිත "විලී ඔන්ලයින් ජර්නල්ස්" හි ලියාපදිංචිය ද පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් ලබා ගන්නා ලදී.

දේශීය ජර්නල 17ක සහ විදේශීය ජර්නල 83ක ලියාපදිංචිය ලබාගෙන ඇති පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය ඊට අමතරව නව පොත් ගැන හඳුන්වා දෙන විද්‍යුත් විවරණිකා, එදිනෙදා සිදුවීම්, ජාත්‍යන්තර පුවත් නිවේදන සහ ආර්ථිකය පිළිබඳ කරුණු ඇතුළත් දේශීය පුවත්පත් නිවේදන සහ ලිපි එකතු කොට අන්තර්ජාලය හරහා බෙදා හැරීම සිදු කරයි. ජාතික භාෂා ප්‍රතිපත්තියට අනුකූල වීම පිණිස හැකි සෑම අවස්ථාවකදී ම දේශීය පුවත්පත්වල පළ කෙරෙන අදාළ වාර්තා භාෂාත්‍රයෙන් ම එකතු කොට බෙදා හැරීම ද විශේෂත්වයකි.

ශ්‍රී ලංකාවේ ඇති බැංකු කටයුතු හා ආර්ථික විද්‍යා පුස්තකාලවලට අවශ්‍ය තොරතුරු සැපයීමෙන් සහ අන්තර් පුස්තකාල හුවමාරුව යටතේ අවශ්‍ය තොරතුරු බෙදාහදා ගැනීම තුළින් පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය සිය සේවාවන් තවදුරටත් පවත්වා ගෙන ගියේය. ඊට අමතරව ලොව පුරා විසිර ඇති මහ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන අතර තොරතුරු බෙදාහදා ගැනීමේ අරමුණින් පිහිටුවා ඇති "විශ්ව මහ බැංකු සහ මූල්‍ය ආයතනවල පුස්තකාල සහ තොරතුරු වෘත්තිකයන්ගේ ජාලයේ" ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස ද පසුගිය වසර පුරාම කටයුතු කළේය. පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානයේ අභ්‍යන්තර වෙබ් අඩවිය තුළින් මහ බැංකු කාර්ය මණ්ඩලයට ඩිජිටල් පුස්තකාල සේවාවට ප්‍රවේශ වීමේ පහසුකම ද සලසා දී ඇත.

## 5. ව්‍යවහාර මුදල්

1949 අංක 58 දරන මුදල් නීති පනතේ නියමයන් අනුව ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි ඇතුළත්ව ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය සහ අධිකාරී බලය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. මෙම කාර්යය ඉටු කිරීමේදී ව්‍යවහාර මුදල් නෝට්ටු නිර්මාණය කිරීම, මුද්‍රණය කිරීම, කාසි ටංකනය කිරීම හා ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි බෙදා හැරීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත.

මුදල් මණ්ඩලය සතු මෙම ව්‍යවස්ථාපිත වගකීම සම්බන්ධ කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ව්‍යවහාර මුදල් සඳහා වන ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් තොග පවත්වා ගැනීමත්, එහි වටිනාකම සහ අඛණ්ඩතාව ආරක්ෂා කිරීමත් මගින් ආර්ථිකය සුමට ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන ව්‍යවහාර මුදල් කෙරෙහි මහජන විශ්වාසය ගොඩනැංවීමේ හා පවත්වාගෙන යෑමේ කාර්යයෙහි ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් නිරතව සිටී.

### 5.1 ව්‍යවහාර මුදල් මුද්‍රණය හා ටංකනය

2017 වර්ෂයේදී ආර්ථිකය තුළ ව්‍යවහාර මුදල් සඳහා වන ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 270 ක් මුද්‍රණය කිරීමටත්, කාසි මිලියන 970 ක් ටංකනය කිරීමටත් අවශ්‍ය කටයුතු ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කල අතර සංසරණය තුළ ගුණාත්මක තත්ත්වයේ නෝට්ටු පැවතීමත්, මහජන ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් තොග පැවතීමත් තහවුරු කිරීම සඳහා අදාළ සැපයුම් ගෙන්වීම ඉදිරි වර්ෂවලදී සිදු කරනු ලැබේ. රුපියල, රුපියල් 2, රුපියල් 5 සහ රුපියල් 10 කාසි ප්‍රමාණයෙන් කුඩා කරමින් මල නොබැඳෙන වානේ ලෝහයෙන් නිෂ්පාදිත සංසරණ තත්ත්වයේ පවතින නව කාසි කාණ්ඩයක් නිර්මාණය කිරීමටද කටයුතු කරන ලදී. මෙම නව කාසි කාණ්ඩය මගින් ටංකන පිරිවැය අවම කිරීම හා කාසි හැසිරවීම පහසු කිරීම අපේක්ෂා කෙරේ.

### 5.2 ව්‍යවහාර මුදල් බෙදා හැරීම

**(අ) සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්**

තාක්ෂණය මගින් මෙහෙයවනු ලබන මුදල් භාවිතයෙන් තොර ගෙවීම් මාධ්‍ය අඛණ්ඩව භාවිතා කරමින් තිබියදීත්, ශ්‍රී ලංකා ආර්ථිකයේ ආර්ථික වර්ධනය හා උද්ධමනය සමඟ අනුගතව යමින් 2017 වර්ෂය තුළ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සඳහා වූ ඉල්ලුම ඉහළ ගොස් ඇත.

ඒ අනුව සංඛ්‍යා සටහන II-6 හි දක්වා ඇති පරිදි පෙර වර්ෂයට සාපේක්ෂව 2017.12.31 දිනට සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් වටිනාකම රුපියල් බිලියන 598 දක්වා සියයට 8.3 කින් වර්ධනය වී ඇත.

**II-6 සංඛ්‍යා සටහන**

**සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් (2017.12.31 දිනට)**


| නිකුතු | වටිනාකම (රුපියල් බිලියන) | | | | | වෙනස (ප්‍රතිශතයක් ලෙස) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| නෝට්ටු | 332.4 | 408.8 | 482.0 | 541.5 | 585.3 | 6.8 | 23.0 | 17.9 | 12.3 | 8.0 |
| කාසි* | 6.8 | 7.5 | 9.1 | 10.7 | 12.1 | 7.5 | 10.3 | 21.3 | 17.5 | 13.0 |
| එකතුව | 339.2 | 416.3 | 491.1 | 552.2 | 597.4 | 6.8 | 22.7 | 18.0 | 12.4 | 8.3 |

*සංසරණය නොවන සමරු කාසි ඇතුළත් නොවේ.

සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් නෝට්ටුවල වටිනාකම 2017 වර්ෂය තුළ දී රුපියල් බිලියන 585.3 දක්වා සියයට 8.0 කින් වැඩි වී ඇත. රූප සටහන II-1 හි දක්වා ඇති පරිදි ව්‍යවහාර මුදල් නෝට්ටු අතරින් රු.5000 සහ රු.1000 මුදල් නෝට්ටුවල වටිනාකම එක්ව ගත් කල එම ප්‍රතිශතය ආසන්න වශයෙන් 2017.12.31 දිනට සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් නෝට්ටුවල වටිනාකමින් සියයට 85.8 කි.

**II-1 රූප සටහන**

**2017.12.31 දිනට සංසරණයේ පවතින මුදල් නෝට්ටුවල වටිනාකම**




2011 වර්ෂයේදී මහජනයා සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය (සංසරණය තුළ) දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් ලෙස සියයට 4.0 ක් වූ අතර එය 2017 වර්ෂයේ අවසානයේදී සියයට 4.5 දක්වා ඉහළ යෑම තුළින්, රට තුළ තවදුරටත් වැදගත් ගෙවීම් මාධ්‍යයක් ලෙස ව්‍යවහාර මුදල් සඳහා වැඩි වෙමින් පවතින ඉල්ලුමක් පවත්නා බව තහවුරු කරයි (රූප සටහන II-2).

**II-2 රූප සටහන**

**සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් / දළ දේශීය නිෂ්පාදිතය**




**(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ව්‍යවහාර මුදල් නිකුත් කිරීම**

රට තුළ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සඳහා වන ඉල්ලුම සපුරාලීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව අඛණ්ඩව හා විධිමත්ව ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සැපයීම තහවුරු කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු හා ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවෙහි පිහිටුවා ඇති විශේෂ මහජන මුදල් කවුළුව හරහා මුදල් නිකුත් කිරීම නොකඩවා සිදු කෙරිණි.

ඒ අනුව, රටෙහි සංසරණය සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය තුළ දී නිකුත් කර ඇති ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවල වටිනාකම පිළිවෙළින් රුපියල් බිලියන 628.0 ක් සහ රුපියල් බිලියන 1.4 ක් වේ (සංඛ්‍යා සටහන II-7).

**II-7 සංඛ්‍යා සටහන**


**බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි**

| අයිතමය | වටිනාකම (රුපියල් බිලියන) | | | |
|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 |
| නෝට්ටු | 431.8 | 503.4 | 594.0 | 628.0 |
| කාසි | 0.8 | 1.6 | 1.6 | 1.4 |
| එකතුව | 432.6 | 505.0 | 595.6 | 629.4 |

ප්‍රාදේශීය මට්ටමේ කාසි අවශ්‍යතාවය සපුරාලීමට දිවයින පුරා කාසි බෙදා හැරීමේ නව යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මූලික පියවර ගන්නා ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල හරහා රටේ ප්‍රාදේශීය මට්ටමින් කාසි බෙදා දීමේ යෝජනාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සලකා බලන ලදී.

**II-3 රූප සටහන**

**ව්‍යවහාර මුදල් නිකුතුව - ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සංඛ්‍යාව**




**(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගැනීම**

ව්‍යවහාර මුදල් මෙහෙයුම්වල කොටසක් වශයෙන්, මූල්‍ය ප්‍රතිපත්තිමය උපකරණයක් ලෙස මූලිකවම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය පවත්වාගෙන යෑම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් කරනු ලබන ව්‍යවහාර මුදල් තැන්පතු, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලදී. සංඛ්‍යා සටහන II-8 හි දක්වා ඇති පරිදි, 2017 වර්ෂය තුළදී සේවා නිසි (භාවිතයට සුදුසු) සහ සේවා අනිසි (භාවිතයට නුසුදුසු) නෝට්ටු යන දෙයාකාරයම ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලදී. පසුගිය වර්ෂය හා සසඳන විට 2017 වර්ෂයේදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කළ මුදල් තැන්පතු ප්‍රමාණය සියයට 9.2 කින් වැඩි වී ඇත.

**II-8 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කළ ව්‍යවහාර මුදල් තැන්පතු**

| අයිතමය | වටිනාකම (රුපියල් බිලියන) | | | වෙනස ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2015 | 2016 | 2017 |
| නෝට්ටු | 429.6 | 534.5 | 584.0 | 21.1 | 24.4 | 9.2 |

සටහන: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තැන්පත් කරනු ලබන කාසිවල වටිනාකම සැලකිය යුතු අගයක් නොගනී.

**(ඈ) සමරු කාසි නිකුත් කිරීම සහ සමරු අයිතම විකිණීම**

2017 ජනවාරි මාසයේදී, කොළඹ 05, විශාඛා විද්‍යාලයට වසර 100 ක් පිරීම නිමිත්තෙන්, රටෙහි ප්‍රමුඛතම පාසලක් ලෙස එය ජාතියට සිදු කරන දායකත්වය ඇගයීමක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුහුණත වටිනාකම රු.2000 ක් වන සංසරණය නොවන රිදී සමරු කාසියක් නිකුත් කරන ලදී.

"Ceylon Tea", ශ්‍රී ලංකාවේ ඉතා වැදගත් සහ දිගුකාලීන අපනයනික වෙළඳ භාණ්ඩයක් ලෙස ජාතික ආර්ථිකයට සිදු කරන ලද දායකත්වය සලකා එහි 150 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුහුණත වටිනාකම රු.10 ක් වන සංසරණ තත්ත්වයේ සමරු කාසියක් නිකුත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් සංවත්සරය සැමරීම නිමිත්තෙන් සමරු නෝට්ටුවක් නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සැලසුම් කර ඇති අතර 2018 පෙබරවාරි මාසයේදී එම මුදල් නෝට්ටුව නිකුත් කරනු ඇත. තවද, සමරු අයිතම අලෙවි කිරීම කොළඹ කොටුවෙහි පිහිටි ආර්ථික ඉතිහාස කෞතුකාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල හරහා සිදු කෙරිණි.

## 5.3 පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය

සේවා අනිසි/භාවිතයට නුසුදුසු ව්‍යවහාර මුදල් නෝට්ටු සංසරණයෙන් ඉවත් කරමින් රට තුළ ගුණාත්මක තත්ත්වයේ ව්‍යවහාර මුදල් නෝට්ටු පැවැත්ම තහවුරු කිරීමේ අරමුණ ඇතිව පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී.

පිරිසිදු මුදල් සංසරණයේ පැවතීම හේතුවෙන් රටේ ධනාත්මක ප්‍රතිරූපයක් පිළිබිඹු කරන බැවින් 2017 වර්ෂයේදී පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ග කිහිපයක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී.

2017 වර්ෂයේදී සේවා නිසි (භාවිතයට සුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු විධිමත් ලෙස සැපයීම තහවුරු කිරීම සහ සේවා අනිසි (භාවිතයට නුසුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු ඉවත් කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තැන්පත් කරන ලද මුහුණත වටිනාකම රුපියල් බිලියන 94.2 ක භාවිතයට නුසුදුසු ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 177 ක් විනාශ කිරීම ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරනු ලැබීය. මුහුණත වටිනාකම රුපියල් බිලියන 504.6 ක් වූ සේවා නිසි ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 311.7 ක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් නැවත සංසරණයට නිකුත් කරන ලදී.

සාමාන්‍ය පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් කරනු ලබන ව්‍යවහාර මුදල් තැන්පතු අතර වූ සිතාමතා විකෘති කරන ලද හානි කරන ලද හෝ වෙනස් කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු සංඛ්‍යාවෙහි වැඩි වීම සැලකිල්ලට ගැනීමෙන් පසු ව්‍යවහාර මුදල් නෝට්ටු සිතාමතා විකෘති කිරීම, හානි කිරීම හෝ වෙනස් කිරීම සම්බන්ධ නීති දැඩිව බලාත්මක කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී.

එවැනි පුරුදු වලින් වළකින ලෙසත්, 2017.12.31[1] දිනෙන් පසු එවැනි ව්‍යවහාර මුදල් නෝට්ටු සඳහා ගෙවීම් භාර නොගන්නා බැවින් තමා සන්තකයේ පවතින එවැනි ව්‍යවහාර මුදල් නෝට්ටු 2017.12.31 දිනට පෙර හුවමාරු කර ගන්නා ලෙසත් මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ඉතා සාර්ථක දැනුම්වත් කිරීමේ ව්‍යාපාරයක් සිදු කරන ලදී.

1 මහජනතාවගේ බලවත් ඉල්ලීම හා එවැනි ව්‍යවහාර මුදල් නෝට්ටු හුවමාරු කර ගැනීමේදී ඔවුන් මුහුණ දුන් අපහසුතාවයන් සැලකිල්ලට ගනිමින් එවැනි ව්‍යවහාර මුදල් නෝට්ටු භාර ගැනීම සඳහා ලබා දී තිබූ කාලපරිච්ඡේදය 2018.03.31 දක්වා දීර්ඝ කරන ලදී.

බලපත්‍රලාභී වාණිජ බැංකු අතර කාර්යක්ෂම සහ ඵලදායී ලෙස මුදල් කළමනාකරණය හා මෙහෙයුම් වර්ධනයට සහ ව්‍යවහාර මුදල් නෝට්ටුවල ඵලදායී ආයු කාලය වර්ධනයට හේතුවන මුදල් නෝට්ටු තේරීමේ හා මුදල් පරිහරණයේ ක්‍රියාපටිපාටීන් සම්බන්ධයෙන් පවතින ගැටලු හා බාධක පිළිබඳව සාකච්ඡා කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල මුදල් කළමනාකරුවන් සමඟ රැස්වීම් පවත්වන ලදී.

### 5.4 නීති ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට ලබා දුන් සහාය

ව්‍යවහාර මුදල් සම්බන්ධ නීති පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ව්‍යවහාර මුදල් ව්‍යාජ ලෙස ප්‍රතිනිර්මාණය කිරීම සම්බන්ධයෙන් නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහාය දීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව 2017 වර්ෂය තුළදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(අ) ව්‍යාජ මුදල් සැකසීමේ ප්‍රයත්නයන්ට අදාළව පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් විමර්ශන කාර්යාංශය හා නීති ක්‍රියාත්මක කරන බලධාරීන් සමඟ සමීපව කටයුතු කරන ලදී. 2017 වර්ෂය තුළදී හඳුනාගත් ව්‍යාජ මුදල් නෝට්ටු සංඛ්‍යාව 5,812 කි. 2017 වර්ෂයේදී ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියනයකට ඇති ව්‍යාජ මුදල් නෝට්ටු සංඛ්‍යාව ලෙස ගණනය කරනු ලබන ව්‍යාජ මුදල් නෝට්ටු අනුපාතය 5 ක් වේ.

(ආ) ව්‍යාජ මුදල් නෝට්ටු සකස් කිරීම් පිළිබඳව පැවති නඩු විභාගවලට අවශ්‍ය කටයුතු සඳහා අභියෝග කළ නොහැකි සාක්ෂියක් වශයෙන් මුදල් නීති පනතේ 59 වන වගන්තිය ප්‍රකාරව අදාළ අධිකරණ වෙත අධිපතිතුමාගේ අත්සන සහිත සහතික 138 ක් නිකුත් කරන ලදී.

(ඇ) ව්‍යාජ මුදල් සැකසීම පිළිබඳව අධිකරණ නඩු විභාගවල සාක්ෂි ලබාදීමට නඩු විභාග 10 කට සහභාගි විය.

### 5.5 මහජනතාව දැනුම්වත් කිරීම

ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලේ ඉතිහාසය, ආරක්ෂණ සලකුණු, මුදල් භාවිතයේ හොඳ පුරුදු හා කාසි ඵලදායී ලෙස භාවිතය පිළිබඳ මහජන අවබෝධය වැඩිදියුණු කිරීමේ අරමුණින් සාමාන්‍ය මහජනතාව, පොලිස් නිලධාරීන්, බලපත්‍රලාභී වාණිජ බැංකු, අනෙකුත් මූල්‍ය ආයතනවල නිලධාරීන්, ගුරුවරුන්, ශිෂ්‍යයන් සහ රාජ්‍ය නිලධාරීන් සඳහා මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදී.

(අ) සම්මන්ත්‍රණ/වැඩමුළු 32 ක් බැංකු විදු පියෙස, විවිධ බලපත්‍රලාභී බැංකුවල, පොලිස් ස්ථානයන් සහ ජාතික පාසල් තුළදී පවත්වන ලදී.

(ආ) රට පුරා පැවති ප්‍රදර්ශන 15 ක දී ජංගම මුදල් කෞතුකාගාරය ප්‍රදර්ශනය කරන ලදී.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් මුදල් කෞතුකාගාර තුන නැරඹීමට ප්‍රධාන වශයෙන් පැමිණි පාසල් සිසුන්, විදේශික සංචාරකයින් සහ සාමාන්‍ය මහජනතාව ඇතුළුව 8,760 ක පමණ පිරිසකට නැරඹීමේ පහසුකම් සැලසීම සහ පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය සහ ව්‍යාජ මුදල් නෝට්ටු නිෂ්පාදනය කිරීමේ අහිසි ප්‍රතිඵල සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීමේ අත්පත්‍රිකා හා තොරතුරු පත්‍රිකා බෙදා හරින ලදී.

(ඈ) ප්‍රධාන රූපවාහිනී නාලිකා සහ ගුවන් විදුලි නාලිකා හරහා සාකච්ඡා වැඩසටහන් 5 ක් පවත්වන ලදී.

### 5.6 ව්‍යවහාර මුදල් ප්‍රතිනිෂ්පාදනය කිරීම සඳහා අවසර ලබා දීම

2017 වර්ෂයේදී මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය කිරීමේ අවස්ථාවන් 9 ක් සඳහා එවැනි ප්‍රතිනිෂ්පාදනයන් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්තියට අනුකූලව අනුමැතිය ලබා දෙන ලදී.

### 5.7 මෙහෙයුම් පද්ධති වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ව්‍යවහාර මුදල් නෝට්ටුවල ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා මුද්‍රණ සමාගමේ නිෂ්පාදන ක්‍රියාවලිය අවසානයේදී සෑම ව්‍යවහාර මුදල් නෝට්ටුවක්ම පරීක්ෂා කිරීම තහවුරු කිරීමේ ක්‍රියාමාර්ග ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා ව්‍යවහාර මුදල් ඉල්ලුම් කිරීම හා නිකුත් කිරීම ස්වයංක්‍රියකරණයට පියවර කිහිපයක් ගෙන ඇත.

## 6. දේශීය මෙහෙයුම් කටයුතු

### 6.1 දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

මුදල් නීති පනත මගින් පැවරී ඇති විධිවිධාන අනුව දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට කාර්යයන් කිහිපයක් පැවරී ඇත. ඒවා නම්, (අ) විවෘත වෙළෙඳපළ කටයුතු පවත්වා ගෙන යාම (ආ) වාණිජ බැංකුවල සංචිත නියාමනය (ඇ) රජයට, රාජ්‍ය නියෝජිත ආයතන සහ රජය වෙනුවෙන් කටයුතු කරන අනෙකුත් ආයතන සඳහා බැංකුකරු සහ රාජ්‍ය තැන්පතු භාරය ලෙස ක්‍රියා කිරීම සහ බැංකුවල බැංකුකරු ලෙස කටයුතු කිරීම (ඈ) රජය සඳහා කෙටි කාලීන අත්තිකාරම් සැපයීම (ඉ) ඍජු වෙළඳුන් සහ ඍජු සහභාගිත්ව ආයතන සඳහා ගිණුම් පවත්වා ගෙන යාම (ඊ) සහභාගිත්ව ආයතන සහ වෙළඳුන් නොවන ඉල්ලුම්කරුවන් සඳහා එක් දින ණය ලබා දීම සහ (උ) අවශ්‍ය අවස්ථාවල දී බැංකු ආයතන සමඟ ණය කටයුතුවල යෙදීම.

### 6.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

කෙටිකාලීන පොලී අනුපාතික ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කරන මුදල් ප්‍රතිපත්තියට ගැලපෙන පරිදි පවත්වා ගෙන යාමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අපේක්ෂිත මට්ටමට ගෙන ඒමට දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති

උපකරණය ලෙස විවට වෙළෙඳ කටයුතු යොදා ගන්නා ලදී. මේ අතර නිත්‍ය පහසුකම් ද නොකඩවා සහභාගිත්ව ආයතන වෙත ලබා දෙන ලදී.

පෙර වසර අවසානයේ සිට, මූලික වශයෙන් රජය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගන්නා ලද ශුද්ධ ණය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස වසරේ මුල් භාගයේ දී ඉහළ මට්ටමක පැවති අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාවය ඉන් අනතුරුව පහළ ගිය අතර, පෙබරවාරි මස මැද සිට ජූලි මස අග තෙක් මෙම ද්‍රවශීලතා මට්ටම අතිරික්තයන් හා හිඟයන් අතර උච්ඡාවචනය විය. කෙසේ වෙතත්, මෙම තත්ත්වය ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජූලි මස මැද භාගයේ සිට දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළින් විදේශ විනිමය මිලදී ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනස් වූ අතර, මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව වසරේ අග දක්වා නොකඩවා ඉහළ යන ලදී.

මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවයෙහි අතිරික්තයක් පවතින විට මෙම අතිරික්ත ද්‍රවශීලතාව කෙටිකාලීන හා දිගු කාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි හරහා තාවකාලික පදනමින් ද භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනම මත විකිණීම හරහා ස්ථිර පදනමින් ද අවශෝෂණය කරන ලදී. නිත්‍ය ණය පහසුකම් ලබා දීමට අමතරව, ද්‍රවශීලතා හිඟයක් පවත්නා අවස්ථාවල දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම හරහා ද්‍රවශීලතාව පවත්වා ගෙන යාමට කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය විවට වෙළෙඳ කටයුතු සඳහා ප්‍රමාණවත් නොවූ හෙයින් ප්‍රතිමිලදිගැනුම් වෙන්දේසි ගනුදෙනු සඳහා සුරැකුම් වශයෙන් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සේවක අර්ථසාධක අරමුදලින් භාණ්ඩාගාර බැඳුම්කර ණයට ගැනීම සඳහා වූ බැඳුම්කර ණයට ගැනීමේ වැඩසටහන 2017 නොවැම්බර් මස යළි ආරම්භ කරන ලදී.

මුදල් වෙළෙඳපොළෙහි සිදුවන ගනුදෙනු පිළිබඳව තත්කාලීන නිරවද්‍ය තොරතුරු සඳහා ප්‍රවේශ වීමට ඇති හැකියාව මුදල් වෙළෙඳපොළෙහි මිල ගවේශන ක්‍රියාවලිය සඳහා ඉතා වැදගත් වේ. බලයලත් මුදල් තැරැව්කරුවන් සිදු කරන ගනුදෙනු වාර්තා කිරීම සඳහා දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේ දී මංගත පද්ධතියක් හඳුන්වා දෙන ලදී. මෙම පද්ධතිය 2017 වසරේ දී තවදුරටත් වැඩි දියුණු කර මධ්‍ය ඒකාබද්ධ වෙළෙඳපොළ අධීක්ෂණ පද්ධතිය ලෙස හඳුන්වා දෙන ලදී. 2018 ජනවාරි මස සිට ක්‍රියාත්මක වූ මෙම මධ්‍ය ඒකාබද්ධ වෙළෙඳපොළ අධීක්ෂණ පද්ධතිය හරහා සියලුම සහභාගිත්ව ආයතන (බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළඳුන්) සහ බලයලත් මුදල් තැරැව්කරුවන් විසින් ඒක්ෂණ මුදල්, රාජ්‍ය සුරැකුම්පත් සහ විදේශ විනිමය වෙළෙඳපොළවල සිදු කරන ගනුදෙනු පිළිබඳ තොරතුරු වාර්තා කරනු ලබයි. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තම අපේක්ෂිත දෛනික ද්‍රවශීලතාව මධ්‍ය ඒකාබද්ධ වෙළෙඳපොළ අධීක්ෂණ පද්ධතිය හරහා වාර්තා කරයි. එතෙක් පැවති මුදල් තැරැව්කාර වාර්තා කිරීමේ පද්ධතිය, මුදල් වෙළෙඳපොළ අධීක්ෂණ පද්ධතිය, ද්‍රවශීලතා අධීක්ෂණ පද්ධතිය සහ විදේශ විනිමය පද්ධතිය වැනි වාර්තා කිරීමේ පද්ධති කිහිපයක් මධ්‍ය ඒකාබද්ධ වෙළෙඳපොළ අධීක්ෂණ පද්ධතිය විසින් ඒකාබද්ධ කරන ලදී. ඒක්ෂණ මුදල්, රාජ්‍ය සුරැකුම්පත් සහ විදේශ විනිමය වෙළෙඳපොළවල පවත්නා අත්‍යවශ්‍ය වෙළෙඳපොළ දත්ත මධ්‍ය ඒකාබද්ධ වෙළෙඳපොළ අධීක්ෂණ පද්ධතිය විසින් ග්‍රහණය කරනු ලබයි.

### 6.2.1 විවට වෙළෙඳ කටයුතු

(අ) ද්‍රවශීලතා පුරෝකථනය

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් වෙළෙඳපොළෙහි එදිනෙදා මැදිහත්වීම තීරණය කිරීම සඳහා දෛනිකව වෙළෙඳපොළ ද්‍රවශීලතාව පුරෝකථනය කරනු ලබයි. ද්‍රවශීලතා පුරෝකථනය සඳහා මුදල් ප්‍රතිපත්තිවලට අදාල ක්‍රියාමාර්ග සහ ස්වාධීන සාධක සැලකිල්ලට ගනු ලැබේ. සංසරණයේ පවතින මුදල්, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය ගනුදෙනු, වාණිජ බැංකුවල සංචිත තත්ත්වයන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව රජය සමඟ සිදු කරන ගනුදෙනු යනාදිය ස්වාධීන සාධක ගණයට ඇතුළත් වේ. මෙම දෛනික පුරෝකථන පාදක කර ගනිමින් 2017 වසරේ දී පහත සඳහන් විවට වෙළඳ කටයුතු සිදු කරන ලදී.

(ආ) වෙන්දේසි

(i) ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

2017 වසරේ දී මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව අතිරික්තයක්ව පැවති දිනයන්හි දෛනිකව ද්‍රවශීලතාව අවශෝෂණයකර ගැනීමට දෛනික ප්‍රතිමිලදිගැනුම් වෙන්දේසි දින 163 ක දී පවත්වන ලදී. මෙම වෙන්දේසිවල දී ඉදිරිපත් කළ සහ අවශෝෂණය කරන ලද ප්‍රමාණ පිළිවෙළින් රුපියල් බිලියන 4,284.5 සහ රුපියල් බිලියන 3,261.5 ක් විය. මෙම වෙන්දේසිවල බරිත සාමාන්‍ය එළඳා අනුපාතික සියයට 7.25 ක් සහ සියයට 7.75 පරාසය තුළ පැවතුණි.

එදිනම පියවීමේ පදනම මත සතියක් දක්වා කාලසීමාවකට ද්‍රවශීලතාව අවශෝෂණයකර ගැනීමේ උපායක් ලෙස කෙටිකාලීන වෙන්දේසි පවත්වනු ලැබේ. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 115.0 ක් පිරිනමමින් කෙටිකාලීන වෙන්දේසි 8 ක් පැවැත්වූ අතර, එයින් රුපියල් බිලියන 49.2 ක් පමණක් පිළිගත් අතර, ඒවායේ බරිත සාමාන්‍ය එළඳා අනුපාතික සියයට 7.31 සහ සියයට 7.43 ක පරාසය තුළ පැවතුණි. දින හතකට වඩා වැඩි කාලසීමාවකට ද්‍රවශීලතාව අවශෝෂණයකර ගැනීමට දිගුකාලීන ප්‍රතිමිලදිගැනුම් වෙන්දේසි පවත්වනු ලැබේ. 2017 ජනවාරි සහ සැප්තැම්බර් මාසවල දී දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි 11 ක් පැවැත්වූ අතර, එහි පිරිනමන ලද වටිනාකම රුපියල් බිලියන 225.0 ක් විය. වෙන්දේසි දෙකක දී පමණක් ලංසු පිළිගන්නා ලදී. එලෙස පිළිගන්නා ලද ලංසුවල වටිනාකම රුපියල් බිලියන 17.0 ක් විය. මෙම වෙන්දේසි දෙකෙහිම බරිත සාමාන්‍ය එළඳා අනුපාතිකය සියයට 7.44 ක් විය. මෙම දිගුකාලීන ප්‍රතිමිලදිගැනුම් වෙන්දේසිවල පරිණත කාලයන් දින 8 ත් 16 ත් අතර විය.

(ii) **ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

වෙළෙඳපොළ ද්‍රවශීලතා හිඟයක් පවතින අවස්ථාවල දී ද්‍රවශීලතාව වෙළෙඳපොළට මුදා හැරීම සඳහා දින 66 ක් පුරා එක් දින ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. මෙම වෙන්දේසිවල දී පිරිනමන ලද හා පිළිගන්නා ලද වටිනාකම පිළිවෙළින් රුපියල් බිලියන 1,292 ක් සහ රුපියල් බිලියන 1,050 කි. මෙම වෙන්දේසිවල බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 8.47 සහ සියයට 8.75 පරාසය තුළ පැවතුණි. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව 2017 වසර තුළ දී කෙටිකාලීන සහ දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි නොපවත්වන ලදී.

(ඇ) ස්ථිර පදනම මත වූ ගනුදෙනු

ස්ථිර පදනම මත අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණයකර ගැනීම සඳහා ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ වෙන්දේසි පවත්වන ලදී. 2017 වසරේ දී රුපියල් බිලියන 380 ක වටිනාකමින් යුක්ත භාණ්ඩාගාර බිල්පත් යොදා ගනිමින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ වෙන්දේසි 71 ක් පවත්වන ලදී. මෙම වෙන්දේසිවල දී අවශෝෂණය කර ගන්නා ලද ප්‍රමාණය රුපියල් බිලියන 110.3 ක් විය. මෙම වෙන්දේසිවල බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 7.78 සහ සියයට 9.23 ක පරාසය තුළ පැවතුණි. පවත්වන ලද වෙන්දේසි 20 කට ලංසු නොලැබුණු අතර, වෙන්දේසි 11 ක් ප්‍රතික්ෂේප විය. 2017 වසර තුළ දී දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමේ වෙන්දේසි කිසිවක් නොපවත්වන ලදී.

### 6.2.2 නිත්‍ය පහසුකම

අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළ සහ විවෘත වෙළඳ වෙන්දේසි හරහා තම කෙටිකාලීන ද්‍රවශීල අවශ්‍යතා සපුරා ගැනීමට අපොහොසත් වූ සහභාගිත්ව ආයතනවලට නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ නිත්‍ය පහසුකම් වසර පුරාම ලබා දෙන ලදී. 2017 වසරේ දී නිත්‍ය පහසුකම් අනුපාතිකයේ දෛනික සාමාන්‍ය රුපියල් බිලියන 16.4 ක් ලෙස වාර්තා වූ අතර, එහි සමස්ත වටිනාකම රුපියල් බිලියන 3,954.9 ක් විය. දෛනික සාමාන්‍ය වටිනාකම රුපියල් බිලියන 8.8 ක් වූ නිත්‍ය ණය පහසුකම යටතේ ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 2,129.5 ක් විය.

### 6.2.3 ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ විධිවිධානවලට අනුකූලව සෑම වාණිජ බැංකුවක් විසින්ම සිය මුළු රුපියල් තැන්පතු වගකීම්වලට අනුකූලව මහ බැංකුවෙහි පවත්වා ගෙන යන ජංගම ගිණුමේ අනිවාර්යයෙන් දිනපතා පවත්වා ගෙන යා යුතු අවම සංචිත ප්‍රමාණය, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය මගින් තීරණය කරනු ලබයි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයට අනුව ව්‍යවස්ථාපිත සංචිත පවත්වාගෙන යාම පාලනය කිරීම සහ වාණිජ බැංකු විසින් දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වගකීමකි. 2016 ජනවාරි මස 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 7.5 ක් ලෙස සංශෝධනය කරන ලද ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2017 වසර තුළ දී ද නොවෙනස්ව පැවතුණි.

### 6.2.4 බැංකු අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටිකාලීන අත්තිකාරම් මත වූ මහ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, මෙම පොලී අනුපාතිකය යටතේ වාණිජ බැංකුවලට මහ බැංකුවෙන් ණය ලබා ගැනීමේ අවශ්‍යතාවක් 2017 වසර තුළ දී ඇති නොවීය.

## 6.3 රජයේ සහ වාණිජ බැංකුවල බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය

### 6.3.1 මූල්‍ය ආයතනවල ගිණුම්

වාණිජ බැංකුවල බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය ඉටු කරමින් කාර්යක්ෂම අන්තර් බැංකු ගෙවීම් සහ පියවීම් පද්ධතියක් සහතික කරනු පිණිස දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකුවලට ජංගම ගිණුම් පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ විවෘත වෙළෙඳ කටයුතු සහ නිත්‍ය පහසුකම්වල පාර්ශවකරුවන් මෙන්ම තත්කාලීන දළ පියවුම් පද්ධතියේ සහභාගිත්ව ආයතන වන ප්‍රාථමික වෙළඳුන්හට ජංගම ගිණුම් පහසුකම් සහ ඊට අදාළ අනෙකුත් පහසුකම් සැපයීම ද දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලද අතර, මෙම කාර්යයන් රටේ ගෙවීම් සහ පියවීම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා ඉවහල් විය. 2017 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු 25 ක් සහ ප්‍රාථමික වෙළඳුන් 8 ක් වෙනුවෙන් ගිණුම් පවත්වා ගෙන යන ලද අතර, එම ගිණුම් තත්කාලීන දළ පියවීම් පදනම මත ක්‍රියාත්මක විය.

### 6.3.2 රජයේ ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය ඉටු කරමින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් රජයේ දෙපාර්තමේන්තු, නියෝජිත ආයතන සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා ගිණුම් පවත්වාගෙන යාම අඛණ්ඩව සිදු කරන ලද අතර, එම ගිණුම් හිමියන්ට අවශ්‍ය බැංකු පහසුකම් සැපයීම ද සිදු කරන ලදී. 2017 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව පවත්වා ගෙන යන ලද එවැනි ගිණුම් සංඛ්‍යාව 61 ක් විය. ඒ අනුව, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව රජය වෙනුවෙන් රුපියල් බිලියන 15,767.4 ක් වටිනා ගනුදෙනු 20,114 ක් සිදු කරන ලදී. එම ගනුදෙනු සංඛ්‍යාවෙන් සියයට 90 කට වැඩි ප්‍රතිශතයක් නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ගිණුම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුම, දේශීය ආදායම් කොමසාරිස්ගේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ගිණුම සහ ජනාධිපති අරමුදල් ගිණුම යන ගිණුම්වලට අයත් විය.

මුදල් නීති පනතේ 89 වැනි වගන්තිය ප්‍රකාරව යම් මුදල් වර්ෂයක් සඳහා රජයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 10 උපරිමයකට යටත්ව මහ බැංකුව විසින් රජයට පොලී රහිත තාවකාලික අත්තිකාරම් ලබා දීමට කටයුතු කරනු ලැබේ. 2016 වසරේ දී රජයට ලබා දුන් තාවකාලික අත්තිකාරම් මුදල වූ රුපියල් බිලියන 185.1 සමග සැසඳීමේ දී 2017 වසර ආරම්භයේ දී රජයට ලබා දුන් තාවකාලික අත්තිකාරම් මුදල් රුපියල් බිලියන 203.9 දක්වා රුපියල් බිලියන 18.8 කින් වැඩි විය.

### 6.4 එක් දින ද්‍රවශීලතා පහසුකම් සැපයීම

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතනවලට එක් දින ද්‍රවශීලතා පහසුකම් හරහා දෛනික අරමුදල් සැපයීම තුළින් තත්කාලීන දළ මෙහෙයුම් පද්ධතිය තුළ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අඛණ්ඩව සහාය දෙන ලදී. භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් මෙම පහසුකම් සැපයීම, ගාස්තුවකින් තොරව සිදු කරන අතර, සුරැකුම්පත්වල වර්තමාන මිල ගණන් අනුව මිල උච්චාවචන ආවරණය කර ගත හැකි පරිදි ප්‍රමාණවත් ගැලපීමක් එහිදී සිදු කරනු ලැබේ. වසර තුල දී එක් දින ද්‍රවශීලතා පහසුකම් යටතේ ලබා දුන් සමස්ත වටිනාකම රුපියල් බිලියන 11,428 ක් වූ අතර, එහි දෛනික සාමාන්‍ය රුපියල් බිලියන 47.4 කි. මෙය පෙර වසරේ පැවති සමස්ත වටිනාකම වූ රුපියල් බිලියන 9,351 සහ දෛනික සාමාන්‍ය වූ රුපියල් බිලියන 38.8 සාපේක්ෂව 2017 වසර තුළ දෛනික ද්‍රවශීලතා පහසුකම භාවිත කිරීමේ වර්ධනයක් දැකිය හැකි වේ.

### 6.5 බලයලත් මුදල් තැරැව්කරුවන් අධීක්ෂණය

මුදල්, විදේශ විනිමය සහ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ මිල ගවේෂණ ක්‍රියාවලියේ දී මුදල් තැරැව්කරුවන්ගේ කාර්යයෙහි වැදගත්කම සලකා බලමින් 2016 අංක 1 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි ලෙස සංශෝධනය වූ 2013 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි අවලංගු කරමින් මුදල් තැරැව්කරණ පහසුකම් වඩා කාර්යක්ෂමව සැලසීමට හා මුදල් තැරැව්කරුවන්ට මග පෙන්වීම සඳහා 2018 මාර්තු 05 දින සිට බලපැවැත්වෙන පරිදි 2018 අංක 1 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි නිකුත් කරන ලදී. 2018 මාර්තු මස අග වනවිට, මුදල් තැරැව්කරුවන්ගේ සමාගම් 9 ක් සඳහා "බලය පැවරීමේ සහතික" මෙම රෙගුලාසි අනුව නිකුත් කරන ලද අතර, එම සමාගම් "බලයලත් මුදල් තැරැව්කරුවෝ" ලෙස නම් කර ඇත.

බලයලත් මුදල් තැරැව්කාර සමාගම් 8 ක එතැන් පරීක්ෂණ පවත්වන ලද අතර, එම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ රැස්වීම් 10 ක් පවත්වන ලදී. 2017 දී මුදල් තැරැව්කරණ රෙගුලාසි උල්ලංඝණය කරන ලද බලයලත් මුදල් තැරැව්කාර ආයතනයකට එරෙහිව දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් නීතිමය ක්‍රියාමාර්ගයන් ගන්නා ලද අතර, 2017 වසර තුළ බලයලත් මුදල් තැරැව්කාර ආයතන සංඛ්‍යාව නොවෙනස්ව පැවතුණි.

**මුදල් තැරැව්කාර සමාගම් ලැයිස්තුව**

1. බාට්ලීට් මැක්ලේයි ඇන්ඩ් රෝයි (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ඉස්ට් එලායන්ස් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
3. ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
4. එම් වී එස් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
5. සෙන්ට්‍රල් ෆොරෙක්ස් ඇන්ඩ් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
6. පිගට් චැප්මන් ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
7. එස් එම් බී මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
8. තැප්‍රොබේන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
9. විෂ්වින් මනි ඇන්ඩ් එක්ස්චේන්ජ් බ්‍රෝකර්ස් ලිමිටඩ්

## 7. ආර්ථික පර්යේෂණ

1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපනය කිරීම හා සමගාමීව 1950 වසරේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ "ආර්ථික බුද්ධි මණ්ඩලය" වශයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වන්නේ මුදල් මණ්ඩලයට සහ අධිපතිවරයාට ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී වීමේ අරමුණින් සහ මුදල් හා බැංකු ක්ෂේත්‍රය පිළිබඳව සහ අනෙකුත් වැදගත් ආර්ථික විෂයයන් පිළිබඳ තොරතුරු මහජනතාවට ලබාදීමේ අරමුණින් දත්ත සකස් කිරීම සහ ආර්ථික පර්යේෂණ සිදු කිරීමයි. 2017 වසරේදී, ආර්ථික හා මිල ස්ථායීතාව සහ විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වාගෙන යෑමේ අරමුණ ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිය ප්‍රධාන කාර්යභාරය ඉටු කරන ලදී. තවද, රජයේ ආර්ථික උපදේශක ලෙස මහ බැංකුව කටයුතු කිරීමේදී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආර්ථිකයේ උද්ගත වන ගැටලු සහ සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීමට අවශ්‍ය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සම්බන්ධ නිර්දේශ සහ ප්‍රතිපත්ති උපදෙස් අඛණ්ඩව සපයන ලද අතර, රජය විසින් දැනටමත් ක්‍රියාවට නංවා ඇති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලින් ඇතිවන බලපෑම විශ්ලේෂණය කිරීමට කටයුතු කරන ලදී. තවද, ඵලදායී ප්‍රතිපත්ති සැකසීම සඳහා අවශ්‍ය කරනු ලබන, ප්‍රතිපත්ති මූලික කරගත් ආර්ථික පර්යේෂණ සිදු කිරීම සහ වාර්ෂික වාර්තාව හා අනෙකුත් වාර්තා ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතා ඉටු කිරීමද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, මහ බැංකුව විසින් මහජනතාව ඇතුළු ආර්ථිකයේ සියලු පාර්ශ්වකරුවන් වෙත දත්ත සහ තොරතුරු බෙදා හැරීමද, රජය වෙනුවෙන් ජාත්‍යන්තර සංවිධාන සමඟ සමීප සබඳතා පැවැත්වීමද අඛණ්ඩව සිදු කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තුළ ආර්ථික හා සමාජ යටිතල පහසුකම් අංශය, කෘෂිකාර්මික අංශය සහ කර්මාන්ත අංශය යන අංශ තුන ඒකාබද්ධ කර "මූර්ත අංශය" ස්ථාපනය කරමින් 2017 වසරේ දී දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කරන ලදී. දෙපාර්තමේන්තුව මෙසේ වඩාත් හොඳින් ව්‍යුහගත

කිරීම තුළින් වසර තුළ දී විශ්ලේෂණයන්හි ගුණාත්මකභාවය සහ ගැඹුරුබව වර්ධනය කර ගැනීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණු අතර, කාර්ය මණ්ඩලයේ ශක්‍යතා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කර ගැනීමටද හැකි විය.

## 7.1 ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීම

තිරසාර වර්ධනයක් සඳහා හේතුවන වටපිටාවක් සැකසීම සහ රටෙහි මහජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා වූ මූලික අවශ්‍යතාවක් වන ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වාගෙන යැමට මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීම සඳහා මහ බැංකුවට පහසුකම් සලසන අතරතුර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය අවස්ථාවලදී දූරදර්ශී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමට දායක වීම සඳහා දේශීය හා විදේශීය සාර්ව ආර්ථික වර්ධනයන් සමීපව අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් මණ්ඩලය වෙත දූරදර්ශී ප්‍රතිපත්ති උපදෙස් ලබා දීමට මුදල් ප්‍රතිපත්ති කමිටුවට හැකි වන පරිදි, මුදල් ප්‍රතිපත්ති කමිටුවෙහි ලේකම් වශයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආකෘති පදනම් කරගත් සාර්ව ආර්ථික පුරෝකථන, සාර්ව ආර්ථික සංඛ්‍යාන සහ ඇස්තමේන්තු අධීක්ෂණය සමඟ සිය විශේෂඥ මතයද කැටි කරමින් ආර්ථික හා මුදල් තත්ත්වයන් පිළිබඳව පරිපූර්ණ ඉදිරි දැක්මක් සහිත විශ්ලේෂණ සපයන ලදී. වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතික ක්‍රමයක් තුළ, මූර්ත අංශයේ ස්ථායීතාව සඳහා දායක වන අතරතුර මැදිකාලීන ඉලක්ක සහිතව මිල ස්ථායීතාව ආරක්ෂා කිරීම පිණිස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් වෙත නැඹුරු වීම තුළින් මුදල් ප්‍රතිපත්තිය පවත්වාගෙන යැම ශක්තිමත් කෙරෙනු ලබන බව මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කෙරුණු "2017 වසර සහ ඉන් ඉදිරිය සඳහා වන මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති" නම් වූ වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව අධිපතිවරයාට තම සහයෝගය ලබා දුනි. මේ සමඟ 2017 ජූනි මාසයේ සිට මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම්වලදී, මැදි කාලීන ආකෘති මත පදනම් වූ පුරෝකථන යොදා ගනිමින් ඉදිරි දැක්මක් සහිත ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ මැදිකාලීන දැක්මක් මුදල් ප්‍රතිපත්තිය සැකසීම සඳහා යොදා ගැනීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව කටයුතු කළේය. මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා අන්තර් දෙපාර්තමේන්තු සහ කාර්ය මණ්ඩලීය මට්ටමින් වන පූර්ව මුදල් ප්‍රතිපත්ති කමිටු සාකච්ඡා කිහිපයක්ද හඳුන්වා දෙන ලදී. මේ අතර, වඩාත් ගැඹුරු ආර්ථික විශ්ලේෂණ සිදු කිරීමට සහ මුදල් ප්‍රතිපත්ති කමිටුවට හා මුදල් මණ්ඩලයට, අවශ්‍ය තොරතුරු හා විශ්ලේෂණ වඩාත් ගැඹුරින් ඉදිරිපත් කිරීම සඳහා කාර්ය මණ්ඩලයට වැඩි කාල වේලාවක් ලබා දීමට වසරකට පැවැත්වෙන මුදල් ප්‍රතිපත්ති කමිටු ගණන 12 සිට 8 දක්වා අඩු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවට නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයක් සඳහා ක්‍රමානුකූලව සූදානම් වීම පිණිස මෙම වෙනස්කම් දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පාර්ශ්වකරුවන්ගේ අදහස් ලබා ගැනීමට සහ මහ බැංකුවට හා පාර්ශ්වකරුවන්ට අන්‍යෝන්‍ය ලෙස වැඩදායී වන පරිදි ප්‍රතිපත්ති සැකසීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් ලේකම් ලෙස කටයුතු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුව ප්‍රතිස්ථාපනය කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) වෙත ඉදිරිපත් කරනු ලබන මුදල් සංඛ්‍යාන ජා.මූ. අරමුදලේ මුදල් සහ මූල්‍ය සංඛ්‍යාන අත්පොත 2016 (IMF Manual on Monetary and Financial Statistcs - 2016) මත පදනම්ව සකස් කරන ලදී.

විවිධ අනු ආකෘතිවලින් සමන්විත වූ මැදි කාලීන පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය (FPAS) ආකෘතිය මත පදනම්ව මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම ශක්තිමත් කිරීම පිණිස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජා.මූ. අරමුදලේ තාක්ෂණික සහාය හා උපදේශන මත තවදුරටත් කටයුතු කරන ලදී. මීට අමතරව 2020 දී නම්‍යශීලී උද්ධමන ඉලක්කරණ රාමුවක් වෙත යොමු වීම පිණිස වූ පරිපූර්ණ පෙරදැක්මක් සකස් කිරීම සඳහා අවශ්‍ය මුදල් හා විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම පිණිස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ජා.මූ. අරමුදලේ තාක්ෂණික කණ්ඩායමක් සමඟ කටයුතු කළේය.

## 7.2 විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම

ආර්ථිකයෙහි විදේශීය අංශයෙහි ස්ථායීතාව පවත්වා ගැනීමට සහාය වීම පිණිස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දේශීය හා ගෝලීය ආර්ථිකයේ වෙනස්වීම් පිළිබඳව පුළුල් ඇගයීම් සිදු කරමින් සුදුසු ප්‍රතිපත්ති නිර්දේශ ලබා දීම සිදු කරන ලදී. ජාත්‍යන්තර වෙළඳාම හා මූල්‍ය හා සම්බන්ධ විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත මෙන්ම නාමික හා මූර්ත විනිමය අනුපාතික විචලනයන් මත පදනම් වූ විදේශීය අංශයෙහි වර්ධනයන් විශ්ලේෂණය කොට, සුදුසු ප්‍රතිපත්තිමය තීරණ ගැනීම උදෙසා මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලදී. විනිමය අනුපාතිකය සහ දළ නිල සංචිත මත ඇති විය හැකි බලපෑම් හඳුනා ගැනීම සඳහා වෙළඳපොළ වෙනස්වීම් අධීක්ෂණය කරමින්, මුදල් නීති පනතෙහි විධිවිධානවලට අනුව, රජය විසින් විදේශීය ණය ගැනීමේදී ඉන් මුදල් ප්‍රතිපත්තියට ඇති වන බලපෑම ඇගයීම ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

තවද, ජා.මූ. අරමුදල විසින් ලබා දුන් වි.ගැ.හි. බිලියන 1.1 (දළ වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5) ක් වටිනා තුන් අවුරුදු විස්තීර්ණ ණය පහසුකම යටතේ එකඟ වූ ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක, මූලික ඉලක්ක සහ ව්‍යුහාත්මක මිනුම්දඬුවල ප්‍රගතිය අඛණ්ඩව අධීක්ෂණය කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මූලික වූ අතර, ඒ සම්බන්ධයෙන් නිරන්තරයෙන් තොරතුරු ඉදිරිපත් කරමින් තීරණ ගැනීම පහසු කිරීම උදෙසා මහ බැංකුවේ ඉහළ කළමනාකාරිත්වය දැනුම්වත් කරන ලදී. ඒ අනුව, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සම්බන්ධීකරණය කිරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කරමින්, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අදාළ අමාත්‍යාංශවල ද සහයෝගය ඇතිව, වැඩසටහන් ඉලක්ක සහ කාර්යසාධනය සම්බන්ධයෙන් සාකච්ඡාවල ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකාරීව නියැළුණි.

ජාත්‍යන්තරව පිළිගත් දත්ත වාර්තා කිරීමේ ප්‍රමිතීන්ට අනුගත වීම සඳහා විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත සම්පාදනය සහ ප්‍රකාශනය වැඩිදියුණු කිරීම උදෙසා මෙම වසරේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. ඒ අනුව, සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ (Standard International Trade Classification) 4 වන සංශෝධනයට අනුව භාණ්ඩ වෙළඳාම පිළිබඳව වූ සංඛ්‍යා දත්ත සම්පාදනය කරන ලද අතර, 2017 වසරේ වාර්ෂික වාර්තාව තුළ නව වර්ගීකරණය යටතේ වූ දත්ත, පවත්නා වර්ගීකරණය මත පදනම් වූ දත්ත ද සමග ප්‍රකාශයට පත් කොට ඇත. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙවුම් තුලන අත්පොතෙහි හය වෙනි සංස්කරණයට අනුව (BPM6) කාර්තුමය පදනම මත ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත හා ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය පිළිබඳ සංඛ්‍යා දත්ත ද, මාසික පදනම මත වන ජාත්‍යන්තර සංචිත දත්ත සටහන ද ප්‍රකාශයට පත් කළ අතර, කාර්තුමය විදේශීය ණය පිළිබඳ සංඛ්‍යා දත්ත ලෝක බැංකුව වෙත ද, වාර්ෂික පදනම මත සෘජු ආයෝජන දත්ත විදේශීය ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණය (CDIS) වෙත ද නිසි කලට ඉදිරිපත් කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජා.මූ. අරමුදලේ විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයන්ට (SDDS) අදාළ පූර්ව නිවේදිත දින දර්ශනයකට අනුව දත්ත ප්‍රකාශයට පත් කරන ලදී. තවදුරටත්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දත්තවල නිරවද්‍යතාව සහ කාලීන බව සහතික කිරීම උදෙසා, සමීක්ෂණ කිහිපයක් සිදු කරන ලදී. මෙම සමීක්ෂණවලට පෞද්ගලික අංශයේ විදේශීය වත්කම් සහ වගකීම් පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම සඳහා ක්‍රියාත්මක වන වාර්ෂික අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිළිබඳව වූ සමීක්ෂණය සහ තොරතුරු තාක්ෂණය, ප්‍රවාහන, විදුලි සංදේශ, ඉදිකිරීම් සහ රක්ෂණ යනාදී කර්මාන්ත රැසක් ආවරණය කිරීම සඳහා වූ සේවා වෙළඳාම සම්බන්ධයෙන් වූ සමීක්ෂණ ඇතුළත් වේ. තවද, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සම්බන්ධයෙන් වාණිජ බැංකු සමග එක්ව සිදු කරන මාසික සමීක්ෂණයද වර්ෂය තුළදී අඛණ්ඩව සිදු කරන ලදී.

## 7.3 දූරදර්ශී ප්‍රතිපත්තිමය උපදේශන ලබා දීම

2017 වසර තුළදී ද ප්‍රධාන වශයෙන් මුදල් ප්‍රතිපත්තිය, විනිමය අනුපාතික ප්‍රතිපත්තිය, ආර්ථික වර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය අංශයට අදාළ ගැටලු සම්බන්ධව ඉදිරි කාලීන දැක්මකින් යුතු ප්‍රතිපත්තිමය උපදෙස්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ ඉහළ කළමනාකාරිත්වය, රජය සහ පාර්ශවකරුවන් වෙත අඛණ්ඩව ලබා දෙන ලදී. මුදල් නීති පනතේ අංක 116 (1) වගන්තිය ප්‍රකාරව වසරේ පළමු භාගයට අදාළව ආර්ථිකයේ සිදු වූ වර්ධනයන් සාකච්ඡා කරන රහස්‍ය වාර්තාවක් වන "සැප්තැම්බර් 15 වාර්තාව" ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව තුළ 2018 වසර සඳහා රාජ්‍ය අයවැය ලේඛනය සකස් කිරීම සඳහා උපකාරී වන ප්‍රතිපත්තිමය යෝජනා අන්තර්ගත විය. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් නීති පනතේ විවිධ වගන්තිවල සඳහන් කර ඇති පරිදි, ප්‍රතිපත්තිමය ඇගයීම් සහ උපදෙස් ඇතුළත් වාර්තා ද මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, රජයේ "දැක්ම 2025" නමැති ප්‍රතිපත්තිමය ලේඛනය සකස් කිරීමේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ අතර, ජාතික ආර්ථික කවුන්සිලය සහ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත තාක්ෂණික උපදෙස් ලබා දෙන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් වසර තුළදී ජාතික වෙළඳ ප්‍රතිපත්තිය සහ ජාතික අපනයන උපායමාර්ග වැනි ප්‍රතිපත්තිමය ලේඛන ගණනාවකට සහ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවල ඇතුළත් සාර්ව ආර්ථික කරුණු සම්බන්ධයෙන් ස්වාධීන නිරීක්ෂණ ලබා දෙන ලදී.

මුදල් ප්‍රතිපත්ති කමිටුව, වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, මූල්‍ය අංශ ස්ථායිතා කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කමිටුව, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා වූ ටෙන්ඩර් මණ්ඩලය, ආයෝජන කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව සහ පුහුණු කටයුතු කමිටුව යන කමිටුවල සාමාජිකයෙකු වශයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කටයුතු කළේය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන ලද මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් සඳහා දායක වීමට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, ආයෝජන කමිටුව, ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කමිටුව, මහ බැංකු ප්‍රාග්ධනය සම්බන්ධ විචක්ෂණ මට්ටම තීරණය කිරීමේ කමිටුව, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම උදෙසා වූ කමිටුව, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය සඳහා වූ ප්‍රතිපත්ති පෙරදැක්ම ක්‍රියාත්මක කිරීමේ නියාමන කමිටුව, පුස්තකාල උපදේශාත්මක කමිටුව හා පර්යේෂණ ප්‍රකාශන කමිටුව, පුරෝකථනය කිරීමේ හා ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීමේ පද්ධතිය හා සම්බන්ධ කමිටුව සහ ෆින්නෙට් (FINNET) පද්ධතිය නව්‍යකරණය කිරීම සඳහා ද සිය දායකත්වය ලබා දෙනු ලැබීය.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීහු බාහිර ආයතනවල කමිටු සහ මණ්ඩලවල සාමාජිකයන් ලෙස කටයුතු කරමින් ප්‍රතිපත්තිමය වශයෙන් උපදෙස් ලබා දීමට අඛණ්ඩව කටයුතු කළහ. මෙම නියෝජනයන්ට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීම් ආයතනය, ජාතික විද්‍යා පදනම, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලය යනාදිය හා සම්බන්ධ කමිටු සහ මණ්ඩල අදාළ වේ. මීට අමතරව, කෙරවලපිටියේ විදුලි බලාගාරයක් තැනීමේ ව්‍යාපෘතිය හා සම්බන්ධ තාක්ෂණික ඇගයුම් කමිටු, එලිෆන්ට්පාස් ලුණු ලේවා සමාගම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති කමිටුව, පරන්තන් රසායනික සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම, ලංකා ඛනිජ වැලි සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම, ජාතික අපනයන උපායමාර්ග පිළිබඳ තාක්ෂණික කමිටුව, පවුල් අයවැය ඒකක සහ අනෙකුත් ජාතික මට්ටමේ කමිටු වන ජාත්‍යන්තර වෙළඳාම සඳහා

පහසුකම් සැලසීමේ කමිටුව සහ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යා දත්ත සම්බන්ධීකරණය කිරීමේ කමිටුව යනාදී කමිටුවලට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වසර තුළදී සිය දායකත්වය ලබා දෙන ලදී.

### 7.4 ව්‍යවස්ථාපිත ප්‍රකාශන සහ දත්ත හා තොරතුරු බෙදාහැරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත ප්‍රකාශන නිකුත් කිරීම සහ දත්ත හා තොරතුරු කාලෝචිත හා නිවැරදි ආකාරයකින් බෙදාහැරීමේ වගකීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සතු වේ. ඒ අනුව, අනෙකුත් දෙපාර්තමේන්තුවල දායකත්වය ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව ප්‍රධාන ප්‍රකාශන දෙකක් සම්පාදනය කර ප්‍රකාශයට පත් කරනු ලබයි. මුදල් නීති පනතේ 35 වන වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව, 2016 වාර්ෂික වාර්තාව නියමිත කාල වකවානුව තුළදී භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කරන ලදී. 2016 වාර්ෂික වාර්තාව, සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණ, ගෝලීය ආර්ථික පරිසරය, මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව සහ වසර තුළදී ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි ගැටලු හා අභියෝග සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය පියවර සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු, මුදල් මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ප්‍රධාන පරිපාලන විධිවිධාන සහ මහ බැංකු කටයුතුවලට අදාළව සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත් සහ සංඛ්‍යාලේඛන පරිශිෂ්ට පිළිබඳ තොරතුරු සපයයි. මීට අමතරව, 2017 වසරේ සාර්ව ආර්ථික තත්ත්වයන් පිළිබඳව මැදි වසර විශ්ලේෂණයක් සහ 2018 වසර සඳහා ඇස්තමේන්තුවක් ලබා දෙමින් "මෑතකාලීන ආර්ථික ප්‍රවණතා: 2017 සුවිශේෂී සිදුවීම් සහ 2018 අපේක්ෂාවන්" 2017 නොවැම්බර් මාසයේදී භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කෙරුණි. 2018 වසරේ ජනවාරි 03 වන දින නිවේදනය කරන ලද "2018 වසර හා ඉදිරිය සඳහා මුදල් හා මූල්‍ය අංශය සඳහා වූ ප්‍රතිපත්ති පෙරදැක්ම" අනෙකුත් දෙපාර්තමේන්තුවල දායකත්වය සහිතව 2017 දෙසැම්බර් මාසයේදී පිළියෙල කිරීම සඳහා අඛණ්ඩව 11 වන වසරටද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අධිපතිවරයාට සහාය විය. පාර්ශ්වකරුවන්ට වඩා නිශ්චිතව ඔවුන්ගේ උපායමාර්ග සැලසුම් කිරීම සඳහා උපකාරී වන ශ්‍රී ලංකා මහ බැංකුවේ අනාගත ප්‍රතිපත්තිය මඟපෙන්වීම සහ ක්‍රියාකාරිත්වය විනිවිදභාවයකින් සහ පැහැදිලිතාවයකින් යුතුව ලබා දෙමින් ප්‍රතිපත්ති පෙරදැක්ම ප්‍රකාශයට පත් කරන ලදී.

ආර්ථිකයේ විවිධ පාර්ශ්වකරුවන්ට ආර්ථිකමය තොරතුරු සැපයීම සඳහා ආර්ථික දත්ත හා තොරතුරු බෙදා හැරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරෙන ප්‍රධාන වගකීමකි. ඒ අනුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දෛනික, සති, මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනමින් ආර්ථිකයේ සියලු අංශවල මෙන්ම අනෙකුත් ආර්ථික හා මූල්‍ය දර්ශකයන්ගේ දත්තයන් ඇතුළත් මාසික සංඛ්‍යා ලේඛන ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත. වැදගත් ආර්ථික සහ මූල්‍ය සංඛ්‍යාන පිළිබඳ දෘශ්‍ය නිරූපණයක් ලබා දෙන සාර්ව ආර්ථික ප්‍රස්තාර භාෂාත්‍රයෙන්ම ප්‍රකාශයට පත් කරමින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් වසර තුළ මාසික හා සතිපතා ආර්ථික දර්ශක සඳහාද දත්ත සපයන ලදී. මීට අමතරව, මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම්වල විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව වන පුවත්පත් නිවේදනයන් සහ ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ප්‍රවණතා පිළිබඳව සන්නිවේදනය කිරීමේ අදහසින් විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව වන පුවත්පත් නිවේදන කාලෝචිත ආකාරයකින් නිකුත් කරන ලදී. තවද, පොදු මහජනතාවගේ අවධානයට ලක් වූ ආර්ථිකයේ විවිධ ප්‍රවණතා පිළිබඳව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් නිවේදන නිකුත් කරන ලදී.

### 7.5 ප්‍රතිපත්තිමය පර්යේෂණවල නිරත වීම සහ දැනුම බෙදාහැරීම

මුදල් ප්‍රතිපත්ති කමිටුවට හා මුදල් මණ්ඩලයට දූරදර්ශී මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගෙන, කාලීන වැදගත්කමකින් යුත් ආර්ථික ගැටලු නිරාකරණය සඳහා ප්‍රතිපත්තිමය පර්යේෂණ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, ප්‍රධාන සාර්ව ආර්ථික අංශවල මෙන්ම ප්‍රාග්ධන හා මූල්‍ය වෙළඳපොළ වර්ධනයන් සහ ගැටලු ඇතුළත් දේශීය හා ගෝලීය ආර්ථිකයේ තත්ත්වය පිළිබඳ අඛණ්ඩ යාවත්කාලීන කිරීම් පිළිබඳව වූ තොරතුරු දැනුම්දීමේ මුදල් මණ්ඩල පත්‍රිකා, මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ මුදල් මණ්ඩල පත්‍රිකා, නිරීක්ෂණ හා වාර්තා කිරීම් ස්වරූපයෙන් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් පිහිටු වනු ලැබූ කමිටුවක් වන "පර්යේෂණ උපදේශක මණ්ඩලය" විසින් පර්යේෂණ කටයුතු සම්බන්ධ කාර්යයන් සහ දැනුම හුවමාරු කර ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා මඟපෙන්වීම වසර පුරාම අඛණ්ඩව සිදු කරන ලදී. වසර තුළදී බැංකු විද්‍යා පීඨය සමඟ සහයෝගිත්වයෙන් පර්යේෂණ උපදේශක මණ්ඩලය විසින් ආරම්භ කරන ලද පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටිකාලීන පාඨමාලාවක් වන "ආර්ථික විද්‍යාව පිළිබඳ පර්යේෂණ" පාඨමාලාව, පර්යේෂණ උපදේශක මණ්ඩල සාමාජිකයන්ගේ සම්පත් දායකත්වයෙන් යුතුව බැංකු විද්‍යා පීඨයෙහි දී පවත්වන ලදී. පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳව වටිනා අවබෝධයක් ලබා දෙමින්, මහ බැංකුව සහ අනෙකුත් අධ්‍යයන ආයතනවල සහභාගිවන්නන්ගේ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා මෙම පාඨමාලාව නිර්මාණය කර ඇත. වසර තුළදී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් කරනු ලැබූ පර්යේෂණ ලිපි 6 කින් සමන්විත වන පරිදි සකස් කරන ලද මහ බැංකුවේ පර්යේෂණ සඟරාව වන "මාණ්ඩලික පත්‍රිකා" වෙළුම් අංක 46 හි 2016 අංක 1 හා 2 සහ වෙළුම් අංක 47 හි 2017 අංක 1 ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මීට අමතරව, ආර්ථික ක්ෂේත්‍රයෙහි පැන නැගී ඇති ගැටලු පිළිබඳව දැනුම වැඩිදියුණු කිරීම හා හුවමාරු කිරීමේ අරමුණ ඇතිව දෙපාර්තමේන්තුව තුළ සම්මන්ත්‍රණ ගණනාවක් පවත්වන ලදී. තවද, වසර තුළදී විවිධ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපනික ආයතන වෙතින් දෙපාර්තමේන්තුව වෙත පැමිණි ආධුනික පුහුණුවන්නන්ගෙන් සමන්විත කණ්ඩායම් සඳහා

මහ බැංකුකරණයේ ප්‍රායෝගික අංශ පිළිබඳව ඔවුන්ගේ දැනුම වර්ධනය කරමින් අධ්‍යාපනික දැනුම ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී.

2017 දෙසැම්බර් මාසයේදී පර්යේෂණ උපදේශක මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ දස වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සාර්ථකව සංවිධානය කරන ලදී. මෙම සමුළුව, ප්‍රතිපත්ති සම්පාදන සහ අධ්‍යාපනික ආයතන නියෝජනය කරන පර්යේෂකයන්ට ඔවුන්ගේ අත්දැකීම් සහ අදහස් විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් හුවමාරු කර ගැනීමට සංසදයක් සකස් කර දෙන අතරම, මෑතකාලීන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ නව්‍ය න්‍යායික සහ ආනුභාවික පර්යේෂණ දිරිගැන්වීමේ අරමුණ පෙරදැරිව “ශක්තිමත් අනාගතයක් සඳහා වූ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ” යන තේමාව යටතේ පවත්වනු ලැබිණි. “Evidence Based Public Policy: The Application of Efficiency Measures - The Case of Publicly Funded Australian Universities” යන මැයෙන් 2017 ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවෙහි ප්‍රධාන දේශනය, ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයේ සේවාර්ජිත මහාචාර්ය කීත් හවුටන් මහතා විසින් පවත්වනු ලැබීය. පෙර වසරවල මෙන්ම, දස වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සඳහාද ඕස්ට්‍රේලියාව, ප්‍රංශය, ජර්මනිය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ද ඇතුළු ලොව වටා රටවල් ගණනාවක ප්‍රචලිත විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන සහ මහ බැංකු නියෝජනය කරන කීර්තිමත් පර්යේෂකයින්ගේ අවධානය යොමු විය. තීව්‍ර විමර්ශන ක්‍රියාවලියකින් පසුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ පත්‍රිකා තුනක්ද ඇතුළුව, පර්යේෂණ පත්‍රිකා අටක් මෙවර සමුළුවේදී ඉදිරිපත් කිරීමට තෝරා ගන්නා ලදී. 2017 වසරේදී හොඳම පර්යේෂණ පත්‍රිකාව සඳහා වන ආචාර්ය ඩී.එස්. විජේසිංහ අනුස්මරණ සම්මානය, අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු ලබා සිටින මහ බැංකු නිලධාරියෙකු වන හර්ෂ පරණවිතාන මහතා විසින් ඉදිරිපත් කරන ලද “The Transition from Exchange Rate Targeting : The Case of Sri Lanka” යන පර්යේෂණ පත්‍රිකාව සඳහා හිමි විය. මෙම සමුළුවේදී, 2016 වසරේ පවත්වන ලද ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවෙහි පර්යේෂණ පත්‍රිකා කෘතියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අඛණ්ඩව ස්වකීය පර්යේෂණ දේශීය හා ජාත්‍යන්තර ප්‍රකාශනවල පළ කරන ලදී. "An Open Economy Quarterly Projection Model for Sri Lanka" යන මැයෙන් ජා.මූ. අරමුදලේ කාර්ය පත්‍රිකාවක් ලෙස ප්‍රකාශයට පත් වීමට නියමිත පර්යේෂණ පත්‍රිකාව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ජා.මූ. අරමුදලේ නිලධාරීන් විසින් සම කතෘත්වය දරන ලදී. 2017 මාර්තු මාසයේදී South Asia Economic Journal නම් සඟරාවෙහි පළ වූ "Macroeconomic Effects of Monetary Policy Shocks: Evidence from Sri Lanka" නම් වූ පර්යේෂණ පත්‍රිකාවේ සම කර්තෘත්වය අතිරේක අධ්‍යක්ෂවරයෙකු වන ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර මහතා විසින් දරන ලදී. 2017 වසරේදී අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (SEACEN Centre) විසින් පළ කරන ලද "Global Liquidity and the Impact on SEACEN Economies" නම් කෘතියෙහි "Spillover of Global Liquidity Imbalances to Currency Markets: An Emerging Economy Perspective" යන පරිච්ඡේදය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂිකාවක වන ආචාර්ය සුමිල වානගුරු මෙනවිය විසින් කතෘත්වය දරන ලදී. 2017 ජුනි මස Bulletin of the Australian Mathematical Society යන සඟරාවෙහි පළ වූ "Advancement of Autoregressive Conditional Duration Models involving Liquidity and Price Dynamics" නම් වූ පර්යේෂණ පත්‍රිකාවේ කතෘත්වය නියෝජ්‍ය අධ්‍යක්ෂිකාවක වන ආචාර්ය රසිකා යටිගම්මන මහත්මිය විසින් දරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂවරුන් ඇතුළු නිලධාරීහු පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට සහ විවරණය කිරීම සඳහා විවිධ සමුළු නියෝජනය කළහ. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් News Survey වැනි මහ බැංකුවේ කාර්තුමය වාර ප්‍රකාශන සඳහා තවදුරටත් ලිපි සපයන ලදී.

මේ අතර, සන්නිවේදන දෙපාර්තමේන්තුව, බැංකු විද්‍යා පියෙස සහ ප්‍රාදේශීය කාර්යාල සමඟ සහයෝගිතාවයෙන් විශ්වවිද්‍යාල සිසුන්, පාසල් ගුරුභවතුන් හා පාසල් සිසුන් සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල නිලධාරීන්ගේ ආර්ථික දැනුම සහ ආර්ථික සාක්ෂරතාව වර්ධනය කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිය දැනුම ලබා දීමේ මෙහෙයුම් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. 2016 වසරේ වාර්ෂික වාර්තාව පිළිබඳ දේශන ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් භාෂා ත්‍රිත්වයෙන්ම පවත්වන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්යභාරය, මුදල් ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, විදේශීය අංශයේ ප්‍රතිපත්ති සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා යන විෂය ක්ෂේත්‍ර යටතේ ඉතා විශාල අධ්‍යාපනික වැඩසටහන් ප්‍රමාණයක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් රටේ විවිධ ප්‍රදේශවල පවත්වනු ලැබීය. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් බැංකු පරිශ්‍රය වෙත පැමිණෙන දේශීය විදේශීය නියෝජිතයන්ට මහ බැංකුකරණය සහ සාර්ව ආර්ථික වෙනස්වීම් පිළිබඳව දේශන සිදු කරන ලදී. එසේම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් පශ්චාත් උපාධි ඇරඹීමට අපේක්ෂා කරන මහ බැංකුවේ අභ්‍යන්තර නිලධාරීන්ගේ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා උසස් තත්ත්වයේ පර්යේෂණ පත්‍රිකා සකස් කිරීමට අවශ්‍ය කරනු ලබන උපදේශකත්වය සපයන ලද අතර, පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ක්‍රමයේ අවශ්‍යතා සපුරාලීම පිණිස සාර්ව ආර්ථික විද්‍යාව, සූක්ෂම ආර්ථික විද්‍යාව සහ ගණිතය වැනි විෂයානුබද්ධ කෙටිකාලීන පාඨමාලා පවත්වන ලදී. එමෙන්ම, කණිෂ්ඨ නිලධාරීන් හට පර්යේෂණ සඳහා පෙර උපදේශන සේවා සපයන ලද අතර, අනෙකුත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් හට අවශ්‍ය ඕනෑම අවස්ථාවක, අවශ්‍යතාව මත පදනම්ව, පර්යේෂණ අධීක්ෂණ සිදු කරන ලදී. පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (SEACEN) විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකාවලට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මහ බැංකු නිලධාරීන්ගේ පර්යේෂණ යෝජනා පත්‍රිකා 15 ක් සහ සම්පූර්ණ කරන ලද

පර්යේෂණ පත්‍රිකා 12 ක් ඇගයීම සහ අධීක්ෂණය කරන ලදී. එමෙන්ම, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් 2017 වසරේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනා පත්‍රිකා 70 ක් ද අගයන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කිහිප දෙනෙකු සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් විකාශනය වූ "තක්ෂිලාව" සහ "අරිවූට්රු" (Arivootru) රූපවාහිනී අධ්‍යාපනික වැඩසටහන්වලට සිය සම්පත් දායකත්වය ලබා දෙන ලදී. තවද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් "ඉකෝන් අයිකන්" (Econ Icon) නම් සිංහල හා දෙමළ භාෂාවලින් පැවැත්වූ අන්තර් පාඨශාලයීය ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන සංවිධානය කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුවට සහයෝගය ලබා දෙන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය මගින් පවත්වනු ලැබූ "අන්තර් බැංකු ප්‍රශ්න විචාරාත්මක තරගාවලිය" සංවිධානය කිරීම සඳහා ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකාරීව සහභාගි විය.

### 7.6 ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වාගෙන යෑම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සබඳතා කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කරමින්, ජා.මූ. අරමුදල, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (SEACEN), අග්නිදිග ආසියානු, නවසීලන්තය සහ ඕස්ට්‍රේලියානු බැංකු සංගමය (SEANZA), සහ දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානය වැනි ජාත්‍යන්තර බහුපාර්ශවීය මූල්‍ය සංවිධාන සමඟ අඛණ්ඩව සබඳතා පවත්වා ගනිමින් ප්‍රධාන කාර්යයක් ඉටු කරන ලදී. මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තවදුරටත් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා අනෙකුත් ප්‍රධාන ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා රජයට අවශ්‍ය සහයෝගය ලබා දුන්නේය.

2017 වසරේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජා.මූ. අරමුදල, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන ඇතුළු විවිධ ජාත්‍යන්තර සංවිධානවලට සාර්ව ආර්ථික සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීමද සිදු කරන ලදී. වසර තුළදී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම සම්බන්ධ ජා.මූ. අරමුදලේ සාමාජික මෙහෙයුම් වැඩසටහන් දෙකක සහ ජා.මූ. අරමුදලේ IV වන වගන්තිය යටතේ වන වාර්ෂික උපදේශක මෙහෙයුමෙහි සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය (FPAS) සම්බන්ධ ජා.මූ. අරමුදලේ තාක්ෂණික සහායක දූත කණ්ඩායම් තුනක සම්බන්ධීකරණ කටයුතුවල ද නිරත විය.

තවද, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ කටයුතු කිහිපයකදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, කලාපයේ අනෙකුත් මහ බැංකු සමඟ එක්ව කටයුතු කරන ලදී. තායිලන්තයේ බැංකොක්හි පැවති අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ පාලක මණ්ඩලයේ 37 වැනි රැස්වීමේදී 2018 වර්ෂය සඳහා 38 වැනි අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ පාලක මණ්ඩලයේ (BOG) සහ 2019 වර්ෂය සඳහා විධායක කමිටුවේ (EXCO) සභාපතිත්වය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රදානය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සත්කාරකත්වය දක්වන මෙම ප්‍රධාන කටයුතු සඳහා අග්නිදිග ආසියානු සාමාජික රටවල මහ බැංකු 19 ක් සහ අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් සහභාගි වනු ඇත. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2017 ජූලි මාසයේදී 34 වැනි දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ සමූහ සමුළුව පවත්වන ලදී. මෙම සමුළුව සඳහා දකුණු ආසියානු කලාපයේ මහ බැංකු අධිපතිවරුන් සහ මුදල් අමාත්‍යාංශවල ලේකම්වරුන් සහ අනෙකුත් නියෝජිතයන් සහභාගි වූහ. දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සමූහ සමුළුවෙන් අනතුරුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් "ගෝලීය අවිනිශ්චිතතා හමුවේ දකුණු ආසියානු කලාපීය අභියෝග සහ එම අවදානම් අවම කිරීමට ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග" යන තේමාව යටතේ දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ අධිපතිවරුන්ගේ සමුළුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. එහිදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් "ගෝලීය අවිනිශ්චිතතා හමුවේ ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු වන බලපෑම සහ ඒවා අඩු කිරීමට ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග" අවධාරණය කරමින් ශ්‍රී ලංකාව පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. සමුළුවේදී "දකුණු ආසියානු කලාපීය මූල්‍ය අන්තර්ගතභාවය" යන තේමාව යටතේ දකුණු ආසියානු කලාපීය මූල්‍ය සංවිධානයේ පර්යේෂකයන් එක්ව ඉදිරිපත් කළ සහයෝගිතා පර්යේෂණ අධ්‍යයනයට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ද සාමාජිකයෙකු ලෙස ඇතුළත් වූ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂවරයෙකු විසින් එම පර්යේෂණ පත්‍රිකාව විවරණය කරන ලදී. 2016 වසරේදී ආරම්භ කරන ලද දකුණු ආසියානු කලාපීය මූල්‍ය සංවිධානයේ දත්ත ගබඩාව වෙත මාසිකව අදාළ දත්ත ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ඉදිරිපත් කරන ලදී. තවද, 2017 වසරේදී, දකුණු ආසියානු කලාපීය මූල්‍ය සංවිධානයේ දත්ත ගබඩාව වෙත අවදානම් දර්ශක හතක් සඳහා අදාළ වන දත්ත ත්‍රෛමාසිකව හා වාර්ෂික පදනම මත ලබා දීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ආරම්භ කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විවිධ ආයෝජන රැස්වීම් සඳහා, මෑතකාලීන ආර්ථික ප්‍රවණතා, ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ ප්‍රවණතා සහ හැසිරීම් සහ ආර්ථික දැක්ම ඉස්මතු කරමින් විවිධ විද්‍යුත් මාධ්‍ය ආශ්‍රිත ඉදිරිපත් කිරීම් සකස් කිරීම සම්බන්ධීකරණය ද සිදු කරන ලදී. වසර තුළදී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (S&P), මූඩීස් (Moody's) සහ ෆිච් (Fitch) වැනි ජාත්‍යන්තර ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සමඟ අඛණ්ඩව කටයුතු සිදු කළ අතර, එමගින් ශ්‍රී ලංකාවේ ණය ලැබීමට ඇති සුදුසුකම මැන බැලීම සඳහා ස්වෛරීත්ව වත්කම් අරමුදල්, විශ්‍රාම අරමුදල් සහ අනෙකුත් ආයෝජකයන්ට පහසුකම් සපයන ලදී.

# 8. සේවක අර්ථසාධක අරමුදල

1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ ප්‍රතිපාදන යටතේ සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) පිහිටුවා ඇත. පනතේ ප්‍රතිපාදන අනුව අරමුදලෙහි සියලුම පරිපාලන බලතල හා කාර්යයන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සතුවන අතර, අරමුදල් කළමනාකරණයට අදාළ බලතල, කාර්යයන් හා වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තමන් වෙත පැවරී ඇති කාර්යභාරයන් ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් යාන්ත්‍රණය ලෙස සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව බල ගන්වා ඇත.

## 8.1 සේ.අ.අ. දෙපාර්මේන්තුවේ කාර්යයන්

පනතේ ප්‍රතිපාදන අනුව සාමාජික දායක මුදල් හා අධිභාර රැස් කිරීම, පොදු ගිණුම් හා සාමාජික ගිණුම් පවත්වාගෙන යාම, සාමාජික ගිණුම්වලට පොලිය බැර කිරීම, සාමාජිකයන්ට හා ඔවුන්ගේ නීතිමය හිමිකරුවන්ට ප්‍රතිලාභ ආපසු ගෙවීම, අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සහ පනත මගින් මුදල් මණ්ඩලය හා කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේදී දරණ පිරිවැය අරමුදලේ ආදායමෙන් අයකර ගැනීම යන කාර්යයන් සේ.අ.අ. දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ඒ අනුව, 2017 වසරේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව මුදල් මණ්ලයේ අනුමත ප්‍රතිපත්ති හා නිර්දේශයන්ට අනුව ඉහත කාර්යයන් ඉටු කළ අතර, කම්කරු කොමසාරිස් ජනරාල් සමග ද සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන ලදී.

## 8.2 කාර්යයන්හි කාර්යසාධනය

### (අ) අරමුදලේ වටිනාකම, සාමාජික ගිණුම් ශේෂ හා ප්‍රතිලාභ ගෙවීම්

2017 වසර අවසානයේ දී, අරමුදලේ මුළු වටිනාකම රුපියල් බිලියන 2,066.3 ක් වූ අතර, එය 2016 වසර අවසානයේ වූ රුපියල් බිලියන 1,841.5 හා සසඳන විට සියයට 12.2 ක වර්ධනයක් පෙන්නුම් කරයි. ආයෝජන තුළින් ඉපැයූ ආදායම් සහ සාමාජික ශුද්ධ දායක මුදල් (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) ලැබීම් අරමුදලේ මෙම වර්ධනයට හේතු විය. 2016 වසරේ සාමාජික පොලිය ද ඇතුළු රුපියල් බිලියන 1,810.6 ක්ව පැවති අරමුදලේ සාමාජිකයන්ගේ මුළු වගකීම (සාමාජික ශේෂ) 2017 අවසානය වන විට රුපියල් බිලියන 2,020.8 දක්වා සියයට 11.6 කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II - 9). 2017 වසර තුළ දී දායක මුදල් ලැබීම් රුපියල් බිලියන 118.3 සිට 133.3 දක්වා සියයට 12.7 කින් වර්ධනය වූ අතර, අරමුදලේ සාමාජිකයන් හා ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ප්‍රතිලාභ ලෙස රුපියල් බිලියන 117.5 ක් ගෙවන ලදී. සමස්ත ප්‍රතිලාභ ගෙවීම් 2016 වසරට සාපේක්ෂව සියයට 8.4කින් වර්ධනය වීමට නිවාස ණය සහ වෛද්‍ය ප්‍රතිකාර සඳහා සියයට 30 ශේෂය ආපසු ගැනීමේ පහසුකම යටතේ ප්‍රතිලාභ ගෙවීම් බලපාන ලදී. ඒ අනුව, ශුද්ධ ආයකත්වය 2016 වසරේ පැවති රුපියල් බිලියන 9.9 හා සැසඳීමේ දී රුපියල් බිලියන 15.8 ක් දක්වා වර්ධනය විය. අරමුදලේ ශුද්ධ ආදායම 2017 වසරේ දී රුපියල් බිලියන 202.9 ක් වාර්තා කරමින් 2016 වසරේ උපයන ලද රුපියල් බිලියන 175.9 හා සසඳන විට සියයට 15.3 කින් වර්ධනය විය.

**II - 9 සංඛ්‍යා සටහන**

**අරමුදල පිළිබඳ තෝරාගත් මූලික දත්ත**

| අයිතමය | 2016 | 2017 (අ) | වෙනස (%) |
|---|---|---|---|
| අරමුදලේ සමස්ත වටිනාකම (රුපියල් බිලියන) | 1,841.5 | 2,066.3 | 12.2 |
| සාමාජිකයන් වෙත වූ සමස්ත වගකීම (රුපියල් බිලියන) | 1,810.6 | 2,020.8 | 11.6 |
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 17.3 | 17.3 | - |
| දැනට දායක මුදල් එවනු ලබන ගිණුම් (මිලියන) | 2.6 | 2.6 | - |
| දැනට දායක මුදල් එවනු නොලබන ගිණුම් (මිලියන) | 14.7 | 14.7 | - |
| මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන) | 118.3 | 133.3 | 12.7 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන) | 108.4 | 117.5 | 8.4 |
| ශුද්ධ දායක මුදල් (රුපියල් බිලියන) | 9.9 | 15.8 | 59.6 |
| ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව | 187,147 | 260,989 | 39.5 |
| ශුද්ධ ආදායම (රුපියල් බිලියන) | 175.9 | 202.9 | 15.3 |

අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ආ) අරමුදලේ ආයෝජනය හා ප්‍රතිලාභ

#### i) ආයෝජන කළඹ

2017 වසර අවසානයේ දී සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම (පොත් අගය) රුපියල් බිලියන 1,992.4 ලෙස වාර්තා වූ අතර, එය 2016 වසරේ පැවති රුපියල් බිලියන 1,772.2 ට සාපේක්ෂව සියයට 12.4 ක වර්ධනයක් පෙන්නුම් කරයි (සංඛ්‍යා සටහන II - 10). අරමුදලේ සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින් ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමට හා අනෙකුත් වියදම් සපුරා ගැනීමට ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාවයක් පවත්වා ගනිමින්, අරමුදලේ සාමාජිකයින් වෙත දිගුකාලීන ධන මූර්ත ප්‍රතිලාභයක් ලබාදීම ඉලක්ක කොටගත් අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

2017 වසර අවසානයේ දී අරමුදලේ සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 91.3 ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, ව්‍යාපාර කොටස්වල සියයට 4.2ක් සහ භාරකාර සහතිකපත් සහ සාංගමික ණය වල සියයට 2.1 ක් ආයෝජනය කර තිබුණ අතර ඉතිරි සියයට 2.4 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. රජයේ සුරැකුම්පත් ආයෝජනකළඹේ කල්පිරීමේ ව්‍යුහය සහ ඵලදා අනුපාතයන් සංඛ්‍යා සටහන II - 11 හි දක්වා ඇත.

**II - 10 සංඛ්‍යා සටහන**

**ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2016 | | 2017 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු.බිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු.බිලියන) | දායකත්වය (%) |
| භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් | 1,650.4 | 93.1 | 1,818.6 | 91.3 |
| සමාගම් කොටස් | 80.9 | 4.6 | 84.3 | 4.2 |
| සාංගමික ණය උපකරණ | 38.2 | 2.1 | 41.5 | 2.1 |
| ස්ථාවර තැන්පතු | - | - | 48.0 | 2.4 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් | 2.7 | 0.2 | - | - |
| **එකතුව** | **1,772.2** | **100.0** | **1,992.4** | **100.0** |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II - 11 සංඛ්‍යා සටහන**

**2017 අවසානයේ දී රාජ්‍ය සුරැකුම්පත් කළඹේ කල්පිරීමේ ව්‍යුහය**

| කල්පිරීම | පරිණත වටිනාකම (රු. මිලියන) (අ) | දායකත්වය (%) | බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) |
|---|---|---|---|
| වසරකට වඩා අඩු | 185,904.1 | 9.6 | 10.72 |
| වසර 1 - 2 | 186,896.3 | 9.7 | 9.97 |
| වසර 3 - 4 | 157,652.7 | 8.2 | 10.82 |
| වසර 5 ට වැඩි | 1,399,687.6 | 72.5 | 11.03 |
| **එකතුව** | **1,930,140.7** | **100** | **10.88** |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

ii) ආයෝජන ආදායම

2017 වසරේ දී අරමුදලේ සමස්ත ආයෝජන ආදායම රුපියල් බිලියන 222.6 ක් වූ අතර, එය 2016 වසරේ උපයන ලද සමස්ත ආයෝජන ආදායම හා සැසඳීමේ දී සියයට 15.4 ක වැඩි වීමක් පෙන්නුම් කරයි (සංඛ්‍යා සටහන II - 12). පොලී ආදායම ආයෝජන ආදායමෙන් සියයට 84.6 කට දායක වෙමින් අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය විය. 2017 වසරේ පොලී ආදායම රුපියල් බිලියන 188.3 ක් වූ අතර, එය 2016 වසරේ උපයන ලද රුපියල් බිලියන 165.5 හා සැසඳීමේ දී සියයට 13.8 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. වට්ටම් කළ භාණ්ඩාගාර බැඳුම්කර තුළින් 2017 වසර තුළ ලද ක්‍රමක්ෂය ලාභ රුපියල් බිලියන 31.3 ක් වූ අතර, එය 2016 වසර තුළ ලද රුපියල් බිලියන 28.2 හා සැසඳීමේ දී සියයට 11.0 ක වර්ධනයකි. තවද, 2017 වසර තුළ දී උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ හා ලාභාංශ වලින් සමන්විත ව්‍යාපාර කොටස්වල ආයෝජනය කිරීම තුළින් රුපියල් මිලියන 2,993.6 ක ආදායමක් උපයන ලද අතර, එය 2016 වසරේ දී ආදායම වූ රුපියල් මිලියන 4,714.7 සමඟ සැසඳීමේ දී සියයට 36.5 ක අඩුවීමකි. ද්විතියික වෙළඳපොළ කටයුතු තාවකාලිකව නවතා දැමීම හේතුවෙන්, රජයේ සුරැකුම්පත් මගින් උපයන ලද ප්‍රාග්ධන ලාභ 2017 වසර තුළ දී වාර්තා නොවූ අතර, 2016 වසර තුළ දී එය රුපියල් මිලියන 611.8 ක් විය. 2017 වසරේ දී කොටස් ආයෝජනවල හානිකරණය රුපියල් මිලියන 1,502.1 ක් වූ අතර, එය 2016 වසර හා සසඳන විට සියයට 71.3 ක අඩු වීමකි. සමස්තයක් ලෙස, අරමුදලේ ඉපැයුම් අනුපාතිකය 2016 වසරේ දී සියයට 11.4 සමඟ සසඳන කල, එය 2017 වසරේ දී සියයට 11.8 ක් විය.

**II - 12 සංඛ්‍යා සටහන**

**ආයෝජන මගින් ලද ආදායම්**

| ආදායම් මූලාශ්‍රය | 2016 | | 2017 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු.මිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු.මිලියන) | දායකත්වය (%) |
| පොලී | 165,485.4 | 85.8 | 188,346.1 | 84.6 |
| ක්‍රමක්ෂය ලාභ | 28,170.9 | 14.6 | 31,289.3 | 14.1 |
| ප්‍රාග්ධන ලාභ - රජයේ සුරැකුම්පත් | 611.8 | 0.3 | - | - |
| වෙළඳපොළ මිලට අගය කිරීමෙන් ලාභ/පාඩු - රජයේ සුරැකුම්පත් | (584.4) | (0.3) | 1,640.2 | 0.7 |
| වෙළඳපොළ මිලට අගය කිරීමෙන් ලාභ/පාඩු - ව්‍යාපාර කොටස් | (257.7) | (0.1) | (163.4) | (0.1) |
| ව්‍යාපාර කොටස් වලින් ලද ප්‍රාග්ධන ලාභ | 452.1 | 0.2 | - | - |
| ලාභාංශ | 4,262.6 | 2.2 | 2,993.6 | 1.3 |
| මූල්‍ය වත්කම් හානිකරණය | (5,231.6) | (2.7) | (1,502.1) | (0.7) |
| **එකතුව** | **192,909.1** | **100.0** | **222,603.7** | **100.0** |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

iii) වියදම්

2017 වසරේ අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම රුපියල් මිලියන 1,348.7 ක් වූ අතර, එය 2016 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 1,487.2 හා සසඳන විට සියයට 9.3 ක අඩු වීමක් පෙන්නුම් කරන ලදී. 2017 වසරේ දී අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම අරමුදලේ දළ ආදායමින් සියයට 0.61 ක් ලෙස සටහන් වූ අතර, එය 2016 වසරේ දී සියයට 0.77 ක් විය (සංඛ්‍යා සටහන II - 13). වසර ගණනාවක් පුරාම අරමුදලේ මෙහෙයුම් වියදම එහි මුළු දළ ආදායමින් සියයට 1 කට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීමට අරමුදලට හැකි විය.

**II - 13 සංඛ්‍යා සටහන**

**මෙහෙයුම් වියදම්**

| අයිතමය | වටිනාකම (රු. මිලියන) | | ප්‍රතිශත වෙනස (%) |
|---|---|---|---|
| | 2016 | 2017 (අ) | |
| සේවක පිරිවැය | 861.1 | 847.3 | (1.6) |
| පරිපාලන වියදම් | 402.8 | 454.1 | 12.7 |
| වෙනත් වියදම් | 223.3 | 47.3 | (78.8) |
| **එකතුව** | **1,487.2** | **1,348.7** | **(9.3)** |
| **මුළු පිරිවැය දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස** | **0.77** | **0.61** | |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ඈ) සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්

පසුගිය වසර 10 පුරා, සේ.අ. අරමුදලට, එහි සාමාජිකයින් වෙත සියයට 2.5 ක් වන ව්‍යවස්ථාපිත අවම අනුපාතය ඉක්මවන ඉහළ පොලියක් අඛණ්ඩව ගෙවීමට හැකි විය (සංඛ්‍යා සටහන II - 15). අරමුදලේ සාමාජිකයන් වෙත බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම 2016 වසර පැවති රුපියල් බිලියන 171.5 සමඟ සැසඳීමේ දී 2017 වසර අවසානයේ දී රුපියල් බිලියන 198.5 ක් විය (සංඛ්‍යා සටහන II - 14). ඒ අනුව, සේ.අ. අරමුදලට එහි 2017 වසරේ අයවැයගත පොලී අනුපාතය වන සියයට 10.0 ඉක්මවා සියට 10.5 ක පොලී අනුපාතයක් සාමාජික ශේෂ සඳහා ගෙවීමට හැකි විය.

**II - 14 සංඛ්‍යා සටහන**

**සාමාජිකයන්ට ගෙවන ලද පොලිය**

| අයිතමය | වටිනාකම (රු. මිලියන) | | ප්‍රතිශත වෙනස (%) |
|---|---|---|---|
| | 2016 | 2017 (අ) | |
| දළ ආදායම | 193,071.4 | 223.192.5 | 15.6 |
| මුළු මෙහෙයුම් වියදම | (1,487.2) | (1,348.7) | (9.3) |
| ආදායම් බදු | (15,657.2) | (18,897.1) | 20.7 |
| වසරේ ශුද්ධ ආදායම | 175,927.0 | 202,946.8 | 15.4 |
| පෙර වසරේ රඳවාගත් ලාභ | 215.6 | 189.3 | (12.2) |
| වසර තුළ සිදු කළ ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය | (4,645.8) | (4,624.3) | (0.5) |
| සාමාජිකයන් වෙත බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම (වසර තුළ දී ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය අඩු කළ පසු) | 171,496.8 | 198,511.8 | 15.8 |
| සංචිත වලින්/(සංචිත වලට) මාරු කිරීම | 250.0 | (7,000.0) | (2,900.0) |
| සංචිත වලින්/(සංචිත වලට) මාරු කිරීමෙන් පසු සාමාජිකයන්ට බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම | 171,746.8 | 191,511.8 | 11.5 |
| සාමාජික ශේෂ සඳහා පොලිය | (171,557.4) | (191,243.8) | 11.5 |
| රඳවාගත් ශුද්ධ ආදායම | 189.4 | 268.0 | 41.5 |
| සාමාජික ශේෂ සඳහා ගෙවන ලද පොලී අනුපාතය (%) | 10.5 | 10.5 | - |

අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ඈ) අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව සහ සේ.අ.අ. විසින් අවදානම් කළමනාකරණය වඩාත් ශක්තිමත් කිරීම සහ අරමුදලේ මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, අංශ අතර රාජකාරී කාර්යයන් පැහැදිලිව බෙදා වෙන් කිරීම, හඬ පටිගත කිරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම ඇතුළු අනෙකුත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද 2017 වර්ෂය තුළදී හඳුන්වාදෙන ලදී.

**II - 15 සංඛ්‍යා සටහන**

**සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී අනුපාතය**

| වසර | ගෙවන ලද පොලී අනුපාතය (%) | සඵල පොලී අනුපාතය (%) |
|---|---|---|
| 2007 | 11.20 | 11.40 |
| 2008 | 13.20 | 13.44 |
| 2009 | 13.75 | 13.92 |
| 2010 | 12.50 | 12.65 |
| 2011 | 11.50 | 11.58 |
| 2012 | 11.50 | 11.62 |
| 2013 | 11.00 | 11.14 |
| 2014 | 10.50 | 10.60 |
| 2015 | 10.50 | 10.57 |
| 2016 | 10.50 | 10.51 |
| 2017(අ) | 10.50 | 10.51 |

අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සඵල පොලී අනුපාතය = (සාමාජිකයන්ට ගෙවන ලද පොලිය) / [(ආරම්භක සාමාජික ශේෂය + වසර අවසානයේ පොලී ගෙවීම්වලට පෙර සාමාජික ශේෂය )/2]

### (ඉ) පද්ධති සංවර්ධනය

සේ.අ.අ. විසින් එහි ආයෝජන උපායමාර්ග සහ රාමුව සමාලෝචනය හා නැවත පිළියෙළ කිරීමේ ක්‍රියාවලිය සඳහා නවීකරණ ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකුවේ (WB) තාක්ෂණික සහය ලබා ගැනීම සිදු කරනු ලබයි. තවදුරටත්, සේ.අ.අ. ට පුළුල් තොරතුරු තාක්ෂණික විසඳුම් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය ලෝක බැංකුව විසින් ලබා දේ. මෙය පෙරදැරි කොටගෙන ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) තාක්ෂණික අනුග්‍රහය යටතේ, ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහන හරහා ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනය (BPR) සිදු කෙරෙමින් පවතී.

## 8.3 සාමාජික සේවාවන්

### (අ) සාමාජික ගිණුම් ප්‍රකාශන

සේ.අ.අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකයින් සඳහා සාමාජික ගිණුම් ප්‍රකාශන, ඔවුන්ගේ සේවායෝජකයින් හරහා නිකුත් කරනු ලැබේ. 2016 වසරේ පළමු හා දෙවන අර්ධ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන සේවායෝජකයින් හට 2017 වසර තුළදී නිකුත් කරන ලදී. 2017 වසරේ පළමු අර්ධ වර්ෂය, 2018 වසරේ මාර්තු මස අගදී ආරම්භ වනු ඇත.

**II - 16 සංඛ්‍යා සටහන**

**නිකුත් කළ සාමාජික ගිණුම් ප්‍රකාශන ගණන**

| කාලච්ඡේදය | සේවායෝජකයින් සංඛ්‍යාව | ප්‍රකාශන සංඛ්‍යාව (ක්‍රියාකාරී සාමාජිකයින්) |
|---|---|---|
| 2016 පළමු අර්ධ වර්ෂය | 71,310 | 2,141,812 |
| 2016 දෙවන අර්ධ වර්ෂය | 73,076 | 2,568,104 |

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ආ) සාමාජිකයින් සඳහා වූ නිවාස ණය පහසුකම

සේ.අ.අ. සාමාජිකයින් හට සිය ගිණුමේ ශේෂය ඇපයට තබා නිවාස ණය ලබා ගැනීමේ යෝජනා ක්‍රමයක් 1988 වසරේදී හඳුන්වා දුන් අතර, එමගින් අරමුදලේ සාමාජිකයින් හට අත්‍යාවශ්‍ය සේවයක් සලසමින් එම ණය පහසුකම ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව හා සමූපකාර ග්‍රාමීය බැංකු යන සහභාගීත්ව ණය දෙන ආයතන හරහා 2017 වසර තුළදී ද අඛණ්ඩව ලබා ගැනීමට හැකි විය. වසර තුළදී මෙම ව්‍යාපෘතිය යටතේ ශේෂ සහතික 10,998 ක් ආයතන වෙත නිකුත් කරන ලද අතර, අනුමත කරන ලද සමස්ත නිවාස ණය ප්‍රමාණය රුපියල් මිලියන 4,946 කි (සංඛ්‍යා සටහන II - 17). තවද, 2016 වසරේදී පැහැර හරින ලද ණය වෙනුවෙන්, අරමුදල විසින් රුපියල් මිලියන 2,485 කට ආසන්න මුදල් ප්‍රමාණයක් අදාළ සාමාජික ගිණුම්වලින් අඩුකර සහභාගිත්ව ණය දෙන ආයතන වෙත 2017 වසර තුළදී ප්‍රේෂණය කරන ලදී.

**II - 17 සංඛ්‍යා සටහන**

**නිවාස ණය පහසුකම**

| වසර | නිකුත් කළ සහතිකපත් සංඛ්‍යාව | අනුමත කළ ණය ප්‍රමාණය (රු.මිලියන) | අනුමත ණය දෙන ආයතන වෙත මුදාහළ මුදල (රු.මිලියන) |
|---|---|---|---|
| 2007 | 12,969 | 2,872 | 1,240 |
| 2008 | 12,519 | 3,008 | 1,192 |
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 | 11,234 | 3,973 | 2,019 |
| 2013 | 16,268 | 6,914 | 2,178 |
| 2014 | 17,786 | 8,021 | 2,394 |
| 2015 | 13,132 | 5,489 | 2,522 |
| 2016 | 12,780 | 5,414 | 2,541 |
| 2017(අ) | 10,998 | 4,946 | 2,485 |

අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ඇ) පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය

2012 අංක 02 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතට සහ පසුකාලීනව පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද ක්‍රියාපටිපාටියන්ට අනුව, සියයට 30 ක පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය, 2015 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක විය. මෙම ක්‍රමය සඳහා ප්‍රතිලාභ ලබන්නන්ගෙන් ඉහළ ඉල්ලුමක් පැවති අතර, මෙම ක්‍රමය ආරම්භයේ සිට 100,000 ඉක්මවූ ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වෙත රුපියල් බිලියන 58.3 ක මුදලක් 2017 වසර අග වනවිට ප්‍රතිලාභ ලෙස ගෙවන ලදී. එසේම, 2017 වසර තුළදී, ප්‍රතිලාභීන් 32,789 ක් වෙත රුපියල් බිලියන 17.29 ක් නිදහස් කර ඇත.

### (ඈ) ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය

කඩදාසි රහිත මෙහෙයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම තුළින් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඡායාස්ථගත පිළිබිඹු ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

ව්‍යාපෘතියෙහි පළමු අදියර සම්පූර්ණ කිරීමත් සමඟ, සේ.අ.අ වාර්තා අංශයෙහි සාම්ප්‍රදායික ආකෘතිය විද්‍යුත් වාර්තා අංශයක් බවට පත් විය. සියලුම මූලික ගොනු වාර්තා, 'ඩී' පෝරම සහ නැවත ලියාපදිංචි කිරීම් ලේඛන ඡායා පිළිබිඹුගත කර, සුචිගත කිරීමෙන් අනතුරුව දත්ත කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර ඇත. ලේඛන සොයා ගැනීම, ලිපි ගොනු යාවත්කාලීන කිරීම, සටහන් තැබීම සහ අනෙකුත් සම්බන්ධිත කාර්යයන් දෙපාර්තමේන්තුවෙහි පරිශීලකයන්ට ඔවුන්ගේ පරිගණකය තුළින් සිදු කිරීමේ හැකියාව ලබාදී ඇත. ලිපිගොනු ආශ්‍රිත කාර්යයන් ස්වයංක්‍රියකරණය මගින් දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලියන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවී ඇති අතර, ක්‍රියාවලීන් සඳහා කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ සහභාගිත්වය අවම කර ඇත. තවද මෙය පරිවර්තන කාලය, කාර්යාල ඉඩ පහසුකම හා මානව සම්පත් ඉතිරියට හේතු විය.

පළමු අදියර තුළින් ලබාගත් ක්‍රියාවලි කාර්යක්ෂමතාවන් මත පදනම්ව නිතර භාවිත වන වාර්තා ඩිජිටල්කරණය කිරීම සඳහා ව්‍යාපෘතියෙහි දෙවන අදියර 2016 වර්ෂය අවසාන කාලයේදී ආරම්භ කරන ලදී. 2013, 2014 සහ 2015 වර්ෂවලට අදාළව සේව්‍ය ආයතනවලින් සේ.අ.අ. දායක මුදල් රැස් කිරීමට යොදා ගන්නා ලද සී/සී3 වාර්තා, 2002 සිට 2015 වර්ෂය දක්වා ප්‍රතිලාභ ගෙවීම්වලට අදාළ වැඩ වාර්තා (2013 වර්ෂය හැර), 1974 සිට 2009 වර්ෂය දක්වා කේවල සේව්‍ය ලෙජර, 2010 වර්ෂයේ සිට සේ.අ.අ. ගිණුම්වලට අදාළ සංශෝධනයන් සම්බන්ධ ලිපි සහ 2014 වර්ෂයට අයත් නැවත ලියාපදිංචි කිරීම්වලට අදාළ ලේඛන, ව්‍යාපෘතියේ දෙවන අදියරට ඇතුළත් වේ. ව්‍යාපෘතියෙහි මෙම විෂය පථය 2017 වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී.

2001 වර්ෂයේ සිට ප්‍රතිලාභ ගෙවීම්වලට අදාළ වැඩ වාර්තාවලට සම්බන්ධ සියලු ලිපි ගනුදෙනුවල ඡායාස්ථගත පිළිබිඹු දත්ත පද්ධතියට ඇතුළත් කර තිබීම නිසා ප්‍රතිලාභ ගෙවීම් සහ නොගෙවූ ශේෂ ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රියාවලීන් මේ වන විට කාර්යක්ෂම වී තිබේ. තවද, නම් සංශෝධනයන් හා නැවත ලියාපදිංචි කරන ලද සාමාජික තොරතුරු සංශෝධනයන් වැනි සාමාජික සේවාවන්ද කාර්යක්ෂම වී තිබේ.

2016 සහ 2017 වර්ෂයන්ට අයත් සී සහ සී3 වාර්තාවල ඡායාස්ථගත පිළිබිඹු ලබා ගැනීම සහ සුචිගත කිරීම සඳහා 2017 වර්ෂය අගදී ව්‍යාපෘතියෙහි දෙවන අදියරෙහි විෂය පථය දීර්ඝ කරන ලදී.

### (ඉ) සේවක අර්ථසාධක අරමුදල් ජංගම සේවා වැඩසටහන්

සේ.අ.අ. සාමාජිකයන් හට වඩාත් පහසු වන අයුරින් හා ඔවුන්ගේ මෙන්ම සාමාන්‍ය ජනතාව තුළ ඇති සේ.අ.අ. සම්බන්ධ දැනුම වඩ වඩාත් දියුණු කිරීමේ අරමුණින් 2017 වසර තුළදී මෙම සේ.අ.අ. ජංගම සේවා පවත්වන ලදී.

එලෙස 2017 වසර තුළදී සේ.අ.අ. ජංගම සේවාවන් 22 ක් පවත්වන ලද අතර, ඒවායින් කිහිපයක් කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව හා අදාළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හා සහයෝගයෙන් පවත්වන ලදී.

එමෙන්ම රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් සංවිධානය කරන ජංගම සේවා වැඩ සටහන්වලට මෙන්ම අදාළ පෞද්ගලික ආයතන මගින් සංවිධානය කරන ජංගම සේවා වැඩසටහන්වලට ද සේ.අ.අ. දෙපාර්තමේන්තුව සහභාගි වී ඇත. සේ.අ.අ. සම්බන්ධයෙන් එහි සාමාජිකයෙකු හට සිදු කර ගැනීමට අවශ්‍ය කරන සියලුම සේවාවන් කොළඹ පිහිටි සේ.අ.අ. කාර්යාලයට පැමිණීමෙන් තොරව මෙම ජංගම සේවා වැඩසටහන් මගින් ඉටුකර ගැනීමේ පහසුකම සලසා ඇත. ප්‍රධාන වශයෙන් සාමාජික ගිණුමේ ශේෂ ප්‍රකාශන නිකුත් කිරීම, සේ.අ.අ. සාමාජික තොරතුරු හා ගිණුම් සංශෝධනය, සාමාජික තොරතුරු නැවත ලියාපදිංචිය, අන්තර්ජාලය මඟින් සාමාජික ශේෂ විමසීම් සේවය ප්‍රවර්ධනය කිරීම, සේ.අ.අ සම්බන්ධ අනෙකුත් උපදෙස් යන සේවාවන් මෙම ජංගම සේවා වැඩසටහන් තුළින් සේ.අ.අ. සාමාජිකයින් හට ලබාදෙන ලදී.

තවදුරටත් ජංගම සේවාවට සම්බන්ධ සේව්‍යයන්, සේවකයින් හා අනෙකුත් පාර්ශ්වයන් දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙළක්, විද්‍යුත් ලිපි, පෝස්ටර්, අත් පත්‍රිකා හා දේශන වැනි විවිධ සන්නිවේදන ක්‍රම මගින් ද සිදු කරන ලදී.

එමෙන්ම, ජංගම සේවාවල ඵලදායිතාව වැඩිදියුණු කර ගැනීම සඳහා සිදු කළ යුතු පෙර සූදානම් කටයුතු පිළිබඳව ජංගම සේවාවට සෘජුවම සම්බන්ධ වන සේව්‍යයන්, කළමනාකරුවන් හා අනෙකුත් පරිපාලන නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ද ජංගම සේවාවට පෙර පවත්වන ලදී.

**(ඊ) විද්‍යුත් දත්ත භාවිතයෙන් සේ.අ.අ. ආයක මුදල් රැස්කිරීමේ ක්‍රමය**

සේවක අර්ථසාධක අරමුදල විසින් සිය කාර්යයන් වඩාත් කාර්යක්ෂම සහ විනිවිදභාවයකින් යුතුව සිදුකිරීම සඳහා සේවක අර්ථසාධක ආයක මුදල් ගෙවීම් සහ අදාළ සාමාජික දත්ත වාර්තා විද්‍යුත් මාර්ගයෙන් සැපයීමේ ක්‍රමය සේවායෝජකයන් හට හඳුන්වා දෙන ලදී. එහිදී සේවකයන් 50 ට වැඩි ආයතන විද්‍යුත් ආයක ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කරනු වස් 2012 වසරේ අදාළ නීතිමය ප්‍රතිපාදන අනුමත කරගන්නා ලද අතර, එතෙක් මෙම ක්‍රමය ස්වේච්ඡා පදනම මත ක්‍රියාත්මක විණි. 2017 වසරෙහි ද මෙම ක්‍රමය සඳහා සේවායෝජකයන් හට ප්‍රවේශ වීමේ හැකියාව වඩාත් පුළුල් කිරීමේ ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඒ අනුව, මංගත ගෙවීම් ක්‍රමය දැනටමත් ක්‍රියාත්මක නොවන බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ එම ක්‍රමය හඳුන්වාදීම පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් 2018 ජනවාරි මස මෙම ක්‍රමය හරහා ආයක මුදල් එක් රැස් කිරීමට සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ වන ලදී. ඒ අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු හතක් මේ වන විට සේවක අර්ථසාධක අරමුදල් රැස්කිරීමේ නියෝජිතයින් ලෙස සම්බන්ධ වී ඇති අතර, ඉන් වාණිජ බැංකු තුනක් සේවක දත්ත සත්‍යාපනයක් සහිත ස්වයංක්‍රීයව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දී ඇත. මීට අමතරව, සේවක අර්ථසාධක අරමුදලෙහි සියලුම පාර්ශවකරුවන් හට විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සහ ඉන් අත්වන ප්‍රතිලාභ පිළිබඳව සේවායෝජකයින් දැනුම්වත් කිරීමේ ක්‍රියාදාමයන් ද 2017 වසර තුළ සිදු කරන ලදී. ඒ අනුව, සක්‍රීය සාමාජිකත්වයෙන් සියයට 65 ක ප්‍රමාණයක් නියෝජනය වන සේ විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සඳහා ලියාපදිංචි වූ සේවායෝජකයින් සංඛ්‍යාව 2017 වසර තුළදී 6,955 සිට 7,900 දක්වා වැඩිවූ අතර, එය මාසිකව රැස්කරනු ලබන සමස්ත ආයක මුදලෙන් සියයට 80 ක පමණ ප්‍රමාණයක් වේ.

**(උ) සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම**

සේ.අ.අ. සාමාජිකයින්ට කාර්යක්ෂම සේවයක් සැපයීමේ අරමුණින් සේ.අ.අ. දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සේ.අ.අ. සාමාජිකයන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි තොරතුරු සඳහන්ව ඇති ආකාරයට නැවත ලියාපදිංචි කර, ජාතික හඳුනුම්පත් අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංක (Unique Identification Number) ලෙස භාවිතා කිරීමට හැකි වන ආකාරයේ විශේෂ ව්‍යාපෘතියක් දියත් කරන ලදී. මෙමගින් ආයතන දෙකටම පොදුවේ භාවිතා කළ හැකි සාමාජික කේන්ද්‍රගත දත්ත ගබඩාවක් (Member Centric Database) සකස් කරන ලදී.

2017 වසර අවසාන වන විට මිලියන 1.86 කට ආසන්න සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු ප්‍රමාණයක් රැස්කර ගනිමින් අරමුදලේ සක්‍රීය (වර්තමානයේ ආයක මුදල් ගෙවනු ලබන) සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම සිදුකර ඇත. ඒ අතුරින් සියයට 81 ක් (ගිණුම් මිලියන 1.51) පමණ වූ සාමාජික ප්‍රතිශතයකට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබාදී ඇති අතර, සෙසු සාමාජිකයන්ගේ රැස්කරන ලද තොරතුරු පසුව ලියාපදිංචි කිරීම සඳහා යොමු කරනු ලැබේ.

සේ.අ.අ.ට සම්බන්ධ වන නව සාමාජිකයන් තත්කාලීනව ජාතික හැඳුනුම්පත් තොරතුරු යටතේ ලියාපදිංචි කිරීම 2010 නොවැම්බර් මාසයේ සිට ආරම්භ කරන ලදී. ඒ අනුව, සෑම මසකදීම පළමු වරට ආයක මුදල් ලැබෙන සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු රැස්කර ගැනීම සඳහා මාසික නිරීක්ෂණ ක්‍රියාවලියක් ද පවත්වාගෙන යනු ලැබේ.

මේ අනුව, නව සාමාජික ලේඛනයෙහි සාමාජිකයින් 53,091 ක් 2017 වසර තුළදී ලියාපදිංචි කරන ලද අතර, සාමාජිකයන් 71,234 කගේ තොරතුරු යාවත්කාලීන කරන ලදී.

## 9. විනිමය පාලනය/විදේශ විනිමය

විදේශ විනිමය ගනුදෙනු පාලනය කරනු ලැබුවා වූ 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කරලීමේ අරමුණින් ස්ථාපිත කරන ලද විනිමය පාලන දෙපාර්තමේන්තුව 2017 නොවැම්බර් 19 දින තෙක් විනිමය පාලන පනත යටතේ සිය බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාවෙහි නංවන ලදී.

ප්‍රාග්ධන ප්‍රවාහයන් තවදුරටත් ලිහිල් කිරීම, විදේශ විනිමය ගනුදෙනු හා සම්බන්ධ ක්‍රියාවලීන් සරල කිරීම සහ ශ්‍රී ලංකා රජය විසින් 2016 සහ 2017 අයවැය යෝජනාවන්හිදී කරන ලද නිවේදනයන්ට අනුගතවීම අරමුණු කර ගනිමින් විදේශ විනිමය මෙහෙයුම් කටයුතු සඳහා 2017 වර්ෂය තුළදී නව නෛතික සහ ප්‍රතිපත්තිමය රාමුවක් හඳුන්වා දෙන ලදී.

ඒ අනුව, විදේශ විනිමය ප්‍රවර්ධනය හා නියාමනය කිරීම සඳහා ප්‍රතිපාදනයන් සපයමින්ද, එකී වගකීම ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට පවරා දෙමින්ද, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත, 2017 නොවැම්බර් 20 දින සිට බලාත්මක කරන ලදී. විදේශ විනිමය අධ්‍යක්ෂවරයා ප්‍රධානියා ලෙස කටයුතු කරනු ලබන අළුතින් ස්ථාපිත විදේශ විනිමය දෙපාර්තමේන්තුව හරහා නව පනතේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කෙරෙන අතර, නව නීතිය ක්‍රියාත්මකවීමත් සමග විනිමය පාලන දෙපාර්තමේන්තුවේ කාර්යයන් 2017 නොවැම්බර් 19 දින අවසන් කරන ලදී.

මෙම සටහනේ 9.1 ඡේදය මගින් විනිමය පාලන පනත යටතේ 2017 නොවැම්බර් 19 දක්වා විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් සඳහන් කරනු ලබන අතර 9.2 ඡේදය යටතේ විදේශ විනිමය පනත ප්‍රකාරව විදේශ විනිමය දෙපාර්තමේන්තුව මගින් ඉටු කරන ලද ක්‍රියාකාරකම් සඳහන් කරනු ලැබේ.

## 9.1 විනිමය පාලනය

විනිමය පාලන පනත යටතේ 2017 වර්ෂය තුළදී ඉටු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් හා කාර්යයන් පහත සාරාංශගත කෙරේ.

### 9.1.1 විදේශ විනිමය ගනුදෙනු සඳහා පොදු අවසරයන් ප්‍රදානය කිරීම.

(අ) බලයලත් වෙළෙඳුන් හට එනම් බලපත්‍රලාභී වාණිජ බැංකු, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ විදේශ විනිමය ගනුදෙනු සිදු කරනු ලබන අනෙකුත් ආයතන හට විධානයන් නිකුත් කිරීම.

2017 වර්ෂය තුළදී විනිමය පාලන පනත යටතේ බලයලත් වෙළෙඳුන් හට නිකුත් කරන ලද විධානයන් මෙම වාර්තාවේ III කොටසේ දක්වන අතර එහි සාරාංශයක් පහත සඳහන් කරනු ලැබේ.

i) 2017 අංක 01 සහ 02 දරන විධානයන්: ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන් හා ද්විත්ව පුරවැසියන් හට ණය ප්‍රදානය කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙන ලදී.

ii) 2017 අංක 03, 04, 05 සහ 06 දරන විධානයන්: අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදෙමින් බලයලත් වෙළෙඳුන් හට නිකුත් කළ විධානයන් හා සමගාමීව ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත විධානයන් නිකුත් කරන ලදී.

iii) 2017 අංක 07 දරන විධානයන්: දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනයන් යටතේ, 'නිදහස් ව්‍යාපෘති' වල නියැලී සිටින වෘත්තීය සේවා සැපයුම්කරුවන් හට 'ආදායම් බදු නිදහස් කිරීම්' ප්‍රදානය නොකරන හෙයින් බලයලත් වෙළෙඳුන් විසින් අළුතින් අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් හා ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමේ හැකියාව ඉවත් කර ගන්නා ලදී.

iv) 2017 අංක 08, 09, 10, 11, 12 සහ 13 දරන විධානයන්: අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් හට නිකුත් කරන ලද විධානයන් හා සමගාමීව LOLC ෆයිනෑන්ස් සමාගම, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් සමාගම සහ LB ෆිනෑන්ස් සමාගම වෙත විධානයන් නිකුත් කරන ලදී.

v) 2017 අංක 14 සහ 15 දරන විධානයන්: බලයලත් පුද්ගලයන් වෙනුවෙන් අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම සඳහා මෙල්ස්ටා රීගල් ෆයිනෑන්ස් සමාගම හට අවසර ලබාදෙන ලදී.

### 9.1.2 විදේශ විනිමය ගනුදෙනු සඳහා විශේෂ අවසරයන් ප්‍රදානය කිරීම.

(අ) විශේෂිත අරමුණු උදෙසා විනිමය පාලන පනත යටතේ ප්‍රදානය කරන ලද විශේෂ අවසරයන් සංඛ්‍යා සටහන II - 18 හි දක්වා ඇත.

**II - 18 සංඛ්‍යා සටහන**

**විනිමය පාලන පනත යටතේ විදේශ විනිමය ගනුදෙනු සඳහා ප්‍රදානය කරන ලද විශේෂ අවසරයන්**

| අරමුණ | අනුමැතීන් ගණන | වටිනාකම ඇ.එ.ජ.ඩොලර් |
|---|---|---|
| නේවාසික සමාගම් විසින් විදේශයන්හි ආයෝජනය කිරීම සඳහා | 9 | 23.10 |
| නේවාසික සමාගම් විසින් විදේශයන්ගෙන් ණය ලබා ගැනීම සඳහා | 19 | 177.7 |
| සමාගම්/ පුද්ගලයන් විසින් කොටස් නිකුත් කිරීම/ලියාපදිංචි කිරීම/ අනේවාසිකයන්ගේ නමින් කොටස් පැවරීම සඳහා | 78 | අදාළ නොවේ |
| බලයලත් වෙළෙඳුන් හට නිකුත් කර ඇති විධානයන් යටතේ ආවරණය නොවන විවිධ ගනුදෙනුවල නියැලීම සඳහා | 58 | අදාළ නොවේ |
| බලයලත් වෙළෙඳුන් විසින් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම සඳහා | 10 | අදාළ නොවේ |
| නේවාසික සමාගම් විසින් සංස්ථාපිත ඇපකර නිකුත් කිරීම සඳහා | 15 | 83.12 |

(ආ) මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ නියැලීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම.

2017 නොවැම්බර් 19 වන විට, මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ නියැලීම සඳහා සමාගම් 5කට පහත දැක්වෙන පරිදි නව බලපත්‍ර නිකුත් කරන ලද අතර, එක් සමාගමක් මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයෙන් ඉවත් වන ලදී. ඒ අනුව, විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සඳහා අවසර පත්‍ර 57 ක් ද, විදේශ ව්‍යහාර මුදල් මිලදී ගැනීම හා විකිණීම සඳහා අවසර පත්‍ර 13 ක් වශයෙන් ද සමාගම් 70 ක් මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ නියැළිණි. දැනට සිටින මුදල් මාරු කරන්නෙකු හට නව ශාඛාවක් විවෘත කිරීම සඳහා ද 2017 වර්ෂය තුළදී අනුමැතිය ප්‍රදානය කරන ලදී.

**II - 19 සංඛ්‍යා සටහන**

**මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ නියැලීම සඳහා සමාගම් හට බලපත්‍ර නිකුත් කිරීම**

| ආයතන කාණ්ඩය | අවසරලත් ව්‍යාපාරික කටයුතු | නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ පමණක්ම නියැලෙන සීමිත සමාගම් | විදේශ මුදල් මිලදී ගැනීම හා හුවමාරු කිරීම | 03 |
| | විදේශ මුදල් මිලදී ගැනීම, හුවමාරු කිරීම සහ විකිණීම | - |
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | විදේශ මුදල් මිලදී ගැනීම, හුවමාරු කිරීම සහ විකිණීම | - |
| විශේෂිත මූල්‍ය සමාගම් | විදේශ මුදල් මිලදී ගැනීම, හුවමාරු කිරීම සහ විකිණීම | 01 |
| සංචාරක හෝටල් | විදේශ මුදල් මිලදී ගැනීම | 01 |
| එකතුව | | 05 |

### 9.1.3 නව විදේශ විනිමය කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම.

(අ) විදේශ විනිමය පනත් කෙටුම්පත පිළිබඳ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

විනිමය පාලන දෙපර්තමේන්තුව, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේද සහයෝගය ඇතිව විදේශ විනිමය වෙළෙඳපොළ කෙරෙහි යෝජිත ප්‍රතිපත්තිවල විභව බලපෑම හා පහසුවෙන් ක්‍රියාත්මක කළහැකි ආකාර ආදිය සැළකිල්ලට ගනිමින් විදේශ විනිමය පනත් කෙටුම්පත පිළිබඳව අවස්ථා කිහපයකදීම නිරීක්ෂණයන් ඉදිරිපත් කරන ලදී.

(ආ) විදේශ විනිමය පනතේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීම පිණිස රෙගුලාසි/නියෝගයන්, නියමයන් හා විධානයන් සම්පාදනය කිරීම.

ගරු කතානායකවරයා විසින් 2017 ජූලි 28 දින විදේශ විනිමය පනත සහතික කිරීමෙන් අනතුරුව, විනිමය පාලන දෙපාර්තමේන්තුව, විදේශ විනිමය පනත යටතේ ඇමතිවරයා විසින් නිකුත් කිරීම පිණිස නියෝගයන් හා නියමයන් සම්පාදනය කිරීමෙහි නියැළිනි. එම නියෝගයන් 2017 නොවැම්බර් 17 දින රජයේ ගැසට් නිවේදනයන් හි පළ කරන ලදී. විදේශ විනිමය පනත 2017 නොවැම්බර් 20 දින බලාත්මක වන ලදී. විදේශ විනිමය පනත යටතේ වන නියෝගයන් හා නියමයන් මෙම වාර්තාවේ III කොටසේ දැක්වෙන අතර, ඒ පිළිබඳ සාරාංශයක් මෙම සටහනේ 9.2 ඡේදයේ දැක්වේ.

### 9.1.4 විගමනික අරමුදල් ප්‍රේෂණය.

2013 ජුනි 12 හෝ ඊට පසු දිනෙක වෙනත් රටක ස්ථිර නේවාසික වීසා ලබාගත් ශ්‍රී ලාංකිකයන් හට විගමනික දීමනාව නිදහස් කිරීම පිණිස සංක්‍රමණික ආවෘත ගිණුම් 108 ක් විවෘත කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර දෙන ලදී. තවද, 2013 ජුනි 12 දිනට පෙර වෙනත් රටක ස්ථිර නේවාසිකත්වය ලබාගත් ශ්‍රී ලාංකික විගමනිකයන් 207 දෙනෙකු හට අනේවාසික ආවෘත ගිණුම් හරහා ශ්‍රී ලංකාවෙන් පිටතට අරමුදල් ප්‍රේෂණය කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

### 9.1.5 විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය හා සුපරීක්ෂණය/විමර්ෂනය.

(අ) එතැන් පරීක්ෂණ

විධානයන් හා විදේශ විනිමය මෙහෙයුම් සම්බන්ධයෙන් විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් සඳහන් කර ඇති අනෙකුත් අවශ්‍යතාවයන් සමඟ බලයලත් වෙළෙඳුන් දක්වන අනුකූලතාවය තහවුරු කිරීම පිණිස එතැන් පරීක්ෂණ 32 ක් සිදු කරන ලද අතර, මුදල් මාරු කරන්නන් හට නිකුත් කර ඇති බලපත්‍රවල සඳහන් කොන්දේසි හා නියමයන් සමඟ ඔවුන් දක්වන අනුකූලතාවය සනාථ කර ගැනීම පිණිස එතැන් පරීක්ෂණ 31 ක් සිදු කරන ලදී.

(ආ) විමර්ශනයන්

විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් ප්‍රකාරව විමර්ශනයන් 244 ක් සිදු කරන ලදී. විමර්ශනයන් 45 ක් අවසන් කිරීමෙන් අනතුරුව එකී විමර්ශනයන්වල අදාළ පාර්ශ්වයන්ට එරෙහිව පනවන ලද දඩ මුදල් වශයෙන් රුපියල් මිලියන 82.33 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලදී. ඉතිරි විමර්ශනයන් 199, විදේශ විනිමය පනතේ 30(2) (ආ) වගන්තිය ප්‍රකාරව, 2018 මැයි 20 දිනට පෙර සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. මෙම විමර්ශනයන් වලින් බහුතරයක්ම පොදු අවසරයන්හි දක්වා ඇති ක්‍රියාපටිපාටීන් උල්ලංඝනය කරමින් සුරැකුම්පත්/කොටස් නිකුත් කිරීම හා පැවරීම, නේවාසිකයන් විසින් අනේවාසිකයන් හට කරනු ලැබූ අනවසර ගෙවීම්, විනිමය පාලක විසින් නිකුත් කරන ලද විධානයන්/මෙහෙයුම් උපදෙස්වලට බලයලත් වෙළෙඳුන් අනුකූල නොවීම, බලයලත් මුදල් මාරු කරන්නන් හට නිකුත් කර ඇති බලපත්‍රවල සඳහන් කොන්දේසි උල්ලංඝනය කිරීම සහ අනවසරයෙන් විදේශ මුදල් තමා සන්තකකයේ රඳවා තබා ගැනීම යනාදිය සමඟ සම්බන්ධ වේ.

(ඇ) නීති බලාත්මක කිරීමේ අධිකාරීන් හට ද විශේෂ සාක්ෂි/වාචික සාක්ෂි ලබාදීම මගින් නඩු හා අධිකරණ කටයුතුවලට සහාය දක්වන ලදී.

**9.1.6 විනිමය පාලන රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම.**

පවත්නා රෙගුලාසි සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් දැනුවත් බවට තහවුරු කර ගැනීම, යෝජිත නව රෙගුලාසි සම්බන්ධයෙන් ඔවුන්ගේ යෝජනා විමසීම හා ඇගයීම අරමුණු කරගනිමින් අන්තර් ක්‍රියාකාරී රැස්වීම් 5 ක් පවත්වන ලදී. තවද, විදේශ විනිමය රෙගුලාසි සම්බන්ධයෙන්, උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම පිණිස බදුල්ල, නුවරඑළිය, මාතර, අම්පාර වැනි දුරස්ථ ප්‍රදේශයන්හි වැඩ සටහන් 4ක් පවත්වන ලදී.

## 9.2 විදේශ විනිමය

ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනු සිදු කිරීමේදී මනා කාර්යක්ෂමතාවයක් හා සඵලදායීත්වයක් ළඟා කර ගැනීම සහ රට තුලට එන සහ රටින් පිටතට යන ප්‍රාග්ධන ප්‍රවාහයන් බොහෝදුරට බාධාකාරී බවට පවත්නා මතයට පිළියමක් වශයෙන් ආර්ථික ක්‍රියාකාරකම්වලට සාර්ව මට්ටමින් පහසුකම් සැලසීම අරමුණු කර ගනිමින් විනිමය පාලන පනත අවලංගු කර නව විදේශ විනිමය පනත ක්‍රියාත්මක කරන ලදී.

සීමා කිරීම් අඩු කිරීම, ව්‍යාකූලත්වයන් බැහැර කිරීම, ගනුදෙනු හා සම්බන්ධ ක්‍රියාවලීන් සරල කිරීම සහ විදේශ විනිමය ගනුදෙනු සිදුකිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම හරහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ හා විභව ආයෝජකයන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම පිණිස නව රෙගුලාසි විදේශ විනිමය ගනුදෙනු පාලනය කිරීමට වඩා ඒවාට පහසුකම් සැලසීම කෙරෙහි යොමුවේ.

ඒ අනුව, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වන්නේ බලයලත් වෙළෙඳුන් සහ පරිසීමිත වෙළෙඳුන් හට බලතල/අවසර ප්‍රදානය කිරීම, බලයලත් වෙළෙඳුන් සහ පරිසීමිත වෙළෙඳුන් හට විධානයන් හා මාර්ගෝපදේශයන් නිකුත් කිරීම, මහජනතාව වෙත ගැසට් නිවේදන නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම, විශේෂිත විදේශ විනිමය ගනුදෙනු සඳහා අනුමැතීන් ප්‍රදානය කිරීම, බලයලත් වෙළෙඳුන්ගේ/ පරිසීමිත වෙළෙඳුන්ගේ තීරණවලට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනා සළකා බැලීම, විදේශ විනිමය සුපරීක්ෂණය හා විමර්ශනය, අදාළ රෙගුලාසි පිළිබඳ බලයලත් වෙළෙඳුන්ගේ, පරිසීමිත වෙළෙඳුන්ගේ සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම හා ශක්‍යතා ප්‍රවර්ධනය කිරීම යනාදියයි.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් හා කාර්යයන් පහත සාරාංශගත කෙරේ.

**9.2.1 බලයලත් වෙළෙඳුන්/පරිසීමිත වෙළෙඳුන් හට බලතල/අවසර ප්‍රදානය කිරීම.**

විදේශ විනිමය පනත ප්‍රකාරව, බලයලත් වෙළෙන්ඳන් ලෙස කටයුතු කිරීම සඳහා සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවකටම සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව හට (අවසර ලබාදී ඇති ප්‍රමාණය දක්වා) බලය ලබාදෙන ලදී. පරිසීමිත වෙළෙන්ඳන් ලෙස විදේශ විනිමයෙන් ගනුදෙනු කිරීම සඳහා මුදල් මාරු කරන්නන්, හෝටල්, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් ආදිය හටද බලය ලබාදෙන ලදී. ඒ අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට බලයලත් වෙළෙඳුන් 26 ක් ද පරිසීමිත වෙළෙඳුන් 70 ක් ද වූ අතර ඔවුන්ගේ නම් ඇමුණුම II - 2 හි දැක්වේ.

**9.2.2 විදේශ විනිමය ගනුදෙනු සඳහා පොදු අවසර ප්‍රදානය කිරීම.**

(අ) විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයනු ලැබූ ගැසට් නිවේදන නිකුත් කිරීම

විදේශ විනිමය පනතේ 5, 7 සහ 8 වගන්ති සමඟ කියවෙන එකී පනතේ 29 වගන්තිය යටතේ ඇමතිවරයා විසින් නිකුත් කරනු ලැබූ නියෝගයන් සහ විදේශ විනිමය පනතේ 8 සහ 31 වගන්ති යටතේ නිකුත් කරනු ලැබූ නියමයන් 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කෙරුණු අතර ඒවා මෙම වාර්ෂික වාර්තාවේ III කොටසේ දැක්වේ. මෙම නියෝගයන්/නියමයන් හරහා හඳුන්වාදුන් ප්‍රධාන වෙනස්කම් පහත සාරාංශගත කෙරේ.

i) 2017 අංක 01 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග

- ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් සිදු කරනු ලබන විදේශ ආයෝජනයන් මත පැවති සීමාවන් ඉහළ නංවන ලද අතර, තවත් ආයෝජන අවස්ථා නිර්මාණය කරමින් එවැනි ආයෝජනයන් සඳහා පැවති ක්ෂේත්‍රයන් (කොටස් සහ ස්වෛරීත්ව බැඳුම්කරවල සිට ඒකක සහ ණය සුරැකුම්පත් දක්වා) පුළුල් කරන ලදී.
- අදාළ ලේඛන ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බලයලත් වෙළෙඳුන් සමග පවත්වාගෙන යනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හරහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවන් ප්‍රේෂණය කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදුන් අතර, විගමනිකයන් හට වෙනත් රටවල පදිංචිවීමට පහසුකම් සළසමින් විගමනික ප්‍රේෂණයන් සඳහා පැවති සීමාවන් ඉහළ නංවන ලදී.
- නව අවස්ථාවන් නිර්මාණය කරමින්ද, අනාගත ආයෝජකයන් හට පවත්නා ආයෝජන මාර්ග යන් ඉහළ නංවමින්ද, මූල්‍ය ආයතනවල ස්ථාවර තැන්පතු, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් ඕනෑම ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත්, ශ්‍රී ලංකාවේ සංස්ථාගත නොකළ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කරන ලද සමාගම්වල කොටස් ආදිය ඇතුලත් කරමින් අනේවාසිකයන් විසින් ශ්‍රී ලංකාවේ සිදු කරනු ලබන ආයෝජනයන්ට අදාළ ක්ෂේත්‍රයන් පුළුල් කරන ලදී.
- අදාළ රෙගුලාසි සරල කිරීමේ අරමුණින්, පෙර පැවති ණය ක්‍රම 3 ක් ඒකාබද්ධ කරමින්, විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් සඳහා නව තනි ණය ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

ii) 2017 අංක 2 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග සහ 2017 අංක 3 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ) නියෝග

- විදේශ විනිමය ගනුදෙනුවලදී පැහැදිලි බව සහ පහසුව පවත්නා බව තහවුරු කර ගනිමින් විනිමය පාලන පනත යටතේ අවසර ලබාදී තිබූ ගිණුම් වර්ග 18 ක්; පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, ආමුඛ ආයෝජන ගිණුම්, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සහ ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් නමින් කාණ්ඩයන් 5කට වර්ගීරණය කරන ලදී.

iii) පනතේ 8 වගන්තිය යටතේ නියමය

අන්තර්ජාතික ප්‍රතිමානයන් අනුගමනය කරමින්, ශ්‍රී ලංකාවට පැමිණෙන පුද්ගලයන් විසින් ආපසු රැගෙන යාමේ බලාපොරොත්තුවෙන් විදේශ මුදල් නෝට්ටු රැගෙන ඒමේදී රේගුවට ප්‍රකාශ කළයුතු සීමාව ඇ.එ.ජ. ඩොලර් 10,000 දක්වා ඉහළ නංවන ලදී. තවද, නියමයේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව ඇ.එ.ජ.ඩොලර් 10,000 හෝ ඊට සමාන විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණයක් ඕනෑම කාලසීමාවක් දක්වා තමා සන්තකයේ රඳවා තබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික ඕනෑම පුද්ගලයෙකු හට අවසර ලබාදෙන ලදී.

iv) පනතේ 31 වගන්තිය යටතේ නියමය

විනිමය පාලන පනත පරිදි ස්ථිර නේවාසික ස්ථානය සළකා බැලීම වෙනුවට ශ්‍රී ලංකාව තුළ ගත කරන ලද සමාහාර දින ගණන මත පදනම්ව (එනම් දින 183 හෝ ඊට වැඩි) පුද්ගලයෙකුගේ නේවාසික තත්ත්වය තීරණය කිරීම සඳහා නව නිර්ණායකයක් හඳුන්වාදෙන ලදී.

(ආ) බලයලත් වෙළෙඳුන් හට විධානයන් නිකුත් කිරීම.

විදේශ විනිමය පනත යටතේ බලයලත් වෙළෙඳුන් හට නිකුත් කරනු ලැබූ විධානයන් මෙම වාර්තාවේ III කොටසේ දැක්වෙන අතර සාරාංශයක් පහත දෙනු ලැබේ.

i) 2017 අංක 01 දරන විධානයන්: විධානයන්හි සඳහන් කර ඇති කොන්දේසි හා නියමයන්වලට යටත්ව ජංගම ගනුදෙනු සිදු කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී.

ii) 2017 අංක 02 දරන විධානයන්: රාජ්‍ය තාන්ත්‍රික විදෙස් ගමන් බලපත්‍ර හා රාජ්‍ය තාන්ත්‍රික හැඳුනුපත් ඇති විදේශීය පුරවැසියන් හා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් හට, ඔවුන්ගේ ශ්‍රී ලංකාවේ ඇති විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ඇපයට තබාගෙන එම ගිණුම්වල පවත්නා අරමුදල් වලින් 90% සීමාවක් දක්වා ණය කාඩ්පත් නිකුත් කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී.

iii) 2017 අංක 03, 04, 05 සහ 08 දරන විධානයන්: නියෝගවල සඳහන් කර ඇති නියමයන් හා කොන්දේසිවලට අමතරව පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් සඳහා අදාළ වන නියමයන් හා කොන්දේසි බලයලත් වෙළෙඳුන් හා පරිසීමිත වෙළෙඳුන් හට දක්වන ලදී.

iv) 2017 අංක 06 දරන විධානයන්: නේවාසික ආගන්තුකයන් සඳහා වන යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවට පැමිණෙන ආයෝජකයන් සහ වෘත්තිකයන් වෙනුවෙන් නේවාසික ආගන්තුක විදේශ ව්‍යහාර මුදල් ගිණුම් සහ නේවාසික ආගන්තුක රුපියල් ගිණුම් විවෘත කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී.

v) 2017 අංක 07 දරන විධානයන්: ''ශ්‍රී ලංකාව - මගේ සිහින නිවහන'' වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික වීසා ලබා ගන්නා ජ්‍යෙෂ්ඨ විදේශීය පුරවැසියන් වෙනුවෙන් ''ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන් සඳහා වන ස්ථාවර තැන්පතු ගිණුම්'' සහ ''ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන් සඳහා රුපියල් ගිණුම්'' විවෘත කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී.

vi) 2017 අංක 09 දරන විධානයන්: ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාව තුල සිටින පුද්ගලයන් හට විදේශ ව්‍යවහාර මුදලින් ණය ලබාදීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී.

vii) 2017 අංක 10 දරන විධානයන්: ශ්‍රී ලංකාව තුළ ඕනෑම අරමුණක් වෙනුවෙන් භාවිතා කිරීම පිණිස විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ණය සහ අත්තිකාරම් ලබාදීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී.

viii) 2017 අංක 11 දරන විධානයන්: වෙනත් රටක ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරනු ලබන ශ්‍රී ලාංකිකයන් සහ ද්විත්ව පුරවැසිභාවය සහිත පුද්ගලයන් හට, ඔවුන්ගේ නේවාසික තත්ත්වය නොසළකා හරිමින්, ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් අත්පත් කර ගැනීම/ඉදි කිරීම/සංවර්ධනය කිරීම/නවීකරණය කිරීම යන අරමුණු උදෙසා ණය ප්‍රධානය කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී.

ix) 2017 අංක 12 දරන විධානයන්: ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර අත්පත් කරගැනීම, රඳවා ගැනීම සහ මාරු කිරීම යන අරමුණු උදෙසා ''ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන ගිණුම්'' සහ ''බැඳුම්කර ආයෝජන සඳහා වූ ඩොලර් ගිණුම්'' පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීමේ සහ අලෙවි කිරීමේ නියෝජිතයන් ලෙස පත්කරන ලද ප්‍රාථමික වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී.

x) 2017 අංක 13 දරන විධානයන්: ආමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දුන් අතර, නියෝගයන්හි සඳහන් කර ඇති කොන්දේසි හා නියමයන්වලට අමතරව වන කොන්දේසි හා නියමයන් ද දැනුම් දෙන ලදී.

xi) 2017 අංක 14 දරන විධානයන්: ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දුන් අතර, නියෝගයන්හි සඳහන් කර ඇති කොන්දේසි හා නියමයන්වලට අමතරව වන කොන්දේසි හා නියමයන් ද දැනුම් දෙන ලදී.

xii) 2017 අංක 15 දරන විධානයන්: බැංකු ඇපකර, බැඳුම්කර, ණයවර ලිපි නිකුත් කිරීම සහ අළුත් කිරීම සඳහාත්, සංස්ථාපිත ඇපකර සම්බන්ධයෙන් ගෙවීම් කිරීමටත් බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී.

### 9.2.3 විදේශ විනිමය ගනුදෙනු සඳහා විශේෂ අවසරයන් ප්‍රදානය කිරීම.

විශේෂිත අරමුණු වෙනුවෙන් විදේශ විනිමය පනත යටතේ ප්‍රදානය කරන ලද විශේෂිත අවසරයන් සංඛ්‍යා සටහන II - 20 හි දක්වා ඇත.

**II - 20 සංඛ්‍යා සටහන**

**විදේශ විනිමය පනත යටතේ ලබා දුන් විශේෂ අවසරයන්**

| අරමුණ | අනුමැතීන් ගණන | වටිනාකම ඇ.එ.ජ.ඩොලර් |
|---|---|---|
| නේවාසික සමාගම් විසින් විදේශයන්හි ආයෝජනය කිරීම සඳහා | 01 | 30 |
| බලයලත් වෙළෙඳුන් විසින් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම සඳහා | 03 | අදාළ නොවේ |

### 9.2.4 විගමනික අරමුදල් ප්‍රේෂණය කිරීම.

ශ්‍රී ලාංකික විගමනිකයන් හට සංක්‍රමණික දීමනාව හා විජාතිකයන් හට උරුම වූ වත්කම්/අරමුදල් නිදහස් කිරීම පිණිස ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් 148 ක් විවෘත කිරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී.

### 9.2.5 විදේශ විනිමය රෙගුලාසි පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම.

නව විදේශ විනිමය කළමනාකරණ රාමුව පිළිබඳව බැංකුකරුවන් සහ මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියසෙහිදී දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. ඊට අමතරව, නව විදේශ විනිමය රාමුව පිළිබඳව මහජනතාව හා අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම පිණිස විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය ලෙස www.dfe.lk දියත් කරන ලදී.

**ඇමුණුම II - 2**

**2017.12.31 දිනට බලයලත් වෙළෙඳුන්ගේ ලැයිස්තුව**

| | |
|---|---|
| බලපත්‍රලාභී වාණිජ බැංකු | |
| 1. | අමානා බැන්ක් පී.එල්.සී. |
| 2. | ඇක්සිස් බැන්ක් ලිමිටඩ් |
| 3. | ලංකා බැංකුව |
| 4. | කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් |
| 5. | සිටි බැන්ක් එන්.ඒ. |
| 6. | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. |
| 7. | ඩොයිෂ් බැන්ක් ඒ.ජී. |
| 8. | ඩී.එෆ්.සී.සී. බැන්ක් පී.එල්.සී. |
| 9. | හබීබ් බැන්ක් ලිමිටඩ් |
| 10. | හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. |
| 11. | ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් |
| 12. | අයි.සී.අයි.සී.අයි. බැන්ක් ලිමිටඩ් |
| 13. | ඉන්දියන් බැන්ක් |
| 14. | ඉන්දියන් ඕවර්සීස් බැන්ක් |
| 15. | එම්සීබී බැන්ක් ලිමිටඩ් |
| 16. | නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. |
| 17. | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. |
| 18. | පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. |
| 19. | මහජන බැංකුව |
| 20. | පබ්ලික් බැන්ක් බර්හාඩ් |
| 21. | සම්පත් බැන්ක් පී.එල්.සී. |
| 22. | සෙලාන් බැන්ක් පී.එල්.සී. |
| 23. | ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැන්ක් |
| 24. | ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා |
| 25. | යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී. |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | |
| 26. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව |

**2017.12.31 දිනට පරිසීමිත වෙළෙඳුන්ගේ ලැයිස්තුව**

| | |
|---|---|
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | |
| 1 | ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පී.එල්.සී. |
| 2 | බිම්පුත් ෆිනෑන්ස් පී.එල්.සී |
| 3 | සිටිසන්ස් ඩිවලප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පී.එල්.සී |
| 4 | එල් ඕ එල් සී ෆිනෑන්ස් පී.එල්.සී |
| 5 | එල් බී ෆිනෑන්ස් පී.එල්.සී |
| 6 | සෙන්කඩගල ෆිනෑන්ස් පී.එල්.සී |
| 7 | සිංහපුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී |
| 8 | සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී. |
| විශේෂිත කල්බදු සමාගම් | |
| 9 | එස් එම් බී ලීසිං පී.එල්.සී. |

| | |
|---|---|
| සංචාරක හෝටල් | |
| 10 | පර්ල් සිටි හොටෙල් |
| 11 | ෂැංග්‍රිලා හම්බන්තොට රිසෝට් ඇන්ඩ් ස්පා |
| 12 | සීගිරිය ජංගල්ස් |
| බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් | |
| 13 | ඒ ඕ ලක්ෂ්මී ජුවෙල්ස් (පුද්.) සමාගම |
| 14 | ආබ්දීන් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 15 | ආරියවංශ එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම |
| 16 | අරුජිනා ජුවලරි (පුද්.) සමාගම |
| 17 | අරුණ ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 18 | ඒෂියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 19 | බ්‍රෙස්සියා ග්‍රාමීන් (පුද්.) සමාගම |
| 20 | බුලියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 21 | කැපිටල් එක්ස්චේන්ජ් පුද්. සමාගම |
| 22 | සිටි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 23 | කළම්බු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 24 | කුවුන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 25 | දැඩිගම ගෲප් (පුද්.)සමාගම |
| 26 | ඩේටා එක්ස්චේන්ජ් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම |
| 27 | දයා ඕතරයිස්ඩ් මනි චේන්ජර් (පුද්.) සමාගම |
| 28 | ඩෙල්ටා සරත් හෝල්ඩින්ස් (පුද්.) සමාගම |
| 29 | දේවි ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 30 | ජෝර්ජ් මයිකල් හොල්ඩින්ස් (පුද්.) සමාගම |
| 31 | ග්ලෝබල් විලේජ් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 32 | ගෝල්ඩන් මනිචේන්ජර් (පුද්.) සමාගම |
| 33 | ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 34 | ජයේස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් |
| 35 | ජුවෙල් ලංකා මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 36 | කමල් එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම |
| 37 | කේසර් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 38 | කුඩාමඩු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 39 | එම්.පී. මනි චේන්ජර් (පුද්.) සමාගම |
| 40 | මැජෙස්ටික් ජුවෙලරි (පුද්.) සමාගම |
| 41 | මරුති මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 42 | මයුරි මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 43 | මෙට්රෝ ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 44 | මිඩ්නා මිනි මාර්කට් (පුද්.) සමාගම |
| 45 | මිලානෝ මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 46 | මොන්ටිකාලෝ එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 47 | නර්මදා ගෝල්ඩ් සෙන්ටර් (පුද්.) සමාගම |
| 48 | නිව් නටාෂා (පුද්.) සමාගම |
| 49 | නිව් රීගල්ස් මනි චේන්ජර් (පුද්.) සමාගම |
| 50 | පාත් ෆයින්ඩර් (පුද්.) සමාගම |
| 51 | පර්ල් එක්සි (පුද්.) සමාගම |
| 52 | ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 53 | පුෂ්පා මනි චේන්ජර් (පුද්.) සමාගම |
| 54 | රෆීක්ස් ජෙම්ස් (පුද්.) සමාගම |
| 55 | රවී ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 56 | රිම්හා ජුවලරි (පුද්.) සමාගම |
| 57 | රිවිඳු එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම |
| 58 | රෙඩ් රූබි ජුවලර්ස් (පුද්.) සමාගම |
| 59 | රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 60 | රෝයල් මනි මාර්ට් (පුද්.) සමාගම |
| 61 | සලාකා ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් (පුද්.) සමාගම |
| 62 | ශාරන්ගා මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 63 | ෂිෆාස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 64 | එස් එස් ඩී ඩී මනි එක්ස්චේන්ජින් (පුද්.) සමාගම |
| 65 | ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 66 | තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම |
| 67 | යුනික් ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 68 | වසන්තාස් ඉන්ටර්නැෂනල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 69 | වෙස්ටර්න් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 70 | වින්ඩ්සර් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |

## 10. පහසුකම් කළමනාකරණ

2017 දී ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලය ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය ආරම්භ කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින්/පාර්ශ්වකරුවන් සඳහා ප්‍රසන්න හා සුවපහසු සේවා පරිසරයක් ලබා දීමට කටයුතු කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ විදුලි හා යාන්ත්‍රික සේවා වල ගුණාත්මක බව පිළිබඳ අවධානය යොමු කරමින් මහ බැංකුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ශක්තිමත්භාවය තහවුරු කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින්ට කිසිදු බාධාවකින් තොරව සිය කාර්යයන් ඉටු කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් ඇති කර ගැනීම උදෙසා අත්‍යවශ්‍ය ගොඩනැගිලි පහසුකම්වල විශ්වසනීයත්වය සහ කාර්යක්ෂමතාව සහතික කිරීමට පියවර ගෙන තිබේ. තීරණාත්මක මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සේවාවන් නිසි ලෙස ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා නිරන්තර පරීක්ෂාවන් සිදු කරන ලදී. තවද, නිරීක්ෂණ හා අධීක්ෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ CCTV ආවරණය වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම පිළිබඳ මූලික කටයුතු ආරම්භ කරන ලදී.

මූල්‍ය නීති පනතට අනුප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ දේපළ/ගොඩනැගිලි කුලියට ලබා දීම පිළිබඳ ප්‍රධාන ප්‍රතිපත්ති තීරණයක් ගනු ලැබීය. ඒ අනුව 2019 අවසාන වීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ දැනට කුලී සහ කල්බදු පදනම මත ලබා දී ඇති සියලු දේපළවලින් ඉවත් වන ලෙසට වූ මූල්‍ය මණ්ඩල තීරණය සියලු කුලී/කල්බදු ගැනුම්කරුවන් වෙත දැනුම් දෙන ලදී.

මාතර සහ මාතලේ, කිලිනොච්චි, සෝමාවතී නිවාඩු නිකේතනය, සවරින් නිවස්නයේ දේපළ පිළිබඳ ඉදිකිරීම් හා නඩත්තු ව්‍යාපෘති කිහිපයක් අවශ්‍ය ප්‍රමිතීන් හා ඵලදායීතාවයන් සපුරාලමින් සම්පූර්ණ කරන ලදී.

මීට අමතරව දශකයකට පමණ පෙර මිලදී ගන්නා ලද පිරිමැසුම්දායක නොවන වාහන 11 ක් ටෙන්ඩර කැඳවා විකිණීමට පියවර ගන්නා ලදී. ප්‍රවාහන පහසුකම්වල විශ්වසනීයත්වය හා පිරිවැය ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා 2018 වර්ෂය සඳහා විද්‍යුත් බිල්පත්කරණය සහ තත්කාලීන වාහන නිරීක්ෂණය ඇතුළු නවීන පහසුකම් සහිත කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සැපයිය හැකි බාහිර සේවා සපයන්නන්ගෙන් සේවා ලබා ගැනීමට කටයුතු කරන ලදී.

තවද, 2017 ජූලි මස පැවති ආසියානු/පැසිෆික් මුදල් විශුද්ධිකරණ රැස්වීමේ දී 400කට අධික විදේශ හා ශ්‍රී ලංකා මහ බැංකු නියෝජිතයන් සඳහා කාර්යක්ෂම හා උචිත ප්‍රවාහන පහසුකම් සැපයීමට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකි විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක සේවිකාවන් සහ විශ්‍රාමිකයන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නව ක්‍රමවේදයක් යටතේ නිවාඩු පහසුකම් සපයනු ලැබීය. පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවල ගුණාත්මක බව පිළිබඳ වූ වාර්ෂික සමීක්ෂණය 2017. 03 කාර්තුවේදී පවත්වන ලද අතර, ලද ප්‍රතිචාර මත සේවා වැඩිදියුණු කිරීම සඳහා සුදුසු පියවර ගන්නා ලදී.

## 11. මූල්‍ය කටයුතු

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ මුදල් නීති පනතේ අදාළ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යය මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, මහ බැංකුවේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම හා නිරීක්ෂණය කිරීම, මහ බැංකුවේ අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීමේ පද්ධතියක් පවත්වාගෙන යෑම, දායක අරමුදල් මුදාහැරීම සහ රාජ්‍ය විදේශීය ණය ආපසු ගෙවීම, මූල්‍ය ගනුදෙනු අභ්‍යන්තර වාර්තාකරණය සඳහා පද්ධති පවත්වා ගෙන යෑම, අභ්‍යන්තර අරමුදල් 17 ක් කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම සහ සේවක ණය දත්ත සංචිතය පවත්වාගෙන යෑම ඇතුළත් වේ.

### 11.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය:** මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාරව, 2016 වසරේ දෙසැම්බර් මාසය හා 2017 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ මාසික ශේෂ පත්‍රයන් පිළියෙළ කරන ලදී.

(ආ) **කාර්තුමය වාර්තා:** කාර්තුමය මූල්‍ය ප්‍රගති/කාර්ය ඵල සහ තත්ත්වයන් 2017 වසරේ දී මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීම සිදු කරන ලදී.

(ඇ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන:** 2002 වර්ෂයේ සිට ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අදාළ කර ගන්නා ලදී. මූල්‍ය ප්‍රකාශන මහ බැංකු වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2017 වර්ෂය තුළ දීර්ඝ අඛණ්ඩ පදනමකින් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අවශ්‍යතාවයන් මත අනුකූලවීම සඳහා ගිණුම්කරණ පද්ධතීන් හා කාර්ය පටිපාටිය යාවත්කාලීන කරන ලදී. 2017 වර්ෂය සඳහා වූ මහ බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ II වන කොටස ආරම්භයේ දී ඉදිරිපත් කර ඇත.

(ඈ) **ජා.මූ.වා.ප්‍ර. 9 සඳහා සූදානම:** 2018 වසරේ සිට බලපැවැත්වෙන පරිදි ජා.මූ.වා.ප්‍ර. 9 සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා 2017 වසරේ දී පහත පියවර ගනු ලැබීය.

i) බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අදාළ දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.

ii) විගණන ආයතනයකින් තාක්ෂණික සහාය ලබා ගන්නා ලදී.

iii) වත්කම් වර්ගීකරණය ඇගයීම සහ හානිකරණ ආකෘතිය තීරණය කර ඇත.

iv) විගණකාධිපති විසින් පත් කරන ලද බාහිර විගණන සමාගමේ අනුමැතිය ලබාගන්නා ලදී.

v) මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව සමඟ සාකච්ඡා කොට අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් සඳහා මුදල් මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී.

vi) වත්කම් වර්ගීකරණය සම්බන්ධයෙන් ගිණුම්කරණ සහ භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතීන්ට අවශ්‍ය වෙනස් කිරීම් පරීක්ෂා කොට ක්‍රියාත්මක කරන ලද අතර ගිණුම්කරණ ක්‍රියාවලිය සඳහා තවදුරටත් අවශ්‍ය වන වෙනස් කිරීම් අවශ්‍ය පරිදි සිදු කරනු ඇත.

### 11.2 වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2018 වසර සඳහා වූ වාර්ෂික ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපායමාර්ගික සැලසුම් යටතේ ඇති කාර්යය සැලසුම්වලට අනුකූලව පිළියෙළ කරන ලදී. මෙම ක්‍රියාවලිය 2017 අගෝස්තු මස ආරම්භ කරන ලද අතර, 2017 නොවැම්බර් මස අවසන් විය. වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2017 නොවැම්බර් මස ලබා ගන්නා ලද අතර, අයවැය 2018 වසරේ වැඩ කරන මුල් දින සිටම සියලුම දෙපාර්තමේන්තුවලට ලබාදෙන ලදී. 2017 වසර සඳහා වූ අයවැයෙහි ප්‍රගතිය දැක්වෙන කාර්තුමය වාර්තා, ඵලදායි අයවැය පාලනය සඳහා මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී.

## II.3 අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීමේ පද්ධතිය

(අ) 2017 වසර තුළ දී නියමිත කාලසීමාවන් ඇතුළත සියලු අභ්‍යන්තර ගෙවීම් එනම් සේවක වේතන, සේවක ණය හා මෙහෙයුම් වියදම් යනාදිය ගෙවන ලදී.

(ආ) මහ බැංකුවේ ස්ථාවර නියෝග යටතේ ඇති ක්‍රියාපටිපාටීන්ට යටත්ව දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු සියලුම බාහිර ගෙවීම් සිදු කර ඇත. 2017 වර්ෂය ඇතුළත මුළු ගෙවීම් 4,978 ක් සිදු කරන ලද අතර, ඉන් 4,722 ක් දේශීය සැපයුම්කරුවන් සඳහාත් 256 ක් විදේශීය සැපයුම්කරුවන් සඳහාත් විය.

(ඇ) 2017 වසර තුළ දී මහා භාණ්ඩාගාරයට සහ අදාළ ව්‍යාපෘතීන් සඳහා රු.බිලියන 1,103.9 ක වටිනාකමකින් යුත් ණය අරමුදල් නිදහස් කිරීම් 2,776 ක් සහ රු.බිලියන 727.6 ක වටිනාකමකින් යුත් විදේශීය ණය වාරික ආපසු ගෙවීම් 617 ක් ආසන්න වශයෙන් සිදු කර ඇත. මීට අමතරව විවිධ ව්‍යාපෘති සඳහා විදේශ බැංකුවක් සමඟ බැංකු එකඟතාවන් 9 ක් අත්සන් කරන ලදී.

## II.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

(අ) මුදල් මණ්ඩල තීරණයකට අනුව මහ බැංකුවේ අභ්‍යන්තර අරමුදල් (සේවක අර්ථසාධක අරමුදල හැර) මධ්‍යගත ලෙස කළමනාකරණය කිරීම සඳහා මූල්‍ය දෙපාර්තමේන්තුව යටතේ තනි ඒකකයක් ස්ථාපිත කල අතර එහි මෙහෙයුම් කටයුතු 2016 මාර්තු මස සිට ආරම්භ විය. ඒ අනුව, මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන කාර්ය මණ්ඩලයේ සහ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 8 ක් හා වෙනත් අරමුදල් 4 ක්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ශ්‍රී ලංකා තැන්පතු හා ද්‍රවශීලතා ආධාරක අරමුදල, කාර්ය මණ්ඩල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන අරමුදල් 3 ක් හා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව පාලනය කරන ව්‍යාපෘති අරමුදල්වලින් සමන්විත අරමුදල් 17 ක් මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරයි. සියලු අරමුදල් පොදු ආයෝජන ප්‍රතිපත්තියක් යටතේ මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ආයෝජනය කෙරෙන අතර, අදාළ අරමුදල් හිමිකාර දෙපාර්තමේන්තු ඒවායේ පරිපාලක ලෙස කටයුතු කරයි. අරමුදල් කළමනාකරණ පාලන පද්ධතිය ස්වාධීනව කටයුතු කරන ඉදිරි කාර්යාලය, මැද කාර්යාලය හා පසු කාර්යාලයකින් සමන්විත වන අතර නියෝජ්‍ය අධිපතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් ආයෝජන කමිටුව විසින් තීරණ ගැනීම සිදු කෙරේ. අරමුදල් ආයෝජන උපදෙස් දීම සහ නිරීක්ෂණය කිරීම සඳහා ආයෝජන කමිටුව 2017 වසර තුළ 12 වතාවක් රැස් විය. ආයෝජන, අපරානුමත කිරීම සඳහා මාසිකව මුදල් මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

(ආ) මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල, රාජ්‍ය බැංකු (මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව) ස්ථාවර තැන්පතුවල, ඉහළ ශ්‍රේණිගත සංස්ථාපිත ණයකරවල හා කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වල ආයෝජනය කෙරේ. විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 5 ක 2016 වසර සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය වාර්තා එම අරමුදල්වල නීති රීති වලට අනුව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. 2017 වසර අග වන විට මුළු අරමුදල රු. බිලියන 93.88 දක්වා වර්ධනය විය.

**II-21 සංඛ්‍යා සටහන**

**අරමුදල් කළමනාකරණ කාර්ය සාධනය - 2017 (රු. බිලියන)**

| දෙපාර්තමේන්තුව | 2017 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) | 2016 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) |
|---|---|---|
| මූල්‍ය | 52.22 | 48.90 |
| බැංකු අධීක්ෂණ | 38.47 | 27.21 |
| ප්‍රාදේශීය සංවර්ධන | 3.12 | 3.09 |
| කාර්ය මණ්ඩල කළමනාකරණ | 0.07 | 0.06 |
| එකතුව | 93.88 | 79.26 |

## II.5 ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් මොඩියුලය යටතේ ස්ථාවර වත්කම් ලේඛනය තුළ මහ බැංකුවේ සියලුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පවත්වා ගෙන යනු ලබයි. සියලුම වෙනස්කම් එනම් නව මිලදී ගැනීම් හා ඒවායේ ස්ථානගත කිරීම්, ස්ථානගත කිරීම්වල සිදු වූ වෙනස්කම්, ප්‍රත්‍යාගණනයන්, ක්ෂයවීම් සහ ඉවත් කිරීම් 2017 වසර තුළ දී මෙම ලේඛනයේ වාර්තා කර ඇත. අයිතමයන් අත්පත් කර ගැනීම් 760 ක් සහ ඉවත් කිරීම් 423 ක් සමගින් 2017 වසර තුළ දී මෙම ලේඛනය යාවත්කාලීන කරන ලදී.

## II.6 කාර්යමණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මහ බැංකු කාර්ය මණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය අඛණ්ඩව පවත්වාගෙන යන අතර, එමගින් ණය අයකර ගැනීම් වාර්තා කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ සේවකයන්ට සහ කළමනාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු සඳහා 2017 වසර තුළ දී පහසුකම් සපයන ලදී. 2017 වසර තුළ දී රු.බිලියන 1.08 ක වටිනාකමකින් යුත් 942 ක ණය සංඛ්‍යාවක් සේවකයන් සඳහා පිරිනමා ඇත.

## II.7 අනෙකුත් කාර්යයන්

### මිලදී ගැනීම් ක්‍රියාවලිය:

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීතිරීතිවලට අනුව, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව සියලුම තාක්ෂණික ඇගයීම් කමිටු, භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වන ටෙන්ඩර් මණ්ඩල සහ සමීක්ෂණ මණ්ඩල නියෝජනය කරයි. 2017 වසර තුළ දී මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ආසන්න වශයෙන් එවැනි ටෙන්ඩර් මණ්ඩල 151 ක් සහ මිලදී ගැනීම් හා සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු 45 ක් නියෝජනය කර ඇත.

# 12. මූල්‍ය බුද්ධි ඒකකය

මූල්‍ය බුද්ධි ඒකකය, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව ස්වාධීන ව්‍යවස්ථාපිත අධිකාරියක් ලෙසින් 2006 වසරේ දී පිහිටුවන ලදී. මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද නියෝගයකට අනුව 2007 වර්ෂයේ මාර්තු මස සිට මූල්‍ය බුද්ධි ඒකකය පරිපාලනමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රියාත්මක වෙයි. මූල්‍ය බුද්ධි ඒකකයෙහි ප්‍රධාන කාර්යයන් අතරට මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති නීත්‍යානුකූල නොවන අනෙකුත් ක්‍රියාවන්ට අදාළ විය හැකි සම්බන්ධතාවන් අනාවරණය කර ගැනීම, සැක කටයුතු ගනුදෙනු පිළිබඳ විශ්ලේෂණය කිරීම සහ වැඩිදුර විමර්ශන සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙත එම විශ්ලේෂණයන්ට අදාළ විස්තර හා තොරතුරු ලබාදීම ඇතුළත් වේ. තවද, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ ද මූල්‍ය බුද්ධි ඒකකය සිය කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි.

## 12.1 තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ තොරතුරු බෙදාහැරීම

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම පහසු කිරීම පිණිස විශේෂයෙන් හඳුන්වා දී ඇති 'ලංකාෆින්' (LankaFIN) මාර්ගගත දත්ත පද්ධතිය හරහා මූල්‍ය ආයතන මගින් සැක කටයුතු ගනුදෙනු වාර්තා සහ මුදල් ගනුදෙනු පිළිබඳ තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකය වෙත ලැබේ. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, කොටස් තැරැව්කරුවන්, මුදල් හෝ මූල්‍ය වටිනාකම් හුවමාරු කිරීමේ සේවා සපයන ආයතන සහ රක්ෂණ සමාගම් විසින් රුපියල් මිලියනයක් හා ඊට වැඩි මුදල් ගනුදෙනු සහ විද්‍යුත් ප්‍රේෂණ ගනුදෙනු හෝ ඒ හා සමාන අගයකින් යුතු විදේශීය ව්‍යවහාර මුදල් ගනුදෙනු (දේශීය සහ විදේශීය) මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම නොකඩවා සිදු කරගෙන යන ලදී. මීට අමතරව මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 7 වන වගන්තිය අනුව සැක කටයුතු ගනුදෙනු වාර්තාවන් ද මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. ඒ අනුව, 2017 වසර තුළදී රුපියල් මිලියන 9.27 කට වඩා වැඩි මුදල් ගනුදෙනු සහ මුදල් ප්‍රේෂණ සංඛ්‍යාවක් ද, සැක කටයුතු ගනුදෙනු 925 ක් ද වාර්තා කර ඇත. තවද, බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් ද එම ක්ෂේත්‍රය අධීක්ෂණය සහ නියාමනය කරනු ලබන විනිමය පාලකවරයා හරහා රුපියල් මිලියනයක් සහ ඊට වැඩි වන අගයකින් යුතු මුදල් ගනුදෙනු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. මූල්‍ය බුද්ධි ඒකකය විසින් වැඩිදුර පරීක්ෂණ සඳහා 2017 වසර තුළ දී නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ නියාමන අධිකාරීන් වෙත සැක කටයුතු ගනුදෙනු වාර්තා 418 ක් යොමු කරන ලදී.

## 12.2 වාර්තාකරණ ආයතන නියාමනය කිරීම

නීත්‍යානුකූල නොවන ක්‍රියාකාරකම් සහ අපරාධයන්ට අදාළව සිදුවන ඕනෑම ආකාරයක ගනුදෙනු වාර්තා කිරීම සඳහා 2015/56 අංක දරන සැක කටයුතු ගනුදෙනු (ආකෘති) නියෝග අති විශේෂ ගැසට් පත්‍රය 2017 මාර්තු 30 දිනැති අත්සනින් යුතුව 2017 අප්‍රේල් 21 දින නිකුත් කරන ලදී. තවද, 2017 වසර සඳහා වන අවදානම පදනම් කරගත් පරීක්ෂණ සැලැස්මක් සහ 2017 අංක 01 දරන මුදල් හෝ මූල්‍ය වටිනාකම් හුවමාරු කිරීමේ සේවා සපයන ආයතන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා ඇති අනුකූලතාව සඳහා උපදේශන, පිළිවෙළින් 2017 ජනවාරි 17 වන දින සහ 2017 ජනවාරි 20 වන දින නිකුත් කරන ලදී.

## 12.3 දේශීය සහ විදේශීය සහයෝගීතාව

### (අ) අවබෝධතා ගිවිසුම්

2017 වර්ෂය තුළදී විමර්ශනයන් සඳහා තොරතුරු හුවමාරු කරගැනීමේ/ලබා ගැනීමේ අරමුණ ඇතිව දේශීය වශයෙන් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලීසිය සමඟ අවබෝධතා ගිවිසුම් දෙකක් ද, විදේශීය වශයෙන් තායිලන්තය, භූතානය, චීනය, කටාර් රාජ්‍යය සහ ට්‍රිනිඩෑඩ් හා ටොබැගෝ යන රටවල මූල්‍ය බුද්ධි ඒකකයන් සමඟ අවබෝධතා ගිවිසුම් පහක් ද අත්සන් කරන ලදී. ඒ අනුව, 2017 වර්ෂය අවසන් වන විටදී මූල්‍ය බුද්ධි ඒකකය සිය විදේශීය පාර්ශ්වයන් සහ දේශීය නියෝජිත ආයතන සමඟ අත්සන් තබා ඇති මුළු අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව පිළිවෙළින් 37 ක් හා 5 ක් වේ.

### (ආ) එග්මොන්ට් කණ්ඩායම (Egmont Group)

විමර්ශන පවත්වාගෙන යාමේදී අවශ්‍ය තොරතුරු එක්රැස් කරගැනීම පිණිස ගෝලීයව මූල්‍ය බුද්ධි ඒකක 155 කින් සමන්විතව පිහිටුවා ඇති එග්මොන්ට් කණ්ඩායමේ සහාය මූල්‍ය බුද්ධි ඒකකය විසින් ලබාගන්නා ලද අතර, සාමාජික රටවල විමර්ශන කටයුතු සඳහා බුද්ධිමය තොරතුරු එක් රැස් කිරීමට ද සහාය දෙන ලදී. 2017 වසර තුළදී මූල්‍ය බුද්ධි ඒකකය විසින් අවස්ථා 104 කදී විදේශීය මූල්‍ය බුද්ධි ඒකක සමඟ තොරතුරු හුවමාරු කරගෙන ඇත. දැනට සිදු කරගෙන යන විමර්ශනවලට අදාළව විදේශීය මූල්‍ය බුද්ධි ඒකක විසින් ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයෙන් තොරතුරු ඉල්ලීම් 50 ක් ද, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් විදේශීය මූල්‍ය බුද්ධි ඒකකයන් වෙතින් තොරතුරු ඉල්ලීම් 54 ක් ද සිදු කර ඇත. තවද, 2017 පෙබරවාරි මාසයේදී දෝහා කටාර්හි පැවති මූල්‍ය බුද්ධි ඒකකයන්ගේ එග්මොන්ට් කණ්ඩායම් රැස්වීමට සහ 2017 ජූලි මස පැවති එග්මොන්ට් කණ්ඩායමේ ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි පිළිබඳ ක්‍රියාකාරකම් කණ්ඩායම් කමිටු රැස්වීම් සඳහා මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීහු සහභාගී වූහ.

### (ඇ) මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (APG)

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ විසිවන සැසි වාරය සාමාජික රටවල් 41 ක නියෝජිතයන් 408 ක සහ විවිධ අන්තර්ජාතික නිරීක්ෂණ

සංවිධාන රැසක නියෝජිතයන් 24 කගේ සහභාගිත්වයෙන්, 2017 ජූලි මස 15 සිට 21 දක්වා කොළඹදී පවත්වන ලදී. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමන් සහභාගී වූහ. තවද, 2016-2018 වර්ෂයන් සඳහා මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සම සභාපතිත්වය ශ්‍රී ලංකාව විසින් දරන බැවින් සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති කැපවීම තහවුරු කිරීමට හැකි වන බැවින් මෙම සැසිවාරය ශ්‍රී ලංකාවට අතිශය වැදගත් වේ.

### (ඇ) බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය (BIMSTEC)

බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය (BIMSTEC) සංවිධානයේ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාරක සභාවේ 9 වන උප කණ්ඩායම් සැසි වාරය 2017 අප්‍රේල් 26-27 යන දෙදින තුළ මියන්මාරයේදී පැවැත්වුණු අතර ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීහු ඊට සහභාගී වූහ.

## 12.4 ආයතනික හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්

මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ කටයුතුවලට අදාළ ගනුදෙනු හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම සම්බන්ධයෙන් ඇති දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ අරමුණින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය ආයතන සහ මුදල් හෝ මූල්‍ය වටිනාකම් හුවමාරු කිරීමේ සේවා සපයන ආයතන නියෝජනය කරන නිලධාරීන් 2,548 කට දැනුම්වත් කිරීමේ වැඩසටහන්/පුහුණු වැඩමුළු 31 ක් මෙම වසර තුළදී පවත්වන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පළමු සහ දෙවන තාක්ෂණික සහයෝගීතා මෙහෙයුමේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂඥයින් විසින් පිළිවෙළින් 2017 මාර්තු 6-14 සහ 2017 සැප්තැම්බර් 25 සිට ඔක්තෝබර් 05 දක්වා පවත්වන ලදී. මෙම මෙහෙයුම් මගින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්යභාරයන් යටතේ, අවදානම් පදනම් කරගත් අධීක්ෂණයන්, මූල්‍ය බුද්ධි ඒකකයේ හැකියාවන් ප්‍රවර්ධනය සහ සංශෝධනය විය යුතු පනත් යන ප්‍රධාන කරුණු තුන වඩාත් ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ලදී. ඇමරිකා එක්සත් ජනපදයේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවට අදාළ ශ්‍රී ලාංකීය උපදේශන නිලධාරියෙකු, 2017 මැයි මාසයේදී මූල්‍ය බුද්ධි ඒකකය සමඟ සිය කටයුතු ආරම්භ කරන ලදී. මූල්‍ය බුද්ධි ඒකකයේ මෙහෙයුම් සඵලදායීත්වය, මූල්‍ය අංශයේ අධීක්ෂණය හා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාළ උපායමාර්ග සහ සම්පත් කළමනාකරණය ආදී වශයෙන් හඳුනාගත් ප්‍රධාන අංශ තුනක් යටතේ ඔහු විසින් තාක්ෂණික සහයෝගීතාව ලබාදෙනු ලබයි.

## 12.5 අන්‍යෝන්‍ය ඇගයීම සහ පසු-විපරම් ක්‍රියාවලිය

මූල්‍ය කාර්ය සාධක බලකායේ සංශෝධිත නිර්දේශයන්ට අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම, ඊට අදාළ ජාත්‍යන්තර සම්මුතීන්ට ඇති අනුකූලතාව ඇගයීමේ අරමුණින් මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම විසින් අන්‍යෝන්‍ය ඇගයීමේ තුන්වන වටය 2014/15 කාලපරිච්ඡේදය තුළදී පවත්වන ලදී. 2015 සැප්තැම්බර් මාසයේදී සම්මත කරගන්නා ලද අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තාවේදී මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කාලාපීය කණ්ඩායමේ 'කඩිනම් සහ පුළුල් පසු විපරම් ක්‍රියාවලිය' යටතේ ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග රාශියක් නිර්දේශ කරන ලදී. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ සඵලදායීතාව සම්බන්ධව ශ්‍රී ලංකාව ලබාගෙන ඇති ප්‍රගතිය සොයා බැලීම සඳහා මූල්‍ය කාර්ය සාධක බලකායේ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ සමාලෝචන කණ්ඩායමේ (International Cooperation Review Group - ICRG) ඇගයීමට ශ්‍රී ලංකාව ලක් වන බව මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාවට දැනුම් දෙන ලදී. සාකච්ඡා සහ ප්‍රගති සමාලෝචන වාර්තාවන් කිහිපයකට පසුව ජාත්‍යන්තර සහයෝගීතාව, අධීක්ෂණය, නෛතිකමය පුද්ගලයන් හා සැකසුම් සහ සමුලඝාතක අවි ව්‍යාප්තිය සම්බන්ධයෙන් ඉලක්කගත මූල්‍ය සම්බාධක (උතුරු කොරියාව සහ ඉරානයට අදාළ) ආදී වශයෙන් වන කරුණු 4 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අවශ්‍ය ප්‍රගතිය පෙන්වා නොමැති බවට මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාවට දැනුම් දී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2017 වසරේදී ආර්ජන්ටිනාවේ බුවනෝස් අයර්ස්හිදී පැවති වාර්ෂික රැස්වීමේදී, ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමෝපායන්ගේ දුර්වලතා සහිත රටක් ලෙස මූල්‍ය කාර්ය සාධක බලකායේ අනුකූලතා ලේඛනයෙහි ලැයිස්තුගත කරන ලද අතර, මෙය 'අළු ලේඛනයට' ඇතුළත් කිරීම ලෙස හඳුන්වයි. මෙසේ ලැයිස්තුගත කිරීමෙන් අනතුරුව එම හඳුනාගත් ක්‍රමෝපාය දුර්වලතා මගහරවා ගැනීම සඳහා කාල රාමුවකට යටත් වූ ක්‍රියාකාරී සැලැස්මක් ශ්‍රී ලංකාවට ලබා දෙන ලදී. මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් නිර්දේශ කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමට මූල්‍ය බුද්ධි ඒකකය සහ එම ක්‍රියාවලියට අදාළ අනෙකුත් පාර්ශ්වයන් මේ වන විටත් අවශ්‍ය පියවර ගෙන ඇත.

# 13. මානව සම්පත්

2017 වසර තුළදී, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අභිප්‍රේරිත, කැපවීමෙන් කටයුතු කරන සහ දක්ෂතාවන්ගෙන් හෙබි සේවකයන් පිරිසක් මහ බැංකුව තුළ පවත්වාගෙන යෑම සඳහා කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම උදෙසා සේවක දායකත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තීන් වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ත භාවිතාවන් අනුගමනය කිරීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී. තවද, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවක කාර්යසාධන ඇගයීම, සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු කිරීම, අනුප්‍රාප්තික සැලසුම් කිරීම, පන්ති සහ ශ්‍රේණි උසස්වීම් ලබාදීම සහ යහපත් සේව්‍ය-සේවක සබඳතා

පවත්වා ගැනීමට අදාළ හිතකර පරිසරයක් ගොඩනැගීම සඳහා කාර්මික සාමය පවත්වාගෙන යෑම ද සිදු කරන ලදී. 2017 වසර තුළදී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කටයුතු සහ මහ බැංකුවේ මානව සම්පත් ව්‍යුහය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.


## 13.1 මානව සම්පත් ව්‍යුහය

2017 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,405 ක් වූ අතර, එය මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 645 කින් ද, මාණ්ඩලික නොවන පන්තියේ නිලධාරීන් 601 කින් හා සුළු සේවක කාර්ය මණ්ඩලය 159 කින් ද සමන්විත විය. 2017 වසර අවසානය වන විට මහ බැංකුවේ සමස්ත සේවකයන්ගේ වයස්වල සාමාන්‍යය අවුරුදු 39 ක් විය. පසුගිය වසර හා සසඳා බැලීමේදී මුළු කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික පන්තිය, මාණ්ඩලික නොවන පන්තිය සහ සුළු සේවක යන පන්තීන්වල සංයුතිය නොවෙනස්ව පැවතිණි. 2017 වසර අවසානය වන විට පන්තීන් අනුව, ස්ත්‍රී/පුරුෂ භාවය අනුව සහ වයස අනුව කාර්ය මණ්ඩලයේ සංයුතිය පහත II-4 රූප සටහන මගින් දක්වා ඇත.


**II-4 රූප සටහන**

**2017.12.31 දිනට සේවක සංයුතිය**


(අ) සේවක සංයුතිය: පන්ති අනුව




(ආ) සේවක සංයුතිය: ස්ත්‍රී/පුරුෂ භාවය අනුව




(ඇ) සේවක සංයුතිය: වයස අනුව




## 13.2 ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

පහත II-22 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව ඉහළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ නිපුණතාවලින් හෙබි, නානාවිධ දක්ෂතා ඇති කාර්ය මණ්ඩලයකින් සමන්විත විය.

## 13.3 මානව සම්පත් කළමනාකරණය

(අ) බඳවා ගැනීම්

2017 වසරේදී කළමනාකරණ අභ්‍යාසලාභීන්, නීති නිලධාරීන්, ආරක්ෂක නිලධාරීන් (පුරුෂ), කණිෂ්ඨ පෞද්ගලික සහකාර යන තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම සිදු කරන ලද අතර, ප්‍රධාන පුස්තකාලයාධිපති තනතුර සඳහා සුදුසු අයදුම්කරුවෙකු බඳවා ගැනීමට අදාළ කටයුතු අවසන් කරන ලදී. මීට අමතරව, පාර්ශ්වික බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ බැංකුවට අවශ්‍ය සුවිශේෂී නිපුණතා සපුරා ගැනීම සඳහා භාෂා පරිවර්තකයෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

(ආ) කාර්යසාධන කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යසාධන කළමනාකරණ ක්‍රියාවලිය, සේවකයන්ගේ රාජකාරි ලැයිස්තු සකස් කිරීම හා සමාලෝචනය කිරීම, එක් එක් සේවකයන්ට අදාළ වන පරිදි ඉලක්ක අරමුණු පිහිටුවීම, කාර්යසාධන නිරීක්ෂණය හා කාර්යසාධන ඇගයීම යන කොටස්වලින් සමන්විත වේ.

කාර්යසාධනය ඇගයීමේ ක්‍රියාවලිය යටතේ, කාර්යසාධන ඇගයීම් පටිපාටියේ සඳහන් වන පරිදි සාමාන්‍ය නිපුණතා හා තාක්ෂණික නිපුණතා පදනම්ව ළඟාකර ගත් කාර්යසාධනයන් සඳහා අගයන් ලබාදෙමින් සෑම සේවකයකුගේම කාර්යසාධනයන් ඇගයීම් කරනු ලැබීය. සේවක උසස්වීම් පටිපාටියේ ඇති එක් සංරචකයක් ලෙස සේවකයන්ගේ අවසාන කාර්යසාධන ලකුණු යොදා ගැනේ.

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවකයන්ගේ කාර්යසාධනය ඇගයීම් ක්‍රියාවලිය සැලසුම් කළ පරිදි වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදී. තවද, මධ්‍ය වාර්ෂික කාර්යසාධන සමාලෝචන ක්‍රියාවලිය ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අතර, එම ක්‍රියාවලිය මගින් වසරේ මුල් භාගය තුළදී සේවකයන්ගේ කාර්යසාධන මට්ටම අදාළ පාර්ශ්වයන් හට දැනගැනීමට අවස්ථාව සැලසිණි.

(ඇ) උසස්වීම්

2017 වසරේදී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අදාළ උසස්වීම් පටිපාටියට අනුකූලව සේවකයන්ගේ වෘත්තීය අභිවෘද්ධිය තහවුරු කරමින් සේවක උසස්වීම් ලබාදුන් අතර, මේ යටතේ සේවකයන් 148 දෙනෙකුට අදාළ පන්ති හා ශ්‍රේණි උසස්වීම් ලබා දුනි. මේ අනුව සහකාර අධිපතිවරුන් දෙදෙනෙකු නියෝජ්‍ය

**II-22 සංඛ්‍යා සටහන**

**2017.12.31 දිනට ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සාමාජිකත්වයන්**

| කාණ්ඩ | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ආචාර්ය උපාධිධාරීන් | පශ්චාත් උපාධි, ප්‍රථම උපාධි හා වෘත්තීය සාමාජිකත්වයන් | පශ්චාත් උපාධි හා ප්‍රථම උපාධි | ප්‍රථම උපාධි හා වෘත්තීය සාමාජිකත්වයන් | ප්‍රථම උපාධි | පශ්චාත් උපාධි සහ වෘත්තීය සාමාජිකත්වයන් | වෘත්තීය සාමාජිකත්වයන් |
| මාණ්ඩලික පන්තිය | 20 | 87 | 174 | 50 | 159 | 17 | 15 |
| මාණ්ඩලික නොවන පන්තිය | - | 14 | 24 | 15 | 52 | 14 | 30 |
| සුළු සේවක පන්තිය | - | - | - | - | 7 | - | - |
| **එකතුව** | **20** | **101** | **198** | **65** | **218** | **31** | **45** |

අධිපතිවරුන් ලෙසටත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හයදෙනෙකු මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණියට සහකාර අධිපතිවරු ලෙසටත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් දෙදෙනෙකු ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙසටත් උසස්වීම් ලැබූහ. තවද, මාණ්ඩලික පන්තියේ III (1) ශ්‍රේණියේ නිලධාරීන් 34 දෙනෙකුට නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස ද උසස්වීම් ලැබිණි. මේ අතර, නිලධාරීන් 92 ක් ශ්‍රේණි උසස්වීම් ලද අතර, නිලධාරීන් 12 ක් මාණ්ඩලික නොවන පන්තියේ සිට මාණ්ඩලික පන්තිය දක්වා උසස්වීම් ලැබීය.

**(ඈ) සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු කිරීම්**

බැංකුවේ විවිධ ක්ෂේත්‍රයන්හි අත්දැකීම් ලබා ගැනීමට සියලු සේවකයන්ට අවස්ථාව සලසා දීමේ අරමුණින් යුක්තව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික රැකියා ස්ථාන මාරු කිරීමේ ප්‍රතිපත්තිය යටතේ මාණ්ඩලික නිලධාරීන් 19 ක් හා මාණ්ඩලික නොවන නිලධාරීන් 31 ක් 2017 ජනවාරි මස 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු කිරීමට කටයුතු කරන ලදී.

**(ඉ) කාර්මික සාමය**

පහසුකම් සලසා දෙන්නෙකු වශයෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව වෘත්තීය සමිති සහ කළමනාකාරීත්වය අතර සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2017 වසර තුළදී කළමනාකාරීත්වය සහ වෘත්තීය සමිති අතර සාකච්ඡා වාර 9 ක් පවත්වන ලද අතර, එමගින් වැටුප්, උසස්වීම්, පුහුණුවීම්, සුභසාධනය, නව බඳවා ගැනීම් සහ සාමාන්‍ය පරිපාලනය යනාදිය සම්බන්ධයෙන් පැවති ඇතැම් ගැටලු විසඳා ගැනීමට අවස්ථාව ලැබුණි.

## 13.4 දෙපාර්තමේන්තු වසා දැමීම සහ නව දෙපාර්තමේන්තු පිහිටුවීම

නව විදේශ විනිමය පනතට අනුව 2017 නොවැම්බර් 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි විනිමය පාලන දෙපාර්තමේන්තුව වසා දැමීමටත් විදේශ විනිමය දෙපාර්තමේන්තුව පිහිටුවීමටත් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

## 13.5 2017 වසර තුළ අධිපති විසින් විදේශයන්හි සහභාගි වූ රැස්වීම්

(අ) මාර්තු 13 සිට 18 දින දක්වා ඇමෙරිකානු එක්සත් ජනපදයේ සැන් ෆ්‍රැන්සිස්කෝ, ලොස් ඇනජලීස්, බොස්ටන් සහ නිව්යෝර්ක්හිදී පැවති 'Non-deal roadshow' ප්‍රදර්ශන සඳහා සහභාගි වීම.

(ආ) මාර්තු 27, 28 යන දිනයන්වල එක්සත් රාජධානියේ ලන්ඩන් නුවරහිදී සහ මැද පෙරදිග ඩුබායිහිදී පැවති 'Non-deal roadshow' ප්‍රදර්ශන සඳහා සහභාගි වීම.

(ඇ) සැප්තැම්බර් 13 දින හොංකොංහිදී පැවති 24 වන CLSA ආයෝජකයන්ගේ සමුළුවේදී (24th CLSA Investors' Forum) දේශනයක් පැවැත්වීම සඳහා සහභාගි වීම.

(ඈ) ඔක්තෝබර් 11 සිට 14 දින දක්වා වොෂින්ටන්හිදී පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුවේ 2017 වාර්ෂික රැස්වීම සහ 16 දින නිව්යෝර්ක්හිදී පැවති 'Invest Sri Lanka' ආයෝජක සමුළුවේ ප්‍රධාන දේශනය පැවැත්වීම සඳහා සහභාගි වීම.

(ඉ) නොවැම්බර් 20 දින නිව්යෝර්ක්හිදී එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ කොමිසම වෙත 'ශ්‍රී ලංකාවේ පශ්චාත් අර්බුද ගමන්මග' ('Sri Lanka's Post-Conflict Journey') පිළිබඳ ඉදිරිපත් කිරීමක් සඳහා සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ මහ ලේකම් සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සමඟින් සහභාගි වීම.

### 13.6 උසස් කිරීම් / පත්කිරීම්

(අ) සහකාර අධිපති, කේ.ඩී. රණසිංහ මහතා නියෝජ්‍ය අධිපතිවරයෙකු ලෙස 2017 අප්‍රේල් මස 30 දින සිට පත් කරන ලදී.

(ආ) සහකාර අධිපති, සී.ජේ.පී. සිරිවර්ධන මහතා නියෝජ්‍ය අධිපතිවරයෙකු ලෙස 2017 අගෝස්තු මස 19 දින සිට පත් කරන ලදී.

(ඇ) මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණිය සඳහා උසස් කිරීම් හා පත් කිරීම් පහත පරිදි සිදු කරන ලදී.

(i) කේ.එම්.ඒ.එන්. දවුලගල මහත්මිය, එස් ගුණරත්න මහත්මිය, එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා, ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මහත්මිය, ජේ.පී.ආර්. කරුණාරත්න මහතා සහ කේ. ගුණතිලක මහත්මිය සහකාර අධිපතිවරුන් ලෙස 2017 අගෝස්තු 31 දින සිට පත් කරන ලදී.

(ii) යූ.පී. අලවත්තගේ මහතා සහ එම්.අයි. සුරියාන් මහතා ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස 2017 සැප්තැම්බර් 14 දින සිට පත් කරන ලදී.

(ඈ) ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, ආචාර්ය වයි.එම්.ඉන්ද්‍රරත්න මහත්මිය එම දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස 2017 ජනවාරි 10 දින සිට පත්කරන ලදී.

(ඉ) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ යූ.පී. අලවත්තගේ මහතා 2017 සැප්තැම්බර් 04 දින සිට විනිමය පාලන දෙපාර්තමේන්තුවේ විනිමය පාලක ලෙස ද, අනතුරුව 2017 නොවැම්බර් 20 දින සිට විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

(ඊ) ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඩී.එම්.රූපසිංහ මහතා 2017 මැයි 11 දින සිට බැංකු විදු පියෙසෙහි අධ්‍යක්ෂ ලෙස ද, 2017 සැප්තැම්බර් 04 දින සිට සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2017 සැප්තැම්බර් 28 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස ද, 2017 දෙසැම්බර් 19 දින සිට මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

(උ) තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සී.එම්.ඩී.එන්.කේ. සෙනෙවිරත්න මහත්මිය 2017 සැප්තැම්බර් 04 දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස පත් කරන ලදී.

(ඌ) ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඒ.එම්.එන්. ගුණවර්ධන මහතා 2017 සැප්තැම්බර් 04 දින සිට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ඍ) කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ බී.ඩබ්. ජිනසේන මහතා 2017 සැප්තැම්බර් 04 දින සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ ලේකම් ලෙස පත් කරන ලදී.

(එ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ලේකම්, කේ.එච්.ඒ.එස්. ආරියරත්න මහතා 2017 සැප්තැම්බර් 04 දින සිට කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද අනතුරුව 2017 සැප්තැම්බර් 28 දින සිට සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

(ඒ) ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී එච්.පී.ටී විජේසූරිය මහත්මිය, 2017 මැයි 11 දින සිට ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2017 සැප්තැම්බර් 04 දින සිට බැංකු විදු පියෙසෙහි වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ඔ) විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අතිරේක විනිමය පාලක බී.එල්.ජේ.එස්. බාලසූරිය මහතා, 2017 සැප්තැම්බර් 04 දින සිට ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ඕ) සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ටී.ඩී.එච්. කරුණාරත්න මහතා, 2017 සැප්තැම්බර් 04 දින සිට ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ක) තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ කේ.වී.කේ. අල්විස් මහතා, 2017 සැප්තැම්බර් 04 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ග) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ඩබ්. රණවීර මහතා, 2017 සැප්තැම්බර් 04 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ච) රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී, ටී.එච්.බී. සරත්චන්ද්‍ර මහතා, 2017 සැප්තැම්බර් 28 දින සිට කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ජ) මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක ප්‍රධාන ගණකාධිකාරී යූ.එල්. මුතුගල මහත්මිය, 2017 නොවැම්බර් 20 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරී ලෙස පත් කරන ලදී.

(ට) සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය එම්.ඉසෙඩ්.එම්. ආසිම් මහතා, 2017 දෙසැම්බර් 19 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධිකාරී ලෙස පත් කරන ලදී.

### 13.7 මුදා හරිනු ලැබ සිටි නිලධාරීන්

(අ) සහකාර අධිපති, එස්.ආර්. ආටිගල මහතා, නියෝජ්‍ය ලේකම් ලෙස මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත.

(ආ) සහකාර අධිපති, කේ.එම්.එම්. සිරිවර්ධන මහතා, විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

(ඇ) මාණ්ඩලික පන්තියේ IV ශ්‍රේණියේ, ආචාර්ය පී.කේ.ජී. හරිස්චන්ද්‍ර මහතා, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත.

(ඈ) මාණ්ඩලික පංතියේ III (2) ශ්‍රේණියේ, යූ. හෙට්ටිආරච්චි මහතා, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත.

(ඉ) මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ, එස්. රත්නායක මහත්මිය, පරිපාලන සහකාර ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

(ඊ) මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ, එස්. අමිතා මෙනෙවිය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකා නේවාසික නියෝජිත කාර්යාලය වෙත.

(උ) රියැදුරු, එස්.එන්.ඩබ්. කරුණාදාස මහතා, විදුලිබල හා පුනර්ජනනීය අමාත්‍යාංශය වෙත.

### 13.8 විශ්‍රාම ගැනීම්

(අ) සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, ටී.එම්. ඉසෙඩ් මුතාලිෆ් මහතා 2017 ජනවාරි 01 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(ආ) ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ආර්.බී. වීරසිංහ මහත්මිය 2017 ජනවාරි 06 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(ඇ) සහකාර අධිපති, ජේ.පී. මාම්පිටිය මහත්මිය 2017 ජනවාරි 19 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(ඈ) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, එන්.එච්.ඊ.ආර්. සිරිවර්ධන මහත්මිය 2017 ජනවාරි 28 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(ඉ) ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ, එස්.ආර්. සුමනසේකර මහතා 2017 පෙබරවාරි 25 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(ඊ) නියෝජ්‍ය අධිපති, එස්. ලංකාතිලක මහතා 2017 අප්‍රේල් 30 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(උ) සහකාර අධිපති, කේ. සරවනමුත්තු මෙනෙවිය 2017 ජුනි 15 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(ඌ) බැංකු විදු පියෙසෙහි අධ්‍යක්ෂ, යූ.එච්.ඊ. සිල්වා මහතා 2017 අගෝස්තු 11 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(එ) සහකාර අධිපති, එස්.එස්. රත්නායක මහතා 2017 අගෝස්තු 14 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(ඒ) නියෝජ්‍ය අධිපති, පී.සමරසිරි මහතා 2017 අගෝස්තු 19 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(ඔ) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ, ඒ.ඒ. චන්ද්‍රසේන මහතා 2017 අගෝස්තු 23 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

(ඕ) ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, ඒ.එම්.ආර්.කේ. අත්තනායක මහතා 2017 දෙසැම්බර් 26 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

## 14. තොරතුරු තාක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අවශ්‍යතා සපුරාලීමේ කර්තව්‍යය පැවරී ඇති තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උසස් ප්‍රමිතියෙන් යුතු ඒකාබද්ධ මෘදුකාංග සපයමින් එහි ක්‍රියාකාරී කාර්යභාරය අඛණ්ඩව සිදු කරන ලදී.

පසුගිය වසර තුළ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ පහක් යටතේ සිය දායකත්වය සපයන ලදී.

(අ) පිරිවැය - ඵලදායී ව්‍යාපාර විසඳුම් ඉදිරිපත් කිරීම

(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම

(ඇ) ජාතික ගෙවීම් පද්ධතියේ යටිතල පහසුකම් වර්ධනය සඳහා දායකත්වය ලබා දීම

(ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව හා ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම

(ඉ) කාර්ය මණ්ඩලය අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා සංවර්ධනය

**(අ) පිරිවැය - ඵලදායී ව්‍යාපාර විසඳුම් ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන දේශීය ණය ලබා ගැනීමේ කාර්යක්ෂමතාව හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා අදියර තුනක් යටතේ ප්‍රාථමික භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා නව වෙන්දේසි පද්ධතියක් නිර්මාණය කර ක්‍රියාත්මක කරන ලදී.

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ මුදල් නෝට්ටු සැපයුම්කරු භාවිතා කරන ව්‍යවහාර මුදල් නෝට්ටු පරීක්ෂා කිරීමේ යන්ත්‍ර (Single Note Inspection Machine) වෙතින් ඉලෙක්ට්‍රොනිකව ලබා දෙන නෝට්ටු අනුක්‍රමික අංක ග්‍රහණය

කර ගැනීම සඳහා ව්‍යවහාර මුදල් පද්ධතියට (Currency Management System) නව මුහුණතක් එකතු කිරීම මගින් මුදල් නෝට්ටු තොග භාර ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කරන ලදී.

වෙළඳපොළ තොරතුරු සහ වෙළඳපොළ සහභාගිවන්නන්ගේ තොරතුරු අධීක්ෂණය කිරීම බැංකුවේ ක්‍රියාකාරිත්වයේ අත්‍යවශ්‍ය අංගයකි. මේ සඳහා මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂණ (Central Integrated Market Monitoring) පද්ධතිය ස්ථාපනය කොට, බැංකු හා තැරැව්කරුවන්ගේ මුදල් වෙළඳපොළ ගනුදෙනු සම්බන්ධ සියලු තොරතුරු රැස් කිරීමට, විශ්ලේෂණය කිරීමට හා වාර්තා කිරීමටත්, බ්ලූම්බර්ග් (Bloomberg) සහ රොයිටර්ස් (Reuters) පද්ධතිවල සිදු කරන ගනුදෙනු සෘජුවම ග්‍රහණය කර ගැනීමටත් දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පහසුකම් සපයන ලදී.

බැංකු ප්‍රාථමික අලෙවිකරුවන්, කල්බදු සමාගම් සහ මූල්‍ය සමාගම් විසින් වාර්තා කරන ලද තොරතුරු අධීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් භාවිතා කරන මධ්‍යම දත්ත පද්ධතිය (FinNet) නව විශ්ලේෂණ වාර්තා, ව්‍යාප්ත නිරීක්ෂණ (extended surveilance) සහ අතහැර දැමූ දේපළ වාර්තා පහසුකම් ඇතුළත් කොට වැඩිදියුණු කරන ලදී.

දිවයිනේ සෑම ප්‍රදේශයකම ගුරුවරුන් විසින් එකතු කරන භාණ්ඩවල මිල ගණන් වාර්තා කිරීම සඳහා නව ටැබ්ලට් පරිගණකවල ක්‍රියා කරන පද්ධතියක් හඳුන්වා දීම මගින් සංඛ්‍යාන දෙපාර්තමේන්තුවෙහි කාර්යක්ෂමතාව ඉහළ නංවන ලදී.

**(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම**

බැංකුව තුළ අඛණ්ඩ හා කාර්යක්ෂම තොරතුරු තාක්ෂණ සේවාවන් තහවුරු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාලය විවිධ අංශයන්ට සංවෘත කළ හැකි පරිදි සකස් කිරීම වසර තුළ නිම කරන ලද ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අතර වැදගත් ස්ථානයක් ගනී. එහි ප්‍රතිඵලයක් ලෙස උපායමාර්ගික ලෙස වැදගත් තොරතුරු පද්ධති අනෙක් පොදු තොරතුරු තාක්ෂණ පරිසරය වෙතින් වෙන් කරන ලද අතර දැඩි, තාර්කික හා භෞතික ආරක්ෂක පාලනයන් ක්‍රියාත්මක කිරීමට හැකි විය. තව ද, මෙම උපායමාර්ගික ලෙස වැදගත් තොරතුරු පද්ධති සහ ඒවාට ප්‍රවේශ වන පරිගණක, සයිබර් ප්‍රහාරයන්ට නිරාවරණය වීම අවම කර ගැනීම සඳහා අන්තර්ජාල ප්‍රවේශ සීමා පැනවීම සහ වරප්‍රසාද වෙන් කිරීම සිදු කරන ලදී.

විවිධ වර්ගයේ දියුණු කළ ඉලක්කගත සයිබර් ප්‍රහාර හා අභ්‍යන්තර තර්ජනවලින් බැංකුව ආරක්ෂා කිරීමට සංකීර්ණ තර්ජන විශ්ලේෂණ මෘදුකාංගය හඳුන්වා දුන් අතර එමගින් ආයතනය තුළ පරිගණක භාවිත කරන්නන්ගේ විවිධාකාර සැක කටයුතු පරිගණක ක්‍රියාකාරකම් හඳුනාගෙන ඒ පිළිබඳ අනතුරු ඇඟවීම් ලබා දෙයි.

බැංකුව තුළ කඩදාසි නොමැති වැඩ පරිසරයක් නිර්මාණය කිරීමට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව අඛණ්ඩව උත්සාහ කළ අතර පසුගිය වසර තුළ දී මේ සම්බන්ධයෙන් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ යටතේ වර්තමානයේ භාවිත කරන මුද්‍රිත මුදල් මණ්ඩල පත්‍රිකා ඩිජිටල්කරණය කර මුදල් මණ්ඩල රැස්වීම් මෙහෙයවීම සඳහා ස්වයංක්‍රීය මෘදුකාංගයක් හඳුන්වා දෙන ලදී. එමගින් මුදල් මණ්ඩල සාමාජිකයන්ට සහ අනෙකුත් නිලධාරීන්ට ඔවුන්ගේ ටැබ්ලට් පරිගණක මාර්ග යෙන් රැස්වීම් සම්බන්ධිත අන්තර්ගතයන් වෙත ප්‍රවේශ වීමට සහ කළමනාකරණයට හැකියාව ලැබී ඇත. තවද, ලේඛන කළමනාකරණ පද්ධතියක් (Document Management System) බැංකුවට හඳුන්වා දීම සඳහා මූලික අවශ්‍යතා හඳුනා ගැනීම අවසන් කරන ලදී. මෙම ක්‍රමය තවදුරටත් කඩදාසි නොමැති වැඩ පරිසරයක් කරා ගමන පහසු කරවයි.

**(ඇ) ජාතික ගෙවීම් පද්ධතියේ යටිතල පහසුකම් වර්ධනය සඳහා දායකත්වය ලබා දීම**

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ජාතික ගෙවීම් කවුන්සිලයේ පෙරදැක්ම අනුව ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන උපදේශනය සහ තාක්ෂණ දැනුම පසුගිය වසර තුළ අඛණ්ඩව සපයන ලදී.

මධ්‍යම ප්‍රතිපාර්ශව පද්ධතිය සම්බන්ධ ඊ වෙළඳ වේදිකාව (e-Trading Platform) සහ බැඳුම්කර නිෂ්කාශන ආයතනය ස්ථාපිත කිරීම මූල්‍ය වෙළඳපොළ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා ගෙන එන වැදගත් ජාතික ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සේවය ලබා දෙන ලදී.

ජාතික ගෙවීම් පද්ධතියේ මූල්‍ය පණිවුඩ ආරක්ෂිතව හුවමාරු කිරීම සඳහා අන්තර්ජාතික SWIFT පද්ධතිය භාවිත කරයි. SWIFT ආයතනය මගින් නිවේදනය කරන ලද පාරිභෝගික ආරක්ෂණ වැඩසටහන (Customer Security Program) අනුව, SWIFT ජාලය ප්‍රධාන දත්ත ජාලයෙන් වෙන් කිරීම හා SWIFT මෙහෙයුම් සඳහා පමණක් පරිගණක වෙන් කිරීම යන ආරක්ෂක පාලනයන් හඳුන්වා දෙන ලදී. මීට අමතරව ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කළ ජංගම යෙදීම් (mobile applications) සඳහා අවම අනුකූලතා ප්‍රමිතිය සකස් කිරීම සඳහාත් ඩයලොග් දත්ත මධ්‍යස්ථානය, ඊසි කැෂ් (eZ Cash) සහ ප්‍රවාහන කාඩ් පද්ධතිය (Transport Card System) අධීක්ෂණය සඳහාත් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සහභාගි විය.

**(ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව හා ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම**

තොරතුරුවල සුරක්ෂිතභාවය වැඩිදියුණු කොට බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධති සයිබර් තර්ජනයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

උපායමාර්ගික ලෙස වැදගත් තොරතුරු පද්ධතිවල අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම සඳහා අඛණ්ඩ අවදානම් ඇගයීම් සිදු කරන ලද අතර සයිබර් ප්‍රහාරයන්ට නිරාවරණය වීම අවම කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂණ ක්‍රමවේද යොදන ලදී. මීට අමතරව, එවැනි අවදානම් සහිත තත්ත්වයන් හඳුනා ගැනීමට සහ ඒවායින් ආරක්ෂිතව සිටීමට නිර්දේශිත ක්‍රියාමාර්ගයන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කරන ලදී.

ඩිජිටල් තොරතුරු වර්ගීකරණය හඳුන්වා දීම සඳහා තාක්ෂණික යටිතල පහසුකම් පිහිටුවන ලද අතර බැංකු තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියට ඇතුළත් කිරීමට නව තොරතුරු වර්ගීකරණ ප්‍රතිපත්තියක් සකස් කරන ලදී.

**(ඉ) කාර්ය මණ්ඩලය අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා සංවර්ධනය**

බැංකුවේ සියලු සේවකයන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ඊ-මේල් හා අභ්‍යන්තර වෙබ් අඩවිය මගින් දැනුවත් කිරීම් සහ අනතුරු ඇඟවීම් ප්‍රකාශයට පත් කරන ලදී. තවද, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම පිණිස, එම නිලධාරීන්ට කෙටිකාලීන දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබා දෙන ලදී.

## 15. අභ්‍යන්තර විගණන

ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු 1951 වසරේ සිට ක්‍රියාත්මක වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ කාර්ය මණ්ඩලයේ මෙහෙවර, කාර්ය වපසරිය, වගවීම, ස්වාධීනත්වය, වගකීම සහ අධිකාරී බලය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රයේ අන්තර්ගතව ඇත. විගණන කටයුතු සිදු කරනු ලබන්නේ ගෝලීය ප්‍රමිතීන් සහ ක්ෂේත්‍රයේ විශිෂ්ට පරිචයන්ට අනුකූලවය. 2017 වසර තුළදී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

### 15.1 අභ්‍යන්තර විගණන සැලසුම්

2018 - 2020 කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි තුන් අවුරුදු උපාය මාර්ගික අභ්‍යන්තර විගණන සැලසුම සකසන ලදී. උපාය මාර්ගික අභ්‍යන්තර විගණන සැලසුම පාදක කොට ගනිමින් 2018 සඳහා වූ වාර්ෂික විගණන සැලසුම ද සකසන ලදී. උපාය මාර්ගික විගණන සැලසුම සහ වාර්ෂික විගණන සැලසුම මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව විසින් සමාලෝචනය කර මුදල් මණ්ඩලයෙන් අනුමත කර ඇත.

### 15.2 විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීම

**(අ) ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන්**

ශ්‍රී ලංකා මහ බැංකුවේ සැලකිය යුතු වපසරියක් ආවරණය කරමින් 2017 වසරේ දී ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන් ක්‍රියාත්මක කරන ලදී. සෑම විගණන පැවරුමක්ම සාමාන්‍යයෙන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සන්නිවේදනය කිරීම සහ නිරාකරණයට අදාළ කටයුතු කිරීම යන අදියර හතරකින් සිදු කරන ලදී. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව විගණන ප්‍රතිඵල සන්නිවේදනය කිරීමේ දී පියවර හතරක් අනුගමනය කරන ලදී. එනම් විගණන නිරීක්ෂණ තහවුරු කර ගැනීම සඳහා නිම කිරීම් රැස්වීම් පැවැත්වීම, විගණන නිරීක්ෂණ ලිඛිතව දැනුම් දීම, විගණන කෙටුම්පත් වාර්තාව නිකුත් කිරීම සහ අවසන් විගණන වාර්තාව නිකුත් කිරීම වේ. තවද, දෙපාර්තමේන්තුවල ක්‍රියාවලි හිමිකරුවන් (Process Owners) විසින් දැනුම් දී ඇති විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් විගණනයන් ද නියමිත කාලපරාසයන් තුළ දී සිදු කරන ලදී.

**(ආ) ස්ථානීය විගණනයන් ක්‍රියාත්මක කිරීම**

අවශ්‍යතාව මත 2017 වසරේදී ද ස්ථානීය විගණනයන් ක්‍රියාත්මක කරනු ලැබූ අතර විගණන ප්‍රතිඵල ක්‍රියාවලි හිමිකරුවන්ට සහ අනෙකුත් අදාළ පාර්ශවයන් වෙත සන්නිවේදනය කරන ලදී.

**(ඇ) විශේෂ පැවරුම්**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත මණ්ඩලයේ නිර්දේශ මත ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ දින මත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට වාර්තා කරන ලද සංචිත මුදල් දත්ත මත විශේෂ විමර්ශනයන් සිදු කරන ලදී.

**(ඈ) විගණන කටයුතුවල ප්‍රගතිය වාර්තා කිරීම**

විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මුදල් මණ්ඩලයට සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවට කාර්තුමය වශයෙන් වාර්තා කරන ලදී. එමෙන්ම, විගණකාධිපති වෙත විගණන කටයුතු පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා සපයන ලදී.

### 15.3 දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු කිරීම්

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් භූතානයේ රාජකීය මූල්‍ය අධිකාරියේ නිලධාරීන් සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. තවද, විගණන සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා 'අභ්‍යන්තර විගණනය පහසු කිරීමේ මාර්ගෝපදේශ' පිළිබඳව දැනුම්වත් කිරීමක් කරන ලදී. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි උපාධි අපේක්ෂකයන් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ශිෂ්‍යයන් සඳහා අභ්‍යන්තර විගණනය සහ ඊට අදාළ විෂයයන් පිළිබඳව පුහුණු කිරීමේ කටයුතු ද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වසර තුළදී අඛණ්ඩව සිදු කරනු ලැබීය.

### 15.4 මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව සඳහා පහසුකම් සැලසීම

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව යනු මුදල් මණ්ඩලයේ අනු කමිටුවක් වන අතර මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධතීන්, අනුකූලතාවය, දුෂ්කෘත නිවේදන සහ වංචා, අභ්‍යන්තර

විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලයෙන් පැවරූ වෙනත් කරුණු මත මුදල් මණ්ඩලයට උපදෙස් දීම සිදු කරයි. මුදල් මණ්ඩලයේ ලේකම් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ලෙස කටයුතු කරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම කමිටුවේ සහකාර ලේකම් ලෙස කටයුතු කරයි. ඒ අනුව, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් කමිටුවේ ලේකම් කටයුතු සඳහා පහසුකම් සැලසීම සිදු කරන ලදී.

## 16. ජාත්‍යන්තර මෙහෙයුම්

ශ්‍රී ලංකාවේ නිල විදේශ විනිමය සංචිත කළමනාකරණය කිරීමේ වගකීම මුදල් නීති පනතට (MLA) අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇත. මේ යටතේ විදේශ සංචිත කළමනාකරණය කිරීමේ කාර්යය සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීමේ හා එය අධීක්ෂණය කිරීමේ කාර්යය ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

විදේශ සංචිතයෙහි නඩත්තුව සහ එහි සංයුතිය, රුපියලේ ස්ථාවරභාවය ආරක්ෂා කරගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි විදේශ විනිමය මෙහෙයුම්හි විෂය පථය සහ විදේශ සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම්වලට අදාළව මූල්‍ය මණ්ඩලයට ඇති බලය සහ වගකීම යනාදිය ආවරණය කරමින් විදේශ සංචිත කළමනාකරණය සඳහා අවශ්‍ය නෛතික රාමුව මුදල් නීති පනත මගින් සලසා ඇත. මේ අනුව වත්කම් වර්ග, ප්‍රතිපාර්ශ්ව විදේශ ආයතන, මූල්‍ය උපකරණ හා නිකුත් කරන්නන් සම්බන්ධයෙන් වන පරාමිතීන් මුදල් නීති පනතේ 67 වන වගන්තියේ සඳහන් වේ. සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම්හි අවකාශය තවදුරටත් පුළුල් කරමින් එහි අරමුණු වන ආරක්ෂිතභාවය, ද්‍රවශීලිතාව සහ ප්‍රතිලාභ වැඩිදියුණු කිරීමට මුදල් මණ්ඩලය මගපෙන්වනු ලබයි.

### 16.1 විදේශ සංචිත කළමනාකරණය

ආරක්ෂාව, ද්‍රවශීලතාව සහ ප්‍රතිලාභ යන අරමුණු සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය විසින් සංශෝධනය හා අනුමත කරනු ලබන විදේශ සංචිත කළමනාකරණ මාර්ගෝපදේශයන්ට අනුව, විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ අධීක්ෂණය යටතේ විදේශ සංචිත ආයෝජනය කරනු ලබයි. මෙම විදේශ සංචිත ප්‍රධාන මුදල් වර්ග කිහිපයකින් සමන්විත වන අතර, ඒවා ප්‍රධාන වශයෙන් ස්ථාවර ආදායම් සුරැකුම් (FIS), මුදල් වෙළඳපොළ උපකරණ සහ රත්‍රන් සංචිතවල ආයෝජනය කර ඇත. ස්ථාවර ආදායම් සුරැකුම් කළඹ ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත රාජ්‍ය සුරැකුම්පත්, රාජ්‍ය වගකීමක් සහිත සුරැකුම්පත්, රාජ්‍ය නියෝජිත ආයතනවල සුරැකුම්පත් සහ අධිජාතික ආයතන මගින් නිකුත් කළ සුරැකුම්වලින් සමන්විත වේ.

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සංචිත කළමනාකරණය සඳහා සිදු කරනු ලබන ගනුදෙනු, ප්‍රතිපාර්ශවයේ ශක්තිය සහ ණය පියවීමේ හැකියාව කෙරෙහි නිසි අවධානය යොමු කර, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පනවනු ලැබූ අවශ්‍ය සීමාවලට යටත්ව, ප්‍රතිපාර්ශ්ව ණය අවදානම් කළමනාකරණ පද්ධතියේ සඳහන් කර ඇති පරාමිතීන්ට අනුව, විදේශ සංචිත කළමනාකරණ කමිටුව මගින් අනුමත කරන ලද ප්‍රතිපාර්ශ්ව වන, මහ බැංකු, ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත වාණිජ බැංකු හා ආයෝජන ආයතන සමග සිදු කරනු ලැබේ. විදේශ සංචිත කළඹයන්හි වත්කම් හා මුදල් සංයුතිය තීරණය කිරීමේ දී ප්‍රධාන සාධක ලෙස විදේශ ද්‍රවශීලතා අවශ්‍යතා, ණය සේවා ගෙවීම්, අවදානම් කළමනාකරණ පරාමිතීන්, ආදායම් උත්පාදන හැකියාව සහ මුදල් මණ්ඩලයේ විශේෂ නියෝග සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

ගෝලීය ආර්ථිකය වසර තුළ දී ක්‍රමානුකූල වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, එය ගෝලීය මහ බැංකු විසින් ප්‍රතිපත්ති සාමාන්‍යකරණයට අදාළව ගත් චිරස්ථායී පියවර තුළින් නිරූපණය විය. ඇමරිකානු ෆෙඩරල් බැංකුව 2017 වර්ෂය තුළදී සිය ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය වූ ශ්‍රම වෙළඳපොළ තත්ත්වයන් මත පදනම්ව ආර්ථික උත්තේජනයන් (Stimulus) හකුලා ගැනීම ආරම්භ කරමින් පොලී අනුපාතයන් (බැංකු පොලී අනුපාතය) තුන්වරක් ඉහළ දමන ලදී. මෙම වසර තුළ යුරෝපා ආර්ථිකය ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරමින් සේවා වියුක්තියේ ක්‍රමානුකූල පහළ බැසීමක් සහ නැගී එන උද්ධමන පීඩන ලක්ෂණ පිළිබිඹු වීමක් දක්නට ලැබුණු අතර 2018 වසර තුළ දී බැංකු පොලී අනුපාත ඉහළ දැමීමක් ඇතුළු මූල්‍ය උත්තේජන පහළ හෙළීමක් අපේක්ෂා කෙරේ. එසේම, ජපන් ආර්ථිකය ද ක්‍රමයෙන් ඉලක්කගත උද්ධමන අනුපාතය සපුරා ගැනීම වෙත තල්ලු වෙමින් පවතී.

මෙම වසර තුළ වරින්වර පැනනැගුණු උතුරු කොරියානු න්‍යෂ්ටික අවි තර්ජන කලාපීය හා ඉන් ඔබ්බට පැතිරී ජාත්‍යන්තර ආර්ථිකයන් තුළ ද ආතතීන් ඇති කරන ලදී. මැදපෙරදිග සහ උතුරු කොරියාවේ මෙම ආක්‍රමණශීලී කටයුතු ගෝලීය ආර්ථිකයන් නිරතුරුවම පීඩනයකට ලක්කරවන ලද අතර, ඒ තුළින් අඩු පොලී අනුපාතයන් ඇති එක්සත් ජනපද හා ජර්මානු බැඳුම්කර වැනි ආරක්ෂිත වත්කම් (Safe-haven Assets) සඳහා වන රුචිකත්වය ඉහළ ගියේය. එසේම, 2017 දෙවන භාගයේදී ජපාන යෙන් (JPY) මුදල් ඒකකයෙහි අගය ද වැඩි විය. 2017 වසරේ තුන්වන කාර්තුව වන විට OPEC සාමාජික රටවල් විසින් පැවති තෙල් සැපයුම් සීමා කිරීම සම්බන්ධව ඇති වූ එකඟතාවන්හි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය බොර තෙල් මිල ඉහළ යාමට පටන් ගන්නා ලදී. මෙවනි අභියෝගාත්මක/වෙනස්වන ගෝලීය වාතාවරණයක් තුළ, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2017 වසර තුළදී මුදල් වෙළඳපොළ (Money Market) ආයෝජන සහ ප්‍රාග්ධන ඉපැයුම් හා ස්ථිර ආදායම් සුරැකුම් මත වන කූපන් ආදායම් සහ වෙළඳපොළ මිලට අගය කිරීම මත රත්‍රන්, විදේශ විනිමය ගනුදෙනු සහ ස්ථිර ආදායම් සුරැකුම් ඉපැයුම් මගින් එක්සත් ජනපද ඩොලර් මිලියන 153 ක මුළු ආදායමක් (Total Return) උපයන ලදී.

2017 වසර තුළදී, ශ්‍රී ලංකාව ලෝක බැංකු සංචිත උපදේශක සහ කළමනාකරණ වැඩසටහනේ (RAMP) පළමු වසර අවසන් කරන ලදී. ලෝක බැංකුවේ, භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව

විසින් මෙහෙයවනු ලබන මෙම වැඩසටහන මගින් විදේශ විනිමය සංචිත හා අනෙකුත් ආයෝජන කළඹ කාර්යක්ෂමව කළමනාකරණයට අවකාශය ලබාදෙන අතර, උපදේශන සේවා සහ රාජ්‍ය අංශයේ ආයෝජන කළමනාකරුවන්ට පුහුණුව සැපයීම ද සිදු කෙරේ. 2017 වසර තුළදී, උපායමාර්ගික වත්කම් වෙන්කිරීම් (SAA), සඳහා වත්කම් පෙළගස්වන ලදී. මෙහිදී, මධ්‍ය සහ දිගු කාලීන ආයෝජන අරමුණු වන අනාගත වගකීම් පියවීම, ප්‍රාග්ධන සංරක්ෂණය සහ වර්ධනය වැනි දෑ කර ගැනීමට ගැලපෙන වත්කම් වෙන් කිරීමක් විද්‍යාත්මකව කරනු ලබයි. සංචිත උපදේශක සහ කළමනාකරණ වැඩසටහන යටතේ, ලෝක බැංකු භාණ්ඩාගාරය ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විදේශ විනිමය කළමනාකරුවෙකු වශයෙන් පත්කර ගන්නා ලද අතර, වසර 3 ක් සඳහා ඇ.එ.ජ. ඩොලර් මිලියන 200 ක විදේශ සංචිත ඒ සඳහා වෙන් කරන ලදී. මෙම මුදල් ඉහළ ශ්‍රේණිගත රාජ්‍ය සුරැකුම්, රාජ්‍ය වගකීම සහිත සුරැකුම් සහ අධිජාතික ආයතනවල ආයෝජනය කළ යුතු වේ.

ලෝක බැංකු තාක්ෂණික ප්‍රවීනයන්ගේ සහය ඇතිව, 2017 වසර තුළදී විදේශ සංචිත කළමනාකරණය සම්බන්ධව නේවාසික වැඩමුළු 3 ක් පවත්වන ලදී. ආයෝජන කළඹ කළමනාකරණය, අවදානම් සහ කාර්යසාධන මැනීම සහ උපාය මාර්ගික වත්කම් වෙන්කිරීමේ (SAA) ව්‍යූහයට අනුව වාර්තා කිරීම මෙම වැඩමුළුවල ඉලක්ක විය. මීට අමතරව, ලෝක බැංකුව විසින් සංචිත උපදේශක සහ කළමනාකරණ වැඩසටහනේ (RAMP) සාමාජික රටවල්වල නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් 2017 පෙබරවාරි මාසය තුළදී දින 5 ක ජාත්‍යන්තර වැඩමුළුවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව මෙහි සම සත්කාරකත්වය දරන ලදී.

## 16.2 ආයෝජන ක්‍රියාකාරකම් විශ්ලේෂණය හා පහසුකම් සැලසීම

ආයෝජන ක්‍රියාකාරකම් විශ්ලේෂණය හා පහසුකම් සැලසීම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත කළමනාකරණය හා සම්බන්ධ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් සිදු කෙරේ.

### (අ) කාර්ය සාධන ඇගයීම

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, එහි සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම්වල කාර්ය සාධන ඇගයීම් කටයුතු එහි සමස්ත ප්‍රතිලාභ ප්‍රමාණය අනුව දෛනිකව ගණනය කරනු ලබන අතර, එය විදේශ සංචිත මට්ටම සහ එහි ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණයක් ද සහිතව විදේශ සංචිත කළමනාකරණ කමිටුවට සහ මුදල් මණ්ඩලයට පිළිවෙලින් මාසිකව සහ ත්‍රෛමාසිකව වාර්තා කරනු ලබයි. මෙහිදී, ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනයන් හරහා ඉපැයෙන ප්‍රතිලාභ, මුදල් මණ්ඩලය අනුමත කළ උපාය මාර්ගික වත්කම් වෙන් කිරීමේ ක්‍රමයට අනුව තෝරාගත් පිළිගත් මිණුම්දඬුවලට සාපේක්ෂව මනිනු ලබයි. මෙම සාපේක්ෂ ඇගයීම් ක්‍රමය, ආදායම් සංසන්දනයට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබ තිබූ අමතර අවදානම්, ලැබෙන අමතර ප්‍රතිලාභ මගින් ප්‍රමාණවත් ලෙස ආවරණය වන්නේ ද යන්න පෙන්නුම් කිරීමෙන් විදේශ සංචිත කළමනාකරණ උපාය මාර්ගයේ කාර්යක්ෂමතාව තීරණය කිරීමට උපාකාරී වේ. 2018 සිට කාර්ය සාධන විශේෂණ ක්‍රමවේදයක් යටතේ විදේශ සංචිත කළමනාකරණයෙන් ලැබෙන ප්‍රතිලාභ තවදුරටත් සවිස්තරව ඉදිරිපත් කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළ මේ වන විට ආරම්භ කර ඇත. මෙම විශේෂණ ක්‍රමවේදය හරහා ලබාගන්නා දත්ත ඉහළ දිගු කාලීන ප්‍රතිලාභ අරමුණු කරගත් විදේශ සංචිත කළමනාකරණ උපාය මාර්ග සැකසීමේ දී එහි ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා යොදාගත හැක.

### (ආ) සංචිත කළමනාකරණ පද්ධතිය (TMS) පරිපාලනය කිරීම

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සංචිත කළමනාකරණ පද්ධතියේ ප්‍රධාන පරිශීලකයා වන්නා සේම, එහි පරිපාලන කටයුතුවල භාරකාරත්වය ද උසුලන අතර, අනෙක් පරිශීලන දෙපාර්තමේන්තු, එම පද්ධතියේ විදේශ විකුණුම්කරු සහ එහි දේශීය හවුල්කරු අතර නිසි සම්බන්ධීකරණය පවත්වා ගැනීම සම්බන්ධයෙන් ද වගකීම දරයි. තවද, සංචිත කළමනාකරණ පද්ධතියේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සහතික කරනු වස් අවශ්‍ය වන්නා වූ නිසි වැඩිදියුණු කිරීම් සහ යාවත්කාලීන කිරීම් පිළිබඳව මෙන්ම SWIFT, RTGS සහ GL වැනි අභ්‍යන්තර පද්ධති ඇතුළුව Bloomberg සහ Reuters වැනි බාහිර පද්ධති සමඟ ද එහි පූර්ණ සහ අඛණ්ඩ සම්බන්ධතාව සහතික කිරීමේ වගකීම ද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සතු වේ.

නව වත්කම් වෙන්කිරීමේ ක්‍රමවේදයට අනුව විදේශ සංචිතයන්ට අදාළ ශාඛා මට්ටමේ ආකෘතිය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය වූ වත්මන් සංචිත කළමනාකරණ පද්ධතියේ වෙනස්කම් සිදු කිරීම, පද්ධතියේ පාලනය සහ ආරක්ෂාව ඉහළ නැංවීම පිණිස වූ වැඩිදියුණු කිරීම් සහ ස්වයංක්‍රීය දින අවසන් කිරීමේ ක්‍රියාවලිය හඳුන්වාදීම සඳහා අවශ්‍ය පියවර 2017 වසරේදී ගන්නා ලදී.

### (ඇ) මූල්‍යමය නොවන අවදානම් අධීක්ෂණය

සංචිත කළමනාකරණ කටයුතුවලට අදාළ මූල්‍ය-නොවන අවදානම් තත්වය පිළිබඳ විමසිලිමත් වීම සහ හඳුනාගැනීම ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් කරනු ලබන අතර, ඒ හා සබැඳි යෝජිත අවදානම් ප්‍රතිකර්ම මූල්‍ය-නොවන අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෑම කාර්තුවකදීම ඉදිරිපත් කරයි.

### (ඈ) මූල්‍ය විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදී කටයුතු සඳහා අරමුදල් සැපයීමට ඇති ඉඩකඩ වැළැක්වීම සම්බන්ධයෙන් ගනුදෙනු පාර්ශ්වයන්ගේ ඇති බැඳීම/අනුකූල වීම පිළිබඳ වාර්ෂික සමාලෝචනය

වසර 2017 දී ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් 'ගනුදෙනුකරු හඳුනා ගැනීම (KYC)/ගනුදෙනුකරුවන් පිළිබඳ යථායෝගයෙන් ක්‍රියා කිරීම (CDD) සම්බන්ධ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගනුදෙනු පාර්ශ්ව වෙත බලපවත්වන රීති' නම් වූ නව මාර්ගෝපදේශ පද්ධතිය පළමුවරට ක්‍රියාත්මක කරන ලදී. මෙහි මුඛ්‍ය අරමුණ වන්නේ විදේශ සංචිත කළමනාකරණ කටයුතු වලට අදාලව මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ පිළිගත් ජාත්‍යන්තර පරිචයන් සම්බන්ධයෙන් වූ නීති හා රෙගුලාසි පිළිබඳ අනුකූලතාවය සහතික කිරීමයි.

## 16.3 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි විදේශ විනිමය අනුපාතිකයේ අධික විචලනයන් පාලනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ ගනුදෙනු සුමටව පවත්වා ගෙන යාම තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ ගනුදෙනු අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. ඇමෙරිකානු එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් මාර්තු මාසයේ පොලී අනුපාත ඉහළ දැමීම සම්බන්ධයෙන් පැවති අපේක්ෂාවත් සමඟ රජයේ භාණ්ඩාගාර සුරැකුම්පත්වල සිදුකර තිබූ විදේශීය ආයෝජන රටින් ඉවතට ගලායාම, මහා බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීමෙන් පසු යුරෝපා කලාපයේ ඇති වූ වර්ධනයන් සහ උතුරු කොරියානු ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ඇති වූ අවිනිශ්චිතතාවය යන කරුණු, 2017 වසරේ මුල් කාලයේ දී ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සඳහා හේතු විය. 2017 වසරේ පළමු කාර්තුව තුළදී ණය සේවා වාරික ගෙවීම සහ ආනයන සඳහා වූ ඉල්ලුම ඉහළ යාම හේතුකොටගෙන විනිමය අනුපාතිකය මත වූ පීඩනය තවදුරටත් උත්සන්න විය. කෙසේ වුවද, අපනයන ලැබීම් පරිවර්තනයන් තුළින් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමට යටත්ව තෙවන සහ සිව්වන වාරිකයන් ලැබීමත් සමඟ ඇති වූ ධනාත්මක තත්ත්වය හේතුකොටගෙන විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනය වසර අවසන් වනවිට ක්‍රමයෙන් ලිහිල් විය. තවද, 2017 වසර තුළ දී, වෙළඳපොළ බලවේගයන්ට අනුව විදේශ විනිමය අනුපාතය තීරණය වීමට ඉඩ සැලැස්වීම හරහා වැඩි නම්‍යශීලීතාවයකින් විනිමය අනුපාතය තීරණය කිරීමට අවකාශ සැලසීමට ගත් විනිමය ප්‍රතිපත්ති මේ සඳහා තවදුරටත් ඉවහල් විය.

2016 වසරේ දී එක්සත් ජනපද ඩොලර් බිලියන 14.80 ක් වූ මුළු අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව 2017 වසරේ දී එක්සත් ජනපද ඩොලර් බිලියන 16.45 ක් දක්වා වැඩි විය (II-23 වන සංඛ්‍යා සටහන). මෙම වසර තුළදී ද බලපත්‍රලාභී බැංකුවලට පවත්වා ගෙන යා හැකි ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණය මත පනවන ලද සීමාව වන එක්සත් ජනපද ඩොලර් මිලියන 197 මට්ටම නොවෙනස්ව පැවතුණි. තවද, 2016 ශුද්ධ විදේශ විනිමය විකුණුම් ප්‍රමාණය වන එක්සත් ජනපද ඩොලර් මිලියන 768.16 හා සැසඳීමේ දී, වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 1,664.35 ක් විය (II-24 වන සංඛ්‍යා සටහන).

2017 වසරේ දී, පවතින දේශීය අන්තර් බැංකු විදේශ විනිමය වාර්තා කිරීමේ හා අධීක්ෂණය කිරීමේ පද්ධතිය වැඩිදියුණු කරමින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සහ දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සමඟ එක්ව දේශීය විදේශ විනිමය වෙළඳපොළ ගනුදෙනු තත් කාලීනව වාර්තා කිරීම සහ අධීක්ෂණය කිරීම ශක්තිමත් කිරීම සඳහා 'ඒකාග්‍රිත කේන්ද්‍රීය වෙළඳපොළ අධීක්ෂක' නමින් සංකලිත වෙළඳපොළ අධීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කරන ලදී. අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු ස්වයංක්‍රීයව වාර්තා වීම සඳහා මෙම නව පද්ධතිය බ්ලූම්බර්ග් සහ තොම්සන් රොයිටර්ස් යන වෙළඳ ගනුදෙනු පද්ධතීන් සමඟ මෙන්ම, වෙළෙඳපොළ සහභාගී වන ආයතනයන් සමඟද සම්බන්ධ වී 2018 ජනවාරි 02 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.

**II-23 සංඛ්‍යා සටහන**

**අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව - 2017**

(එ.ජ.ඩො. මිලියන)

| මාසය | එතැන් | පසුදින | එදින | ඉදිරි | එකතුව |
|---|---|---|---|---|---|
| ජනවාරි | 305.42 | 187.13 | 205.11 | 845.68 | 1,543.34 |
| පෙබරවාරි | 233.20 | 185.05 | 262.65 | 894.55 | 1,575.45 |
| මාර්තු | 186.25 | 193.80 | 276.40 | 1052.34 | 1,708.79 |
| අප්‍රේල් | 164.50 | 178.75 | 215.50 | 762.01 | 1,320.76 |
| මැයි | 116.50 | 89.95 | 172.06 | 676.33 | 1,054.85 |
| ජූනි | 241.35 | 297.50 | 209.85 | 782.31 | 1,531.01 |
| ජූලි | 314.31 | 277.15 | 339.71 | 542.24 | 1,473.42 |
| අගෝස්තු | 296.43 | 207.74 | 300.66 | 541.07 | 1,345.91 |
| සැප්තැම්බර් | 265.35 | 225.00 | 245.45 | 460.03 | 1,195.83 |
| ඔක්තෝබර් | 294.72 | 179.35 | 277.10 | 434.05 | 1,185.22 |
| නොවැම්බර් | 304.67 | 159.15 | 247.43 | 539.63 | 1,250.87 |
| දෙසැම්බර් | 291.01 | 224.83 | 255.04 | 494.79 | 1,265.67 |
| **එකතුව** | **3,013.69** | **2,405.40** | **3,006.97** | **8,025.06** | **16,451.12** |

මූලාශ්‍රය: ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II-24 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සිදුකරන ලද විදේශ විනිමය ගැනුම් සහ විකුණුම් - 2017**

(එ.ජ.ඩො. මිලියන)

| මාසය | ගැනුම් | විකුණුම් | ශුද්ධ විදේශ විනිමය ගැනුම්/(විකුණුම්) |
|---|---|---|---|
| ජනවාරි | 64.66 | 204.50 | (139.84) |
| පෙබරවාරි | 145.09 | 297.25 | (152.16) |
| මාර්තු | 192.23 | 13.00 | 179.23 |
| අප්‍රේල් | 257.91 | - | 257.91 |
| මැයි | 183.48 | 35.00 | 148.48 |
| ජූනි | 136.00 | - | 136.00 |
| ජූලි | 344.75 | - | 344.75 |
| අගෝස්තු | 200.00 | - | 200.00 |
| සැප්තැම්බර් | 186.50 | - | 186.50 |
| ඔක්තෝබර් | 97.00 | - | 97.00 |
| නොවැම්බර් | 206.00 | - | 206.00 |
| දෙසැම්බර් | 200.50 | - | 200.50 |
| **එකතුව** | **2,214.10** | **549.75** | **1,664.35** |

මූලාශ්‍රය: ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

# 17. නීති සහ අනුකූලතා කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණු ඉටු කිරීම සඳහා අවශ්‍ය වන පරිදි බැංකුවට අදාළ නව නීති සම්පාදනය සහ පවත්නා නීති සමාලෝචනය කිරීමේදී එහි සියලුම නීතිමය සහ පටිපාටිමය කාර්යයන් නිසි ලෙස ඉටු කෙරෙන බවට සහතික වීමත්, අනුකූලතා කාර්යයන්ගේ දුර්වලතාවයන් හඳුනා ගෙන ඒවා නිවැරදි කිරීමේ පියවර ගැනීම පිණිස මහ බැංකුවේ කළමනාකාරිත්වයට එළඹයි අනුකූලතා පදනමක් බිහි කර දීමත්, නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම වේ. මෙම කාර්යයේදී, බැංකුවේ නීතිමය පදනම ආරක්ෂා කර ගැනීම සහ නීතිමය නියාමනමය පදනම යාවත්කාලීනව පවත්වා ගැනීම පිණිස විශාල පරාසයක විහිදී ඇති කාර්යයන් රැසක් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි. එසේම, නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතාවයන් සඳහාද දායක විය යුතු වේ. දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේදී ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

### (අ) මහ බැංකුව සම්බන්ධ නීති සහ නීතිමය පටිපාටීන්ගේ විශ්වසනීයත්වය තහවුරු කිරීම

මෙම වර්ෂය තුළදී නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ නීතිමය රාමුව පිළිබඳවත්, මහ බැංකුවේ මෙහෙයුම් කාර්යයන් පිළිබඳවත්, මුදල් මණ්ඩලයට සහ මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවලට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

අදාළ නීති සම්බන්ධ අනුකූලතාවය දැඩි කරනු වස් හා මූල්‍ය ආයතනවල ගැටලු කාර්යක්ෂම අයුරින් නිරාකරණය කිරීම අරමුණු කරගෙන අදාළ නීතිමය ප්‍රතිපාදන උල්ලංඝනය කරනු ලැබූ මූල්‍ය ආයතනවලට එරෙහිව පියවර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය උපදෙස් හා තාක්ෂණික සහාය නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් සපයා ඇත.

මූල්‍ය පද්ධති ස්ථායීතාවය ළඟා කර ගැනීම ඉලක්ක කරගෙන බහුතරයක් එවන් උපදෙස් සපයනු ලැබුවද, නියෝජ්‍යත්ව කාර්යයන් සහ සංස්ථාපිත සේවාවන් වැනි මහ බැංකුවේ අනෙකුත් වගකීම්වලට අදාළවද නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව නීති උපදෙස් ලබා දී ඇත.

මහ බැංකුව විසින් එළඹීමට නියමිත ගිවිසුම් සහ කොන්ත්‍රාත්තුවල නෛතිකභාවය පරීක්ෂා කිරීම මෙන්ම මහ බැංකුවට අදාළ ඔප්පු හා අනෙකුත් ලේඛන ලියා සහතික කිරීමද නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

### (ආ) නීති කෘත්‍යයන්

මහ බැංකුවේ මුදල් මණ්ඩලය හෝ එහි සේවකයන් පාර්ශ්වයන් වන නඩු කටයුතු මනාව මෙහෙයවීම නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවේ වගකීම වේ. 2017 වසරේදී දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවූ කිසිදු නීති කෘත්‍යයක් මහ බැංකුවට අගතිදායක අයුරින් අවසාන නොවූ බව සාඩම්බරයෙන් අවධාරණය කර සිටිමු.

### (ඇ) නීති ප්‍රතිසංස්කරණ

විදේශ විනිමය පනත හඳුන්වා දීම සඳහා නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව මූලිකව කටයුතු කළ අතර, එයට අමතරව ප්‍රධාන අණපනත් වන මුදල් නීති පනත, බැංකු පනත, ගෙවීම් සහ පියවීම් පද්ධති පනත, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සමාලෝචනය කිරීම සඳහාද කටයුතු කරන ලදී. දැනටමත් මතු වී ඇති ගැටලු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ යටිතල පහසුකම්වල හඳුනාගත් අඩුලුහුඬුකම් නිසි පරිදි ආමන්ත්‍රණය කිරීම එකී සමාලෝචනයන්ගේ මූලික අරමුණ විය.

### (ඈ) අනුකූලතාව

අනුකූලතාව සම්බන්ධ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස මහ බැංකුව සඳහා විස්තරාත්මක අනුකූලතා අත්පොතක් සැකසීමේ කටයුත්ත දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. එයට අමතරව, මහ බැංකු සේවකයන්ගේ වෘත්තීය ආචාරධර්ම ප්‍රවර්ධනය කිරීම තුළින් මහ බැංකුවේ මෙහෙයුම් කාර්යයන්වල විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා දුෂ්කෘත නිවේදන ප්‍රතිපත්තියක් දැනටමත් හඳුන්වා දී ඇති අතර මහ බැංකු සේවකයන් සඳහා ආචාරධර්ම පද්ධතියක් සැකසීමද ආරම්භ කරන ලදී.

### (ඉ) මහජනතාව දැනුවත් කිරීම

අනවසර මූල්‍ය ව්‍යාපාර, තහනම් යෝජනා ක්‍රම සහ මූල්‍ය අතරමැදිකරණය වැනි මහ බැංකුකරණය සම්බන්ධ නීතීන්ගේ නව ප්‍රවණතාවනයන් සම්බන්ධව විවිධ පාර්ශ්වයන් දැනුවත් කිරීම අරමුණු කරගෙන දිවයින පුරා පැවැත්වෙන විවිධාකාර වැඩමුළු, සම්මන්ත්‍රණවල සම්පත්දායකයන් ලෙස නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දායකත්වය ලබා දෙන ලදී.

### (ඊ) නීති බලගැන්වීම් අංශය

2017 ජුනි 16 දින පැවැති අංක 21/2017 දරන මුදල් මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණයක් පරිදි, නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවට අනුබද්ධව 2017.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලගැන්වීම් අංශය පිහිටුවන ලදී. එම අංශයේ මූලික අරමුණු වූයේ මහ බැංකුව මගින් පරිපාලනය කෙරෙන පනත්වල විධිවිධානයන්ට අදාළ අපරාධ වැරදි සම්බන්ධ නීති බලගැන්වීම් සිදු කිරීම, අසාර්ථක මූල්‍ය සමාගම්වලට එරෙහිව නීතිමය පියවර ගැනීම, තහනම් යෝජනා ක්‍රම සහ නීති විරෝධී තැන්පතු රැස්කිරීම් වළක්වාලීම යනාදියයි. එම අංශයේ විමර්ශන කටයුතු සඳහා සහාය දීම සඳහා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට අනුයුක්ත පොලිස් නිලධාරීන් සිව් දෙනෙකුගෙන් සමන්විත විශේෂ පොලිස් අංශයක් ද ස්ථාපිත කරන ලදී.

1988 අංක 30 දරන බැංකු පනතේ 83 (ඇ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව තහනම් යෝජනා ක්‍රම සම්බන්ධ විමර්ශන සිදු කිරීම සහ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ විධිවිධාන යටතේ නීති විරෝධී තැන්පතු භාර ගැනීමට එරෙහිව පියවර ගැනීම මෙම බලගැන්වීම් අංශය වෙත පැවරී තිබිණි. ඒ අනුව,

නීති විරෝධී තැන්පතු රැස්කිරීමෙහි යෙදුණු එක් සමාගමක් ද, තහනම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ සමාගම් හතරක් ද, සම්බන්ධව විමර්ශන ආරම්භ කරන ලදී.

2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලගැන්වීම් අංශය, මහ බැංකුවේ දෙපාර්තමේන්තුවක් බවට පත් කරන ලද අතර එය නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලදී.

## 18. සාර්ව විචක්ෂණතා අධ්‍යයන

සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව 2007 වසරේ එහි ස්ථාපනයේ සිටම මූල්‍ය පද්ධතියේ පද්ධතිමය අවදානම් හා අන්තරායන් තක්සේරු කිරීමේ අභිලාශයෙන් යුතුව අවශ්‍ය දත්ත හා සම්පත්වලින් පරිපූර්ණ විය. මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පවත්වා ගැනීම පිළිබඳ මහ බැංකුවෙහි අරමුණ අනුව යමින්, මූල්‍ය පද්ධති ස්ථායීතාවයට බලපාන අවදානම් අවම කිරීම සඳහා පූර්ව ක්‍රියාකාරී සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති මෙවලම් සම්පාදනය කිරීමේ වගකීම දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

විවිධ සංඛ්‍යානමය විශ්ලේෂණ, මූල්‍ය ආයතන පිළිබඳ පරීක්ෂණ, පද්ධතියේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර අන්තර් සම්බන්ධතාව පිළිබඳ අධ්‍යයන සහ ස්ථායීතාවය හා අවදානම් පිළිබඳව වෙළඳපොළ මත සම්බන්ධව දෙපාර්තමේන්තුව විසින් සිදු කරන සමීක්ෂණ ඉහත කී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශාල පිටුවහලක් විය. දෙපාර්තමේන්තුව විසින් වසර තුළ සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

### අ) සාර්ව විචක්ෂණ අධ්‍යයනය

දෙපාර්තමේන්තුවේ අභිමතාර්ථය අනුව යමින්, බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ලැයිස්තුගත සමාගම් වැනි මූල්‍ය ආයතන මෙන්ම මුදල් වෙළඳපොළ හා සාර්ව ආර්ථිකයේ ස්ථායීතාවය ඇගයීම අරමුණු කරගෙන මූල්‍ය කාර්යසාධන දර්ශක රාශියක් සකස් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, දේශීය මුදල් මත පීඩනය පුරෝකථනය කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශකයක් සම්පාදනය කරන ලදී. මෙම විශ්ලේෂණයන්ගේ සොයා ගැනීම් මූල්‍ය පද්ධති ස්ථායීතාව පිළිබඳ කාර්තුමය මුදල් මණ්ඩල පත්‍රිකා හරහා මුදල් මණ්ඩලයට නිතිපතා ඉදිරිපත් කරන ලදී.

සාර්ව විචක්ෂණ අධ්‍යයන සඳහා අවශ්‍ය සවිස්තරාත්මක දත්ත ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශවයන්ගෙන් ඵලදායී ලෙස දත්ත එක්රැස් කිරීම තවදුරටත් විධිමත් කිරීමටත්, මහ බැංකුව තුළ ගැටලුවකින් තොරව දත්ත හුවමාරු කර ගැනීමටත්, අන්තර් දෙපාර්තමේන්තු තාක්ෂණ කමිටුවක් ආරම්භ කරන ලදී.

### ආ) සමීක්ෂණ

2017 වර්ෂය මුලදී මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ඇගයීමට විධිමත් ද්වි-වාර්ෂික සමීක්ෂණයක් ආරම්භ කරන ලද අතර, මූල්‍ය පද්ධතියට හා මූල්‍ය පද්ධති ස්ථායීතාවයට ඇති විය හැකි අවදානම් පිළිබඳව වෙළඳපොළ මත හඳුනාගැනීම සඳහා මූල්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගෙන් විශාල සහයෝගයක් ලැබිණි. තවද, ශ්‍රී ලංකාවේ ගෘහ ඒකකවල ණයගැතිභාවය ඉහළ යෑම පිළිබඳ මූල්‍ය හා සමාජ අවධාරණය නිසා ගෘහස්ත අංශය පිළිබඳ සමීක්ෂණයක් සඳහා මූලික අඩිතාලම යොදන ලදී. ඒ අනුව, සාර්ව විචක්ෂණ අධ්‍යයන දෙපාර්තමේන්තුව මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීත්වයෙන් ගෘහ ඒකකවල ණයගැතිභාවය පිළිබඳ සමීක්ෂණය කිරීමට හා තොරතුරු එක් රැස් කිරීමට කටයුතු කරන ලදී.

### ඇ) මහ බැංකුවේ ප්‍රකාශන හා වාර්තා

2016 වාර්ෂික වාර්තාවේ අටවන පරිච්ඡේදය සහ මුදල් ඇමති වෙත යොමු කරන වාර්තාව සකස් කිරීම හා සම්බන්ධීකරණය මගින් දෙපාර්තමේන්තුව මහ බැංකුවේ ව්‍යවස්ථාපිත වාර්තාවලට දායක වන ලදී. මීට අමතරව, මහ බැංකුවේ මූල්‍ය අංශය හා සම්බන්ධ අනෙකුත් දෙපාර්තමේන්තු සහ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, සණස මහා සංගමය, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ඒකක භාර සංගමය සහ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම් වැනි බාහිර ආයතනවල සහයෝගය ඇතිව සාර්ව විචක්ෂණ අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මෑත කාලීන ආර්ථික ප්‍රවණතා වාර්තාවෙහි අටවන පරිච්ඡේදය වන 'මූල්‍ය අංශයේ ප්‍රවණතා හා ස්ථායීතාව' පිළියෙල කරන ලදී. තවද, මෙම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රතිපත්ති විවරණය 2017 වසර සඳහා ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. මූල්‍ය ආයතන වෙළඳපොළ සහ යටිතල පහසුකම් පිළිබඳ සවිස්තරාත්මක කරුණු සහ දත්ත සැපයීම මගින් අදාළ පාර්ශවකරුවන්ට මූල්‍ය පද්ධතිය සහ එහි ස්ථායීතාවය පිළිබඳ අවබෝධයක් ලබාදීම මෙම වාර්තාවල අරමුණ වේ. ජාතික මූල්‍ය පද්ධතියේ කාර්යසාධනය ඒ හා සම්බන්ධ අවදානම් ඉඩප්‍රස්ථා සහ නියාමන සංවර්ධන පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමට සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව නිරන්තරයෙන්ම උත්සාහ දරයි.

## 19. ගෙවීම් සහ පියවීම්

මුදල් නීති පනතේ 62 අ වගන්තිය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අරමුදල් මාරු කිරීම සඳහා පද්ධති පිහිටුවීම සහ මෙහෙයවීම, ගෙවීම් බැරකම් පියවීම සහ සහභාගිත්ව ආයතනවලට පද්ධති නීතිරීති නිකුත් කිරීම සඳහා බලය පවරා ඇත. මේ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව 2002 දී ස්ථාපනය කරන ලදී. 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත බලාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවට එම පනත යටතේ පැවරී ඇති වගකීම් ඉටු කිරීම ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවට පවරන ලදී.

තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි (RTGS) මෙහෙයුම් සිදු කිරීම, මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීම, ස්විෆ්ට් (SWIFT) සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීම, ආසියානු නිෂ්කාශන සංගමයේ රටවල් අතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම, ජාතික ගෙවීම් යාන්ත්‍රණය ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීම සහ

රට තුළ ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමන සහ අවේක්ෂණ කටයුතු සිදු කිරීම යන කාර්යයන් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කටයුතු වේ. 2017 වසර තුළ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කටයුතුවලට අදාළ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් පහත දැක්වේ.

## 19.1 තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු

(අ) ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන අතර කාල සංවේදී සහ විශාල වටිනාකම් සහිත ගෙවීම් තත්කාලීන දළ පියවීම් පදනම මත පියවීම් සිදු කරන තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කරන ලද අතර, එම පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා, අතිරේක අරමුදල් ඉල්ලා සිටින සහභාගිත්ව ආයතන වෙත එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා දීම ද සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවෙහි මධ්‍යම තැන්පතු පද්ධතියයි.

(ආ) 2017 වසර අවසානයේදී තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන සංඛ්‍යාව 36 ක් විය. වසර තුළදී තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් රුපියල් බිලියන 92,303 ක වටිනාකමින් යුත් ගනුදෙනු 377,312 ක ප්‍රමාණයක පියවීම් කටයුතු සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් පියවන ලද දෛනික සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය 1,566 ක් වූ අතර, එහි ගනුදෙනුවල සාමාන්‍ය වටිනාකම රුපියල් බිලියන 383 ක් විය. සහභාගිත්ව ආයතන වෙත දෛනිකව ලබාදෙන ලද එක් දින ද්‍රවශීලතා පහසුකමෙහි සාමාන්‍යය රුපියල් බිලියන 47.4 ක් විය. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරමින් තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි උපයෝගීතාව වසර තුළදී සියයට 99.71 වැනි ඉහළ තත්ත්වයකින් පවත්වා ගෙන යන ලදී.

## 19.2 ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා සැපයීම

**(අ) විදේශ විනිමය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා**

2017 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් සපයන ලද පසු මෙහෙයුම් කාර්යාල සේවා පහත දැක්වේ.

i) 2017 වසරේදී, විදේශ විනිමය අලෙවි සහ මූල්‍යන, මුදල් වෙළඳපොළ, ස්ථාවර ආදායම් සුරැකුම්පත්, රන් වෙළඳපොළ ආශ්‍රිත කටයුතු, ආසියානු නිෂ්කාශන සංගමයේ ගනුදෙනු සහ ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් ගනුදෙනු 10,475 කට අදාළ පියවීම් සිදු කළ අතර, එහි වටිනාකම එක්සත් ජනපද ඩොලර් බිලියන 357.2 ක් විය.

ii) ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව, පසු මෙහෙයුම් කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය සංශෝධන සැපයීම මගින් භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියෙහි නවීකරණ ව්‍යාපෘතිය සඳහා දායක විය.

**(ආ) විවට වෙළඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා**

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ සිදු කළ විවට වෙළඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සලසා දෙමින් විවට වෙළඳපොළ සහභාගිත්ව ආයතනවල ද්‍රවශීල අවශ්‍යතා කළමනාකරණය සඳහා පහසුකම් සලසන ලදී. ඒ අනුව, 2017 වසර තුළදී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 3,327 ක් වටිනා ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු 1,212 ක් ද, වටිනාකම රුපියල් බිලියන 3,955 ක් වූ නිත්‍ය තැන්පතු පහසුකම් ගනුදෙනු 3,130 ක් ද, රුපියල් බිලියන 2,130 ක් වූ නිත්‍ය ණය පහසුකම් 2,844 ක් ද, රුපියල් බිලියන 1,050 ක් වූ ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු 1,860 ක් ද, රුපියල් බිලියන 109 ක් වූ ස්ථිර පදනම මත විකුණුම් ගනුදෙනු 89 ක් ද සිදු කිරීමට සහ පහසුකම් සැලසීමට දායක විය.

## 19.3 ස්විෆ්ට් මූල්‍ය තොරතුරු සන්නිවේදන පද්ධතිය කළමනාකරණය

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් තම මූල්‍යමය මෙහෙයුම් සන්නිවේදනය සඳහා අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමයෙහි (ස්විෆ්ට්) සේවාවන් භාවිතා කරනු ලබන අතර, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ස්විෆ්ට් පද්ධතිය භාවිතා කරන්නන් වෙනුවෙන් එම පද්ධතිය පවත්වා ගෙන යෑම ද සිදු කරනු ලබයි. ඒ සඳහා, මෘදුකාංග සහ දෘඩාංග, ක්‍රියාදාමයන්, ක්‍රියාපටිපාටීන් සහ අවදානම් කළමනාකරණ පාලනයන් සම්බන්ධයෙන් ස්විෆ්ට් ප්‍රධාන මූලස්ථානය මගින් නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම පද්ධතිය පවත්වාගෙන යෑම ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීමට සහ මනා සේවාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ස්විෆ්ට් නෙට් පද්ධතිය සමඟ සම්බන්ධතාවය ලංකා මූල්‍ය සේවා කාර්යාංශ සමාගම හරහා ඇති වක්‍ර සම්බන්ධතාවක් ලෙස පවත්වා ගනී. ජාත්‍යන්තරව සලකන විට, මෙහෙයුම් කටයුතු සහ පද්ධති අවදානම් තත්ත්වයන්හි වැඩි වීම නිසා, 2017 වසර ස්විෆ්ට් පද්ධතිය භාවිතා කරන්නන් හට අභියෝගාත්මක වසරක් විය. තම සේවාදායකයින් වෙත වැඩි දියුණු කරන ලද පහසුකම් සහිත වඩා කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා සේවා සැපයුම්කරු විසින් ස්විෆ්ට් පද්ධතිය නව සංස්කරණයක් (වෙළුම 7.1.40) සඳහා කිහිප වතාවක්ම වැඩිදියුණු කරන ලදී. ඒ අනුව, ස්විෆ්ට් විසින් හඳුන්වා දුන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ද මෙම නව සංස්කරණ සාර්ථකව ස්ථාපනය කරන ලදී. ස්විෆ්ට් අංශයෙහි ආරක්ෂක තත්ත්වය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ද විවිධ ආරක්ෂක ක්‍රමෝපායයන් හඳුන්වා දෙන ලදී. 2017 වසරේදී යවන ලද සහ ලැබුණු මුළු ස්විෆ්ට් පණිවුඩ සංඛ්‍යාව, පිළිවෙළින්, 1,438,115 ක් සහ 801,620 ක් විය. ලැබුණු මුළු පණිවුඩ සංඛ්‍යාවෙන් 230,819 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ

ගනුදෙනු සඳහා වූ අතර, ඉතිරිය තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ සුරැකුම්පත් ආශ්‍රිත ගනුදෙනු සඳහා විය.

### 19.4 ආසියානු නිෂ්කාශන සංගමය යටතේ සිදු කරන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

2017 වසරේදී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ආසියානු නිෂ්කාශන සංගමයෙහි සාමජික රටවල් 9 අතර සිදුවන ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් පදනම මත පියවීම සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. ආසියානු නිෂ්කාශන සංගම් යාන්ත්‍රණය හරහා ශ්‍රී ලංකාව, රුපියල් බිලියන 533.6 ක වටිනාකමකින් යුත් ගනුදෙනු 6,335 ක් සිදු කරන ලදී. එම යාන්ත්‍රණය යටතේ සිදු කරන ලද ශුද්ධ පියවීම්වල වටිනාකම රුපියල් බිලියන 459.7 ක් විය.

ආසියානු නිෂ්කාශන සංගමයේ 46 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සහ නිත්‍ය තාක්ෂණික කමිටුවෙහි රැස්වීම 2017 වසරේ ජූලි මාසයේ දී කොළඹ දී පවත්වන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා ආසියානු නිෂ්කාශන සංගමයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස වසරක කාලයකට පත් කරන ලදී. ආසියානු නිෂ්කාශන සංගමයේ මහ ලේකම් ඇතුළු සාමාජික රටවල මහ බැංකු සහ මූල්‍ය අධිකාරීන්හි නියෝජිතයින් මෙම රැස්වීමට සහභාගී විය.

### 19.5 ජාතික ගෙවීම් යාන්ත්‍රණය ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් 'ලංකාපේ' (LankaPay) සන්නාමය යටතේ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම මගින් මෙහෙයවනු ලබන කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. රටෙහි ජාතික ගෙවීම් යාන්ත්‍රණය ලෙස නම් කරන ලද කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය පද්ධති 5 කින් සමන්විත වේ. එනම් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS), විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS), ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ හවුල් යාන්ත්‍රණය (SAS), විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS), සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CMobS) වේ. කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට සහය වීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින්, 2015 අංක 07 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය මගින් නියම කරන ලද කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සමඟ සම්බන්ධ වීමේ කාලසීමාවන් අනුව කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී. කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය පහත දැක්වේ.

(අ) කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රථම පද්ධතිය ලෙස, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය 2013 ජූලි මාසයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. 2017 අවසාන වන විට, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජික සංඛ්‍යාව 27 දක්වා වැඩි විය. 2017 වසරේදී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා රුපියල් බිලියන 264.1 ක වටිනාකමකින් යුතු ගනුදෙනු මිලියන 33 ක් සිදු කරන ලදී. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණ ජාලය හරහා සිදු කරන කාඩ්පත් ගනුදෙනු වල සුරක්ෂිත බව වැඩි දියුණු කිරීමට, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් විසින් ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා ඊඑම්වී (EMV) තාක්ෂණය යොදා ගන්නා ලෙස එම සාමාජිකයින් වෙත උපදෙස් ලබා දෙන ලදී.

(ආ) කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි දෙවන උප පද්ධතිය වන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය 2015 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලදී. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, අන්තර්ජාලය පදනම් කරගත් බැංකු කටයුතු, ජංගම දුරකථන පදනම් කරගත් බැංකු කටයුතු, ස්වයං සේවා ගෙවීම් යන්ත්‍ර (Kiosks) සහ බැංකු කවුළු වෙතින් වැනි බහුවිධ ගෙවීම් මාධ්‍ය හරහා සිදු කරනු ලබන ගෙවීම් නිෂ්කාශනය සඳහා පොදු යටිතල පහසුකම් සපයයි. 2017 වසරේදී, මූල්‍ය ආයතන 11 ක් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සමඟ සම්බන්ධ වීමෙන් එහි සාමාජික සංඛ්‍යාව 33 දක්වා වැඩි විය. 2017 වසරේදී විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් රුපියල් බිලියන 273.7 ක වටිනාකමකින් යුතු ගනුදෙනු මිලියන 3.2 ක පියවීම් කටයුතු සිදු කරන ලදී.

(ඇ) ශ්‍රී ලංකා රේගුව වෙත තත්කාලීන ගෙවීම් පහසුකම් සැලසීම සඳහා 2017 ජූලි 20 වන දින සිට ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව ක්‍රියාත්මක කරන ලදී. මේ වන විට ලියාපදිංචි වාණිජ බැංකු හතක් ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව සමඟ සම්බන්ධ වී ඇත. ශ්‍රී ලංකා රේගුව වෙත තත්කාලීන ගෙවීම් සිදුකිරීමට පහසුකම් සැලසීම සඳහා විශේෂිත ගනුදෙනු කේතයක් හරහා සිදු කරන ගනුදෙනුවල උපරිම වටිනාකම වැඩි කිරීම සඳහා 2015 අංක 01 දරන ගෙවීම් සහ පියවීම් චක්‍රලේඛය ප්‍රතිස්ථාපනය කර 2017 අංක 08 දරන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල උපරිම වටිනාකම සහ ගාස්තු සඳහා වූ ගෙවීම් සහ පියවීම් චක්‍රලේඛය නිකුත් කරන ලදී. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ආදායම් පාලක කළමනාකරණ තොරතුරු පද්ධතිය ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව සමඟ සම්බන්ධ කිරීම සඳහා කරන ලද ඉල්ලීම සලකා බලා ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව ආදායම් පාලක කළමනාකරණ තොරතුරු පද්ධතිය සමඟ සම්බන්ධ කිරීමට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම වෙත අවසර ලබාදෙන ලදී.

(ඈ) ජාත්‍යන්තර ගෙවීම් කාඩ්පත් ජාලයක් (International Card Scheme) සමඟ හවුල් වී ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික)

සමාගම වෙත අවසර ලබාදෙන ලදී. ඒ අනුව, අඩු පිරිවැය ගෙවීම් කාඩ්පත් වර්ග හඳුන්වාදීම සඳහා පහසුකම් සලසන ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමයක් 2018 වසරේදී ක්‍රියාත්මක කරනු ඇත. ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමයක් හඳුන්වා දීමෙන් පසු විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සජීවී මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ඇත.

### 19.6 ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණය

විද්‍යුත් ගෙවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය සහ කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව එහි නියාමන සහ අවේක්ෂණ කටයුතු තවදුරටත් සිදු කරන ලදී. ඒ අනුව, 2017 වසර තුළදී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් සිදු කරන ලදී.

(අ) 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ බලපත්‍රලාභී ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු ලෙස හර කාඩ්පත් නිකුත් කිරීමට අවසර දී තිබුණු මූල්‍ය ආයතනයකට ණය කාඩ්පත් නිකුත් කිරීමට අවසර ලබාදෙන ලදී. මෙයට අමතරව, ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු ලෙස බලපත්‍ර ලබාදී තිබුණු බලපත්‍රලාභී වාණිජ බැංකුවකට ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සේවා සැපයුම්කරුවකු ලෙස කටයුතු කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

(ආ) ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධතිවල පවතින අවදානම් සැලකිල්ලට ගනිමින්, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති මෙහෙයවීම සඳහා බලපත්‍රලාභී සේවා සැපයුම්කරුවන්ගේ විද්‍යුත් මුදල් පද්ධතිවල විශ්වසනීයත්වය සහ සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා අදාළ සේවා සැපයුම්කරුවන්ට නිර්දේශ නියම කිරීම සිදු කරන ලදී.

(ඇ) රට තුළ ක්‍රියාත්මක වන සුළු පරිමාණ ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සහ ණය කාඩ්පත් මාර්ගෝපදේශයන්ට සහ අනෙකුත් නියමයන්ට සේවා සැපයුම්කරුවන්ගේ අනුකූලතාව පරීක්ෂා කිරීම සඳහා දුරස්ථ අවේක්ෂණ කටයුතු තවදුරටත් සිදු කරන ලදී.

(ඈ) හදිසි අවස්ථාවකදී තම ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා වන සූදානම තහවුරු කර ගැනීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීමට ලක් කරන ලදී.

### 19.7 ජාතික ගෙවීම් කවුන්සිලය

2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ විධිවිධාන යටතේ ජාතික ගෙවීම් කවුන්සිලය, 2006 වසරේදී පිහිටුවන ලදී. ජාතික ගෙවීම් කවුන්සිලය ගෙවීම් පද්ධති පිළිබඳ උපදේශන සහ නිරීක්ෂණ කමිටුව වේ. ජාතික ගෙවීම් කවුන්සිලය ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ඊට අදාළ දෙපාර්තමේන්තු, බලපත්‍රලාභී බැංකු, මූල්‍ය ක්ෂේත්‍රයේ ආයතන හා සංගම් සහ ජංගම දුරකථන පදනම් කරගත් ගෙවීම් සේවා සපයන්නන්ගෙන් සමන්විත වේ. නවීන ගෙවීම් තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් මූල්‍ය තාක්ෂණ අංශය සහ බ්ලොක්චේන් (Blockchain) තාක්ෂණය පිළිබඳ වැඩි දියුණු කිරීම් අධ්‍යයනය කිරීම සඳහා ජාතික ගෙවීම් කවුන්සිලය විසින් කටයුතු ආරම්භ කරන ලදී.

### 19.8 මහජනතාව දැනුම්වත් කිරීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රටෙහි ක්‍රියාත්මක ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු සහ සංඛ්‍යාලේඛන ප්‍රචාරය කිරීම සඳහා නිකුත් කරනු ලබන "කාර්තුමය විවරණිකාව" (Payments Bulletin) ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. තවද, අවශ්‍යතාව මත පදනම්ව, ගෙවීම් පද්ධති සහ වෙනත් සම්බන්ධිත කරුණු පිළිබඳව සාමාන්‍ය ජනතාව සහ බැංකු කාර්ය මණ්ඩල දැනුම්වත් කිරීමේ අරමුණින් වැඩසටහන් 5 ක් ක්‍රියාත්මක කරන ලදී. විද්‍යුත් ගෙවීම් ක්‍රමවේද ප්‍රවර්ධනය සඳහා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සහ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය පිළිබඳ ගනුදෙනුකරුවන් දැනුම්වත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පල කරන ලදී.

## 20. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම්කරණයේ පහසුකම් සපයන්නා වශයෙන් කටයුතු කරන ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රතිපත්තිවල ඵලදායිතාව ඉහළ නංවමින් හා අපේක්ෂිත කාල රාමුව තුළ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම උදෙසා උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක වනවා ද යන්න තහවුරු කරමින් ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරයි.

### 20.1 2017-2021 සඳහා වන උපායමාර්ගික සැලසුම පිළියෙළ කිරීම, ප්‍රගති සමාලෝචනය හා කළමනාකාරිත්වයට වාර්තා කිරීම

2017 ජනවාරි 02 දින පැවැත් වූ 2017 නව වසර සඳහා වැඩ ඇරඹීමේ උත්සවයේ දී "විෂම චක්‍රය බිඳ දැමීම" යන තේමාව යටතේ 2017-2021 සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සැලසුම එළි දක්වන ලදී. ඊට පසු සතියේ දී පර්ෂද පදනම මත 2017-2021 සඳහා වන උපායමාර්ගික සැලසුම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර, උපායමාර්ගික සැලසුමෙහි පිටපත් සියලුම සේවා නියුක්තිකයින් අතර බෙදා දෙන ලදී. උපායමාර්ගික/ක්‍රියාකාරි සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් කාර්තුමය පදනම මත පවත්වන ලද අතර ඒවා ක්‍රියාත්මක කිරීමේ දී මතු වී ඇති ගැටලු හා දෙපාර්තමේන්තු උපායමාර්ගික/ක්‍රියාකාරි සැලසුම්හි අපේක්ෂිත ආකාරයට ක්‍රියාත්මක නොකරන ලද කටයුතුවලට හේතු වූ කරුණු දක්වමින් මුදල් මණ්ඩලය වෙත ප්‍රගතිය වාර්තා කරන ලදී.

### 20.2 2018-2020 සඳහා වන උපායමාර්ගික ප්‍රමුඛතා

වර්තමාන උපායමාර්ගික සැලසුම්කරණයට හඳුන්වා දිය යුතු යෝග්‍ය වැඩි දියුණු කිරීම් අන්තර්ගත කිරීම සඳහා ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්හි (Bank of England) සහයෝගය ඇතිව උපායමාර්ගික සැලසුම්කරණ සම්මන්ත්‍රණය 2017 ඔක්තෝබර් 03-04 දිනයන්හි දී සංවිධානය කළේය. ඉන් අනතුරුව, 2017 ඔක්තෝබර් 28-29 දිනයන්හි දී උපායමාර්ගික සැලසුම්කරණ කතිකාවත පවත්වන ලද අතර ඉහත සම්මන්ත්‍රණයේ දී මතු වූ විශේෂිත කරුණු මෙහි දී සාකච්ඡා කරන ලදී. වසර තුනක කාලයක් සඳහා සමස්ත බැංකුව සඳහා වන උපායමාර්ගික ප්‍රමුඛතා හඳුනා ගැනීමේ වැදගත්කම මෙහි දී අවධාරණය කෙරුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සැලසුම්කරණයේ සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරමින් 2018-2020 තුන් අවුරුදු කාලපරිච්ඡේදය සඳහා සමස්ත බැංකුව සඳහා වන උපායමාර්ගික ප්‍රමුඛතා වශයෙන් උපායමාර්ගික ප්‍රමුඛතා හයක් (6 ක්) ඉහළ කළමනාකාරිත්වය විසින් හඳුනා ගන්නා ලදී. උපායමාර්ගික ප්‍රමුඛතා සඳහාම පිහිටුවන ලද කාර්යය සාධක බලකායන් විසින් කාල නිර්මිත උපායමාර්ගික ක්‍රියාකාරකම් ද සහිතව ඉදිරි වසර තුන සඳහා උපායමාර්ගික අරමුණු ඇතුළත් කොට සංකල්ප පත්‍රිකාවන් හයක් පිළියෙළ කරන ලද අතර ඒවා සාංගමික කළමනාකාරිත්ව කමිටුවේ නිර්දේශයන් සහිතව මුදල් මණ්ඩලය විසින් අනුමත කර ඇත.

### 20.3 දෙපාර්තමේන්තු ක්‍රියාමාර්ගික සැලසුම්

වාර්ෂික දෙපාර්තමේන්තු ක්‍රියාමාර්ගික සැලසුම් සඳහා නව වැඩිදියුණු කිරීම් හඳුන්වා දුන් අතර දෙපාර්තමේන්තු ක්‍රියාමාර්ගික සැලසුම් (i) සමස්ත බැංකුව සඳහා වන උපායමාර්ගික ප්‍රමුඛතා හා සම්බන්ධව දෙපාර්තමේන්තුවට අදාළ උපායමාර්ගික කටයුතු හා (ii) අදාළ වසරේ මෙහෙයුම් කටයුතු යන කොටස් දෙකෙන් සමන්විත වේ. අපේක්ෂිත ප්‍රතිඵලයන් හා ඒවායේ බලපෑම ළඟා කර ඇත්දැයි තහවුරු කර ගනු පිණිස උපායමාර්ගික/මෙහෙයුම් ක්‍රියාමාර්ග යටතේ එක් එක් දෙපාර්තමේන්තුව විසින් සුදුසු ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනා ගෙන ඇත. උපායමාර්ගික ප්‍රමුඛතා හා දෙපාර්තමේන්තු ක්‍රියාමාර්ග සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය දෙපාර්තමේන්තු මට්ටමින් කාර්තුමය පදනම මත පවත්වන රැස්වීම්හි දී සමාලෝචනය කෙරෙනු ඇත.

### 20.4 අමාත්‍යාංශයන්ට හා අනෙකුත් රජයේ ආයතනයන්ට වාර්තා යොමු කිරීම

2017 වසරේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාසික යාවත්කාලීන කිරීම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු පිළිබඳ කාර්යසාධන වාර්තා සහ විගණන හා කළමනාකාරිත්ව කමිටු රැස්වීම් සඳහා අවශ්‍ය තොරතුරු ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි යොමු කරන ලදී. මීට අමතරව රජයේ අනෙකුත් ආයතන විසින් ඉල්ලුම් කරන ලද තොරතුරු යෝග්‍ය පරිදි කාලීනව ලබා දෙන ලදී.

## 21. රාජ්‍ය ණය

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මුදල් නීති පනතේ 113 වගන්තියට අනුව රජයේ නියෝජිත වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම ඉටු කරයි. එම වගකීම් ඉටු කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 1950 අගෝස්තු මස 28 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරම්භයත් සමඟ පිහිටුවන ලදී. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ, විසර්ජන පනතෙහි සඳහන් දළ ණය ගැනීම් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අරමුදල් රැස් කිරීම, නියමිත කාලය තුළ රජයේ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු පියවීමේ පහසුකම් සුමටව සිදු කිරීම සඳහා ලංකාසෙකියු (LankaSecure) පද්ධතිය මගින් පහසුකම් සැලසීම සහ මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් ලේඛනය පවත්වාගෙන යෑම වේ. මීට අමතරව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ණය වෙළඳපොළ දියුණු කිරීමෙහිලා කටයුතු කරයි.

### 21.1 විසර්ජන පනතට අනුව රජයේ දළ ණය ගැනීම් සඳහා අරමුදල් රැස් කිරීම

(අ) 2014 වසරේ දී, රජයේ දළ අරමුදල් අවශ්‍යතාවය මූල්‍යනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු මගින් දේශීය හා විදේශීය මූලාශ්‍රයන්ගෙන් අරමුදල් රැස් කිරීම සිදු විය.

(ආ) ඉහත සඳහන් කළ ණය උපකරණ මගින් සිදු කරනු ලැබූ මූල්‍යන කටයුතු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

**II - 25 සංඛ්‍යා සටහන**

**2015 සහ 2016 වර්ෂයේ කල්පිරීම් හා වෙන්දේසි කාර්යසාධනය**

| උපකරණය | 2016 | | 2017 | |
|---|---|---|---|---|
| | නිකුත් කිරීම් රු.බිලියන | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් රු.බිලියන | වෙන්දේසි ගණන |
| භාණ්ඩාගාර බිල්පත් | 1,635.4 | 52 | 1,624.3 | 52 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 663.6 | 23 | 548.8 | 16 |
| | නිකුත් කිරීම් එ.ජ.ඩො. මිලියන | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් එ.ජ.ඩො. මිලියන | වෙන්දේසි ගණන |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB) | 1,365.9 | 6 | 2,231.4 | 4 |
| | නිකුත් කිරීම් එ.ජ.ඩො. මිලියන | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් එ.ජ.ඩො. මිලියන | වෙන්දේසි ගණන |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISB) | 1,500.0 | 1 | 1,500.0 | 1 |

(ඇ) 2017 භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමස්ත ශුද්ධ විදේශ ගලාඒම් එ.ජ.ඩොලර් මිලියන 440.6 ක් වූ අතර, එය එම වසර තුළ භාණ්ඩාගාර බිල්පත්වලින් විදේශීය ගලාඒම් එ.ජ.ඩොලර් මිලියන 80.5 කින් හා භාණ්ඩාගාර බැඳුම්කරවලින් විදේශීය ගලාඒම් එ.ජ.ඩොලර් මිලියන 360.1 කින් සමන්විත විය.

(ඈ) වර්ධනය වූ වෙළඳපොළ වාතාවරණයත්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හා ඒකාබද්ධ ණය මගින් ලැබූ විදේශ මූල්‍ය ගලනයත් සහ වර්ධනය වූ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල විදේශ ආයෝජන මෙන්ම පරිණත වන භාණ්ඩාගාර බැඳුම්කරවල මුල් මුදල පමණක් දේශීය මූලාශ්‍රයන්ගෙන් පියවීම සඳහා වූ රාජ්‍ය උපායමාර්ගය හේතුවෙන් 2017 දෙවන භාගයේ දී ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාත ලිහිල් වීම සිදු විය.

(ඉ) ඇඩි ප්‍රතිපත්තිමය පොලී අනුපාත සහ ඇඩි ද්‍රවශීලතා වාතාවරණය හේතුවෙන් අවම කරන ලද දිගුකාලීන සුරැකුම්පත් නිකුත් කිරීම නිසා නොපියවූ දේශීය ණය කළඹෙහි පරිණතිය සඳහා ගත වන සාමාන්‍ය කාලය, 2016 වසරේ දී, වසර 5.98 සිට 2017 වසරේ දී වසර 5.78 දක්වා පහළ බසින ලදී.

## 21.2 රජයේ ණය සේවාකරණ

වසර තුළ දී සිදු කරන ලද සමස්ත රාජ්‍ය ණය ගෙවීම් රුපියල් බිලියන 1,603.1 ක් වූ අතර, එය දේශීය ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 1,213.5 ක් හා විදේශ ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 389.6 කින් සමන්විත විය.

## 21.3 රාජ්‍ය සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික හා ද්විතීය වෙළඳපොළ ගනුදෙනු පියවීමේ පහසුකම් සැලසීම සඳහා ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතිය භාවිතා කරනු ලැබේ. මෙම පද්ධතිය ඔවුන් වෙනුවෙන් සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් වන අනෙකුත් ආයෝජකයින් වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යනු ලබන සෘජු අලෙවි සහභාගිකරුවන් 33 දෙනෙකුගෙන් (බලපත්‍රලාභී වාණිජ බැංකු 25 ක් සහ ප්‍රාථමික අලෙවි සමාගම් 8 ක්) සහ ඔවුන් වෙනුවෙන් පමණක් ගිණුම් පවත්වාගෙන යනු ලබන සෘජු සහභාගිකරුවන් 3 දෙනෙකුගෙන් (කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා මහ බැංකුව සහ සේවක අර්ථසාධක අරමුදල) සමන්විත වේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ලංකාසෙක්‍යු පද්ධතියෙහි අඛණ්ඩව හා තත්කාලීනව මෙහෙයුම් සිදුවන බව සහතික කරමින් පියවීමේ කටයුතුවලට අදාළ පහසුකම් සැපයීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. 2017 දෙසැම්බර් මස අවසාන වන විට සමස්ත නිර්ලේඛිත සුරැකුම්පත්වල මුහුණත වටිනාකම රුපියල් බිලියන 4,912.2 ක් වූ අතර එය රුපියල් බිලියන 724.7 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සහ රුපියල් බිලියන 4,187.5 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමන්විත විය.

## 21.4 රාජ්‍ය සුරැකුම්පත් ලේඛනය පවත්වාගෙන යෑම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් හිමිකාරිත්වයේ සිදුවන වෙනස්කම් යාවත්කාලීනව පවත්වාගෙන යෑම, රජයේ සුරැකුම්පත් සුරක්ෂිත කිරීමට උපකාරී විය. මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) ගිණුම් හිමියන්ට හිමිකම්, ගනුදෙනු හා ගෙවීම් වශයෙන් වූ කාලීන ප්‍රකාශනයන් යැවීමේ කාර්යය වසර පුරා අඛණ්ඩව සිදු විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් 2017 වසර තුළ විද්‍යුත් තැපැල මගින් විද්‍යුත් ප්‍රකාශනයන් 2,022 ක් සහ සාමාන්‍ය තැපැල මගින් අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 18,962 ක්, මාසික ගනුදෙනු ප්‍රකාශන 49,887 ක් සහ ගෙවීම් ප්‍රකාශන 24,029 ක් මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) ගිණුම් හිමියන් වෙත යවන ලදී. තවද, මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) ගිණුම් හිමියන්ට තම යාවත්කාලීන ගිණුම් තොරතුරු අන්තර්ජාල ගිණුමක් හරහා පරීක්ෂා කිරීමේ පහසුකම ලබා දෙන ලදී. 2017 දෙසැම්බර් මස අග වන විට මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) මුළු ලියාපදිංචි ගිණුම් හිමියන් සංඛ්‍යාව 93,203 ක් විය.

## 21.5 ක්‍රියා පිළිවෙත ප්‍රතිසංස්කරණය කිරීම

රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වැඩිදියුණු කිරීමට සහ එහි කාර්යක්ෂමතාව, සඵලතාවය සහ විනිවිදභාවය ඉහළ නැංවීම උදෙසා 2017 වර්ෂය තුළ පහත සඳහන් පද්ධති වැඩිදියුණු කිරීම් ක්‍රියාවට නංවන ලදී.

**(අ) භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ නව ක්‍රමය**

2017 ජූලි 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා නව ප්‍රාථමික නිකුත් කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙමගින් 2015 පෙබරවාරි මස සිට භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ක්‍රියාත්මක වූ සම්පූර්ණ වෙන්දේසි ක්‍රමය මත පදනම් වූ නිකුත් කිරීමේ ක්‍රමය ප්‍රතිස්ථාපනය කරන ලදී. නව ක්‍රමයක් හඳුන්වා දීමේ මූලික අරමුණ වූයේ, මූල්‍යන සැලසීමේ විනිවිදභාවය පවත්වාගෙන යන අතරම, අවම වියදමකින් රාජ්‍ය මූල්‍යනය සිදු කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් කාර්යක්ෂම කිරීමයි. ක්‍රමානුකූල, මාසික භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි, නව ක්‍රමයේ අඩංගු වේ. එක් එක් මාසික වෙන්දේසිය, වෙනස් කල්පිරීම් ඇති බැඳුම්කර කාණ්ඩ දෙකකින් ඉදිරිපත් කරයි. තවද, නව පද්ධතිය අදියර තුනකින් සමන්විත වේ. I අදියරේ දී, බහු මිල වෙන්දේසි ක්‍රමය යටතේ, ඉදිරිපත් කළ යුතු ප්‍රමාණය තුළ පවතින සියලුම සාධාරණ ලංසු භාර ගැනීමට උත්සාහ කරයි. I අදියරේ දී ඉදිරිපත් කළ ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් ලබා ගැනීමට තීරණය වුවහොත්, වටිනාකම මත පදනම් වූ ස්වේච්ඡා මිල කැඳවීම් සඳහා අදියර II විවෘත කරයි. මෙම අදියර යටතේ නිකුත් කිරීම්, I අදියරේ දී තීරණය කරන ලද බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකයට (Weighted Average Yield

Rate) සිදු කරන අතර II අදියරට ඉදිරිපත් කළ ප්‍රමාණයට වඩා වැඩි ලංසු ප්‍රමාණයක් ලැබුණු විට II අදියරේ නිකුත් කිරීම I අදියරේ වෙන්දේසි සහභාගිවන්නන්ගේ කාර්යසාධනයට සමානුපාතික වේ. III අදියර යටතේ, හිඟ ප්‍රමාණය, තිබුනහොත් පමණක්, බර තැබූ ඵලදා අනුපාතිකයට ප්‍රාථමික වෙළඳකරුවන්ට අනිවාර්ය පදනමකින් නිකුත් කෙරේ. අදියර III දී සිදු වන වෙන් කිරීම, අදියර I හා II දී එක් එක් ප්‍රාථමික වෙළඳුන්ගේ සාර්ථකත්වයට ප්‍රතිලෝමව සමානුපාතික වේ. කෙසේ වෙතත්, අදියර III ක්‍රියාත්මක කිරීමට අවම වශයෙන් නිකුතු ප්‍රමාණයේ සියයට 60 ක ප්‍රමාණයක්වත් I අදියර යටතේ පිළිගෙන තිබිය යුතුය.

**(ආ) භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් නිකුතු දින දර්ශකය**

2017 වර්ෂය තුළ, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වෙන්දේසි දිනය, ගෙවීම් කළ යුතු දිනය, කල් පිරීමේ කාලය සහ නිකුතු ප්‍රමාණය (භාණ්ඩාගාර බැඳුම්කර සඳහා) ඇතුළත් කාර්තුමය දින දර්ශනය රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ප්‍රාථමික නිකුතු ක්‍රියාවලියේ පුරෝකථනය කිරීමේ හැකියාව ඉහළ නැංවීමට, කල් ඇතිව ආයෝජකයන් හට තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව සහතික කිරීමට සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් මූල්‍යන අවශ්‍යතා පදනම් කර ගනිමින්, මුදල් අමාත්‍යාංශයේ ද සහයෝගය ඇතිව මෙම දින දර්ශනය ප්‍රකාශයට පත් කරනු ලබයි.

## 21.6 ඉදිරි දැක්ම

(අ) ප්‍රාථමික වෙළඳපොළ සඳහා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ පද්ධතිය පුළුල් කිරීමේ හැකියාව ගවේෂණය කිරීම මෙන්ම දේශීය වෙළඳපොළෙහි රාජ්‍ය ණය ගැනීමේ විනිවිදභාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම.

(ආ) ප්‍රාථමික නිකුතුන් සඳහා ඉලෙක්ට්‍රොනික ලංසු තැබීමේ සැකසුම සැලසුම් කිරීමත් සමඟම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම සඳහා නිර්ලේඛන ආකෘති පත්‍රයක් නිර්මාණය කිරීම මගින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙළඳපොළෙහි ද්විතීයික වෙළඳපොළ පුළුල් කිරීම.

(ඇ) රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ගැඹුරු හා පුළුල් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සමඟ රාජ්‍ය ණය සුරැකුම්පත් සඳහා සුවිශේෂී වූ ඉලෙක්ට්‍රොනික වෙළඳ පද්ධතිය (ETP) හා මධ්‍යම ප්‍රතිපාර්ශව නිෂ්කාශනාගාරයක් (CCP) ස්ථාපිත කිරීමට මූලික පියවර ගනු ලැබ ඇත. තවද, මෙමගින් විනිවිදභාවය වැඩි කිරීම හා අසමමිතික තොරතුරු අවදානම අවම කිරීම සඳහා ද්විතීයික වෙළඳපොළ තුළ ණය උපකරණ පිළිබඳ තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ඇත.

**(ඈ) වගකීම් කළමනාකරණ පනත ආයතනගත කිරීම**

වගකීම් කළමනාකරණ පනත (LMA) ක්‍රියාත්මක කිරීමේ අවසාන අදියරෙහි වන අතර, එය 2018 වසරේ මුල් මාසවල බලාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වගකීම් කළමනාකරණ පනත මගින්, දේශීය හා විදේශීය රාජ්‍ය ණය කළඹෙහි පිරිවැය හා අවදානම ඵලදායී ආකාරයෙන් කළමනාකරණය සඳහා නොපියවූ රාජ්‍ය ණය කළඹෙහි කල් පිරීමේ ආකෘතිය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරන අතර, රාජ්‍ය ණය කළඹෙහි හඳුනාගත් අවදානම් පැතිකඩවල් අවම කිරීම සඳහා ද වගකීම් කළමනාකරණ රාමුව ආයතනගත කිරීම මගින් අපේක්ෂා කෙරේ.

ඉදිරි කාලය තුළ ඇති ප්‍රතිමූල්‍යතා අවදානම (ණය ඒකරාශී වීම අවම කිරීමට) හා වාණිජ ණය කළඹෙහි (අන්තර්ජාතික ස්වෛරීත්ව බැඳුම්කරවල) කල්පිරීමේ කාලය දීර්ඝ කිරීම සඳහා මෙය සක්‍රීය ලෙස දායක වේ. තවද, මෙමගින් භාණ්ඩාගාර බැඳුම්කරවල කල්පිරීමේ ව්‍යුහය දීර්ඝ කිරීම සහ කූපන් ගෙවීමේ වක්‍රය සුමට කිරීම සඳහා ඉඩකඩ සලසා දීම ද අපේක්ෂා කෙරේ. වගකීම් කළමනාකරණ පනත මගින් ආපසු මිලදී ගැනීම්, හුවමාරු කිරීම, පෙර අරමුදල් සම්පාදනය වැනි වගකීම් කළමනාකරණ මූලාරම්භයක් සඳහා නීතිමය පදනම සපයනු ඇත. තවද, මෙමගින් උපායමාර්ගික නොවන වත්කම් වෙන්දේසියෙන් ලැබෙන මුදල් සඳහා විශේෂ අරමුදල් පවත්වා ගැනීමට ද හැකියාව ලබා දෙනු ඇත.

**(ඉ) වත්මන් නීති බලගැන්වීම සඳහා වූ පියවර**

විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ තත්කාලීන වෙළඳපොළ වර්ධනයත් සමඟ සමගාමී වීම සඳහා ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත (RSSO) සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත (LTBO) වැඩිදියුණු කිරීම සඳහා සංශෝධන යෝජනා කර ඇත. එසේම, විදේශ වගකීම් සඳහා වූ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වන පරිදි, 1957 අංක 29 දරන විදේශ ණය පනතට සංශෝධන ගෙන ඒමට යෝජනා කර ඇත.

(ඊ) විදේශීය ආයෝජකයන්ගේ පදනම විවිධාංගීකරණය සඳහා සහ විදේශීය ආයෝජකයන් හට රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත පිවිසීමේ පහසුව වර්ධනය කිරීම සඳහා, රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ යූරෝක්ලියර් (Euroclearability) පහසුකම ලබා ගැනීමේශක්‍යතා අධ්‍යයනයේ, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව නිරත වී ඇත.

## 21.7 ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් දූත මණ්ඩල සම්බන්ධීකරණය

2017 වසරේ දී, ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන (ෆිච් රේටින්ග්ස් ලිමිටඩ්, මූඩීස් ඉන්වෙස්ටර් සර්විසස්, ස්ටැන්ඩර් ඇන්ඩ් පුවර්ස්) සඳහා වාර්ෂික ශ්‍රේණිගත කිරීමේ සමාලෝචන සඳහා පහසුකම් සපයනු ලැබීය.

# 22. ප්‍රාදේශීය සංවර්ධන

සාම්ප්‍රදායික ණය මෙහෙයුම් කටයුතු තවදුරටත් ව්‍යාප්ත කරමින්, 2017 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නව ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගොඩනැංවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරන ලදී. මෙම නව ප්‍රතිපත්තිමය උපායමාර්ග සහ ක්‍රියාමාර්ග තුළින් සමස්තයක් ලෙස රටෙහි සියලු දෙනාම ඇතුළත් වූ තුළිත ආර්ථික වර්ධනයක් ඇති කරලීම සඳහා සහාය වීමේ හා රටේ මූල්‍ය අන්තර්ගතභාවය පුළුල් කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ධාරිතාව තවදුරටත් ශක්තිමත් කර ගැනීමට හැකි විය.

2017 වසරේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින්, ණය අතිරේකකරණ සේවාවන් රැසක් ලබා දෙමින් විවිධ ප්‍රතිමූල්‍ය, පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම යන කටයුතු සම්බන්ධීකරණය කිරීමේ, පහසුකම් සැලසීමේ සහ ක්‍රියාත්මක කිරීමේ කටයුතු අඛණ්ඩවම සිදු කරන ලදී. මෙම සහනදායී ණය යෝජනා ක්‍රම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජය, විදේශ ආධාර සපයන නියෝජිත ආයතන සහ සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් අරමුදල් සපයන ලදී. කෘෂිකාර්මික හා සත්ත්ව පාලන, ක්ෂුද්‍ර මූල්‍ය සහ ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ අංශ ඇතුළත් පුළුල් අංශ පරාසයක තනි පුද්ගලයින්ට සහ ව්‍යාපාර ආයතනවලට දැරිය හැකි මූල්‍ය පහසුකම් ලබා දීම මගින් සේවය සපයන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වසර මුළුල්ලේ සිදු කරන ලද මූල්‍ය සාක්ෂරතා සහ කුසලතා සංවර්ධන වැඩසටහන් මාලාව මෙම ප්‍රතිලාභීන්ට මෙන්ම ඉලක්කගත කණ්ඩායම්වල සිටි අනෙකුත් පුද්ගලයින්ටද මහත් පිටුවහලක් විය. විධිමත් මූල්‍ය ක්ෂේත්‍රය වෙත පිවිස නොමැති අය සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන්ගේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ දැනුම ඉහළ නැංවීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පරිපූර්ණ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා පවත්වන ලදී. මේ සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මුද්‍රිත, විද්‍යුත් සහ ගුවන් විදුලි මාධ්‍ය සඵලදායී ලෙස භාවිතා කිරීම වසර තුළදී සැලකිය යුතු මට්ටමක විය.

ආර්ථිකයේ විවිධ අවශ්‍යතා ඇති ජන කොටස් සඳහා සේවාවන් සැපයීමට විවිධ ණය යෝජනා ක්‍රම හඳුන්වා දීමට සහ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයක් සකස් කිරීම සඳහා කටයුතු යෙදීමට ක්‍රියා කළ බැවින්, ප්‍රතිපත්තිමය වශයෙන් බලන කල, 2017 වර්ෂය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට මහත් අභියෝගාත්මක වර්ෂයක් විය. වර්ෂය තුළදී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එහි මානව සම්පත් පූර්ණ ධාරිතාවයකින් යුතුව උපයෝගී කර ගනිමින් ඉහළ ජාතික වැදගත්කමකින් යුතු ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ක්‍රමෝපායක ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. මෙම පියවරයන් අතර, ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය ආරම්භ කිරීම, කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් අරමුදල් සපයන "කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන" ආරම්භ කිරීම සඳහා මූලික කටයුතු සිදු කිරීම, "ස්වශක්ති - රැකියා දස ලක්ෂයක් කරා" ණය යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ ආපදාවලින් හානියට පත් ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම සඳහා සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම අරමුණු කර ගනිමින් "අත්වැල" ණය යෝජනා ක්‍රමය සහ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ "ආපදාවලින් පසු ආර්ථික කටයුතු නැවත නගාසිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය" යන යෝජනා ක්‍රම දෙකද හඳුන්වා දීම යනාදිය ඇතුළත් වන ලදී. තවද, ණය යෝජනා ක්‍රම කිහිපයකට අදාළ මෙහෙයුම් උපදෙස් අවශ්‍යතාවයන් මත සංශෝධනය කිරීමට වැඩිදුරටත් පියවර ගන්නා ලදී.

තවද, මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය ක්‍රමයේ සියලුම පාර්ශවකරුවන් එක් දිශානතියකට මෙහෙයවීමේ වැදගත්කම හඳුනා ගනිමින් රටේ පළමු වරට ජාතික මූල්‍ය අන්තර්ගත උපායමාර්ගයක් ගොඩනැංවීම සඳහා ජාත්‍යන්තර අත්දැකීම් එකතු කර ගනිමින්, ලෝක බැංකුවෙහි ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවෙහි තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා මුල පුරන ලදී.

### 22.1 සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම

මූල්‍ය කටයුතු ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 වර්ෂයේදී ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම සහ පොලී සහනාධාර යෝජනා ක්‍රම 15 ක් හරහා ණය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පුළුල් කරන ලදී. මෙම යෝජනා ක්‍රම අතරින් රජයේ රැකියා උත්පාදන වැඩසටහනට සහ ආපදාවලින් පසු නැවත නගාසිටුවීමේ උත්සාහයන්ට සහාය දැක්වීම අරමුණු කර ගනිමින් 2017 වර්ෂයේදී "ස්වශක්ති", "අත්වැල" සහ "ආපදාවලින් පසු ආර්ථික කටයුතු නැවත නගාසිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය" නමින් ණය යෝජනා ක්‍රම තුනක් හඳුන්වා දෙන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම සහ පොලී සහනාධාර යෝජනා ක්‍රම පිළිබඳ විස්තර II-23 වන වගුවේ දක්වා ඇත. මීට අමතරව, කෘෂි ඵලදායීතාව, කාර්යක්ෂමතාවය, වෙළඳපොළ ප්‍රවේශය ඉහළ නැංවීමට සහාය වීම සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ එකතු කළ වටිනාකම ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේදී ලෝක බැංකු අරමුදල් සම්පාදනය මත වූ කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය යටතේ ආංශික ඇප ආවරණ ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී.

ප්‍රතිලාභීන්ට ඉදිරි අභියෝගවලට ශක්තිමත් මූල්‍ය පදනමක් හා ඉහල ආත්ම විශ්වාසයක් සහිතව මුහුණ දීමට හැකි වනු පිණිස ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම සහ පොලී සහනාධාර යෝජනා ක්‍රම මගින් සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා ණය ප්‍රතිලාභීන් 126,742 ක් සඳහා රුපියල් මිලියන 19,251.03 ක ණය මුදල් ප්‍රමාණයක් 2017 වසරේදී මුදා හැර ඇත. මෙම මුදා හැරීම්වලින් සියයට 57.7 ක බහුතර ණය ප්‍රමාණයක් පොලී සහනාධාර ක්‍රම හරහා ලබා දුන් අතර, සියයට 42.3 ක ප්‍රමාණයක් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම හරහා මුදා හැර

ඇත. මෙම ණය යෝජනා ක්‍රම සඳහා අරමුදල් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා රජය විසින් සපයන ලදී. මෙම අරමුදල් මූලාශ්‍ර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ණය මුදා හැරීම්වලින් පිළිවෙළින් සියයට 47.0 ක්, සියයට 29.3 ක් සහ සියයට 23.8 ක් සඳහා දායක විය. ණය මුදා හැරීම්වල ආංශික දායකත්වය සැලකිල්ලට ගත් විට, කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශය වෙත සියයට 73.0 ක ණය ප්‍රමාණයක් මුදා හරින ලද අතර පිළිවෙළින් කර්මාන්ත අංශය සහ සේවා අංශය වෙත සියයට 19.4 ක් සහ සියයට 7.6 ක් මුදා හරින ලදී. 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රමවල තත්ත්වය පහත සඳහන් කර ඇත.

## 22.2 2017 ශ්‍රී ලංකා රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම

ශ්‍රී ලංකා රජය විසින් අඛණ්ඩවම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිමූල්‍ය සහ පොලී සහනාධාර යෝජනා ක්‍රම සඳහා 2017 වර්ෂයේදී මුළු මුදාහැරීම්වලින් සියයට 23.8 ක් එනම් රුපියල් මිලියන 12,420.5 ක මුදල් ප්‍රමාණයක් සඳහා අරමුදල් සපයන ලදී. වසර තුළදී, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 6 ක් සහ පොලී සහනාධාර යෝජනා ක්‍රම 2 ක් ඇතුළත්ව ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයන ලද ණය යෝජනා ක්‍රම 8 ක් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයන ලද නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය "සරුසාර" ණය යෝජනා ක්‍රමය, පොලී සහනාධාර යෝජනා ක්‍රමයක් මෙන්ම ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ලෙසද ක්‍රියාත්මක විය.

(අ) ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයන ලද ණය යෝජනා ක්‍රම අතරින් 2017 වර්ෂයේදී, කෙටි කාලීන බෝග වර්ග 33 ක් සඳහා කුඩා පරිමාණයේ ගොවීන් 71,397 ක් වෙත පොලී සහනාධාර සපයමින් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය කැපී පෙනෙන කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. මූල්‍ය ප්‍රගතිය සලකා බැලීමේදී, 2017 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද මුළු ණය මුදාහැරීම්වලින් සියයට 40.8 ක් එනම් රුපියල් මිලියන 7,845.2 ක් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මුදා හැර ඇත. එපමණක් නොව, රටේ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා දායක වෙමින් ශ්‍රී ලංකා රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමයන් සඳහා ලබා දුන් ණය ප්‍රමාණයෙන් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය සඳහා පමණක් සියයට 63.2 ක ණය ප්‍රමාණයක් මුදා හැර ඇත. කෙසේ වෙතත්, ප්‍රධාන වගා ප්‍රදේශවල පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දෙන ණය ප්‍රමාණය පසුගිය වසර හා සැසඳීමේදී සියයට 2 ක පහළ යෑමක් දක්නට ඇත.

(ආ) භූ-ගෝලීය ව්‍යාප්තිය අනුව ණය මුදා හැරීම සලකා බැලීමේදී පසුගිය වසරවල අඛණ්ඩවම පැවත ආ ප්‍රවණතාවය බිඳලමින්, 2017 වර්ෂය තුළදී අම්පාර දිස්ත්‍රික්කය නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මුදා හරින ලද ණය ප්‍රමාණයෙන් ඉහළම කොටසක් වාර්තා කළ අතර, එය මෙම යෝජනා ක්‍රමය යටතේ මුදා හරින ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 12.6 ක් විය. (රුපියල් මිලියන 976.8) පසුගිය වසරේ මුළු ණය මුදාහැරීම්වලින් ඉහළම කොටසක් වාර්තා කල අනුරාධපුර දිස්ත්‍රික්කය මෙම වසරේදී නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මුදා හරින ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 11.5 ක ණය ප්‍රමාණයක් මුදා හරිමින් දෙවැනි ඉහළම කොටස හිමි කරගත් අතර ඊළඟ ඉහළම ප්‍රමාණය බදුල්ල දිස්ත්‍රික්කය එනම් සියයට 8.7 ක් (රුපියල් මිලියන 684.9) හිමි කර ගන්නා ලදී.

(ඇ) රජය මගින් අරමුදල් සපයන ලද ණය යෝජනා ක්‍රම අතරින් දෙවන ඉහළම ප්‍රගතිය "ස්වශක්ති" ණය යෝජනා ක්‍රමය හිමි කරගත් අතර, 2017 වර්ෂයේදී එම ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 2,146.8 ණය මුදල් ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 9,664 ක් අතරේ මුදා හරින ලදී. විශේෂයෙන් තරුණ තරුණියන්, උපාධිධාරීන්, කාන්තාවන් සහ විවිධාකාර හැකියාවන් ඇති පුද්ගලයින්ගේ මූල්‍ය, තාක්ෂණික, අලෙවිකරණ, ව්‍යවසායකත්ව අවශ්‍යතා සපුරාලීම සඳහා රජයේ අනුග්‍රහය සහිත යාන්ත්‍රණයක් ඇති කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව 2017 වසරේදී "ස්වශක්ති" ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. ඉදිරි පස් වසර තුළදී නව රැකියා අවස්ථා දස ලක්ෂයක් ජනනය කිරීමේ රජයේ පුළුල් ප්‍රතිපත්තිමය අරමුණ වෙත මෙම යෝජනා ක්‍රමයේ මූලික අවධානය යොමු වී ඇත.

(ඈ) විභවතාවයක් ඇති ව්‍යවසායකයින්ගේ කුසලතාවයන් හා හැකියාවන් සහ ග්‍රාමීය ප්‍රදේශවල ඇති සම්පත් හඳුනාගෙන ස්වයං සවිබල ගැන්වූ ක්ෂුද්‍ර ව්‍යවසායකයන් ලෙස නැඟී සිටීමට අවශ්‍ය පුහුණුව සහ තාක්ෂණික සහාය, අලෙවිකරණ සහාය සමඟ ඔවුන් වෙත ලබා දීමත් මෙම නව යෝජනා ක්‍රමයෙන් අපේක්ෂා කෙරේ. "ස්වශක්ති" ණය යෝජනා ක්‍රමය ණය අතිරේකකරණ සේවාවන්ද සහිත ණය යෝජනා ක්‍රමයක් වන අතර එය දිවයින පුරා ක්‍රියාත්මක වේ. මෙම යෝජනා ක්‍රමයෙහි සුවිශේෂී ලක්ෂණය වනුයේ නව ව්‍යවසායකයන්ට මූලික වියදම් පියවා ගැනීම සඳහා ණය මුදලට අමතරව විශේෂ ප්‍රදාන මුදලක් ලබා දීමයි. ලබා දෙනු ලබන ප්‍රදාන මුදලේ උපරිමය රු.50,000/- ක් වන අතර, සෑම ව්‍යවසායකයකුට වාර්ෂිකව සියයට 5.5 ක පොලී අනුපාතයක් යටතේ උපරිම වශයෙන් රු. 250,000 ක ණය මුදලක් සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් ලබා දෙනු ලබයි. ප්‍රතිමූල්‍ය මුල් මුදල්වල ආපසු අයකිරීම් අවුරුදු 20 දක්වා නැවත ණය දීම සඳහා යොදවනු ඇත.

(ඉ) ආපදාවලින් පසු ආර්ථික කටයුතු නැවත ගොඩනැංවීම සඳහා රජයේ මැදිහත්වීමේ ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින්, 2017 අගෝස්තු මාසයේදී "අත්වැල" නමින් ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා රජය විසින්

හඳුනාගත් ආපදාවකින් හානියට පත් ඕනෑම ආර්ථික කටයුත්තක් නැවත යථා තත්ත්වයට පත් කිරීමට සියයට 2 වාර්ෂික පොලී අනුපාතයක් යටතේ සහනදායී මූල්‍ය පහසුකම් සැලසීම මෙම යෝජනා ක්‍රමයේ අරමුණ වේ. ආරම්භක පියවරක් ලෙස, 2017 වර්ෂයේ මැයි මාසයේදී පැවති ආපදා තත්ත්වයෙන් විපතට පත් ආර්ථික කටයුතු නැවත යථා තත්ත්වයට පත් කිරීමට ශ්‍රී ලංකා රජය විසින් සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම සඳහා රුපියල් මිලියන 2,000 ක මුදලක් වෙන් කරන ලදී. මෙම යෝජනා ක්‍රමය ආරම්භ වී මාස හතරක් පමණ ගත වූ පසු එනම් 2017 දෙසැම්බර් මස අවසානය වන විට, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 1,815.1 ක ණය මුදල් ප්‍රමාණයක් ලබා දීම සඳහා ණය අයදුම්පත් 4,570 ක් ලියාපදිංචි කරන ලදී. සහභාගිත්ව මූල්‍ය ආයතනවල වාර්තාවලට අනුව, සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් රුපියල් මිලියන 887.8 ක මුදල් ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 2,094 දෙනෙකු අතර මුදා හැර ඇත. 2017 වර්ෂය අවසන් වන විට, සහභාගිත්ව මූල්‍ය ආයතනවල ඉල්ලීම මත එම ආයතන විසින් ලබාදෙන ණය 227 ක් සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් ලෙස රුපියල් මිලියන 100 ක් මුදා හැර ඇත.

(ඊ) තවදුරටත්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වෙනත් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 4 ක්, එනම්, දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල, (PAMP RF), දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - අදියර II - චක්‍රීය අරමුදල (PAMP II - RF), ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය - අදියර II, තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල සහ පොලී සහනාධාර ක්‍රමයක් වන තේ කර්මාන්තශාලා සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය (WCLSTF) ක්‍රියාත්මක කරන ලදී. දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල, දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - අදියර II- චක්‍රීය අරමුදල යටතේ රුපියල් මිලියන 1,582.24 ක මුදලක් මුදා හරින ලද අතර එය රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම යටතේ මුදා හරින ලද මුළු මුදා හැරීම්වලින් සියයට 12.7 කි. 2017 වර්ෂය තුළදී මුදා හරින ලද මුළු රජයේ අරමුදල්වලින් තේ කර්මාන්තශාලා සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 595.5 ක මුදලක් එනම් සියයට 4.8 ක් මුදා හරින ලද අතර "අත්වැල" සහ ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රම මගින් රුපියල් මිලියන 249.68 ක මුදලක් මුදා හරින ලදී. එය සියයට 2 ක් විය.

(උ) මෙම යෝජනා ක්‍රම මූල්‍යනය සඳහා ශ්‍රී ලංකා රජය විසින් වෙන් කරන ලද මුළු අරමුදල්වලින් වැඩි ප්‍රමාණයක් කෘෂිකාර්මික සහ සත්ත්ව පාලන අංශය වෙත ලබා දෙන ලදී. එය රජයේ අරමුදල්වලින් සියයට 80.6 ක ප්‍රතිශතයක් එනම් රුපියල් මිලියන 9,997ක මුදලකි. රජය මගින් අරමුදල් සපයනු ලබන ණය යෝජනා ක්‍රම යටතේ සියයට 14.8 ක අරමුදල් ප්‍රමාණයක් කාර්මික අංශය (රු.මිලියන 1,838) සඳහා ද ඊළඟට සියයට 4.6 ක ප්‍රතිශතයක ප්‍රමාණයක් (රු.මිලියන 565.8) සේවා අංශය වෙත ද මුදා හරින ලදී.

(ඌ) ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වශයෙන්, තමන්ගේම ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලැබූ තරුණ තරුණියන්ට මූල්‍යාධාර සැපයීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වූ ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය, පුහුණුව ලත් තරුණ තරුණියන්ට තවදුරටත් ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන පරිදි, 2019.12.31 දින දක්වා දීර්ඝ කරන ලදී. ණය යෝජනා ක්‍රමයෙහි ප්‍රතිලාභ ලබා දීම තවදුරටත් පුළුල් කරමින්, ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන සහ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන ඇතුළත් කිරීම සඳහා ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය යටතේ උප ණය ගැනුම්කරුවන් සඳහා වූ සුදුසුකම් සංශෝධනය කරන ලදී. තවදුරටත්, තරුණ ව්‍යවසායකයින්ට ඇති ධනාත්මක බලපෑම සැලකිල්ලට ගනිමින් ස්වයං රැකියා ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමයෙහි ණය ආපසු ගෙවීමේ කාලය ද වසර 5 සිට වසර 6 දක්වා දීර්ඝ කරන ලදී.

## 22.3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම

තුලිත සහ සහභාගීත්ව ප්‍රාදේශීය සංවර්ධනයෙහි ඇති උපායමාර්ගික වැදගත්කම සැලකිල්ලට ගනිමින්, 2017 වර්ෂයේදී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ණය යෝජනා ක්‍රම දෙකක් වූ "සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය" සහ "මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය" සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් තවදුරටත් සපයන ලද අතර එම යෝජනා ක්‍රම දෙක පිළිවෙලින්, ප්‍රතිමූලය ණය යෝජනා ක්‍රමයක් සහ පොලී සහනාධාර යෝජනා ක්‍රමයක් වේ.

(අ) ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධානම ණය යෝජනා ක්‍රමය වන "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමයයටතේ රුපියල් මිලියන 3,984.58 ක ණය ප්‍රමාණයක් මුදා හැර ඇති අතර එය 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම මගින් මුදා හරින ලද මුළු අරමුදල්වලින් සියයට 43.5 කි. මෙමගින් වර්ෂය තුළදී දිවයින පුරා ප්‍රතිලාභීන් 7,363 ක් වෙත මූල්‍ය පහසුකම් ලබා දී ඇත.

(ආ) සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ 2016 වසරේදී මුදා හරින ලද රුපියල් මිලියන 4,767.1 හා සසඳන කල, 2017 වර්ෂයේදී මුදා හරින ලද ණය ප්‍රමාණය සියයට 16.4 කින් පහත වැටී ඇත. ණය යෝජනා ක්‍රමය සඳහා 2017 වර්ෂය වෙනුවෙන් පැවති අරමුදල් ප්‍රමාණයේ සීමාව මෙම පහත වැටීමට මූලික වශයෙන් හේතු විය. එසේ වුවද, 2017 වර්ෂයේදී ප්‍රතිමූල්‍ය සඳහා පැවති රුපියල්

මිලියන 4,000 න් රුපියල් මිලියන 3,984.6 ක් මුදා හරින ලදී. සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයෙහි සියයට 8 ක වාර්ෂික පොලී අනුපාතය හා සසඳා බලන කල, වාර්ෂිකව සියයට 5.5 ක් වූ අඩු පොලී අනුපාතයක් යටතේ, රැකියා උත්පාදනය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් 2017 වර්ෂය මුලදී "ස්වශක්ති" ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලද අතර එම ණය යෝජනා ක්‍රමය "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් සඳහාද විකල්ප මූල්‍ය ප්‍රභවයක් ලෙස කටයුතු කර ඇත.

(ඇ) "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමයෙහි ණය මුදා හැරීමේ භූගෝලීය ව්‍යාප්තිය සලකා බලන කල පසුගිය වසරවල ප්‍රවණතාවය තවදුරටත් පවත්වා ගෙන යමින්, 2017 වර්ෂයේදී මෙම යෝජනා ක්‍රමය යටතේ ඉහළම ණය මුදාහැරීම් ප්‍රමාණය වූ සියයට 13 ක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් ලබා ගෙන ඇත. පිළිවෙළින්, කළුතර දිස්ත්‍රික්කය (සියයට 10.8) සහ ගම්පහ දිස්ත්‍රික්කය (සියයට 9.5) ඊළඟට ඉහළම ණය ප්‍රමාණයන් හිමිකර ගෙන ඇත.

(ඈ) "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමයෙහි මුළු ණය මුදා හැරීම් ප්‍රමාණයෙන් බහුතරයක් එනම් රුපියල් මිලියන 1,873.3 ක් (සියයට 47.0) කාර්මික අංශය සඳහා මුදා හැර ඇති අතර කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශයෙහි ප්‍රතිලාභීන් අතර රුපියල් මිලියන 1,205.1 (සියයට 30.2) ක් මුදා හරින ලදී. ඉතිරි ප්‍රමාණය එනම් රුපියල් මිලියන 906.2 ක් (සියයට 22.7) වෙනත් අංශ වෙත මුදා හැර ඇත.

(ඉ) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පොලී සහනාධාර සපයන යෝජනා ක්‍රමයක් ලෙස මහා පරිමාණ කිරි නිස්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය, කිරි ගොවීන් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම අරමුණු කර ගනිමින් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක විය. කිරිවලින් ස්වයංපෝෂිත වීමේ ජාතික අරමුණට සහාය දැක්වීම සඳහා කිරි ආශ්‍රිත සියලුම ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි මෙම යෝජනා ක්‍රමය යටතේ කිරි ගොවීන්ට පොලී සහනාධාර ලබා දේ.

(ඊ) 2017 වර්ෂයේදී මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ රටේ කිරි ගොවීන්හට රුපියල් මිලියන 1,648.5 ක් මුදා හැර ඇත. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම සහ පොලී සහනාධාර යෝජනා ක්‍රමවල සමස්ත ප්‍රගතිය සැලකිල්ලට ගත් විට, මුළු මුදා හැරීම්වලින් සියයට 8.6 ක් සඳහා දායක වෙමින් මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය සිව්වැනි ස්ථානය ලබා ගැනීමට සමත් විය.

(උ) සමස්ත ප්‍රගතිය සැලකිල්ලට ගත් විට, මෙම යෝජනා ක්‍රමවලට අරමුදල් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙන් කරන ලද අරමුදල්වලින් බහුතරය කෘෂිකාර්මික සහ සත්ත්ව පාලන අංශය වෙත ලබා දෙන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයන ලද අරමුදල්වලින් සියයට 50.7 ක් එනම් රුපියල් මිලියන 2,853.61 ක මුළු මුදලක් කෘෂිකාර්මික සහ සත්ත්ව පාලන අංශය වෙත මුදා හැර ඇති අතර සියයට 33.3 ක් කාර්මික අංශයට ද (රු.මිලියන 1,873.26) සියයට 16.1 ක් සේවා අංශය වෙතද (රු. මිලියන 906.22) මුදා හැර ඇත.

(ඌ) ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ලෙස, 2017 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි, මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ණය ආපසු ගෙවීමේ කාලය, ව්‍යාපෘතියේ ස්වභාවය මත පදනම්ව වසර 1 ක උපරිම සහන කාලයක්ද ඇතුළුව වසර 5 සිට වසර 6 දක්වා දීර්ඝ කරන ලදී. පාර්ශවකරුවන් විසින් කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාර ලෙස, කිරි ලබා ගැනීමට වැඩි කාලයක් ගත් වීමත්, සුළු පරිමාණ කිරි ගොවීන්ට වාණිජමය මට්ටමට පත්වීමට දීර්ඝ කාලයක් ගත වීමත් යන කරුණු සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

## 22.4 ප්‍රදානිත අරමුදල් මගින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම

2017 වර්ෂය තුළදී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ප්‍රාදේශීය සංවර්ධන ඉලක්කයන් ඉටු කර ගැනීම සඳහා අරමුදල් සපයන ආයතනයක් ලෙස කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් සැලකිය යුතු දායකත්වයක් දක්වන ලදී. ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 4 ක් ඇතුළුව ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 6 ක් සඳහා 2017 වසරේදී රුපියල් මිලියන 1,197.49 ක ණය මුදලක් ලබා දෙමින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල දායකත්වය ලබා දෙන ලදී. ඉතා වැදගත් කරුණක් නම්, රජය විසින් කරන ලද ඉල්ලීමට අනුව, 2017 වර්ෂයේ පැවති ආපදා තත්ත්වයන්ගෙන් හානියට පත් වූ ආර්ථික ක්‍රියාකාරකම් නැවත නගාසිටුවීම සඳහා පුද්ගලයන්ට සහාය වීමට ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ "ආපදාවලින් පසු ආර්ථික කටයුතු නැවත නගාසිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (PEARL)" ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මගින් අරමුදල් සපයන ලදී. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ අරමුදල් මගින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමවලට අදාළව ප්‍රතිපත්තිමය වෙනස්කම් කිහිපයක් 2017 වර්ෂයේදී සිදු කරන ලද අතර ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන 2017 වර්ෂයේ දෙසැම්බර් මසදී අවසන් කරන ලදී.

(අ) ජාතික කෘෂි සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ ක්ෂුද්‍ර මූල්‍ය, තරුණ දිරිය, පිටත වගාකරුවන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය (ප්‍රාග්ධන සහ කාලීන ණය යෝජනා ක්‍රමය) සහ ආපදාවලින් පසු ආර්ථික කටයුතු නැවත නගාසිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (PEARL) යන ණය යෝජනා ක්‍රම මගින් 2017 වර්ෂයේදී රුපියල් මිලියන 1,040.5 ක මුදලක් මුදා හරින ලද අතර එය කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ අරමුදල් මගින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම

යටතේ මුදා හරින ලද මුළු ණයවලින් සියයට 86.9 කි. ආපදාවලින් පසු ආර්ථික කටයුතු නැවත නගාසිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය හැර අනෙකුත් සියලුම ණය යෝජනා ක්‍රම මගින් කෘෂිකාර්මික සහ සත්ත්ව පාලන අංශයේ ප්‍රතිලාභීන් වෙත ණය ලබා දී ඇත.

(ආ) ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම අතර ඇති උප ණය යෝජනා ක්‍රම දෙකකින්, එනම්, පිටත වගාරුවන් සඳහා වූ ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමයෙන් සහ පිටත වගාකරුවන් සඳහා වූ කාලීන ණය යෝජනා ක්‍රමයෙන් සමන්විත, පිටත වගාකරුවන් සඳහා වූ අගයදාම සංවර්ධන ණය යෝජනා ක්‍රමය මගින් පමණක් රුපියල් මිලියන 437.70 ක ණය මුදල් ප්‍රමාණයක් එහි ප්‍රතිලාභීන් වෙත මුදා හැර ඇත. එම ප්‍රමාණය 2017 වර්ෂයේදී ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ සිදු කරන ලද මුළු මුදා හැරීම්වලින් සියයට 42.1 ක් විය. කෙසේ නමුදු, ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ පමණක් 2017 වර්ෂයේදී රුපියල් මිලියන 334.10 ක මුදලක් මුදා හරින ලද අතර එය මුළු වසර තුළ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් මුදා හල අරමුදල්වලින් සියයට 32.1 කි.

(ඇ) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉල්ලීම මත ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2017 වර්ෂයේදී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගණනාවක් ගන්නා ලදී. රැකියා උත්පාදනය ඉහළ නැංවීම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය අරමුණු කර ගනිමින් "තරුණ දිරිය" ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගත හැකි ණය ප්‍රමාණය රුපියල් 150,000 සිට රුපියල් මිලියන 1 දක්වා ඉහළ නංවන ලද අතර, ණය ආපසු ගෙවීමේ කාලසීමාවද මාස 36 සිට මාස 48 දක්වා ඉහළ නංවන ලදී. තවද, ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි ක්‍රියාත්මක කාලය 2017.12.31 දක්වා දීර්ඝ කරන ලදී.

(ඈ) 2017 වර්ෂයේදී, ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන හැරුණු විට, මොනරාගල, කුරුණෑගල, බදුල්ල සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල දුප්පත් ගොවීන්ගේ දිළිඳුකම තුරන් කිරීම සහ ආදායම් උත්පාදනය අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වූ වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහාය වීමේ හා හවුල් වීමේ වැඩසටහනේවක්‍රිය අරමුදලද අවසන් කරන ලදී.

(ඉ) ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකා රජය මගින් සහ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අරමුදල් සපයන ලද ව්‍යාපෘති දෙවර්ග යෙහි මෙන් ප්‍රදානිත අරමුදල මගින් ක්‍රියාත්මක වූ ණය යෝජනා ක්‍රමවලදීද බහුතර ණය මුදාහැරීම් කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශය වෙත යොමු කරන ද අතර එම ප්‍රමාණය රුපියල් මිලියන 1,183.52 ක් එනම් සියයට 98.8 ක් වූ අතර රුපියල් මිලියන 13.97 ක් වූ ඉතිරි සියයට 1.2 ක මුදල් ප්‍රමාණය කාර්මික අංශය වෙත මුදා හැර ඇත.

(ඊ) ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන වෙනුවට 2018 වර්ෂයේ මුල් කාලයේදී කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන (SAPP) නමින් නව වැඩසටහනක් හඳුන්වා දීමට සැලසුම් සකස් කරන ලදී. මෙහි අරමුණ වනුයේ වාණිජමය මට්ටමින් නිෂ්පාදනයෙහි සහ අලෙවිකරණයෙහි නියැළී සිටින කුඩා පරිමාණ ගෘහස්ථ නිෂ්පාදකයින් 57,500 කගේ ආදායම සහ ආහාරවල ගුණාත්මකතාවය තිරසාර ලෙස ඉහළ නැංවීමයි. ණය සහ අනෙකුත් ණය අතිරේක කරන සේවාවන් සැපයීම තුළින් ප්‍රතිලාභීන් සඳහා සියලු දෙනාම ඇතුළත් වූ විධිමත් මූල්‍ය සේවාවන් නිර්මාණය කිරීමට කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන මගින් අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් අරමුදල් සපයනු ලබන අතර ශ්‍රී ලංකා රජය මගින්ද ප්‍රතිපාදන මුදල් සපයා දෙනු ලබයි. කුඩා කෘෂි ව්‍යාපාරයන්ගේ හවුල්කාරිත්ව වැඩසටහනෙහි ණය සංරචකය ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන අතර රටේ කෘෂිකාර්මික සහ සත්ත්ව පාලන අංශයෙහි මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 6 කින් මෙය සමන්විත වේ.

## 22.5 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ නව ක්‍රියාමාර්ගයන්

**(අ) කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (AMP) හා ආංශික ණය ඇප ආවරණ (PCG) යෝජනා ක්‍රමය**

කෘෂිකාර්මික ඵලදායීතාවය, කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහාය වීම, වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ සියලුම පාර්ශවකරුවන් විසින් සිදු කරනු ලබන එකතු කළ අගය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් විවිධ සංවිධානමය පාර්ශ්වකරුවන් හා එක්ව ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ (IDA) අරමුදල්වලින් කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරනු ලැබේ. කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණ වනුයේ කෘෂිකාර්මික ඵලදායීතාව, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ප්‍රදේශයේ ව්‍යාපෘතිවල විධිමත් ගොවීන්, ගොවි කණ්ඩායම්, කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ සංවිධාන, සමූපකාර, සමාගම්, නිෂ්පාදකයින්ගේ සංවිධාන සහ සුළු හා මධ්‍ය පරිමාණ කෘෂි ව්‍යාපාරයන්හි එකතු කළ වටිනාකම ඉහළ නැංවීම සඳහා සහාය වීමයි. කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සංරචක 3 කින් සමන්විත වේ. එනම් කෘෂිකාර්මික අගයදාම සංවර්ධනය, ඵලදායීත්වය ඉහල නැංවීම හා විවිධාංගීකරණය සහ ව්‍යාපෘති කළමනාකරණය, අධීක්ෂණය සහ ඇගයීම වේ.

**II - 26 සංඛ්‍යා සටහන**

**2017 වසර තුළ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබූ වැඩසටහන්**

(රුපියල් මිලියන)

| අරමුදල් ප්‍රභවය | ණය යෝජනා ක්‍රමයේ නම | අරමුණ | ප්‍රතිමූල්‍ය/ පොලී සහනාධාර | 2017 වසර සඳහා වෙන් කරන ලද මුළු අරමුදල් ප්‍රමාණය | 2017 වසරේදී සහභාගිත්ව මූල්‍ය ආයතනවලට මුදා හරින ලද අරමුදල් ප්‍රමාණය | මුදා හැරීමට ඇති ඉතිරි අරමුදල් ප්‍රමාණය | ණයගැතියා ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතිකය (වසර අවසානයේදී) | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ අරමුදල් | දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (PAMP - RF) | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ අඩු ආදායම්ලාභී කණ්ඩායම් විධිමත් බැංකු ක්‍රමය හා සම්බන්ධ කිරීම තුළින් දිළිඳුකම පිටුදැකීම. | ප්‍රතිමූල්‍ය | 680.00 | 548.48 | ණය ආපසු අය කර ගැනීම් චක්‍රීයව යොදා ගැනේ. | 12% | |
| | දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය අදියර II - චක්‍රීය අරමුදල (PAMP - II RF) | | ප්‍රතිමූල්‍ය | 2,105.36 | 1,033.76 | ණය ආපසු අය කර ගැනීම් චක්‍රීයව යොදා ගැනේ. | 10% | |
| | "ස්වශක්ති" ණය ව්‍යාපෘතිය | ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල නිරත වී සිටින ව්‍යවසායකයන් සහ එම අංශයට අලුතින් ඇතුළත් වූ ව්‍යවසායක-යන් සඳහා රැකියා අවස්ථා ජනනය කිරීම. | ප්‍රතිමූල්‍ය | 4,000.00 | 2,146.78 | 1,853.22 | 5.5% | |
| | ආපදාවලින් හානියට පත් ආර්ථික කටයුතු නැවත නගාසිටුවීම සඳහා වූ "අත්වැල" ණය යෝජනා ක්‍රමය (READ) | ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඕනෑම ආපදාවකින් හානියට පත් ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම. | ප්‍රතිමූල්‍ය | 2,000.00 | 100.00* | 1900* | 2% | |
| | ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය - අදියර II (SEPI) | තමන්ගේම ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලැබූ තරුණ පිරිස් සඳහා මූල්‍ය සහාය ලබා දීම. | ප්‍රතිමූල්‍ය | 150.00 | 149.68 | ශ්‍රී ලංකා රජය විසින් 2018 වර්ෂය සඳහා අරමුදල් වෙන් කරන ලදී. | 7% | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (TDP - RF) | කුඩා හා තේ වතු හිමියන්ගේ ආදායම් තිරසාර ලෙස ඉහළ දැමීම සහ අපනයන වෙළඳපොළ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් සහතිකය HACCP*** සහතිකය ලබා ගැනීම සඳහා තේ කර්මාන්තශාලා නවීකරණය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම | ප්‍රතිමූල්‍ය | 1,100.00 | - | අවසන් කර ඇත. | 9% | |
| | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) | වී සහ කෙටිකාලීන භෝග වගාවන්හි නියුතු ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම. | පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ | අරමුදල් සඳහා ඇති ඉල්ලුම මත තීරණය වේ. | 7,845.22 | අදාළ නොවේ** | 7% | සහභාගිත්ව මූල්‍ය ආයතනවල අරමුදල් සහ ශ්‍රී ලංකා රජයේ පොලී සහනාධාර |
| | තේ කර්මාන්තශාලා සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය (WCLSTF) | ලියාපදිංචි කරන ලද තේ කර්මාන්ත සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය සපයා ගැනීමට සහාය වීම. | පොලී සහනාධාර | අරමුදල් සඳහා ඇති ඉල්ලුම මත තීරණය වේ. | 596.53 | අදාළ නොවේ** | (AWPLR + 1.0% - 2.0%) | සහභාගීත්ව මූල්‍ය ආයතනවල අරමුදල් සහ ශ්‍රී ලංකා රජයේ පොලී සහනාධාර |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය (Subagya) | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හෝ වෙනත් ව්‍යසනයක බලපෑමකට ලක් වූ එවැනි ව්‍යාපෘති ඇරඹීමට හෝ පවතින ව්‍යාපාර වැඩිදියුණු කිරීම | ප්‍රතිමූල්‍ය | 4,000.00 | 3,984.59 | ණය ආපසු අය කර ගැනීම චක්‍රීයව යොදා ගැනේ | 8% | සහභාගිත්ව මූල්‍ය ආයතනවල අරමුදල් සහ රජයේ පොලී සහනාධාර මගින් |
| | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය (CSDDLS) | වාණිජ මට්ටමේ කිරි ගොවිපළවල් ප්‍රවර්ධනය කිරීම තුළින් කිරි සහ කිරි නිෂ්පාදනවලින් ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීමට සහාය වීම | පොලී සහනාධාර | අරමුදල් සඳහා ඇති ඉල්ලුම මත තීරණය වේ. | 1,648.50 | අදාළ නොවේ** | 6% | |
| ප්‍රදානිත අරමුදල් | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය - ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශයන්හි දුප්පත් ජන කොටස්වල ආදායම් මට්ටම් සහ සමාජ තත්ත්වය දියුණු කිරීම | ප්‍රතිමූල්‍ය | 334.10 | 334.10 | අවසන් කර ඇත | 6.5% | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මගින් අරමුදල් සපයන ලදී. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය - තරුණ දිරිය ණය යෝජනා ක්‍රමය | සුළු පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීම සහ වෙනත් ආකාරයේ ස්වයං රැකියා ලාභීන් ව්‍යවසායකයන් බවට පත් කිරීම සඳහා ග්‍රාමීය මට්ටමේ දිළිඳු තරුණ තරුණියන්ට ණය පහසුකම් ලබා දීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කර ගැනීමට සහාය වීම | ප්‍රතිමූල්‍ය | 268.80 | 268.80 | අවසන් කර ඇත | 6.5% | |
| | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය - පිටත වගාකරුවන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය (ප්‍රාග්ධන සහ කාලීන ණය යෝජනා ක්‍රමය) | කෘෂිකාර්මික නිෂ්පාදනවල නිෂ්පාදනය, ඵලදායීත්වය, ගුණාත්මකතාවය සහ එකතු කළ වටිනාකම ඉහළ නැංවීම. | ප්‍රතිමූල්‍ය | 437.60 | 437.60 | අවසන් කර ඇත | 6.5% | |
| | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය - ආපදාවලින් පසු ආර්ථික කටයුතු නැවත නගාසිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (PEARL) | 2017 වර්ෂයේ රටේ පැවති ආපදා තත්ත්වයෙන් හානියට පත් වූ ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම සඳහා සහනාදායී මූලය පහසුකම් සැපයීම | ප්‍රතිමූල්‍ය | 134.52 | 134.52 | අවසන් කර ඇත | 6.5% | |
| | වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහාය වීමේ හා හවුල් වීමේ වැඩසටහන - චක්‍රීය අරමුදල | මොනරාගල, කුරුණෑගල, බදුල්ල සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කවල දිළිඳු ගොවීන්ගේ ආදායම් උත්පාදනය ඉහළ නැංවීම සහ දිළිඳුකම තුරන් කිරීම | ප්‍රතිමූල්‍ය | 0.46 | 0.40 | අවසන් කර ඇත | 10% | |
| | සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (SFLCP -RF) | ප්‍රතිලාභීන්ගේ සුභසාධනය සහ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ග්‍රාමීය දිළිඳු ජනතාවට ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වෙනුවෙන් විධිමත් ණය සැපයීම | ප්‍රතිමූල්‍ය | 386.36 | 22.07 | ණය ආපසු අය කර ගැනීම් චක්‍රීයව යොදා ගැනේ | 12% - 14% | |

* අත්වැල ණය යෝජනා ක්‍රමය ආරම්භ වී මාස හතරක් පමණ ගත වූ පසු එනම් 2017 දෙසැම්බර් මස අග වන විට, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 1,815.1 ක ණය මුදල් ප්‍රමාණයක් ලබා දීම සඳහා ණය 4,570 ක් පමණ ලියාපදිංචි කරන ලදී. සහභාගිත්ව මූල්‍ය ආයතනවල වාර්තාවලට අනුව, සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් රු. මිලියන 887.8 ක මුදල් ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 2,094 දෙනෙකු අතර මුදා හැර ඇත.

*** Hazard Analysis and Control points.

කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතියෙහි සමස්ත ප්‍රතිපත්ති අධීක්ෂණය, මාර්ගෝපදේශය, ව්‍යාපෘති අධීක්ෂණය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙහි ස්ථාපිත කරන ලද මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුව විසින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

කෘෂිකාර්මික අංශය නවීකරණ කිරීමේ ව්‍යාපෘතියෙහි කෘෂිකාර්මික අගයදාම සංවර්ධන සංරචකය යටතේ වන ආංශික ඇප ආවරණ යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ඇත. ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකාර්මික අංශ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන ලෙස ක්‍රියා කරනු ඇති අතර පරිපාලන නිලධාරී ලෙස ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය මෙහෙයවීම සඳහා අධිකාරී බලය ලබා දී ඇත.

උප-ණයකරුවන් විසින් ණය ආපසු ගෙවීම පැහැර හැරීමේ අවදානමට එරෙහිව, සහභාගිත්ව මූල්‍ය ආයතන ආවරණය කරන නව්‍ය අවදානම් බෙදාහැරීමේ මෙවලමක් ලෙස ක්‍රියා කරමින්, කෘෂිකාර්මික නවීකරණ ව්‍යාපෘතියෙහි සංවර්ධන අරමුණුවලට සහාය දක්වමින්, මූල්‍ය අතරමැදිකරුවන්ගේ වත්මන් හා වෙනස් වන අවශ්‍යතා සපුරාලීම ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය මගින් සිදු කෙරෙනු ඇත. මෙම සන්දර්භය තුළ, ඉහළ වටිනාකමකින් යුතු කෘෂිකාර්මික නිෂ්පාදන සහ එකතු කළ අගයන් සඳහා විධිමත් ගොවීන්, ගොවි කණ්ඩායම්, කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ සංවිධාන, සමූපකාර, සමාගම්, නිෂ්පාදන සංගම් සහ සුළු හා මධ්‍ය පරිමාණ කෘෂි ව්‍යාපාරවල ආයෝජනයන් ලබා ගැනීමට ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය මගින් අපේක්ෂා කෙරේ.

කෘෂි හෝ ව්‍යාපාර කටයුතු සඳහා අරමුදල් සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේදී සහභාගිත්ව මූල්‍ය ආයතනවල සුරැකුම් අවශ්‍යතා සම්බන්ධයෙන් ගොවීන් සහ කෘෂි ව්‍යවසායකයන් මුහුණ දෙන ගැටලු විසඳන අතරම අතරමැදි මූල්‍ය සේවා සපයන්නන් විසින් කෘෂිකාර්මික අංශයට ණය ලබා දීමේදී ඇති වන ණය කළඹ සංකේන්ද්‍රණය වීමේ අවදානම සහ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් ආදී කරුණුවල ඇති වන ගැටලු සඳහා විසඳුම්ද ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය මගින් ලබා දෙනු ඇත. ඒ අනුව, මූල්‍ය ප්‍රවේශය ඉහළ නැංවීම, කෘෂිකාර්මික අංශයට ණය ලබා දීමට සහභාගිත්ව මූලය ආයතන දිරිමත් කිරීම, සහභාගිත්ව මූල්‍ය ආයතනවල ණය පැහැර හැරීමේ අවදානමේ කොටසක් ආවරණය කිරීම සහ වත්කම් අත්පත් කර ගැනීම සඳමා දිගුකාලීන ණය දීම දිරිමත් කිරීම කෙරෙහි ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය මගින් අවධානයට යොමු කරනු ඇත.

**(ආ) මූල්‍ය අන්තර්ගතභාවය සඳහා ජාතික උපායමාර්ගයක් නිර්මාණය කිරීම**

රට තුළ මූල්‍ය අන්තර්ගතභාවය ඇති කරලීම සඳහා ජාත්‍යන්තර අත්දැකීම් ඇතුළත් කර ගැනීමේ වැදගත්කම හඳුනා ගනිමින්, පුළුල් ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපායමාර්ගයක් නිර්මාණය කිරීමට ලෝක බැංකු කණ්ඩායමේ සාමාජිකයෙකු වන ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයේ තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කරුණු සොයා බලන ලදී. ඒ අනුව, 2018 ජනවාරි මාසයේදී, මෙයට අදාළව ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව සමඟ සහයෝගිතා ගිවිසුමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්සන් කරන ලදී.

යෝජිත පුළුල් අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයේ අරමුණ වනුයේ, රටපුරා මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමට වඩාත් ඵලදායී සහ කාර්යක්ෂම ක්‍රියාවලියක් ප්‍රවර්ධනය කිරීමයි. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයෙන් ලබා ගනු ලබන තාක්ෂණික සහාය, මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය පුළුල් කිරීම සඳහා සාක්ෂි මත පදනම් වූ, මනා ලෙස සම්පත් යෙද වූ සහ ප්‍රමුඛත්වයෙන් යුතු වඩා පරිපූර්ණ ප්‍රවේශයක් හඳුන්වා දීමට අවස්ථාවක් ලබා දෙනු ඇත.

එදිනෙදා ගෙවීම් සඳහා වන යටිතල පහසුකම් පුළුල් කිරීම, විවිධාකාර මූල්‍ය සේවාවන් භාවිතා කිරීම දිරිගැන්වීම, මූල්‍ය සේවා ලබන්නන්ගේ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සහ මූල්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය පරිසරය වැඩිදියුණු කිරීම ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම තුළින් කෙටිකාලීනව අපේක්ෂා කරනු ලබයි. මෙමගින් මධ්‍යකාලීනව, සෑම වැඩිහිටියෙකුටම සහ ව්‍යාපාරයකටම, ප්‍රවේශයක් ඇති අන්තර්ගත මූල්‍ය පද්ධතියක් අත්කර දීමට රටට හැකි සහ ප්‍රමාණවත්, ගුණාත්මක සහ දැරිය හැකි මූල්‍ය සේවාවන් රැසක් පූර්ණ වශයෙන් භාවිතා කිරීමටද හැකි වනු ඇත.

## 22.6 කුසලතා සංවර්ධනය සහ ශක්‍යතා ගොඩනැංවීම

මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමට අදහස් කරනු ලබන ඕනෑම ප්‍රධාන ආයතනයක් විසින් පොදු මහජනතාවගේ කුසලතා සංවර්ධනය සහ ධාරිතා ගොඩනැංවීමේ අවශ්‍යතාවය යටපත් කළ නොහැකිය. ඵලදායී උපායමාර්ගයන් නිර්මාණය කිරීමෙහි සහ ඵලදායී මූල්‍ය සාක්ෂරතාවය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ ඇති ප්‍රමුඛ වැදගත්කම හඳුනා ගනිමින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 වර්ෂයේදී මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කුසලතා සංවර්ධනය අරමුණු කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 150 ක් පවත්වන ලදී. සංවර්ධිත නාගරික ප්‍රදේශවලට සීමා නොවී, මූල්‍යමය අංශයෙන් බැහැරවීම හේතුවෙන් ඇති වන අවාසි පිළිබඳව දැනුවත් කිරීම සඳහා අඩු මූල්‍ය අන්තර්ගතභාවයක් ඇති ප්‍රදේශ කරා යෑමට සෑම උත්සාහයක්ම ගන්නා ලදී. ඉලක්කගත කණ්ඩායම්වල අවශ්‍යතා සපුරාලීමට මෙම වැඩසටහන් සකස් කර ඇති අතර

මූලික වශයෙන් විධිමත් මූලය අංශයට ඇතුළත් වීමෙන් හා එයට සම්බන්ධ වීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳව අවධානය යොමු කර ඇත. ඉලක්කගත කණ්ඩායම් සමාජයේ විවිධ කොටස්වලින් යුතු පුද්ගල සමූහයකින් සමන්විත විය. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද විවිධ සහනදායී ණය යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත්භාවයක් ඇති කරන අතරම ඉලක්කගත කණ්ඩායම්වලට යහපත් බැංකු පුරුදු, මූල්‍ය විනය සහ නව මූල්‍ය උපකරණ සේවාවන් පිළිබඳව හඳුන්වා දීමටද හැකි විය.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද වැඩසටහන්වල විස්තර II -27 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II - 27 සංඛ්‍යා සටහන**

**2017 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්**

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| මූල්‍ය සාක්ෂරතාව | 74 |
| කුසලතා සංවර්ධනය | 57 |
| ශක්‍යතා ගොඩනැංවීම | 18 |
| මාධ්‍ය වැඩසටහන් | 01 |
| මුළු සංඛ්‍යාව | 150 |

# 23. ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ

එළදායී සම්පත් සංවර්ධනය වැඩිදියුණු කිරීමේ හා ධෛර්යමත් කිරීමේ අරමුණින් හා වඩා හොඳ සේවාවක් මහජනතාවට ලබා දීම සඳහා මුදල් නීති පනතේ 7 වන වගන්තියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාදේශීය කාර්යාල 6 ක් මාතර, අනුරාධපුරය, මාතලේ, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය හා නුවරඑළිය ප්‍රදේශයන්හි ස්ථාපිත කර ඇත. වර්තමානයේ දී, එම කාර්යාල ප්‍රාදේශීය මට්ටමින් මූල්‍ය ආයතන සම්බන්ධීකරණය, පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය ආර්ථික අංශ කටයුතු හඳුනාගැනීම හා මහ බැංකු කාර්යයන් ප්‍රාදේශීයව ව්‍යාප්ත කිරීම යන කටයුතු සිදු කරනු ලබයි.

## 23.1 සංවර්ධන කාර්යයන්

2017 වර්ෂයේ දී ප්‍රාදේශීය කාර්යාල විසින් ප්‍රාදේශීයව පවතින විෂමතාවයන් අවම කිරීමේ අරමුණින් චිරස්ථායී හා සමතුලිත ආර්ථික වර්ධනයක් ගොඩනැගීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු හා ධාරිතාව ගොඩනැංවීමේ වැඩසටහන් පැවැත්වීම යනාදී විවිධ කාර්යයන් හා සම්බන්ධ විය. එමෙන්ම, ප්‍රාදේශීය කාර්යාල අදාළ ප්‍රදේශයන්හි මූල්‍ය අධ්‍යාපන වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ද සක්‍රීයව දායක විය. ප්‍රාදේශීය කාර්යාල විසින් විධිමත් හා අඩු පිරිවැය මූල්‍ය සේවා, නීත්‍යානුකූල නොවන තැන්පතු භාරගන්නා ආයතන හා වැඩසටහන්, මූල්‍ය සාක්ෂරතාවය හා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ වැඩසටහන් 234 ක් පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, රාජ්‍ය සේවකයින්, ව්‍යවසායකයින් හා සාමාන්‍ය මහජනතාව ආවරණය වන පරිදි පුද්ගලයින් 21,928 ක් සඳහා ක්‍රියාත්මක කරන ලදී. තවදුරටත් ප්‍රාදේශීය කාර්යාල අදාළ ප්‍රදේශයන්හි ණය බෙදාහැරීමේ යාන්ත්‍රණය දියුණු කිරීමට කටයුතු කරන ලද අතර සාර්ථක ලෙස ණය සම්බන්ධතා 2,486 ක් ස්ථාපිත කරන ලදී. විවිධ හේතු නිසා ණය වාරික ගෙවීමට දුෂ්කරතා මතු වී ඇති ණයකරුවන් 2,309 ක් උදෙසා ණය උපදේශන සේවා ද සපයා ඇත.

එමෙන්ම ප්‍රාදේශීය කාර්යාල විසින් ව්‍යවසායකත්ව සංවර්ධනය, නිරීක්ෂණ චාරිකා/තාක්ෂණ හුවමාරු වැඩසටහන් හා විශිෂ්ට පරිචයන් යනාදී ක්ෂේත්‍ර ද ආවරණය කරමින් වැඩසටහන් පවත්වා ඇත. මේ යටතේ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසහටන් 30 ක් පුද්ගලයින් 2,325 දෙනෙකුට ද, නිරීක්ෂණ චාරිකා/තාක්ෂණ හුවමාරු වැඩසටහන් 18 ක් පුද්ගලයින් 696 දෙනෙකුට ද, විශිෂ්ට පරිචයන් පිළිබඳ වැඩසටහන් 62 ක් පුද්ගලයින් 3,053 දෙනෙකුට ද ප්‍රතිලාභ ලැබෙන අයුරින් ක්‍රියාත්මක කරන ලදී. තාක්ෂණ හුවමාරු වැඩසටහන්, නවීන තාක්ෂණය හා විශිෂ්ට පරිචයන් පිළිබඳ වැඩසටහන්, කිරිපට්ටි පාලනය, මල් වගාව, බිම්මල් වගාව, ආහාර සැකසුම් ක්‍රියාවලිය, නිමි ඇඳුම් අංශ, සංචාරක කටයුතු සම්බන්ධ නිෂ්පාදන හා සේවා යන ඒ ඒ ප්‍රදේශයන්හි පවතින ආර්ථික අංශ ඉලක්ක කර ගනිමින් පවත්වන ලදී. කෙසේවුවත්, මේ යටතේ විශේෂ අවධානයක් දෙනු ලැබුවේ විවිධ පරිසර හිතකාමී යෝජනාවන් පිළිබඳ දැනුවත් කිරීම හා තාක්ෂණය සැපයීම සම්බන්ධවය. තවදුරටත් පුද්ගලයින් 1,765 ක් සඳහා විවිධ දක්ෂතා සංවර්ධනය කිරීමට හා වැඩිදියුණු කිරීමට කළමනාකරණ සංවර්ධන වැඩසටහන් 36 ක් පවත්වන ලදී.

විවිධ අවශ්‍යතා මත ව්‍යාපාර අංශ පිහිටුවීම, අලෙවිකරණය, ගිණුම්කරණය, බදුකරණය, පොත් තැබීම, ගනුදෙනුකාර සේවා සහ අනෙකුත් පුහුණු වැඩසටහන් 65 ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 2,999 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදුකිරීම මගින් අදාළ ප්‍රදේශයන්හි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශ ගොඩනැංවීම සඳහා ශක්තිමත් සහායක් සපයන ලදී. එමෙන්ම ප්‍රාදේශීය කාර්යාල විසින් විශේෂයෙන්ම උත්සව සමයන්හි ණයකරුවන්ගේ අලෙවි උත්සාහයන්ට වෙළඳ සම්බන්ධතා, ගැණුම්කරු-විකුණුම්කරු සංවාද හා වෙළඳ ප්‍රදර්ශන මගින් සහාය ලබා දෙන ලදී. ඒ අනුව ප්‍රාදේශීය මට්ටමින් වෙළඳ ප්‍රදර්ශන 14 ක් ව්‍යවසායකයින් 903 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී.

මාතලේ ප්‍රාදේශීය කාර්යාලය “මහ බැංකුව ඔබ හමුවට” යන මැයෙන් විවෘත දින වැඩසටහනක් 2017 මැයි මස තුළ දී සිදු කරන ලද අතර මහ බැංකුවේ සියලුම සේවා එනම්, සේවක අර්ථසාධක අරමුදල, හානි වූ මුදල් හුවමාරු කිරීම, මුදල් කෞතුකාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රකාශනයන් සහ සමරු කාසි අලෙවිය සහ ණය යෝජනා ක්‍රම විසඳුම් යනාදී සේවා සඳහා සම්බන්ධ විය.

කිලිනොච්චි ප්‍රාදේශීය කාර්යාලය හා අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් ග්‍රාමීය ජන සමාජය මුහුණපාන ණයගැතිභාවය පිළිබඳ පරීක්ෂා කිරීමටත්, තේරුම් ගැනීමටත්,

එම ණයගැතිභාවය මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය උපායමාර්ග පිළිබඳ සාකච්ඡා කිරීමටත් යාපනය හා කිලිනොච්චි නගරයට අධිපතිතුමාගේ විශේෂ සංචාරයක් 2017 ඔක්තෝබර් මස සංවිධානය කරන ලදී. ග්‍රාමීය ණයගැතිභාවය පිළිබඳව 2017 නොවැම්බර් මස උතුරු පළාතේ සිදුකරන ලද සමීක්ෂණයට ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුවත්, අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයත්, ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලයත් සක්‍රීයව සහභාගි විය.

ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය කාර්යාල අධීක්ෂණය හා කළමනාකරණය කිරීමේ කටයුතු වලට අමතරව ප්‍රාදේශීය කාර්යාල වලින් ආවරණය නොවන කොළඹ, කළුතර හා ගම්පහ යන ප්‍රදේශයන්හි සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව ප්‍රදේශයේ විශේෂ පුහුණු අවශ්‍යතාවයන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධතාවයන් ස්ථාපිත කරගැනීමට කළුතර දිස්ත්‍රික් ලේකම් සමඟ විශේෂ සාකච්ඡාවක් වර්ෂයේ අවසාන භාගය තුළ දී සිදු කරන ලදී.

### 23.2 ප්‍රාදේශීය කටයුතු සඳහා මහ බැංකුව නියෝජනය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල විවිධ වැඩසටහන් විවිධ ප්‍රදේශයන්හි ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය කාර්යාල 6 ක්‍රියාකාරීව එම කටයුතු සඳහා සහාය ලබා දීම තුළින් ප්‍රාදේශීය මට්ටමින් ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කිරීම සිදු කරයි. ප්‍රාදේශීය කාර්යාල වර්ෂය තුළ දී සිසුන් හා ගුරුවරුන් සඳහා පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය, ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීම, නීත්‍යානුකූල නොවන මූල්‍ය ආයතන, තහනම් ණය යෝජනා ක්‍රම, රජයේ සුරැකුම්පත් වෙළඳපොළ, විදේශ විනිමය රෙගුලාසි සහ අධ්‍යාපනික වැඩසටහන් යනාදී දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා පැවැත්වීම තුළින් ඒ පිළිබඳ දැනුවත්භාවය ගොඩනැංවීමට කටයුතු කරන ලදී. වර්ෂය තුළ පුද්ගලයින් 3,386 දෙනෙකු සඳහා පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය හා ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීමේ වැඩසටහන් 44 ක් ද, පුද්ගලයින් 2,276 දෙනෙකු සඳහා නීත්‍යානුකූල නොවන මූල්‍ය ආයතන හා පිරමිඩ යෝජනා ක්‍රම පිළිබඳ වැඩසටහන් 18 ක් ද, සිසුන් හා ගුරුවරුන් 5,480 දෙනෙකු සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණ 32 ක් ද, පුද්ගලයින් 1,313 දෙනෙකු සඳහා මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදී මූල්‍ය සහ රාජ්‍ය ණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 11 ක් ද, පුද්ගලයින් 413 දෙනෙකු සඳහා විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 4 ක් ද, පුද්ගලයින් 1,878 දෙනෙකු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය යෝජනා ක්‍රම සම්බන්ධ නීති හා රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 24 ක් ද සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියෙස මඟින් බැංකු හා මූල්‍ය ආයතනවල කාර්යය මණ්ඩල සේවකයින් 1,209 දෙනෙකු සඳහා ප්‍රාදේශීය මට්ටමින් පවත්වන ලද පුහුණු වැඩසටහන් 15 ක් සඳහා ද සහාය ලබා දෙන ලදී. දිවයින පුරා සිටින සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් 79,476 දෙනෙකු සඳහා විවිධ සේවා සැපයීමට විශේෂ අවධානයක් යොමු කරන ලදී.

## 24. අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය මහ බැංකුවේ සෑම මට්ටමකම තීරණ ගැනීමේදී තීරණාත්මක සාධකයක් වී ඇත. එයට හේතුව මහ බැංකුව සිය බහුවිධ කාර්යයන්හි නිරත වීමේදී මෙන්ම අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වයක් සමඟ කටයුතු කිරීමේදී අවදානම් රැසකට භාජනය වීමට සිදු විය හැකි වීමයි. ඒ අනුව බැංකුව තුළ අවදානම් කළමනාකරණය කිරීම තෙවැදෑරුම් ආරක්ෂක ක්‍රමවේදයක් යටතේ සිදු කෙරුණි. පළමු පෙළ ආරක්ෂක ක්‍රමයේ වගකීම දරනු ලබන්නේ අදාළ මෙහෙයුම් ඒකකය හෝ දෙපාර්තමේන්තුව විසිනි. දෙවන පෙළ ආරක්ෂක ක්‍රමය වන්නේ ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්යය වන අතර මූල්‍ය අවදානම් තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීමේ වගකීම දරනු ලබයි. තෙවන පෙළ ආරක්ෂක ක්‍රමය වන්නේ අභ්‍යන්තර විගණන කාර්යය වන අතර එමගින් පළමු හා දෙවන පෙළ මෙහෙයුම් කටයුතු සිදු කෙරුණු ආකාරය පිළිබඳ ස්වාධීන හා වාස්තවික සහතික කිරීමක් සිදු කරනු ලැබේ. දෙවන පෙළ ආරක්ෂක ක්‍රමය වශයෙන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ස්වාධීන ලෙස අවදානම් කළමනාකරණය කිරීමේ කාර්යයෙහි මෙම වසර තුළදී අඛණ්ඩව නිරත වූ අතර බැංකුවේ අවදානම් යහපාලන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නව ක්‍රියාමාර්ගයන් ද ගනු ලැබීය.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට පවරා ඇති කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ඉටු කරගෙන යනු ලැබේ. ඒ අනුව, වසර තුළදී අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් විදේශ සංචිත සම්බන්ධ අවදානම් කළමනාකරණය හා මූල්‍ය දෙපාර්තමේන්තුව මගින්, කළමනාකරණය කරනු ලබන අභ්‍යන්තර අරමුදල් ආයෝජන සම්බන්ධයෙන් වන මූල්‍ය අවදානම් තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සිදු කරන ලදී. මීට අමතරව, සේවක අර්ථසාධක අරමුදලේ (EPF) ආයෝජනයන්ට අදාළ අවදානම් කළමනාකරණය සිදු කිරීමට අදාළ මූලික කටයුතු සිදු කරනු ලැබූ අතර ආයතනගත අවදානම් කළමනාකරණ (ERM) රාමුවක් ඇති කිරීම සඳහා අවශ්‍ය ඇතැම් පූර්ව අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට කටයුතු සිදු කරන ලදී.

2017 දී අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද මූලික කාර්යයන් පහත දැක්වේ.

### 24.1 විදේශ සංචිත ආයෝජනයන්ට සම්බන්ධ මූල්‍ය අවදානම

විදේශ සංචිත කළමනාකරණයේදී මහ බැංකුවට නිරාවරණය වන ප්‍රධාන මූල්‍ය අවදානම් වන්නේ වෙළඳපොළ අවදානම හා ණය අවදානම වේ. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විදේශ සංචිත ආයෝජන කළඹෙහි ඇති වෙළඳපොළ අවදානම ස්වාධීනව තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම හා වාර්තා කිරීම සිදු කළ අතර එම කටයුතු ආයෝජන ප්‍රතිපත්ති හා විදේශ සංචිත කළමනාකරණ මාර්ගෝපදේශයන්ට අදාළ

**විශේෂ සටහන 13**

## මහ බැංකුවල යහපාලනය සහ ආයතනගත අවදානම් කළමනාකරණය (ERM) පෙළ ගැස්වීම

### හැඳින්වීම

සාම්ප්‍රදායිකව, මහ බැංකු යනු අවදානම් සහිත කාර්යයන්හි නිරත නොවන ආයතන විශේෂයකි. කෙසේ වෙතත්, මෙම සාම්ප්‍රදායික මතයට වෙනස්ව යමින්, වර්තමානයේ මහ බැංකු තම ආයතනය මුහුණ දෙන අවදානම් පරාසය ඉතා මැනවින් හඳුනා ගැනීමේ නිපුණතාවකින් හෙබි ආයතන බවට ක්‍රමක්‍රමයෙන් පත්ව තිබේ. මෙයට පසුබිම් වී ඇත්තේ මහ බැංකුවලට පැවරුණු කාර්යභාරයන් පසුගිය වසර ගණනාවක් මුළුල්ලේ විශාල පරිවර්තනයන්ට භාජනය වීමත්, ඒ තුළින් එම ආයතන විසින් ඉටු කරනු ලැබූ කාර්යයන් වඩාත් සංකීර්ණ වීමත්ය. ඒ අනුව, මහ බැංකුවල වත්මන් කාර්යභාරය වඩාත් බහුවිධ වූවක් බවට පත් වී ඇති අතර, ආයතනය තුළ අවදානම් කළමනාකරණ හා ප්‍රතිලාභ අරමුණුවලට අමතරව, ජාතික අවශ්‍යතාවයන් සහ අනෙකුත් නෛතික හා ව්‍යවස්ථාමය වගකීම් රැසක්ද ඔවුන් වෙත පැවරී ඇත. බාහිර පරිසරයෙන් ඇති වන්නා වූ බලපෑම් සලකා බලන කල ලොව පුරා මහ බැංකු ඉතා අස්ථාවර වූත්, අවිනිශ්චිත වූත්, අනපේක්ෂිත සිදුවීම් සහිත වූත් පසුබිමක ක්‍රියාත්මක වේ. එබැවින්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලියෙහි සාර්ථකත්වය පිළිබඳ සාධාරණ තහවුරු කිරීමක් ලබා ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් වශයෙන් මහ බැංකුවලට දැඩි ප්‍රයත්නයක නිරත වීමට සිදුව ඇත. මීට අමතරව, මූල්‍ය වෙළඳපොළවල සිදුව ඇති යහපාලන බිඳවැටීම් හා මූල්‍ය අපචාරයන් හේතුවෙන් මහ බැංකු පිළිබඳව යොමුව ඇති මහජන අවධානය හා අපේක්ෂාවන් දැඩි ලෙස වර්ධනය වී ඇති අතර, මෙය හේතුකොට ගෙන මහ බැංකු ඒවායෙහි කීර්තිනාමය බිඳවැටීමේ අවදානමකට මුහුණ පා ඇත. මේ අනුව, කීර්තිනාමය පළුදු වීමේ අවදානම තුළින් ඇති විය හැකි විශ්වාසනීයත්වය අහිමි වීම, මහ බැංකු ප්‍රතිපත්තිවල ඵලදායීතාවය කෙරෙහි ඉමහත් ඍණාත්මක බලපෑමක් ඇතිකර තිබේ.

මෙවැනි පසුබිමක් තුළ ලොව පුරා මහ බැංකු අවදානම් කළමනාකරණය සඳහා විශ්වාසනීය වූත්, ව්‍යුහාත්මක වූත්, විනයානුකූල වූත් ප්‍රවේශයක් සඳහා යොමු වී ඇති අතර, ආයතන තුළ පවත්නා හා ඉදිරියේ දී ඇති විය හැකි අවදානම් කළමනාකරණය කරනු වස් යොදා ගත හැකි වඩාත් ඵලදායී උපායමාර්ගයක් ලෙස 'ආයතනගත අවදානම් කළමනාකරණය' හෙවත් ERM (Enterprise-wide Risk Management) සංකල්පය ක්‍රියාත්මක කිරීමට තෝරාගෙන ඇත. ආයතනගත අවදානම් කළමනාකරණය යනු අනිවාර්යයෙන්ම සංයුක්ත වූත්, පරිපූර්ණ වූත් ප්‍රයත්නයක් වන අතර, එහි මනා ක්‍රියාකාරීත්වය සඳහා සෑම පාර්ශ්වකරුවෙකුටම සුවිශේෂී වූ භූමිකාවක් හා වගකීමක් පැවරී ඇත. මෙම ක්‍රියාවලියේ දී ආයතනය තුළ ඉහළම ප්‍රමිතියකින් යුතු යහපාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම ඉතා වැදගත් වේ.

### මහ බැංකු තුළ යහපාලනය

මහ බැංකු තුළ යහපාලනය යනු දශකයකටත් අධික කාලයක් මුළුල්ලේ අවධානයට ලක්ව ඇති සිද්ධාන්තයක් වුවද, මෙය ක්‍රියාවට නැංවීම විවිධ ප්‍රායෝගික ගැටලු හේතුකොටගෙන විවාදාත්මක වී ඇත. ඒ කෙසේ වෙතත්, යහපාලන සංකල්පයේ උපායමාර්ගික වටිනාකම අවතක්සේරුවකට ලක් නොකළ යුතු වන අතර, මහ බැංකු විසින් යහපාලනය ක්‍රියාවට නැංවිය යුත්තේ එමගින් ලබාදෙන බොහෝ ප්‍රතිලාභ නිසාම පමණක් නොවේ. මහ බැංකු විසින් නියාමනය කරන මූල්‍ය ආයතන මත යහපාලන රෙගුලාසි පනවා ඇති නිසා, යහපාලනය රැකීම සඳහා තමා මතම පවරාගත් සදාචාරාත්මක වගකීමකටද මහ බැංකු බැඳී සිටී. කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ගැටලු මධ්‍යයේ වුවද, යහපාලනය, ආයතනගත අවදානම් කළමනාකරණය සාර්ථක කරගනු පිණිස අත්‍යාවශ්‍ය වූ යාන්ත්‍රණයක් ලෙස මහ බැංකු විසින් හඳුනා ගෙන ඇත. යහපාලනය හා ආයතනගත අවදානම් කළමනාකරණය යනු එකිනෙක හා බැඳී පවත්නා වූද, එකිනෙකට අනුරූප වූද, එකිනෙකා මගින් ප්‍රතිලාභ ලබාගන්නා වූද සංකල්ප ද්විත්වයකි.

### ආයතනගත අවදානම් කළමනාකරණය සඳහා පහසුකම් සලසන්නෙකු ලෙස යහපාලනය

යහපාලනය යනු අවදානම ඇතුළු අනෙකුත් කාර්යයන් මෙහෙයවීම සඳහා ආයතනයක් තුළ කටයුතු සිදු කරන ආකාරයයි. මේ අනුව, වඩාත් කාර්යක්ෂම හා ඵලදායී යහපාලනයක් ගොඩනැංවීම සඳහා 'මෙහෙයවීම', 'ස්වාධීනත්වය', 'වගවීම' හා 'විනිවිදභාවය' යන මූලධර්ම අතිශයින් වැදගත් වන අතර, ආයතනගත කළමනාකරණ රාමුව සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා ද මෙම මූලධර්ම ස්ථාපිත කිරීම පූර්ව අවශ්‍යතාවක් වේ. අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් පවත්නා සිය කැපවීම හා මෙහෙයවීම පැහැදිලිව විදහා දක්වමින්, ඒ සඳහා අවශ්‍ය පහසුකම් හා පසුබිම සැකසීම අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය මගින් සිදු කළ යුතුය. ආයතනයේ අවදානම් යහපාලන රාමුව මගින් මෙහෙයුම් කාර්යයන් හා වාර්තාකරණය සඳහා අවශ්‍ය කරන ස්වාධීනත්වය නිසිතැන්හිදී ලබාදිය යුතුය. ආයතනය තුළ අවදානම් කළමනාකරණය හා සම්බන්ධ සියලු පාර්ශ්වකරුවන්ගේ වගවීම් මනාව අර්ථ දැක්විය යුතු අතර, මෙහිදී අධ්‍යක්ෂ මණ්ඩලයේ, විවිධ කමිටුවල, දෙපාර්තමේන්තුවල හා සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ භූමිකා පැහැදිලි කිරීමක් සිදුවිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය, විවිධ කමිටු හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් ගනු ලබන තීරණ හා තීරණ ගැනීමේදී අනුගමනය කරන ක්‍රියාපටිපාටිය මනා විනිවිදභාවයකින් යුක්තව අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වයන් වෙත දැනුම් දීමේ ක්‍රමවේදයක් ගොඩනැංවිය යුතුය. ඉහළ වාර්තාකරණ ක්‍රියාපිළිවෙත්, තීරණ ගනු ලබන ව්‍යුහයන්,

තොරතුරු හුවමාරු වන මාර්ග හා පාර්ශ්වකරුවන්ගේ කාර්යභාරය හා වගකීම් මුලාරම්භයේදීම පැහැදිලිව නිර්ණය කිරීම තුළින්, ආයතනගත අවදානම් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු වේ. තවද, මෙමගින් අනවශ්‍ය නිලධාරීවාදී ක්‍රියාපටිපාටීන් හා නිශ්ඵල පෞද්ගලික මතවාද මගින් ආයතනික සංහිදියාව කඩාකප්පල් වීම, සම්පත් අපතේ යෑම වැනි ආයතනගත අවදානම් කළමනාකරණය සාර්ථකව ක්‍රියාවට නැංවීම ප්‍රමාද කිරීමට හේතුවන සාධක මගහරවා ගැනීමට අවකාශ ලැබේ.

**යහපාලනය සඳහා පහසුකම් සලසන්නෙකු ලෙස ආයතනගත අවදානම් කළමනාකරණය**

ආයතනගත අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීම මගින් අවිනිශ්චිතතා කල් ඇතිව හඳුනා ගැනීම, නව්‍ය අවස්ථා උදාකර ගැනීම, ප්‍රයත්නයන් අපතේ යෑම වලක්වා ගැනීම සහ කාර්යයන් හා පාලනයන් ප්‍රමුඛතාවන්ට අනුව පෙළගැස්වීම සඳහා අවශ්‍ය පසුබිම සැකසෙන අතර, කාලීන, දැනුම්වත්, සහභාගිත්ව හා අවදානම් පිළිබඳ පරිචයකින් යුත් තීරණ ගැනීමේ අවකාශය උදා කරනු ලැබේ. මහ බැංකුවක දීර්ඝ කාලීන ශක්‍යතාව හා කීර්තිනාමය රැකගනු පිණිස, අධ්‍යක්ෂ මණ්ඩලය ද, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ද අවදානම් පිළිබඳ පොදු අවබෝධයකින් සිටිය යුතු වීම යහපාලනයේ මූලිකාංගයක් වන අතර, ආයතනගත අවදානම් කළමනාකරණය මෙම අවබෝධය ගොඩනැංවීමට අවශ්‍ය යාන්ත්‍රණය සකසනු ලබයි. යහපාලනය නොමැති වීම, නැතහොත් දුර්වල වූ යහපාලනය ආයතනයක පැවැත්මට තර්ජනයක් වන බව ඊට අදාළ වූ පර්යේෂණවලින් විදහා දක්වා ඇත. යහපාලන අවදානමට හේතු වන බොහෝ කරුණු ඇත. මේ අතුරින්, අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ග පිළිබඳ අවධානය යොමු නොකොට දෛනික මෙහෙයුම් කෙරෙහි පමණක් අවධානය යෙදවීම, අධ්‍යක්ෂ මණ්ඩලයට සපයන තොරතුරුවල අඩු ගුණාත්මක බව, ප්‍රමාද බව, ප්‍රමාණවත් නොමැති බව හා අනවශ්‍ය සංකීර්ණ බව, සහ ආයතනය තුළ නිසි උපායමාර්ගික සැලැස්මක් නොමැතිකම හෝ පවත්නා සැලසුම නියමාකාරව ක්‍රියාත්මක නොකිරීම ආදිය මූලික වේ. මීට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය අවශ්‍ය පමණට වඩා අඩු හෝ වැඩි වීම, ඔවුන් ප්‍රමාණවත් දැනුම් හා නිපුණතා සම්භාරයකින් යුක්ත නොවීම, අදක්ෂ වීම හා ආයතනය වෙත අවශ්‍ය අවධානය යොමු කිරීමට අපොහොසත් වීම, ආයතනයට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි මනාව විමර්ශනය කර අනුමත කර නොතිබීම, අවදානම් නොසලකා හැරීම හෝ නිසිපරිදි කමනාකරණය නොකිරීම ආදිය ද දුර්වල යහපාලනයක් පවතින ආයතනයක ලක්ෂණ වේ. ආයතනගත අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාවට නැංවීම මගින් ඉහළම යහපාලන ප්‍රමිතීන් ආයතනය තුළ ස්ථාපිත කර ඇති බවටත්, ඒවා ක්‍රියාවට නංවා ඇති බවටත් සහතික විය හැකිය.

**අවදානම් කළමනාකරණ ඉදිරි දැක්ම - ශ්‍රී ලංකා මහ බැංකුව**

අවදානම් කළමනාකරණය කිරීම සඳහා ඉතා සාර්ථක ප්‍රවේශයක් ලෙස, ඉහළ යහපාලන ප්‍රමිතියකින් යුත් ආයතනගත අවදානම් කළමනාකරණ ක්‍රමවේද සඳහා ලෝකයේ බොහොමයක් මහ බැංකුවල පිළිගැනීම ලැබී තිබේ. මහ බැංකුවල නව්‍ය ප්‍රවණතාවන්ට අනුකූලව යමින් ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමේ වැදගත්කම අවධාරණය කරමින්, ‘මහ බැංකුව තුළ ආයතනගත අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීම’ ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ෂ 2018-2020 සඳහා වන උපායමාර්ගික සැලසුමෙහි එක් ප්‍රධාන උපායමාර්ගයක් ලෙස හඳුනා ගෙන ඇත. ආයතනගත අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ මූලික පියවර වන්නේ බැංකුව තුළ මනා අවදානම් යහපාලන රාමුවක් ක්‍රියාවට නැංවීමයි. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වන අවදානම් කළමනාකරණ හා අවදානම් යහපාලන ව්‍යූහයන්ගෙන් සමන්විත අවදානම් යහපාලන රාමුවක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනටමත් සකසා ඇති අතර, 2018 වසර තුළදී මෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවරයන් ගැනීමට නියමිතය. අවදානම් යහපාලන රාමුවෙහි එක් ස්ථරයක් වන අවදානම් කළමනාකරණ ව්‍යූහය තෙවැදෑරුම් ආරක්ෂක ක්‍රමවේදයන්ට අනුව සකසා ඇති අතර, එමගින් අවදානම් කළමනාකරණය හා සම්බන්ධ කාර්යයන් කණ්ඩායම් තුනක් අතර ඉතා පැහැදිලි සීමාංකනයකට ලක් කොට තිබේ. මේ අනුව පළමු පෙළ ආරක්ෂක ක්‍රමවේදයේ වගකීම මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කරන දෙපාර්තමේන්තුවලට පැවරී ඇති අතර, අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, ඒවා සඳහා උචිත පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක වන බව තහවුරු කරමින් කළමනාකරණය කිරීම සහ අනුකූලතාව අධීක්ෂණය කිරීම ඔවුන්ට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ. දෙවන පෙළ ආරක්ෂක ක්‍රමවේදයේ වගකීම අවදානම් හා අනුකූලතා පර්ෂදය වෙත පැවරී ඇති අතර, මෙමගින් අවශ්‍ය පහසුකම් සැලසීම, අවදානම් හා අනුකූලතා කටයුතු ස්වාධීනව අධීක්ෂණය කිරීම හා අවදානම් හා අනුකූලතා පිළිබඳ පොදු ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ පිළියෙළ කිරීම ආදිය සිදු කරනු ලබයි. තෙවන පෙළ ආරක්ෂක ක්‍රමවේදය මෙහෙයවනු ලබන්නේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙනි. ඔවුන් විසින් පළමු හා දෙවන පෙළ ආරක්ෂක ක්‍රමවේදයන්හි ඵලදායිතාව පිළිබඳ ස්වාධීන වූත්, වාස්තවික වූත්, සහතික කිරීමක් මුදල් මණ්ඩලය වෙත ලබා දෙයි. සෑම ආරක්ෂක ක්‍රමවේදයක්ම අවදානම සම්බන්ධ තොරතුරු ඔවුන්ට ආවේණික වූ දෘෂ්ඨිකෝණයකින් විග්‍රහ කොට ඉදිරිපත් කිරීම තුළින්, මුදල් මණ්ඩලයට අවදානම් සමස්තය පිළිබඳ වඩාත් පරිපූර්ණ අවබෝධයක් ලබාගෙන, අවදානම පිළිබඳ මනා දැනුමකින් යුක්තව තීරණ ගැනීම සඳහා ඉඩකඩ සැලසෙයි. මෙම සංයුක්ත අවදානම් සහතික කිරීම,

නව ආවදානම් කළමනාකරණ රාමුවෙන් සැලසෙන ඉතා වැදගත් වාසියකි. අවදානම් යහපාලන රාමුවෙහි අනෙක් ස්තරය වන අවදානම් යහපාලන ව්‍යුහය සමන්විත වන්නේ ස්වාධීන අවදානම් වාර්තාකරණය, අධීක්ෂණය හා අවදානම් යහපාලනය සඳහා පහසුකම් සපයන කමිටු ව්‍යුහයකිනි. මුදල් මණ්ඩලයට වාර්තා කළ යුතු තොරතුරු විධායක මට්ටමේ විචක්ෂණ කමිටුවකින් හා මුදල් මණ්ඩල උප කමිටුවලින් සමන්විත අවදානම් යහපාලන ව්‍යුහයක් හරහා ඉදිරිපත් වෙයි. තොරතුරු රැස් කිරීමේ හා තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ තිබිය යුතු වාස්තවිකත්වය, ස්වාධීනත්වය හා සහභාගීත්ව තීරණ ගැනීමේ හැකියාව සුරක්ෂිත කිරීම සඳහා මෙම කමිටු පිහිටුවා ඇත. ඉහත කමිටු ව්‍යුහය උපයෝගී කරගනිමින් වඩාත් විශ්වාසනීය වූත්, සම්පූර්ණ වූත්, කාලෝචිත වූත් තොරතුරු වෙත ප්‍රවේශ වෙමින්, යහපාලන හා අවදානම් කළමනාකරණ අධීක්ෂණ වගකීම් ඉටු කිරීමට මුදල් මණ්ඩලයට අවස්ථාව සැලසේ.

**නිගමනය**

ලොව පුරා විසිරී ඇති මහ බැංකු, ආයතනය තුළ පවතින සියලු අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාව ඇති අතිශය ඵලදායී යාන්ත්‍රණයක් ලෙස ආයතනගත අවදානම් කළමනාකරණ ක්‍රමවේදය පිළිගෙන තිබේ. එය ආයතනික අභිමතාර්ථ හා අරමුණු වඩා සාමූහිකව හා සංවිධානාත්මකව ඉටුකර ගැනීමට ඉඩකඩ සම්පාදනය කරයි. කෙසේ වුවත්, ක්‍රියාත්මක වන පරිසරය තුළ යහපාලනයට නිසි ප්‍රමුඛතාවය නොලැබේ නම්, ලොව ඇති ඉතාම ඵලදායී යැයි සැලකෙන යාන්ත්‍රණයක් පවා අසාර්ථක වීමට ඉඩ ප්‍රස්ථාව ඇත. මේ අනුව, ආයතනගත අවදානම් කළමනාකරණය ක්‍රියාවට නැංවීම සඳහා අත්‍යාවශ්‍ය වූ මූලිකාංගයක් ලෙස අවදානම් යහපාලන රාමුව සැලකෙන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු ලොව පුරා බොහොමයක් මහ බැංකු සිය ආයතනගත අවදානම් කළමනාකරණ රාමුවේ සාර්ථකත්වය සඳහා ශක්තිමත් පදනමක් ඇති කරනු පිණිස, අවදානම් යහපාලන රාමු ස්ථාපිත කර ඇත.

පරාමිතීන් හා අනුකූල වීම තහවුරු කර ඇත. ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹෙහි වෙළඳපොළ අවදානම් ඇස්තමේන්තු කිරීම සඳහා අවදානම් මත වටිනාකම හා පැවතුම් කාලය උපයෝගී කර ගනිමින් අවදානම් මට්ටම නිශ්චිත ඉලක්ක යටතේ පවත්වානෙ යෑමට කටයුතු කර ඇති බව තහවුරු කරන ලදී.

Fitch ratings, Standard and Poors සහ Moody's Analytics යන ආයතන මගින් නිකුත් කළ ණය ශ්‍රේණිගත කිරීම් පදනම්ව ප්‍රතිපාර්ශව ණය අවදානම දෛනිකව අධීක්ෂණය කරන ලදී. මේ අනුව ශ්‍රේණිගත කිරීම්වල වෙනස්වීම් අනුව ප්‍රතිපාර්ශ්වීය ණය අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශයන්ට අනුව යමින් හා ප්‍රතිපාර්ශ්වයන් හා නිකුතුකරුවන් ඔවුන්ගේ ණය වගකීම් ඉටු කිරීමේදී ඇති විය හැකි ණය නොගෙවීම් අවදානම් සලකා බලා ප්‍රතිපාර්ශ්වීය සීමාවන්, නිකුතුකරුගේ සීමාවන් හා මූල්‍ය උපකරණ සීමාවන් කිහිපයක්ම සංශෝධනය කරන ලදී. ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සියලුම ආයෝජන කටයුතු සුදුසුකම් ලත් නිකුතුකරුවන් සහ ප්‍රතිපාර්ශවයන්ගේ අවදානම් මට්ටම මත පදනම් වූ සීමා ව්‍යුහයන් යටතේ සිදුවන බව තහවුරු කිරීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමඟ සමීපව කටයුතු කරන ලදී.

ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල පමණක් ගනුදෙනු කිරීමට වඩා මුදල් වෙළඳපොළ ප්‍රතිපාර්ශවයන් සමඟ ගනුදෙනු කිරීමේදී ණය අවදානමට ලක් වීමේ හැකියාව වැඩි නිසා ක්‍රියාකාරී මුදල් වෙළඳපොළේ ප්‍රතිපාර්ශවයන්ගේ ණය පැහැර හැරීමේ හුවමාරු ගිවිසුම් (Credit Defalt Swap) හා කොටස් වෙළඳපොළ මිල ගණන් දෛනිකව නිරීක්ෂණය කොට ඉහළ, මධ්‍යම හා පහළ ලෙස පිළිවෙළින් රතු, කහ සහ කොළ පැහැයෙන් යුතු සංඥා දර්ශන මගින් වර්ගීකරණය කොට වාර්තා කරන ලදී. මුදල් වෙළඳපොළ ප්‍රතිපාර්ශවයන් සමඟ කෙටිකාලීන අරමුදල්වල ආයෝජනය කිරීමේදී සලකා බලනු වස් ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට මෙම තොරතුරු දිනපතා දැනුම් දෙන ලදී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මුදල් වෙළඳපොළ ප්‍රතිපාර්ශවයන්ගේ ණය පැහැර හැරීමේ හුවමාරු ගිවිසුම් (Credit Defalt Swap) සහ කොටස් වෙළඳපොළ මිල ප්‍රවනතා සාරාංශයක් සහ ජාත්‍යන්තර වශයෙන් ඇති අවදානම් සිද්ධි මෙන්ම ඒවායින් සිදු විය හැකි බලපෑම් ද ඇතුළත් මාසික වාර්තාවක් සකස් කරන ලදී. මෙමගින් නව අවදානම් මූලාශ්‍ර හඳුනා ගැනීමට හැකියාව ලැබුණි.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය කළමනාකරණ කමිටුවේ මාසික රැස්වීම්වලට විදේශ සංචිත ආයෝජනවල අවදානම් මිනුම් ඉදිරිපත් කරන ලද අතර, කාර්තුමය අවදානම් වාර්තාවන් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විදේශ සංචිත ආයෝජන සම්බන්ධයෙන් වූ නව යෝජනා සඳහා අවදානම් කළමනාකරණ දෘෂ්ටිකෝණයෙන් ඇගයීම් සිදු කළ අතර උපායමාර්ගික වත්කම් වෙන් කිරීම (Strategic Assets Allocation), සැකසීම සඳහා අවදානම් කළමනාකරණයට අදාළ තොරතුරු ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත සපයනු ලැබීය. මීට අමතරව වසර තුළදී අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ලෝක බැංකුවේ සංචිත වත්කම් කළමනාකරණ වැඩසටහන (RAMP) මෙන්ම 2018 දී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ආයතනගත අවදානම් කළමනාකරණ රාමුවට අනුගත වෙමින් වර්තමාන විදේශ විනිමය කළමනාකරණ මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම හා ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය කෙටුම්පත් කිරීම සිදු කරන ලදී.

## 24.2 අභ්‍යන්තර ආයෝජන අරමුදල

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අභ්‍යන්තර අරමුදල් ආයෝජනයන්, අවදානම් කළමනාකරණ දෘෂ්ටිකෝණයෙන් විශ්ලේෂණය කරන ලදී. එහිදී පවත්නා මාර්ගෝපදේශයන් සමඟ අනුකූලතාවය පරීක්ෂා කිරීම හා අවශ්‍ය විට අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ද

ඉදිරිපත් කරන ලදී. මෙම විශ්ලේෂණ මාසිකව සිදු කරන ලද අතර කාර්තුමය අවදානම් වාර්තාවන් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව බැංකුව තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ආයතනගත අවදානම් කළමනාකරණ රාමුව හා අනුගත වෙමින් ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය හා ආයෝජන මාර්ගෝපදේශ පිළියෙළ කිරීමේ නිරතව සිටී.

### 24.3 සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජනවලට අදාළ මූල්‍ය අවදානම අධීක්ෂණය කිරීමේ වගකීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති අතර ඒ සඳහා මූලික පියවරක් ලෙස අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වූ අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලද අතර සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ ක්‍රියාපටිපාටි තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය සහ ආයෝජන මාර්ගෝපදේශ පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීම සඳහා කටයුතු යොදා තිබේ.

### 24.4 ආයතනගත අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීමේ මූලික කටයුතු

බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය සහ අවදානම් කළමනාකරණ සංස්කෘතිය ශක්තිමත් කිරීම සඳහා වූ පියවරක් ලෙස, 2018-2020 උපායමාර්ගික සැලසුම්කරණ කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාවට නැංවීම අරමුණු කර ගනිමින් බැංකුව සඳහා ආයතනගත අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මූලික පියවර ගන්නා ලදී. මෙම කාර්යයට වැඩි වැදගත්කමක් හා ප්‍රමුඛත්වයක් ලබා දෙමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලියේදී ආයතනගත අවදානම් කළමනාකරණ රාමුවක් හඳුන්වා දීම බැංකුවේ ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස හඳුනා ගන්නා ලදී.

ආයතනගත අවදානම් කළමනාකරණය සම්බන්ධ විෂයානුබද්ධ නිපුණතාවයන් ගොඩනැගීම සඳහා සහ ශ්‍රී ලංකා මහ බැංකුව තුළ අවදානම් කළමනාකරණය කිරීමේ සංස්කෘතියක් ඇති කිරීම සඳහා බැංකු විදු පියෙසහිද සහය ඇතිව වැඩමුළු කිහිපයක් සංවිධානය කරන ලදී. ඊට අමතරව, අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා සෑම දෙපාර්තමේන්තුවක් සඳහාම අවදානම් නිලධාරීන් පත් කිරීම සිදු කරන ලදී. වසර තුළ දී අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අවදානම් යහපාලන (Risk Governance) හා අවදානම් කළමනාකරණ (Risk Management) ආකෘතීන්ගෙන් සමන්විත නව අවදානම් යහපාලන රාමුවක් (Risk Governance Framework) නිර්මාණය කිරීමේ නිරත වූ අතර මෙය බැංකුව තුළ ආයතනගත අවදානම් කළමනාකරණ රාමුව (Enterprise Risk Management) ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික පදනම ලෙස සැලකේ.

### 24.5 මූල්‍ය නොවන අවදානම්

මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් වන දෙපාර්තමේන්තු 17 කට සම්බන්ධ මූල්‍ය නොවන අවදානම් ඒකාබද්ධ කර බැංකු අවදානම් ආකෘතිය පිළියෙළ කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සිදු කරන ලදී. එහිදී හඳුනාගත් අවදානම්, ප්‍රතිපත්ති අවදානම්, මෙහෙයුම් අවදානම් හා අනෙකුත් මූල්‍ය නොවන අවදානම් යනුවෙන් ප්‍රධාන අවදානම් වර්ග තුනක් යටතේ වර්ගීකරණය කරන ලද අතර අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 3x3 අවදානම් ආකෘතීන් යටතේ හා අවදානම් වර්ගීකරණ ක්‍රමයක් උපයෝගී කර ගනිමින් මෙම අවදානම් පිළිබඳ විශ්ලේෂණයක් සිදු කොට මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරන ලදී.

### 24.6 දෛනික වෙළෙඳපොළ තොරතුරු/ මූල්‍ය වෙළෙඳපොළ තොරතුරු

දේශීය වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්ව, මුදල් වෙළඳපොළ තුළ කෙටිකාලීන පොලී අනුපාත විචලනයන්, ජාත්‍යන්තර සංචිතවලට බලපානු ලබන පරිදි විදේශ විනිමය වෙළඳපොළේ සිදුවන මුදල් ප්‍රවාහ හා මිල වෙනස්වීම් හා රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි ඵලදායී වක්‍රවල හැසිරීම හා රාජ්‍ය ණය අවශ්‍යතා ඇතුළත් වෙළඳපොළ තත්ත්වය දෛනිකව විශ්ලේෂණය කොට අධිපතිතුමා වෙත වාර්තා කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

### 24.7 වෙනත් ක්‍රියාකාරකම්

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සිය කාර්ය මණ්ඩලයේ විෂයානුබද්ධ නිපුණතා ගොඩනැංවීම් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලද අතර මේ සම්බන්ධයෙන් ලෝක බැංකුවේ සංචිත උපදේශන හා කළමනාකරණ වැඩසටහන (RAMP) යටතේ නිලධාරීන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීමට කටයුතු කරනු ලැබීය. මෙමගින් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්යයන් තවදුරටත් වැඩිදියුණු කිරීමට හැකි විය.

මීට අමතරව, සේවක මණ්ඩල සාමාජිකයන් විසින් පවත්වන ලද විෂයානුබද්ධ ඉදිරිපත් කිරීම්, අනෙකුත් සාමාජිකයන් අතර දැනුම හුවමාරු කර ගැනීමට උපකාරී විය. එමෙන්ම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (Treasury Management System) අවදානම් කළමනාකරණයට අදාළව යාවත්කාලීන කිරීමට සම්බන්ධ විය.

## 25. ලේකම් දෙපාර්තමේන්තුව

ලේකම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භයේදීම ප්‍රතිෂ්ඨාපිත දෙපාර්තමේන්තු අතරින් එකකි. එමගින් සිදු කෙරෙන කාර්යයන් අතරින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ක්‍රමය පරිපාලනය කිරීම, නිවාඩු රීති ක්‍රියාත්මක කිරීම, පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු, විදේශ පුහුණු හා විදේශ සංචාර සම්බන්ධයෙන් වන ගෙවීම් කටයුතු සිදු කිරීම, උත්සව සංවිධානය කිරීම, අභාවිත සහ යල් පිනූ භාණ්ඩ පිළිබඳ සමීක්ෂණ මණ්ඩල කටයුතු හා තැපැල් සේවා සැපයීම සහ අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන සේවා සපයා දීම ප්‍රධාන වේ. මෙම කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් කටයුතු සාර්ථකව කරගෙන යෑම සඳහා විශාල දායකත්වයක් සපයයි. 2017 වසර අවසන් වන විට අනූඑක් දෙනෙකුගෙන් සැදුම් ලත් කාර්ය මණ්ඩලයක් ලේකම් දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුතු විය.

**(අ) භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම:**

2017 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් ප්‍රධාන වශයෙන්ම ටෙන්ඩර් පටිපාටිය මූලික කර ගනිමින් රුපියල් මිලියන 107 ක වටිනාකමින් යුත් ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ හා සේවා සැලසුම් කළ කාලය තුළ දී ප්‍රසම්පාදනය කරන ලදී. මහ බැංකුව සඳහා නියමිත වේලාවට භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම සහතික කරනු පිණිස 2017 වර්ෂයේ දී ද ප්‍රසම්පාදන සැලසුම් සකස් කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2017 වර්ෂය සඳහා සැලසුම් කළ මහ බැංකුවේ සමස්ත ප්‍රසම්පාදන අවශ්‍යතාවලින් 87% ක ප්‍රමාණයක් ඉතා සාර්ථක ලෙස අවසන් කිරීමට ලේකම් දෙපාර්තමේන්තුවට හැකි විය. තවද, පොදු වගකීම් රක්ෂණ ආවරණය ද ඇතුළු බැංකුවේ සියලුම දේපළ සඳහා සඵල විස්තීර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී.

**(ආ) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ක්‍රමය පරිපාලනය කිරීම:**

දෙදහසකට අධික ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වෙනුවෙන් මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය, වැන්දඹු හා අනත්දරු අරමුදල, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල සහ මහ බැංකු අර්ථසාධක අරමුදල යටතේ අදාළ ගෙවීම් කටයුතු සහ ඊට අදාළ ලිපි ලේඛන කටයුතු ලේකම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව පරිපාලනය කරන ලදී.

**(ඇ) නිවාඩු රීති ක්‍රියාත්මක කිරීම:**

ලේකම් දෙපාර්තමේන්තුව විසින් සේවා නියුක්තයන්ගේ පෞද්ගලික හා රාජකාරී විදේශ සංචාර සඳහා නිවාඩු අනුමැති 610 ක් ලබා දීමට කටයුතු කරන ලදී. මෙයට අමතරව මහ බැංකු සේවා නියුක්තිකයන්ගේ වෘත්තීය සංගම් හා වෙනත් සමිති සංවිධානවලට සපයනු ලබන සේවාවලට අදාළ ලිපිලේඛන කටයුතු සිදු කරන ලදී.

**(ඈ) පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු, විදේශ පුහුණු හා විදේශ සංචාර සම්බන්ධයෙන් වන ගෙවීම් කටයුතු සිදු කිරීම:**

සේවා නියුක්තයන් 45 දෙනෙකුගේ පශ්චාත් උපාධි කටයුතු සඳහා සහ සේවා නියුක්තයන්ගේ කෙටි කාලීන විදේශ පුහුණු සංචාර 477 ක් සඳහා ලේකම් දෙපාර්තමේන්තුව විසින් 2017 වසර තුළදී පහසුකම් සලසන ලදී.

**(ඉ) අභාවිත සහ යල්පිනූ භාණ්ඩ පිළිබඳ සමීක්ෂණ මණ්ඩල කටයුතු, උත්සව සංවිධානය කිරීම සහ තැපැල් කාමර සේවාව:**

2017 වර්ෂය තුළ දී අභාවිත යල්පිනූ කාර්යාලයීය උපකරණ ඉවත් කිරීම උදෙසා වූ සමීක්ෂණ මණ්ඩලයක කටයුතු මහ බැංකු අත් පොතෙහි දැක්වෙන ක්‍රමවේදයනට අනුකූලව මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ දී සම්පූර්ණ කරන ලදී. 2017 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් අලුත් අවුරුදු වැඩ ඇරඹීමේ උත්සවය හා ඊට සමගාමීව දීර්ඝ සේවා තිළිණ ප්‍රදාන උත්සවය, 1996 බෝම්බයෙන් විපතට පත් වූවන් සැමරීමේ වැඩසටහන සහ ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීමේ 67 වැනි සංවත්සරික දේශනය අතුළු විවිධ සැමරුම් උත්සව සම්බන්ධීකරණය සහ සංවිධානය කරනු ලැබීය. ලේකම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැපැල් කාමර සේවාව මගින් 2017 වර්ෂයේ දී දේශීය සහ විදේශීය වශයෙන් ලිපි 58,515 ක් ද පාර්සල් 1,051 ක් ද යැවීම සඳහා පහසුකම් සලසන ලදී.

**(ඊ) අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන සේවා සපයාදීම:**

2017 වර්ෂය තුළ මහ බැංකු අධිපතිගේ නිල කාර්යයන් සිදු කිරීම සඳහා අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන කටයුතු සැපයීම ද ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. ඒ අනුව, අධිපතිගේ හමුවීම් හා රැස්වීම් සංවිධානය, දේශන හා ලිපි සඳහා අවශ්‍ය කෙටුම්පත් සකස් කිරීම මෙන්ම මූල්‍ය වෙළඳපොළ පිළිබඳ තොරතුරු සැපයීම ද සිදු කරන ලදී. තවද, අධිපතිතුමාගේ දේශීය හා විදේශීය නිල සංචාර හා අධිපති සහ නියෝජ්‍ය අධිපතිවරුන්ගේ නිල උත්සව සඳහා අදාළ කටයුතු සංවිධානය කිරීම ආදී සන්ධාන සේවා සපයන ලදී. මීට අමතරව, මහ බැංකුවේ හා අධිපතිතුමාගේ විශේෂිත ආරාධිත අමුත්තන් හට අවශ්‍ය පහසුකම් සැපයීම ද සිදු කෙරුණි.

## 26. ආරක්ෂක සේවා

අදාළ වර්ෂය තුළ දී ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින්ට, ගොඩනැගිලිවලට, අනෙකුත් දේපළවලට සහ මුදල් ප්‍රවාහනය සඳහා ආරක්ෂාව සැපයීම නොකඩවා කරගෙන යන ලද අතරම පහතින් සාරාංශගත ආකාරයට ආරක්ෂක පද්ධතිය වැඩිදියුණු කිරීම සහ සේවක පුහුණුවීම් කාර්යයන්හි ද නියැලුනි.

### 26.1 ආරක්ෂක පද්ධති වැඩිදියුණු කිරීම්

වර්ෂය තුළ දී මහ බැංකු මූලස්ථානයේ හා අනෙකුත් සියලු පිටස්තර පරිශ්‍ර තුළ ස්ථාපිත කර තිබූ සියලු ගිනි නිවීම් උපකරණ විධිමත් පදනමක් මත පරීක්ෂා කිරීම, අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සිදු කරන ලදී. රාජගිරියේ බැංකු විදු පියසේ පිහිටි "සවරින්" අධ්‍යයන මධ්‍යස්ථානය සඳහා වෙනමම ප්‍රවේශ පාලන පද්ධතියක් පිහිටුවීම ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැවැත්වූ හදිසි අවස්ථාවන්හි දී රාජකාරි අඛණ්ඩව පවත්වාගෙන යැමේ පුහුණු කටයුතු සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සක්‍රීයව සහභාගි විය.

### 26.2 පුහුණුවීම්

(අ) ගිනි අනතුරු වැළැක්වීම, ගිනි නිවීම සහ ප්‍රථමාධාර වැඩසටහන්

මහ බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවලින් තෝරා ගන්නා ලද සියලුම ගිනි අනතුරු ආරක්ෂණ නිලධාරීන් සඳහා කොළඹ මහ නගර සභාවේ ගිනි නිවීම් දෙපාර්තමේන්තුව, ශාන්ත ජෝන් ගිලන් රථ සේවාව සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව ගිනි වැළැක්වීම, ගිනි නිවීම, ප්‍රථමාධාර සහ ආපදා කළමනාකරණ පිළිබඳව දින දෙකක පෘථුල වැඩසටහනක් පවත්වන ලදී. මීට අමතරව මාර්තු මස දී ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ කොළඹ ගිනි නිවීම් ඒකකය සමගින් ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ සමස්ත සේවා නියුක්තිකයින් උදෙසා ගිනි නිවීමේ සහ ගිනි අනතුරු සරඹ පෙරහුරුවක් ද පවත්වන ලදී.

(ආ) කුසලතාවයන් හා දක්ෂතාවයන් ඔප්නැංවීම

ආරක්ෂක නිලධාරීන්ගේ කුසලතාවය වැඩිදියුණු කිරීම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් ද පිළියෙළ කරන ලදී. මෙම අධ්‍යයන වැඩසටහන් ආරක්ෂක, තොරතුරු තාක්ෂණය, අභිප්‍රේරණ ආකල්ප පරිවර්තන පැතිකඩ, පාරිභෝගික සම්බන්ධතා සහ නායකත්ව පුහුණුව ආදී ප්‍රධාන අංශ ආවරණය කරන ලදී.

(ඇ) අවි පරිහරණය සහ ජීව වෙඩි පුහුණුව

ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහයෝගය ඇතිව සියලුම ආරක්ෂක නිලධාරීන් සඳහා අවි පරිහරණය සහ ජීව වෙඩි තැබීමේ පුහුණුවක් වර්ෂයේ අවසාන කාර්තුවේ දී ලබා දෙන ලදී.

## 27. කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ

කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව (කා.සේ.ක.) සුභසාධන පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ප්‍රතිලාභීන් වෙත ලබාදීම මෙම වසර තුළදී ද අඛණ්ඩව සිදු කරන ලදී. කාර්යමණ්ඩල නිවාස (උකස්) ණය සැපයීම, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්යමණ්ඩල සුභසාධන ණය ක්‍රමය යටතේ ණය ලබාදීම, සේවා දායක වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම, වෛද්‍ය මධ්‍යස්ථාන පහසුකම් සහ ආපනශාලා පහසුකම් සැපයීම මෙම සේවාවන්වලට අයත් විය. 2017 වසර අවසාන වන විට සේවානියුක්තයන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා ලියාපදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 10,000 ක් පමණ විය.

2017 වසර තුළදී, කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් අර්ථසාධක අරමුදල් සහ කාර්යමණ්ඩල සුභසාධන ණය ක්‍රමයන් යටතේ වාහන ණය, පරිගණක ණය, වෙනත් ණය සහ නිවාස ණය ඇතුළු මුළු ණය 2,026 ක් ප්‍රදානය කරන ලදී. අයදුම්කරුවන් විසින් අදාළ සියලුම ලියකියවිලි සහිතව ඉදිරිපත් කරනු ලැබූ අයදුම්පත් සඳහා නියමිත දින ගණන ඇතුළත ණය නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. ණය අධීක්ෂණ ක්‍රමය මගින් වඩාත් කාර්යක්ෂව සේවානියුක්තයන්ට ණය ලබා දීම අධීක්ෂණය කිරීමට හැකි විය.

මහ බැංකු ආපනශාලාව මගින් බැංකු කාර්යමණ්ඩලයට ලබාදෙන සේවාවන් හැකි උපරිම තත්ත්වයෙන් ඉහළ නැංවීමට තවදුරටත් කටයුතු කරන ලදී. තවද, 2017 වසර තුළදී ආපනශාලාවල තත්ත්වය සහ පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි සියලුම ප්‍රතිලාභීන්ගේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීමට කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කටයුතු කරන ලදී. පසුගිය වසරට සාපේක්ෂව 2017 වර්ෂයේ දී ප්‍රතිපූරණය කරන ලද මුළු වෛද්‍ය වියදම් ප්‍රමාණය සියයට පහකින් ඉහළ ගොස් ඇත. සේවා නියුක්තයන්ට සහ විශ්‍රාමිකයන්ට ඔවුන්ගේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය පිළිබඳව විද්‍යුත් තැපැල මගින් දැනුම්දීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. වෛද්‍ය මධ්‍යස්ථානය මගින් බාහිර පාර්ශවයන් හරහා සපයනු ලබන වෛද්‍ය පහසුකම්, මහ බැංකු සේවානියුක්තයන් වෙත කාර්යාල වේලාවන් තුළදී සපයන ලදී. සාධාරණ මිල ගණන් යටතේ වෛද්‍ය පරීක්ෂණ සහ රසායනාගාර සේවා පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් සිදු කිරීමට ද පියවර ගන්නා ලදී. සෞඛ්‍ය සේවාවන් සම්බන්ධව සේවානියුක්තයන් දැනුවත් කිරීමේ වැඩසටහන් හයක් සලකා බලන වර්ෂය තුළදී කා.සේ.ක. දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලදී. තවද, 2017 වසර තුළදී අවමංගල්‍ය සහනාධාර අරමුදලේ සහ මරණාධාර ක්‍රමයේ සාමාජික මුදල සහ ප්‍රතිලාභ සංශෝධනය කරන ලදී.

## 28. සංඛ්‍යාන

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, දත්ත රැස් කිරීම, සම්පාදනය, විශ්ලේෂණය, පුරෝකථනය හා දත්ත බෙදා හැරීම යන ක්‍රියාකාරකම් ඵලදායීව ඉටුකරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායීතා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අඛණ්ඩව දායක විය. 2017 වසරේ දී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් අතරට සමීක්ෂණ, පර්යේෂණ හා වෙනත්

මූලාශ්‍ර මගින් දත්ත සහ තොරතුරු එක්රැස් කිරීම; මිල, දේපල හා වැටුප් පිළිබඳ දර්ශක සහ ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සම්පාදනය කිරීම; පළාත්බද දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීම; මෑත කාලීන සාර්ව ආර්ථික දර්ශක පුරෝකථනය කිරීම සහ විවිධ ප්‍රකාශන, පුවත්පත් නිවේදන හා දත්ත සංචිතයක් මගින් සංඛ්‍යාන හා වෙනත් තොරතුරු බෙදාහැරීම ඇතුළත් විය. මීට අමතරව, ප්‍රධාන ගෝලීය ශ්‍රේණිගත කිරීම් තුළ ශ්‍රී ලංකාවේ ස්ථානය පිළිබඳ අවධානය යොමු කරමින් එම ශ්‍රේණි ඉහළ නැංවීමට දායක වීමටත්, දේශීය හා ජාත්‍යන්තර ආයතනයන්හි හැකියා වර්ධන වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සැපයීම සඳහාත් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

## 28.1 සමීක්ෂණ හා වෙනත් දත්ත මූලාශ්‍ර මගින් දත්ත එකතු කිරීම

### (අ) ව්‍යාපාර මත පිළිබඳ සමීක්ෂණ

පවතින ආර්ථික තත්ත්වය සහ කෙටිකාලීන වෙළඳපොළ ප්‍රවණතා පිළිබඳ අධීක්ෂණය කිරීම සඳහා කාර්තුමය පදනම මත සිදුකරනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය (Business Outlook Survey - BOS) 2017 වසර තුළදී ද අඛණ්ඩව සිදුකරන ලදී. මෙමගින් ලැබෙන තොරතුරු ආර්ථිකයේ ඉදිරි ප්‍රවණතා පිළිබඳව පූර්ව දැනුම්දීමේ දර්ශකයක් ලෙස යොදා ගැනේ. ආර්ථිකයේ ප්‍රධාන ක්‍රියාකාරකම් (කෘෂිකාර්මික, කාර්මික හා සේවා) නියෝජනය කරන මහා පරිමාණ ව්‍යාපාර ඒකක, මෙම සමීක්ෂණයේ ඉලක්ක ගත සංගහනය වේ.

නිෂ්පාදන හා සේවා කටයුතුවලට අදාලව ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය (Purchasing Managers' Index- PMI) පිළිබඳ සමීක්ෂණය මාසිකව සිදු කරනු ලැබූ අතර එම තොරතුරු දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) පුරෝකථනය සඳහා පූර්ව දැනුම්දීමේ දර්ශකයක් ලෙස භාවිතා කෙරේ. තවද, එමගින් පර්යේෂකයන්, ආර්ථික විශ්ලේෂකයන්, ව්‍යාපාර ක්ෂේත්‍රයේ විශේෂඥයන් සහ ව්‍යාපාර පිළිබඳ තීරණ ගන්නන් සඳහා කර්මාන්ත තත්ත්වය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වන අතිරේක තොරතුරු ලබා දෙයි. නිෂ්පාදන කටයුතුවලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පිළිබඳ සමීක්ෂණය සඳහා නිෂ්පාදන කර්මාන්තවල ගැනුම් කළමණාකරුවන් ද සේවා කටයුතුවලට අදාළ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පිළිබඳ සමීක්ෂණය සඳහා එම ආයතනවල ව්‍යාපාර කටයුතු පිළිබඳව මනා දැනුමක් සහිත යෝග්‍ය නිලධාරීන් ද ඉලක්කගත සංගහනය වේ. ප්‍රධාන වශයෙන් බස්නාහිර පළාත කේන්ද්‍ර කරගනිමින් පවත්වාගෙන යන නිෂ්පාදන හා සේවා ආයතන 100 ක් බැගින් වූ නියැදි ඉලක්ක කරගනිමින් සෑම මසකම අවසාන සතිය තුළදී මෙම සමීක්ෂණය සිදු කරන ලදී.

විවිධ වූ විචල්‍යයන් ග්‍රහණය හරහා ඉදිකිරීම් ක්ෂේත්‍රය පිළිබඳව පූර්ව අවබෝධයක් ලබා ගැනීම අරමුණු කරගනිමින් 2017 වසරේදී ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය පිළිබඳ සමීක්ෂණය ඉදිකිරීම් ක්ෂේත්‍රය ද ආවරණය වන පරිදි පුළුල් කරන ලදී. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (Construction Industry Development Authority-CIDA) හි ලියාපදිංචි කර ඇති ඉදිකිරීම් සමාගම් ලැයිස්තුව යොදා ගනිමින් නියැදිය තෝරා ගන්නා ලදී. ඉදිකිරීම් කර්මාන්තයෙහි වර්ධනය පිළිබඳ පුරෝකථන වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් දර්ශකයක් සකස් කිරීම සඳහා මාසිකව මෙම සමීක්ෂණය 2017 ජුනි මස සිට සිදු කරන ලදී.

ණය වෙළඳපොළේ ඉල්ලුම සහ සැපයුම පිළිබඳ ප්‍රවණතා අධ්‍යයනය කිරීමේ අරමුණින් ණය තත්ත්වය පිළිබඳ සමීක්ෂණය 2017 වසර තුලදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ණය ඉල්ලුම් පාර්ශවයේ ප්‍රවණතා හඳුනාගැනීමට ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයකින් ද, ණය සැපයුම් පාර්ශවයේ ප්‍රවණතා හඳුනාගැනීමට ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයකින් ද මෙය සමන්විත වේ. බස්නාහිර පළාත තුළ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවලින් ආවරණය වන පළාත් තුළ ක්‍රියාත්මකව පවතින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක, ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයේ ඉලක්කගත සංගහනය වේ. ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු ආවරණය කරනු ලබයි. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල අර්ධ වාර්ෂික පදනමින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා කළමණාකාරීත්වය වෙත වාර්තා කරන ලදී.

### (ආ) උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය

2006 වසරේ හඳුන්වාදුන් උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් මාසිකව පවත්වනු ලබයි. වර්තමානයේ දී, ආයතනික අංශය, ගෘහස්ථ අංශය සහ අධ්‍යයන අංශය යන ප්‍රධාන කාණ්ඩ තුනක් මෙම සමීක්ෂණයට ඇතුලත් වන අතර අධ්‍යයන අංශය පසුගිය වසර අගභාගයේ සිට ඇතුලත් කරගන්නා ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේ දී, විශේෂයෙන්ම ආයතනික අංශ තුළ නියැදි යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය අවසන් කරන ලදී. ප්‍රතිචාර දක්වන්නන් වර්තමාන උද්ධමන තත්ත්වය මෙන්ම ඉදිරි මාස 12ක කාලය තුළ දී අපේක්ෂිත උද්ධමනය පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සපයනු ලබයි. සමීක්ෂණයේ ප්‍රතිඵල, ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා මාසිකව කළමණාකාරීත්වයට වාර්තා කරන ලදී.

### (ඇ) ශ්‍රම බලකායේ තොරතුරු හා රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය

සමස්ත ශ්‍රම වෙළඳපොළ දත්ත විශ්ලේෂණය සම්බන්ධයෙන් ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා වෙනත් දත්ත සපයන්නන්ගෙන් ලබා ගත් තොරතුරු රටෙහි සේවා නියුක්තිය, සේවා වියුක්තිය, විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා, ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ සහ ශ්‍රම ඵලදායීතාව යන කාණ්ඩ යටතේ විශ්ලේෂණය කරන ලදී. එසේම ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම සඳහා ජාතික සහ අන්තර්ජාතික ආයතන සමග සහයෝගීතාවයෙන් දත්ත හුවමාරු කරගැනීමේ ක්‍රමවේදයක් ද ක්‍රියාත්මක කරන ලදී.

රටෙහි රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තියෙහි ප්‍රවණතා නිර්ණය කිරීම සඳහා රාජ්‍ය අංශයේ සියලුම ආයතන ආවරණය වන පරිදි රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය අර්ධ

වාර්ෂිකව පවත්වන ලදී. මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ද මීට සමාන සමීක්ෂණයක් සිදු කරන අතර, කලින් තීරණය කරන ලද කාලපරිච්ඡේදයන් සඳහා 2018 වසරේ සිට දත්ත සැපයීමට එම දෙපාර්තමේන්තුව එකඟතාවය පළකරන ලදී. සමීක්ෂණ තුළින් රැස් කරගත් දත්ත මහජනතාවගේ තොරතුරු උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ප්‍රකාශන තුළින් ඉදිරිපත් කරන ලදී.

**(ඇ) පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා කටයුතු පිළිබඳ සමීක්ෂණය**

දළ දේශීය නිෂ්පාදිතයේ පුරෝකථන වැඩි දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා කටයුතුවල ප්‍රවණතාව ග්‍රහණය කරගැනීමේ අරමුණින් නව දර්ශකයක් හඳුන්වාදීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් මෙම සමීක්ෂණය ආරම්භ කරන ලදී. මෙහිදී පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා කටයුතු නියෝජනය සඳහා සුදුසු නියැදියක් හඳුනා ගැනීමේ අරමුණින් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් පළමුව පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කවුන්සිලය යටතේ ලියාපදිංචි කර ඇති රෝහල් ඉලක්ක කර ගත් සංගණනයක් මගින් පෞද්ගලික රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවලින් ප්‍රතිකාර ලබා ගත් රෝගීන් සංඛ්‍යාව පිළිබඳ දත්ත රැස් කරන ලදී. සංගණනයේ ප්‍රතිඵල මත පදනම්ව 2017 වසරේ දෙවන කාර්තුවේ සිට මාසිකව ප්‍රතිකාර ලබා ගන්නා ලද බාහිර රෝගීන් ගණන හා නේවාසික රෝගීන් ගණන පිළිබඳ තොරතුරු කාර්තුමය වශයෙන් එක් රැස් කිරීමට මෙම නියැදි සමීක්ෂණය සිදු කරන ලදී. මෙම සමීක්ෂණය පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවාවන්හි එකතුකළ අගයෙහි වර්ධනය පුරෝකථන කිරීම සඳහා ප්‍රමාණ දර්ශකයක් ලෙස එම සේවාවන්හි ප්‍රවණතා ග්‍රහණය කරගනු ලබයි.

**(ඉ) සුපිරි වෙළෙඳසැල්හි සිල්ලර වෙළෙඳාම් කටයුතු පිළිබඳ සමීක්ෂණය**

රටෙහි වර්තමාන සිල්ලර වෙළෙඳ ක්‍රියාකාරකම්වල අනාගත ප්‍රවණතාවයන් හඳුනාගැනීම සඳහා රට තුළ පවතින ප්‍රධාන සුපිරි වෙළඳ සැල් ජාලය ඉලක්ක කරගනිමින් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේ දී මෙම සමීක්ෂණය ආරම්භ කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන දර්ශක පදනම් කරගත් ද.දේ.නි පුරෝකථනය කිරීම සඳහා සුපිරි වෙළඳ සැල්හි සිල්ලර වෙළඳාම් කටයුතුවල ප්‍රවණතා පිළිබිඹු කරන ප්‍රමාණ දර්ශකයක් සම්පාදනය කිරීම මෙම සමීක්ෂණයෙහි අරමුණ වේ. තවද, මෙය ආර්ථිකයේ පාරිභෝගික වියදම් රටා පිළිබඳ විශ්ලේෂණය කිරීම සඳහා ආසන්න ආදේශකයක් ලෙස යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

**(ඊ) සහාධිපත්‍ය වෙළෙඳපොළ සමීක්ෂණය**

වෙළෙඳ ගැන්වීම්වල පළවන සහාධිපත්‍ය දේපළ විකුණුම් මිල ගණන් එක් රැස් කිරීම, ඉදිරියේ දී ඉදිකිරීමට නියමිත නිවාස ඒකක ප්‍රමාණය පිළිබඳ අදහසක් ලබා ගැනීම සහ සාදා නිමකල හා දැනට ඉදිකෙරෙමින් පවතින ව්‍යාපෘතිවල විකුණුම් මට්ටම් ගැන තොරතුරු විමසා බැලීම සඳහා 2017 ජනවාරි මස සිට වෙබ් අඩවි සහ දුරකථන පදනම් කරගත් සමීක්ෂණයක් මාසිකව සිදුකරන ලදී. කෙසේ වුවද, ගණුදෙනු සිදු වූ නියම මිල ගණන් ලබා ගැනීමටත් මිල මට්ටම් උච්චාවචනයන්ට අදාල හේතු හඳුනා ගැනීමටත් මේ හරහා නොහැකි බැවින්, සහාධිපත්‍ය වෙළඳපොළෙහි ගොඩනැගිලි ඉදිකරන්නන් ඉලක්ක කරමින් ප්‍රශ්නාවලි පදනම් කරගත් සමීක්ෂණයක් කාර්තුමය වශයෙන් දියත් කිරීමට සංඛ්‍යාන දෙපාර්තමේන්තුව තීරණය කරන ලදී. ඒ අනුව, සැබෑ මිල ගණන්, ඉල්ලුම, මිල වෙනස් වීම් සඳහා වන හේතු, දැනට පවතින හා ඉදිරියේදී ඉදිකිරීමට බලාපොරොත්තු වන නිවාස ඒකක ප්‍රමාණය, දැනට වෙන් කරවාගෙන ඇති නිවාස ඒකක ප්‍රමාණය, නිවාස ගැනුම්කරුවන්ගේ තොරතුරු සහ වෙළඳපොළ පිළිබඳ ගොඩනැගිලි ඉදිකරන්නන්ගේ ඉදිරි දැක්ම යනාදී තොරතුරු එක්රැස් කිරීම සඳහා සමීක්ෂණයක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට වසර අග භාගයේ දී ක්‍රියා කරන ලදී. ඒ අනුව, 2017 සැප්තැම්බර් මාසයේ දී මූලික සමීක්ෂණයක් දියත් කළ අතර, එයට සහභාගී වූවන්ගෙන් ලැබුණු ප්‍රතිචාරද සැලකිල්ලට ගනිමින් 2018 වසරේ සිට කාර්තුමය වශයෙන් මෙම සමීක්ෂණය සිදු කිරීමට සංඛ්‍යාන දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. සහාධිපත්‍ය අංශයේ සිදුවන ප්‍රවණතා නිරීක්ෂණය කිරීම සඳහා වෙළඳපොළ ක්‍රියාකාරීන් සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම ද මෙම සමීක්ෂණය තුළින් අපේක්ෂා කෙරේ.

**(උ) දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ**

1978 වසරේ දී ආරම්භ කරන ලද දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ 2017 වසරේදීත් අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර ඒ හරහා පාරිභෝගික භාණ්ඩවල සිල්ලර සහ නිෂ්පාදිත මිල ගණන්, අසංවිධිත පුද්ගලික අංශයේ දෛනික වැටුප් සහ කෘෂිකාර්මික හා මත්ස්‍ය නිෂ්පාදනයන්හි අපේක්ෂිත නිෂ්පාදන මට්ටම් යන තොරතුරු සතිපතා, මාස්පතා හා කාර්තුමය වශයෙන් රැස්කරනු ලබයි. මෙම වැඩපිළිවෙළ යටතේ එක් රැස් කරනු ලබන දත්ත, මිල හා වැටුප් වල සෘතුමය විචලන සහ ප්‍රාදේශීය වෙනස්කම් විශ්ලේෂණය කිරීම; මිල දර්ශක, පළාත් දළ දේශීය නිෂ්පාදිතය සහ ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සම්පාදනය කිරීම; මිල වෙනස්වීම් පුරෝකථනය කිරීම; ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්කම් මගින් මිල මත ඇති කරන බලපෑම ඇගයීම; ජාතික ආදායම හා වියදම ඇස්තමේන්තු කිරීම සහ මිල හා වැටුප් දත්ත පොදු ජනතාව වෙත බෙදා හැරීම සඳහා පුළුල් වශයෙන් යොදා ගනු ලබයි.

මෙම වැඩපිළිවෙළ යටතේ, මුළු දිවයිනම ආවරණය වන පරිදි විහිදී ගිය දත්ත එකතු කිරීමේ මධ්‍යස්ථානවල දත්ත සමීක්ෂකවරුන් ලෙස කටයුතු කරනු ලබන රජයේ පාසල් ගුරුවරුන් හරහා දත්ත එකතු කර ගැනීම සිදු කෙරේ. තවදුරටත් මෙම වැඩපිළිවෙළ යටතේ පිටකොටුව වෙළඳපොළ, මරඳගහමුල සහල් වෙළඳපොළ, දඹුල්ල සහ නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථාන සහ මීගමුව හා පෑලියගොඩ මාළු වෙළඳපොළ යන ස්ථාන වලින් තොග සහ සිල්ලර මිල ගණන් දෛනිකව හා සතිපතා රැස් කිරීම සඳහා ගුරුවරුන් නොවන දත්ත සමීක්ෂකවරුන්ගේ සේවය ද ලබා ගැනේ. තවද කළමණාකරන තොරතුරු පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව මගින් තෝරාගත් වෙළඳපොළවලින් ආහාර ද්‍රව්‍යය කිහිපයක තොග සහ සිල්ලර මිල ගණන් දෛනිකව

රැස් කිරීම සිදුකරන අතර දිනපතා පොදු මහජනතාවගේ දැන ගැනීම පිණිස එම තොරතුරු අන්තර්ජාලය හරහා ප්‍රකාශයට පත් කිරීම ද සිදු කෙරේ.

දත්ත එකතු කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා ඉතා ඉහළ ගුණාත්මක භාවයකින් යුත් කාලානුරූපී දත්ත පද්ධතියක් සඳහා වූ දත්ත රැස් කිරීම, සම්ප්‍රේෂණය, ඒකාබද්ධ කිරීම හා බෙදාහැරීම අරමුණු කරගනිමින්, දැනට පවත්නා දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ නවීකරණය කිරීම සඳහා වූ මූලික පියවර 2017 වසරේ දී ගන්නා ලදී. ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි විචලන පුරෝකථනය කිරීමට අවශ්‍යවන සිල්ලර මිල ගණන් නියමිත වේලාවට එක් රැස් කර ගැනීම පවත්නා වැඩපිළිවෙළ නවීකරණය කිරීමේ මූලික අරමුණ විය. එසේම, මෙම නවීකරණ වැඩපිළිවෙළ යටතේ ඉලෙක්ට්‍රොනික දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ හා සම්බන්ධ වූ නව දත්ත සමීක්ෂකවරුන් සඳහා වූ පුහුණු සම්මන්ත්‍රණ, 2017 සිව්වන කාර්තුව තුළදී සිදු කරන ලදී. මෙම පුහුණු සම්මන්ත්‍රණ තුළදී, දත්ත එකතු කිරීමේ සිට වාර්තා කිරීම දක්වා වූ සජීවී අත්දැකීමක් ද සමඟ සියලුම දත්ත සමීක්ෂකවරුන්ට දත්ත එකතු කිරීමේ යෙදුම ( App ) සහිත ටැබ්ලට් පරිගණක හඳුන්වා දෙන ලදී. ඉලෙක්ට්‍රොනික දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ 2018 ජනවාරි පළමුවන දින සිට නිල වශයෙන් ආරම්භ කරන ලදී.

## 28.2 දර්ශක සම්පාදනය

### (අ) ව්‍යාපාර මතය පිළිබඳ දර්ශක

ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි ප්‍රතිඵල පදනම් කොට ගෙන, ව්‍යාපාර තත්ත්වය, ලාභදායීත්වය, පුහුණු ශ්‍රම සුලභතාවය, විකුණුම්, ඉල්ලුම් සහ ධාරිතා උපයෝජනය යන ව්‍යාපාර මතය පිළිබඳ වූ දර්ශක ගණනය කරන ලදී. අදාල සමීක්ෂණ ප්‍රතිඵල මුදල් ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ප්‍රතිපත්ති පිළියෙල කිරීමේ අරමුණ සඳහා සවිස්තර වාර්තාවක් කළමණාකාරීත්වයට ඉදිරිපත් කරන ලදී. තවදුරටත්, මහජනතාවගේ දැනගැනීම පිණිස තෝරාගත් දර්ශක කිහිපයක ප්‍රතිඵල කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ පළ කරන ලදී.

නිෂ්පාදන කටයුතුවලට අදාල ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය සඳහා උපදර්ශක ලෙස නව ඇණවුම්, නිෂ්පාදිතය, සේවා නියුක්තිය, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගත වන කාලය සහ ගැනුම් තොග අයත් වන අතර සේවා කටයුතුවලට අදාල ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය සඳහා උපදර්ශක ලෙස නව ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය, නිම කිරීමට නියමිත කාර්යයන් සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් සම්බන්ධ ඉදිරි අපේක්ෂා අයත් වේ. මෙමඟින් පෙර මාසයට අනුරූපව මාසික ප්‍රවණතා නිරූපණය වන දර්ශක ගණනය කළ අතර, අදාළ ප්‍රතිඵල ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක කරගැනීම සඳහා ඉහළ කළමණාකාරීත්වයට සහ මුදල් ප්‍රතිපත්ති කමිටුවට වාර්තා කරන ලදී. තවද, මහජනතාවගේ දැනුම්වත් වීම පිණිස පුවත්පත් නිවේදන ද නිකුත් කරන ලදී.

### (ආ) දේපල මිල දර්ශක

තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද කොළඹ, දෙහිවල, හෝමාගම, කඩුවෙල සහ කැස්බෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් උප කොට්ඨාශ 51 ක තක්සේරු දත්ත, උපයෝගී කරගනිමින් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් නොකඩවා අර්ධ වාර්ෂිකව සිදු කරනු ලබන ඉඩම් මිල දර්ශකය 2017 වසරේදී ද, ගණනය කරන ලදී. මෙහිදී නේවාසික, වාණිජ සහ කාර්මික යන අංශ ආවරණය කරමින් උපදර්ශක තුනක් සම්පාදනය කරනු ලබන අතර එම උපදර්ශක තුනෙහි සරල සාමාන්‍යය මගින් සමස්ත ඉඩම් මිල දර්ශකය ගණනය කරනු ලබයි. මීට අමතරව, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් නිශ්චල දේපල මිල දර්ශකවල ආවරණය වැඩිදියුණු කිරීම සඳහා දැනට පවත්නා දර්ශක භූගෝලීය සහ ක්‍රමවේදීය වශයෙන් වැඩිදියුණු කිරීමට මූලාරම්භ කිහිපයක් ගෙන ඇත. තවද, පළමු වරට 2017 වසරේදී ඉඩම් මිල දර්ශකය පිළිබඳ වාර්තාව මහජනතාවගේ දැනුම්වත් වීම සඳහා ප්‍රකාශයට පත් කරන ලදී.

වෙබ් අඩවි පදනම් කරගත් සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණයක් මගින් ලබාගත් විකුණුම් තොරතුරු යොදා ගනිමින් නව දර්ශකයක් සම්පාදනය කිරීමට අවශ්‍ය මූලික පියවර දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබිණි. කළමණාකාරීත්වයට තොරතුරු ලබා දීම සඳහා කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි මහජනතාව වෙත නිකුත්කර ඇති තොරතුරු යොදා ගනිමින් සහාධිපත්‍ය දේපල වෙළඳපොළ තුළ මිල හැසිරීම නිරීක්ෂණය කිරීමට 2017 ජනවාරි මස සිට මෙම දර්ශකය මාසිකව ගණනය කරනු ලබයි. මෑතකදී හඳුන්වා දෙනු ලැබූ ප්‍රශ්නාවලි පදනම් කරගත් සහාධිපත්‍යය වෙළඳපොළ සමීක්ෂණය තුළින් ලබාගත් තොරතුරු දැනට පවතින දර්ශකයේ හැසිරීම පැහැදිලි කිරීමට සහ සැබෑ ගනුදෙනුවල මිල මත පදනම්ව නව දර්ශකයක් සම්පාදනය කිරීමට ඉඩ සලසනු ඇත.

### (ඇ) වැටුප් දර්ශක

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ආර්ථිකයේ වැටුප් සහ වේතනවල විචලන මැනීම සඳහා වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කරනු ලබයි. මේ සඳහා රාජ්‍ය, විධිමත් පෞද්ගලික සහ අවිධිමත් පෞද්ගලික යන අංශවල වැටුප් විචලන වෙන් වෙන් වශයෙන් විශ්ලේෂණය කරනු ලැබේ. රාජ්‍ය අංශය සඳහා වන නාමික සහ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛන මත පදනම්ව ගණනය කරනු ලබයි. කම්කරු දෙපාර්තමේන්තුව විසින් ලබාදෙනු ලබන පඩි පාලක සභාවල සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක මත පදනම්ව විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කරනු ලැබේ. දෙපාර්තමේන්තුව විසින් දැනට පවත්නා දර්ශකවල අඩුපාඩු කිහිපයක් මඟහරවා ගැනීම සඳහා විධිමත් පෞද්ගලික අංශයේ සේවකයින්ගේ වැටුප් ප්‍රවණතා නිරූපණය වන අයුරින් නව දර්ශකයක් ගණනය කිරීම 2017 වසරේදී ආරම්භ කරන ලදී. දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ මගින් රැස්කරනු ලබන දත්ත පදනම් කරගෙන සකසනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශක මගින්, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් විචලන විශ්ලේෂණය කරනු ලැබේ.

## 28.3 ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය පුරෝකථනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ආකෘති සහ ආකෘති නොවන ක්‍රමවේද භාවිතා කරමින් කෙටිකාලීන පාරිභෝගික මිල උද්ධමනය සහ ආර්ථික වර්ධනය පුරෝකථනය කරයි. මෙම පුරෝකථන මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීම්, පූර්ව මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් ප්‍රතිපත්ති කමිටුව තුළදී විශ්ලේෂණයට සහ සාකච්ඡාවට බඳුන් කර මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට යොදා ගැනීම සඳහා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිණි.

කෙටිකාලීන පුරෝකථන සඳහා මූලික වශයෙන් මෑත කාලීන මිල ප්‍රවණතා, ආර්ථිකමිතික ක්‍රමවේද සහ වෙළඳපොළ ප්‍රවණතා ආශ්‍රිත මිල ගණන්වල අපේක්ෂිත විචලන පදනම් කර ගන්නා ලදී. උද්ධමන පුරෝකථන ආකෘති වැඩිදියුණු කිරීම සඳහා උද්ධමනය කෙරෙහි සැපයුම් සහ ඉල්ලුම් යන දෙපාර්ශවයෙන්ම උද්ධමනයට බලපානු ලබන නව විචල්‍ය පිළිබඳ දෙපාර්තමේන්තුව නිරන්තර අධ්‍යයනයක යෙදෙමින් සිටී. තවදුරටත්, දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සමීක්ෂණවල ප්‍රතිඵල වලින් පිළිබිඹු වන යෙදවුම් සහ නිමැවුම්වල මිල ප්‍රවණතා මෙන්ම උද්ධමනය කෙරෙහි බලපාන විචල්‍යවල ඇතිවී තිබෙන සහ ඇතිවීමට නියමිත වෙනස්කම් අනුව පාරිභෝගික මිල ගණන්වල හැසිරීම පදනම් කරගනිමින් ද උද්ධමන පුරෝකථන නිරන්තරයෙන්ම යාවත්කාලීන කරනු ලැබිණි.

ආර්ථික දර්ශක හා ආකෘති පාදක ක්‍රමවේද උපයෝගී කරගනිමින් ආර්ථිකයේ එක් එක් උප ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රාථමික හා ද්විතීයික දත්ත භාවිතා කොට ආර්ථික වර්ධනය කාර්තුමය වශයෙන් පුරෝකථනය කරන ලදී. ආර්ථික දර්ශක පදනම් කරගත් පුරෝකථන සඳහා ආර්ථිකයේ උප ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රමුඛ ආර්ථික දර්ශක, සමීක්ෂණ තුළින් ලබාගත් තොරතුරු සහ අනෙකුත් තොරතුරු ප්‍රවීණයන්ගේ පූර්ව විනිශ්චයන් සමඟ සංයුක්ත කරන ලදී. නිරවද්‍යතාව වැඩි දියුණු කිරීමේ අරමුණ සහිතව ආකෘති මත පදනම් වූ කෙටිකාලීන පුරෝකථන ශක්තිමත් කිරීම සඳහා 2017 වසර තුළදී ගතික සාධක ආකෘතිය (Dynamic Factor Model) හඳුන්වා දෙන ලදී.

තවද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිය දෙපාර්තමේන්තුව තුළ සිදු කරනු ලබන පුරෝකථන ක්‍රියාවලියට අමතරව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය ඇතිව ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථන හා ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය (Forecasting and Policy Analysis System - FPAS) සඳහා කෙටිකාලීන උද්ධමන සහ ද.දේ.නි. පුරෝකථන; අදාළ විශ්ලේෂණ සහ අනෙකුත් තොරතුරු ලබා දෙමින් ආයක විය.

## 28.4 ප්‍රාදේශීය සංඛ්‍යාන ගණනය කිරීම

### (අ) ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය

රටෙහි සහ එහි එක් එක් පළාත්වල සෞභාග්‍ය තත්ත්වය මැන බැලීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේදී ද ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සම්පාදනය කරන ලදී. මෙය රටෙහි සහ පළාත්වල ආර්ථික සහ සමාජ සංවර්ධනය පිළිබිඹු කරන සංයුක්ත දර්ශකයක් වේ. විචල්‍ය 43 ක් භාවිතයෙන් මනිනු ලබන ආර්ථික සහ ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහ පැවැත්ම සහ සමාජ ආර්ථික යටිතල පහසුකම් යන උපදර්ශක තුනකින් මෙම දර්ශකය සමන්විත වේ. රටෙහි සමස්ත සෞභාග්‍ය මට්ටම නිරූපණය කරන මෙම දර්ශකයෙහි නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීමේ අරමුණ සහිතව යොදා ගන්නා විචල්‍ය සහ ක්‍රමවේදය පිළිබඳව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව නිරන්තර විමසිල්ලෙන් පසු වෙයි. ඒ අනුව දර්ශකයෙහි ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා 2017 වසර තුළදී සමාජ ආර්ථික යටිතල පහසුකම් කාණ්ඩය සඳහා පළාත් සභා සාමාජිකයන් අතර කාන්තා සහභාගීත්වය මැන බැලීමේ නව විචල්‍යයක් ඇතුළත් කරන ලදී.

### (ආ) පළාත් දළ දේශීය නිෂ්පාදනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ඇස්තමේන්තු කරන ලද ජාතික ගිණුම්, සුදුසු දර්ශක යොදා ගනිමින් පළාත් අනුව බෙදා වෙන් කර නාමික පළාත් දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. 2016 වසර සඳහා වන දත්ත සහ 2015 සඳහා වන නැවත ගණනය කරන ලද දත්ත 2017 ඔක්තෝබර් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු අගයන්හි විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා පළාත් මට්ටමින් ජාතික දත්ත වෙන් කල හැකි යෝග්‍ය දර්ශක පිළිබඳ නිරන්තර අධ්‍යයනයක යෙදෙමින් සිටියි. තවද, යාවත්කාලීන දත්ත ක්‍රමිකව අන්තර්ග්‍රහණය කරගැනීමේ අරමුණෙන් සංයුක්ත දර්ශකද අවශ්‍ය අවස්ථාවන්හිදී භාවිතා කරන ලදී. ඒ අනුව, ඉදිකිරීම්, තොග සහ සිල්ලර වෙළඳාම්, මූල්‍ය සේවා සහ රක්ෂණ කටයුතු යන දළ දේශිය නිෂ්පාදිතයේ අයිතම සඳහා වැඩිදියුණු කිරීම් හඳුන්වා දෙන ලදී.

## 28.5 සංඛ්‍යාන තොරතුරු බෙදා හැරීම

2017 වසර තුළදී සංඛ්‍යාන තොරතුරු බෙදා හැරීමේ ක්‍රියාවලිය තුළ නව පියවරක් තබමින්, බාහිර දත්ත පරිශීලකයන්ගේ ප්‍රයෝජනය උදෙසා ''Data Library''නමින් දත්ත සංචිතයක් නිකුත් කිරීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී. මෙය අභ්‍යන්තර දත්ත අවශ්‍යතාවයන් සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහාය ඇතිව ස්ථාපිත ඉලෙක්ට්‍රොනික දත්ත සංචිතයේ වැඩිදියුණු කරන ලද සංස්කරණයකි. මෙම දත්ත ගබඩාව අභ්‍යන්තර දෙපාර්තමේන්තු නවයක සහ බාහිර ආයතන කිහිපයක මූර්ත, මුදල්, රාජ්‍ය මූල්‍ය, විදේශීය සහ මූල්‍ය යන අංශ ආවරණය වන කාලශ්‍රේණි දත්ත වලින් සමන්විත වේ.

තවද, මෙම වසර තුළදී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව ''ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාන 2017- XXXIX වෙළුම'' අගෝස්තු මාසයේදී ද ''ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2017-XL වෙළුම'' සැප්තැම්බර් මාසයේදී ද භාෂා ත්‍රිත්වයෙන්ම, මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍යවලින් ප්‍රකාශයට පත්කරන ලදී. මීට අමතරව දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේදී ද තෝරා ගත් පාරිභෝගික අයිතම සඳහා

සකස් කරන ලද දෛනික මිල වාර්තා, සතිපතා සහ මාස්පතා ආර්ථික දර්ශක ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය හරහා මහජනතාවට පරිශීලනය කිරීමේ අවස්ථාව සලසා දී ඇත. තවද මහ බැංකු වාර්තාව සහ මෑත කාලීන ආර්ථික ප්‍රවණතා ප්‍රකාශනය සඳහා පරිච්ඡේද දෙක බැගින්ද ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික විවරණිකාව සඳහා දත්ත ලබා දීමෙන්ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව දායකත්වය දක්වනු ලැබීය. මීට අමතරව පුවත්පත් නිවේදන හරහා මහජනතාවට තොරතුරු බෙදා හරිනු ලැබූ අතර වසර පුරාවටම දැනුම බෙදා දීමේ ක්‍රියාකාරකම් පවත්වන ලදී.

### 28.6 ගෝලීය ශ්‍රේණිගත කිරීම්වල ශ්‍රී ලංකාවේ ස්ථානය පිළිබඳ අවධානය යොමු කිරීම

**(අ) ''ව්‍යාපාර පවත්වාගෙන යැමේ පහසුව'' පිළිබඳ වන ශ්‍රේණිගත කිරීම**

ශ්‍රී ලංකාවේ ''ව්‍යාපාර පවත්වාගෙන යැමේ පහසුව'' පිළිබඳ ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීමේ ප්‍රධාන වගකීම දරනු ලබන නව කාර්යය කමිටුවක් 2016 වසරේ දී සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශය යටතේ පිහිටුවන ලදී. මෙම කමිටුව මගින් ආයෝජන පරිසරය වැඩිදියුණු කිරීමේ සමස්ත අරමුණට අදාළව ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා ලෝක බැංකුවෙහි සහාය ද ඇතිව ප්‍රතිපත්ති පෙරදැක්මක් ප්‍රකාශයට පත් කරන ලද අතර යෝජිත ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ සොයා බැලීමට අදාළ ආයතන සමඟ මෙම කමිටුව සමීපව කටයුතු කරනු ලබයි. රජය විසින් ක්‍රියාත්මක කරන ලද මෙම මූලාරම්භයන්ට සමගාමීව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව සිය සහයෝගය අඛණ්ඩව ලබා දුන් අතර ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍ර සැකසීම සඳහා කාර්යය කමිටුව විසින් සංවිධානය කරන ලද විවිධ රැස්වීම්/වැඩමුළු වලට සහභාගී වීම, අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා ප්‍රගතිය සම්බන්ධ රැස්වීම් සඳහා සහභාගී වීම, ශ්‍රේණිගත කිරීම් තුළ රටෙහි ස්ථානය වැඩි දියුණු කර ගැනීම හා සම්බන්ධ වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා ශ්‍රී ලාංකික සහභාගීත්වයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ මෙම ශ්‍රේණිගත කිරීම සඳහා සලකා බැලෙන විචල්‍ය පිළිබඳ තොරතුරු කාලානුරූපීව නියමිත පරිදි අදාළ බලධාරීන් වෙත ලබා දීම යනාදිය 2017 වසර තුළදී සිදු කරන ලදී.

**(ආ) අනෙකුත් ගෝලීය ශ්‍රේණිගත කිරීම්**

ගෝලීය දර්ශක වන ලෝකව්‍යාප්ත පාලන දර්ශක (Worldwide Governance Indicators), ගෝලීය තරඟකාරීත්ව දර්ශකය (Global Competitiveness Index), ආර්ථික ස්වාධීනතා දර්ශකය (Index of Economic Freedom), මානව සංවර්ධන දර්ශකය (Human Development Index), ලෝක ආර්ථික ස්වාධීන දර්ශකය ( Economic Freedom of the World Index), දූෂණ පිළිබඳ සංජානන දර්ශකය (Corruption Perceptions Index), වෙළඳ කටයුතු ශක්තිමත් කිරීමේ දර්ශකය (Enabling Trade Index) සහ ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (Organization for Economic Co-operation and Development- OECD) මගින් සිදු කරන හවුල්කාර රටවල අවදානම් වර්ගීකරණය, පිළිබඳ ඇගයීම් අඛණ්ඩව අධීක්ෂණය කරමින් මෙම ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ලංකාවට ලැබී ඇති ස්ථානය සහ ශ්‍රේණිගත කිරීම්වල වර්ධනයක් ඇති කර ගැනීම සඳහා යොදා ගත හැකි උපාය මාර්ග පිළිබඳ වාර්තා කළමණාකාරීත්වයට සහ අනෙකුත් ඉහළ අධිකාරීන් වෙත අවශ්‍ය පරිදි දැනුම් දෙන ලදී. එසේම ඉහත සඳහන් දර්ශක සම්පාදනය කරනු ලබන ආයතන වෙත ශ්‍රී ලංකාව පිළිබඳ සාර්ව ආර්ථික තොරතුරු සතිපතා මෙන්ම මාසිකව සැපයීමට ද කටයුතු කරන ලදී.

## 29. ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත (ක්ෂුද්‍රමූල්‍ය පනත) ප්‍රකාරව ක්ෂුද්‍රමූල්‍ය අංශය නියාමනය සහ අධීක්ෂණය යන වගකීම් සහිතව ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන අවම අවශ්‍යතා සපුරන ක්ෂුද්‍රමූල්‍ය සමාගම් වෙත බලපත්‍ර ලබා දීම, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් නියාමනය කිරීම, එම සමාගම් නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම සහ රාජ්‍ය නොවන ක්ෂුද්‍ර මූල්‍ය සංවිධාන නියාමනය කිරීම සඳහා රීති පැනවීම, ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා (රෙජිස්ට්‍රාර්වරයා) වෙත ප්‍රතිපත්ති, ප්‍රමිති සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ.

2017 අවසානය වන විට ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත් නවයක් ලැබුණු අතර, අයදුම්පත් අගය කිරීම සහ අයදුම් කළ සමාගම් වෙත ගොස් මූලික විමර්ශන කිරීම 2017 වසර තුළදී සිදු කරන ලදී.

තවද, 2017 පළමු කාර්තුව තුළ දී ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත රාජ්‍ය නොවන ක්ෂුද්‍රමූල්‍ය සංවිධානවල විචක්ෂණ අවශ්‍යතා හා සම්බන්ධ ප්‍රතිපත්ති, ප්‍රමිති සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සිදු කෙරිණි. රෙජිස්ට්‍රාර්වරයා විසින් එම ප්‍රතිපත්ති, ප්‍රමිති හා මාර්ගෝපදේශ ක්‍රියාවට නැංවීම රාජ්‍ය නොවන ක්ෂුද්‍රමූල්‍ය සංවිධාන නියාමනය කිරීමට අදාළ රීති සම්පාදනය කිරීම මගින් සිදු කළ යුතුය.

**(අ) දැනුම්වත් කිරීම් සහ ශක්‍යතා වැඩිදියුණු කිරීම**

2017 වර්ෂය තුළදී ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයින්ගේ සංගමය හා එක්ව දිවයිනම ආවරණය වන පරිදි මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් හතක් පවත්වන ලදී. මෙම වැඩසටහන්වල ප්‍රධාන අරමුණු වූයේ ක්ෂුද්‍රමූල්‍ය ගනුදෙනුකරුවන්ගේ දැනුම වර්ධනය කිරීම සහ ඔවුන්ගේ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමයි.

තවද, ක්ෂුද්‍රමූල්‍ය අංශය හා සම්බන්ධ ගැටලු හඳුනාගෙන ඒ සඳහා සුදුසු ප්‍රතිපත්ති නිර්දේශ කිරීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කිලිනොච්චිය, නුවරඑළිය සහ අනුරාධපුරය යන ප්‍රදේශවල ක්ෂේත්‍ර අධ්‍යයනයන් සිදු කරන ලදී.

# 30. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත හා 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත අනුව පිළිවෙළින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් නියාමනය හා අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි. මීට අමතරව, ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කිරීමේ කාර්යභාරයද බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කාර්යයන් යටතට බලපත්‍රලාභී සමාගම්වල ව්‍යවස්ථාපිත පරීක්ෂණ හා අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කිරීම ඇතුළත් වන අතර නියාමන කාර්යයන් යටතට විචක්ෂණ නියාමනයන් ක්‍රියාත්මක කිරීම හා නියාමන අනුමැතීන් ලබා දීම ඇතුළත් වේ. මෙම ප්‍රධාන කාර්යයන්ට අමතරව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනවසරයෙන් පවත්වාගෙන යනු ලබන මුදල් ව්‍යාපාර පිළිබඳ විමර්ශනය කිරීම, දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, මෙම අංශයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම, අධිකරණ කාර්යයන් සඳහා පහසුකම් සැපයීම සහ මහජන පැමිණිලි සඳහා මැදිහත් වීම වැනි වෙනත් විවිධ කාර්යයන්වලද නිරත වේ.

2017 අවසානය වන විට බලපත්‍රලාභී මුදල් සමාගම් 45 ක්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 6 ක් සහ ප්‍රාථමික අලෙවිකරුවන් 15 ක් දෙපාර්තමේන්තුවේ නියාමනය යටතේ පැවතිනි. මීට අමතරව කල්බදු මූල්‍යකරණ පනත යටතේ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්ද ඇතුළත්ව, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන 68 ක් සඳහා බලපත්‍ර නිකුත් කර ඇත. එම බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ නාමලේඛණය මෙම කොටස අවසානයේ දක්වා ඇත. 2017 වර්ෂය තුළදී නිකුත් කරන ලද විධානයන් හා රෙගුලාසි මෙම වාර්තාවේ තුන්වැනි කොටසෙහි දැක්වේ. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය තුළදී සිදු කරන ලද කාර්යයන් පහතින් සාරාංශගත කර ඇත.

## 30.1 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අධීක්ෂණය කිරීම

**(අ) ව්‍යවස්ථාපිත පරීක්ෂණ පැවැත්වීම (එතැන් පරීක්ෂණ)**

i) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2017 වර්ෂය සඳහා සැලසුම් කළ පරිදි බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 30 ක වාර්ෂික ව්‍යවස්ථාපිත පරීක්ෂණ සිදු කරන ලදී. අඩු කාර්යක්ෂමතාව, ආයතනික යහපාලනයේ ගැටලු, ණය අලාභ සඳහා ප්‍රමාණවත් නොවන වෙන් කිරීම්, අභ්‍යන්තර පාලනයේ දුර්වලතා, ඇතිවිය හැකි ණය අවදානම් සහ ව්‍යාපාර ආකෘතින් හරහා පැනනගින දිගුකාලීන ස්ථාවරත්වය සම්බන්ධ ගැටලු මෙකී පරීක්ෂණවල ප්‍රධාන සොයාගැනීම් විය.

ii) මෙම පරීක්ෂණවලදී හඳුනාගත් ගැටලු සම්බන්ධව මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියාකාරී සැලසුම් සහ නිර්දේශයන්, අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල අවධානය සඳහා දැනුම් දුන් අතර, අදාළ සමාගම් විසින් එකඟ වූ කාලරාමුව තුළ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම සඳහා පසු විපරම් කිරීමද සිදු කරන ලදී.

**(ආ) අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කිරීම**

පවතින ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් ව්‍යාපාර කටයුතුවලින් බැහැරව සිටින බලපත්‍රලාභී මුදල් සමාගම් දෙකක හැර අනෙක් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ඔවුන් විසින් ජාලගත දත්ත සම්ප්‍රේෂණ පද්ධතිය හරහා කාලාවර්තිතව ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තොරතුරු පදනම් කරගෙන අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. මූල්‍ය තත්ත්වය ඇගයීමේ ක්‍රියාවලිය දියුණු කිරීම හා පැනනැගිය හැකි ගැටලු පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම් කල්තියා හඳුනා ගැනීම අරමුණු කරගෙන නව සුපරීක්ෂණ රාමුවක් වර්ෂය තුළදී හඳුන්වා දෙන ලදී. වර්ෂය තුළදී අලුතින් නිකුත් කරන ලද ශාඛා විවෘත කිරීම, ස්ථානය වෙනස් කිරීම හා වසා දැමීම සම්බන්ධ විධානය හා සමගාමී වීම සඳහා ශාඛා ව්‍යාප්තිය සම්බන්ධ දත්ත සම්ප්‍රේෂණ වාර්තාව සංශෝධනය කළ අතර නව ගිණුම්කරණ ප්‍රමිතිවලට අදාළ මූල්‍ය තොරතුරු ග්‍රහණය කර ගැනීම සඳහා නව වාර්තාවක් හඳුන්වා දෙන ලදී. අඛණ්ඩ සුපරීක්ෂණය තවදුරටත් පහසු කරවීම සඳහා විගණන වාර්තා, කළමනාකරණ ලිපි, බාහිර ශ්‍රේණිගත කිරීම් සහ පුවත්පත් වාර්තා යොදා ගන්නා ලදී. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, පූර්ව අනතුරු කල්තියා හඳුනා ගැනීමේ පද්ධතිය හරහා අවදානම් ඇතිවිය හැකි අංශ හඳුනාගත් අතර, එම අවදානම් අවම කිරීම සඳහා පිළියම් නිර්දේශ කරන ලදී. මූල්‍ය ශක්තිමත්භාවය හා අවදානම් කළමනාකරණය මත පදනම්ව බලපත්‍රලාභී මුදල් සමාගම් පෙළගැස්වීම සඳහා අභ්‍යන්තර අධීක්ෂණ ශ්‍රේණිගත කිරීමේ පද්ධතියක්ද ක්‍රියාත්මක කරන ලදී. මෙම අංශයේ ඇතිවන නව වර්ධනයන් සම්බන්ධව ඉහළ කළමනාකාරිත්වය දැනුවත් කිරීම සඳහා අඛණ්ඩ පරීක්ෂණයේදී හඳුනා ගත් කරුණු සහ කාර්යසාධනය මුදල් මණ්ඩලය වෙත නිරන්තරයෙන් වාර්තා කරන ලදී.

**(ඇ) දුර්වල බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අර්බුද නිරාකරණය කිරීමේ ක්‍රියාමාර්ග**

2017 වර්ෂය තුළ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලික ඉලක්කය වූයේ පසුගිය වසර කිහිපය පුරා දිගුකාලීන ද්‍රවශීලතා අර්බුදයන්ට ලක් වී ඇති බුන්වත් සමාගම්වල ගැටලු නිරාකරණය කිරීමයි. විශ්වාසදායී ආයෝජන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවහොත් පීඩාවට පත් අක්‍රීය සමාගම්

තුනක් ඈවර කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් මූලික අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, එක් සමාගමක් වෙත නිකුත් කර තිබූ බලපත්‍රය අහෝසි කිරීමේ නිවේදනය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල අතර දැනට ඈවර කිරීමට අදාළ නීතිමය ගැටලු නිරාකරණය කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටී. තවත් සමාගමක් සඳහා යෝජිත ආයෝජකයන්ගෙන් ලද යෝජනා කිහිපය අතරින්, එක් ආයෝජකයෙකුගේ ප්‍රාග්ධනය යෙදවීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් මූලික අනුමැතිය ලබා දෙන ලදී. අනෙක් සමාගම සම්බන්ධයෙන්, එහි තැන්පත්කරුවන් විසින් ගොනු කර ඇති නඩු කටයුතු සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වැඩි වශයෙන් යොමු වන අතර සුදුසු ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා ආයෝජකයන් සමග අඛණ්ඩව සාකච්ඡා සිදු කෙරිණි. මීට අමතරව, සක්‍රීය දුර්වල සමාගම් තුනක් සම්බන්ධව ප්‍රාග්ධනය යෙදවීම සඳහා යථා තත්ත්ව පරීක්ෂණ සිදු කිරීමට හා එම සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමට සුදුසු ආයෝජකයන් සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය පියවරයන් ආරම්භ කර ඇත. තවද, සමාගම් දෙකක් සඳහා තැන්පතු හා ණයගැනීම් සීමා පනවා ඇති අතර මෙම සමාගම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල, ඉහළ කළමනාකාරිත්වය සහ බාහිර විගණකවරුන් සමග රැස්වීම් පවත්වන ලදී.

## 30.2 ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කිරීම

**(අ) ව්‍යවස්ථාපිත පරීක්ෂණ සහ අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කිරීම**

සියලුම ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කළ අතර, 2017 වර්ෂය තුළදී ප්‍රාථමික අලෙවිකරුවන් දෙදෙනෙකුගේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ අවසන් කරන ලදී. අධීක්ෂණ ක්‍රියාමාර්ගයක් ලෙස, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනයේ සහ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී ආයතනයේ ප්‍රාථමික අලෙවිකාර ඒකකයේ ව්‍යාපාර කටයුතු මාස 6 ක කාලයක් (පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනය 2017 ජූලි 06 සිට බලපැවැත්වෙන පරිදි සහ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී ආයතනයේ ප්‍රාථමික අලෙවිකාර ඒකකය 2017 අගෝස්තු 15 සිට බලපැවැත්වෙන පරිදි) සඳහා අත්හිටුවන ලදී. තවද 2017.07.24 දින සිට බලපැවැත්වෙන පරිදි එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සමාගමට රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික වෙන්දේසිය සඳහා සහභාගී වීම වළක්වා ඇත.

2018.01.01 සිට බලපැවැත්වෙන පරිදි බැංකුවල ප්‍රාථමික අලෙවිකාර ඒකකයන්හි අධීක්ෂණ, පරීක්ෂණ හා සුපරීක්ෂණ සහ කාර්යසාධනය කාලාවර්තිතව අගය කිරීමේ කාර්යයන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මාරු කිරීමට මුදල් මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදී. තවද, සියලුම ප්‍රාථමික අලෙවිකරුවන් වෙත (බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් හා බැංකුවල ප්‍රාථමික අලෙවිකාර ඒකක) රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ හා වෙළඳපොළ හැසිරීම දියුණු කිරීම සම්බන්ධයෙන් නියාමනයන් හා විධාන නිකුත් කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී වෙත තවදුරටත් අවසර ලබා දී ඇති අතර විචක්ෂණ අවශ්‍යතා සම්බන්ධව ප්‍රාථමික අලෙවිකරුවන් වෙත විධානයන් හා මාර්ගෝපදේශ නිකුත් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බලය පවරා ඇත.

**(ආ) එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සමාගමේ අර්බුද නිරාකරණය කිරීමේ ක්‍රියාමාර්ග**

එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සමාගමේ දුර්වල මූල්‍ය භාවිතයෙහි ප්‍රතිඵලයක් ලෙස ක්ෂණ ද්‍රවශීලතා තත්ත්වයක් ඇති වීම හේතුවෙන් 2016 වර්ෂය තුළදී පද්ධතිමය ගැටලුවක් ඉස්මතු විය. සුරක්ෂිත ප්‍රතිමිලදී ගැනුම් හා ස්ථිර පදනමක් මත වූ ආයෝජන පියවූ අතර මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය මගින් සුපරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සමාගමේ අර්බුද නිරාකරණය කිරීමේ යෝජිත ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර එම ක්‍රමවේදය සම්බන්ධයෙන් සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

## 30.3 විචක්ෂණ නියාමන නිකුත් කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමන අනුමැතීන්, විධානයන් සහ විචක්ෂණ අවශ්‍යතා නිකුත් කිරීම

(අ) විධානයන් සහ විචක්ෂණ අවශ්‍යතා නිකුත් කිරීම

i) **මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත**

2017 වර්ෂය සඳහා ජාතික අයවැය යෝජනා අනුව, බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී ඒවායේ වටිනාකම් මත ලබා දෙන ණය අනුපාත සම්බන්ධයෙන් නිකුත් කර තිබූ විධානය සංශෝධනය කරන ලදී. ඒ අනුව, වටිනාකම මත ණය අනුපාතයන්හි උපරිම සීමාවන් පහත පරිදි වේ.

| වාහන වර්ගය | වටිනාකම මත ණය අනුපාතය (%) |
|---|---|
| **ලියාපදිංචි නොකළ වාහන සහ පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා අඩු කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන** | |
| අ) වාණිජ වාහන (ලොරි සහ බර වාහන) | 90 |
| ආ) මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) සහ වෑන් රථ | 50 |
| ඇ) ත්‍රීරෝද රථ | 25 |
| ඈ) වෙනත් ඕනෑම වාහන | 70 |
| **පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන** | 70 |

සංචාරක සහ/හෝ ප්‍රවාහන කටයුතුවල නිරත ඕනෑම සමාගමකට ඒවායේ මූලික ව්‍යාපාර කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට වාහන සංචිත මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් සඳහා ඉහත සීමාවන් අදාළ නොවේ. එසේ වුවද, එලෙස මූල්‍යනය කරන ලද වාහන පළමු ලියාපදිංචි කිරීමේ දින සිට වසරක් ඇතුළත කිසිදු පුද්ගලයෙකුට හෝ ආයතනයකට පැවරීම සිදු කළ නොහැක.

ii) **අවම මූලික ප්‍රාග්ධනය සම්බන්ධ විධානය**

ප්‍රාග්ධන තත්ත්වය ශක්තිමත් කිරීම සහ අභ්‍යන්තර හා බාහිර කම්පනයන්ට සාර්ථකව මුහුණ දීමට ඇති හැකියාව වර්ධනය කිරීමේ අරමුණෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් පවත්වා ගත යුතු අවම මූලික ප්‍රාග්ධන මට්ටම අදියරෙන් අදියර වැඩි වන පරිදි වැඩි කරන ලදී. ඒ අනුව, අවම මූලික ප්‍රාග්ධනය රුපියල් මිලියන 400 සිට 2018.01.01 දින සිට රුපියල් බිලියන 1.0 දක්වාද, 2019.01.01 දින සිට රුපියල් බිලියන 1.5 දක්වාද, 2020.01.01 දින සිට රුපියල් බිලියන 2.0 දක්වා ද, 2021.01.01 දින සිට රුපියල් බිලියන 2.5 දක්වා ද වන ලෙස වැඩි කර ඇත.

iii) **ගංවතුරින් පීඩාවට පත් ගනුදෙනුකරුවන්ට ප්‍රදානය කර තිබූ ණය පහසුකම් සඳහා සහන සැලසීම**

ගංවතුර, අහිතකර කාලගුණික තත්ත්වයන් සහ ඒ හා සම්බන්ධිත ආපදා අවස්ථාවන්ගේ අහිතකර බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර හා සාමාන්‍ය මෙහෙයුම් කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා පහසුකම් සැලසීමේ ජාතික ප්‍රතිපත්තියක් ලෙස, පොදු යහපත සඳහා එවන් ණය ගනුදෙනුකරුවන් වෙත පහත දැක්වෙන සහනයන් ලබා දීමට බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට අවසර ලබා දෙන ලදී.

i) සියලුම සක්‍රීය ණය පහසුකම් වෙනුවෙන් මාස 3 කට නොවැඩි පමා සහනයක් ලබා දීම.

ii) ඉහත පමා සහනය සඳහා යටත් වන ණය ගනුදෙනුකරුවන්ගේ සහ ඉහත දැක්වෙන අහිතකර බලපෑම්වලට ලක් වූ අක්‍රීය ණය ගනුදෙනුකරුවන් නැවත සැලසුම් කරන ලද කොන්දේසි යටතේ තම ව්‍යාපාර කටයුතු යළි ආරම්භ කිරීමෙන්/ප්‍රතිව්‍යුහගත කිරීමෙන් ණය පියවීම සඳහා කැමැත්තක් දක්වන්නේ නම් හිඟ ණය වෙනුවෙන් අය කරනු ලබන දඩ පොලිය කපා හැරීම.

iv) **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය හා ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ රාමුව සම්බන්ධ යෝජිත විධානයන්**

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අවදානම් කළමනාකරණය කෙරෙහි දැඩිව අවධාරණය කරමින් අවදානම තක්සේරු කිරීමේ හැකියාවන් වර්ධනය දිරිමත් කිරීම අරමුණු කරගෙන බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා 2018 වර්ෂය තුළ දී නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුවක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුව සම්බන්ධයෙන් කෙටුම්පත් කරන ලද විධානය බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අදහස්/නිරීක්ෂණ ලබා ගැනීම සඳහා යොමු කර ඇති අතර යථා කාලයේදී එම විධානය නිකුත් කරනු ලැබේ. තවද, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අරමුණින් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අනුකූලතා රාමුවක් හඳුන්වා දීමට කටයුතු කර ඇත.

(ආ) **නියාමන අනුමැතීන් ලබා දීම**

i) අඛණ්ඩ සුපරීක්ෂණයේ කාර්යයක් ලෙස, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා සාංගමික ව්‍යවස්ථාවලීන් සංශෝධනය කිරීමට, පාලිත සමාගම් පිහිටුවීමට, ණය සාධන පත්‍ර නිකුත් කිරීමට, කොටස් ප්‍රාග්ධනය වැඩි කිරීමට, නව ආයෝජකයන් හරහා ප්‍රාග්ධනය ආයෝජනයට, ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සඳහා බාහිර සේවාවන් ලබා ගැනීමට, නව අධ්‍යක්ෂවරුන් සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන් පත් කිරීමට, ලියාපදිංචි ලිපිනයන් වෙනස් කිරීමට, ව්‍යාපාර ස්ථාන වෙනස් කිරීමට, ව්‍යාපාර හිමිකම මාරු කිරීමට සහ නව ශාඛාවන් 49 ක් විවෘත කිරීමට අනුමැතීන් ලබා දෙන ලදී.

ii) වර්ෂය තුළදී ඒකාබද්ධ වීමේ ගනුදෙනු දෙකක් අවසන් විය. ඒවා නම් රිචර්ඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම සමඟ විලච් ෆිනෑන්ස් පීඑල්සී සමාගම ඒකාබද්ධ වීම සහ සෙන්ට්‍රල් ෆිනෑන්ස් පීඑල්සී සමාගම සමඟ ඉසුරු ලීසිං කම්පැනි ලිමිටඩ් සමාගම ඒකාබද්ධ වීමයි.

## 30.4 අනවසර මුදල් ව්‍යාපාර පවත්වාගෙන යන පුද්ගලයන් පිළිබඳ විමර්ශනය

දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ තොරතුරු හා මහජන පැමිණිලි පදනම් කරගෙන අවසර නොමැතිව මුදල් ව්‍යාපාරවල නිරතවීම් පිළිබඳව පරීක්ෂාකාරීව කටයුතු කරන ලදී. 2017 වර්ෂය තුළදී අනවසර මුදල් ව්‍යාපාර ලෙස තීරණය කරන ලද එක් සමාගමකට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා නීතිපතිතුමන්ගෙන් උපදෙස් ලබා ගන්නා ලදී.

## 30.5 මහජනයා දැනුම්වත්කිරීම් සහ බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම

(අ) මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන්

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනවසර මූල්‍ය ආයතනවල සහ ආයෝජන ක්‍රමවල ආයෝජනය කිරීමේ ඇති අවදානම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් 8 ක්

## ඇමුණුම II-3

## බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නියාමනය වන මූල්‍ය ආයතන (2017 වර්ෂය අවසානයට)

### බලපත්‍රලාභී මුදල් සමාගම්

1. අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී
2. අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
3. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
4. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
5. ඒ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ්
6. එච්එන්බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
7. එල්බී ෆිනෑන්ස් පීඑල්සී
8. එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී
9. එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
10. ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
11. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී
12. ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී
13. කලම්බෝ ට්‍රස්ට් ෆිනෑන්ස් පීඑල්සී
14. කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්
15. කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
16. කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
17. ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ්
18. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී
19. ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්
20. ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
21. නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
22. පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී
23. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
24. ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී (පෙර සමිට් ෆිනෑන්ස් පීඑල්සී)
25. බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී
26. බ්‍රැක් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
27. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
28. මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
29. මල්ටි ෆිනෑන්ස් පීඑල්සී
30. මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ්
31. යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
32. රිච්ඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ්
33. වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
34. සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්
35. ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී
36. සිටි ෆිනෑන්ස් කෝපරේෂන් ලිමිටඩ්
37. සියපත ෆිනෑන්ස් පීඑල්සී
38. සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
39. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී
40. සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
41. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී
42. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී [අ]
43. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
44. සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්
45. සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද කළමනාකරණ නියෝජිතයෙකු විසින් කළමනාකරණය කෙරෙන අතර, ප්‍රතිව්‍යුහගත කෙරෙමින් පවතී. ඒ අතරතුර තැන්පතු රැස් කිරීම අත්හිටුවා ඇත.

### ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

**(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බෑන්ක් පීඑල්සී
2. එම්සීබී බෑන්ක් ලිමිටඩ්
3. කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
4. ඩීඑෆ්සීසී බෑන්ක් පීඑල්සී
5. නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී
6. නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී
7. පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී
8. යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
9. ලංකා බැංකුව
10. සම්පත් බෑන්ක් පීඑල්සී
11. සෙලාන් බෑන්ක් පීඑල්සී
12. හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී

**(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු**

1. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
2. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බෑන්ක් ලිමිටඩ්
3. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
4. ශ්‍රී ලංකා සේවින්ග්ස් බෑන්ක් ලිමිටඩ්
5. සණස ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී

**(ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

1. ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ්
2. එල්ඕඑල්සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
3. එස්එම්බී ලීසිං පීඑල්සී
4. කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ්
5. නිවෙස්ට් කැපිටල් ලිමිටඩ්
6. යුනිසන්ස් කැපිටල් ලීසිං ලිමිටඩ්

**(ඈ) ඉහත සඳහන් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්**

### ප්‍රාථමික අලෙවිකරුවන්

1. ඇකියුට් සෙකියුරිටීස් ලිමිටඩ්
2. එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
3. එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී [අ]
4. කැපිටල් එලයන්ස් ලිමිටඩ්
5. කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
6. නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ්
7. පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් [ආ]
8. පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී [ඇ]
9. මහජන බැංකුව
10. යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
11. ලංකා බැංකුව
12. වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්
13. සම්පත් බෑන්ක් පීඑල්සී
14. සෙලාන් බෑන්ක් පීඑල්සී
15. ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පීඑල්සී

(අ) 2017.07.24 දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික වෙන්දේසිය සඳහා සහභාගි වීම වළක්වා ඇත.
(ආ) 2017.07.06 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික අලෙවිකරණ ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතු කරගෙන යාම මාස 6 ක කාලයක් සඳහා අත්හිටුවන ලදී.
(ඇ) 2017.08.15 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික අලෙවිකරණ ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතු කරගෙන යාම මාස 6 ක කාලයක් සඳහා අත්හිටුවන ලදී.

පැවැත්වූ අතර විද්‍යුත් මාධ්‍ය දැන්වීම් 10 ක් ප්‍රචාරණය කරන ලදී. වර්ෂය තුළදී, බලපත්‍රලාභී බැංකු හා බලපත්‍රලාභී මුදල් සමාගම්වල නම් ලැයිස්තු හා වෙනත් ප්‍රයෝජනවත් තොරතුරු ඇතුළත් අත් පත්‍රිකා 15,000 ක් පමණ මහජනයා අතර බෙදා දෙන ලදී.

(ආ) **බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම**

සාර්ව ආර්ථික තොරතුරු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය සහ නියාමන වර්ධනයන් සම්බන්ධ අදහස් හුවමාරු කර ගැනීම සඳහා අවස්ථාවන් සැලසීමේ පරමාර්ථයෙන් මහ බැංකු අධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කාර්තුමය රැස්වීම් පවත්වන ලදී. මීට අමතරව, දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට සහ ඒවා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා බාහිර විගණකවරුන් සහ ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයන් සමඟ අඛණ්ඩව තොරතුරු හුවමාරු කර ගන්නා ලදී. තවද, දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියසෙහි සහ ප්‍රාදේශීය කාර්යාලවල පැවති පුහුණු වැඩමුළු සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

### 30.6 අනවසර මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ඇති නීතිමය කාර්යයන් සඳහා පහසුකම් සැපයීම

(අ) **ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනය**

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුමත කරන ලද ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනයේ ආරක්ෂිත තැන්පත්කරුවන්ට අදියර 3 කින් තැන්පතු ආපසු ගෙවීමේ ක්‍රමවේදය අනුව, එම සමාගම විසින් තුන්වන අදියරෙහි ගෙවීම් කටයුතු සිදු කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටී. රජය විසින් 3 වන අදියරෙහි අරමුදල් වාරික ලෙස නිකුත් කිරීමට තීරණය කර ඇති අතර මුළු අරමුදල් අවශ්‍යතාව වන රුපියල් මිලියන 4,055 න් දැනට රුපියල් මිලියන 3,000 ක් ලබා දී ඇත. ඉතිරි තැන්පත්කරුවන් සඳහා ගෙවීම් අරමුදල් ලැබුණු පසු සිදු කෙරේ.

(ආ) **වෙනත් අනවසර මූල්‍ය ආයතන**

ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ලිමිටඩ් සහ එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් ආයතනයන්හි තැන්පත්කරුවන් විසින් 2015 වර්ෂය තුළ ගොනු කරන ලද නඩු කටයුතු සඳහා දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව පහසුකම් සපයන ලදී.

### 30.7 මහජන පැමිණිලි නිරාකරණය

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව ප්‍රධාන වශයෙන්ම ගනුදෙනුවලදී පාරිභෝගිකයන්ට සිදුවන අකටයුතුකම් සහ අදාළ සමාගම් සමඟ එළැඹී ඇති ගනුදෙනු සඳහා සහන ඉල්ලීම් සම්බන්ධයෙන් ඉදිරිපත් වූ පැමිණිලි විශාල ප්‍රමාණයක් සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් විය.

## 31. පුහුණු හා සංවර්ධන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව ප්‍රාග්ධන සංවර්ධනයෙහි මතුවෙමින් පවතින අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් මුදල් මණ්ඩලය විසින් 2015 ජූලි මස දී පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ එම අවශ්‍යතාවන් සපුරාලීම සඳහා උපාය මාර්ග සකස් කිරීම, වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, බුද්ධිමය ශක්‍යතාව වර්ධනයට පහසුකම් සැලසීම, බැංකුවේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම, විදේශීය/දේශීය කෙටි කාලීන පුහුණු අවස්ථා සලසා දීම සහ කාර්ය මණ්ඩලය අතර දැනුම හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වේ.

### 31.1 පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු

2017 වසර තුළ දී පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්හට ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය පහසුකම් සපයන ලදී. ඕස්ට්‍රේලියාවේ, එක්සත් රාජධානියේ සහ ඇ.එ.ජ.යේ පිළිගත් විශ්වවිද්‍යාලයන්හි ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා නිලධාරීන් 5 දෙනෙකුට ද, විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධිය හැදෑරීම සඳහා නිලධාරීන් 9 දෙනෙකුට ද, දේශීය විශ්වවිද්‍යාලයක ආචාර්ය උපාධිය ආරම්භ කිරීමට එක් නිලධාරියෙකුට ද අවස්ථාව ලබාදෙන ලදී. මේ අතර, සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කළ නිලධාරීන් 6 දෙනෙක් සහ විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධි සම්පූර්ණ කළ නිලධාරීන් 18 දෙනෙක් 2017 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජකාරී කටයුතු සඳහා නැවත පැමිණියහ (සංඛ්‍යා සටහන II-28).

### 31.2 කෙටි කාලීන පුහුණු අවස්ථා

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයෙහි නිපුණතා ඉහළ නැංවීමේ අරමුණින්, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව බැංකුවේ කාර්ය මණ්ඩලයට කෙටිකාලීන විදේශීය හා දේශීය පුහුණු අවස්ථාවන් 1,572 ක් සපයන ලදී. 2016 වර්ෂයේ අවසානයේ දී සිදු කරන ලද වාර්ෂික නිපුණතා හඳුනා ගැනීමේ අභ්‍යාසය හරහා මෙම පුහුණු අවශ්‍යතා හඳුනා ගන්නා ලදී.

#### 31.2.1 කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා

2017 වසර තුළ දී පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිගත් විදේශ පුහුණු ආයතන සහ එංගලන්ත බැංකුව, ජර්මන් බුන්ඩෙස් බැංකුව, ඉන්දියානු සංචිත බැංකුව, මැලේසියානු නෙගාරා බැංකුව, කොරියානු බැංකුව, ඇමෙරිකාවේ ෆෙඩරල් සංචිත බැංකුව සහ සිංගප්පූරු මූල්‍ය අධිකාරිය යන මහ බැංකු මගින් පුහුණු වැඩසටහන්,

වැඩමුළු, සම්මන්ත්‍රණ, සමුළු, අධ්‍යයන චාරිකා සහ රැස්වීම් ලෙස පවත්වනු ලබන කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා 308 ක් සඳහා පහසුකම් සපයන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, දකුණු හා නැගෙනහිර ආසියානු රටවල පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය (SEACEN), ජාත්‍යන්තර පියවීම් බැංකුව (BIS), ඉන්දියානු කාර්මික සහ ආර්ථික සහයෝගිතාව (ITEC), මැලේසියානු පුත්‍ර විශ්වවිද්‍යාලය වැනි අරමුදල් සපයන ජාත්‍යන්තර ආයතන, පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ පුහුණු ආයතන විසින් ඉදිරිපත් කරන ලද පුහුණු අවස්ථා සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලය සහභාගී විය. පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව, ජර්මන් බුන්ඩෙස් බැංකුවෙහි, ආසියා-පැසිෆික් ග්‍රාමීය හා කෘෂිකාර්මික ණය සංගමය (APRACA) විසින් බංගලාදේශයේ දී හා ලංකා ක්ලියර් පෞද්ගලික ආයතනය විසින් ඉන්දියාවේ දී පවත්වන ලද විදේශ අධ්‍යයන චාරිකා 3 ක් සඳහා 2017 දී පහසුකම් සලසන ලදී (සංඛ්‍යා සටහන II-29).

**II-28 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සිය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද හා සම්පූර්ණ කරන ලද නිලධාරීන් සංඛ්‍යාව (2013 - 2017)**

| සුදුසුකම් | 2013 | | 2014 | | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ |
| ආචාර්ය උපාධිය | 6 | 0 | 5 | 2 | 3 | 5 | 4 | 3 | 6 | 6 |
| විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධිය | 11 | 19 | 24 | 11 | 19 | 21 | 15 | 18 | 9 | 18 |

**II-29 සංඛ්‍යා සටහන**

**කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා - 2017**

| ක්ෂේත්‍රය | පුහුණු වැඩසටහන් ගණන | සහභාගි වූ නිලධාරීන් ගණන |
|---|---|---|
| මුදල් ප්‍රතිපත්තිය, ආර්ථික විද්‍යාව සහ සංඛ්‍යානය | 51 | 74 |
| මූල්‍ය පද්ධති ස්ථාවරත්වය | 71 | 96 |
| අවදානම් කළමනාකරණය, නීති හා අනුකූලතා | 11 | 14 |
| ආයෝජන කළඹ කළමනාකරණය | 23 | 28 |
| මහ බැංකු කටයුතු | 6 | 14 |
| තොරතුරු තාක්ෂණය/ගෙවීම් හා පියවීම් | 10 | 13 |
| ව්‍යවහාර මුදල් කළමනාකරණය | 8 | 11 |
| මානව සම්පත් කළමනාකරණය | 10 | 26 |
| ක්ෂුද්‍ර මූල්‍ය | 7 | 11 |
| වෙනත් | 12 | 21 |
| **එකතුව** | **209** | **308** |

පුහුණු වැඩසටහන් හරහා ලබාගත් දැනුම හා අත්දැකීම් භාවිතා කරමින් සිදු කළ යුතු විවිධ පැවරුම් පැවරීම මගින් අදාළ නිලධාරීන් හට ලැබුණු කෙටි කාලීන විදේශ පුහුණු පාඨමාලාවල සඵලතාව ඇගයීම අඛණ්ඩව කර ගෙන යන ලදී. මෙම කටයුතු පශ්චාත් පුහුණු අධීක්ෂණ අනු කමිටුව විසින් අධීක්ෂණය කරනු ලබයි. 2017 වසර තුළ දී පුහුණු අනු කමිටු රැස්වීම් 2 ක් පවත්වන ලදී. ඒ අනුව, ඒවායේ දී ලබාදුන් පැවරුම් 34 කින් 27 ක් කෙටි කාලීන විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් විසින් සම්පූර්ණ කර 2017 වසර තුළ දී භාර දී ඇත (සංඛ්‍යා සටහන II-30).

**II-30 සංඛ්‍යා සටහන**

**2017 වසර තුළ කෙටි කාලීන විදේශ පුහුණු වැඩසටහන්වලට සහභාගීවූවන් විසින් සම්පූර්ණ කරන ලද පැවරුම්.**

| වර්ගීකරණය | පැවරුම් ගණන |
|---|---|
| මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීම සඳහා වන මාර්ගෝපදේශ | 2 |
| ලිපි, ඉදිරිපත් කිරීම් හරහා දැනුම හුවමාරු කර ගැනීම හා කාර්යමණ්ඩල දැනුම්වත් කිරීම | 16 |
| පද්ධති හා ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සඳහා වන යෝජනා | 9 |
| **එකතුව** | **27** |

### 31.2.2 කෙටි කාලීන දේශීය පුහුණු අවස්ථා

2017 වසර තුළ දී, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව, බැංකු විදු පියසෙහි සහ වෙනත් පිළිගත් දේශීය පුහුණු ආයතනයන්හිදී පවත්වන ලද පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු වැනි කෙටි කාලීන දේශීය පුහුණු අවස්ථා 1,264 ක් බැංකුවේ කාර්ය මණ්ඩලය වෙත ලබාදෙන ලදී. මෙම පුහුණු වැඩසටහන් ප්‍රධාන වශයෙන් ආර්ථික විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව, ගිණුම්කරණය, බැංකුකරණය, තොරතුරු තාක්ෂණය, නීතිය, විගණනය, අරමුදල් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, ලේඛන කටයුතු පිළිබඳ කාර්යයන්, මානව සම්පත් කළමනාකරණය, බැංකු හා මූල්‍ය ආයතන අධීක්ෂණය, මූල්‍ය වෙළඳපොළ, විදේශ විනිමය, ව්‍යවහාර මුදල්, ප්‍රාදේශීය සංවර්ධනය යන අංශ යටතේ විය. 2017 වසර තුළ දී, බැංකු විදු පියස සහ අනෙකුත් පුහුණු ආයතන මගින් පැවැත් වූ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙළින් 756 ක් සහ 508 ක් විය.

**31.3 වැඩමුළු සහ දැනුම හුවමාරුව**

2017 වසර තුළ දී, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව ''අන්තර්ජාතික වෙළඳාම සහ විදේශීය අංශයේ ගැටලු'' යන මැයෙන් ඉහළ පෙළේ ව්‍යුහගත පුහුණු වැඩසටහනක් සංවිධාන කරන ලදී. මෙයට අමතරව, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විදේශීය පුහුණුවෙන් පසු නැවත පැමිණි සහ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවලින් පසුව සේවයට වාර්තා කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්හට ඉදිරිපත් කිරීම් පැවැත්වීමට පහසුකම් සලසන ලදී.